ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 27(2) යටතේ මම පහත සඳහන් ප්‍රශ්නය ඉදිරිපත් කරනවා.

මේ රටේ දශක ගණනාවක් තිස්සේ කීර්තිමත් නිදහස් සෞඛ්‍ය සේවයක් පැවතුණත්, පසුගිය වසර දෙකතුන තුළ සෞඛ්‍ය සේවයේ දරුණු කඩා වැටීමක් වාර්තා වුණා. මේ වන විට රට තුළ අත්‍යවශ්‍ය ඖෂධවල දැඩි හිඟයක් පවතින අතර, දැනට ඇති සීමිත ඖෂධ ප්‍රමාණයේ ද මිල ශීඝ්‍ර ලෙස ඉහළ යෑම නිසා රෝගීන්ට එම ඖෂධ මිලට ගැනීමට නොහැකි වාතාවරණයක් උදා වෙලා තිබෙනවා. එය සමස්ත ජනතාවගේ සෞඛ්‍ය තත්ත්වය කෙරෙහි ප්‍රබල තර්ජනයක් ඇති කරන බව අපට පෙනී යනවා. බැවින්, සෞඛ්‍ය ක්ෂේත්‍රයේ මතුව ඇති ගැටලු සම්බන්ධයෙන් රජය සුවිශේෂී අවධානයක් කඩිනමින් යොමු කළ යුතුව ඇත.

ඒ අනුව, මෙය ජාතික වැදගත්කමකින් යුතු ගැටලුවක් වශයෙන් සලකා මම පහත සඳහන් ප්‍රශ්න ඉදිරිපත් කරනවා.

01. මෙරටට ආනයනය කළ යුතු අත්‍යවශ්‍ය ඖෂධ වර්ග කවරේ ද යන්න ලැයිස්තුගත කර තිබේද? එම ලැයිස්තුව මෙම සභාවට ඉදිරිපත් කරන්නේද? රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව මඟින් සහ වෙනත් ආනයනකරුවන් විසින් මෙම අත්‍යවශ්‍ය ඖෂධ ආනයනය නිසි කලට සිදු කරන බවට රජයට සහතික විය හැකිද? ඒ සඳහා මාසිකව කොපමණ විදේශ විනිමය ප්‍රමාණයක් අවශ්‍ය වේද? එම මුදල ප්‍රමාදයකින් තොරව ලැබෙන බව රජයට සහතික විය හැකිද? එම විදේශ විනිමය ප්‍රමාණය ඒ සඳහා පමණක් වෙන් කිරීමට රජය කටයුතු කරන්නේද?

02. දැනට ඖෂධවල මිල ගණන් තීරණය කිරීම සිදු කරනු ලබන්නේ මිල කමිටුවක් මඟින් බව වාර්තා වේ. මෙම මිල කමිටුවෙහි සාමාජිකයන් කවුරුන්ද? ඔවුන් නියෝජනය කරනු ලබන්නේ කුමන පාර්ශ්වයන් ද? එම කමිටුවට ඖෂධ ආනයනකරුවන් මෙන්ම, ඖෂධ බෙදාහරින්නන්, ඖෂධ අළෙවිකරුවන් ද, අනෙකුත් පාර්ශ්වකරුවන් ද සහභාගි කර ගැනීම තුළින් ඖෂධ සඳහා සාධාරණ මිලක් නියම කළ හැකි නොවන්නේද? මිල කමිටුව වෙනුවට, සියලු ඖෂධවල මිල ගණන් පාලනය වන පරිදි මිල සූත්‍රයක් හඳුන්වා දීමට රජයට කටයුතු කළ නොහැකි ද?

03. ඖෂධ අලෙවිසැල් වෙත බෙදා හරිනු ලැබූ ඖෂධ කල් ඉකුත්වීමෙන් පසු ඇතැම් සැපයුම්කරුවන් විසින් ඒවා නැවත එකතු කිරීම සිදු නොකරන බව ඔසුසල් හිමියන් විසින් පෙන්වා දෙනවා.

මෙම කල් ඉකුත් වූ ඖෂධ නිසි පරිදි ඔසුසල්වලින් ඉවත් කිරීම සඳහා සමස්ත සැපයුම්කරුවන්ටම එක් නිශ්චිත ප්‍රතිපත්තියක්; ක්‍රමවේදයක් හඳුන්වා දීම කළ නොහැකිද? මේ සඳහා ජාතික ඖෂධ නියාමන අධිකාරිය විසින් ගෙන ඇති ක්‍රියා මාර්ග කවරේ ද?

04. මෙම වසරේ මාස අටක් වැනි කෙටි කාලපරිච්ඡේදයක් තුළ දී වෛද්‍යවරුන් 500කට ආසන්න සංඛ්‍යාවක් රට හැර ගොස් ඇති බවට තොරතුරු හෙළි වී තිබෙනවා. මීට

[ගරු සජිත් ප්‍රේමදාස මහතා]

අමතරව, අනෙකුත් සෞඛ්‍ය වෘත්තිකයින් ද රට හැර යාම සිදු වෙමින් පවතිනවා. මෙය තවදුරටත් වර්ධනය වුවහොත් මෙරට සෞඛ්‍ය පද්ධතිය මුළුමනින්ම පාහේ බිඳ වැටීමට හේතු වෙනවා. වෛද්‍යවරුන් ඇතුළු සෞඛ්‍ය වෘත්තිකයින් මෙරට සෞඛ්‍ය සේවයේ රඳවා ගැනීමට සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් ගනු ලබන පියවර කවරේ ද?

05. මෙරට ඖෂධ ගෙන්වීම, බෙදා හැරීම සහ අළෙවිය සම්බන්ධයෙන් සම්පූර්ණ වගකීම දරනු ලබන්නේ ජාතික ඖෂධ නියාමන අධිකාරිය - NMRA - විසිනි. නමුත්, ජාතික ඖෂධ නියාමන අධිකාරිය විසින් ඉටු කරනු ලැබිය යුතු මූලික කාර්යයක් වන සැපයුම්කරුවන් ලියා පදිංචි කිරීමේ දැඩි ප්‍රමාදයක් පවතින නිසා, නිසි කලට ඖෂධ වෙළෙඳ පොළ වෙත සැපයීමට බාධා ඇති වන බවට වාර්තා වෙනවා. පුහුණු ඖෂධවේදීන්ගේ හිඟය මෙයට හේතු වෙලා තිබෙනවා. එමෙන්ම, ඖෂධ අළෙවිසැල් පරීක්ෂා කිරීම ඇතුළු අනෙකුත් කාර්යයන් ඉටු කරනු ලබන ආහාර හා ඖෂධ පරීක්ෂකවරුන් - food and drugs inspectors - බඳවා ගැනීමේ ගැටලු නිසා ද ජාතික ඖෂධ නියාමන අධිකාරියේ කාර්යයන් නිසි පරිදි ඉටු නොවන බව වාර්තා වෙනවා. මෙම ගැටලු විසඳීම සඳහා රජය විසින් ගෙන ඇති ක්‍රියා මාර්ග කවරේ ද?

06. රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව - SPC - විසින් ගෙවීම් නොකිරීම නිසා සැපයුම්කරුවන් ඖෂධ සැපයීම අත්හිටුවා ඇති බවට තොරතුරු වාර්තා වේ. මෙය සත්‍යයක්ද? එසේ නම්, රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව මගින් කොපමණ මුදලක් ඖෂධ ආනයනකරුවන් වෙත ගෙවීමට තිබේද? එම ගෙවීම් ප්‍රමාදවීමට හේතු කවරේද?

ගරු කථානායකතුමනි, මේ ප්‍රශ්න ගණනාව මම ඉදිරිපත් කරන්නේ විශේෂයෙන්ම රජය සෞඛ්‍ය ක්ෂේත්‍රයට ප්‍රමුඛ අවධානයක් යොමු කරන්න ඕනෑ නිසායි. මම හිතන විධියට රජය සැලසුම් කර-කර ඉන්නවා, තවදුරටත් ඇමති මණ්ඩලය වැඩි කිරීමට. නමුත් ඇමති මණ්ඩලය වැඩි කිරීම සඳහා කැප කරන ප්‍රතිපාදන මේ රටේ අම්මලා සහ දරුවන් වෙනුවෙන්, මේ රටේ ජන ජීවිත බේරා ගැනීම සඳහා අවශ්‍ය ඖෂධ ලබා දීමේ වැඩ පිළිවෙළක් වෙනුවෙන්; මේ රටේ මිනිස්සුන්ට සහන මිලකට ඖෂධ ටික ලබා ගන්න පුළුවන් ක්‍රමවේදයක් වෙනුවෙන් යොමු කළොත් හොඳයි නේද? ඇමති පැටවු ගහනවාට වඩා ඒක හොඳයි නේද? එම නිසා සෞඛ්‍ය ක්ෂේත්‍රයට සම්බන්ධ මේ ප්‍රශ්නයට නිශ්චිත සහ තිරසර පිළිතුරක් රජය පැත්තෙන් ලබා දෙනවා නම් මම කැමැතියි.

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 27 (2) යටතේ ගරු විපක්ෂ නායකතුමා අප කාටත් වැදගත් වන ප්‍රශ්නයක් අසා තිබෙනවා. මේ ප්‍රශ්නයට සවිස්තරාත්මක පිළිතුරක් ලබා දිය යුතු බැවින්, සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම්තුමා විසින් සභානායක කාර්යාලයට දැනුම් දී තිබෙනවා, 2022.11.29 වැනි දින ඊට ඉඩකඩ සලසා දෙන්න කියලා. ගරු විපක්ෂ නායකතුමා ස්ථාවර නියෝග 27 (2) යටතේ අද අසන ලද ප්‍රශ්නය සෞඛ්‍ය අමාත්‍යාංශයට තමයි සම්පූර්ණයෙන්ම අදාළ වෙන්නේ. එම නිසා එයට අදාළ පිළිතුර 2022.11.29 දින ලබා දෙන බව අමාත්‍යාංශ ලේකම්ගේ ලිපිය අනුව මම සඳහන් කරනවා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

29 වැනිදා ද?

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ඔව්, 29 වැනිදා. ඒ ගොල්ලන් ඉල්ලීමක් කර තිබෙනවා, 29 වැනිදා මෙම ප්‍රශ්නයට පිළිතුරක් ලබා දීමට ඉඩ සලසා දෙන්න කියලා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

29වැනි දා වනකල් ඉන්නවා ද, මේ වාගේ වැදගත්, බැරෑරුම් ප්‍රශ්නයකට පිළිතුරු ලබා දෙන්න? ඒ ගැන පොඩ්ඩක් හිතලා බලන්න, ගරු කථානායකතුමනි. මොකද, සෞඛ්‍ය ක්ෂේත්‍රයට අදාළව, ඖෂධ සම්බන්ධව බැරෑරුම් ප්‍රශ්නයක් තමයි මම ඉදිරිපත් කළේ. ප්‍රශ්නයකට පිළිතුරක් දෙන්න කාලය ඉල්ලුවාට මම සාමාන්‍යයෙන් විරුද්ධ වන්නේ නැහැ. නමුත්, අද මේ අහන ප්‍රශ්නයට පිළිතුරු දෙන්න 29වැනි දා වනකල් ඉන්න අවශ්‍යද? ගරු කථානායකතුමනි, මේ සම්බන්ධයෙන් ඔබතුමා තීන්දුවක් දෙන්න. මොකද, මේක රටේ බැරෑරුම් ප්‍රශ්නයක්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

මම අමාත්‍යාංශ ලේකම්තුමාට කථා කරලා බලන්නම්, ඉක්මනින් පිළිතුරු ගන්න පුළුවන්ද කියලා.

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ඉක්මනින් පිළිතුරු දෙන්න කියලා අපි කිව්වා. ගරු විපක්ෂ නායකතුමනි, ඊයේ දිනයි ඔබතුමා මේ ප්‍රශ්නය යොමු කරලා තිබෙන්නේ. ඒ ගැන අපි වහාම සෞඛ්‍ය අමාත්‍යාංශයට දැනුම් දුන්නා. ඒ අනුව, ලේකම්තුමාගේ ලිපියේ සඳහන් කර තිබෙන දිනයයි මම කිව්වේ. අපි සෞඛ්‍ය අමාත්‍යතුමාට දැනුම් දෙන්නම්, ඊට පෙරාතුව මේ ප්‍රශ්නයට පිළිතුරක් දෙන්න කියලා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

මම සාධාරණව කියන්නේ,- *[බාධා කිරීමක්]*

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

මේක මගෙන් අහපු ප්‍රශ්නයක් නම් ඒ වෙලාවේම මම පිළිතුරු ලබා දෙනවා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ඒක හරි. දින දෙකක්, තුනක් කාලය ගත්තාට කමක් නැහැ. නමුත්, 29වැනි දා වනකල් ඉන්න ඕනෑද, මේකට පිළිතුරු දෙන්න? *[බාධා කිරීමක්]* 29වැනි දා වනකල් කාලය ඉල්ලන්නේ, මේ රටේ සෞඛ්‍ය ක්ෂේත්‍රය පිළිබඳව රජය දැනුවත් වෙලා නැද්ද?

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

මට නම් එහෙම ප්‍රශ්නයක් නැහැ. මගෙන් ඇහුවා නම් පිළිතුරු දෙනවා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මට නම් ප්‍රශ්නයක් නැහැ කියන්න එපා, ගරු සභානායකතුමනි. දැන් ඔබතුමා නේ නැඟිට්ටේ, මේ ප්‍රශ්නයට පිළිතුරු දෙන්න.

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
මම සභාවට දැනුම් දුන්නේ, සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම්තුමා විසින් සභානායක කාර්යාලයට ඉදිරිපත් කර තිබෙන ඉල්ලීම.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
සමාවෙන්න, ගරු සභානායකතුමනි. ඒ පිළිතුර මට නම් පිළිගන්න බැහැ. රටේ සෞඛ්‍ය ක්ෂේත්‍රයේ තිබෙන බරපතළ ගැටලුවක් පිළිබඳව පිළිතුරක් දෙන්න 29වැනි දා වනකල් රජය කල් මරනවා. ඒ අතරතුර අපට කියනවා, කැබිනට් මණ්ඩලයට එකතු වෙන්න කියලා. ඒකට ආරාධනාව අද හෙටම තිබෙනවා. මොකක්ද, මේ විහිළුව? *[බාධා කිරීමක්]* කරුණාකර මේ ප්‍රශ්නවලට පිළිතුරු දෙන්න.

ගරු කථානායකතුමනි, මට තව කාරණයක් කියන්න තිබෙනවා. පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදය ශක්තිමත් කරමින් සිය මහජන නියෝජිත වගකීම ව්‍යවස්ථාදායකය තුළ නිසි පරිදි ඉටු කිරීම සඳහා දක්වන ලද කැපවීම වෙනුවෙන් Institute of Politics කියන ආයතනය වසරක් පාසා, "වසරේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයා" සම්මානය පිරිනමනවා.

මම දන්නා විධියට, අවුරුදු 2ක් පිට පිට ම අපේ ගරු රෝහිණී කුමාරි විජේරත්න මැතිනිය ඒ සම්මානය ලැබුවා. ඒ වාගේම මේ වසරේ ප්‍රතිපක්ෂය නියෝජනය කරමින් අපේ ගරු නීතිඥ ප්‍රේම්නාත් සී. දොලවත්ත මැතිතුමා ඒ සම්මානය ලැබුවා. ඒ දෙපළටම අපේ ගෞරවය, ආශීර්වාදය, ශුභාශිංසන මේ ගරු සභාවේ සියලු දෙනා වෙනුවෙන් පුද කර සිටිනවා.

ගරු කථානායකතුමනි, මට තව කරුණු දෙකක් කියන්න අවස්ථාව ලබා දෙන්න. ගරු කථානායකතුමනි, ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ රැඳවුම් නියෝග මත රඳවා තබාගෙන සිටින පූජ්‍ය ගල්වැව සිරිධම්ම ස්වාමීන් වහන්සේ සහ වසන්ත මුදලිගේ හෙට දවස වෙනකොට දින 90ක කාලය සම්පූර්ණ කරනවා. අපට ආරංචියක් තිබෙනවා, ඒ රැඳවුම් නියෝගය තවදුරටත් දීර්ඝ කරන්න යනවා කියලා. මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා, ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ ක්‍රියාත්මක කරන මේ හිංසනය, ම්ලේච්ඡත්වය කරුණාකර නතර කරන්න කියලා. මම නම් මේක හඳුන්වන්නේ "රාජ්‍ය ත්‍රස්තවාදය" හැටියටයි. කරුණාකර මේ රාජ්‍ය ත්‍රස්තවාදය නතර කරන්න. තරුණ පරපුර වෙනුවෙන් හඬ නඟපු, රටේ ජන පරපුර වෙනුවෙන් හඬ නඟපු මේ රටේ ම පුරවැසියන් ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ මේ විධියට සිරගත කිරීම වහා නතර කරලා ඔවුන් මුදා හැරීමට කටයුතු කරන්න කියලා මම බොහොම කාරුණිකව ඉල්ලා සිටිනවා. විපක්ෂය හැටියට අපි මේ රාජ්‍ය හිංසනය, රාජ්‍ය ම්ලේච්ඡත්වය, රාජ්‍ය තර්ජනය, රාජ්‍ය ත්‍රස්තවාදය තරයේ හෙළා දකිනවා.

ගරු කථානායකතුමනි, ඔබතුමාගේ අවසරය ඇතිව අවසාන වශයෙන් මා මේ කාරණාව ඉදිරිපත් කරනවා. ගරු කථානායකතුමනි, ඊයේ දිනයේ මා මිත්‍ර ගරු අග්‍රාමාත්‍යතුමා ප්‍රකාශයක් කළා, පාර්ලිමේන්තුව විසුරුවා හැරීම කොයි වෙලාවටද, කොයි ආකාරයටද කරන්න පුළුවන් කියන කාරණාව ගැන. එතුමා කියනවා, පාර්ලිමේන්තුව විසුරුවා හරින්න ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ප්‍රතිපාදනයක්, provision එකක් නැහැයි කියලා. මා හිතන හැටියට ගරු අග්‍රාමාත්‍යතුමා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ප්‍රතිපාදන හරියාකාරව අවබෝධ කරගෙන නොවෙයි, ඒ ප්‍රකාශය කරලා තිබෙන්නේ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 70 (1) ව්‍යවස්ථාවේ (අ) සහ (ඇ) අනුව පාර්ලිමේන්තුවේ යෝජනා සම්මතයක් මත පාර්ලිමේන්තුව විසුරුවා හරින්න ජනාධිපතිවරයාට හැකියාව තිබෙන බව අපි හැමදෙනාම දන්නා කාරණාවක්. ඒක තමයි, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් කියන්නේ. ඒ වාගේම ජනාධිපතිවරයාට අවස්ථාව එළඹෙනවා, විශේෂයෙන්ම වසර දෙකහමාරකින් පසුව පාර්ලිමේන්තුව විසුරුවා හරින්න.

ගරු අග්‍රාමාත්‍යතුමා විසින් ගරු හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමාට අවලාද නඟා තිබෙනවා, අපේ රටේ තිබෙන්නේ ඇමෙරිකන් ක්‍රමයක් නොවෙයි, අපේ රටේ midterm elections නැහැ කියලා. ඔව්, ඒ කාරණය අපි දන්නවා. ඒක අමුතුවෙන් උගන්වන්න ඕනෑ දෙයක් නොවෙයි. ඇමෙරිකාවේ තිබෙන්නේ fixed-terms: House of Representativesට two years; Presidentට four years; Senate එකට six years. ඒක අපි දන්නවා.

එම නිසා මම අග්‍රාමාත්‍යතුමාගෙන් ඉල්ලීමක් කරනවා, රටේ ජනතාව නොමඟ යවන්න එපා කියලා. පාර්ලිමේන්තුවේ බහුතරයකින් සම්මත වෙච්ච යෝජනාවක් තුළින් ජනාධිපතිවරයාට අවස්ථාව ලැබෙනවා, පාර්ලිමේන්තුව විසුරුවන්න. ඒක හෙට වුණත් කරන්න පුළුවන්; අනිද්දා වුණත් කරන්න පුළුවන්; අද දවසේ වුණත් කරන්න පුළුවන්. ගරු අගමැතිතුමාත් ව්‍යවස්ථාවේ ප්‍රතිපාදන නොදැන තමයි ඊයේ කථා කරලා තිබෙන්නේ. රටේ ජනතාව නොමඟ යවන්න අපි කිසිසේත්ම උත්සාහ දරන්නේ නැහැ.

මම මේ අවස්ථාවේ බොහොම සතුටින් කියන්න කැමැතියි, මෙන්න මේ කාරණය. මැතිවරණ කොමිසමේ සභාපතිතුමා අපට - විපක්ෂයේ සියලු පාර්ශ්වවලට- ප්‍රතිඥාවක් ලබා දුන්නා, නියමිත කාලයට මැතිවරණ පවත්වනවා කියලා. ගරු කථානායකතුමනි, ඇත්ත වශයෙන්ම මැතිවරණ පවත්වන්න බාධාවක් තිබෙනවා. මොකක්ද ඒ බාධාව? ආණ්ඩුවට ලැබෙන ප්‍රතිඵලය සම්බන්ධව ඒකාන්ත වශයෙන්ම ඇඟ කිළිපොළා යන බයක් නම් එතුමන්ලාට ඇති. ඒක බාධාවක් වෙයි ද දන්නේ නැහැ. ආණ්ඩුව මැතිවරණයකට රැගෙන යාම ඇත්තෙන්ම පිස්සු බල්ලෙක් නාවන්න ගෙනියනවා වාගේයි; දඟලනවා, මැළි කරනවා. ගරු කථානායකතුමනි, ආණ්ඩුවට පිටකොන්දක් තිබෙනවා නම්, කශේරුකාවක් තිබෙනවා නම්, රටේ ජනමතයට සවන් දෙනවා නම් කරුණාකරලා මැතිවරණයකට යන්න කියලා මම ඉල්ලීමක් කරනවා. එයට බාධා කරන්න එපා, අකුල් හෙළන්න එපා. එයට ඉඩ දෙන්න කියලා මම ආණ්ඩුවට කියනවා. ජනසම්මතවාදයට ඉඩ දීම තුළින් මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා වෙනවා.

ගරු කථානායකතුමනි, මට මේ කරුණු, කාරණා ඉදිරිපත් කරන අවස්ථාව ලබා දීම ගැන ඔබතුමාට බෙහෙවින් ස්තුතිවන්ත වෙනවා. ගරු සුසිල් ප්‍රේමජයන්ත ඇමතිතුමා දක්වන ප්‍රතිචාරයටත්, ප්‍රතිචාර දක්වන්න මට අවස්ථාව ලබා දෙන්න.

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, ප්‍රථමයෙන්ම මගේ සුබ පැතුම් පිරිනමනවා, ගරු රෝහිණී කවිරත්න මන්ත්‍රීතුමියටත්, ගරු ප්‍රේම්නාත් සී. දොලවත්ත මන්ත්‍රීතුමාටත්. විශේෂයෙන්ම පාර්ලිමේන්තු කටයුතුවලදී -පාර්ලිමේන්තුවේදීත්, කමිටුවලදීත්-

[ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා]

සිය දායකත්වය ලබා දීම වෙනුවෙන් එම දෙදෙනාට ලැබුණු පිළිගැනීම සම්බන්ධව. එම දෙපළ වෙනුවෙන් අපේ විපක්ෂ නායකතුමා එක් කරපු සුබ පැතුම්වලට අමතරව මගේ සුබපැතුම් ද පිරිනමනවා.

ගරු විපක්ෂ නායකතුමා මතු කරපු දෙවැනි කාරණයට මම දැන් පිළිතුරු දෙන්නම්. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ XI වැනි පරිච්ඡේදයේ ව්‍යවස්ථාදායකයේ කාර්ය පටිපාටිය සහ බලතල යටතේ 70 (1) අනුව්‍යවස්ථාවේ ඊට පෙර දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය යටතේ තිබුණේ අවුරුදු හතරහමාරකින් පාර්ලිමේන්තුව විසුරුවා හරින්න පුළුවන් කියලා. විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය යටතේ තමයි විපක්ෂ නායකතුමා විසින් මතු කරන ලද ඡේදය තිබෙන්නේ. විසිඑක්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේත් විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ තිබුණු ආකාරයට ඒ ඡේදය එසේම තිබෙනවා. හැබැයි දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ තිබුණේ අවුරුදු හතරහමාරකින් පාර්ලිමේන්තුව විසුරුවා හරින්න පුළුවන් කියලා. ඒ අවුරුදු හතරහමාර තමයි දැන් අවුරුදු දෙකහමාර වෙලා තිබෙන්නේ. ඒ වාගේම, දැන හෝ නොදැන, මහ හැරීමකින් හෝ ගරු කථානායකතුමනි, ඒ සඳහා තුනෙන් දෙකක ඡන්දයක් අවශ්‍යයි කියලා 70 (1) අනුව්‍යවස්ථාවේ නැහැ. 70 (1) අනු ව්‍යවස්ථාවේ සඳහන් වන්නේ මෙහෙමයි:

> "ජනාධිපතිවරයා විසින් කලින් කළ ප්‍රකාශනයක් මඟින් පාර්ලිමේන්තුව කැඳවීම, පාර්ලිමේන්තුවේ වාර අවසාන කිරීම සහ පාර්ලිමේන්තුව විසුරුවා හැරීම කළ හැක්කේය:
>
> එසේ වුවද -
>
> (අ). (ඇ) වන ඡේදයේ විධිවිධානවලට යටත්ව..."

මම ඒක දිගටම කියවන්න අවශ්‍ය නැහැ. ඒ අනුව, අවුරුදු දෙකහමාරක කාලය ඉකුත් වුණාට පස්සේ තමයි පාර්ලිමේන්තුව විසුරුවා හැරීමට ජනාධිපතිවරයාට අවසර ලැබෙන්නේ. හැබැයි ඊට පෙරාතුව පාර්ලිමේන්තුවේ බහුතරයකින් යෝජනාවක් සම්මත කළොත්, මැතිවරණයක් පවත්වන්න පුළුවන්. ඒකේ කිසි ප්‍රශ්නයක් නැහැ. ඔබතුමා පෙන්වා දුන්නේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ තිබෙන කාරණය, ගරු විපක්ෂ නායකතුමනි. මට ඒක වෙනස් කරන්න බැහැ නේ. ඒක එහෙමයි.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු කථානායකතුමනි, ගරු සභානායකතුමාට පිළිතුරු ලබා දෙන්න අයිතිය තිබෙනවා. ගරු සභානායකතුමනි, ඔබතුමා දුන්න පිළිතුර මම පිළිගන්නවා. ඔබතුමාට බොහොම සරලව කියන්න තිබුණා නේ, අගමැතිතුමා කියපු ප්‍රකාශය වැරදියි, විපක්ෂ නායකවරයා කියපු එක හරි කියලා. එහෙම කිව්වා නම් හරි නේ. ඔච්චර කියවන්න ඕනෑ නැහැ නේ. අරකයි, මේකයි කියලා කියවන්න ඕනෑ නැහැ නේ.

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ඔබතුමා විපක්ෂ නායකවරයා විධියට ඔබතුමාගේ කාර්ය භාරය කරන අතර, මම සභානායකවරයා හැටියට මගේ කාර්ය භාරය ඉටු කරනවා.

ගරු කථානායකතුමනි, තව කාරණයක් මම මේ ගරු සභාවේ අවධානයට යොමු කරනවා. මීට මාසයකට විතර කලින් ගරු ඉෂාක් රහුමාන් මන්ත්‍රීතුමා ප්‍රශ්නයක් ඇහුවා. ගරු මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමනි, මේ ප්‍රශ්නය ගැන ඔබතුමාත් දන්නවා. අපේ ගරු එස්.එම්. මරික්කාර් මන්ත්‍රීතුමාත් මේ වෙලාවේ සභාවේ ඉන්න එක හොඳයි. ගරු ඉෂාක් රහුමාන් මන්ත්‍රීතුමා ඇසූ ප්‍රශ්නය සම්බන්ධවයි මම මේ කියන්නේ. 2022 වර්ෂයට අදාළව, 6 ශ්‍රේණියේ සිට 11 ශ්‍රේණිය දක්වා ඉස්ලාම් ධර්මය පෙළ පොත් මුද්‍රණය කර යවා තිබුණා. නමුත්, එවකට -මම අධ්‍යාපන අමාත්‍යාංශය බාර ගැනීමට පෙරාතුව- ආරක්ෂක අමාත්‍යාංශයේ උපදෙස් අනුව ඒ පෙළ පොත්වල යම් යම් සංශෝධන කළ යුතුයි කියලා යෝජනා කරලා තිබුණා. ඒ අනුව, ඉස්ලාම් ධර්මය සහ අනෙක් ආගම් පිළිබඳව වන කමිටුවකින් මේ කරුණු පරිශීලනය කරලා ඉතාම සුළු සංශෝධන කීපයක් - minor amendments ටිකක් - කරලා ඒ පිටු ටික ඇතුළත් කරලා නැවත ඒවා මුද්‍රණය කරලා සූදානම් කර තිබ්බා. ඒ පිළිබඳව ඔබතුමන්ලා පාර්ලිමේන්තුවේදී මගෙන් ප්‍රශ්න ඇහුවා. මම කිව්වා, හැකි ඉක්මනින් ඒ පෙළ පොත් ටික බෙදනවා කියලා. මේ වන විට එම පොත් බෙදන්න පටන් අරන් තිබෙනවා. සියලු ආගම්වල දැනුවත්භාවයෙන් හා එකඟතාවෙන් යුතුව, කිසිදු භේදයකින් තොරව ඒ අවශ්‍ය සංශෝධන කරලා, දරුවන් වෙනුවෙන් ඒ පෙළ පොත් ටික යවනකොට, "Colombo Today" කියන website එකෙන් -ඔබතුමන්ලා බලන්න. ඒක කාගෙද කියා මම දන්නේ නැහැ.- දැන් කියනවා, ආගමික අන්තවාදය සහිත පොත් බෙදා හැරීමට මම අනුමැතිය දුන්නාය කියලා, ගරු විපක්ෂ නායකතුමනි.

මම කළේ, මේ රටේ සෑම දරුවෙකුටම සාධාරණත්වය ඉටු කිරීම. පෙළ පොත් ටික ආපසු ගෙන්වා අදාළ සංශෝධන කරලා ආපසු බෙදා දෙන්න කටයුතු කර තිබෙනවා. ඒ දරුවන් ලබන මැයි මාසයේදී O/L Examination එකට පෙනී ඉන්නවා. මම ඒ වෙලාවේත් කිව්වා, "මාස හයක් තිබෙනවා, මම කොහොම හරි මේ පොත් ටික දෙනවා" කියලා. මම කළේ නිවැරැදි දේ. ඔබතුමන්ලාත් ඒක පිළිගනීවි. නමුත්, ගරු කථානායකතුමනි, "Colombo Today" කියන website එක -

**ගරු එස්.එම්. මරික්කාර් මහතා**
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)

ගරු ඇමතිතුමනි, ඒක ජාතිවාදී website එකක් -

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

මම කළේ, ඔබතුමන්ලාගේ ඉල්ලීම අනුව සියලු දරුවන්ට සාධාරණය ඉටු කිරීමයි. සෑම දරුවකුටම සමානව අවස්ථාව දෙන්න ඕනෑ. අපි දැන් ඉක්මනින් ඒ පෙළ පොත් ටික බෙදා දෙමින් යනවා. "Colombo Today" කියන website එක ඒ සම්බන්ධයෙන් රට තුළ අසත්‍යයක් ප්‍රචාරය කරනවා. ගරු කථානායකතුමනි, මම ඒ පිළිබඳව ඔබතුමාගේ අවධානය යොමු කරවනවා. ඒ කාර්යය නැවත්වුවේ නැත්නම්, මම ඒක වරප්‍රසාද ප්‍රශ්නයක් හැටියට පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනවා. මම කළේ, සියලු දරුවන්ට සාධාරණය ඉටු කිරීමයි.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු කථානායකතුමනි, අපේ සිරිධම්ම හාමුදුරුවෝ සහ වසන්ත මුදලිගේ සම්බන්ධයෙන් මම වැදගත් කාරණාවක් ඇහුවා. ගරු ඇමතිතුමනි, මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා. ඒ අය අත් අඩංගුවට අරගෙන හෙටට දින 90 සම්පූර්ණ වෙනවා. කරුණාකර, ඒ දෙපොළ නිදහස් කරන්න. ඒ ඉල්ලීම ඉෂ්ට කරන්න. නැත්නම්, ඒක මේ ආණ්ඩුවටත් හොඳ නැහැ; රටටත්

හොඳ නැහැ; ප්‍රජාතන්ත්‍රවාදයටත් හොඳ නැහැ; මානව අයිතිවාසිකම්වලටත් හොඳ නැහැ. මේ කාරණය තුළින්, පොදු ජන නිදහස වළක්වන ආණ්ඩුවක් තිබෙනවාය කියලා මුළු ලෝකයටම ඔප්පු කරනවා.

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, ත්‍රස්තවාදය වැළැක්වීමේ පනතේ ප්‍රතිපාදන අනුව තමයි ඒ ක්‍රියාමාර්ග අරගෙන තිබෙන්නේ. මීට පෙර හදිසි නීතිය යටතේත් එවැනි රඳවා ගැනීමේ නියෝග නිකුත් කරන්න පුළුවන්කම තිබුණා. ඒ වකවානුව අනුව ඒක කෙරුණා. ඒ වාගේම, ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත ඉවත් කරලා, ඒ වෙනුවට Counter Terrorism Act එක ගෙන ඒම සඳහා දැන් කෙටුම්පත සකස් කරගෙන යනවා.

ගරු අධිකරණ ඇමතිතුමා විසින් ලබන අවුරුද්දේ මුල් සැසි වාරවලදී ඒ කෙටුම්පත පාර්ලිමේන්තුවේ සභාගත කරාවි. මේක ජාත්‍යන්තර වශයෙනුත් මතු වෙච්ච ප්‍රශ්නයක්. මම ඒක අතිරේක කාරණයක් හැටියටයි සඳහන් කළේ.

ගරු විපක්ෂ නායකතුමනි. ඔබතුමා මතු කරපු මේ ප්‍රශ්නය මම විෂය භාර ඇමතිවරයාට යොමු කරන්නම්. රැඳවුම් නියෝග අනුව රඳවා තබන්න පුළුවන් දින 90යි. ඊට පසු ඕනෑ නම් තවත් නීතිමය ක්‍රියාමාර්ග තිබෙනවා. පසුගිය සතියේ ශ්‍රේෂ්ඨාධිකරණයෙන් නියෝගයක් දුන්නා ඔවුන් මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කරන්න කියලා. ඔවුන් මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කරපු බව මම මාධ්‍ය තුළින් දැක්කා. ඒ පිළිබඳව නීතිමය කටයුතු කෙරිගෙන යනවා. ඔබතුමා මතු කළ කාරණය මහජන ආරක්ෂක අමාත්‍යවරයාගේ විෂය පථයට අයත් කාරණයක් නිසා, මම ඔබතුමාගේ ඉල්ලීම එතුමාට යොමු කරන්නම්.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු ඇමතිතුමනි, කරුණාකර මේ සභාවට හෙළිදරව් කරනවාද සිරිධම්ම හාමුදුරුවෝ සහ වසන්ත මුදලිගේ කරපු ත්‍රස්තවාදී ක්‍රියාව මොකක්ද කියලා? මොකක්ද, ඔවුන් කරපු ත්‍රස්තවාදී ක්‍රියාව?

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, යම්කිසි කෙනෙක් මහේස්ත්‍රාත් අධිකරණයට හෝ වෙනත් අධිකරණයකට ඉදිරිපත් කර රඳවා ගෙන සිටිනවා නම් හෝ රිමාන්ඩ් බන්ධනාගාරගත කර තිබෙනවා නම්, ඒ පිළිබඳ තොරතුරු දෙන්න පුළුවන් වෙන්නේ, අදාළ පොලීසිය විසින් ඉදිරිපත් කරන "B" වාර්තාව සහ ඊට ආනුෂංගික අතුරු වාර්තා අනුවයි. ඒ නිසා අද මට මේ සම්බන්ධයෙන් පිළිතුරක් දෙන්න බැහැ. ඒ සඳහා මට කාලයක් අවශ්‍යයි. විෂය භාර ඇමතිතුමාට මේ පිළිබඳව දැනුම් දීලා තොරතුරු ලබා ගෙන තමයි ඒකට පිළිතුරක් දෙන්න වෙන්නේ.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)

ගරු කථානායකතුමනි, ගරු ඇමතිතුමා මේ කාරණය සම්බන්ධයෙන් කථා කරපු නිසා එතුමාගේ දැනුවත් වීම සඳහායි මම මේ කාරණය කියන්නේ. ගරු ඇමතිතුමනි, අන්තර් විශ්වවිද්‍යාල ශිෂ්‍ය බලමණ්ඩලයේ කැඳවුම්කරු වසන්ත මුදලිගේ මහත්මයාවත්, සිරිධම්ම ස්වාමීන් වහන්සේත් අත්අඩංගුවට ගත්තාට පසුව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිසම ඒ පිළිබඳව පරීක්ෂණයක් කළා.

ඔවුන් පරීක්ෂණයක් කර සති දෙකකට කලින් වාර්තාවක් ඉදිරිපත් කර කිව්වා, "ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ ඒ අයව අත්අඩංගුවට ගැනීමට කිසිදු ආකාරයක පදනමක් නැහැ. අත්අඩංගුවට ගන්නවා නම් මේ තිබෙන සාමාන්‍ය නීතිය හොඳටම ප්‍රමාණවත්" කියලා. ඒ කියන්නේ, මානව හිමිකම් කොමිසම පැහැදිලිව කියා තිබෙනවා ඉතාම අසාධාරණ, අයුතු ක්‍රියාවක් තමයි මේ ආණ්ඩුව කරලා තිබෙන්නේ කියලා. මානව හිමිකම් කොමිසමේ වාර්තාව අද වෙනකොට ජාත්‍යන්තරයේත් කථා බහට ලක් වෙලා තිබෙනවා. ඒ නිසා, අපි ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා වහාම මේකට මැදිහත් වෙන්න කියලා. මොකද, රටේ ගෞරවය අද වෙනකොට කෙලෙසිලා ඉවරයි. තවත් එහෙම වෙන්න දෙන්න එපා කියලා අපි ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

අමාත්‍යාංශ නිවේදන, ගරු මුදල් රාජ්‍ය ඇමතිතුමා.

## රාජ්‍ය ආයතන පිළිබඳ වාර්තාව: මුදල් රාජ්‍ය අමාත්‍යතුමාගේ ප්‍රකාශය
## அரச நிறுவனங்கள் பற்றிய அறிக்கை: நிதி இராஜாங்க அமைச்சரினது கூற்று
## REPORT ON GOVERNMENT ENTITIES: STATEMENT BY STATE MINISTER OF FINANCE

**ගරු රංජිත් සියඹලාපිටිය මහතා (මුදල් රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு ரன்ஜித் சியம்பலாபிடிய - நிதி இராஜாங்க அமைச்சர்)
(The Hon. Ranjith Siyambalapitiya - State Minister of Finance )

ගරු කථානායකතුමනි, පසුගිය අය වැය කථාවේදී ගරු ජනාධිපති රනිල් වික්‍රමසිංහ මැතිතුමා මුදල් අමාත්‍යවරයා ලෙස මෙම ගරු සභාවට ප්‍රකාශ කළ පරිදි, රජයට අයත් ආයතන සියල්ලේම ලේඛනයක් අප සකස් කළා. එහි සාරාංශය මෙසේයි.

| **වර්ගය** | **සංඛ්‍යාව** |
|---|---|
| විශේෂ වියදම් ඒකක | 19 |
| අමාත්‍යාංශ | 29 |
| දෙපාර්තමේන්තු | 99 |
| දිස්ත්‍රික් ලේකම් කාර්යාල | 25 |
| ප්‍රාදේශීය ලේකම් කාර්යාල | 341 |
| පළාත් සභා | 09 |
| රාජ්‍ය ව්‍යාපාර ඇතුළුව රාජ්‍ය හිමිකාරත්වය සහිත ආයතන | 420 |
| පළාත් පාලන ආයතන | 341 |
| **එකතුව** | **1,283** |

වර්ගීකරණය කරන ලද ඒ ඒ ආයතන පිළිබඳව මෙම ලේඛනයේ පැහැදිලිව සඳහන් කර ඇති අතර, රාජ්‍ය මුදල් පාලනය පිළිබඳ උත්තරීතර බලය හිමි පාර්ලිමේන්තුවට රජය සතු සියලු ආයතනවල විස්තරාත්මක ලේඛනයක් ප්‍රථම වතාවට ඉදිරිපත් කිරීම ඉතා වැදගත් යැයි සලකමින් මෙම ලේඛනය මම **සභාගත*** කරනවා. බොහොම ස්තුතියි.

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රධාන වැඩ කටයුතු. න්‍යාය පත්‍රයේ විෂය අංක 01, විසර්ජන පනත් කෙටුම්පත - 2023, තෙවන වෙන් කළ දිනය.

විවාදය ආරම්භ කිරීම, ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මැතිතුමා.

## විසර්ජන පනත් කෙටුම්පත, 2023
## ஒதுக்கீட்டுச் சட்டமூலம், 2023
## APPROPRIATION BILL, 2023

***කල් තබන ලද විවාදය තවදුරටත් පවත්වනු පිණිස නියෝගය කියවන ලදී.***
***ඊට අදාළ ප්‍රශ්නය - [ නොවැම්බර් 14 ]***
***"පනත් කෙටුම්පත දැන් දෙ වන වර කියවිය යුතු ය." - [ගරු රනිල් වික්‍රමසිංහ මහතා]***
***ප්‍රශ්නය යළිත් සභාභිමුඛ කරන ලදී.***

*ஒத்திவைக்கப்பட்ட விவாதம் மீளத் தொடங்குதற்கான கட்டளை வாசிக்கப்பட்டது.*
*சம்பந்தப்பட்ட வினா - [நவம்பர் 14]*
*"சட்டமூலம் இப்பொழுது இரண்டாம்முறை மதிப்பிடப்படுமாக." - [மாண்புமிகு ரணில் விக்கிரமசிங்ஹ]*
*வினா மீண்டும் எடுத்தியம்பப்பட்டது.*

*Order read for resuming Adjourned Debate on Question - [14th November]*
*"That the Bill be now read a Second time."- [The Hon. Ranil Wickremesinghe]*
*Question again proposed.*

[පූ.භා. 10.01]

**ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, ලෝක ඉතිහාසයේ ප්‍රථම වතාවට රට බංකොලොත් කරපු ආණ්ඩුවක් අය වැය ඉදිරිපත් කරනවා. ලෝකයේ හැම රටකම සිදු වන්නේ ආණ්ඩුව කරලා රට බංකොලොත් කළ අය ආණ්ඩුව දාලා යන එකයි. නමුත්, අපේ රටේ මොකක්ද වෙන්නේ? බංකොලොත් කරපු ආණ්ඩුවක් අය වැය ඉදිරිපත් කරනවා. මේක නේ විහිළුව! මෙහෙම කරන්න පුළුවන්ද? ලෝකයේ කොහේවත් රටක මෙහෙම දෙයක් වෙලා නැහැ. ආත්ම ගරුත්වය තිබෙනවා නම් කරන්න ඕනෑ, ඉල්ලා අස් වෙන එකයි. මම පොහොට්ටුවේ මන්ත්‍රීවරුන්ට දොස් කියන්නේ එසේ නොකරන නිසා.

ගරු කථානායකතුමනි, ළඟදී එංගලන්තයේ වෙච්ච සිද්ධියක් මා කියන්නම්. ඔබතුමා දන්නවා, Liz Truss අගමැතිතුමිය පිළිබඳව. අගමැති වුණාම එතුමිය මුදල් ඇමතිවරයා හරහා බ්‍රිතාන්‍යයේ ලොකු සමාගම්වලට විශාල වශයෙන් බදු සහන දුන්නා - Pounds Sterling 45 billion. මොකක්ද, බ්‍රිතාන්‍ය පාලක පක්ෂය කළේ? බ්‍රිතාන්‍ය පාලක පක්ෂය එතුමියගෙන් ඇහුවා, "ලොකු සමාගම්වලට දැන් බිලියන 45ක බදු සහන දීලා තිබෙනවා. ඒ මුදල්වලින් තමයි ඉස්කෝල, ඉස්පිරිතාල නඩත්තු කරන්නේ. ඒ මුදල් හොයාගන්නේ කොහෙන්ද?" කියලා. මොකක්ද එතුමිය කිව්වේ? "මම ණයක් ගන්නවා" කිව්වා. ණය ගත්තාම උද්ධමනය වැඩි වෙනවා. කොන්සර්වේටිව් පක්ෂයේ මන්ත්‍රීවරු එතුමියට කිව්වා, "ඉල්ලා අස් වෙන්න" කියලා. ලංකාවේ මොකක්ද වුණේ? 2019 ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාගේ ආණ්ඩුව ලොකු සමාගම්වලට රුපියල් බිලියන 800ක බදු සහන දුන්නා.

එදා ආණ්ඩුව පැත්තේ හිටපු ඔය කවුරුවත් ඒ ගැන කථා කළාද? එක්කෙනෙක්වත් නැඟිටලා ඇහුවාද, "ඇයි මේ බදු සහන දෙන්නේ?" කියලා. මේ කථා කරන වෙලාවේවත් මේ ගරු සභාවේ මුදල් ඇමතිවරයා නැහැ. මුදල් රාජ්‍ය ඇමතිවරයා හෝ දැන් ඉන්නවාද?

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
එතුමා ඉඳලා ගියා.

**ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)
ඒක තමයි. මේ ගරු සභාවේ දැන් මුදල් ඇමතිවරයාත් නැහැ, නියෝජ්‍ය ඇමතිවරුත් නැහැ, රාජ්‍ය ඇමතිවරුත් නැහැ. ආණ්ඩුවේ මන්ත්‍රීවරු 10දෙනෙක් විතර ඉන්නවා. එංගලන්තයේ කොන්සර්වේටිව් පක්ෂයේ මන්ත්‍රීවරුන් එරට අගමැතිවරයාගෙන් ඇහුවා වාගේ, "ඇයි, මේ රුපියල් බිලියන 800ක බදු සහන දුන්නේ?" කියලා මේ රටේ ජනාධිපතිතුමාගෙන් අහන්න තරම් කොන්දක් එදා පොහොට්ටුවේ එක මන්ත්‍රීවරයෙකුටවත් නොතිබුණේ ඇයි කියා මම අහනවා. කවුරුවත් එහෙම ඇහුවේ නැහැ. අපේ රට ප්‍රපාතයට ඇද වැටුණේ එදා. අපි ඒකෙන් පාඩම් ඉගෙන ගන්න ඕනෑ. පොහොට්ටුවේ වියතුන් කියලා පිරිසකුත් හිටියා. ඒ අයත් කට වහගෙනයි හිටියේ. අපි ඒ ගැන කනගාටු වෙනවා.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
"වියත්මග".

**ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)
ඔව්, "වියත්මග". අන්තිමට ජනතාව පාරට බැහැලා තමයි ගෝඨාභය මහත්මයා එළෙව්වේ. ඔය පැත්තේ අය කටවත් ඇරියේ නැහැ. ගරු කථානායකතුමනි, එදා බදු සහන දෙනකොට අහන්න තිබුණා නේ, "ඇයි, මේ බදු සහන දෙන්නේ?" කියලා. ඔබතුමා ඇහුවේත් නැහැ. විපක්ෂයේ මන්ත්‍රීවරයකුට දෙන්න තිබුණු, රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ සභාපති ධුරයත් ඔබතුමා ස්ථාවර නියෝග අත් හිටුවා ආණ්ඩුවට දුන්නා. රට බංකොලොත් වෙනවා කියන කාරණය අවුරුදු 2ක් යනකල් ආණ්ඩුව හැංගුවා. අපට රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ සභාපතිකම දීලා තිබුණා නම්, අපි කියනවා 2020 දී IMF එකට යන්න කියලා. *[බාධා කිරීමක්]* තමුන්නාන්සේලා කොටස්කාරයෝ.

ගරු කථානායකතුමනි, එහෙම නම්, අද අපේ රටට අලුත් ආණ්ඩුවක් ඕනෑ. අලුත් ආණ්ඩුවක පිපාසයෙන් ජනතාව ඉන්නේ. ඒකට ඉඩ දෙන්න. අලුත් ආණ්ඩුවක් අවශ්‍යයි. ඒ සඳහා මාර්ගය සකස් කරන්න.

**ගරු චාමර සම්පත් දසනායක මහතා (ප්‍රාථමික කර්මාන්ත රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க - ஆரம்பக் கைத்தொழில் இராஜாங்க அமைச்சர்)
(The Hon. Chamara Sampath Dasanayake - State Minister of Primary Industries)
පිපාසයි.

**ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)
ඔව්, පිපාසයෙන් ඉන්නේ. ඒක තමයි ඇත්ත. පාරට බැහැලා බලන්න.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
එතුමාට හම්බ වුණා නේ, රාජ්‍ය ඇමතිකමක්.

**ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)
සමීක්ෂණ ප්‍රතිඵල අනුව ආණ්ඩුවට ජනතා සහයෝගය තිබෙන්නේ සියයට 3යි.

**ගරු එස්.එම්. මරික්කාර් මහතා**
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
ඡන්දය තියලා බලමු.

**ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)
ඔව්, ඡන්දය තියලා බලමු. *[බාධා කිරීම්]* ගරු කථානායකතුමනි, දැන් ආණ්ඩුව ලෝකය වටේ යනවා, ණය reschedule කරන්න කියලා. චීනය, ඉන්දියාව, ජපානය වගේ රටවලට හිහමනේ යනවා, ණය reschedule කරන්න කියලා. හැබැයි, අපේ රටේ බැංකුවලින් ණය අරන් තිබෙන රාජ්‍ය සේවකයන්ගේ, පෞද්ගලික අංශයේ සේවකයන්ගේ, පොදු ජනතාවගේ ණය reschedule කරන්න බැංකුවලින් මැළිකමක් දක්වනවා. ඇයි ඒ? ආණ්ඩුව ණය reschedule කරන්න කියලා ලෝකය වටේ යනවා නම්, අපේ රටේ බැංකුවලින් ණය අරන් තිබෙන අයගේ ණය reschedule කරලා කාලය දීර්ඝ කරන්නේ නැත්තේ ඇයි? මේවා තමයි ජනතාව අපෙන් අහන ප්‍රශ්න. මම අද සංඛ්‍යාලේඛන ගැන කථා කරන්නේ නැහැ. මම අද කථා කරන්නේ ජනතාවට තිබෙන ප්‍රශ්න ගැන. එම නිසා මම මුදල් ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා, ණය reschedule කරන එක කරන්න කියලා. බැංකු හොඳට හම්බ කරනවා. බැංකුවලට වාර්තාගත ලාභ ලැබෙනවා. ඒකට හේතුවක් තිබෙනවා. මොකද, රජය මුදල් ලබා ගන්නේ බැංකුවලින්. එම නිසා ජනතාව තලා පෙළා හරි ආණ්ඩුව ඒ ආධාර ගන්න උත්සාහ කරනවා.

ගරු කථානායකතුමනි, අද පෙනෙනවා නේ, රාජ්‍ය අංශය අසාර්ථක බව. කවුද, මේ රාජ්‍ය අංශය බිහි කළේ? කවුද, අවශ්‍ය ප්‍රමාණයට වඩා රාජ්‍ය අංශයේ රැකියා දුන්නේ? කවුද, සංස්ථා බිහි කළේ?

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
කවුද?

**ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)
කවුද කියලා ඔබතුමා දන්නවා.

අද රාජ්‍ය අංශය සම්පූර්ණයෙන් අසාර්ථකයි. ඕනෑම රටක පෞද්ගලික අංශය තමයි රටේ ආර්ථිකය මෙහෙයවන්න ඕනෑ. ගරු කථානායකතුමනි, ඔබතුමාත් ඒ කාරණය පිළිගන්නවා ඇති. මොකද, ඔබතුමාත් තේ වතු තිබෙන කෙනෙක්. ආණ්ඩුව අවුරුදු ගණනාවක් රාජ්‍ය අංශය බදාගෙන හිටියා නේ. සංස්ථා, ජනසතු ව්‍යාපාර ඒ ඔක්කෝම අසාර්ථකයි. නමුත්, මේ අය වැයෙන් පෞද්ගලික අංශයට මොනවා ද දීලා තිබෙන සහන? පෞද්ගලික අංශයට කිසිම සහනයක් දීලා නැහැ. අපනයනකරුවන්ට පනවා තිබෙනවා, සියයට 30ක බද්දක්. ඒ හැම අංශයකම බද්ද සියයට 14 ඉඳලා සියයට 30 දක්වා ඉහළ දමා තිබෙනවා. අපනයනකරුවන් විනාශ කරන දෙයක් නේ මේ කරන්නේ.

ගරු කථානායකතුමනි, දැන් මා ළඟ තිබෙනවා, "The Island" පුවත් පතේ පළ වූ, ධම්මික සමරවික්‍රම මහතා කරපු ප්‍රකාශයක් ඇතුළත් ලිපියක්. ඒ මහත්මයා කියනවා, "50% of factories are closed " කියලා; ෆැක්ටරිවලින් සියයට 50ක් වහලා ලු. ඒ පුවත් පත සඳහන් කරනවා, "About 50% of factories had been closed and the others were operating at suboptimal levels, Dhammika Samarawickrama, head of the Micro Electric International (Pvt.) Ltd. said during a TV interview..." යනුවෙන්.

අනෙක් ඒවා සාමාන්‍යයෙන් පවත්වාගෙන යනවා ලු. මේක තමයි තත්ත්වය. එතුමා කියනවා, බැංකුවලින් ණය ගන්න ගියාම පොලිය වැඩියි, ණය ලබා දීම ප්‍රමාද කරනවා කියලා. රට ගොඩ ගන්න ඕනෑ නම් රාජ්‍ය අංශය පුළුල් කරලා වැඩක් වෙන්නේ නැහැ. ගරු කථානායකතුමනි, පෞද්ගලික අංශය පඩි ගෙවන්නේ කොහොම ද? ව්‍යාපාරය හම්බ කරලා නේ පඩි ගෙවන්නේ. නමුත්, රාජ්‍ය අංශය පඩි ගෙවන්නේ සල්ලි අච්චු ගහලා. ඒක බොහොම ලෙහෙසි වැඩක්. ආණ්ඩුවට සල්ලි නැති වුණාම සල්ලි අච්චු ගහලා පඩි ගෙවනවා. පෞද්ගලික අංශයේ අයට සල්ලි අච්චු ගහන්න බැහැ නේ. ඒ ගොල්ලන් හම්බ කරලා ගෙවන්න ඕනෑ. එහෙම නම්, කවුද රටට දායකත්වය දෙන්නේ? රට ගොඩ ගන්න නම්, අප දෙගොල්ලන්ම එකතු වෙලා පෞද්ගලික අංශයට අවශ්‍ය දිරි දීමනා දෙන්න ඕනෑ කියලායි මා හිතන්නේ. පෝලිම් ටිකක් අඩු වෙලා තිබෙන නිසා ආණ්ඩුව දැන් හිතාගෙන ඉන්නේ 'ඔක්කෝම හරි' කියලා. මම ආණ්ඩුවට අනතුරු ඇඟවීමක් කරනවා. 'ඔක්කෝම හරි' කියන හැඟීම එන්නේ දැන් ණය ගෙවන්නේ නැති නිසා. *[බාධා කිරීමක්.]* ගරු කථානායකතුමනි, I want your attention. - [*Interruption*.] I want the Hon. Speaker's attention. Do not disturb him. මොකද, ගරු කථානායකතුමාත් පිළිගන්නවා, මා කියන කාරණය. ගරු කථානායකතුමනි, ආණ්ඩුව ණය ගෙවන එක දැන් නවත්වලා නේ. ලෝකයට කට ඇරලා කිව්වා නේ, "අපි බංකොලොත්!" කියලා. පසුගිය අවුරුදු 100ටම ලෝක ඉතිහාසයේ රටවල් හතයි කිව්වේ, "අපි බංකොලොත්!" කියලා.

ලංකාව එයින් එක රටක්. ලජ්ජා නැද්ද? මේ, දේශානුරාගයෙන් ආපු අය. දැන් මම කියාගෙන ආවේ මේකයි. අපි දැන් ණය ගෙවන එක නවත්වලා තිබෙන්නේ. ණය ගෙවන එක නවත්වලා නිසා දැන් ආණ්ඩුව අතේ සල්ලි තිබෙනවා. ඒවායින් තමයි මේ වැඩ ඔක්කොම කරන්නේ. හැබැයි, ණය ගෙවන්න පටන් ගත්තාට පස්සේ ඇති වන තත්ත්වය මොකක්ද? අවුරුද්දකට අපට US Dollars 12 billion අවශ්‍යයි. ඒ, ඩොලර් බිලියන හයක් කෑමට සහ ඉන්ධනවලට, අනෙක් හය ණය ගෙවන්න. ඒක සොයා ගන්නේ කොහොමද? මේ අය වැය ලේඛනය දිහා බැලුවාම අපට පෙනෙනවා, මේ අවුරුද්දට කෑමටයි, ණය ගෙවන්නයි ඇමෙරිකානු ඩොලර් බිලියන 12ක් - US Dollars 12 billion - සොයා ගන්නේ කොහොමද කියලා නම් මේකේ නැහැ කියලා; මේ පොතේ නම් නැහැ. මේවා තමයි අපට තිබෙන ප්‍රශ්න. මුදල් රාජ්‍ය ඇමතිතුමනි, ලබන අවුරුද්දට මේ US Dollars 12 billion සොයා ගන්නේ කොහොමද? අවුරුද්දකට ඇමෙරිකානු ඩොලර් බිලියන 12ක් ඕනෑ. ඩොලර් බිලියන හයක් ඉන්ධන ඇතුළු අත්‍යවශ්‍ය භාණ්ඩවලට, ඉතිරි ටික ණය ගෙවන්න. කොහොමද ඒ මුදල් සොයා ගන්නේ, මුදල් රාජ්‍ය ඇමතිතුමනි?

**ගරු රංජිත් සියඹලාපිටිය මහතා**
(மாண்புமிகு ரன்ஜித் சியம்பலாபிடிய)
(The Hon. Ranjith Siyambalapitiya)
ඔබතුමාට පැහැදිලි පිළිතුරක් පසුව ලබා දෙන්නම්.

**ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)
දැන් පිළිතුරක් ඕනෑ. ඔබතුමා මුදල් රාජ්‍ය ඇමති නේ.

**ගරු රංජිත් සියඹලාපිටිය මහතා**
(மாண்புமிகு ரன்ஜித் சியம்பலாபிடிய)
(The Hon. Ranjith Siyambalapitiya)
ඔබතුමා දැන් එකපාරටම මේ ප්‍රශ්නය අහනවා. මම මේ ගැන සොයා බලලා -

**ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)
එක පාරට තමයි අහන්නේ.

**ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා**
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M. Ranjith Madduma Bandara)
එක පාරට තමයි වැටුණේ.

**ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)
කුරුමානම් අල්ලන්න ඕනෑ නැහැ.

**ගරු රංජිත් සියඹලාපිටිය මහතා**
(மாண்புமிகு ரன்ஜித் சியம்பலாபிடிய)
(The Hon. Ranjith Siyambalapitiya)
ඔබතුමා එක පාරට කොළයක් බලාගෙන -

**ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා**
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M. Ranjith Madduma Bandara)
දෙපාරට අහන්න බැහැ නේ.

**ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)
මම අහපු ප්‍රශ්නයට උත්තරය ඔබතුමාගේ දිව අග තිබෙන්න ඕනෑ. අපට අවුරුද්දකට - *[බාධා කිරීමක්]* හා, හොඳයි, හොඳයි. පස්සේ කියන්න කෝ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
එතුමාගේ කථාව ඉවර වුණාම ඔබතුමා පිළිතුරු දෙන්න. *[බාධා කිරීමක්]*

**ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)
අහලා කියන්න.

**ගරු රංජිත් සියඹලාපිටිය මහතා**
(மாண்புமிகு ரன்ஜித் சியம்பலாபிடிய)
(The Hon. Ranjith Siyambalapitiya)
ගරු කථානායකතුමනි, ඩොලර් බිලියන 12ක් හොයන්නේ කොහොමද කියලා එතුමා එකපාරටම මගෙන් අහනවා. කරුණාකර ඒකට මට පොඩි වෙලාවක් දෙන්න. තව ටික වෙලාවකින් එතුමා අහන්න පුළුවන්, තව ඩොලර් බිලියන පහක් සොයන්නේ කොහොමද කියලා. මේ ගරු සභාවේ අපි වගකීමෙන් උත්තර දෙන්න ඕනෑ.

**ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)
මම කනගාටු වෙනවා. ගරු කථානායකතුමනි, මගේ හිතේ එතුමාට යම් ගරු කිරීමක් තිබෙනවා. නමුත් එතුමා ලබා දුන් පිළිතුර ගැන මම කනගාටු වෙනවා. මොකද, මේවා දිව අග තිබෙන්න ඕනෑ පිළිතුරු. දිව අග තිබෙන්න ඕනෑ. ගරු කථානායකතුමනි, මේ මුදල ලබන අවුරුද්දට විතරක් නොවෙයි, 2025 වෙනකම් අපට ඕනෑ. 2025 වෙනකම් අවුරුද්දකට US Dollars 12 billion ඕනෑ. ඒක සොයන්නේ කොහොමද කියලා මේ අය වැය පොතේ නම් නැහැ. ඒවා තමයි ජනතාව අහන ප්‍රශ්න. මුදල් රාජ්‍ය ඇමතිතුමා දුන් පිළිතුරෙන්ම පෙනෙනවා නේ, ආණ්ඩුවට උත්තර නැහැ කියලා. හැබැයි, අලුත් ආණ්ඩුවක් ආවොත් මීට වඩා - මේ ආණ්ඩුවට වඩා - අපට ජාත්‍යන්තර සහයෝගය ලැබෙනවා. *[බාධා කිරීමක්]*

මොකද, අපට තානාපතිවරු කියලා තිබෙනවා නේ. අපේ රටේ ඉතිහාසයේ ප්‍රථම වතාවට, මේ ආණ්ඩුව ආර්ථික අපරාධ - economic crimes - කරලා තිබෙනවා කියලා එක්සත් ජාතීන්ගේ සංවිධානයේ දැන් සටහන් වෙලා තිබෙනවා. මම දන්නේ නැහැ, ඒකට අධිකරණ ඇමතිතුමා මොන වාගේ උත්තරයක් දුන්නාද කියලා. මොකද, එතුමා අපේ පැත්තෙත් හිටියා; ආණ්ඩුව පැත්තෙත් හිටියා. ආර්ථික අපරාධ කරනකොටත් හිටියා; ආර්ථික අපරාධ නොකරනකොටත් හිටියා. ගරු කථානායකතුමනි, ආණ්ඩුව ආර්ථික අපරාධ කරනවා කියලා එක්සත් ජාතීන්ගේ සංවිධානයෙන් කිව්වාම අනෙක් රටවල් අපට උදවු කරයිද? උදවු කරන්නේ නැහැ නේ. ආණ්ඩුවට අවුරුද්දකට US Dollars 12 billion හොයා ගන්න බැරි වුණාම මොකක්ද කරන්නේ? ජනතාවට බදු ගහනවා. පෙරේදා රනිල් වික්‍රමසිංහ මැතිතුමා ගැසට් එකක් නිකුත් කර තිබුණා, ආනයනය කරන භාණ්ඩ 630ක සෙස් බද්ද වැඩි කරලා. ගරු කථානායකතුමනි, අද උදේ නුවර මගේ හිතවතෙක් මට WhatsApp message එකක් එවා තිබුණා. ඒ, එක item එකක් පිළිබඳව විතරයි. බලන්න, පාසල් උපකරණ සියයට 300කින් වැඩි වෙලා. රුපියල් 10කට තිබුණු පැන්සල අද රුපියල් 40යි. කටර්, පෑන් රුපියල් 180යි. ඒ වාගේම අද උදේ මට කෙනෙක් කිව්වා, CR පොතක් රුපියල් 800යි කියලා. රුපියල් 800යි! මේ වෙලාවේ ගැලරියේ ඉඳගෙන පාසල් දරුවෝ බලාගෙන ඉන්නවා. අපට වඩා දරුවෝ ඒ ගැන දන්නවා. ඇත්ත වශයෙන්ම අපි මෙහෙම කථා කරනවාට දරුවන් අත්පුඩියක් ගහන්න ඕනෑ. අත්පුඩියක් ගහන්න.

**ගරු රංජිත් සියඹලාපිටිය මහතා**
(மாண்புமிகு ரன்ஜித் சியம்பலாபிடிய)
(The Hon. Ranjith Siyambalapitiya)
ගරු කථානායකතුමනි, ඒ පිළිබඳව පොඩි පැහැදිලි කිරීමක් කරන්න මට විනාඩි දෙකතුනක් දෙන්න.

ඒක ඉතා ලොකු චෝදනාවක්. ගරු කථානායකතුමනි, සෙස් බද්දක් දාන්නේ විශේෂයෙන්ම මේ රටේ ආදේශන තිබෙන, නමුත් විදේශවලින් ගෙනෙන උපකරණ සඳහා. මේ සෙස් බද්ද නිසා ආහාර ද්‍රව්‍යවල මිල වැඩි වෙනවා කියලා ඊයේ ඉතා වැරදි විධියට සඳහන් කර තිබුණා, මම දැක්කා. අපි ආහාරවලට කිසිසේත්ම සෙස් බද්දක් පනවා නැහැ. නමුත් මේ රටේ නිෂ්පාදනය කරන්න පුළුවන් ඇක්සයිස් පොත වෙන්න පුළුවන්; පැන්සල වෙන්න පුළුවන්, අපට තිබෙන විනිමය හිඟයත් එක්ක මේ රටට ගෙන්වන එවැනි භාණ්ඩ 2,000ක් එකවර නවත්වන්න වුණා. ඉතින්, මේ වාගේ මේ රටේ නිෂ්පාදනය කරන්න පුළුවන් භාණ්ඩ පිට රටින් ගේනකොට අපි සෙස් බද්දක් පනවලා, මේ රටේ නිෂ්පාදකයාට ඒකෙන් උදවු කරනවා. පිට රටින් ගෙනෙන ඒ භාණ්ඩයක මිල කියමින් ගරු මන්ත්‍රීතුමා මේ වෙලාවේ සභාව භය කරන්න හදනවා. සෙස් බද්දක් දාන්නේ මේ රටේ නිෂ්පාදන ආරක්ෂා කර ගන්න, ගරු කථානායකතුමනි.

**ගරු වීරසුමන වීරසිංහ මහතා**
(மாண்புமிகு வீரசுமன வீரசிங்ஹ)
(The Hon. Weerasumana Weerasinghe)
Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔව්, ගරු වීරසුමන වීරසිංහ මන්ත්‍රීතුමා.

**ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)
මගේ වෙලාව නම් ගන්න එපා.

**ගරු වීරසුමන වීරසිංහ මහතා**
(மாண்புமிகு வீரசுமன வீரசிங்ஹ)
(The Hon. Weerasumana Weerasinghe)
ගරු කථානායකතුමනි, මම හිතන්නේ මුදල් රාජ්‍ය ඇමතිතුමා කියපු කාරණය අසත්‍යයක්. මොකද, පිට රටින් ගෙනෙන භාණ්ඩවලට තමයි සෙස් බද්ද ගහලා තිබෙන්නේ. පාසල් පොත් නිෂ්පාදනයට භාවිත කරන කඩදාසිවලින් සියයට 75ක් ආනයනය කරනවා. අනෙක් පාසල් උපකරණවලිනුත් සියයට 50ක් ආනයනය කරනවා. ඒ නිසා මේ පාසල් උපකරණ සෙස් බද්දෙන් ඉවත් කරන්න විශේෂ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්න. නැත්නම්, ජනවාරි මාසයේ අලුතින් පාසල් වාරය පටන් ගන්නකොට ගම්බද ඈත පාසල්වල දරුවන් අසරණ වෙනවා. දරුවන් දෙතුන් දෙනා සිටින පවුල් අද අන්ත අසරණ වෙලා සිටිනවා. ලංකාවේ කර්මාන්ත දියුණු වෙන එක හොඳයි. නමුත් ඒ කර්මාන්ත දියුණු වෙනතුරු මේ පාසල් උපකරණ සඳහා සහනයක් ලබා දෙන්න යම් වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මුදල් රාජ්‍ය ඇමතිතුමා, ඒ සම්බන්ධයෙන් උත්තරයක් දෙනවාද?

**ගරු රංජිත් සියඹලාපිටිය මහතා**
(மாண்புமிகு ரன்ஜித் சியம்பலாபிடிய)
(The Hon. Ranjith Siyambalapitiya)
එතැන point of Order එකක් තිබෙනවාද කියලා මා දන්නේ නැහැ, ගරු කථානායකතුමනි. කොහොම වුණත්, ලංකාවේ නිෂ්පාදනය කරන්න පුළුවන්, පිට රටින් ගෙන්වන ආදේශන සඳහා පමණයි සෙස් බද්ද පනවන්නේ. ඒ සෙස් බද්දෙන් අපට ලැබෙන ආදායමත් අපි යොදවන්නේ ලංකාවේ නිෂ්පාදන ශක්තිමත් කරන්න. ඒ නිසා එතුමා කියන කථාව සත්‍යයක් නොවෙයි කියා මම පැහැදිලිව කියනවා.

**ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, ගරු වීරසුමන වීරසිංහ මන්ත්‍රීතුමා කිව්වා වාගේ මම කියන්නේත් අපේ දරුවන්ගේ අධ්‍යාපනයට අවශ්‍ය උපකරණ සෙස් බද්දෙන් නිදහස් කරන්න කියලා. ඒක තමයි අපේ ඉල්ලීම. ඒ වාගේම වෛද්‍ය උපකරණත් සෙස් බද්දෙන් නිදහස් කරන්න.

**ගරු ජගත් කුමාර සුමිත්‍රාආරච්චි මහතා**
(மாண்புமிகு ஜகத் குமார சுமித்ராரச்சி)
(The Hon. Jagath Kumara Sumithraarachchi)
ගරු කථානායකතුමනි, මටත් විනාඩියක් දෙන්න.

හෙට දවසේ මේ රටේ අනාගතය භාර ගන්නට සිටින දරුවන්ගේ අධ්‍යාපන කටයුතුවලට අවශ්‍ය පාසල් උපකරණවල මිල වැඩිවෙලා තිබෙනවා නම් ඒක වෙනස් කරන්න ඕනෑ, ගරු කථානායකතුමනි. ඒකට මම එකඟයි. හැබැයි, විපක්ෂයේ සිටින පළපුරුදු, කොණ්ඩය පැහුණු නායකයෙක්, අත්පුඩි ගහන්න කියලා ගැලරියේ සිටින පාසල් දරුවන්ට කියනවා නම්, එතුමා වැරැද්දක් කරන්න කියලායි කියන්නේ. ඒක නවත්වන්න කියන්න. සතුටු වෙන්න එපා.

**ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, මගේ කොණ්ඩය පැහිලා තමයි. හැබැයි මම ඩයි දාලා නැහැ. ගරු මහින්ද රාජපක්ෂ මැතිතුමා මට වඩා වැඩිමල්. ආණ්ඩුවේ පළමු පෙළ සිටින ඔක්කොම වාගේ කොණ්ඩයට ඩයි දාලා එන්නේ. මම ඩයි දාලා නැහැ. මට වයස හංගන්න ඕනෑ නැහැ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඩයි මිල වැඩි වෙලා නැහැ නේ. ඔබතුමා දැන් මාතෘකාව අනුව කථා කරන්න.

**ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, ඉස්පිරිතාලවල බෙහෙත් නැහැ. මේ අය වැයෙන් බෙහෙත් හිඟයට කිසිම උත්තරයක් නැහැ. ආහාර නිෂ්පාදනය ගැන වචනයක්වත් සඳහන් වන්නේ නැහැ, මේකේ. පොහොර සහනාධාරය ගැන මේ අය වැයේ වචනයක්වත් සඳහන් වෙලා තිබෙනවාද? පොහොර සහනාධාරය ගැන වචනයක්වත් සඳහන් වෙලා නැහැ. ගරු කථානායකතුමනි, ඒ වාගේම මිල පාලනය ගත්තාම, දැන් මේ රටේ මිල පාලනයක් නැහැ නේ.

මට මතකයි, අපි උසාවි යන කාලයේ හැම සඳුදාම මහනුවර අධිකරණයේ මිල පාලන නඩු අහන දිනය. මම මේ ගැන කිහිප වතාවක්ම කියා තිබෙනවා. මහනුවර නගරයේ වැඩි මිලට බඩු වෙළෙඳාම් කරන ව්‍යාපාරිකයෝ 100දෙනෙක් විතර එදාට උසාවියට ගෙනෙනවා. අද මිල පාලනයක් නැහැ. හිතෙන හිතෙන ගණන් අය කරනවා. ආණ්ඩුව හරියට ක්‍රියාත්මක වෙනවාද කියන එකට හොඳම සාධකය තමයි මිල පාලනය. ආණ්ඩුවක් හරියට ක්‍රියාත්මක වෙනවා නම්, මිල පාලනයක් තිබෙනවා. Public Utilities Commission එක මොනවාද කරන්නේ කියලා මම අහනවා. මොකද, අද භාණ්ඩවලට හිතෙන හිතෙන ගණන් අය කරනවා. සියයට සියයකින්, සියයට දෙසීයකින් භාණ්ඩ මිල වැඩි කරනවා. මිනිස්සුන්ට එල්ලෙන්න වැල් නැහැ. ගරු කථානායකතුමනි, ඔබතුමා ගමක ජීවත් වෙන කෙනෙක් නේ. ඔබතුමා මට වඩා හොඳින් මේ ගැන දන්නවා.

ආණ්ඩුව බදු නොවන ආදායම වැඩි කරන්න යනවා. ඒකෙන් දිළිඳු මිනිස්සුන්ට ප්‍රශ්නයක් ඇති වෙනවා. විවාහයක් රෙජිස්ට්‍රර් කරන්න ගියත්, ගාස්තුව වැඩියි. ඒ, බදු නොවන ආදායම. ඒක සාමාන්‍ය ජනතාවට විශාල ප්‍රශ්නයක්. බලන්න, දැන් අපේ රටේ පුරවැසියන් කොපමණ ප්‍රමාණයක් රට හැර යනවාද කියලා. වියට්නාමයට අපේ රටින් 300දෙනෙක් විතර ගිහින් ඉන්නවා. ඒ ගොල්ලන් කියන්නේ මොකක්ද? "අපිව ලෝකයේ ඕනෑම රටකට යවන්න. ලංකාවට නම් ආපසු යවන්න එපා" කියනවා. ශ්‍රී ලාංකිකයන් හැටියට අපට ලජ්ජාවක් නැද්ද? 300දෙනෙක් විතර වියට්නාමයේ ඉන්නවා, ඒ අය කියනවා, "අපිව ඕනෑම රටකට යවන්න. ලංකාවට නම් යවන්න එපා" කියලා. පසුගිය මාස හය

[ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා]

ඇතුළත වෛද්‍යවරුන් 600දෙනෙක් පමණ පිටරට ගිහින් තිබෙනවා. ඒ, නීත්‍යනුකූලව ගිය ප්‍රමාණය. කී දෙනෙක් හොරෙන් ගිහින් තිබෙනවාද කියා අපට කියන්න බැහැ.

බංකොලොත් වුණු ආණ්ඩුවක් අය වැයක් ඉදිරිපත් කළා. මේක හරියන්නේ නැති වැඩක්. ප්‍රශ්නය ප්‍රමාද කරන එක විතරයි වෙන්නේ; you are only delaying the problem. නමුත් මේ අයට විසඳුමක් දෙන්න බැහැ. කොහොමද, විසඳුමක් දෙන්නේ? ගමට යන්න බැහැ නේ, මේ ගොල්ලන්ට. ගමට ගිහිල්ලා රැස්වීමක් පවත්වන්න කියන්න කෝ. ගරු කථානායකතුමනි, ඕක තමයි දැන් තිබෙන තත්ත්වය. කමක් නැහැ. ඊළඟට, විදුලි ගාස්තු - *[බාධා කිරීමක්]*

**ගරු රංජිත් සියඹලාපිටිය මහතා**
(மாண்புமிகு ரன்ஜித் சியம்பலாபிடிய)
(The Hon. Ranjith Siyambalapitiya)
ගරු මන්ත්‍රීතුමනි, මට තත්පර තිහක් දෙන්න. *[බාධා කිරීමක්]* නැහැ. මට ඔබතුමාගෙන් ප්‍රශ්නයක් අහන්න තිබෙනවා. රාජ්‍ය ආදායම වැඩි කරගන්න ඕනෑය කියා ඔබතුමන්ලාත් පුන-පුනා කියනවා. හැබැයි, මේ හැම එකක්ම වැඩි කළාම සියයට 90ක් විතර ජනතාව තමයි ඒවා ගෙවන්නේ. ඒක ඔබතුමන්ලා ප්‍රශ්නයක් කරගෙන. කරුණාකරලා මට කියන්න, ඔබතුමන්ලාගේ ආණ්ඩුවක් බලයට ආවාම මේ ආදායම සකස් කර ගන්නා විධිය ගැන. "අපිට පිටරටින් එනවා; අරගොල්ලන් උදව් කරනවා" වැනි සරල දේවල් නොවෙයි. ඔබතුමා වගකිව යුතු ජ්‍යෙෂ්ඨයෙක් හැටියට මේ සභාවට කියන්න, කොහොමද - *[බාධා කිරීමක්]*

**ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)
මම කියන්නම්. *[බාධා කිරීමක්]* Hon. (Dr.) Harsha de Silva ඕනෑ නැහැ, මම කියන්නම් කෝ. අපි මොකක්ද ඉස්සෙල්ලාම කරන්නේ? බලන්න, ගරු කථානායකතුමනි, විදෙස්ගත වෙලා ඉන්නා ශ්‍රමිකයන් අපේ රටට සල්ලි එවන්නේ නැහැ නේ. යුද්ධය පැවති කාලයේත් බිලියන අටක් ලැබුණා; Rs. 8,000 million යුද්ධය පැවති කාලයේ ලැබුණා. දැන් ඊට වැඩි ප්‍රමාණයක් එන්න ඕනෑ. යුද්ධය ඉවර වෙලා දැන් අවුරුදු දහයකටත් වැඩියි.

නමුත්, දැන් කීයද එවන්නේ? බිලියනයකටත් අඩු ගණනක් එවන්නේ. අපි ඉස්සෙල්ලාම කරන්න ඕනෑ මොකක්ද? අපි ඒ ශ්‍රමිකයන්ගේ විශ්වාසය දිනාගන්න කටයුතු කරන්න ඕනෑ. අපි Central Bank එක ස්වාධීන කරනවා; Central Bank එක ස්වාධීන කරලා නිදහසේ වැඩ කරන්න පුළුවන් වාතාවරණයක් අපි හදනවා. එතකොට ඒ ගොල්ලන් සල්ලි එවනවා. ඇයි, දැන් ඒ ගොල්ලන් සල්ලි එවන්නේ නැත්තේ? ආණ්ඩුව ආර්ථික අපරාධ කරනවා කියලා එක්සත් ජාතීන්ගේ සංවිධානය කියනකොට අපේ ශ්‍රමිකයන් සල්ලි එවයිද? රාජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා මට උත්තරය කියන්න. විදෙස්ගත ශ්‍රමිකයන් සල්ලි එව්වොත් අපට අවුරුද්දකට රුපියල් බිලියන අටක් - Rs. 8 billion - ගන්න පුළුවන්. එතකොට අපේ ප්‍රශ්නයෙන් භාගයක් ඉවරයි. එතකොට ණය ගෙවන්න ඕනෑ මුදල විතරයි අපට අවශ්‍ය වෙන්නේ. ඕක තමයි උත්තරය. තමුන්නාන්සේලාට බැරි වෙලා තිබෙනවා නේ, විදෙස්ගත ශ්‍රමිකයන්ගේ විශ්වාසය දිනා ගන්න.

**ගරු රංජිත් සියඹලාපිටිය මහතා**
(மாண்புமிகு ரன்ஜித் சியம்பலாபிடிய)
(The Hon. Ranjith Siyambalapitiya)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)
මම උත්තරය දුන්නා. Please do not disturb me.

**ගරු රංජිත් සියඹලාපිටිය මහතා**
(மாண்புமிகு ரன்ஜித் சியம்பலாபிடிய)
(The Hon. Ranjith Siyambalapitiya)
ගරු කිරිඇල්ල මන්ත්‍රීතුමනි, දැන් ඔබතුමා උපකල්පනය කරනවා ඔබතුමන්ලා ආවොත් විදෙස්ගත ශ්‍රමිකයෝ සල්ලි එවයි කියලා. ඇයි, මෙහෙම සිල්ලර, සරල පිළිතුරු මේ ගරු සභාවට දෙන්නේ? ඔබතුමන්ලාට එවැනි උපකල්පනයක්, සිහිනයක් තිබෙනවා. නමුත්, ඒක එහෙම වෙයිද?

**ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, මේක විශ්වාසය නේ. ඕනෑ එකක් වෙන්නේ විශ්වාසය මත නේ. නමුත්, දැන් ඒ ගොල්ලන් මුදල් එවන්නේ නැහැ. ඒ අය මට කථා කරනවා නේ, සල්ලි එවන්නේ නැහැ කියනවා. අපට දිනපතා කථා කරනවා. ඔවුන් සල්ලි එවන්නේ නැහැ. ඒකයි මම කියන්නේ. අපට තානාපතිවරු කියලා තිබෙනවා, "අලුත් ආණ්ඩුවකට අපි උදවු කරනවා" කියලා. ඒ ගොල්ලන්ටත් ඕනෑ, අලුත් ආණ්ඩුවක්. මොකද, පරණ ආණ්ඩුවත් එක්ක ගනුදෙනු කරලා ඒ ගොල්ලන් හොඳට පාඩම් ඉගෙන ගෙන තිබෙන නිසා. ඔබතුමා ජ්‍යෙෂ්ඨයෙක් හැටියට කල්පනා කර බලන්න. දැන් උද්ධමනය සියයට 66යි. නමුත්, උද්ධමනය නැති කරන්න අවශ්‍ය ආයෝජන මේ අය වැය තුළ නැහැ.

ගරු කථානායකතුමනි, මට තව විනාඩි කීයක් තිබෙනවාද?

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමාට වෙන් වූ කාලය අවසානයි. ඔබතුමාට කාලය ඕනෑ නම් තව විනාඩි 5ක් විතර ගන්න.

**ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)
මම ටිකක් වැඩියෙන් බෙදා ගන්නම්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔව්, ඔබතුමා කවදත් එහෙමයි.

**ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)
මම විපක්ෂයේ ප්‍රධාන සංවිධායක නේ. ගරු කථානායකතුමනි, මම විනාඩියෙන් කථාව අවසන් කරන්නම්.

ගරු කථානායකතුමනි, ඔබතුමා ජ්‍යෙෂ්ඨ දේශපාලනඥයකු නිසායි මම මේ කාරණය කියන්නේ. ඔබතුමාට මතක ඇති, 1960 ගණන්වල අපට ආරාධනාවක් ලැබුණා, ASEAN එකට බැඳෙන්න කියලා. අද ASEAN එක තමයි, තුන්වැනි වෙළෙඳ කණ්ඩායම. European Union එකටයි, South American Union එකටයි අමතරව ASEAN එක තමයි third bloc එක; තුන්වැනි ප්‍රබල වෙළෙඳ සංවිධානය. 1960 ගණන්වලදී අපට ආරාධනාවක් ලැබුණා ඒ සංගමයට බැඳෙන්න කියලා. ඒ

ගොල්ලන් අපට application එකකුත් එව්වා, ASEAN එකට බැඳෙන්න කියලා. ඒත් අපි බැඳුණේ නැහැ. එදා හිටපු වමේ පක්ෂය ඒකට විරුද්ධ වුණා.

අද ඒ සංගමය ඉතා බලවත්. අපි වියට්නාමය ගැන කථා කරනවා. මලයාසියාව ගැන කථා කරනවා. ඒ රටවල් දියුණු වුණේ ඇයි? මේ සංගමයට බටහිර රටවල ආයෝජන ආවා. අපි 1960 ගණන්වලදී කර ගත්තේ විශාල වැරැද්දක්. අපට මලයාසියාවේ අගමැතිතුමා ඒකට එන්න කිව්වා. Application එකත් එව්වා. නමුත්, අපි ඒක පිළිගත්තේ නැහැ.

ඊයේ ඉරාන් වික්‍රමරත්න මන්ත්‍රීතුමා කිව්වා, ජනාධිපතිවරුන්ගේ වත්කම් හා බැරකම් ප්‍රකාශ මේ පාර්ලිමේන්තුවට හෙළි කරන්න ඕනෑය කියලා. ගරු කථානායකතුමනි, ඊටත් ටිකක් එහාට ගිහිල්ලා මම ඔබතුමාට මේ කාරණය කියන්න කැමැතියි. අපි පාර්ලිමේන්තු මන්ත්‍රීවරු, අපි අපේ වත්කම් හා බැරකම් ප්‍රකාශ ප්‍රදර්ශනය කරමු. මන්ත්‍රීවරුන්ගේ වත්කම් හා බැරකම් ප්‍රකාශ ඔබතුමාට භාර දෙන එක නොවෙයි කරන්න ඕනෑ. ජනතාවට බලන්න පුළුවන් තැනක ඒවා ප්‍රදර්ශනය කරමු. මම මගේ වත්කම් හා බැරකම් ප්‍රකාශය ඉදිරිපත් කර තිබෙනවා. Transparency International එකෙන් සියලු මන්ත්‍රීවරුන්ට කිව්වා, "වත්කම් හා බැරකම් ප්‍රකාශය එවන්න, අපේ website එකේ දානවා" කියලා. මන්ත්‍රීවරු 15ක් විතර ඒවා එවලා තිබෙනවා. අපි එතැනින් ආදර්ශයක් දෙමු. අර කෙනාට, මේ කෙනාට ඇඟිල්ල දිගු කරන්නේ නැතිව තමා සම්මතයේ පිහිටා අපේ වත්කම් හා බැරකම් අපි හෙළිදරව් කරමු. ගරු කථානායකතුමනි, අපේ වත්කම් හා බැරකම් හෙළි කරන්න Parliament website එක අපට දෙන්න. අපි පාර්ලිමේන්තුවෙන් මේක පටන් ගෙන ආදර්ශයක් දෙමු. මගේ වත්කම් හා බැරකම් ප්‍රකාශය තිබෙනවා, Transparency International එකේ website එකේ. ඕනෑම කෙනෙකුට ඒක බලන්න පුළුවන්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමන්ලා එකතු වෙලා නීතිය වෙනස් කරලා දෙන්න. මම ඉඩ දෙන්නම්.

**ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)
ඔබතුමා යෝජනාවක් ගෙනාවොත් අපි ඒකච්ඡන්දයෙන් සම්මත කරනවා. ඡන්දයක් අරගෙන අපි ඒ යෝජනාව සම්මත කරමු.

මම විශ්වාස කරනවා, මහ බැංකුව ස්වාධීනව වැඩ කරයි කියලා. මොකද, අපි ඩොලර් මිලියන 7,800ක් එක්කයි රට භාර දුන්නේ. ඔබතුමාත් දන්නවා නේ, ඒක. මේ අවුරුද්දේ මැයි මාසයේ තමයි අපි දන්නේ අපේ සංචිත ඇමෙරිකානු ඩොලර් මිලියන 20කට පමණ අඩුවෙලා කියලා. ගරු කථානායකතුමනි, මේ දේවල් අපි දන්නේ නැහැ, පාර්ලිමේන්තුව දන්නේත් නැහැ, ඔබතුමා දන්නේත් නැහැ. ඔක්කෝම හැංගුවා. මහ බැංකුව ස්වාධීන කරන්න ඕනෑ. මහ බැංකුව විතරක් නොවෙයි, විසිඑක්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් දැන් ස්වාධීන කොමිෂන් සභා සියල්ලට ම යම් කිසි ස්වාධීනත්වයක් ලැබෙනවා. අපි ඒකට අවුරුදු තුනක් සටන් කළා. විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගේනකොට මම සංශෝධන 40ක් ඉදිරිපත් කළා. එවකට අධිකරණ ඇමතිවරයා වශයෙන් හිටපු ගරු අලි සබ්රි මහත්මයා ඒ සංශෝධන එකක්වත් පිළිගත්තේ නැහැ. මම උත්සාහ කළේ විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය, දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට කිට්ටු කරන්නයි. හැබැයි, මම කියන්න ඕනෑ විසිඑක්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ආණ්ඩුව ගෙනාවේ කැමැත්තෙන් නොවෙයි කියන එක. ආණ්ඩුව කැමැති වුණේ නැහැ, විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය අහෝසි කරන්න. ආණ්ඩුවට ඕනෑ වුණේ මේ ආයතන ඔක්කෝම තමන්ගේ හස්තය යටතේ තබාගන්න. නමුත්, ජාත්‍යන්තර බලපෑම් නිසා ඒක කරන්න සිද්ධ වුණා. ඒකයි වුණේ. ගරු කථානායකතුමනි, ඔබතුමා ස්ථාවර නියෝග අත්හිටෙව්වා නේ. ඔබතුමා ස්ථාවර නියෝග අත්හිටුවලා,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මම නොවෙයි, ඔබතුමන්ලා සියලු දෙනා එකතු වෙලා ඒක කළේ.

**ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)
ඔබතුමා හැමදාම කියනවා, "මම නොවෙයි" කියලා. න්‍යාය පුස්තකය හදන්නේ ඔබතුමා නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මට එහෙම බලයක් නැහැ.

**ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)
නැහැ, නැහැ. න්‍යාය පුස්තකය හදන්නේ ඔබතුමා නේ. "Standing Orders are suspended" කියලා ඔබතුමා තමයි මූලාසනයේ ඉඳලා කියන්නේ. ඒකට අපි අත උස්සනවා. ඒක වෙනම වැඩක්. බහුතරය ඉන්නේ ඒ පැත්තේ නේ. කමක් නැහැ, ප්‍රමාද වෙලා හෝ ඔබතුමා ඒවා තේරුම් අරගෙන තිබෙනවා. දැන් ආංශික අධීක්ෂණ කාරක සභා පිහිටුවන්න ඔබතුමාට කලබලේ. මේ කටයුතු අවුරුදු 3ක් ප්‍රමාද කළා. ඒත් රට වෙනුවෙන් සහයෝගය දෙන්න අපි සූදානම්.

ස්තුතියි.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා (අග්‍රාමාත්‍ය සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා)**
(மாண்புமிகு தினேஷ் குணவர்தன - பிரதம அமைச்சரும் பொது நிருவாக, உள்நாட்டலுவல்கள், மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சரும்)
(The Hon. Dinesh Gunawardena - Prime Minister and Minister of Public Administration, Home Affairs, Provincial Councils and Local Government)
Sir, I rise to a point of Order.

මම මේ ගරු සභාවේ නැති අවස්ථාවකදී ගරු විපක්ෂ නායකතුමා මම ගැන හා ඊයේ අය වැය විවාදයේදී මම කරපු ප්‍රකාශයක් සම්බන්ධව සඳහන් කරලා තිබෙනවා. ගරු විපක්ෂ නායකතුමා සඳහන් කරන කාරණය අපැහැදිලි කරුණු මත සඳහන් කරන දෙයක් කියලා මම විශ්වාස කරනවා. මම පිළිතුරු දුන්නේ විපක්ෂයේ පළමුවන කථික ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමාටයි. මා ළඟ හැන්සාඩ් වාර්තාව තිබෙනවා. එය කියවා බලන්න. එය කියවා බලා තමයි මා ඊයේ පිළිතුරු දුන්නේ. ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමාගේ කථාවේදී කියනවා, "The

[ගරු දිනේෂ් ගුණවර්ධන මහතා]

US had midterm elections" කියලා. That is a provision in the US Constitution and only one-third of the Senate goes for elections. That is how the US Senate system works. මේ කාරණය සඳහන් කරලා මම ඉතා පැහැදිලිව කිව්වා, එවැනි provision එකක්, එවැනි ඉඩකඩක් ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් ලබා දීලා නැහැ කියලා. ගරු මන්ත්‍රීතුමන්ලා කොණ්ඩ පාට කරලා එනවාය කියලා ලක්ෂ්මන් කිරිඇල්ල මන්ත්‍රීතුමා විහිළුවෙන් වාගේ මන්ත්‍රීවරුන්ගේ වරප්‍රසාද පිළිබඳව ප්‍රශ්නයක් මතු කළා. ඒක විහිළුවක් නිසා හොඳයි. එතුමා පසුගිය හවුල් ආණ්ඩුවේ; රනිල් වික්‍රමසිංහ මැතිතුමාගේ සහ මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාගේ සහාග ආණ්ඩුවේ සභානායකතුමා. එතුමන්ලා සම්මත කළේ මොකක්ද? අවුරුදු හතරහමාරක් තුළ මැතිවරණයක් පවත්වන්න බැහැයි කියන නීතිය එතුමන්ලා සම්මත කළා. ඒක අමතක කරන්න එපා. කාලයෙන් කාලයට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව වෙනස් කරන පිළිවෙළට අපි කටයුතු කළ යුතු නැහැ. ඒ නිසා ගරු හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමාට පිළිතුරු දීලා මම කිව්වා, ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව යම් යම් කොන්දේසි මත පාර්ලිමේන්තුව විසුරුවා හරින්න ජනාධිපතිතුමාට ඉඩකඩ තිබෙන බව. ඒ වාගේම විපක්ෂ නායකතුමාත් සඳහන් කළ පරිදි, වෙන යෝජනාවකින් පාර්ලිමේන්තුව විසුරුවා හරින්නත් පුළුවන්.

නමුත්, not like in the US Constitution. That is very clear. That is why I told the Hon. (Dr.) Harsha de Silva not to mislead the country and the House. ඒක පිළිගනිමින් විපක්ෂ නායකතුමා, ඉරාන් වික්‍රමරත්න මන්ත්‍රීතුමා ඊට පස්සේ පිළිතුරු දීලා කිව්වා, "ඒක පිළිගන්නවා. ඒක පිළිගන්නවා. නමුත්, ජනමතයක් ලබා ගැනීම සඳහා මහ මැතිවරණයක් දැන් අපි ඉල්ලන්නේ" කියලා. Those are two different things. I replied to the Hon. (Dr.) Harsha de Silva's intepretation of the Constitution. The Constitution is very clear. I have read the Constitution over and over again. The Leader of the Opposition also would have read it. There is no provision, as in the US Constitution or in the US electoral system, for us to have midterm elections. So, let us not get excited. What you all are agitating for is your principles and policies. But, what we stand for is for the sake of the country, for the country to come out of this situation it is in. For the country to come out of it, there has to be unity among all of us and a working arrangement. We stick to that.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මන්ත්‍රීතුමාත් ප්‍රශ්නයක් මතු කළා. එතුමා කිව්වා, අපේ රටේ පාසල් ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට පොත් ලැබෙන්නේ නැහැ කියලා. ගරු මන්ත්‍රීතුමනි, පොත් ලැබෙනවා. දැන් අධ්‍යාපන ඇමතිතුමා මේ ගරු සභාවෙන් එළියට ගියා. නමුත්, මම කියන්න ඕනෑ පාසල් දරුවන්ට පොත් ලැබෙන බව. රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවට අවශ්‍ය කඩදාසි අපි ආනයනය කරමින් සිටිනවා. *[බාධා කිරීමක්]* පොඩ්ඩක් ඉන්න, ලක්ෂ්මන් කිරිඇල්ල මන්ත්‍රීතුමා. මම කියන දේට සවන් දෙන්න. දැන් ඉඳගන්න. මම කියලා ඉවර වුණාට පස්සේ ඕනෑ දෙයක් අහන්න. මොකද, ඔබතුමා එක එක්කෙනාට අපහාස කරනවා මිසක් කාරණය බරපතළ ලෙස වටහා ගන්නේ නැහැ. ඔබතුමා හිටපු සභානායකවරයෙක්. ඒ විධියට ඔබතුමා කටයුතු කරනවා නම් හොඳයි. අපේ රජය ඒ සඳහා අවශ්‍ය provisions මේ අය වැය ලේඛනයෙන් වෙන් කරමින් ඒ කටයුතු කරගෙන යනවා, ගරු කථානායකතුමනි. ඒ නිසා ඔබතුමන්ලා කලබල වෙන්න එපා. ලංකාවේ ශිෂ්‍ය පරම්පරාවට අධ්‍යාපනය කරගෙන යන්න අවශ්‍ය සියලු දේ ලබාදීමේ කටයුත්ත දැන් අපි කරගෙන යනවා. ඒ කාරණාව ගැන ඔබතුමන්ලා අහපු එක හොඳයි. The process is going on. There is the State Printing Corporation and also other institutions engaged in this process. Thank you, Sir.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු කථානායකතුමනි, ගරු අගමැතිතුමා මගේ නමත් සඳහන් කළ නිසා මට අවස්ථාවක් දෙන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

කියන්න, ගරු විපක්ෂ නායකතුමා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු අගමැතිතුමනි, මම මේ කියන කාරණය අහගන්න. අද රටේ ජනතාව කියන්නේ තමන්ගේ මතයට, ජන වරමට තැනක් ලබා දෙන්න කියලායි. ගරු අගමැතිතුමනි, ඔබතුමා ඇමෙරිකාව ගැන කථා කරනවා; ඇමෙරිකානු ව්‍යවස්ථාව ගැන කථා කරනවා. නමුත්, ඇමෙරිකාව බංකොලොත් වෙලා නැහැ.

තමුන්නාන්සේලාගේ ආණ්ඩුව අද මේ රට සුන්නද්දූලි කරලා ඉවරයි; බංකොලොත් කරලා ඉවරයි; විනාශ කරලා ඉවරයි; වට්ටවලා ඉවරයි. ඒ නිසා අද ගොවියා ඉවරයි, ධීවරයා ඉවරයි, පොදු ජනතාව ඉවරයි. තරුණයෝ රට අත හැර යනවා. ඒ වාගේ තත්ත්වයක් තුළ මම ඔබතුමාගෙන් ඉල්ලා සිටින්නේ මෙච්චරයි. ඔබතුමා මේ ගරු සභාවට ප්‍රතිඥාවක් දෙනවා ද, මැතිවරණ කල් දමන්නේ නැතිව, විශේෂයෙන්ම පළාත් පාලන මැතිවරණය කල් දමන්නේ නැතුව, මාර්තු 20 වන දා වනවිට අලුතෙන් එම සභා ස්ථාපනය කළ හැකි ආකාරයට ඇඟිලි ගැසීමකින් තොරව එම මැතිවරණය පවත්වන්න මැතිවරණ කොමිසමට නිදහස ලබා දෙනවා කියලා? තමුන්නාන්සේ උත්තරයක් දෙන්න කෝ.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි, මේ විනාඩි කීපයක් තුළ විපක්ෂ නායකතුමා තමන්ගේ ප්‍රශ්නය වෙනස් කරපු හැටි බලන්න. එතුමා කලින් කිව්වේ, වෙන කථාවක්. ඒ කථාවට පිළිතුරු දුන්නාම, හර්ෂ ද සිල්වා මැතිතුමා ඇමෙරිකානු ව්‍යවස්ථාව ගැන කියපු නොමඟ යවන අර්ථ නිරූපණය ගැන දැන් වෙන කාරණාවක් කියනවා. එතුමා නැඟිටලා අලුතෙන් ප්‍රශ්නයක් අහනවා. මැතිවරණ කොමිෂන් සභාව කියන්නේ, ස්වාධීන කොමිෂන් සභාවක්. එම නිසා ඔබතුමන්ලා ගිහිල්ලා ඒ අය හමු වුණත්, වෙන අය ගිහිල්ලා හමු වුණත්, ඒ කියන කාරණා මත තමයි මැතිවරණ කොමිසම වැඩ කරන්නේ.

[පූ.භා. 10.35]

**ගරු (වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා (වැවිලි කර්මාන්ත අමාත්‍ය සහ කර්මාන්ත අමාත්‍යතුමා)**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ரமேஷ் பதிரண - பெருந்தோட்டக் கைத்தொழில் அமைச்சரும் கைத்தொழில் அமைச்சரும்)
(The Hon. (Dr.) Ramesh Pathirana - Minister of Plantation Industries and Minister of Industries)

ගරු කථානායකතුමනි, මුලින්ම අපේ ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මැතිතුමා කියපු කරුණුවලින් කාරණා දෙකකට පිළිතුරු දෙන්න මම කැමතියි. එකක් තමයි, එතුමා කිව්වා මේ ආණ්ඩුවට නීත්‍යනුකූල අයිතිවාසිකමක් නැහැ රට භාරගන්න කියලා. මම එතුමාට මතක් කරන්න කැමතියි මේ කාරණය. මහින්ද රාජපක්ෂ අගමැතිතුමා 2022 මැයි මස 09 වෙනිදා තමුන්ගේ ධුරයෙන් ඉල්ලා අස් වුණා. ඒ සමඟ ආණ්ඩුව විසිරුණා. ඉන් පසුව තමයි එවකට සිටි ජනාධිපතිතුමා කිව්වේ, ඔබතුමන්ලාගේ ගරු විපක්ෂ

නායකතුමාට ආණ්ඩුව භාර ගන්න කියලා. එතුමා ආණ්ඩුව භාර නොගත්ත නිසා තමයි, වත්මන් ජනාධිපතිතුමා එදා ආණ්ඩුව භාර ගත්තේ. ඒ වාගේම අපි නැවත රජයක් පත් කර ගත්තා.

දෙවැනි කාරණය මෙයයි. ගරු කථානායකතුමනි, අපේ ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මැතිතුමා සඳහන් කළා, එතුමන්ලාගේ කාලයේ තමයි රාජ්‍ය සේවය පෝෂණය කළේ, ආරක්ෂා කළේ, වර්ධනය කළේ, හැබැයි දැන් රාජ්‍ය සේවය අකාර්යක්ෂමයි කියලා. ඔව්, මම පිළිගන්නවා. අපි නියෝජනය කරපු වාමවාදී මධ්‍යස්ථ දේශපාලන ධාරාව රාජ්‍ය සේවය පෝෂණය කළා, ආරක්ෂා කළා, වැඩි වර්ධනය කළා. ඒ ගැන මට ඉතාම ආඩම්බරයි. එහි අඩුවක් තිබෙනවා නම්, මම පිළිගන්නවා. හැබැයි, මම එතුමාට සිහිපත් කරන්න කැමැතියි, ඒ දේශපාලන ධාරාවෙන් තමයි එතුමාත් පෝෂණය වුණේ, දේශපාලන ගමන ආරම්භ කළේ කියලා. එතුමාට මගේ විශේෂ ගෞරවයක් තිබෙනවා. ඒ ගෞරවයට හේතුව තමයි, මම පේරාදෙණිය විශ්වවිද්‍යාලයට ගිය පළමු දවසේ මාව එක්කරගෙන ගියේ මගේ තාත්තා නොවෙයි එතුමා. එතුමා තමයි මාව එක්කරගෙන ගියේ. එතකොට එතුමා අපේ දේශපාලන ව්‍යාපාරයේ පතාක යෝධයක්. එතුමාගේ දේශපාලනයත් ආරම්භ වුණේ, පෝෂණය වුණේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙන් කියන කාරණය අපි අමතක කරන්න හොඳ නැහැ. එතුමා සඳහන් කළ කාරණයට පිළිතුර මෙයයි. ඔව්, අපි ගත්ත සමහර ජනප්‍රිය තීන්දු නිසා අපි දේශපාලනමය වශයෙන් වන්දියක් ගෙවමින් සිටිනවා. අපි දේශපාලන වශයෙන් අපහසුතාවට පත්වෙලා තිබෙනවා. 2019දී විශිෂ්ට ජන වරමකින් බලයට පත් වුණු ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමාට මේ රටේ ධුරය හැර දාලා යන්න සිදු වුණා.

ඒකෙන් පස්සේ, අද රටේ ජනාධිපති ධුරයට පත් වෙලා ඉන්න රනිල් වික්‍රමසිංහ මැතිතුමාට දෛවෝපගතව වගකීමක් පැවරිලා තිබෙනවා, නැවත අපේ අතින් වෙච්ච වැරදි හදාගන්න. මොනවාද අපි ගත්ත ජනප්‍රිය තීන්දු? අපි ගත්ත ජනප්‍රිය තීන්දුවලින් එකක් තමයි, උපාධිධාරීන් 55,000කට රැකියා ලබාදීම. අඩු ආදායම්ලාභී, අඩු සුදුසුකම් තිබෙන දරුවන් 45,000කට මෙරට රැකියා ලබා දුන්නා. රාජ්‍ය සේවය ශක්තිමත් කරන්න, ඒක ප්‍රකෘතිමත් කරන්න කියලා අපි දිළිඳු පවුල් ලක්ෂයකට රැකියා දීලා බරක් දරා ගත්තා. ඒක අපහසු තීන්දුවක් වුණා, ජනප්‍රිය තීන්දුවක් වුණා. හැබැයි ඒකෙන් ආර්ථිකයට ප්‍රබල පහරක් වැදුණා.

ගරු කථානායකතුමනි, වැට් එකට විරුද්ධව මේ රටේ ව්‍යවසායකයෝ පෙළපාළි ගිහිල්ලා විශාල ගැටලුවක් ඇති කරලා 2015-2019 කාලයේ ඇති වෙච්ච අර්බුදත් එක්ක අපි වැට් එක අඩු කරලා ඔවුන්ට සහන දෙන්න සැලැස්සුවා. අපි මානුෂීයව හිතලා, ආදායම් බදු අඩු කර ගන්න ආර්ථිකයට ගෝචර නොවන තීන්දුවක් ගැනීම නිසා අපේ ආර්ථිකය අඩපණ වුණා. ඒක අපි පිළිගන්නවා. හැබැයි සමහර ජනප්‍රිය තීන්දු ගත්තේ මේ බදු අඩු කළාම ඔවුන්ට අත රැඳෙන මුදල් ප්‍රතිආයෝජනය කරලා ආර්ථිකය ශක්තිමත් වෙයි කියන බලාපොරොත්තුවෙනුයි. හැබැයි ඒක ඒ විධියට සිදු වුණේ නැහැ. ඒ නිසා අපට අහිමිවීම් රැසක් සමඟ දේශපාලන වන්දියක් ගෙවන්න සිදු වෙලා තිබෙනවා. ගරු කථානායකතුමනි, අපි පසු කරගෙන ආවේ අපහසු කාල සීමාවක් විතරක් නොවෙයි අවාසනාවන්ත කාල සීමාවක්.

2019 වසරේදී "Lonely Planet" සඟරාව ලෝකයේ සංචාරය කළ යුතු හොඳම රට හැටියට ලංකාව නම් කරනකොට 2018 වර්ෂයේදී අපේ රටට සංචාරකයෝ මිලියන 2.3ක් ඇවිල්ලා තිබුණා. සංචාරක ව්‍යාපාරයෙන් 2018 වර්ෂයේදී ඩොලර් බිලියන 5.8ක ආදායමක් අපට ලැබිලා තිබුණා. හැබැයි 2019 පාස්කු බෝම්බ ප්‍රහාරයෙන් පස්සේ අපේ සංචාරක ව්‍යාපාරය කඩා වැටෙන්න පටන් ගත්තා. ඉන් පසුව 2020දී අපි කවුරුත් බලාපොරොත්තු නොවෙච්ච විධියට ලෝක වසංගතය තත්ත්වයක් අපේ රටට ආවා. ඒ වාගේ වසංගතයක් ලෝකයේ මීට පෙර ඇවිල්ලා තිබෙන්නේ මීට අවුරුදු 100කට පමණ කලින් 1918දී. ඒ Spanish flu කියන වසංගත තත්ත්වය. අපේ රටට කොරෝනා ව්‍යසනය ඇවිල්ලා අපේ ආර්ථිකය කඩාගෙන වැටුණා, සංචාරක ව්‍යාපාරය කඩාගෙන වැටුණා, විදේශ ප්‍රේෂණ නතර වුණා. අපි ගත්ත සමහර වැරදි තීන්දු නිසා 2021 වර්ෂය අවසන් වෙනකොට අපේ රටට ආර්ථික අර්බුද එන්න පටන් ගත්තා. ඒකත් එක්ක අපි තවත් අසරණ වුණා. දැන් ඒ අසරණවීමෙන් අපි නැවත ගොඩ එන්න හදනකොට තවත් අර්බුදකාරීව දීර්ඝ කාලයකට අපි යම් පමණකට පසුගාමී වුණා. මොකද, ලෝක යුධ තත්ත්වයත් එක්ක, රුසියානු යුක්රේන යුධමය ගැටලුවත් එක්ක ලෝකයේ වැඩිම තෙල් මිල, ගෑස් මිල පසුගිය කාලයේ වාර්තා වුණා. සංචාරකයන් අපේ රටට එන එක අකර්මණ්‍ය වුණා. ඒ වාගේ කාරණා රැසක් නිසා සමහර විට අපිට මීට කලින් ප්‍රතිසංස්කරණය කර ගත හැකිව තිබුණු අපේ ආර්ථිකය තවත් පසුගාමී වුණා. හැබැයි එම තත්ත්වයන් යහපත් අතට හැරෙමින් පවතින බව මහ බැංකුවේ අධිපතිතුමා ඇතුළු මුල්‍ය අංශයට වගකිව යුතු පිරිස් බොහොම පැහැදිලිව ප්‍රකාශ කරනවා. අපේ ආර්ථිකය ස්ථාවර වෙමින් තිබෙනවා. අපේ රටේ උද්ධමනය විශාල ලෙස ඉහළ ගියා. 2022 සැප්තැම්බර් මාසයේ මේ රටේ උද්ධමනය සියයට 77.3යි. නොවැම්බර් මාසය වෙනකොට උද්ධමනය සියයට 60ක මට්ටමකට අඩුවෙමින් තිබෙනවා. උද්ධමනය වැඩි වුණා, බඩු මිල ඉහළ ගියා, ජනතාව දුකට පත් වුණා කියලා අපි පිළිගන්නවා. හැබැයි, දැන් රටේ ආර්ථිකය යම් පමණකට ස්ථාවර වෙලා තිබෙනවා. මේ නොවැම්බර් මාසය වනකොට උද්ධමනය සියයට 60ක විතර මට්ටමකට අඩු වෙලා තිබෙනවා.

අපේ පොලී අනුපාතිකත් විශාල ලෙස ඉහළ ගියා. හැබැයි, මහ බැංකුව ප්‍රකාශ කරන විධියට, බලාපොරොත්තු වන විධියට ඉදිරි මාස තුන හය අතර කාලය තුළ උද්ධමනය අඩු වෙලා, විශාල ගැටලුවක් වෙලා තිබෙන බැංකු පොලී අනුපාත ක්‍රමානුකූලව අඩු වෙයි. මහ බැංකු අධිපතිතුමා දවස් කිහිපයකට කලින් එය ප්‍රකාශ කළා. සියයට 28-30 පොලී අනුපාත තබාගෙන මේ රටේ ව්‍යාපාර කරන්න බැහැ. කාටවත් ශක්තිමත්ව කර්මාන්ත කරන්න බැහැ. හැබැයි, ඒ පැවැති තත්ත්වය ක්‍රමානුකූලව වෙනස් වෙලා යහපත් අතට හැරෙන බව පෙනෙන්න තිබෙනවා.

ගරු කථානායකතුමනි, ඊට එහාට ගිහිල්ලා බැලුවොත්, දැන් මේ රටට ක්‍රමානුකූලව විදේශ ප්‍රේෂණ ලැබෙමින් තිබෙනවා. ඔක්තෝබර් මාසයේ අපට ඩොලර් මිලියන 357ක් ලැබී තිබෙනවා. මේ රට දණින් වැටෙනකල්, මේ රටේ ජනතාව දුකට පත් වෙනකල්, මේ රටට එකම ඩොලරයක්වත් එවන්න එපාය කියලා දේශපාලන පක්ෂ නායකයෝ පිට රට ඉන්න ජනතාවගෙන් ඉල්ලීම් කළා. සමහර අය ඒවාට ඇහුම්කන් දුන්නා. ඩොලර් ලැබුණේ නැහැ. හැබැයි දැන් ක්‍රමානුකූලව තත්ත්වය යථාවත් වෙමින් තිබෙනවා. මේ වසර අවසානය වන විට අඩු ගානේ ඩොලර් බිලියන තුනක, හතරක ආදායමක් විදේශ ප්‍රේෂණවලින් අපට ලැබෙයි.

මේ රටේ සංචාරක ව්‍යාපාරය බිඳ වැටුණා විතරක් නොවෙයි, බිඳ වැට්ටුවා. ඒරොෆ්ලොට් ගුවන් යානය පිළිබඳ සිද්ධිය අපි දන්නවා. ඒ වෙලාවේ මේ රටේ අධිකරණයත් මැදිහත් වෙලා ඒ ගුවන් යානා තහනම් කරලා, සංචාරක කර්මාන්තය විනාශ කරන්න උත්සාහ කළා. හැබැයි, දැන් නැවත ඒරොෆ්ලොට් ගුවන් යානා අපේ රටට එනවා. රුසියාවෙන් මේ රටට සංචාරකයෝ එනවා. සංචාරක ව්‍යාපාරය ක්‍රමානුකූලව යථාවත් වෙමින් තිබෙනවා. මේ පසුතලයත් එක්ක, අන්තර්ජාතික මූල්‍ය අරමුදල සමඟ අපි කරන සාකච්ඡා දෙසැම්බර් මාසයේදී සාර්ථකව අවසන් කරන්න පුළුවන් වුණොත්, මේ රටට අනිවාර්යයෙන්ම ආර්ථික ස්ථාවරභාවය ලැබෙනවා. අපි ධනාත්මකව මේ කරුණු දිහා බලමු.

[ගරු (වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා]

ආර්ථික ස්ථාවරභාවය ලැබිලා නැවත මේ රටේ ආර්ථිකය ශක්තිමත් කරන්න හැකියාව තිබෙනවා. මීටත් වඩා අර්බුදකාරී කාල සීමාවලදී අපේ රටේ ජනතාව නැඟිටලා තිබෙනවා. ඒ නිසා අපේ රටේ ජනතාවට නැවත නැඟී සිටින්න හැකියාව තිබෙන බව අපි බොහොම පැහැදිලිව ප්‍රකාශ කරනවා.

ගරු කථානායකතුමනි, පසුගිය වසර කිහිපය තිස්සේම මේ රටේ ක්‍රමානුකූලව ගොඩ නැඟුණු ණය කන්දරාවක් තිබෙනවා. 2019දී අපි බලයට එනකොට ගෙවිය යුතුව තිබුණු ණය ප්‍රමාණය ඩොලර් බිලියන 52ක්. ඒකෙන් බිලියන තුනක් පසුගිය කාලයේ ගෙව්වා. තවත් ඩොලර් බිලියන 49ක් ගෙවන්න ඕනෑ. වාර්ෂිකව තිබුණු ඩොලර් බිලියන 10ක වෙළෙඳ ශේෂය, ආනයන අපනයන අතර වෙනසත් එක්ක ක්‍රමානුකූලව ගොඩ නැඟුණු වෙළෙඳ ශේෂය පසුගිය කාලයේ අපට දරා ගත නොහැකි ණයක් බවට පත් වුණා. 2019දී අපි බලයට පත් වෙලා ණය නොගන්න ගත්ත තීන්දුවත් එක්ක, තවත් ව්‍යාකූල තත්ත්වයට පත් වෙලා අපි ආර්ථික වශයෙන් අපහසුතාවට පත් වුණා. ඒ තීන්දු සමඟ අපේ ආර්ථිකය අපහසුතාවට පත් වෙලා ආර්ථිකය කඩා වැටුණු බව සත්‍යයක්. හැබැයි, ඒ අතරේ අපට නොපෙනුණු හොඳ තීන්දු ගණනාවකුත් තිබුණා. එකක් තමයි, අපි මේ ආර්ථික අර්බුදය එන බව දැන ගෙන මේ රටට පිට රටින් වාහන ගෙන්වීම නතර කිරීම. මේ රටට වාහන ගෙන්වන්න වාර්ෂිකව ඩොලර් බිලියන දෙකක් වැය කළා. අපි වාහන ගෙන්වන එක නතර කළා. අර්බුදකාරී කාල සීමාවේ එය නතර කළාට පසුව ශ්‍රී ලංකාවේ වාහන එකලස් කිරීමේ කර්මාන්තයත් ක්‍රමානුකූලව දියුණු වෙලා තිබෙනවා. ඒ දියුණු වන කර්මාන්තය තුළින් මේ රටට අවශ්‍ය වාහන නිෂ්පාදනය කිරීමේ පසුතලය සකස් කරගනිමින් තිබෙනවා.

කරුංකා, කහ, ඉඟුරු ආදී දේවලුත් අපි පිට රටින් තමයි ගෙනාවේ. අපි ඒවා ගෙන්වීම නැවැත්තුවා. අපේ රටේ වවන්න පුළුවන් දේ වවන්න, හදන්න පුළුවන් දේ හදන්න අවශ්‍ය ධෛර්යය අපි දුන්නා. හැබැයි, මේ ආර්ථික අර්බුදය අතරේ මේ රටේ කෘෂිකර්මාන්තයේ ඇති වෙච්ච දියුණුව, නිෂ්පාදන කර්මාන්තවල සුළු වශයෙන් හෝ ඇති වෙච්ච දියුණුව ඉදිරියට අරගෙන ඇවිත් එය ඔපනංවන මට්ටමට කටයුතු කරන්න අපට බැරි වුණා. ඒක අපේ රටේ අවාසනාවක්.

කර්මාන්ත අංශයට රට පැත්තෙන් බලපාන ප්‍රධාන ගැටලුවක් තමයි ආණ්ඩුවෙන් ආණ්ඩුවට ප්‍රතිපත්ති වෙනස් වීම. ඊළඟ මැතිවරණයේදී කවුරු බලයට පත් වුණත්, මේ රටේ කර්මාන්ත පැත්තෙන්, කෘෂිකර්මාන්තය පැත්තෙන් ආරක්ෂණ ප්‍රතිපත්තියක් තිබෙන්න අවශ්‍යයි. එහෙම කළේ නැත්නම්, කුඩා මට්ටමේ කර්මාන්ත අපි ආරක්ෂා කළේ නැත්නම්, නිෂ්පාදන ආර්ථිකය ආරක්ෂා කරන්න කටයුතු කළේ නැත්නම්, නැවත වතාවක් පෙර තිබුණු තත්ත්වයටම අපි පත් වෙනවා.

මෝටර් වාහන එකලස් කිරීමේ කර්මාන්තය වාගේම මේ රටේ රබර් නිෂ්පාදන කර්මාන්තයත් අද ඉහළ මට්ටමකින් දියුණු වෙලා තිබෙනවා. ලෝකයේ ටයර් නිෂ්පාදනයේ ප්‍රමුඛයා අද ලංකාවයි. ඇඟලුම් ක්ෂේත්‍රයේ විශාලතම නිෂ්පාදකයා නොවුණත්, අද ලෝකයේ ඇඟලුම් නිෂ්පාදන හා සම්බන්ධ පර්යේෂණ මත පදනම් වුණු කාරණාවලට විසඳුම් - research-based solutions - සොයන ප්‍රධාන කර්මාන්තය තිබෙන්නේ ශ්‍රී ලංකාවේයි. ඒ ආයතන විශාල ලෙස දියුණු වෙලා තිබෙනවා.

පසුගිය වසර දෙකක කාල සීමාව තුළ මේ රටේ දියුණු වූ කර්මාන්ත අතර ඉදිරියෙන්ම තිබෙන්නේ නාන කාමර උපාංග කට්ටල ආශ්‍රිත කර්මාන්තයයි. ඒ සියල්ල මීට පෙර අපි පිටින් ගෙනාවේ. හැබැයි, නිෂ්පාදකයෝ 10දෙනෙකු එකතු වෙලා අද මේ රටේ අවශ්‍යතාව සම්පූර්ණ කරන්න කටයුතු කරනවා. ඒ වාගේම, බෝට්ටු තැනීම, කුඩා යාත්‍රා තැනීම සහ ඖෂධ නිෂ්පාදනය පැත්තෙනුත් ශ්‍රී ලංකාව පසුගිය අවුරුදු දෙක තුළ විශාල ඉදිරි පිම්මක් තබා තිබෙනවා. කවුරු මේ රටේ බලයට පත් වුණත් කමක් නැහැ, අපේ රටේ දියුණු වෙමින් තිබෙන මේ කර්මාන්ත ටික ආරක්ෂා කර ගන්න අවශ්‍ය උදව්ව ලබා දිය යුතුයි. රටක් හැටියට පෞද්ගලිකව දරන්න බැරි ජීවන මට්ටමක් අපි පසුගිය කාලයේ දරා තිබෙනවා. විදේශ විනිමය ලැබී මේ රට නැවත යථාවත් වෙනකොට ඒ කර්මාන්ත ටික ආරක්ෂා කරන්න අවශ්‍ය ප්‍රතිපත්ති සම්පාදනයේදී පක්ෂ, විපක්ෂ සැම කෙනෙකුම උදව් කරන්න කියා මම ඉතාම ගෞරවයෙන් ඉල්ලා සිටිනවා.

ගරු කථානායකතුමනි, මේ අර්බුදයත් එක්ක පසුගිය කාලසීමාව පුරාම බොහෝ අය නිදහස් ශ්‍රී ලංකාවේ වසර 74ක අතීතය පිළිබඳව කථා කළා. බලයට නොආපු දේශපාලන පක්ෂවල අය මෙතැන කථා කළා, එය පක්ෂ, විපක්ෂ දේශපාලනඥයන් සැම කෙනකුටම 74 වසරක ශාපයක් හැටියට. හැබැයි, මම මේ කාරණය කියන්න කැමැතියි. 1945දී රාජ්‍ය මන්ත්‍රණ සභාවේදී ආචාර්ය සී.ඩබ්ලිව්.ඩබ්ලිව්. කන්නන්ගර මැතිතුමා නිදහස් අධ්‍යාපන පනත ඉදිරිපත් කළ අවස්ථාවේ සිට මේ රටේ සමාජ විප්ලවයක් සිදු වෙලා තිබෙනවා.

ඒ වසර 75ක කාලය තුළ අපේ රටේ අධ්‍යාපනය, සෞඛ්‍ය, භෞතික යටිතල පහසුකම් ආදී ක්ෂේත්‍රවල සංවර්ධනයේ වුණු වෙනස මේ කලාපයේ එකම රටකවත් වෙලා නැහැ. ඒක මම කියන්නේ බොහොම ආඩම්බරයෙන්. දේශපාලනඥයන්ට ගරහන්න පුළුවන්; චෝදනා කරන්න පුළුවන්. හැබැයි, නිදහස් අධ්‍යාපනයේ පියා වන ආචාර්ය සී.ඩබ්ලිව්.ඩබ්ලිව්. කන්නන්ගර මැතිතුමාගේ ඉඳලා මේ රටේ හිටපු දේශපාලනඥයෝ දහස් ගණනක් අවංකව මේ රටට සේවය කර තිබෙනවා. ඒ වාගේම, අපේ සෞඛ්‍ය, අධ්‍යාපනය කියන ක්ෂේත්‍රවල දියුණුවේ ප්‍රතිඵල ලෝක මට්ටමට ගිහිල්ලාත් තිබෙනවා.

ගරු කථානායකතුමනි, ඊළඟට මට ඔබතුමාට කියන්න අවශ්‍ය වෙන්නේ එතරම් පිටට නොපෙනෙන කාරණයක්. ඒ තමයි නිදහස් ශ්‍රී ලංකාවේ කර්මාන්ත ප්‍රතිපත්තිය දියුණු කරන්නත් ඉතිහාසයේ සිට විශාල වෙහෙසක් අරගෙන තිබෙනවා කියන එක. ඒ සඳහා පළමුවෙනි උදාහරණය තමයි, 1952දී කොළඹ ක්‍රමය යටතේ මේ රටේ කාර්මික සංවර්ධන මණ්ඩලය බිහි කිරීම. එය ඇති කරන්නේ මේ රටේ කර්මාන්ත 4ක් දියුණු කරන්න බලාගෙන. දැව කර්මාන්තය, පෝසිලේන් මැටි කර්මාන්තය, ඇඟලුම් කර්මාන්තය සහ වානේ කර්මාන්තය දියුණු කරන්නයි 1952දී මේ රටේ කාර්මික සංර්ධන මණ්ඩලය - IDB - බිහි කරන්නේ. ඒ කාලයේම දේශපාලනඥයෝ ඒකට මුදල් ලබා දෙන්න DFCC එක නිර්මාණය කර තිබුණා. DFCC - Development Finance Corporation of Ceylon - එක 1957දී නිර්මාණය කරන්නේ. ඒකට කාර්මික තාක්ෂණ සහාය දෙන්න කාර්මික තාක්ෂණ ආයතනය හදන්නේ 1957දී. ඒවාට අවශ්‍ය කළමනාකරණ දායකත්වය දෙන්න ජාතික ව්‍යාපාර කළමනාකරණ ආයතනය - NIBM - හදන්නේ 1967දී. මේකට ඉංජිනේරු සහාය ලබා දෙන්න ජාතික ඉංජිනේරු පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය - NERD - හදන්නේ 1974දී. ඒ කියන්නේ, නිදහස් ශ්‍රී ලංකාවේ කර්මාන්ත දියුණු කරන්න අවශ්‍ය කර්මාන්ත ප්‍රතිපත්තියක් සකස් කරලා ඒකට අවශ්‍ය වටපිටාව සකස් කරලා තිබුණා. DFCC ආයතනය පෞද්ගලීකරණය කළා. ඊට පස්සේ සංවර්ධනය වෙනුවෙන් හදපු බැංකුවක් වුණු NDB එක පෞද්ගලීකරණය කළා. ලංකාව අදටත් සංවර්ධනය පැත්තට දායකත්වය ලබා දෙන්න අවශ්‍ය සංවර්ධන බැංකුවක් නොමැති වීමේ අඩුවෙන් පීඩා විඳිනවා.

NDB එක, DFCC එක පෞද්ගලීකරණය වුණේ කාගේ අවශ්‍යතාවටද, මොන න්‍යාය පත්‍රයක් යටතේද කියන කාරණය අදටත් ගැටලුවක් වෙලා තිබෙනවා. අදටත් ලංකාවේ කර්මාන්තකරුවන්ට අත දෙන්න, සහයෝගය දෙන්න, අවශ්‍ය මූල්‍ය පහසුකම් සලසන්න බැංකුවක් නැහැ. චීනයේ තිබෙනවා, EXIM බැංකුවක්. අපට ආනයනයට අපනයනයට උදවු කරන්න EXIM බැංකුවක් නැහැ; සංවර්ධනයට උදවු කරන්න බැංකුවක් නැහැ. කෘෂිකර්මාන්තය දියුණු වුණාට, අධ්‍යාපනය, සෞඛ්‍ය දියුණු වුණාට අවාසනාවකට වාගේ අපට නිෂ්පාදන ආර්ථිකය ශක්තිමත් කරන්න බැරි වෙලා තිබෙනවා. ඒකට බලපාන ප්‍රධාන කාරණා කිහිපයක් තිබෙනවා. එකක්, මේ රටේ නිෂ්පාදකයකුට, ආයෝජකයකුට ඉඩමක් ගන්න බැහැ. ප්‍රධාන කාරණයක්, ඒක. ඒ නිසා අපි ආණ්ඩුවට යෝජනා කළා, සියලු ඉඩම් එකතු කරලා land bank එකක් හදන්න කියලා, එහෙම නැත්නම් එකම ස්ථානයකින් ඉඩම් ලබා දීමේ ක්‍රමවේදයක් සකස් කරන්න කියලා. ඒ සඳහා යෝජනාවක් අතිගරු ජනාධිපතිතුමා මේ අය වැය ලේඛනයේදී ඉදිරිපත් කර තිබෙනවා. ඒ ගැන විවිධ විවේචන විවිධ පාර්ශ්වවලින් ඉදිරිපත් කරනවා, උප දිසාපතිවරු හරහා ඉඩම් ලබාදීමේදී ගැටලු මතු වෙයි කියලා. හැබැයි, ඒ ගැටලු විසඳාගෙන ආයෝජකයන්ට ඉඩම් ලබාදීමේ ක්‍රමවේදයක්, දේශීය, විදේශීය ව්‍යවසායකයින්ට ඉඩම් ලබාදීමේ පහසු ක්‍රමවේදයක් සකස් කරන්න අවශ්‍යයි.

ඒක ප්‍රධාන කාරණයක්. දෙවන කාරණය තමයි, නීතිය පිළිබඳ කාරණය. මේ රටේ නීතිවලින් ව්‍යවසායකයන් බැඳ දමා තිබෙන්නේ. ව්‍යවසායක් ආරම්භ කරන්න ගියත්, පවත්වාගෙන යන්න ගියත් විවිධ ආයතනවලින් ලබා ගන්න තිබෙන ලයිසන් නිසා විවිධාකාර ගැටලු පැන නැඟී තිබෙනවා. ලංකාවේ මිනිස්සු දේශපාලකයන්ට චෝදනා කරනවා, "හොරු" කියලා. හැබැයි, ව්‍යවසායක් කරන සෑම මිනිහෙකුම හොරෙක්ය කියා හිතාගෙනයි රටේ නීති පද්ධතිය තුළ ඒ සම්බන්ධයෙන් වන නීති හදලා තිබෙන්නේ. ව්‍යවසායකයන්ගේ දෑත් බැඳ දාලා තිබෙන්නේ. ඒ නිසා ඒ සම්බන්ධයෙන් වන නීති ලිහිල් කරන්න අවශ්‍යයි.

ආයෝජනය සම්බන්ධයෙන් අද ගැටලුවක් මතු වෙලා තිබෙනවා. මොකද, අද මූලධනය සපයා ගැනීමේ ගැටලුවක් තිබෙනවා. කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් මේ රටේ ජාතික නිෂ්පාදනයට සියයට 52ක ආර්ථික දායකත්වයක් ලබා දෙනවා. ඔවුන්ට අත දෙන්න පහසුකම් සලසන්න අවශ්‍යයි. මේ අර්බුදකාරී කාල සීමාවේ ප්‍රමාණවත් නොවුණත්, ඔවුන් වෙනුවෙන් රුපියල් බිලියන දෙකක පමණ මුදලක් කුඩා චක්‍රීය අරමුදලක් හැටියට ජනාධිපතිතුමා ලබා දීලා තිබෙනවා. ඒ වෙනුවෙන් අප එතුමාට ස්තුතිය පුද කරන්න ඕනෑ. මේ රටේ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් අප ආරක්ෂා කර ගත්තේ නැත්නම් ලංකාවේ ඉදිරි ගමන පිළිබඳව පැහැදිලිව ප්‍රශ්නාර්ථයක් ඉතුරු වනවාය කියන කාරණය මා මතක් කරන්න කැමැතියි.

ගරු කථානායකතුමනි, ශ්‍රී ලංකාවේ ආර්ථිකය දියුණු කරන්න අවශ්‍ය ව්‍යාපාර දියුණු කිරීම පිළිබඳ කාරණයේදී අපට වැදගත් වන දර්ශක කීපයක් තිබෙනවා. එකක් තමයි, අපි හැම දාම කථා කරන Ease of Doing Business Index එක. මේ දර්ශකයට අනුව රටවල් 199ක් අතරින් ලංකාව ඉන්නේ 99වන ස්ථානයේ. දෙවන එක Global Competitiveness Index එක. එම දර්ශකයට අනුව රටවල් 141ක් අතරින් 84වන ස්ථානයේ අප ඉන්නේ. ඒවාට බලපාන සාධක මොනවාද? ඒවාට බලපාන ප්‍රධාන කරුණු කීපයක් තිබෙනවා. එක ප්‍රධාන කරුණක් තමයි, මා කලිනුත් සඳහන් කළ policy inconsistency තත්ත්වය. එහෙම නැත්නම් ජාතික ප්‍රතිපත්ති රාමුවක් නොමැති වීම. දෙවන කාරණය මොකක්ද? විවිධාකාර ආණ්ඩු මඟින් විවිධ විධියට වෙනස් කරන බදු ක්‍රමය - tax structure එක- පිළිබඳව පැහැදිලිතාවක් නොමැති වීම. තුන්වන කාරණය, මේ රටට අවශ්‍ය පුහුණු ශ්‍රමිකයන් නොමැති වීම. ගරු කථානායකතුමනි, ඒක ප්‍රධාන ගැටලුවක්. මා ඒ සම්බන්ධයෙන් වචන කීපයක් කියන්න කැමැතියි.

නිදහස් ශ්‍රී ලංකාවේ පසුගිය වසර 74ක කාලය තුළ දේශපාලකයින් පාසල් 7,000ක් හදලා තිබෙනවා; විශ්වවිද්‍යාල 18ක් හදා තිබෙනවා; උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතන හදා තිබෙනවා. මේ රටේ ගුරුවරු ප්‍රමාණය 240,000 දක්වා වැඩි කර තිබෙනවා. දේශපාලකයින් විශ්වවිද්‍යාල, පාසල්, උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතන, විද්‍යාපීඨ හැදුවාට වැඩක් නැහැ, මේවායෙන් බිහි වන දරුවන්ට වෘත්තීයාභිමුඛ පුහුණුවක් ලබා දෙන්නේ නැත්නම්. පාසලේදී ඉංග්‍රීසි භාෂාව කියා දෙන්නේ නැත්නම්, දරුවන්ට විදේශ භාෂා -ප්‍රංශ භාෂාව, ජර්මන් භාෂාව, චීන භාෂාව- කථා කරන්න උගන්වන්නේ නැත්නම්, ඔවුන්ට තාක්ෂණික දැනුම ලබා දෙන්නේ නැත්නම් එහෙම පාසල් හැදුවාට වැඩක් නැහැ. විශ්වවිද්‍යාල හැදුවාට වැඩක් නැහැ, වෘත්තීයමය වශයෙන් ගැළපෙන පාඨමාලා ඔවුන්ට හඳුන්වා දුන්නේ නැත්නම්. දේශපාලකයින් අධ්‍යාපනය පැත්තෙන් යම් වැඩ කොටසක් කරලා තිබෙනවා.

හැබැයි, අප මෙය වෘත්තියාභිමුඛ දිශානතියකට යොමු කරගත්තේ නැත්නම්, මේ අධ්‍යාපන ක්‍රමයෙන් වැඩක් නැහැ, ගරු කථානායකතුමනි. අපි අධ්‍යාපන ක්‍රමය පිළිබඳව පසු විපරම් කළ යුතුයි. දරුවන්ට බරක් නොවන පරිදි, දරුවන්ට පහසු වන පරිදි අධ්‍යාපන ක්‍රමය සකස් කළ යුතුයි. ඒ වාගේම, දරුවන්ට අවශ්‍ය තාක්ෂණික, වෘත්තිමය, ගණිතමය හැකියාව ලබා දෙන අධ්‍යාපන ක්‍රමයක් කරා අපි ඉක්මනින් ගමන් කළ යුතුයි. එසේ කළේ නැත්නම්, අප මොන අය වැය ලේඛන ඉදිරිපත් කළත් වැඩක් නැහැ. අපි අපේ තරුණ පරපුර ආරක්ෂා කරමින් ඉදිරියට යන්න අවශ්‍යයි.

ව්‍යාපාර පසුගාමී වීම කෙරෙහි බලපාන තවත් කාරණයක් තිබෙනවා. ලංකාවේ පරිගණක සාක්ෂරතාව අන්තර්ජාලය පැත්තෙන්, එහෙම නැත්නම් Information and Communication Technology පැත්තෙන් ඉහළ ගියත්, ලංකාවේ අන්තර්ජාලයේ penetration එක - ප්‍රවේශය - ඉහළ මට්ටමක තිබුණත්, ලංකාව තාක්ෂණය පැත්තෙන් ව්‍යාපාර ලෝකයේ ඉතාම පසුගාමී තැනකයි තිබෙන්නේ. ඒ අංශයෙන් ශ්‍රී ලංකාව ඉන්නේ රටවල් 180ක් අතරින් 107 වන ස්ථානයේ. ලංකාවේ පරිගණක තිබෙනවා, ඒ වාගේම දුරකථන මිලියන 30ක් තිබෙනවා, අන්තර්ජාල පහසුකම තිබෙනවා. හැබැයි, ගරු කථානායකතුමනි, ලංකාවේ බහුතරයක් ඒවා පාවිච්චි කරන්නේ, Facebook බලන්න, WhatsApp බලන්න, TikTok බලන්න. නමුත්, ඒක ව්‍යාපාරයකට සම්බන්ධ කරලා value chain එකක් -අගය එකතු කිරීමේ ක්‍රියාදාමයක්- හරහා ලෝකය සමඟ සම්බන්ධ කරන ක්‍රමවේදයක් නැහැ. නමුත්, එවැනි ක්‍රමවේදයක් අත්‍යවශ්‍යයි. ඉදිරි කාලය තුළ අපි උත්සාහ කරනවා, කුඩා ව්‍යවසායකත්ව සංවර්ධනය සඳහා කාන්තාවන් සහ රටේ සමස්ත ව්‍යවසායකයන් අගයදාමය එකතු කිරීමේ ලෝක ක්‍රියාවලියට සම්බන්ධ කිරීමට. ඒ සඳහා තාක්ෂණය යොදා ගැනීම කෙරෙහි අපි අවධානය යොමු කළ යුතුයි. එහෙම කළේ නැත්නම් අපේ රටේ ව්‍යාපාර දියුණු කළාට වැඩක් නැහැ. මොකද, ඉදිරියේදී අන්තර්ජාතික වෙළෙඳ පොළට ප්‍රවේශ වීමේදී අපට බොහොම පැහැදිලිව ගැටලුවක් මතු වෙනවා.

ගරු කථානායකතුමනි, මුදල් රාජ්‍ය අමාත්‍ය ගරු රංජිත් සියඹලාපිටිය මැතිතුමා කථා කරමින් රජයේ ආදායම් පැත්ත පිළිබඳව පැහැදිලි කළා. බදු ක්‍රියා දාමය තුළ අපි පැහැදිලි ගැටලුවක් දකිනවා. විවිධ බදු අය කිරීම සහ බදු එකතු කිරීමේ ක්‍රියා දාමය හරහා මේ රට තුළ ගැටලු ගණනාවක් මතු වෙලා තිබෙනවා.

අපි පසුගිය දවස්වල දේශීය ආදායම් දෙපාර්තමේන්තුව ගැන, ශ්‍රී ලංකා රේගුව ගැන කථා කළා. දේශීය ආදායම් දෙපාර්තමේන්තුව ගැන කථා කරලා එය අනුගමනය කරන බදු

[ගරු (වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා]

එකතු කිරීමේ ක්‍රියාවලිය පිළිබඳව, එහි තිබෙන විවිධ අක්‍රමිකතා පිළිබඳව සඳහන් කළාට පස්සේ, දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ නිලධාරි මහත්වරුන් පිරිසක් ගිහිල්ලා පෞද්ගලික දත්ත එළියට ලබා දුන්නා කියා පොලිසියට පැමිණිලි කරනවා අපි දැක්කා. අපි එතුමන්ලාට කියනවා, මෙහිදී යම් කාරණයක් සාධනීය විධියට හෙළිදරව් කළා නම්, ඒක නිවැරදි කරගන්න උත්සාහ කරන්න කියලා. එහෙම නැතිව, ඒ කරුණු හෙළි කළ මන්ත්‍රීවරුන්ට විරුද්ධව CID එකට පැමිණිලි කරලා වැඩක් නැහැ.

බදු එකතු කිරීමේ දැල පිළිබඳව විශාල ගැටලුවක් තිබෙනවා. එම කාර්යය සඳහා තාක්ෂණය භාවිත කරන්න අවශ්‍යයි කියන එක අපි අවස්ථා කිහිපයකදීම සඳහන් කර තිබෙනවා. පුද්ගලයාට පුද්ගලයා සම්බන්ධ කිරීම - person-to-person contact - හරහා බදු එකතු කරන්න ගියොත්, අක්‍රමිකතා, ගැටලු රැසක් ඇති වෙනවා. ශ්‍රී ලංකා රේගුවට, සුරාබදු දෙපාර්තමේන්තුවට වාගේම දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට තාක්ෂණය එකතු කළේ නැත්නම් අපේ ඉලක්ක ජයගන්න අපට හැකියාව ලැබෙන්නේ නැහැ. එහෙම කළොත් විතරයි, ඒ කටයුත්ත විනිවිද පෙනෙන ස්වභාවයෙන් කරන්න පුළුවන් වන්නේ. මෙහිදී ජනාධිපතිතුමා ඉදිරිපත් කර තිබෙන, විශේෂයෙන් රටේ සමස්ත බදු ක්‍රියාවලිය විශ්ලේෂණය කර නිර්දේශ ලබා දීම සඳහා ජනාධිපති කොමිෂන් සභාවක් ස්ථාපනය කිරීම සහ ඒ සම්බන්ධයෙන් විශේෂිත ක්‍රියා මාර්ග ගැනීම කියන කාරණය ඉතා වැදගත්. ගරු කථානායකතුමනි, එහි වැදගත්කම දෙගුණ තෙගුණ වන්නේ කොහොමද? මේ සම්බන්ධයෙන් පසුගිය දිනවල පළ කර තිබෙන වාර්තාවක් මම ඔබතුමාගේ අවධානයට යොමු කරන්න කැමැතියි. එය, බදුකරණයේ ගැටලු සහ මිල උච්චාවචනයන් පිළිබඳ නිවැරදි ක්‍රමවේදය අනුගමනය නොකිරීම හරහා ශ්‍රී ලංකාවට අහිමි වන මුදල ගැන සඳහන් වාර්තාවක්. එහි තෝරාගත් කොටසක් මා ඔබතුමාගේ අවධානය පිණිස ඉදිරිපත් කරනවා. The title of this Report is "Trade-Related Illicit Financial Flows in 134 Developing Countries 2009-2018". ගරු කථානායකතුමනි, එම Global Financial Integrity කියන think tank වාර්තාවේ page 59 හි සඳහන් වන පරිදි ලංකාවේ පමණක් 2009 ඉඳලා 2018 දක්වා අහිමි වුණු ඩොලර් ප්‍රමාණය බිලියන 36.8ක් වෙනවා. එතරම් මුදලක් අපට අහිමි වෙලා තිබෙන්නේ කොහොමද? ලංකාවේ ආනයනයේදී සහ අපනයනයේදී undervalue කිරීම - මිල අඩු කර සඳහන් කිරීම - නිසායි. ඒ අනුව ලංකාවේ අපනයන සහ ආනයනවල වටිනාකමින් රජයට ලැබිය යුතු මුදලින් ඩොලර් බිලියන 36.8ක් අවුරුදු 9ක් වාගේ කාලයකදී රටට අහිමි වෙනවා. ගරු කථානායකතුමනි, ඩොලර් බිලියන 36ක් කියන්නේ කොතරම් නම් විශාල මුදලක්ද? නිදහස් ශ්‍රී ලංකාව ගත්තොත්, අද වනකොට සමස්ත ණයවලින් අපට ගෙවන්න තිබෙන්නේ ඩොලර් බිලියන 49යි. හැබැයි, අවුරුදු 9ක කාලයක් තුළ අපට ඩොලර් බිලියන 36ක් පමණ අහිමි වෙලා තිබෙනවා, රේගුව ඇතුළු ආයතනවලින් කරන undervalue කිරීම් නිසා සහ ඒවා පසුපස හඹා ගිහින් ඒ තත්ත්වය හඳුනා නොගැනීම නිසා. ඒ වාගේ විශාල ගැටලුවක් මතු වෙලා තිබෙනවා. ගරු කථානායකතුමනි, ඉහතින් සඳහන් කළ වාර්තාවේ අදාළ කොටස මා **සභාගත*** කරනවා.

අප මේ කරුණු යථාවත් කරන්නේ නැතිව, ව්‍යවසායකයන්ට අත දුන්නාට, ප්‍රතිපත්ති රාමුව හැදුවාට, විනිවිද පෙනෙනසුලුභාවයෙන් කටයුතු කළාට ප්‍රයෝජනයක් වන්නේ නැහැ. රටට අහිමි වූ අතිවිශාල ධනස්කන්ධය පිළිබඳව අප මීට වඩා වගවීමකින් කටයුතු කරන්න අවශ්‍යයි.

ඒ වගවීම තිබෙන්න ඕනෑ දේශපාලනඥයන්ට විතරක් නොවෙයි. මොකද, දේශපාලනඥයන් බලයට ඇවිල්ලා අවුරුදු 5න්, 10න් යනවා. ඔවුන් ඇමතිකම් කරනවා; ගෙදර යනවා. හැබැයි, මේ ආයතනවල අවුරුදු 30ක්, 40ක් අඛණ්ඩව සේවය කරන විශාල නිලධාරින් පිරිසක් ඉන්නවා. ඔවුන්ට රට ගැන හැඟීමක්, ජාතික හැඟීමක් තිබෙනවා නම්, ඔවුන් සෑම කෙනෙක්ම මේ කර්තව්‍යයට එකතු වෙන්න ඕනෑ. ඔවුන් එකතු කරගන්නේ නැතිව අපට මේ ගමන සාර්ථකව යන්න බැහැ කියන කාරණාව මම සඳහන් කරනවා.

ගරු කථානායකතුමනි, අවසාන වශයෙන් මම මේ කාරණය සඳහන් කරන්න කැමැතියි. අපි වාමවාදී මධ්‍යස්ථ දේශපාලන ධාරාවකින් පැවත එන පුද්ගලයන්. ඉතිහාසයේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයත්, ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ ඇතුළු ඒ දේශපාලන ධාරාවත් නියෝජනය කළේ වාමවාදී මධ්‍යස්ථ දේශපාලන ධාරාව. ගරු ජනාධිපති රනිල් වික්‍රමසිංහ මැතිතුමා යම් පමණක දක්ෂිණාංශික මධ්‍යස්ථ මතවාදී දේශපාලන ධාරාවක් නියෝජනය කරන පුද්ගලයෙක්. එහෙම නම්, මේ රටේ දියුණුව වෙනුවෙන් අපි සෑම කෙනෙක්ම එකතු වෙලා ඉන්නවා. මේ තීරණාත්මක මොහොතේ අපේ දේශපාලන මතිමතාන්තර පැත්තක තියලා රට වෙනුවෙන් එකතු වෙන්න කියා ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමා සෑම කෙනෙකුටම ආරාධනා කළා. ඒ ආරාධනය මුලින්ම කළේ, විපක්ෂ නායකතුමාට. විපක්ෂ නායකතුමා ඒ වෙලාවේ ඒ වගකීම භාරගත්තේ නැති නිසා තමයි රනිල් වික්‍රමසිංහ මැතිතුමා අගමැති ධුරයට පත් වෙලා, අද මන්ත්‍රීවරුන්ගේ ඡන්දයෙන් ජනාධිපති ධුරයට පත් වෙලා ඉන්නේ. එතුමාත් අවස්ථා කිහිපයකදීම ඉල්ලීම් කළා, එකතු වෙලා වැඩ කරන්න එන්න කියලා.

දැන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අවශ්‍ය සංශෝධන කරලා තිබෙනවා; මේ රටට අවශ්‍ය ස්වාධීන කොමිෂන් සභා ස්ථාපනය කරලා තිබෙනවා; අනෙකුත් කරුණු කාරණා පිළිබඳව ද විනිවිද පෙනෙන පරිදි කටයුතු කරමින් තිබෙනවා. අපට දේශපාලනය කරන්න පුළුවන්. ජනතාව කැමැති පුද්ගලයෙකු ඊළඟ මැතිවරණයේදී තෝරා ගනීවි. හැබැයි, ඒ මැතිවරණයට පෙර කළ යුතු දෙයක් තිබෙනවා. මේ රට ස්ථාවර කිරීම වෙනුවෙන්, රටේ ආර්ථික ස්ථාවරභාවය වෙනුවෙන් සහ ඉදිරි ගමන වෙනුවෙන් පැහැදිලි දැක්මක් ඉදිරිපත් කර තිබෙනවා. ඒ දැක්ම යථාර්ථයක් බවට පත් කරන්න අපි සෑම දෙනා එකතු වෙලා කටයුතු කරමු කියන යෝජනාව කරමින්, මට මේ අවස්ථාව ලබා දීම ගැන ඔබතුමාටත් ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වෙනවා.

**ගරු රංජිත් සියඹලාපිටිය මහතා**
(மாண்புமிகு ரஞ்ஜித் சியம்பலாபிடிய)
(The Hon. Ranjith Siyambalapitiya)

ගරු කථානායකතුමනි, ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මන්ත්‍රීතුමා අද උදේ මගෙන් ප්‍රශ්නයක් ඇහුවා. ඒකට කෙටි පිළිතුරක් ලබා දීම සඳහා මට අවස්ථාව දෙන්න. ඒක වැදගත් ප්‍රශ්නයක්. එතුමා 2023 වර්ෂයේ වියදම් ගැන කථා කරමින් ඩොලර් බිලියන 15ක් ගැන ඇහුවා. ගරු කථානායකතුමනි, ඩොලර් බිලියන 15ක් නොවෙයි, ආනයනය සඳහා ඩොලර් බිලියන 20ක් වියදම් කරන්න අපි estimate කරලා තිබෙනවා. ඒ ඩොලර් බිලියන 20 ලැබෙන්නේ, අපනයන ආදායමෙන් ඩොලර් බිලියන 14ක්, ශ්‍රමික ප්‍රේෂණවලින් ඩොලර් බිලියන 4.5ක්, සංචාරක ඉපැයීම්වලින් ඩොලර් බිලියන 2.1ක් වශයෙනුයි. මේ කාරණය ඉතාම පැහැදිලියි. මෙය සිහින ඇස්තමේන්තුවක් නොවෙයි. අපි ආවොත් මෙච්චර ලැබෙයි කියලා හිතන එකක් නොවෙයි. අපට තානාපතිවරුන් කියපු කාරණාවකුත් නොවෙයි. මුදල් හොයා ගන්නා ආකාරය අපි ඉතා පැහැදිලිව ඇස්තමේන්තුවක් මඟින් පෙන්වා තිබෙනවා.

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු කථානායකතුමනි, -

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

ගරු කථානායකතුමනි, අපේ ගරු මුදල් රාජ්‍ය ඇමතිතුමාත් සභාවේ සිටින නිසා මම වැදගත් කාරණයක් කෙටියෙන් මතු කරන්න කැමැතියි. ගරු රාජ්‍ය අමාත්‍යතුමනි, සංවර්ධන ලොතරැයි මණ්ඩලය 19වැනි දා කොළඹදී "සංවර්ධන අභිමන්" නමින් කෑම plate එකකට රුපියල් 3,700ක් වියදම් කරලා ලොකු පාටියක් දාන්න ලෑහැස්ති කරලා තිබෙනවා. ගරු මුදල් රාජ්‍ය ඇමතිතුමනි, කරුණාකර ඒ ගැන සොයා බලන්න. ඒ වාගේම, ජාතික ලොතරැයි මණ්ඩලය 2022 මාර්තු 14වන දා ඉඳන් මැයි මාසයේ 15වන දා වන කල් ලොතරැයි පත් මුද්‍රණය කරලා නැහැ. ගරු රාජ්‍ය අමාත්‍යතුමනි, ඒ ඔබතුමා හිටපු නැති කාල වකවානුවක්. "ගොවිසෙත" ලොතරැයිය වාර 57ක් මුද්‍රණය කරලා නැහැ. ගරු කථානායකතුමනි, අලාභය කොච්චරද? "ගොවිසෙත" ලොතරැයිය 57 වාරයක් මුද්‍රණය වෙලා නැහැ. ඒ කියන්නේ, කාලයක් ලංකාවේ ඒ ලොතරැයිය තිබිලා නැහැ. කලින් ටිකට් මුද්‍රණය කරපු කොම්පැනියටම නැවත ඒ ටිකට් මුද්‍රණය කිරීම සඳහා දීලා තිබෙනවා. රුපියල් කෝටි 60කට වඩා මේ රටට පාඩුයි. ඒ කියන්නේ, රුපියල් මිලියන 600ක්. ගරු කථානායකතුමනි, කෘෂිකර්ම අමාත්‍යාංශයට ගොවිසෙත ලොතරැයියෙන් විශාල මුදලක් ලැබෙනවා. ඒකත් දැන් අහිමි වන තත්ත්වයට පත් වෙලා තිබෙනවා. ගරු රාජ්‍ය අමාත්‍යතුමනි, මම ගෞරවයෙන් ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා, ඒ පිළිබඳව සොයා බලා කටයුතු කරන්න කියලා.

**ගරු රංජිත් සියඹලාපිටිය මහතා**
(மாண்புமிகு ரன்ஜித் சியம்பலாபிடிய)
(The Hon. Ranjith Siyambalapitiya)

ගරු කථානායකතුමනි, එතුමා ඒ තොරතුරු ලබා ගත් මූලාශ්‍ර ගැන මම දන්නේ නැහැ. නමුත් ඒ පිළිබඳව අවධානය යොමු කරලා අවශ්‍ය පියවර ගන්න, අවශ්‍ය නිවැරදි කිරීම් කරන්න මැදිහත් වෙන්න මා සූදානම්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Next, Hon. Dharmalingam Sithadthan.

[மு.ப. 11.01]

**ගරු ධර්මලිංගම් සිද්ධාර්ථන් මහතා**
(மாண்புமிகு தருமலிங்கம் சித்தார்த்தன்)
(The Hon. Dharmalingam Sithadthan)
Sir, I think I have 20 minutes.

கௌரவ சபாநாயகர் அவர்களே, சுதந்திர இலங்கையானது கடந்த 75 வருட காலத்தில் இப்படியானதொரு பாரிய பொருளாதார நெருக்கடியைச் சந்தித்ததில்லை. 1970களில் சிறிமாவோ பண்டாரநாயக்க அம்மையார் அவர்கள் பிரதமராக இருந்தபோது, பொருளாதார நெருக்கடி ஏற்பட்டது. அவர் அதனை வேறு விதமாகக் கையாண்டார். அப்போது நிதி அமைச்சராக இருந்த டாக்டர் என்.எம். பெரேரா அவர்கள், ஒளித்து வைத்திருந்த பணத்தை வெளியிலே கொண்டு வருவதற்காக 50 ரூபாய், 100 ரூபாய் தாள்களைச் செல்லுபடியற்றதாக்கினார். இவ்வாறு பல நடவடிக்கைகளை எடுத்து, நாட்டின் பொருளாதாரத்தைச் சீர்செய்ய அவர் முயற்சித்தார். அதுமாத்திரமல்ல, அந்த நேரத்தில் வன்னியில் விசுவமடு போன்ற பகுதிகளில் எங்களுடைய தமிழ் இளைஞர்கள் பலருக்குக் காணிகள் கொடுக்கப்பட்டன. செழிப்பான வாழ்க்கையை உருவாக்குவதற்கு இவ்வாறு உதவிகள் செய்யப்பட்டு, நாடு மீண்டும் கட்டியெழுப்பப்பட்டது.

இன்று நாடு வங்குரோத்து நிலையில் இருக்கின்றது. இந்த நிலையில், "இலங்கை, புதியதோர் எதிர்காலத்தை நோக்கி...." என்ற கருப்பொருளில் சனாதிபதி அவர்கள் நிதி அமைச்சர் என்ற முறையில் 2023ஆம் ஆண்டுக்கான வரவு செலவுத்திட்டத்தைச் சமர்ப்பித்திருக்கிறார். எந்தவித ஆரவாரமுமின்றி, சலுகைகளுமின்றி அவர் அதனை வாசித்து முடித்தார். இன்றைய சூழலில் பாரிய சலுகைகள் கிடைக்குமென மக்களும் பெரிதாக எதிர்பார்த்திருக்கமாட்டார்கள். ஏனெனில், தற்போதைய பொருளாதார நிலைமை பற்றி அவர்களுக்கு நன்றாகவே தெரியும்! என்றாலும், அவர்கள் அதனை மிகக் கவனமாக அவதானித்துக்கொண்டிருந்தார்கள். அவர்களின் எதிர்பார்ப்பை அரசாங்கம் பூர்த்திசெய்திருக்கிறதா? என்றால், இல்லை! மக்களுக்கோ, தொழிலாளர் வர்க்கத்தினருக்கோ எந்தவிதமான சலுகையும் கொடுக்கப்படவில்லை.

இலங்கையில் அரச உத்தியோகத்தர்கள், தனியார் நிறுவனங்களில் வேலை செய்பவர்கள்தான் நடுத்தர வர்க்கத்தினராகக் கணிக்கப்பட்டு வந்தார்கள். பொருளாதார நெருக்கடி ஏற்படுவதற்கு முன்னர், அவர்கள் நிரந்தர மாதாந்த வருமானத்தைப் பெற்று, ஓரளவுக்குத் தங்களுடைய குடும்ப வாழ்க்கையை நடாத்திக்கொண்டிருந்தார்கள். ஆனால், இன்று அவர்களும் வறுமைக் கோட்டுக்குக்கீழ் தள்ளப்பட்டிருக்கிறார்கள். என்னுடன் பலர் கதைக்கும்பொழுது, தாங்கள் சிலவேளைகளில் இரண்டு வேளைதான் உணவு உண்பதாகவும், தாங்கள் பட்டினி இருந்துகொண்டு, குழந்தைகளுக்குச் சாப்பிடக் கொடுப்பதாகவும் வெட்கத்தைவிட்டுக் கூறுகிறார்கள். அப்படியான நிலைமைகள்தான் இப்பொழுது உருவாகியிருக்கின்றன. இதற்காக நான் இந்த அரசாங்கத்தை மாத்திரம் குறைகூறவில்லை. இது தொடர்ந்து வருகின்ற ஒரு பிரச்சினையாகும். அதன் உச்சத்தைத்தான் நாங்கள் இப்போது எட்டியிருக்கிறோம். அதனால்தான் நாடு வறுமையில் சிக்கி, வங்குரோத்து நிலையை அடைந்திருக்கிறது. நாடு வங்குரோத்து நிலையை அடைந்திருக்கின்ற நேரத்திலும்கூட, வரவு செலவுத்திட்டத்தில் பாதுகாப்பு அமைச்சுக்கு -

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Order, please! The Hon. Deputy Speaker will now take the Chair.

*අනතුරුව ගරු කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්,* **නියෝජ්‍ය කථානායකතුමා [ගරු අජිත් රාජපක්ෂ මහතා]** *මූලාසනාරූඪ විය.*

*அதன்பிறகு, மாண்புமிகு சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, பிரதிச் சபாநாயகர் அவர்கள் [மாண்புமிகு அஜித் ராஜபக்ஷ] தலைமை வகித்தார்கள்.*

*Whereupon* THE HON. SPEAKER *left the Chair, and* DEPUTY SPEAKER [THE HON. AJITH RAJAPAKSE] *took the Chair.*

ගරු ධර්මලිංගම් සිද්ධාර්ථන් මහතා
(மாண்புமிகு தருமலிங்கம் சித்தார்த்தன்)
(The Hon. Dharmalingam Sithadthan)

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, பாதுகாப்பு அமைச்சு, பொதுமக்கள் பாதுகாப்பு அமைச்சு ஆகிய இரண்டு அமைச்சுக்களுக்கும் ஒதுக்கப்பட்டிருக்கின்ற நிதியானது, என்றும் முக்கியமாகச் செயற்படவேண்டிய அமைச்சுக்களான சுகாதாரம், கல்வி, விவசாயம் போன்ற அமைச்சுக்களுக்கு ஒதுக்கப்பட்ட நிதியைவிட அதிகமாகக் காணப்படுகிறது. குறிப்பாக, இந்த அமைச்சுக்கள் சார்ந்த துறைகளை ஊக்குவிப்பதன் மூலம்தான் இந்த நாட்டின் பொருளாதாரத்தை மீண்டும் கட்டியெழுப்ப முடியும் என்ற நிலைப்பாடு இருக்கின்ற இக்காலகட்டத்தில், அவற்றுக்கு ஒதுக்கப்பட்டிருக்கின்ற நிதியைவிடக் கூடுதலான நிதி பாதுகாப்பு அமைச்சுக்கு ஒதுக்கப்பட்டிருக்கிறது.

2021ஆம் ஆண்டைவிட, 2022ஆம் ஆண்டில் பாதுகாப்பு அமைச்சுக்குக் கூடுதலான நிதியும் 2022ஆம் ஆண்டைவிட, 2023ஆம் ஆண்டில் கூடுதலான நிதியும் ஒதுக்கப் பட்டிருக்கிறது. இந்த நாட்டில் யுத்தம் முடிவடைந்துவிட்டது. அப்படியிருக்கையில், ஏன் பாதுகாப்பு அமைச்சுக்குத் தொடர்ந்தும் கூடுதலான நிதி ஒதுக்கப்பட்டு வருகிறது என்ற கேள்வி எங்கள் மத்தியிலும் மக்கள் மத்தியிலும் இருக்கிறது. இவ்வாறு கூடுதலாக ஒதுக்கப்படுகின்ற நிதியானது, எங்களுடைய பகுதிகளில் இருக்கின்ற காணிகளை அபகரிப் பதற்கும் அவற்றைப் பிடித்து வெவ்வேறு தேவைகளுக்காகப் பயன்படுத்துவதற்கும்தான் பாவிக்கப்படுகிறது என்பது எங்களுக்குத் தெளிவாகத் தெரிகிறது. இன்றைய கால கட்டத்தில் பாதுகாப்பு அமைச்சுக்கு யுத்த காலத்தில் ஒதுக்கப் பட்ட நிதியைக் காட்டிலும் கூடுதலான நிதியை ஒதுக்குவதற்கு என்ன தேவை இருக்கிறது? யுத்த காலத்தில் ஆயுதத் தளபாடங்களை வாங்குவதற்குக் கூடுதலான நிதி உங்களுக்குத் தேவைப்பட்டிருக்கலாம்! அவ்வாறான தேவை இன்று இல்லாத போது, எதற்காக பாதுகாப்பு அமைச்சுக்கு இவ்வளவு தொகை நிதி ஒதுக்கப்படுகிறது? அப்படியென்றால், இன்றும் இந்த நாடு யுத்த மனப்பான்மையுடன்தான் இருக்கிறதா? என்பதை நாங்கள் மிகத் தெளிவாக உணர்ந்துகொள்ள வேண்டும். ஆகவே, பாதுகாப்பு அமைச்சுக்கு ஒதுக்கப்பட்டிருக்கின்ற நிதியை நிச்சயமாக அரைவாசியாகக் குறைக்க வேண்டும்.

இன்று நாளாந்த வருமானத்தை எதிர்பார்த்து வாழுகின்ற குடும்பங்கள் பட்டினியில் இருப்பதை நாங்கள் பார்க்கக்கூடிய தாக இருக்கிறது. அவர்களுக்கான நிவாரணங்கள் சரியான முறையிலே கொடுக்கப்பட வேண்டும். அத்துடன், அவை சரியாகப் பகிர்ந்தளிக்கப்படுகிறதா என்பதையும் பார்க்க வேண்டும். அதற்கென குறிப்பிட்டளவு தொகை நிதி இம்முறை வரவு செலவுத்திட்டத்தில் ஒதுக்கப்படவுமில்லை. இன்றிருக் கின்ற பொருளாதார நெருக்கடி நிலைமையில், மக்களுடைய வறுமை நிலையைப் போக்குவதற்கான நடவடிக்கைகளை எடுக்கவேண்டியது அரசாங்கத்தின் மிக முக்கிய கடமையாக இருந்தாலும், அவற்றைச் செய்வதை அரசாங்கம் தாமதப் படுத்துவதை அல்லது அவற்றைச் செய்யாமல்விடுகின்ற நிலைமையை நாங்கள் பார்க்கக்கூடியதாக இருக்கிறது.

பொருளாதார நெருக்கடி காரணமாக இலங்கையில் ஏறக்குறைய 40 சதவீதமான மக்கள் வறுமைக் கோட்டுக்குக்கீழ் மிகவும் பாதிப்பான நிலையில் வாழ்ந்துகொண்டிருப்பதாக பேராதனைப் பல்கலைக்கழகத்தால் மேற்கொள்ளப்பட்ட ஆய்வின் முடிவு சொல்கிறது. அதேவேளையில், உலக வங்கி யால் வெளியிடப்பட்ட 2020-2021ஆம் ஆண்டு காலப் பகுதிக்கான அறிக்கையில், இலங்கையில் ஏறக்குறைய 13.1 சதவீதமான மக்கள் வறுமை நிலையில் இருப்பதாகச் சொல்லப் பட்டிருக்கிறது. அது 2022ஆம் ஆண்டின் நடுப்பகுதியில் 25.6 சதவீதமாக உயர்வடைந்திருக்கிறது. இவ்வாறு வறுமை நிலைக்குச் செல்கின்ற மக்களை அதிலிருந்து மீட்டெடுப் பதற்குப் படிப்படியாக நடவடிக்கைகள் எடுக்கப்படுமென இந்த வரவு செலவுத்திட்டத்தில் கூறப்பட்டிருக்கிறது. இந்த விடயங்கள் எல்லாம் எழுத்திலே இருக்கின்றன; it is on paper. இவை செயற்படுத்தப்பட வேண்டும். அதற்கான நிதியை எங்கிருந்து பெறுவது? என்ற கேள்வி எழுகிறது. இன்று இந்த நாட்டினுடைய மொத்த வெளிநாட்டுக் கடன் ஏறக்குறைய 51 பில்லியன் டொலராகும். அதில் 35 பில்லியன் டொலர் இறையாண்மைக் கடனும் இருக்கிறது. இந்த நிலையில், இந்த வரவு செலவுத்திட்டமானது, முழுமையாகவே IMF எனப்படும் சர்வதேச நாணய நிதியத்திடமிருந்து கிடைக்க இருக்கின்ற நிதியை எதிர்பார்த்துத்தான் தயாரிக்கப்பட்டிருக்கிறது. சர்வதேச நாணய நிதியத்திடமிருந்து எதிர்பார்க்கின்ற நிதியின் அளவு 2.9 பில்லியன் அமெரிக்க டொலராகும். இதன்மூலம் எப்படி இந்த நாட்டினுடைய பொருளாதாரத்தை மீளக் கட்டியெழுப்ப முடியும்? அது எப்படிச் சாத்தியமாகும்? என்ற கேள்விகள் எழுகின்றன.

கடந்த காலங்களில் மக்களைத் திருப்திப்படுத்தக்கூடிய வகையிலான தீர்மானங்கள் எடுக்கப்பட்டதாலும், கடுமை யான தீர்மானங்கள் சிலவற்றை எடுக்காமல்விட்டதனாலும் தான், இன்று இந்த நாடு இந்த நிலைமைக்குப் போயிருப்பதாக மாண்புமிகு சனாதிபதி அவர்கள் பல தடவை சொல்லி யிருக்கிறார். சனாதிபதி அவர்கள் கூறிய விடயம் நூற்றுக்கு நூறு சதவீதம் உண்மையானது. சிங்கப்பூரின் முன்னாள் பிரதமர் லீ குவான் யூ அவர்கள் கூறிய, "நான் கடுமையான தீர்மானங்களை எடுத்தேன்; பண்டாரநாயக்கா அவர்கள் மக்களைத் திருப்திப்படுத்தும் வகையில் பிரபல்யமான தீர்மானங்களை எடுத்தார்" என்ற கூற்றை அவர் உதாரணம் காட்டியிருக்கிறார். அப்படியான தீர்மானங்களால்தான் இலங்கை இவ்வளவுதூரம் பின்னடைந்திருப்பதாக அவர் கூறியிருக்கிறார். நிச்சயமாக, லீ குவான் யூ அவர்கள் சொன்ன விடயம், இனப்பிரச்சினையுடன் சம்பந்தப்பட்ட விடயமாகும். 1956ஆம் ஆண்டில் தனிச் சிங்களச் சட்டம் கொண்டுவரப் பட்டதனால்தான், இந்த நாட்டில் இனப்பிரச்சினை ஆரம்ப மானது. அதனால் ஏற்பட்ட அழிவுகள் அதிகம்! அதன் காரணமாக படிப்படியாக பிரச்சினைகள் ஏற்பட்டு, யுத்தம் உருவானது. அரசாங்கம் கோடிக்கணக்கான ரூபாயை - billions of rupeesஐ - செலவழித்து யுத்தத்தை நடத்தியது. அதற்காக வெளிநாடுகளிடமிருந்து கடனும் பெற்றது. கடைசியில், நாடும் அழிந்து, கடனாளியாகவும் மாறி, பொருளாதாரப் பின்ன டைவைச் சந்திக்கவேண்டிய நிலைமை உருவானது. அந்த சரித்திரத்தை நோக்கிப் போகவேண்டிய அவசியமில்லை.

ஆகையால், மாண்புமிகு சனாதிபதி அவர்கள் சரியான தீர்மானங்களை எடுக்கவேண்டுமே ஒழிய, மக்களைத் திருப்திப் படுத்தக்கூடிய வகையில் பிரபல்யமான தீர்மானங்களை எடுக்கக்கூடாது. இன்றிருக்கின்ற நிலைமையில், நியாயமான அரசியல் தீர்வுதான் இந்தப் பிரச்சினைக்கு நிரந்தரத் தீர்வாக அமையுமென எவரும் சொல்வார்கள். ஏனென்றால், இனப் பிரச்சினை இருக்கும் வரை நல்லிணக்கம் ஏற்பட வாய்ப் பில்லை. நாங்கள் அடிக்கடி நல்லிணக்கம் பற்றிப் பேசுகிறோம். நல்லிணக்கம் ஏற்படவேண்டுமென்றால், நியாயமானதோர் அரசியல் தீர்வு முன்வைக்கப்பட வேண்டும்.

அரசியல் தீர்வை முன்வைப்பதற்காக கடந்த காலங்களில் பல முயற்சிகள் எடுக்கப்பட்டன. அதற்காக கோடிக்கணக்கான ரூபாய் செலவழிக்கப்பட்டது. 2020-2021ஆம் ஆண்டு காலப்

பகுதியில் கோட்டாபய ராஜபக்ஷ அவர்கள் சனாதிபதியாக இருந்தபோது, அதற்கென நிபுணர் குழுவொன்றை அமைத்தார். அதன் நடவடிக்கைகளுக்கென 158 மில்லியன் ரூபாயும் ஒதுக்கப்பட்டது. அதில் ஏறக்குறைய 21 மில்லியன் ரூபாய் செலவு செய்யப்பட்டிருக்கிறது. நான் இதனை வெறுமனே சொல்லவில்லை. மாறாக, இந்தத் தகவலை கணக்காய்வாளர் நாயகத்தின் அறிக்கையிலிருந்தே எடுத்தேன். பின்னர், அக்குழு அப்படியே கிடப்பிலே கிடந்தது. இதுபோல, கடந்த காலங்களில் இலட்சக்கணக்கான ரூபாய் செலவழிக் கப்பட்டு, பல விடயங்கள் முன்னெடுக்கப்பட்டன. எனினும், அவை கிடப்பில் போடப்பட்டதனால், எதுவுமே நடைபெற வில்லை. சந்திரிக்கா பண்டாரநாயக்க குமாரதுங்க அவர்கள் சனாதிபதியாக இருந்த காலத்தில் கொண்டுவரப்பட்ட, "பிராந்தியங்களின் ஒன்றியம்" என்ற தீர்வுத்திட்டம் ஓரளவுக்கு அனைவராலும் ஏற்றுக்கொள்ளப்பட்டது. அது இன்றும் இருக்கிறது. மாண்புமிகு சனாதிபதி அவர்கள் 75ஆவது சுதந்திர தினத்திற்கு முன்பு அரசியல் தீர்வைப் பெற்றுக்கொடுப்பதாகக் கூறியிருக்கிறார். அது நல்லதொரு விஷயம்! நிச்சயமாக அவர் அதைச் செய்யவேண்டும். அவர் அதனைச் செய்வார் என்று நாங்களும் எதிர்பார்க்கிறோம். இதற்கென மீண்டும் Select Committeeஐ நியமித்து, round-table conferenceஐ நடாத்தி அதிகளவு நிதியைச் செலவழிக்காமல், சந்திரிக்கா பண்டார நாயக்க குமாரதுங்க அவர்களுடைய காலத்தில் முன்வைக்கப் பட்ட அந்தத் தீர்வுத்திட்டத்தை நடைமுறைப்படுத்துவது பற்றி யோசிக்க வேண்டும்.

ஐக்கிய தேசியக் கட்சியைப் பிரதிநிதித்துவப்படுத்திய, அப்போதைய வெளிவிவகார அமைச்சராக இருந்த ஏ.சீ.எஸ். ஹமீத் அவர்கள், அன்று அது சம்பந்தமாக நடைபெற்ற கூட்டங்களில்பங்குபற்றி, அதிலுள்ள விடயங்களை மிக ஆழமாக ஆராய்ந்தார். அதுமாத்திரமல்ல, அதிலுள்ள பல விஷயங்களையும் ஏற்றுக்கொண்டார். ஆகையால், அதை அமுல்நடத்துவதில் எந்தக் கஷ்டமும் இருக்காது. அவர் கூறியதுபோல, இந்த நாட்டில் ஒற்றுமையை ஏற்படுத்த வேண்டுமானால், சில விஷயங்களை விட்டுக்கொடுத்து, "பிராந்தியங்களின் ஒன்றியம்" என்ற தீர்வுத் திட்டத்தை அமுல்படுத்தலாம். எங்களுடைய நிலைப்பாடும் அதுதான். அதுமாத்திரமல்ல, பண்டாரநாயக்க அவர்களுடைய ஆட்சிக் காலத்தில் கைச்சாத்திடப்பட்ட பண்டா - செல்வா ஒப்பந்தமும் இல்லாமற்போயிருக்கிறது.

அடுத்து, இன்று வட, கிழக்கு மாகாணங்கள் எவ்வாறு ஒதுக்கப்படுகின்றன என்பதற்குச் சில உதாரணங்களை நான் இங்கு சொல்ல விரும்புகிறேன். ஒன்று, துணுக்காய், மல்லாவி பிரதேசங்களிலுள்ள 7,377 குடும்பங்களுக்கு குடிநீர் வழங்கும் திட்டத்திற்காக உலக வங்கியால் 1,200 மில்லியன் ரூபாய் ஒதுக்கப்பட்டிருந்தது. அந்தத் திட்டத்தை நடைமுறைப் படுத்தாமல், வேறொரு மாவட்டத்திற்குக் கொண்டுசெல்வதற்கு முடிவு எடுக்கப்பட்டிருக்கிறது. இந்த முடிவானது, நிச்சயமாக தமிழர்களைப் பாதிக்கும்! நாட்டில் பாரிய பொருளாதாரப் பிரச்சினைகள் இருந்துகொண்டிருக்கின்ற இந்தக் கால கட்டத்தில்கூட, அரச அதிகாரிகள் இவ்வாறான விடயங்களைச் செய்வதில் மிகக் கவனமாக இருக்கிறார்கள். அவர்கள் எந்தப் பிரச்சினையும் இல்லாமல் இவற்றைச் செய்கிறார்கள்; செய்துகொண்டும் இருக்கிறார்கள். ஆகையால், அரசாங்கம் இதனைக் கட்டாயம் கவனத்திலெடுக்க வேண்டும்.

அடுத்தது, திருக்கோணேஸ்வரப் பிரச்சினை! நாங்கள் இவ்விடயம் தொடர்பில் இங்கு பல தடவை பேசியிருக்கிறோம். கௌரவ அமைச்சர் அவர்கள் அங்கு விஜயம் செய்து, அங்கு நடைபெறுகின்ற செயற்பாடுகளை நிறுத்தியிருக்கிறார். அது நல்ல விடயமாகும். அதேபோல், அதைச் சரியான முறையிலே தீர்த்துவைக்க வேண்டியது அவருடைய கடமையாகும். இவ்வாறு பல பிரச்சினைகளுக்கு நாங்கள் முகங்கொடுத்து வருகின்றோம். அவற்றைத் தீர்ப்பதற்கு அரசாங்கம் முயற்சிக்க வேண்டும். ஏனெனில், நாங்கள் தற்போதைய சூழலை நல்லதொரு சந்தர்ப்பமாகவே பார்க்கிறோம். எங்களுக்காக அல்ல, இந்த நாட்டுக்காக. இந்த நாடு பொருளாதார ரீதியில் பின்னடைந்திருக்கின்ற இவ்வேளையில், அனைத்து மக்களும் ஒன்றாகச் சேர்ந்து, நாட்டில் இருக்கின்ற முக்கிய பிரச்சினையான இனப் பிரச்சினைக்கு ஒரு நியாயமான தீர்வைக் காண்பதன்மூலம் தமிழர்கள், சிங்களவர்கள், முஸ்லிம்கள் என்ற வேறுபாடின்றி, அனைவருமாகச் சேர்ந்து இந்த நாட்டை மீளக்கட்டியெழுப்புவதற்கான சந்தர்ப்பத்தை உருவாக்க முடியும். இன்று நாங்கள் இதைச் செய்யத் தவறுவோமேயானால், நாடு பொருளாதார ரீதியில் மேலும் பின்னடைவதை எவராலும் தடுத்து நிறுத்த முடியாது.

இன்று நாட்டைவிட்டு professionals - வைத்தியர்கள், engineers எனப் பலர் - சென்றுகொண்டிருக்கிறார்கள். நான் இதனை சும்மா சொல்லவில்லை. நேரடியாக அறிந்த விடயங்களைத்தான் சொல்கிறேன். என்னுடைய நண்பர்கள் சிலரும் அப்படியாக வெளிநாடு சென்றிருக்கிறார்கள். இந்த நாட்டில் வாழ முடியாது என்ற காரணத்துக்காக அவர்கள் தற்காலிகமாகச் சென்றாலும்கூட, அங்கு அவர்கள் தங்களை ஸ்திரப்படுத்திக்கொண்டால், நிச்சயமாக அவர்கள் நாட்டுக்குத் திரும்பி வரமாட்டார்கள். வைத்திய நிபுணர்கள் பலரும் வெளிநாடு சென்றிருக்கிறார்கள். இது இந்த நாட்டுக்கு மிகப் பெரிய பிரச்சினையாக மாறியிருக்கிறது. தங்களால் வைத்தியத் தொழிலைச் சிறப்பாகச் செய்ய முடியாது என்று அவர்கள் கூறுகிறார்கள். ஏனென்றால், இன்று வைத்தியசாலைகளில் சில நோய்களுக்கான மருந்துகள் இல்லை; மருத்துவ உபகரணங்கள் இல்லை. இவற்றையாவது அரசாங்கம் தரவில்லை என்றால், தாங்கள் இங்கிருந்து என்ன செய்வது? என்று அவர்கள் கேட்கிறார்கள். அவர்கள் இங்கு தங்களை அர்ப்பணித்து வேலைசெய்வதற்குத் தயாராக இருந்திருக் கிறார்கள். எனினும், தங்களால் சிறந்த சேவையை வழங்க முடியவில்லை என்ற காரணத்துக்காகப் பலர் நாட்டை விட்டுச் சென்றிருக்கிறார்கள். இன்னும் பலர் செல்ல இருக்கிறார்கள். சிலர் இப்போது இருக்கின்ற நிலைமையைப் பார்த்து, அதாவது நீண்ட வரிசைகள் இல்லாமல் போயிருக்கின்றன; பிரச் சினைகள் குறைந்திருக்கின்றன என்று எண்ணி, நாட்டினுடைய பொருளாதாரம் முன்னேறுவதற்கான வாய்ப்பு இருக்கிறது என்ற நம்பிக்கையில் நாட்டிலேயே இருக்கிறார்கள். இப்படி யாக மக்கள் அனைவரும் மிகவும் குழப்பமான நிலையில் இருக்கிறார்கள். இந்தக் குழப்பங்கள் நீங்க வேண்டுமானால், இந்த நாடு பொருளாதார ரீதியாக முன்னேற வேண்டும். அதேநேரத்தில் தேசிய இனப் பிரச்சினைக்கு நியாயமான தீர்வைக் காண வேண்டும். நான் முன்னர் கூறியதுபோன்று, "பிராந்தியங்களின் ஒன்றியம்" என்ற தீர்வுத்திட்டத்தின் மூலமோ அல்லது சமஷ்டி முறையிலோ அல்லது தமிழ் மக்கள் ஏற்றுக்கொள்ளக்கூடிய வேறு எந்த முறையிலோ அதற்குத் தீர்வைக் காண வேண்டும். அதற்கு இந்தச் சபையிலே இருக்கின்ற 225 பேரும் ஒத்துழைக்க வேண்டும்.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
දැන් කථාව අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමා.

**ගරු ධර්මලිංගම් සිද්ධාර්ථන් මහතා**
(மாண்புமிகு தருமலிங்கம் சித்தார்த்தன்)
(The Hon. Dharmalingam Sithadthan)

முடிக்கிறேன். இதற்கு நீண்ட காலம் எடுக்க முடியாது. ஏனெனில், 75 வருடங்கள் கடந்துவிட்டன. இப்பிரச்சினை யானது, இந்த நாடு சுதந்திரம் அடைந்ததிலிருந்து இருக்கிறது. இது மலையக மக்களுடைய பிரச்சினையுடன் ஆரம்பிக் கப்பட்டது. பாகிஸ்தானிய - இந்தியக் குடியுரிமைச் சட்டத்தின் மூலம் பத்து இலட்சம் மக்கள் குடியுரிமை அற்றவர்களாக ஆக்கப்பட்டார்கள். மிகவும் பின்தங்கிய நிலையில் இருக்கின்ற மலையகத் தமிழர்களுக்கு இந்த வரவு செலவுத்திட்டத்தில் நிவாரணம் வழங்கியிருக்கலாம். கௌரவ மனோ கணேசன் அவர்கள் கூறியதுபோல, at least இப்படியோர் இனம் இந்த நாட்டில் இருக்கிறது என்பதாக அச்சமூகத்தின் பெயரையாவது வரவு செலவுத்திட்டத்தில் mention பண்ணியிருக்கலாம்! அவ்வாறுகூட, இந்த வரவு செலவுத்திட்டத்தில் அவர்கள் பற்றிக் குறிப்பிடப்படவில்லை. அந்த இனம் மிகவும் கஷ்டப் படுகின்ற ஓர் இனமாகும். எங்களுடைய பகுதிகளில் யுத்தத் தால் பாதிக்கப்பட்ட மக்கள் எப்படி துன்பப் படுகிறார்களோ, அதேயளவு துன்பத்தை அவர்களும் அனுபவிக்கிறார்கள். இவற்றையெல்லாம் நிவர்த்தி செய்வதற்கு அரசாங்கம் கட்டாயம் நடவடிக்கை எடுக்கவேண்டுமென்று கேட்டு, எனது உரையை முடித்துக்கொள்கிறேன். நன்றி. வணக்கம்.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ගරු ශෂීන්ද්‍ර රාජපක්ෂ මැතිතුමා. ඔබතුමාට මිනිත්තු 14ක කාලයක් තිබෙනවා.

[අ.භා. 11.20]

**ගරු ශෂීන්ද්‍ර රාජපක්ෂ මහතා (වාරිමාර්ග රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு சஷீந்திர ராஜபக்ஷ - நீர்ப்பாசன இராஜாங்க அமைச்சர்)
(The Hon. Shashindra Rajapaksa - State Minister of Irrigation)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම කථාව ආරම්භ කරන්නේ මා නියෝජනය කරන ඌව පළාතට විශේෂ සැලකීමක් ලෙස ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයට නව වෛද්‍ය පීඨයක් ආරම්භ කිරීමට ප්‍රතිපාදන වෙන් කිරීම පිළිබඳව ගරු ජනාධිපතිතුමන්ටත්, අධ්‍යාපන අමාත්‍යතුමා ඇතුළු සියලු දෙනාට ස්තුතිය පුද කරමින්.

සාම්ප්‍රදායික මානසිකත්වයකින් යුතුව ඉදිරිපත් කරන අය වැයක් වෙනුවට නව ආර්ථික වැඩ පිළිවෙළක් ක්‍රමානුකූලව, පියවරෙන් පියවර ගොඩනැඟීමට අවශ්‍ය අඩිතාලම දැමීම සඳහා උත්සාහයක් ගන්නා අය වැයක් ඉදිරිපත් කිරීම පිළිබඳව මා සන්තෝෂ වෙනවා. මේ ඉදිරිපත් කළ අය වැය හොඳම අය වැය කියලා මම මේ කියනවා නොවෙයි. නිදහස ලැබූ දවසේ සිට ඉදිරිපත් කළ අය වැය යෝජනාවලට වඩා වෙනස් යෝජනා මේ තුළ තිබෙනවා. අපි හැමදාම අහලා තියෙන්නේ බදු පිට බදු පටවන, අරක දෙනවා, මේක දෙනවා කියලා කියවන අය වැය යෝජනා. එහෙම නැත්නම් අරක අඩු කරනවා, මේක අඩු කරනවා කියන යෝජනා. පවතින ආර්ථික අර්බුදකාරී තත්ත්වය කළමනාකරණය කර ගනිමින් ආර්ථිකය ස්ථාවර කර ගැනීමේ දීර්ඝ කාලීන වැඩ පිළිවෙළක මූලාරම්භය දරන වැඩ පිළිවෙළක් මෙවර ඉදිරිපත් වෙලා තිබෙනවා. යැපුම් මානසිකත්වයක සිට ස්ථාවර ආදායමක් උපයන වැඩ පිළිවෙළක් රටේ ජනතාවට අවශ්‍යයි. ඒ නිසා මේක හොඳ ප්‍රවේශයක් ලෙස මා දකිනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සමස්ත රාජ්‍ය සේවයේ කාර්යක්ෂමතාවය හා ඵලදායීතාව පිළිබඳව රටේ ජනතාව ප්‍රශ්න කරමින් සිටින පසුබිමක් තුළ රාජ්‍ය යන්ත්‍රණය ප්‍රතිසංවිධානය කිරීම සම්බන්ධයෙන් යෝජනා මේ අය වැය තුළ ඉදිරිපත් වෙලා තිබෙනවා. මේ අවස්ථාව මහ නොහැර මේ කාර්යය ඉටු කිරීම වටිනවා කියලා මා හිතනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අය වැයේ 17 වන යෝජනාව අනුව ව්‍යාපෘති/ වැඩසටහන් ඇගයීම සඳහා නව ක්‍රමවේදයක් ඉදිරිපත් කරලා තිබෙනවා. නව ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී දූෂණය හා නාස්තිය මෙන්ම ව්‍යාපෘතිවල අපේක්ෂිත ප්‍රතිඵලය ලබා ගත හැකිද, නොහැකි ද කියලා සොයා බැලීමට ක්‍රමවේදයක් යෝජනා වෙලා තිබෙනවා. මූල්‍ය ප්‍රගතිය විගණනය කරනවා වාගේම යෝජනා වෙන ව්‍යාපෘතිවල ප්‍රායෝගිකත්වය සහ එම ව්‍යාපෘතියෙන් රටට ලැබෙන ඵලදායීත්වය පිළිබඳව නිවැරදිව විගණනය කළ යුතුයි කියලා මා විශ්වාස කරනවා. විගණන දෙපාර්තමේන්තුවෙන් දැනටත් කරන්නේ අය වැය මඟින් ලබා දුන්න ප්‍රතිපාදන වියදම් කළාද නැද්ද, ඒ ප්‍රතිපාදන නීත්‍යනුකූලව වියදම් කළාද යන්න සොයා බැලීම පමණයි. නමුත් විය යුත්තේ ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ලබා දුන්න ප්‍රතිපාදන නිවැරදිව ආයෝජනය වුණාද, ඒ හරහා රටට කොපමණ ප්‍රතිලාභයක් ලබා දෙනවාද යන්න සොයා බැලීමයි. සමස්ත රාජ්‍ය ව්‍යුහයටම මේ ක්‍රමවේදය අදාළ කළ යුතු වෙනවා කියාත් මා විශ්වාස කරනවා. එමඟින් රටේ ජනතාවගේ බදු මුදල් නිවැරදිව රටේ උන්නතිය වෙනුවෙන් ආයෝජනය වුණු බවට තහවුරු කර ගැනීමට හැකියාවක් ලැබෙනවා. අපි හුදෙක් සුබසාධන රාජ්‍යයක් වූ බැවින්ම ජනතාව අතර තිබෙන මතය තමයි පෞද්ගලික අංශයේ සේවාවන්ට වඩා රාජ්‍ය අංශයේ සේවාවල ඉතාම පසුගාමී හා අකාර්යක්ෂමතාවක් ඇති බව. ගැඹුරින් අධ්‍යයනය කරලා බැලුවොත්, විවෘතව කථා කළොත් මේ මතයේ යම් ඇත්තක් තිබෙන බව අපට හැඟෙනවා. මේ තත්ත්වය මඟහරවා ගෙන පෞද්ගලික අංශය හා සම සමව කාර්යක්ෂමව වැඩ කරන්න පුළුවන් රාජ්‍ය අංශයක් බිහි කිරීමට අපි කටයුතු කළ යුතුයි. ශක්තිමත්, කාර්යක්ෂම, ඵලදායී රාජ්‍ය සේවයක් බිහිවීම තුළින් පමණයි අපට අපේ රට ගොඩනැඟීමට හැකියාව ලැබෙන්නේ. අපි මේක කරන්නේ කොහොමද? මා තදින් විශ්වාස කරනවා, අධ්‍යාපන ප්‍රතිසංස්කරණ තුළින් රටේ අනාගත වගකීම භාරගත යුතු හා භාරගත හැකි පරම්පරාවක් නිර්මාණය කළ යුතුයි කියලා. පාසල් අවධියේදීම වෙනස්ව හිතන්න පුළුවන් නිර්මාණශීලී දරුවෙකු නිර්මාණය කිරීමට අධ්‍යාපනය ලබාදිය යුතුයි.

පොතේ පතේ වාගේම ප්‍රායෝගිකව ක්‍රියා කළ හැකි, වගකීම් දැරිය හැකි දරුවෙකු සමාජයට ලබා දිය යුතුයි. රැකියා අවශ්‍යතාව මුල් කරගත් උපාධි පාඨමාලා විශ්වවිද්‍යාලවලට හඳුන්වා දිය යුතුයි. රැකියා වෙළෙඳ පොළට අනුව උපාධිධාරීන් බිහි කළ යුතුයි. උපාධියක් හෝ උසස් අධ්‍යාපනයක් ලබා ගැනීමෙන් පසුව තමන්ට රැකියාවක් සෙවීම නොව අවශ්‍යතාව අනුව රැකියාව හඳුනාගෙන ඒ අනුව උපාධිය නිර්මාණයකොට දරුවාට ඒ අධ්‍යාපන අවස්ථාව ලබා ගැනීමට අවස්ථාවක් සකස් කර දිය යුතුයි.

විදේශ ශිෂ්‍යත්ව හා පුහුණු වැඩසටහන් සඳහා සහභාගි වන රාජ්‍ය සේවකයන් අපේ රටට ගැළපෙන පුහුණු වැඩසටහන් සඳහා යොමු කළ යුතුයි. එමඟින් ලැබෙන දැනුම හා අත්දැකීම් රටටත්, තමන්ටත් ඵලදායී ලෙස යොදා ගැනීම අධීක්ෂණය කළ යුතුයි. පෞද්ගලික අංශය මෙන්ම රාජ්‍ය සේවයේ වෘත්තිකයන්ගේ හැකියාව හා දක්ෂතා අනුව වැටුප් හා දීමනා ඉහළ නැංවීම කළ යුතුව තිබෙනවා. දක්ෂයාට තැන ලබා දීම තුළින් පළපුරුදු රාජ්‍ය සේවකයන් සේවය තුළ රඳවා ගැනීම කළ හැකි වෙනවා කියා මා විශ්වාස කරනවා. අද රටේ තිබෙන යල් පැනපු පැරණි අධ්‍යාපන ක්‍රමවේදය වෙනස් නොකොට මේ රටේ ඵලදායී සේවාවක් හදන්න අපට අවස්ථාවක් ලැබෙන්නේ නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ රට ගෝලීය වෙළෙඳ පොළවල් සඳහා රැගෙන යා යුතු බව හඳුනාගෙන තිබෙනවා. ඒ අනුව ජාත්‍යන්තර වෙළෙඳ කාර්යාලයක් පිහිටුවීමට අතිගරු ජනාධිපතිතුමා යෝජනා කරලා තිබෙනවා. අපට රටක් හැටියට තනිව කටයුතු කරන්න බැහැ. නව ගෝලීයකරණයට අපි මුහුණ දෙන්න අවශ්‍යයි. ජාතික ඵලදායිතා කොමිෂන් සභාවක් පිහිටුවීමටත් එතුමා යෝජනා කරලා තිබෙනවා. එය ඉතාම කලෝචිතයි කියා මම විශ්වාස කරනවා. පවතින ප්‍රතිපත්ති පිළිබඳව සමාජ හා පාරිසරික ගැටලු අධ්‍යයනය කිරීමට, රෙගුලාසි අධ්‍යයනය කිරීමට, වෙළෙඳ පොළවල ගැළපීම නිර්දේශ කිරීමට, ක්ෂුද්‍ර ආර්ථික ප්‍රතිපත්තිය පිළිබඳව අධ්‍යයනය කිරීමට මෙමඟින් හැකියාව ලැබෙනවා. සංශෝධන කළ යුතු කරුණු පිළිබඳව නිර්දේශ ලබා දීමට මේ මඟින් හැකියාව ලැබෙනවා.

ලෝකයේ දියුණු රටවල් ගැන අධ්‍යයනය කරලා අපි ඔවුන්ගෙන් ඉගෙන ගත යුතුයි. අනෙකුත් රටවල් පියවරෙන් පියවර සංවර්ධනය කරා ගමන් ගත් ආකාරයටම, අපි අපිට සුදුසු ක්‍රමවේදයක් අනුගමනය කළ යුතුව තිබෙනවා. ලෝක වෙළෙඳ පොළේ අපේ රටට, අපේ නිෂ්පාදනවලට, අපේ හැකියාවන්ට ජයග්‍රහණයක් ලබා ගත හැකි වන්නේ අපේ පවතින අධ්‍යාපන පද්ධතිය යාවත්කාලීනකොට ආකල්පමය වෙනසක් ඇති කිරීම තුළින් පමණයි කියලා මම විශ්වාස කරනවා. තමන්ට වගකීමක් දැරිය හැකි, ඒ වාගේම වගවීමක් ඇති වන ආකාරයේ ආකල්ප වර්ධනය කළ යුතු වෙනවා. එහෙම නැතිව හැම දාම විරෝධතා පවත්වලා, උද්ඝෝෂණ පවත්වලා, ගෙවල් ගිනි තියලා, පිකටින් කරලා මේ රට දියුණු කරන්න බැහැ. මා ඉතාම අවධාරණයෙන් කරුණක් කියන්න අවශ්‍යයි. දැන් බලන්න, නිවැරදි, සාධාරණ ආයෝජකයෙක් රටට ආපු සෑම අවස්ථාවකම අවස්ථාවාදීන් පිරිසක් එකතු වෙලා ඒ ආයෝජකයා අධෛර්යවත් කරලා එළවා ගන්නවා. ඒ ගොල්ලෝ පුරුදු වෙලා තිබෙන්නේ ආයෝජකයන් මහ අපරාධකරුවන් ලෙස දකින්නයි. එහෙම නොවෙයි විය යුත්තේ. මෙවර ඒ සඳහා හොඳ යෝජනා ඉදිරිපත් කර තිබෙනවා. ජාතික සංවර්ධන කමිටුවට - National Development Committee - ආයෝජන ව්‍යාපෘති ඉදිරිපත් කරලා, අධ්‍යයනය කරලා, එම ආයෝජනයේ තිබෙන වටිනාකම හඳුනාගෙන රටේ ජනතාවට ඉතාම විවෘතව කාරණය පැහැදිලි කරලා එම ආයෝජකයාට ඉඩ ලබා දිය යුතුයි. එමඟින්, අපට තනියම ලෝක වෙළෙඳ පොළ ජයගත නොහැකි අවස්ථාවලදී මේ ආයෝජකයන්ගේ උදවු ඇතිව අපේ රට එතැනට ගෙන යා හැකි වෙනවා කියලා මම විශ්වාස කරනවා. ඒ වාගේම අපේ රට ඇතුළත සිදුවන දේශීය සංවර්ධන කටයුතුද ඉතාම තදින් පසුවිපරම් කළ යුතුයි කියලා මම විශ්වාස කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගමේ සංවර්ධන කටයුතු සඳහා ගමෙන් යෝජනා ඉදිරිපත් වීමේ ක්‍රමවේදයක් සකස් කළ යුතුයි. ඒ වාගේම එම සංවර්ධන කටයුතුවලට අවශ්‍ය ප්‍රතිපාදන ලබා දීමේදී ගමට එහි වගකීම ද ලබා දිය යුතු වෙනවා. ප්‍රාදේශීය ලේකම් කාර්යාල හා ප්‍රාදේශීය සභා එකට එකතු වෙලා සංවර්ධන කටයුතු ඉටු කිරීමේ ක්‍රමවේදයක් ගැන හිතන්න අවශ්‍යයි.

ප්‍රාදේශීය මට්ටමින් සංවර්ධන සභාවක් ඇති කළ යුතු වෙනවා. ප්‍රාදේශීය මට්ටමේ තිබෙන රාජ්‍ය යන්ත්‍රණයත්, දේශපාලන යන්ත්‍රණයත් එකතු කරලා, ගමේ සංවර්ධනය සඳහා අවශ්‍ය ප්‍රතිපාදන ලබා දීලා එම සංවර්ධන කටයුතු ඉටු කිරීමේ වගකීමත් ඔවුන්ටම ලබා දීම සුදුසුයි කියා මම විශ්වාස කරනවා. නමුත්, මේ සංවර්ධන කටයුතු කිරීමේදී අධීක්ෂණය කිරීම වැදගත්. එය අධීක්ෂණය කිරීම සඳහා දිස්ත්‍රික් මට්ටමින් යන්ත්‍රණයක් සකස් කළ යුතු වෙනවා. ඊට පසු දිස්ත්‍රික්ක 25ම අධීක්ෂණයට අවශ්‍ය ජාතික කමිටුවක් නිර්මාණය කළ යුතු වෙනවා. ජාතික මට්ටමේ තිබෙන ඒ ඒ විෂයයට අදාළ අමාත්‍යාංශ මඟින් ගන්නා වූ ප්‍රතිපත්තිමය තීරණ ක්‍රියාත්මක කිරීමේ වගකීම මේ යන්ත්‍රණය හරහා පහළ මට්ටමට යැවීමට හැකියාව ලැබෙනවා. ඒ විතරක් නොවෙයි. අදාළ සංවර්ධන කටයුත්ත නිවැරැදිව ඉටු වුණාද, නැද්ද කියා අධීක්ෂණය කිරීමටත් මේ හරහා අවකාශ ලැබෙනවා කියා මා විශ්වාස කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම නැවත මගේ කථාවේ මුලින් කියූ කාරණාවලට එනවා. මේ සියල්ල ක්‍රියාත්මක කළ හැකි ආකාරයට අපේ රටේ අධ්‍යාපන ක්‍රමවේදය සකස් කළ යුතු වෙනවා. අද තරුණ තරුණියන් අසහනයෙන් පීඩාවට පත් වෙන්නේ වෙන කිසිම දෙයක් නිසා නොවෙයි, තමන්ට වගකීමක් නොපැවරෙන නිසායි. තමන්ගේ හැකියාව, තමන්ගේ දක්ෂතාව ලෝකයට පෙන්වන්න අවස්ථාවක් නොලැබෙන නිසා ඔවුන් එසේ අසහනයට පත් වෙනවා. ඒ සඳහා ඔවුන්ට අවස්ථාව හදලා දෙන එක අපේ වගකීමක් කියලා මම විශ්වාස කරනවා. නිදහස ලැබුණු දවසේ සිට ක්‍රියාත්මක කරන යල් පැන ගිය සාම්ප්‍රදායික ක්‍රමවේද අනුව කටයුතු කරමින් අපට ඉදිරියට යන්න හැකියාව ලැබෙන්නේ නැහැ. අලුතින් හිතන්න පුළුවන් අලුත් පරම්පරාවක් හදන්න අවශ්‍යයි. ඒ අයට මේ රටේ වගකීම භාරදිය යුතුයි කියලා මම විශ්වාස කරනවා. මම හිතනවා මෙවර අය වැය මඟින් තරමක් දුරට හෝ ඒ කටයුත්ත කිරීමට විශාල උත්සාහයක් අරගෙන තිබෙනවා කියලා. අපි මොනවා සඳහන් කළත්, මොනවා යෝජනා කළත් මේ අය වැයේ සඳහන් කරුණු ක්‍රියාත්මක කිරීම තමයි අවසානයට වැදගත් වන්නේ.

අවුරුදු 75ක් මුළුල්ලේ ඉදිරිපත් කරපු අය වැය යෝජනාවල අඩංගු නිවැරැදි අදහස් හා යෝජනා නැවත අරගෙන, ඒවායින් ක්‍රියාත්මක කරන්න බැරි වුණු දේවල් ක්‍රියාත්මක කිරීමට උත්සාහයක් ගත යුතුයි කියලා මම යෝජනා කරනවා. මම විශ්වාස කරනවා, ඒ තුළින් මේ රට නිවැරැදි ගමන් මඟක ගෙන යන්න හැකියාව ලැබෙයි කියලා. හෘදය සාක්ෂියට එකඟව, අවංකව, නිවැරැදි වැඩක් කරන්න උත්සාහයක් ගන්නා සියලු දෙනාටම ඒ කටයුත්ත සාර්ථකව ඉටු කරන්න ශක්තිය, ධෛර්යය ලැබේවා කියලා මම ප්‍රාර්ථනා කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය මෙනෙවිය - *[සභා ගර්භය තුළ නැත.]*

ගරු තිස්ස අත්තනායක මන්ත්‍රීතුමා. ඔබතුමාට මිනිත්තු 13ක කාලයක් තිබෙනවා.

[පූ.භා. 11.32]

**ගරු තිස්ස අත්තනායක මහතා**
(மாண்புமிகு திஸ்ஸ அத்தநாயக்க)
(The Hon. Tissa Attanayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙවර අය වැය ලේඛනය ඉදිරිපත් කරන්නේ, නිදහසින් පසු අපේ රට මුහුණ පා තිබෙන භයානකම අර්බුදකාරී අවස්ථාව තුළයි. අපේ රට බංකොලොත්භාවයට පත් වුණු අවස්ථාවකයි මේ අය වැය ඉදිරිපත් කර තිබෙන්නේ කියන එක අපි පැහැදිලිව දන්නා කාරණයක්.

අද අපි දැඩි ආර්ථික පීඩනයකට ලක්වෙලා තිබෙනවා. රටේ ජනතාව විශාල දරිද්‍රතාවකට මුහුණ දීලා තිබෙනවා. දරිද්‍රතාව කොච්චර ද කියනවා නම්, ලෝක බැංකු වාර්තාවලට අනුව අපේ

[ගරු තිස්ස අත්තනායක මහතා]

රටේ ජනගහනයෙන් සියයට 26ක් දැඩි ලෙස දරිද්‍රතාවට පත් වෙලා තිබෙනවා. වතු ආශ්‍රිතව මේ තත්ත්වය ඉතාම භයානකයි. වතු ආශ්‍රිතව එම අගය සියයට 48ක් පමණ වෙනවා. ඒ වාගේම, පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ සමීක්ෂණ වාර්තාවලට අනුව, අද සමස්ත ජනගහනයෙන් සියයට 40කට වැඩි ප්‍රමාණයක් විශාල දරිද්‍රතාවකින් පෙළෙනවා.

ඒ විතරක් නොවෙයි. උද්ධමනය අතින් ගත්තොත්, මේ සියවසේ වැඩිම උද්ධමනකාරී තත්ත්වයක් තිබෙන අවස්ථාවකයි අප ඉන්නේ. මේ අවුරුද්දේ සැප්තැම්බර් මාසය වෙනකොට අපේ රටේ උද්ධමනය සියයට 70කට ආසන්න වෙලා තිබෙනවා. ආහාර උද්ධමනය සියයට 94ක් වෙනවා. මෙහි භයානකකම කොච්චරද කියනවා නම්, අද ලංකාවේ ජීවත් වන පවුල්වලින් සියයට 50කට වැඩි ප්‍රමාණයක් තුන් වේලටම පෝෂ්‍යදායක ආහාරයක් ගන්නේ නැති තත්ත්වයක් තමයි තිබෙන්නේ. ඒ විතරක් නොවෙයි. ප්‍රවාහන උද්ධමනය සියයට 150කට වඩා වැඩිවෙලා තිබෙනවා. ඒ තුළින් දරිද්‍රතාව වැඩි වෙලා තිබෙනවා. මේ අනුව බලනකොට, අද අපි ඉන්නේ ඉතා ඉහළ අවදානම් තත්ත්වයකයි කියන එක අපි දැනගත යුතු කාරණාවක්. මේ ජීවන වියදමේ වැඩිවීම පාලනය කරන්නේ කොහොමද කියලා අපි තවම හිතලා නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෑත කාලයේ ළමා මන්දපෝෂණය පිළිබඳව UNICEF එක විසින් වාර්තාවක් ඉදිරිපත් කර තිබුණා. ශ්‍රී ලංකාව ළමා මන්දපෝෂණය අතින් ලෝකයේ හයවැනි තැනට පත් වෙලා. මේක අනාගතයට කොයි තරම් අවදානම් තත්ත්වයක්ද කියන එක අපි තේරුම් ගන්න ඕනෑ. මේ නිසා අද මේ අය වැය ලේඛනයෙන් ඉලක්ක කළ යුත්තේ කුමක්ද? ඇත්තටම අය වැය ලේඛනයක මූලික හරය විය යුත්තේ ඉලක්ක කිරීමයි; "අපි කොහොමද ඊළඟ වර්ෂය කිහිපය තුළ ඉදිරියට යන්නේ?" කියලා අනාගත පුරෝකථනයක් කිරීමයි.

අපි හැම අවුරුද්දකටම අය වැයක් හදන බව ඇත්ත. හැබැයි, ඒ අය වැය එකිනෙකට සම්බන්ධ වෙන්න ඕනෑ. නමුත්, මේ අය වැයේ තිබෙන කාරණා දිහා බැලුවාම එවැනි ඉලක්කගත තත්ත්වයක් තිබෙන බව පෙනෙනවාද? මම එක කාරණයක් අහනවා. අය වැයෙන් සලකා බැලිය යුතු මූලිකම කාරණාව මෙහි එහෙම පිටින්ම නොසලකා හැර තිබෙනවා. ඒ වාගේම, සැලකිල්ලකින්, කළමනාකරණයකින් යුතුව ඒ ඉලක්ක සම්පූර්ණ කර ගැනීමට අපි අනුගමනය කළ යුතු ක්‍රියා පිළිවෙත මොකක්ද? බිඳ වැටී තිබෙන ආර්ථිකය යළි පණ ගැන්වීමට අවශ්‍ය ආර්ථික ප්‍රතිසංස්කරණ කිසිවක් මෙහි ඇතුළත් වෙලා නැහැ. එය පළමුවැනි කාරණය. යමක් තිබෙනවා කියා තර්ක කරන්න පුළුවන්. හැබැයි, ඒක ප්‍රමාණවත්ද කියන ප්‍රශ්නය අපට මූලික වශයෙන් තිබෙනවා.

ඒ විතරක් නොවෙයි, දැන් අපේ විදේශ සංචිත බිඳ වැටිලා; බින්දුවයි. අපිට සතියකට ජීවත් වෙන්න ඕනෑ විදේශ සංචිත ප්‍රමාණයවත් අපට රැකගන්න පුළුවන්කමක් නැහැ. අපි ඒ තරම් දුෂ්කර තත්ත්වයකට පත් වෙලා. අපේ විදේශ සංචිත වැඩි කර ගැනීමට, ඒවාට පිළියම් හොයන අපනයන ප්‍රවර්ධන, සේවා ප්‍රවර්ධන වැඩසටහන් පිළිබඳව නිශ්චිත ඉලක්කයක් මේ අය වැයේ නැහැ. ඒ විතරකුත් නොවෙයි, ජීවන වියදම පාලනය කර ගැනීම සඳහා, ආදායම්-වියදම් පාලනය කර ගැනීම සඳහා මාර්ගයක් මේ අය වැයේ පැහැදිලිව පෙන්නුම් කර නැහැ. ඒ වාගේම, රාජ්‍ය ආදායම හා වියදම පාලනය කිරීම පිළිබඳවත් නිසි සැලසුමක් නැහැ.

වැදගත්ම කාරණය මේකයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. පසුගිය කාලයේ මිනිස්සු පාරට බැහැලා කෑ ගහමින් කියපු ප්‍රධාන කාරණයක් තිබුණා. ඒක තමයි නාස්තිය, දූෂණය, හොරකම පිටුදකින්න කියන එක. මේ අය වැයේ ඒ සම්බන්ධයෙන් දක්වා තිබෙන සැලකිල්ල කුමක්ද? රාජ්‍ය දේපොළ නාස්තිය, දූෂණය, හොරකම පිටුදැකීම සඳහා කිසිම වැඩ පිළිවෙළක් නැතුවා පමණක් නොවෙයි, ජනාධිපතිතුමා මුදල් ඇමතිවරයා හැටියට අය වැය කථාව ඉදිරිපත් කරන කොට, ඒවා හාස්‍යයට ලක් කරමින් කථා කිරීමකුත් සිදු කළා. නමුත්, කාර්යක්ෂමතාව වැඩි කිරීම ආදිය සිදු නොකර මේ අය වැය ලේඛනයෙන් අපේ අනාගතය දකින්නේ කොහොමද?

ජනාධිපතිතුමා මේ අය වැය ලේඛනය ඉදිරිපත් කරන කොට කිව්වා, මෙය තරුණ පරපුරේ අනාගතය ඉලක්ක කර හදපු අය වැයක් කියලා. හැබැයි, තරුණ පරපුරේ අනාගතය ඉලක්ක කර හදපු අය වැයක් නම්, ඒ සඳහා ඉලක්ක විය යුත්තේ කුමක්ද? අපි 2048, ඒ කියන්නේ නිදහස ලබා අවුරුදු 100කට පසුව මේ රට දියුණු තත්ත්වයකට ගෙනෙනවා කියා ඉලක්ක කිරීමද, අපේ මූලික අභිප්‍රාය විය යුත්තේ? ඊට එහා අපි කල්පනා කළ යුතුයි. වර්තමානයේ අපි මුහුණ දෙන අභියෝගයට මුහුණ දෙන්න පුළුවන්කම තිබෙන්න ඕනෑ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විශේෂයෙන්ම මේ අය වැය ලේඛනය මම දකින්නේ හුදු වාර්තාවක් විධියට විතරයි. එහෙම නොවෙයි විය යුතු වන්නේ. අය වැය ලේඛනය නිශ්චිත ගිණුමක් විය යුතුයි. එවැනි ඉලක්කගත වැඩ පිළිවෙළක් නම් මේ අය වැයේ මම දුටුවේ නැහැ.

ගරු මුදල් රාජ්‍ය ඇමතිතුමා මෙතැන සිටින නිසා, විශේෂයෙන්ම ජනාධිපතිතුමාගේ කථාවේදී යෝජනා කළ කාරණා තුනක් ගැන මම කියන්න කැමැතියි. ජනාධිපතිවරයා මුදල් ඇමතිතුමා වශයෙන් මේ අය වැය කථාව ඉදිරිපත් කරන අවස්ථාවේ කිව්වා, රුපියල ස්ථාවර කිරීම පිළිබඳව. කොහොමද, රුපියල ස්ථාවර වෙන්නේ? ඇත්තටම මේ වෙලාවේ රුපියල යම් ආකාරයකින් ස්ථාවර වෙලා තිබෙන්නේ, ඩොලරයේ අගය එක්ක ලොකු වැඩිවීමක් නොවී තිබෙන්නේ, වෙන කිසි කාරණයක් නිසා නොවෙයි. අපි ණය ගෙවන්නේ නැති නිසායි. ණය නොගෙවීම නිසා අපි ගෙවන්න තිබෙන ණයවල අපිට තිබෙන වගකීම යම් ආකාරයකට සීමා වෙලා තිබෙනවා. ඒ වාගේම, මේ ස්ථාවර වීම එක විධියට යන්න පුළුවන් තත්ත්වයකට ගෙනෙන්න අය වැයෙන් කිසිම යෝජනාවක් නැහැ.

ඊළඟට, ලබන වර්ෂයේ සියයට හතක-අටක ආර්ථික වර්ධනයක් ළඟා කර ගැනීමට මේ තුළ තිබෙන යෝජනාව කුමක්ද කියා අපි අහනවා. දැන් අපි ඉන්නේ ඍණ තත්ත්වයක; ඍණ නවයක විතර තත්ත්වයක; භයානක තත්ත්වයක. එතකොට ලබන අවුරුද්දේ සියයට හතක-අටක ආර්ථික වර්ධනයක් ලබා ගන්නා තත්ත්වයකට අපි එනවා නම්, ඒකට තිබෙන කඩිනම්, වේගවත් වැඩ පිළිවෙළ මොකක්ද කියා කියන්න ඕනෑ. ඒ වාගේම ඩොලර් බිලියන තුනක ආයෝජන ලංකාවට ගෙනෙනවා කියනවා. කා එක්කද, කථා කර තිබෙන්නේ? මොකක්ද, ඒකට තිබෙන වැඩ පිළිවෙළ? ඒවා මොකුත් නැහැ. නිකම් ඉදිරිපත් කරන සංඛ්‍යා ලේඛනයක් හැටියට සහ ලස්සන කතන්දරයක් හැටියට මෙය ඉදිරිපත් කර තිබෙනවා. ඩොලර් බිලියන තුනක ආයෝජන ගෙනෙනවා නම්, රට ඒකට සූදානම්ද? අපි කාටද, ආරාධනා කර තිබෙන්නේ? කොහෙන්ද, මේවා එන්නේ? මේ ගැන තොරතුරු පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම ඉතාම වැදගත්.

ඒ විතරක් නොවෙයි. අපනයන ආදායම ඩොලර් බිලියන තුනක් දක්වා වැඩි කරනවා කියනවා. ඉතින් මේවා වැඩි කරන්න තිබෙන සැලසුම කුමක්ද කියා මේ පාර්ලිමේන්තුවට කියන එක තමුන්නාන්සේලාගේ වගකීමක් හැටියට අපි දකිනවා. හැබැයි, ඒ කිසිවක් මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර නැහැ. අඩු ගණනේ උද්ධමනය තනි ඉලක්කමට ගෙනෙනවා කියන්න තරම්

සහතිකයක් මේ අය වැයේ තිබෙනවාද? එවැන්නක් මෙහි දකින්න නැහැ. දැන් මේ රටේ සමස්ත උද්ධමනය සියයට 66ක්, 70ක් විතර වෙනවා.

එය පාලනය කරලා තනි ඉලක්කමකට ගෙනෙන්න නම්, අප කොයි තරම් කාර්යභාරයක්, වැඩ කොටසක් කළ යුතුව තිබෙනවාද? මේ අය වැය තුළ ඒවා ගැන මොකුත් කියන්නේ නැහැ. ඒ විතරක් නොවෙයි, ගරු මුදල් රාජ්‍ය ඇමතිතුමනි, බදු ආදායම රුපියල් බිලියන 1,321ක් ලෙස වැඩි කරගන්නා බව කිව්වත්, ඒක ප්‍රායෝගික නැහැ කියා ඔබතුමා දන්නවා. ගිය අවුරුද්දේත් ඒ ප්‍රමාණය ලැබුණේ නැහැ. ඒ ඉලක්කය ළඟා කරගන්න අවශ්‍ය යන්ත්‍රණය ක්‍රියාත්මක වනවාද කියා මා දන්නේ නැහැ. ගැසට් නිවේදනය නිකුත් කළ පමණින් බදු ආදායම මෙච්චරයි කියලා උපකල්පනය කිරීම අය වැයකට ගැළපෙන්නේ නැහැ කියා මම හිතනවා. මොකද, උපකල්පන මත අය වැයක් හදලා බැහැ. ඒක ප්‍රායෝගික විය යුතුව තිබෙනවා. නැත්නම්, රටට නිශ්චිත ඉලක්කයට ළඟා වෙන්න ටිකක් අමාරු වනවා.

අනෙක් වැදගත්ම ප්‍රශ්නය රජයේ වියදම් පාලනය කරගන්න අනුගමනය කර තිබෙන ක්‍රියා පටිපාටිය මොකක්ද කියන එක. වැඩිම මුදල් ප්‍රතිශතයක් වෙන් කර තිබෙන්නේ මුදල් අමාත්‍යාංශයත් ඇතුළුව ජනාධිපතිවරයා සතුව තිබෙන අමාත්‍යාංශ ගණනාවටයි. දෙවැනියට වැඩිම වියදම, ආරක්ෂක වියදම. මහජන ආරක්ෂක අමාත්‍යාංශයට වෙන් කරපු මුදලත් එකතු කළොත් දෙවැනියට වැඩිම ඉහළම වියදම ආරක්ෂක වියදමයි. වියදම අඩු කර ගැනීම සඳහා යෝජනා කර තිබෙන එකම ක්‍රමවේදය මොකක්ද? අවුරුදු 18ට වැඩි කාලයක් හමුදාවේ සේවය කළ නිලධාරින්ට, සොල්දාදුවන්ට විශ්‍රාම යන්න දෙන එක තමයි, වියදම් පාලනය කිරීම සඳහා කර තිබෙන එකම යෝජනාව. අප අහන්නේ, අය වැය සමබරතාවකින් යුතුව පවත්වාගෙන යන්න මේ හරහා පුළුවන්ද කියලායි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ ඊළඟ ප්‍රශ්නය මේකයි. ගරු ලක්ෂ්මන් කිරිඇල්ල හිටපු ඇමතිතුමාත් උදේ මේ ප්‍රශ්නය ඇහුවා. මෙවර අය වැය පරතරය පියවා ගන්නේ කොහොමද? මුළු වියදම රුපියල් බිලියන 5,000කටත් වැඩි ප්‍රමාණයක්. එය පියවාගන්න දේශීය වශයෙන් මෙච්චර, විදේශීය වශයෙන් මෙච්චර ලැබෙනවාය කියනවා. විදේශීය වශයෙන් බිලියන 560ක් බව කිව්වා. දේශීය වශයෙන් තව ගණනක් කිව්වා. හැබැයි, මේ පරතරය පියවාගන්න මේ බදු ආදායම්වලින් පමණක්, ඒ වාගේම විදේශ ආදායම්වලින් පමණක් පුළුවන්ද? විදේශ ණය ගන්න තිබෙන්නේ කොහෙන්ද? අපි දැන් ලෝකයේ කොන් වෙච්ච රටක්. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල අපට කෙසේ හෝ සහතිකයක් දුන්නොත් යම් ආකාරයක හෝ සහනයක් ලැබෙනවා. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලින් අපට බොහෝ දේවල් ලැබෙන්නේ නැහැ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල පිළිගත්තොත් අපට යම් ආකාරයක ආර්ථික ප්‍රතිසංස්කරණ සඳහා පිළිගැනීමක් තිබෙනවා කියලා, අපට ප්‍රයෝජන දෙකයි ලැබෙන්නේ. එකක් තමයි, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලට ගිහින් අපට ගනු දෙනු කරන්න අවකාශය ලැබෙන එක.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ඔබතුමාට තව මිනිත්තු තුනක කාලයක් තිබෙනවා.

**ගරු තිස්ස අත්තනායක මහතා**
(மாண்புமிகு திஸ்ஸ அத்தநாயக்க)
(The Hon. Tissa Attanayake)
මට මිනිත්තු 15ක් තිබුණා නේ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
නැහැ, මිනිත්තු 13යි තිබෙන්නේ.

**ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)
කමක් නැහැ, එතුමාට කාලය ලබා දෙන්න, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

**ගරු තිස්ස අත්තනායක මහතා**
(மாண்புமிகு திஸ்ஸ அத்தநாயக்க)
(The Hon. Tissa Attanayake)
ජාත්‍යන්තර මූල්‍ය අරමුදල අපට සහතිකයක් දුන්නොත් අපට වාසි දෙකක් පමණයි ලැබෙන්නේ. එකක් තමයි, ජාත්‍යන්තර මූල්‍ය ගනු දෙනුවලට අපට සහතිකයක් ලැබෙන එක. දෙවෙනි එක තමයි, මූල්‍ය තත්ත්වය යටතේ වැඩ කටයුතු කරන්න අපට යම් ආකාරයක ස්ථාවරත්වයක් ගොඩ නැඟෙන එක. ඒ නිසා ඒ සහතිකය අවශ්‍යයි. හැබැයි, දැන් තිබෙන තත්ත්වය හැටියට ඒක ඒ ආකාරයෙන්ම ක්‍රියාත්මක වන බවට සහතිකයක් නැහැ. මේ වනකොටත් -තවමත්- ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සහතික කිරීමක් කරන්නේ නැහැ. මොකද, ණය ප්‍රතිව්‍යුහගතකරණය පිළිබඳ ප්‍රශ්න ගොඩක් තිබෙනවා.

ඊළඟට, දැනුම කේන්ද්‍ර කරගත් ආර්ථිකයක් ගොඩ නඟන්න යනවා නම්, ඒ වෙනුවෙන් තිබෙන වැඩ පිළිවෙළ මොකක්ද? අය වැයක ඒ වාගේ වචන දාලා, කතන්දර ලියලා හරියන්නේ නැහැ. ඒ වාගේ කතන්දර ගොඩක් අපි දිගටම ලියා තිබෙනවා. පසුගිය අය වැය ලේඛන කිහිපය ගත්තාම, ඒ හැම අය වැය ලේඛනයකම මේ වාගේ කතන්දර කියා තිබෙන ආකාරය අපි දැක්කා. බලන්න, ගරු නියෝජ්‍ය කථානායකතුමනි, රනිල් වික්‍රමසිංහ මැතිතුමා තරුණ පරපුරේ අනාගතය වෙනුවෙන් වන යෝජනාවක් අය වැය ලේඛනය මඟින් ඉදිරිපත් කළා. මීට ඉස්සෙල්ලා ඉදිරිපත් කළ අය වැය ලේඛන දිහාත් බලන්න. බැසිල් රාජපක්ෂ මහත්මයා ඉදිරිපත් කළ 2022 අය වැය ලේඛනයේත් යෝජනා ගණනාවක් ඉදිරිපත් කළා. දැන් ඒ යෝජනාවල ප්‍රධාන කාරණා එකක්වත් ක්‍රියාවට නැංවුණාද? අය වැය ලේඛනයේ යෝජනා පොල් ගෙඩි අකුරින් ලොකුවට දමනවා. හැබැයි, ඒ එක යෝජනාවක්වත් ක්‍රියාත්මක වුණේ නැහැ. ඒ කියපු යෝජනා ටික ක්‍රියාත්මක වුණා නම්, රට කොතැනද නවතින්න ඕනෑ. ඒ යෝජනා එකක්වත් ක්‍රියාත්මක වුණේ නැහැ. ඒ විතරක් නොවෙයි. රනිල් වික්‍රමසිංහ ජනාධිපතිතුමා පසුගිය දා අතුරු අය වැය යටතේ ඉදිරිපත් කළ යෝජනා ගෙන බලන්න. අය වැය යෝජනා එකින් එකට සම්බන්ධ වෙන්න ඕනෑ. හැබැයි, ඒ එක යෝජනාවක්වත් ක්‍රියාත්මක වුණේ නැහැ. එතකොට අපි කොහොමද ඉලක්කගතව හරි තැනට යන්නේ? හරි තැනට යන්න තරම් වැඩ පිළිවෙළක්, මාර්ගයක් නැති බව අප කියන්න ඕනෑ. දැනුම කේන්ද්‍ර කරගත් ආර්ථිකයක් හදන්න යනවා නම්, ඒක කරන්න පුළුවන් වන්නේ කොහොමද? *[බාධා කිරීමක්]*

**ගරු රංජිත් සියඹලාපිටිය මහතා**
(மாண்புமிகு ரஞ்ஜித் சியம்பலாபிடிய)
(The Hon. Ranjith Siyambalapitiya)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කියපු, එක වැදගත් කාරණාවක් ගැන විතරක් මම පැහැදිලි කරන්නම්. ඔබතුමා ඇහුවා, බදු මුදල්වලින් අය වැය හිඟය පියවාගන්නේ කොහොමද කියලා. අය වැය හිඟය කියන්නේ බදු මුදල් නොවෙයි. අය වැය හිඟය කියන්නේ, ආදායම ඉක්මවා ගිය වියදමේ ප්‍රමාණය. ඔබතුමා ඒක දන්නවා. අපි කියා තිබෙනවා, එය සියයට 7.9ක්, නැත්නම් රුපියල් බිලියන 2,404ක් බව.

[ගරු රංජිත් සියඹලාපිටිය මහතා]

මුළු මූල්‍යනය සම්බන්ධයෙන්, එනම් මුළු දේශීය මූල්‍යනය රුපියල් බිලියන 1,844ක් සහ මුළු විදේශීය මූල්‍යනය රුපියල් බිලියන 560ක් වන බව අප මෙහි ඉතා පැහැදිලිව සඳහන් කර තිබෙනවා. එසේ සඳහන් කර තිබෙන්නේ, ආසියානු සංවර්ධන බැංකුව, ලෝක බැංකුව ආදි බැංකුවලින් අපට ලැබෙන මුදල් අනුවයි. ඒ නිසා මේ එකක්වත් සාවද්‍ය තොරතුරු නොවෙයි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "අය වැය" කියන්නේ හැම විටම උපකල්පන තමයි. ලබන වර්ෂයේ මෙහෙම වේවි කියලා කරන උපකල්පන තමයි ඉදිරිපත් කර තිබෙන්නේ. හැබැයි, වැරැදි තොරතුරු මත පිහිටා, පදනමක් නැතිව කටයුතු කරනවා නම් තමයි ප්‍රශ්නය. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඉතාම හොඳ පදනමක් ඇතිව තමයි අප මේවා ඉදිරිපත් කර තිබෙන්නේ.

**ගරු තිස්ස අත්තනායක මහතා**
(மாண்புமிகு திஸ்ஸ அத்தநாயக்க)
(The Hon. Tissa Attanayake)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම කිව්වේ මේකයි. පසුගිය අවුරුදු කිහිපය තුළම මේ වාගේ අය වැය යෝජනා ඉදිරිපත් කළා. හොඳම උදාහරණය මා කියන්නම්. පසුගිය අවුරුද්දේ බදු ආදායම්වලින් නිශ්චිතව ලබාගන්නවා යැයි කියූ ප්‍රමාණය ලබාගත්තාද? නැහැ. ඒ ඉලක්කය සාර්ථක කරගෙන තිබෙන්නේ සියයට කීයකින්ද? අප විදේශ ණය වශයෙන් ඉල්ලපු ප්‍රමාණය ගන්න අපට පුළුවන් වුණාද? බැරි වුණා. ඒකයි මා කිව්වේ මෙහි ලොකු පරතරයක් තිබෙන බව. අවසාන වශයෙන් ඒ මුළු බර වැටෙන්නේ ජනතාව මතටයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට මතකයි ජනාධිපතිතුමා මුදල් ඇමතිවරයා හැටියට මේ වසරේ අතුරු අය වැය ඉදිරිපත් කළ වෙලාවේ කරපු යෝජනා. ආර්ථිකයේ වැරැදුණු තැන් හොයන්න විශේෂ කමිටුවක් පත් කරනවා කියලාත් කිව්වා. ඒ, 2018-2022 වර්ෂවලට අදාළව. මම අහනවා, "ඒක සිද්ධ වුණා ද?" කියලා. ඒවා කථාවට විතරක් සීමා වුණාම අය වැය ලේඛනයක මූලික ඉලක්ක සම්පූර්ණ කරගන්නේ කොහොමද? ඒ නිසා තමයි මා කියන්නේ මේ අය වැය ලේඛනය කිසිදු පදනමක් නැතිව ඉදිරිපත් කර තිබෙන බව.

අපනයන ආදායම ගැනත් මෙහි කියනවා. අපනයන ආදායම සම්පූර්ණ කරගන්නේ කොහොමද, අපනයන මත සියයට 30ක බදු ආදායමක් පනවමින් අපනයනය අධෛර්ය කරනකොට? ඒ නිසායි මා කියන්නේ නියමිත පරිදි ක්‍රියාත්මක නොවන තත්ත්වයේ යෝජනා, ඉලක්කම් පමණක් ඉදිරිපත් කිරීම ප්‍රමාණවත් නැහැ කියලා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ අය වැය ලේඛනය දිහා බලන කොට විශේෂයෙන් පෙනෙන කරුණු තුනක් තිබෙනවා. එකක්, "බදු". දෙවැන්න, "ණය". තුන්වැන්න, "විකිණීම". මෙහි සමස්තයක් හැටියට තිබෙන්නේ "බදු -ණය- විකිණීම" කියන තුනයි. ආයතන විකිණීම හරහා ලබාගන්නා මුදල් ප්‍රාග්ධන මුදල් බවට පරිවර්තනය කරගන්න දරන උත්සාහයක් තමයි මෙහි තිබෙන්නේ. අවසානයේදී රටට සිදු වන්නේ මොකක්ද? මේ ගැන අපට නම් ඒ තරම් ලොකු විශ්වාසයක් නැහැ. ඒ නිසා අපි කියනවා, මීට වඩා වග කීමෙන් මේ දෙස බලන්න කියලා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ කථාව අවසන් කරන්න ඉස්සෙල්ලා කිව යුතු දෙයක් තිබෙනවා. මේ අය වැය ලේඛනය ගැන සමාජ මාධ්‍ය තුළ අපූරු කථාවක් කියා තිබෙනවා මම දුටුවා. එය වචන දෙකතුනකින් කියා තිබුණු කථාවක්. ඒ තමයි, "මේ ඉදිරිපත් කර තිබෙන්නේ, තුන්ලොවක් පෙනෙන ත්‍රෛලෝක පත්‍ර අය වැයක්" කියන එක. මටත් පෙනෙන්නේ ඒකමයි. මොකක්ද එහෙම කියන්න හේතුව? කිසිදු යථාර්ථයක් නැති අය වැය ලේඛනයක් තමයි මේ ඉදිරිපත් කරලා තිබෙන්නේ.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ මැතිතුමා. ඔබතුමාට විනාඩි 14ක කාලයක් තිබෙනවා.

[පූ.භා. 11.47]

**ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ මහතා**
(மாண்புமிகு உபுல் மஹேந்திர ராஜபக்ஷ)
(The Hon. Upul Mahendra Rajapaksha)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද දවසේ මේ අය වැය විවාදයට සම්බන්ධ වීමට ලැබීම ගැන මා සතුටු වෙනවා. අය වැය කියන්නේ ජනතාවගේ පැත්තෙන් හිතලා ඉදිරිපත් කරන ඉතා සුවිශේෂී ලියවිල්ලක්. අපි පුංචි කාලයේත් අය වැය ඉදිරිපත් කරන කල් ආසාවෙන් බලාගෙන සිටියා. අද දවසේ මම සතුටු වෙනවා, මගේ ප්‍රදේශයේ ජනතාවගේ ඡන්දයෙන් පාර්ලිමේන්තුවට ඇවිත් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු විධියට අය වැය විවාදවලට සම්බන්ධ වන්නට මාහට අවස්ථාව ලැබීම ගැන. මේක මම පාර්ලිමේන්තුවට පත් වෙලා ආවාට පසුව මා සම්බන්ධ වන දෙවන අය වැය විවාදයයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ආණ්ඩුව පැත්තේ සිටියා වුණත් මේ අය වැය සම්බන්ධයෙන් අපට යම් යම් විවේචන තිබෙනවා. දළ ජාතික නිෂ්පාදනය, දළ දේශීය නිෂ්පාදනය, අපනයන ආදායම ආදි සියල්ල පිළිබඳව අප කථා කරන්න අවශ්‍යයි. හැබැයි, මහ පොළොවේ ජීවත් වන ජනතාව මේවායෙන් සතුටු වෙනවා නම් අපට කිසි ගැටලුවක් නැහැ. ජනතාව සතුටු නම් අපට පුළුවන් අත් දෙකම උස්සන්න. නමුත්, පවතින තත්ත්වය ඊට වඩා වෙනස් කියලායි මම විශ්වාස කරන්නේ. මොකද, මෙවර අය වැයෙහි අපේක්ෂිත ආදායම සහ අපේක්ෂිත වියදම දිහා බලන කොට විශාල පරතරයක් පෙනෙන්නට තිබෙනවා. අප විශාල අය වැය හිඟයක් සහිත අය වැයක් තවදුරටත් ඉදිරියට ගෙන යමින් කොහෙන් හෝ ණයක් අරගෙන එම හිඟය පියවාගන්නා විට සිදු වන්නේ අපේ අනාගත පරම්පරාව තවත් ණයකාරයන් බවට පත් කරන එකයි. ගිය වර අය වැය ඉදිරිපත් කරපු වෙලාවේදී පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වශයෙන් අපට ඉටු කිරීමට ලොකු කාර්යභාරයක් තිබුණා. අපට කිව්වා, "ගමට යන්න. ගමට ගිහින් ගමේ ජනතාවගේ අදහස් හා යෝජනා ගන්න" කියලා. මගේ ප්‍රදේශයේ ග්‍රාම නිලධාරි වසම් 151ක් තිබෙනවා. ඒ ග්‍රාම නිලධාරි වසම් 151ටම මා ඇතුළු ප්‍රාදේශීය මන්ත්‍රීවරුන්, ප්‍රාදේශීය ලේකම්තුමන්ලා, රාජ්‍ය නිලධරයන් ඇතුළු අපි සියලුදෙනා ගිහින් බොහොම සතුටින් යෝජනා ගෙනැල්ලා මේ පාර්ලිමේන්තුවේදී හරිම උජාරුවෙන් කිව්වා, "අපි හදන්නේ සහභාගිත්ව අය වැයක්" කියලා.

මහ ජනතාවගේ අදහස් අරගෙන අපි ඒ අය වැය සකස් කළා. ඒ අය වැයට අපි විශේෂ කාරණා ගණනාවක් ඉදිරිපත් කළා. රටේ ආර්ථිකයේ බිඳ වැටීම අපි දැක්කා. ග්‍රාමීය මට්ටමේ ව්‍යවසායකයන් ගොඩ නඟන්නේ කොහොමද, ගම තුළ කණ්ඩායම් ඇති කරලා ශ්‍රම විභජනය තුළින් නිෂ්පාදනයන් බිහි කරන්නේ කොහොමද, කණ්ඩායම් තුළින් ඒ නිෂ්පාදන ආයතන ආරම්භ කරන්නේ කොහොමද, ග්‍රාමීය ජනතාවත් එක්ක එකතු වෙලා කෘෂි කර්මාන්තය ගොඩ නඟන්නේ කොහොමද, පොල්

වගාව ඇති කරන්නේ කොහොමද, අනාගතයේදී පොල්වලින් මේ රටේ අපනයනයට දෙන දායකත්වය කොපමණද යන කාරණා ගැනත්, ඒ වාගේම විවිධ ස්වයං රැකියා උත්පාදනයන් සඳහා ගම තුළ ව්‍යවසායකයන් බිහි කරනවා වාගේම කුඩා කර්මාන්ත, ස්වයං රැකියා උත්පාදනය කිරීම, ග්‍රාමීය ජනතාවගේ නිෂ්පාදන නගරයට ගෙනෙන්න ප්‍රවාහන පහසුකම් ඇති කිරීම, ග්‍රාමීය මාර්ග සංවර්ධනය කිරීම යන කටයුතු පිළිබඳව ලොකු කතිකාවක් ඇති කළා. ඒ සඳහා අය වැයෙන් අපට මුදල් වෙන් කළා. හැබැයි, අවාසනාවකට වාගේ ඒ වසර තුළ ඇති වුණු යම් යම් සිද්ධීන් නිසාත්, කොවිඩ් - 19 වසංගතය නිසාත් ආර්ථිකයේ යම් බිඳ වැටීමක් සිදු වුණා. ඒ නිසා අපට ඒ සියල්ල ගම තුළට ගෙන යන්න පුළුවන්කමක් ලැබුණේ නැහැ. අද දවසේත් කියනවා, මන්ත්‍රීවරුන්ට ගමට යන්න කියලා. හැබැයි, එදා දවසේ අපි ගමට ගිහින් ගෙනාපු යෝජනා සම්බන්ධයෙන් ජනතාව බලාගෙන ඉන්නවා. ඒ යෝජනා අද ක්‍රියාත්මක වෙයි, හෙට ක්‍රියාත්මක වෙයි කියලා බලාගෙන ඉන්නවා. ගමෙන් ඉදිරිපත් වුණු යෝජනා සම්බන්ධයෙන් ජනතාව අපෙන් අහනවා. "මන්ත්‍රීතුමා, අපට මැෂින් එක ලැබෙන්නේ කවදාද? අපේ පාර හදන්නේ කවදාද?" කියලා අහනවා. නමුත් අපට දෙන්න උත්තරයක් නැහැ. ගම තුළට යනවාට වඩා අද ගමේ ජනතාව ජීවත් කරවන්න, ජනතාවගේ ප්‍රශ්නවලට ඇහුම්කන් දෙන්න අපට සිද්ධ වෙලා තිබෙනවා. මේ අය වැය තුළින් ඒවාට උත්තර අඩුවෙන් සැපයුවත්, පක්ෂ විපක්ෂ දේශපාලනයෙන් තොරව රටක් වශයෙන් අනාගතය ගැන හිතලා, අපේ රට තිබෙන තැනින් ඉදිරියට ගෙන යන්න අපට කරන්න පුළුවන් මොනවාද කියලා අපි බලන්න ඕනෑ.

අපේ ප්‍රධාන අපනයන භෝගයන් තේ, පොල්, රබර් කියලා තමයි සාම්ප්‍රදායිකව කිව්වේ. හැබැයි, 1978න් පස්සේ ඒකට ඇඟලුම් කර්මාන්තයත් එකතු කර ගත්තා. අපේ රටට සංචාරකයෝ එනවා, සංචාරක කර්මාන්තය වැඩිදියුණු කර ගන්න ඕනෑ. මුතු, මැණික්වලින් අපට ආදායමක් ලැබෙනවා. හැබැයි, ඒ ආදායම් කළමනාකරණය කර ගන්න, ඒවා වැඩිදියුණු කර ගන්න මොනවා හෝ වැඩසටහනක් කළාද? අද අපට මොකක්ද වෙලා තිබෙන්නේ? ගමකට ගියාම අපට දැක ගන්න පුළුවන් වන්නේ අක්කර විසි ගණනක්, අක්කර තිස් ගණනක් තිබෙන පොල් වතු කුඩා කැබලිවලට කඩන එකයි. ඒ සම්න්ධයෙන් පොල් වගා කිරීමේ මණ්ඩලය ක්‍රියාත්මක වුණාද? ප්‍රධාන අපනයන භෝගයක් වන පොල් වගා කරන ඉඩම් කැබලි කිරීම සම්බන්ධයෙන් මේ පාර්ලිමේන්තුවේ නීතියක් ගෙනාවාද? අපේ තවත් ප්‍රධාන අපනයන භෝගයක් වන රබර් වගා කරන වතු විශාල වශයෙන් විනාශ කරලා දැම්මා; ගලවා දැම්මා. ඒ සම්බන්ධයෙන් ක්‍රියාමාර්ගයක් ගත්තාද? ඒ වාගේම තේ කර්මාන්තය වැඩිදියුණු කිරීම සඳහා නවීන උපකරණ ගෙනෙන්න අපි මොනවා හෝ කටයුත්තක් කළාද? අපි ඒ කිසිවක් කළේ නැහැ. අපි කිව්වා, සම්ප්‍රදායානුකූලව මෙන්න මේවා තමයි අපේ ආදායම් භෝග කියලා. හැබැයි, ඒවා විනාශ වනකොට ඒවා රැක ගන්න අපි කටයුතු කළේ නැහැ.

අද විපක්ෂයේ සිටින අපේ ලක්ෂ්මන් කිරිඇල්ල මන්ත්‍රීතුමා හිටපු ජ්‍යෙෂ්ඨ ඇමතිවරයෙක්. එතුමා අමාත්‍ය ධුරය දරපු කාලයේදී මගේ ගමේ අක්කර 27ක පොල් ඉඩමක් කැබලි කරන්න නිර්දේශයක් ලබා දුන්නා. මා එයට විරුද්ධව මහා සටනක් කළා. නමුත් ඒක වළක්වා ගන්න බැරි වුණා. අද ඒ ඉඩම මහා කාන්තාරයක් වාගේ තිබෙනවා. අපි පාර්ලිමේන්තුව නියෝජනය කරනවා නම්, අපට තිබෙන ප්‍රධාන ආදායම් මූලාශ්‍ර ටික ආරක්ෂා කර ගන්න අපට බැරි ඇයි? ඒ සම්බන්ධයෙන් නීති සකස් කරලා නැහැ. අපි මේ ගරු සභාවට ඇවිල්ලා මොනවා හෝ දෙයක් කියවනවා. ඒ කිව්ව දේ ඔහේ තිබෙනවා. ඒ හැරෙන්න යමක් වුණේ නැහැ. ඒ නිසා මා රජයට යෝජනා කරන්නේ ඒ සම්බන්ධයෙන් නීති සකස් කරන්න කියලායි. මේ නීති සකස් කරන්න ඕනෑ කාටවත් රිංගලා යන්න පුළුවන් විධියට නොවෙයි. හෙක්ටෙයාර 4කට වැඩි ඉඩම්, කැබලි කරනවා නම් අනුමැතියක් අවශ්‍ය නැහැයි කියන එක නොවෙයි කියන්න ඕනෑ. ඉඩම් අක්කරයක් හෝ කැබලි කරනවා නම්, ඒවායේ තිබෙන රබර් ගලවනවා නම්, ඒ වෙනුවෙන් නීති සකස් කරන්න ඕනෑ.

ඒ විතරක් නොවෙයි. අපි මේ ආණ්ඩුව පත් කරනකොට ප්‍රතිඅපනයනය සම්බන්ධයෙන් අපට ලොකු ප්‍රශ්නයක් තිබුණා. අපි කිව්වා, මේ ප්‍රතිඅපනයනය නවත්වන්න ඕනෑය, අපේ දේශීය නිෂ්පාදකයා දිරිමත් කරන්න ඕනෑය කියලා. අද මොකක්ද වෙන්නේ? අදත් රබර් ප්‍රතිඅපනයනය කරනවා. අද රබර් ගොවියාට ඔහුගේ රබර් කිරි ටික විකුණා ගන්න පුළුවන්කමක් ලැබෙන්නේ නැහැ. ඒ සඳහා අද මිලක් ලැබෙන්නේ නැහැ. මහා පරිමාණ වෙළෙන්දෝ වෙළෙඳ පොළ ආක්‍රමණය කරලා තිබෙනවා. ඒ අය ඒවා ප්‍රතිඅපනයනය කරනවා. ඒ නිසා අපට සිද්ධ වෙලා තිබෙනවා, ඒ සම්බන්ධයෙන් සටන් කරන්න. මේවා ග්‍රාමීය ජනතාවගේ ප්‍රශ්න. මේවාට සියයට ගණන් දත්ත ප්‍රමාණයන් නොවෙයි අවශ්‍ය වන්නේ. ග්‍රාමීය ජනතාවගේ කුරුඳු ටික විකුණා ගන්න, එනසාල් ටික විකුණා ගන්න, ගම්මිරිස් ටික විකුණා ගන්න තමයි ඔවුන්ට අවශ්‍ය වන්නේ. අතීතයේ වස්කෝ ද ගාමා මේ ප්‍රදේශයට එන්නේ මොනවාටද? කුරුඳු, එනසාල්, මුතු, මැණික්, අලි ඇතුන්, ඇත් දළ ආදිය සොයාගෙන තමයි ආවේ.

මේවා අදටත් අප සතුව තිබෙනවා. අතීතයේ අපේ ප්‍රධාන ආදායම් මාර්ග වුණු මේවා දියුණු කරන්න අපි මොනවාද කරලා තිබෙන්නේ? ඒ නිසා, අපට මේ සම්බන්ධයෙන් ලොකු කාර්ය භාරයක් කරන්න තිබෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. අපි බොහෝ පිරිසක් තවම ගම නියෝජනය කරමින් ගමේ ජීවත් වෙන අය. අපි ඒ අයගේ ආර්ථිකය ශක්තිමත් කරන්න ඕනෑ. ඒ ආර්ථිකය ශක්තිමත් වුණොත් තමයි අපනයන ආර්ථිකය ශක්තිමත් වෙන්නේ. ඒ හරහා තමයි අපට ගෙවුම් ශේෂය කුඩා කර ගන්න පුළුවන්කම ලැබෙන්නේ. ගමේ මිනිහා ශක්තිමත් කරන්නේ නැතිව අපට මේ ආර්ථිකය ගොඩ නඟන්න අමාරුයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ අය වැය සම්බන්ධයෙන් මට නම් යම් විවේචනයක් තිබෙනවා. මොකද, මේ අය වැය ඉදිරිපත් කරද්දී ඒ ගැන බොහෝ පිරිසක් බලාගෙන හිටියා. අපේ රටේ දෛනික වැටුප් ලබන බොහෝ පිරිසක් ඉන්නවා. ඒ වාගේම, මාසික වැටුප් ලබන අය ඉන්නවා. කොන්ත්‍රාත් පදනම මත රාජකාරි කරන අය ඉන්නවා. ආදේශක මට්ටමින් රාජකාරි කරන අය ඉන්නවා. එවැනි සේවකයෝ බලාගෙන හිටියා, අය වැයක් ඉදිරිපත් කරනකොට ඒ හරහා අපට ස්ථිර පත්වීමක් ලැබෙයි; අපට මොනවා හරි දීමනාවක් ලැබෙයි කියලා. අද අපට ඒ ගැන කතිකාවක් නැහැ. මට ඒකට රජයට දොස් කියන්න විධියක් නැහැ. මේ රටේ තිබෙන තත්ත්වය තුළ ඒ දේ කරන්න අපහසු වෙන්න පුළුවන්. හැබැයි, මම මේ කියන්නේ ජනතාවගේ අපේක්ෂා බිඳ වැටිලා තිබෙනවා කියන එකයි. ඔබ, අපි හැමෝම එකතු වෙලා බහුකාර්ය සේවකයෝ විශාල පිරිසක් රාජ්‍ය සේවයට එකතු කළා. අද ඒ අයගෙන් මැසිවිල්ලක් තිබෙනවා. අද ඒ අය අපට හම්බ වෙන හැම වතාවේම අහන්නේ, "මන්ත්‍රීතුමා, අපට මොකද වෙන්නේ? අපි ගැන කවුද කථා කරන්නේ" කියලායි. "අපිව මේ රාජ්‍ය සේවයට සම්බන්ධ කළා. අද අපට ඉන්න හිටින්න තැනක් නැහැ. අපට නියමිත වැටුප් තලයක් නැහැ. අපි ගැන හොයලා බලන්න" කියලා ඔවුන් කියනවා. එම නිසා අපි මේ පාර්ලිමේන්තුවේ ඒ ගැන කතිකාවක් ඇති කරන්න ඕනෑ. ඒ වාගේම, රාජ්‍ය ආයතනවල, ප්‍රාදේශීය සභාවල, පළාත් සභාවල, විශේෂයෙන්ම මණ්ඩලවල සහ සංස්ථාවල විවිධ සේවකයෝ ඉන්නවා. ඒ වාගේම, ව්‍යාපෘතිවල සිටින සේවකයන් විශාල ප්‍රමාණයකට අද සේවය අහිමි වෙමින් තිබෙනවා. ඒ නිසා මේ හැම අහිමිවීමක් හරහාම ඒක ඒ උදවියගේ පවුල්වලට බලපානවා; දරුවන්ට බලපානවා; ඔවුන්ගේ ආහාර පානවලට බලපානවා.

[ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ මහතා]

ජීවත්වීමේ අරගළයක ඔවුන් නියැළිලා ඉන්නවා. මේ අය වැයෙන් හෝ පාර්ලිමේන්තුවෙන් මේවාට විසඳුම් ලබා දෙන්න ඕනෑ. මේ තිබෙන තත්ත්වය තුළ ඒවා හොයන්න අපහසුකමක් තිබෙන්න පුළුවන්. අපට ඒක තේරෙනවා. නමුත් අපි මේවාට විසඳුම් දෙන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ රටේ තිබෙන ආර්ථික තත්ත්වය පිළිබඳව අපට අවබෝධයක් තිබෙනවා. අද ආදායමට වඩා වියදම ඉතා ඉහළ ගිහිල්ලා තිබෙනවා. බදු පනවනවාට ජනතාව කැමැතියි කියලා අපි කියන්නේ නැහැ. බුදුන් වහන්සේගේ කාලයේ ඉඳලා මේ ගැන කතිකාවක් තිබුණා. ඒ නිසා අපි බදු ආදායම් පනවන්නට ඕනෑ. ආදායම් වැඩියෙන් ලබන පුද්ගලයන්ගෙන් අපි බදු මුදල් අය කර ගන්නට ඕනෑ. ඒක ඉතාමත් පරිස්සමින්, ජනතාවට අහිතකර නොවන විධියට අය කර ගන්න ඕනෑ. වක්‍ර බදු තුළින් දුප්පත්, පොහොසත් භේදයකින් තොරව සියලු ජනතාව බදුවලට හසු වෙනවා. නමුත්, මේ රටේ සෘජු බදු ගෙවන්නේ ඉතාම සුළු පිරිසක්. සෘජු බදු ගෙවන අය දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ නිලධාරින්ව සම්බන්ධ කරගෙන, ඒ අයගේ ආදායම් අඩුවෙන් පෙන්වලා තමන්ගේ බදු ප්‍රමාණය අඩු කර ගන්නවා. මේවා වෙනුවෙන් තමයි රජය නීති හදන්න ඕනෑ. ඊට පස්සේ VAT එක ඇතුළු විවිධ බදු වර්ග එනවා. විවිධ බදුවර්ග ඇවිල්ලා, ගමට යනකොට වරිපනම් බද්දකුත් අය කරනවා. අවසානයේදී ගමේ මනුස්සයා බදු ගෙව්වාට පස්සේ වෙනත් දෙයක් කරන්න මුදලක් ඉතිරි වෙන්නේ නැහැ. Overtime වැඩ කරලා මාසික වැටුප රුපියල් ලක්ෂයකට වඩා වැඩි වුණොත් එතැනිනුත් බද්දක් අය කරනවා. එහෙම නම් ජනතාව කාටද මේක කියන්නේ? බොහෝ උදවිය බැංකුවලින් ණය අරන් තිබෙනවා. ඒ බැංකු ණයවලට මුදල් කැපුණාට පස්සේ සියයට 40යි පඩි පතෙන් ඉතිරි වෙන්නේ. ඒ මාසික වැටුපෙන් ETF කැපෙනවා; EPF කැපෙනවා. ඒ ඉතිරි වන මුදලින් දරුවෝ පාසල් යවන්න ඕනෑ; පවුලම ජීවත් වෙන්න ඕනෑ; ඉන්ධන ටිකට වියදම් කරන්න ඕනෑ; කන්න බොන්න ඕනෑ; සමාජයේ විවිධ උත්සවවලට සහභාගී වෙන්න ඕනෑ; දරුවන්ගේ අධ්‍යාපන කටයුතුවලට වියදම් කරන්න ඕනෑ; electricity bills, telephone bills මේවා සියල්ල ගෙවන්න ඕනෑ; ඒ වාගේම, අහිංසක අම්මාට, තාත්තාට සලකන්නත් ඕනෑ. අද අපේ රටේ මිනිස්සුන්ට ඒවා එකක්වත් කර ගන්න අමාරුයි. ඒ නිසා මේවා අපි තේරුම් ගන්න ඕනෑ. අය වැය සුන්දර නොවෙන්න පුළුවන්. හැබැයි, සතුටින් ඉන්න පවුලක් දකින්න පුළුවන් විධියට, සිනහ වෙලා ඉන්න දරුවන් දකින්න පුළුවන් විධියට, අම්මාට, තාත්තාට සතුටින් ඉන්න පුළුවන් විධියට, දරුවන්ට, සමාජයට යුතුකම් ඉටු කරන්න පුළුවන් විධියට ආර්ථිකයක් මේ රටේ ගොඩ නැඟෙන්න ඕනෑ.

අද සමෘද්ධිලාභීන් ඇතුළු අඩු ආදායම්ලාභීන් වෙනුවෙන් රජය යම් සහනයක් සලසනවා. ගැබිනි මව්වරුන්ට පෝෂණ මල්ලක් ලබා දෙනවා. රාජ්‍ය සේවකයන්ට, පෞද්ගලික අංශයේ සේවකයන්ට, විවිධ ආයතනවල සේවය කරන අයට අඩුම වශයෙන් යම් මුදලක් මූලික වැටුපට එකතු කරන්න බැරි වුණත්, කෙටිකාලීන වශයෙන් මේ අයට යම් දීමනාවක් හෝ දෙන්න කටයුතු කරන්න ඕනෑ. එහෙම නොවුණොත් ඔවුන් තමන්ගේ ජීවිත අහිමි කර ගන්නා තත්ත්වයට පත් වෙන්නත් පුළුවන්. එවැනි මහා ඛේදවාචකයකට අද ඔවුන් ලක්වෙලා තිබෙනවා. පවුල් ආරවුල් ඇති වෙනවා. දරුවන්ගේ පාසල් අධ්‍යාපනය කඩා වැටෙනවා. තමන්ගේ අම්මාට, තාත්තාට යුතුකම් ඉටු කර ගන්න බැරිව අනන්ත අප්‍රමාණ මිනිස්සු දුක් විඳිනවා. ඒ නිසා පාර්ලිමේන්තුවක් වශයෙන් අපට මේ සම්බන්ධයෙන් වගකීමක් තිබෙනවා. අපි මේ හැම දෙයක්ම කරන්නේ මහජනතාවගේ සුබ සිද්ධිය වෙනුවෙන්.

මහ ජනතාවගේ ශුභ සිද්ධිය වෙනුවෙන් මොනවාද කරන්න පුළුවන් කියලා අපි කල්පනා කරන්න ඕනෑ. මේ වාගේ ප්‍රශ්න ඇති වෙන්න පටන් ගත්ත කාලයේ ඉඳලාම අපි නිරන්තරයෙන් කිව්වා, පොදු ප්‍රවාහන සේවය දියුණු කරන්න කියලා. අද දරුවෙක් පාසලට යවන්න පුළුවන්කමක් නැහැ. මම නියෝජනය කරන්නේ ගම්පහ දිස්ත්‍රික්කය. කොළඹ ප්‍රදේශයේ පාසල්වලට යන දරුවන්ගේ දෙමව්පියෝ අපි හමුවෙන්න ඇවිල්ලා කියනවා, "අනේ, මන්ත්‍රීතුමා ළඟ පාසලකට අපේ දරුවා ඇතුළු කරලා දෙන්න, දුර පාසලකට යවන්න පුළුවන්කමක් නැහැ" කියලා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පොදු ප්‍රවාහන සේවය දියුණු කරන්න අපි අනන්ත අප්‍රමාණ යෝජනා ගෙනැල්ලා තිබෙනවා.

අද ග්‍රාමීය මට්ටමේ ව්‍යාපාර බිඳ වැටිලා. පිට්ටු, ඉදිආප්ප ඇතුළු කඩයප්පම් හදලා ජීවත් වන අයගේ ව්‍යාපාර සියල්ල බිඳ වැටිලා. අඩු පොලියක් යටතේ ණයක් ලබා දීලා හෝ ආධාර ක්‍රමයක් මත හෝ ග්‍රාමීය මට්ටමේ ඉන්න ව්‍යවසායකයෝ ගොඩනඟා ඔවුන්ගේ ආර්ථිකය ශක්තිමත් කරන්න අපි කටයුතු කරන්න ඕනෑ.

ඊළඟට, අපි අධ්‍යාපනය ගැන බලමු. අද අංග සම්පූර්ණ අධ්‍යාපනයක් පාසල තුළින් ලබා දෙනවාද? ශිෂ්‍යත්ව විභාගයට මුහුණ දෙන්න සිටින 5 ශ්‍රේණියේ දරුවන්ට පාසලේදී උගන්වන ගුරුවරයාගේ ගෙදර පවත්වන ශිෂ්‍යත්ව පන්තියට ඒ දරුවන් නොගියාම ඒ දරුවන්ට අඩන්තේට්ටම් සිදු වනවා නම්, මේක නිදහස් අධ්‍යාපන ක්‍රමය නොවෙයි. පාසලෙන් විෂය නිර්දේශය සම්පූර්ණයෙන් ආවරණය වෙන්න ඕනෑ. ටියුෂන් පන්තියට දරුවන් යන්නේ පාසලෙන් එය නිසි ලෙස සිදු නොවන නිසායි. අපේ නිදහස් අධ්‍යාපනයේ ඵල දරුවන්ට දෙන්න ඕනෑ. ඒ තුළින් තමයි අපට මේ ප්‍රශ්නවලට කාලීන වශයෙන් විසඳුම් සොයා ගන්න පුළුවන් වෙන්නේ.

කුලී වැඩ කරලා ජීවත් වූ මිනිසුන්ට කුලී වැඩක් කර ගන්න බැරි තත්ත්වයක් උදාවෙලා තිබෙන යුගයක තමයි අද අපි ජීවත් වෙන්නේ. මොකද, පවතින ආර්ථික ප්‍රශ්න තුළ අද තව කෙනකුට මුදලක් දීලා වැඩක් කර ගන්න විධියක් නැහැ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඉන්දියන් සාගරයේ මුතු ඇටය කියලායි අපේ රටට කිව්වේ. එය අපි අභිමානයෙන් කිව්වා. ඒ වාගේම අපේ රටට ධර්මද්වීපය කියා කියනවා. හැබැයි එක අය වැයක ගෙනාවා, සමලිංගික සේවනයට අවසර දෙන්න ඕනෑ කියලා. ඒ ගැන ලොකු කතිකාවක් ඇති වුණා. ඒකටත් ජනතාව විරුද්ධ වුණා. ඒ වාගේම ගණිකා වෘත්තිය නීතිගත කරන්නත් අවසර ඉල්លුවා. ඒ ගැනත් ලොකු කතිකාවක් ඇති වුණා. ඒකටත් ජනතාව විරුද්ධ වුණා. ඊළඟට, තැබෑරුම් එළිවනතුරු විවෘත කර තැබීමට අවසර ඉල්ලුවා. ඒකටත් ජනතාව ප්‍රසාදයක් දැක්වූයේ නැහැ. අය වැයක් ඉදිරිපත් කරනකොට අපේ සංස්කෘතිය, අපේ ජාතිකත්වය අමතක කර යෝජනා ඉදිරිපත් නොවිය යුතුයි. මෙවර අය වැයෙන් යෝජනාවක් ගෙනැවිත් තිබෙනවා, ගංජා සම්බන්ධයෙන්. මේ කාරණය සම්බන්ධව කමිටුවක් පත් කර තිබෙන නිසා ඒ ගැන අපට දෙපාරක් හිතන්න පුළුවන්. හැබැයි, එයට නීතියෙන් අනුමැතියක් ලැබෙනවා නම්, මම අනිවාර්යයෙන්ම මේ අය වැයට විරුද්ධව අත ඔසවනවා. අපි පාර්ලිමේන්තුව නියෝජනය කරන්න ආවේ මේ රටේ ගංජා වැවීම නීතිගත කරන්න නොවෙයි. අපි පාර්ලිමේන්තුවට ආවේ, අහිංසක මිනිසුන්ගේ ඡන්දයෙන්. ඒ මිනිසුන්ගේ සුබසාධනය වෙනුවෙන්, රටේ සංවර්ධනය වෙනුවෙන් අවශ්‍ය නීති හදන්න ඕනෑ. එලෙස හදන නීති තුළින් මේ රටේ නීතිය ස්ථාපිත කරලා, යහපත් රටක් නිර්මාණය කිරීමට උදව් කරන්නයි මම පාර්ලිමේන්තුවට ආවේ. එහෙම නැතිව මම, මේ රට ගංජාවලින් ස්වයංපෝෂිත කරන්න පාර්ලිමේන්තු ආපු මන්ත්‍රීවරයකු නොවන බව මතක් කරන්න ඕනෑ.

ස්තුතියි.

**ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු අලි සබ්රි අමාත්‍යතුමාගෙන් මට යම් කාරණයක් දැන ගැනීමට අවශ්‍යයි.

ගරු ඇමතිතුමනි, දකුණු කොරියාවේදී මිය ගිය උඩතලවින්න ප්‍රදේශයේ මුස්ලිම් තරුණයා වෙනුවෙන් වන්දියක් ලබා දෙනවාද? මම දන්නවා, ඔබතුමා ඒ සඳහා උත්සාහ කරන බව. එය ලබා දෙනවාද?

**ගරු ජනාධිපති නීතිඥ එම්.යූ.එම්. අලි සබ්රි මහතා (විදේශ කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி எம்.யூ.எம். அலி சப்ரி - வெளிநாட்டு அலுவல்கள் அமைச்சர்)
(The Hon. M.U.M. Ali Sabry, PC - Minister of Foreign Affairs)
ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මැතිතුමනි, සෝල් නුවර සිද්ධියෙන් මිය ගිය තරුණයාගේ body එක අපේ මැදිහත්වීමෙන් අපේ තානාපති කාර්යාලය හරහා දවස් හතරක් ඇතුළත ලංකාවට ගෙන්වා ගත්තා. ඉන් පසුව අපි කොරියානු තානාපති කාර්යාලය එක්ක මේ සම්බන්ධයෙන් කථා කළා. ඔවුන් රුපියල් මිලියන නවයක වටිනාකමක් තිබෙන compensation එකක් ලබා දෙනවා. ඒ හැරුණාම dead body එක ලංකාවට ගෙන්වා ගැනීම සඳහා වියදම් වූ මුදලත් ලබා දෙන්න එකඟ වෙලා තිබෙනවා. අපි ඒ සම්බන්ධයෙන් කටයුතු කරගෙන යනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු තලතා අතුකෝරල මන්ත්‍රීතුමිය. ඔබතුමියට මිනිත්තු 13ක් තිබෙනවා.

[අ.භා. 12.04]

**ගරු නීතිඥ තලතා අතුකෝරල මහත්මිය**
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) தலதா அதுகோரல)
(The Hon. (Mrs.) Thalatha Athukorala, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අවුරුදු 75ක නිදහසක ඉතිහාසයෙන් පස්සේ අපේ රට බංකොලොත් වෙලා තිබෙන වෙලාවක ඉදිරිපත් කරපු අය වැය ලේඛනය ගැන තමයි අපි මේ කථා කරන්නේ. මුදල් අමාත්‍යවරයා වශයෙන් ගරු ජනාධිපතිතුමා මේ අය වැයේ සඳහන් කර තිබෙනවා, අවුරුදු 75ක නිදහසේ ඉතිහාසය තුළ ආර්ථිකය ඉදිරියට ගෙන යෑම සිදු කළ යුතුව තිබුණත්, ඊට ප්‍රමුඛතාව ලබා නොදුන් බවත්, දැන් වෙනත් දිශානතියකට ගමන් කළ යුතු බවත්. එම දිශානතිය තීරණය වන්නේ, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ කොන්දේසි අනුවද, එහෙම නැත්නම් චීනය හා ඇමෙරිකාව වාගේ බලවත් රටවල් විසින් ලබා දෙන්නා වූ ණය කොන්දේසි මතද කියන එක ගැන අද ලොකු ප්‍රශ්නයක් ඇතිවෙලා තිබෙනවා. මොකද, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සහන ලබා දෙනකල් අපි බලාගෙන ඉන්නවා. හැබැයි, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සහනයක් ලබා දෙනවා වාගේම, අපි ඒ ගොල්ලන් එක්ක ඇති කර ගන්නා එකඟතා අනුව, ඒ කොන්දේසි හැම එකක්ම ඉෂ්ට කරන්න සිද්ධ වන බවත් අපි කවුරුත් අමතක කරන්න හොඳ නැහැ.

හිටපු මුදල් අමාත්‍යවරයකු වූ මංගල සමරවීර මැතිතුමා 2019දී කියපු කථාවක් මේ වෙලාවේ මට මතක් වෙනවා. එතුමා කිව්වා, "මේ මුදල් කළමනාකරණය - fiscal management - හරියට ගියොත් අපට රටක් හැටියට ඉදිරියට යන්න පුළුවන්. එහෙම නැති වුණොත්, අපි 2022දී බංකොලොත්භාවයට පත් වෙනවා. ඒක කාටවත් නවත්වන්න බැහැ" කියලා. එදා එතුමා ඉන්ධන මිල සම්බන්ධයෙන් මිල සූත්‍රයක් ඉදිරිපත් කළ වෙලාවේ අද ඔය ආණ්ඩු පක්ෂයේ ඉන්න ගොඩක් අය බොහොම අපහාසාත්මක විධියට එතුමාට හිනා වුණා. ඒ වාගේම එදා එතුමා බදු ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරනකොට ඒකටත් නොයෙකුත් විධියේ අපහාස-උපහාස කළා. එතුමා එවකට හිටපු මුදල් ඇමතිතුමා. එතුමා ගොඩක් ඈත බලලා තමයි ඒ වෙලාවේදී තීන්දු-තීරණ ගත්තේ. එතකොට එතුමාත් එක්ක එකට කැබිනට් මණ්ඩලයේ හිටපු අය හැටියට අපි දැනගෙන හිටියා, මේ බදු ප්‍රතිපත්තිය පිළිබඳව ලොකු ප්‍රශ්නයක් රටේ තිබෙනවා කියලා.

අද රටේ ඇති වී තිබෙන තත්ත්වයට සෘජුවම වග කියන්න ඕනෑ කෙනකු තමයි, හිටපු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහත්මයා. එතුමාගේ මතය, එහෙම නැත්නම් එතුමාගේ ප්‍රායෝගිකභාවය, එතුමාගේ අකාර්යක්ෂමතාව නිසා අද මේ රටට මේ වාගේ තත්ත්වයකට මුහුණ දෙන්න සිද්ධ වෙලා තිබෙනවා. අපි කොච්චර කොහොම කිව්වත්, ඒක තමයි යථාර්ථය. එතුමා 2019දී ජනාධිපති ධුරයට පත් වෙලා මාසයක් විතර ගත වෙනකොට රට බංකොලොත් කළා, රට ණය කළා කියන යහ පාලන රජය ඉදිරිපත් කර තිබුණු බදු විශාල ප්‍රමාණයක් සම්පූර්ණයෙන්ම අහෝසි කරලා -අවලංගු කරලා- දැම්මා. අපි දන්නවා, ඒ කාලය තුළ සීනි බදු වංචාවක් සිද්ධ වුණු බව. ඒ වාගේම, මහ බැංකුවත් එක්ක ගනුදෙනු කරලා බැඳුම්කර වංචා වැනි නොයෙකුත් විධියේ වංචා 2007 වර්ෂයේ ඉඳලා නොයෙක් අවස්ථාවලදී සිද්ධ වෙලා තිබෙනවා. ඒ කාලය තුළ ගත්තා වූ යම් යම් තීරණ නිසා අද තිබෙන මේ තත්ත්වයට රටක් හැටියට අපට මුහුණ දෙන්න සිද්ධ වෙලා තිබෙනවා.

හිටපු මහ බැංකු අධිපතිවරයකු වූ අජිත් නිවාඩ් කබ්රාල් මහත්මයා පසුගිය 2020 වර්ෂයට ඉස්සෙල්ලා තමන් මහ බැංකුවේ අධිපතිවරයා හැටියට හිටපු කාලයේ ඇති වූ මේ රටේ මූල්‍ය ප්‍රගතිය ගැන ගොඩක් දේවල් මේ ගරු සභාවේදී පසුගිය කාලයේ කථා කළ බව අපට අද වාගේ මතකයි. ඒ වාගේම පී.බී. ජයසුන්දර මහත්මයා ඒ කාලයේ ඒ ඇමතිවරුම හැඳින්වූයේ "ආර්ථික ඝාතකයා" කියලායි. ඒ අය ගත්තා වූ යම් යම් තීරණ නිසා මේ රටේ බංකොලොත්භාවය ඉක්මන් වුණා කියන එකත් මේ වෙලාවේ අපි මතක් කරන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ වෙලාවේදී කිව යුතු, අපට අමතක කරන්න බැරි තවත් කාරණයක් තිබෙනවා. ඒ වෙලාවේ කිව්වා, "රටේ ප්‍රශ්නයක් නැහැ. නමුත්, කොවිඩ් වසංගතය නිසා මේ තත්ත්වය ඇති වුණා" කියලා. අපි ඒක පිළිගන්නවා. කොවිඩ් වසංගතය නිසා ලෝකයේම පොඩි මන්දගාමීකමක් ඇති වුණා. Antigen kits මිලදී ගන්න, එහෙම නැත්නම් එන්නත්වලට ගෙවන්න අපේ රටේ තිබුණු විදේශ සංචිතවලින් විශාල ප්‍රමාණයක් යොදවන්න සිදු වූ බව කියනවා. නමුත්, කොමිස් මුදල් ලබා ගැනීම සඳහා, වෙනත් ප්‍රතිලාභ සඳහා හිටපු ජනාධිපතිවරයාගේ යාළුවෝ යැයි කියා ගත්ත පිරිස් එම කටයුතු සඳහා යොදවපු එකෙන් තමයි වෙනත් අවස්ථාවලට වැඩිය ඉක්මනින් අපේ විදේශ සංචිත ප්‍රමාණය ගොඩක් අඩු වෙලා ගියේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පසුගිය කාලයේදී අපේ රටේ කෘෂි කර්මාන්තය අඩපණ වුණා. අද සහල්වල මිල අපි දන්නවා. එදා කිලෝවක් රුපියල් 75ට, 80ට දෙනකොට සහල් කිලෝවක මිල ගැන නොයෙකුත් දේවල් කිව්වා. නමුත්, අද සහල් කිලෝවක් රුපියල් 200 ඉක්මවා තිබෙනකොට ඒ ගැන කවුරුවත් කථා කරන්නේ නැහැ. එදා වෙදා පාදෙනියලා වාගේ අය මේ සඳහා උපදෙස් දීලා කාබනික පොහොර කතන්දරයක් ගෙනැල්ලා අද තේ වගාවද, වී වගාවද, අතුරු භෝග වගාවද, පලතුරු වගාවද -මේ හැම එකක්ම- නන්නත්තාර වෙලා තිබෙනවා. අපේ රටේ කොයි

[ගරු නිතිඥ තලතා අතුකෝරල මහත්මිය]

තැනක වුණත් තිබෙන්නේ සාරවත් පසක්. යාපනයට ගිහිල්ලා බැලුවත්, අද උඩරට වැවෙන එළවලු ඒ ප්‍රදේශයේත් හොඳට වැවෙනවා. හැබැයි, කාබනික පොහොර හඳුන්වා දීමේ සිද්ධියත් එක්ක අපට ගොඩක් ප්‍රශ්නවලට මුහුණ දෙන්න සිද්ධ වුණා. මේ වාගේ කරුණු-කාරණා ගොඩක් හේතුවෙන් තමයි මේ රට අද තිබෙන තත්ත්වයට පත් වුණේ.

ගරු ජනාධිපතිතුමා අය වැය කථාවේදී කියනවා, නිදහස් අධ්‍යාපනය, නිදහස් සෞඛ්‍ය සේවාවන් හා අනෙකුත් සුබසාධන කටයුතු ඔස්සේ සමාජයේ සියලු කොටස්වලට සාධාරණ ලෙස ප්‍රතිලාභ ලැබෙනවාද යන්න සොයා බැලිය යුතුයි කියලා.

අපි දන්නේ නැහැ, එතුමාගේ යටි අරමුණ මොකක්ද කියලා. මොකද, ගොඩක් ආයතන වාගේම නිදහස් අධ්‍යාපනයත් සම්පූර්ණයෙන්ම පෞද්ගලික අංශයට දෙන්න මොකක් හරි බලාපොරොත්තුවක් තිබෙනවාද දන්නේ නැහැ. නිදහස් සෞඛ්‍යය ගැනත් එහෙම කියලා තිබෙනවා. ඇත්තටම අතිදුෂ්කර හෝ අතිදිළිඳු නොවෙයි, සාමාන්‍ය මට්ටමකින් ගම් වැසියෝ හැටියට ජීවත් වන අයට, සාමාන්‍ය ජීවිතයක් ගත කරන අයට අද නිදහස් අධ්‍යාපනය, නිදහස් සෞඛ්‍යය කියන සේවා හීන බවට පත් වෙලා තිබෙනවා. ඉස්පිරිතාලෙට ගියාට එතැනින් බෙහෙත් ටික ගන්න හම්බ වෙන්නේ නැහැ. මට දැන ගන්න ලැබුණා, ඊයේ-පෙරේදා දවසක ඉස්පිරිතාලේ clinic එකෙන් සමේ රෝගයකට ෆාමසියෙන් ගන්න කියලා බෙහෙතක් දීලා තිබෙනවා; බෙහෙත රුපියල් අටදාහයි. එවැනි තත්ත්වයක් තුළ අපට නිදහස් අධ්‍යාපනයක් හා සුබසාධනයක් ගැන කථා කරන්න පුළුවන්ද?

සමෘද්ධි ව්‍යාපාරය ගැනත් කියා තිබෙනවා. 1995 වසරේ ඉඳලාම නොකඩවාම සමෘද්ධි සහනාධාරය ලබන අය ඉන්නවා. එතකොට සවිබල ගැන්වීමක් සිදු වෙලා තිබෙන්නේ කොහේද? ඒ අයට හැමදාම සමෘද්ධි සහනාධාරය දීලා තිබෙනවා. ඇයි? අද සමෘද්ධි ව්‍යාපාරය සම්පූර්ණයෙන්ම දේශපාලන වැඩ පිළිවෙළක් බවට පත් වෙලා තිබෙනවා. දැන් මේ වනකොටත් කමිටු පත් කරගෙන, ආණ්ඩු පක්ෂයේ අය ඒවායේ සාමාජිකයෝ ලෙස පත් වෙලා තිබෙනවා. අද රට බංකොලොත්. ඒක මේ රටේ ලක්ෂ දෙසිය විසිඑකටම බලපාන ප්‍රශ්නයක්. හෙට දවසේ අපි ඔක්කෝම ඒ ප්‍රශ්නයට මුහුණ දෙන්න ඕනෑ. හැබැයි, ඒ අය තමයි දැන් ආපසු සමෘද්ධිය දෙන්න ඕනෑ අය තෝරන්නේ. මොනවාද, නිර්ණායක? ඒ සම්බන්ධයෙන් වැඩ පිළිවෙළක් තිබෙනවාද? අපි දන්නවා, වැඩිහිටි දීමනාව දෙනකොට එක වැඩිහිටියෙක් නැති වෙනකල් ඉන්න ඕනෑ, ඊළඟ පුද්ගලයාට ඒ දීමනාව දෙන්න. ඉතින් මම නම් හිතන විධියට ජනාධිපතිවරයා මුදල් ඇමතිවරයා හැටියට නිදහස් අධ්‍යාපනය, නිදහස් සෞඛ්‍යය සහ වෙනත් සුබසාධන සේවා ගැන කථා කළාට අද මේ දිළිඳු රටේ, බංකොලොත් රටේ කිසිම දෙයක් එහෙම තත්ත්වයක නැහැ කියන එක තමයි අපට කියන්න තිබෙන්නේ. ජනාධිපතිවරයා සුබසාධනය ගැන සඳහන් කරලා තිබෙන නිසා සුදුසු මනුස්සයාට, දිළිඳු මනුස්සයාට සහනාධාර ලබා දෙන්න හරි ක්‍රමවේදයක් හදනවා නම් හොඳයි. අද පවුල් ලක්ෂ විස්සක් විතර සමෘද්ධි සහනාධාරය ලබනවා. තේ වතු තිබෙන අය, බස් තිබෙන අය, කඩ තිබෙන අය සමෘද්ධි සහනාධාරය ලබනවා. ඒ නිසා ඒ ගැන නිවැරදි අධීක්ෂණයක් කරලා, ලැබිය යුතු කෙනාට සහනාධාරය ලබා දෙන්න ඕනෑ. මොකද, එදා තුන්වේල කාපු මිනිස්සු දෙවේල කනවා. දෙවේල කාපු අය එක වේලක් කනවා. මොකුත් නැති මිනිස්සු කොහොම හරි කොස් ටිකක් තම්බාගෙන ගමේකමට ඔහේ කාලා නිහඬව ඉන්නවා. වෙනමම තත්ත්වයකට අද රට පත් වෙලා තිබෙනවා.

ඊළඟට, අපේ රටේ ආදායම් ලබන ක්ෂේත්‍ර -වැවිලි ආර්ථිකය, නිදහස් වෙළෙඳ කලාප, ඇඟලුම් කර්මාන්ත, සංචාරක ව්‍යාපාරය, විදේශ රැකියා- ගැන සඳහන් කරලා තිබෙනවා. පොහොර ප්‍රශ්නයත් එක්ක වැවිලි කර්මාන්තය පිළිබඳව අපි කථා කරලා වැඩක් නැහැ. අප සියලුදෙනාටම ඒ සම්බන්ධයෙන් හොඳ අවබෝධයක් තිබෙනවා. කුරුඳු කර්මාන්තය සඳහා නව දෙපාර්තමේන්තුවක් ඇති කරන්න ඕනෑය කියලා සඳහන් කරලා තිබෙනවා. කුරුඳු කර්මාන්තය සඳහා නව දෙපාර්තමේන්තුවක් ඇති කරන එක හොඳයි. හැබැයි, අපේ වෙළෙඳ පොළ කොහේද තිබෙන්නේ? අපි දන්නවා, සමහර රටවල, ආසියානු රටවල ඉන්න ශ්‍රී ලාංකිකයන් spices සඳහා පාවිච්චි කරන කුරුඳු ටික ඔක්කෝම ගෙනෙන්නේ වියට්නාමයෙන් බව. මෙහේ තිබෙන තද නීති, ක්‍රමවේදයක් නැතිකම, සමහර ආයතනවල දූෂිත වැඩ පිළිවෙළ නිසා අමාරුවෙන් කුරුඳු ටිකක් වවන අහිංසක මනුස්සයෙකුට තැනක් නැහැ. ඒ නිසා අද මුදල් ඇමතිතුමා හැටියට ජනාධිපතිතුමාට වැවිලි කර්මාන්තය ගැන කථා කරන්න දෙයක් ඉතුරු වෙලා තිබෙනවාද කියලා මම දන්නේ නැහැ. කථා කළොත් කියාවි, අමු තේ දලු කිලෝ එකකට මෙච්චර මිලක් ගෙවනවාය කියලා. හැබැයි, අමු දලු කිලෝ එකකට ඒ මිල ගෙවන්නේ වෙන මොකක්වත් නිසා නොවෙයි, අමු දලු නිෂ්පාදනය අඩු වෙලා තිබෙන නිසායි.

ඊළඟට, ඇඟලුම් කර්මාන්තය ගැන සඳහන් කරලා තිබෙනවා. අපි දන්නවා, කාලයකට ඉස්සර GSP Plus සහනය නැතුව ගිය බව. අද ඇඟලුම් කර්මාන්තකරුවන් මේ රටින් යන්න ගිහිල්ලා තිබෙනවා. ලෝකයේ සිටින ප්‍රසිද්ධ ඇඟලුම් කර්මාන්තකරුවන් අද මේ රටට ඇවිල්ලා තිබෙනවාද? ඒ සඳහා වැඩ පිළිවෙළ මොකක්ද? මට කථා කරන්න ඉතුරු වෙලා තිබෙන කාලය ඉතාම කෙටි නිසා මම අපේ ගරු නියෝජ්‍ය කථානායකතුමාගෙන් තව විනාඩි දෙකක කාලයක් ඉල්ලනවා.

සංචාරක කර්මාන්තය දියුණු කරන්න කථා කරනවා. ඒක බොහොම හොඳයි. හැබැයි, මේ රට තමයි සංචාරකයන්ට තිබෙන එකම ගමනාන්තය කියලා හිතලා අපි වැඩ කරන්න හොඳ නැහැ. අද සංචාරකයින්ට පහසුකම් දෙන්න අපට පුළුවන්ද? යමක් කමක් තිබෙන ඉහළ පෙළේ සංචාරකයන් අද මේ රටට එනවාද?

ඊළඟට, ළමා මන්දපෝෂණය ගැන මේ අය වැයේ කිසිම වචනයක් කථා කරලා නැහැ.

අඩුම ගණනේ පාසල් යන දරුවන්ගේ මන්දපෝෂණය ගැන මොනවා හෝ ක්‍රමවේදයක් සකස් කළ යුතුයි. බංකොලොත් වෙච්ච රටක නිකම් දෙන්න කියලා අපි කියන්නේ නැහැ. නමුත්, අධ්‍යාපන අමාත්‍යාංශය හරහාවත් මේ සඳහා යම් වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්න ක්‍රමවේදයක් සකස් කර තිබෙනවාද? ගරු ජනාධිපතිතුමා මේ අය වැයෙන් ග්‍රාමීය පාසල්වල පහසුකම් වැඩි කර තිබෙනවා. හැබැයි, දරුවන් පාසලට යවන්න, ඔවුන් මන්දපෝෂණ තත්ත්වයෙන් මුදා ගන්නයි අපි කටයුතු කළ යුත්තේ. අද දරුවන් ඉස්කෝලේ යන්නේ නැති තත්ත්වයක් තිබෙන්නේ. දවස් පහක් පාසැල් ගිය ළමයා අද දවස් දෙකයි යන්නේ. සමහර ළමයි පාසැල් යන්නේම නැති තත්ත්වයකට පත් වෙලා තිබෙනවා.

ගැබිනි මව්වරුන්ගේත්, කිරි දරුවන්ගේත් ත්‍රිපෝෂ ටික අද හරියාකාරව ලැබෙන්නේ නැහැ. ඒ ගැන කිසිම අවධානයක් මෙවර අය වැයෙන් යොමු කර නැහැ. මේවා දෙන්න කියනවා නොවෙයි. හැබැයි, මේවාට සුදුසු වැඩ පිළිවෙළක් තිබෙන්න ඕනෑ. විශ්‍රාම වැටුප් ලබන, ඉතාම අමාරුවෙන් ජීවත් වෙන විශ්‍රාමිකයන්ටත් අද ඒ වැටුප මදි වෙලා තිබෙනවා. රෝහල්වල බෙහෙත් ටික නැත්නම් ඒ බෙහෙත් ටික මිලදී ගැනීමට තරම්වත් ඔවුන්ට ලැබෙන ඒ මුදල ප්‍රමාණවත් නැහැ. ඒ පිළිබඳව අපි කනගාටු වෙනවා. මුදල් ඇමතිතුමා මේ අය වැය ඉදිරිපත් කරද්දී දිශානතිය වෙනස් කරපු එක හොඳයි. IMF එක කිව්වොත්,

තවදුරටත් දිශානතිය වෙනස් කරන එක හොඳයි. හැබැයි මොන දිශානතිය වෙනස් කළත්, අපි රටක් හැටියට මුහුණ දෙන දරුවන්ගේ මන්දපෝෂණය, පාසල් අධ්‍යාපනය, සෞඛ්‍ය ඇතුළු ප්‍රමුඛතම ප්‍රශ්න සම්බන්ධයෙන් වන කිසිම වැඩ පිළිවෙළක් මේ අය වැයෙන් ඉදිරිපත් කර නැහැ. අඩුම ගණනේ විදේශ සංචිතයක් හෝ පාවිච්චි කර මේවාට සුදුසු වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කළ යුතුයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද රට තිබෙන්නේ ඉතා බැරෑරුම් තත්ත්වයකයි. අපි විවේචනයක් කරනවා නොවෙයි. හැබැයි, බංකොලොත්භාවයත් එක්ක තවදුරටත් ඉදිරියට යන්න අමාරුයි. මොනවා කරන්නත් මනුෂ්‍යයින් ජීවත් වෙලා ඉන්න ඕනෑ. ඒ නිසා මේ හැම කාරණයක් සම්බන්ධයෙන්ම මීට වැඩි අවධානයක් යොමු කළා නම් හොඳයි කියලා මම හිතනවා.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු (ආචාර්ය) සරත් වීරසේකර මැතිතුමා. ඔබතුමාට මිනිත්තු 14ක කාලයක් තිබෙනවා.

[අ.භා. 12.17]

**ගරු (ආචාර්ය) සරත් වීරසේකර මහතා**
(மாண்புமிகு (கலாநிதி) சரத் வீரசேகர)
(The Hon.(Dr.) Sarath Weerasekera)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඕනෑම රටක විදේශ ප්‍රතිපත්තිය ඒ රටේ ආර්ථිකයට බලපාන බව අපි දන්නවා. ඒ වාගේම තමයි අපේ රටේත් විදේශ ප්‍රතිපත්තිය ආර්ථිකයට බලපානවා. අලි සබ්රි ඇමතිතුමාට මම ස්තුතිවන්ත වෙනවා. මොකද, එතුමා අපේ විදේශ ප්‍රතිපත්තිය ගැන "Daily FT" පුවත්පතට ඉතාම හොඳින් විස්තර කර තිබුණා. අග්‍රාමාත්‍යතුමාත් අපේ විදේශ ප්‍රතිපත්තිය ගැන ඉතාම හොඳින් විග්‍රහ කරලා තිබුණා. එතුමා ඉංග්‍රීසි භාෂාවෙන් විග්‍රහ කරන ලද කාරණා සිංහල භාෂාවට හැරෙව්වොත් එහි සඳහන් වන්නේ, "අපේ විදේශ ප්‍රතිපත්තිය මධ්‍යස්ථයි. අපි මිත්‍රත්වයේ දෑත සෑම රටකටම දිගු කරනවා. එය දුර්වලකමක් ලෙස නොදැකිය යුතුයි. එය කලාපීය සහ ජාත්‍යන්තර බල අරගළයෙන් ඈත් වීමකි. අපි මධ්‍යස්ථ වන අතර, එක් රටකට වෙනත් රටකට විරුද්ධව අපේ රට භාවිත කිරීමට අපි ඉඩ නොදෙමු. එවන් අවස්ථාවල අපි ඉතා උනන්දුවෙන් අපේ ස්වෛරීත්වය ආරක්ෂා කරමු" කියලායි. "We very zealously protect our territorial integrity"; එහෙම තමයි කියන්නේ. අපේ විදේශ ප්‍රතිපත්තිය මධ්‍යස්ථ වීම ඉතා වැදගත් වන්නේ Quad වැනි සංවිධාන නිසායි. එක පැත්තකින්, ඇමෙරිකාව, ඕස්ට්‍රේලියාව, ඉන්දියාව සහ ජපානය තිබෙනවා. අනෙක් පැත්තෙන්, චීනය තිබෙනවා. ඒක නිසා අපේ විදේශ ප්‍රතිපත්තිය neutral විය යුතුයි.

නෙවිල් ලද්දුවහෙට්ටි මහත්මයා මම ඉතා ගෞරවයෙන් මේ අවස්ථාවේ මතක් කරනවා. එතුමා, "ද අයිලන්ඩ්" පුවත්පතට ඉතා වටිනා ලිපි ලියනවා. විදේශ ප්‍රතිපත්තිය මධ්‍යස්ථ නම් අපි කෙසේද හැසිරිය යුත්තේ කියන කාරණය ගැන එතුමාත් ඉතා ලස්සනට සඳහන් කරලා තිබෙනවා. ඇත්ත වශයෙන්ම අපි විදේශ ප්‍රතිපත්තිය මධ්‍යස්ථ රටක් නම්, අන් රටවල් සමඟ කටයුතු කරනකොට අපි අපක්ෂපාතී විය යුතුයි. වෙනත් රටවල් අබිබවා තවත් රටක් සමඟ සම්බන්ධකම් ඇති නොකරගත යුතුයි. උචිත ක්‍රමයෙන් බැහැරව අපේ රටේ තිබෙන යටිතල පහසුකම් පිළිබඳව විවිධ ව්‍යාපෘති හිතුමතේ වෙනත් රටවලට -විදේශීය සමාගම්වලට- ලබා නොදිය යුතුයි. එහෙම දෙනවා නම්, අපේ විදේශ ප්‍රතිපත්තිය මධ්‍යස්ථයි කියලා අපට කියන්න බැහැ. උදාහරණයක් ගත්තොත්, අපි එදා කොළඹ වරායේ නැඟෙනහිර පර්යන්තය ජපානයට සහ ඉන්දියාවට දෙන්න හැදුවා. බටහිර පර්යන්තය අදානි සමාගමට දෙනවා. ඒ කටයුත්ත අපේ විදේශ ප්‍රතිපත්තිය මධ්‍යස්ථයි කියන කාරණයට අනුකූල නැහැ. එදා හම්බන්තොට වරාය ඇමෙරිකාවට දෙන්න හැදුවා. ඇමෙරිකාව ඒක ප්‍රතික්ෂේප කළාට පසුව ඉන්දියාවට දෙන්න හැදුවා. ඉන්දියාවත් ප්‍රතික්ෂේප කළාට පසුව තමයි ඒක චීනයට දෙන්න හැදුවේ. ඒ වාගේ විශාල යටිතල පහසුකම් තිබෙන ව්‍යාපෘති ලබා දීමේදී පළමුවෙන්ම අපි කළ යුත්තේ, ඒ සඳහා වන ව්‍යාපෘති යෝජනා - project proposals - සකස් කිරීමයි. ඊට පසුව අභිමතය ප්‍රකාශ කරන ලියුම් - letters of interest - අපි ලබාගත යුතුයි.

ඊට පසුව උචිත ක්‍රමවේදයෙන් පස්සේ තමයි අදාළ විදේශීය සමාගම හෝ විදේශීය රට තෝරා ගත යුත්තේ. එහෙම තමයි නියම මධ්‍යස්ථ විදේශ ප්‍රතිපත්තියක් තිබෙනවා නම් කටයුතු කළ යුත්තේ. කිසිම unsolicited proposal එකක්, ඒ කියන්නේ ස්ව කැමැත්තෙන් දෙන යෝජනාවක් අපි පිළිගන්න ඕනෑ නැහැ, අපේ විදේශ ප්‍රතිපත්තිය මධ්‍යස්ථ නම්. ඇත්තටම මම විසිදෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට තනියම විරුද්ධ වුණේ, විදේශ ආයෝජකයන් ටෙන්ඩර් ක්‍රමයෙන් සොයා ගත යුතුයි කියලා, නැත්නම් තෝරා පත් කර ගත යුතුයි කියලා ඒ ප්‍රසම්පාදන කොමිසමේ පවා පැහැදිලිව කියලා නැති නිසායි. අපේ විදේශ ප්‍රතිපත්තිය මධ්‍යස්ථ නම් ඉන්දියාවේ ආරක්ෂාව නිසා යම් යම් තීරණ ගන්නවා කියන එකටත් යම් කිසි සීමා දැමිය යුතුයි. උදාහරණයක් වශයෙන් කිව්වොත් උතුරේ සූර්ය බලශක්ති ව්‍යාපෘතිය චීන සමාගමකට දුන්නා. නමුත්, ඉන්දියාවේ බලපෑම මත අපි ඒක අවලංගු කළා. ඒක මධ්‍යස්ථ විදේශ ප්‍රතිපත්තියක් තිබෙන අපි ඇත්ත වශයෙන්ම නොකළ යුතු දෙයක්.

ඒ වාගේම තමයි, "Yuan Wang 5" කියන චීනයේ විමර්ශන නෞකාව එනකොට ඉන්දියාව විරුද්ධ වුණා. නමුත්, ඒ දෙකටම පැහැදිලි, පිළිගත හැකි හේතු කාරණා ඉදිරිපත් වුණේ නැහැ. අපි ස්වාධීන නම් ඇත්ත වශයෙන්ම ස්වාධීන තීරණ ගත හැකි නිදහසක් අපේ රටට තිබෙන්න ඕනෑ. හැබැයි, ස්වාධීනව තීරණ ගන්න නිදහසක් තිබෙනවා නම් එසේ තීරණ ගන්න හැකියාවකුත් අපට තිබෙන්න ඕනෑ. ඒ හැකියාව ඇති වෙන්නේ ඇත්ත වශයෙන්ම අපි ආර්ථික වශයෙන් ස්වාධීන නම්, ශක්තිමත් නම් පමණයි. ආර්ථික වශයෙන් ශක්තිමත් බවක්, ස්වාධීන බවක් ඇති කර ගන්න නම් අපි ආහාර සුරක්ෂිතතාව ඇති කර ගත යුතුයි, අපි ආහාර අතින් ස්වයංපෝෂිත විය යුතුයි. ඒ වාගේම, තමයි අපි ස්වශක්තියෙන් ආරක්ෂාව සපයා ගත යුතුයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ නිසා තමයි මම කියන්නේ අපේ විදේශ ප්‍රතිපත්තිය ආර්ථික සංවර්ධනයට සෘජුව බලපානවා කියලා. විදේශ ප්‍රතිපත්තිය ගැන කථා කරනකොට ඉන්දියාව කියන සාධකයත් ඉතාම වැදගත්. අපි දන්නවා භූගෝලීය පිහිටීම අනුව ඉතිහාසයේ සිටම, -එදා මෙදාතුර- ඉන්දියාවට අනෙක් රටවලට වඩා අපට බැඳීමක් තිබෙන බව. නමුත්, එදා ඉන්දියාව සහ අද ඉන්දියාව වෙනස්. අතීතයේ ඉන්දියාවේ ප්‍රාන්ත රජවරුන්ගේ ආකල්ප අනුවයි අපේ බැඳීම් සහ සබැඳියා තිබුණේ. උදාහරණයක් හැටියට සමහර ප්‍රාන්ත අපේ සංස්කෘතිය, අපේ උරුමයන් හැඩගස්වන්න දායක වුණා, ඒවා වර්ධනය කරන්න දායක වුණා. නමුත්, දකුණේ තිබුණු ප්‍රාන්ත වරින් වර අපේ රට ආක්‍රමණය කරලා, අපේ දේපොළ සහ වස්තුව කොල්ල කාලා, අපි භක්තියෙන් රැක ගත්ත දේවල් විනාශ කර තිබෙනවා. වර්තමාන ඉන්දියාව නිර්මාණය කළේ, බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදීන් විසින්, මිනිස් ජීවිත බොහෝ සංඛ්‍යාවක් බිලි දීලා. එහිදී ඒ අය නිදහස් ඉන්දියාව සහ පාකිස්තානය කියලා බෙදා වෙන් කර ගත්තා. එහෙම නම් අපේ මධ්‍යම විදේශ ප්‍රතිපත්තිය තීරණය විය යුත්තේ එදා තිබුණු ඉන්දියාව අනුව නොවෙයි මෙදා තිබෙන වර්තමාන ඉන්දියාව අනුවයි.

[ගරු (ආචාර්ය) සරත් වීරසේකර මහතා]

එදා අපේ ආරක්ෂාව සහ භෞමික අඛණ්ඩතාව රඳා පැවතුණේ ප්‍රාන්ත රාජ්‍යවල රජවරුන්ගේ අභිලාෂ මතයි. නමුත්, අද ඉන්දියාවේ ආරක්ෂාව සහ භෞමික අඛණ්ඩතාව රඳා පවතින්නේ අපේ ආරක්ෂාව සහ භෞමික අඛණ්ඩතාව මත. උදාහරණයක් හැටියට අපේ රටෙන් උතුර-නැගෙනහිර වෙන් වුණොත් තමිල්නාඩුවේ බෙදුම්වාදී අභිලාෂ වර්ධනය වෙනවා. එතකොට දකුණු ඉන්දියානු ප්‍රාන්තත් ඔවුන් අනුකරණය කරයි. එතකොට ඉන්දියාවට ගෝලීය වශයෙන් බලවත් රටක් බවට පත් වෙන්න තිබෙන අපේක්ෂාවලට ඒක තර්ජනයක් වෙනවා. ඒක නිසා තමයි ඉන්දියාව කොටි ත්‍රස්තවාදීන් පරාජය කරන්න ඉන්දීය සාම සාධක හමුදා මෙහාට එව්වේ. ඒක බැරි වුණාම තමයි එදා දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය බලෙන් අපේ කර පිට පැටෙව්වේ. නමුත්, මම මේ අවස්ථාවේදී කියා සිටිනවා උතුර-නැගෙනහිරට බලය බෙදා දුන්නොත් ඇත්ත වශයෙන්ම වෙන් වෙන්න තිබෙන ප්‍රවණතාව වැඩියි. ඒ වාගේම, දිස්ත්‍රික්කවලට බලය විමධ්‍යගත කළොත් ඇත්ත වශයෙන්ම අපේ භෞමික අඛණ්ඩතාව රැකෙනවා. අපේ භෞමික අඛණ්ඩතාව රැකුණොත් පමණයි ඉන්දියාවේත් භෞමික අඛණ්ඩතාව රැකෙන්නේ. We must never allow devolution, but must always have decentralization. මේ ආකල්පයේ තමයි අපි සැමවිටම සිටිය යුතු වෙන්නේ.

අද අපි යම්කිසි ආර්ථික අර්බුදයකට මැදි වෙලා තිබෙනවා නම් ඒකට අපට ඉන්දීය සහාය අවශ්‍ය වෙනවා. මොකද, අපි අසාර්ථක රටක් වුණොත් බලවත් රටවල් මේකට ඇඟිලි ගහයි, අත පොවයි. ඒක ඉන්දියාවේ යහපත පිණිස හේතු වෙන්නේ නැහැ. එහෙම නම් කෙටියෙන් කිව්වොත් අපි අපේ ආරක්ෂාව සහ භෞමික අඛණ්ඩතාව රැක ගත යුත්තේ ඉන්දියාවේ ආරක්ෂාව සහ භෞමික අඛණ්ඩතාවට ඒක බලපාන නිසායි.

එසේ නම් අප දැන් ඉන්දියාව දෙස බැලිය යුත්තේ කෙසේද? අප එදා කිව්වා, ඉන්දියාව දෙස වැඩිමහල් සහෝදරයෙක් හැටියට - like a big brother - බලනවා කියලා. හැබැයි, දැන් අප ඉන්දියාව දෙස බලන්නේ එහෙම නොවෙයි. ඇත්ත වශයෙන්ම අන්‍යෝන්‍ය භෞමික අඛණ්ඩතාව තහවුරු කරන සමාන පාර්ශ්ව - equal partners - හැටියටයි අප ඒ දෙස බලන්න ඕනෑ. එහෙම බලනවා නම්, අපේ ඒ මධ්‍යස්ථ විදේශ ප්‍රතිපත්තිය ඒ ආකාරයෙන් ක්‍රියාත්මක වනවාද කියා බලන්න ඕනෑ. මා ගරු ජනාධිපතිතුමාට යෝජනා කරනවා, අපේ මධ්‍යස්ථ විදේශ ප්‍රතිපත්තිය අප නියමාකාරයෙන් ක්‍රියාත්මක කරනවාද, නැද්ද කියන එක තහවුරු කර, ඒ සම්බන්ධයෙන් යම්කිසි වාර්තාවක් ලබා දෙන්න තාක්ෂණික කමිටුවක් පත් කරන්න කියලා.

ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා ජනාධිපති වශයෙන් ඉන්න කොට නියමාකාරයෙන් ඒ මධ්‍යස්ථ විදේශ ප්‍රතිපත්තිය අනුගමනය කළා නම් වර්තමාන ආර්ථික අර්බුදයෙන් අපට මිදෙන්න තිබුණා. අප කැබිනට් මණ්ඩලයේදී ඉතා පැහැදිලිව කිව්වා, රුසියාවෙන් තෙල් ගන්න කියලා. නමුත්, ඇමෙරිකාව තරහ වෙයි කියා රුසියාවෙන් තෙල් ගත්තේ නැහැ. රුසියාවෙන් තෙල් ගත්තා නම් අරගළය ඇති වෙන්නේත් නැහැ. එහෙම වුණා නම් මේ ආර්ථික අර්බුදය බොහෝ දුරට අපට විසඳා ගන්නත් තිබුණා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ජාතික ආරක්ෂාව සහ ආහාර සුරක්ෂිතතාව අත්‍යවශ්‍ය දෙයක් බව මා කියන්න ඕනෑ. ආහාර සුරක්ෂිතතාව ඇති කරන්න නම් රජයේ තිබෙන ඉඩම් රජය සතුවම තිබිය යුතුයි; land must belong to the State. බොහෝ රටවල ඉඩම් - land - රජය සතු වනවා. මේ අය වැයෙන් ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ ඉඩම් පවා බැහැර කරන්න ප්‍රාදේශීය ලේකම්වරුන්ට ඉඩ දීලා තිබෙනවා. ඒකට මා ඇත්ත වශයෙන්ම තරයේ විරුද්ධයි.

ගරු මහාචාර්ය චන්න ජයසුමන මැතිතුමා ඉතා ලස්සනට මෙහි තිබෙන භයානක අනුවර පැහැදිලි කර තිබෙනවා අප දැක්කා. ඇත්ත වශයෙන්ම ශ්‍රී ලංකා මහවැලි අධිකාරියෙන් ඉඩම් සඳහා දෙන්නේ බලපත්‍ර. නමුත්, ප්‍රාදේශීය ලේකම්වරයකු දෙනවා නම් දෙන්නේ සින්නක්කර ඔප්පු. රජයේ තිබෙන ඉඩම් එක පුද්ගලයකුට බැහැර කරන්න අවසර දීම මොන තරම් අවදානම් කාර්යයක්ද කියන එක මා මේ අවස්ථාවේදී කියනවා. එහෙම වුණොත් දේශපාලනඥයන්ට, දේශපාලන හෙංචයියන්ට සහ තැරැව්කාරයන්ට අවශ්‍ය විධියට තමයි ඒ ඉඩම් බෙදන්න වෙන්නේ. උතුර - නැගෙනහිර -විශේෂයෙන් උතුරේ- ඉඩම් කොහොම බෙදාවිද කියන එක නම් අපට හිතා ගන්න පුළුවන්. ප්‍රභාකරන්ට අවුරුදු තිහක් තිස්සේ යුද්ධ කරලා කරන්න බැරි වෙච්ච දේ අපි මේ අය වැය ලේඛනයේ එක වාක්‍යයකින් කරන්න යන එක මුළු ජාතියම පාවා දීමක් හැටියටයි මා සලකන්නේ. ගොවියකුගේ ඉඩමකට සින්නක්කර ඔප්පු දුන්නොත් ඔහු පෞද්ගලික අයිතිකාරයකු වෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. පෞද්ගලික අයිතිකාරයකු වුණොත් ඔහුගේ කුඹුරකට හෝ ඉඩමකට රජයෙන් කිසිම ආධාරයක් දෙන්නේ නැහැ; ණයක් ලබා ගන්න බැහැ; කිසිම උදව්වක් කරන්නේ නැහැ; පොහොර සහනාධාරය දෙන්නේ නැහැ. එහෙම වුණොත් ඔහු අනිවාර්යයෙන්ම ඒ කුඹුර හෝ ඉඩම විකුණා දමනවා. එහෙම විකුණා දැම්මොත් රජයට ඒ ඉඩම අහිමි වනවා. එදා අපේ රටේ ඉඩම්වලින් සියයට 14ක් පෞද්ගලික අංශය සතුව තිබුණා; සියයට 86ක් රජය සතුව තිබුණා. මා රජයට යෝජනා කරනවා, පර්යේෂණයක් - research එකක් - කරලා, රජයට අද වනකොට ඉඩම් කොපමණ අයිතිද කියා සොයා බලන්න කියලා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ආහාර සුරක්ෂිතතාව කියන්නේ, ධාන්‍ය වර්ග - හාල්, පරිප්පු වාගේ දේවල් - මාස හයකට, නැත්නම් අවුරුද්දකට ගබඩා කර තබන එක නොවෙයි. ඇත්තටම ආහාර සුරක්ෂිතතාව - food security - කියන්නේ මොකක්ද? රජය සතු කෘෂි ඉඩම්වල මෙන්න මේ දේවල් -මේ තැන්වල වී, මේ තැන්වල එළවලු, මේ තැන්වල අල, ලූනු- වවන්න කියලා රජය විසින් කියන්න පුළුවන්කම තිබෙනවා නම්, එහෙම කියන්න පුළුවන් පාලනයක් තිබෙනවා නම් ඒක තමයි ආහාර සුරක්ෂිතතාව කියන්නේ. නමුත්, ඉඩම්වල අයිතිය රජයට නැති වුණොත් ඒ පාලනය නැති වනවා. ආහාර සුරක්ෂිතතාවට අනිවාර්යයෙන්ම එය බැරෑරුම් ලෙස හානිකර වනවා. ඒ නිසා රජයේ ඉඩම් ප්‍රාදේශීය ලේකම්තුමාට බැහැර කරන්න තිබෙන බලය ඉතා වැරදි බව මා මේ අවස්ථාවේදී කියනවා. ඒක අප අනිවාර්යයෙන්ම මේ අය වැය ලේඛනයෙන් ඉවත් කළ යුතුයි.

ගරු ජනාධිපතිතුමා කියා තිබෙනවා, "we must look inward; we must look inside" කියලා. ඒ පිළිබඳව අප සන්තෝෂ වනවා. ඒ ආකල්පයට -concept එකට- අප එකඟයි. මොකද, බාහිරින් හැම තිස්සේම ආධාර උපකාර, නැත්නම් විදේශ විනිමය බලාපොරොත්තු වෙලා ඒක නැවතුණොත් අපට ලොකු ප්‍රශ්නයක් ඇති වනවා. ඒ වාගේම, අපේ සම්පත් අප පාවිච්චි කරන්න ඕනෑ. නමුත්, විශාල වශයෙන් ලාභ ලබන ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය සහ ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව වාගේ ආයතන අළෙවි කිරීම ඇත්ත වශයෙන්ම ජාතියට හානිකරයි. එයිනුත් වළකින ලෙස තමයි මම මේ අවස්ථාවේ ඉල්ලා සිටින්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඉස්සෙල්ලාත් කිව්වා වාගේ ඇත්ත වශයෙන්ම අපේ රටේ ආර්ථිකය ඉතා බරපතළ සහ තීරණාත්මක තත්ත්වයක තිබෙන මොහොතකයි ගරු ජනාධිපතිතුමා විසින් මේ අය වැය ඉදිරිපත් කරනු ලැබුවේ. යම්

ප්‍රශ්නයකට පිළිතුරු සෙවීමට නම්, ඒ ප්‍රශ්නය ඇති වුණේ කොහොමද කියා අපි සොයා බලන්න ඕනෑ. දුක නැති කිරීමේ මාර්ගය සොයනවා නම්, අපි ඉස්සෙල්ලාම දුකට හේතුව දැනගත යුතුමයි. ඒ අතින් බලන කොට, 2019 වන විට කිසිදු උවදුරක් නැතිව,-

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔතුමාට වෙන් කළ කාලය අවසන් වනවා.

**ගරු (ආචාර්ය) සරත් වීරසේකර මහතා**
(மாண்புமிகு (கலாநிதி) சரத் வீரசேகர)
(The Hon.(Dr.) Sarath Weerasekera)
මට තවත් විනාඩියක කාලයක් දෙන්න, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

2019 වන විට රටේ කිසිදු උවදුරක් නැති වුණත්, විදේශ සංචිතය ලෙස යහ පාලන රජය අපගේ නව රජයට භාර දුන්නේ ඇමෙරිකානු ඩොලර් බිලියන 7.6යි. එම යහ පාලන ආණ්ඩුව නියෝජනය කළ ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මැතිතුමාත් දැන් මේ ගරු සභාවේ ඉන්නවා. තෙල්, ගෑස් ආදිය ගෙන්වන්න මාසයකට ඩොලර් බිලියන 1.5ක් අවශ්‍ය වුණා. නමුත් විදේශ විනිමය වශයෙන් කිසිදු මුදලක් නොලැබුණු නිසා මාස 7ක් තුළ අපේ රටේ විදේශ සංචිතය සම්පූර්ණයෙන් සිඳී ගියා. 2019 දී ආණ්ඩුව මාරු වන විටත් ලංකාව විදේශ සංචිත ඌනතාව හේතුවෙන් බාහිර ක්ෂේත්‍රයේ අවදානමට ලක්ව සිටි බව IMF වාර්තාව මඟින් හෙළිදරව් වෙලා තිබෙනවා.

වර්ෂ 2015 දී අපේ විදේශ ණය ප්‍රමාණය ඇමෙරිකානු ඩොලර් බිලියන 23.4ක් වුවත්, 2019 වන විට -යහ පාලන රජය අවසන් වන විට- එය ඇමෙරිකානු ඩොලර් බිලියන 38.7 දක්වා වැඩි වෙලා තිබුණා. එසේ ණය ප්‍රමාණය වැඩි වුණු නිසා 2019න් පස්සේ ණය ආපසු ගෙවීම වෙනුවෙන් වසරකට ඩොලර් බිලියන 6ක් ගෙවීමට සිදුවීම විශාල අභියෝගයක් වුණා. එම නිසා 2021 වන විට අපේ විදේශ සංචිතය ඩොලර් බිලියන 1.5ක් දක්වා අඩු වුණා. ඒ තත්ත්වය එසේ තිබියදීත් අපි කිසිදු ණය වාරිකයක් පැහැර නොහැර කටයුතු කරගෙන ගියා. නමුත්, 2022 මාර්තු වන විට ණය වාරික නොගෙවා පැහැර හරින ලෙස සමහරු රජයට බලපෑම් කළා. ඩොලරය පාවෙන්න ඉඩ හැරියා, බැංකු පොලිය ඉහළ දැම්මා, IMF සහනය ඉල්ලන ලෙස බල කළා. ඒ අතරතුර ගෑස් සහ ඉන්ධනවල හිඟකම නිසා අරගළ සහ උද්ඝෝෂණ ව්‍යාපාර දියත් වුණා. ඒ වාගේම ණය ආපසු නොගෙවන බවත් ප්‍රකාශ කළා. අපි අපේ රට බංකොලොත් රටක් ලෙස ප්‍රකාශ කළ නිසා අපට උදව් දෙන්න සිටි රටවල් පවා අපට උදව් දීමෙන් වැළකුණා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ රට බංකොලොත් -bankrupt- රටක් වශයෙන් ප්‍රකාශ කිරීම ඉතාම වැරදි දෙයක් හැටියටයි මා දකින්නේ. බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය මන්ත්‍රීතුමිය. ඔබතුමියට මිනිත්තු 17ක කාලයක් තිබෙනවා.

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය මෙනෙවිය**
(மாண்புமிகு (கலாநிதி) (செல்வி) ஹரிணி அமரசூரிய)
(The Hon. (Dr.) (Ms.) Harini Amarasuriya)
බොහොම ස්තුතියි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඇත්ත වශයෙන්ම ලබන වසර සඳහා වන අය වැය මේ වසරේ ඉදිරිපත් කරන්නේ සහ අප ඒ පිළිබඳව සාකච්ඡා කරන්නේ සුවිශේෂී තත්ත්වයක් මත මේ රට ආර්ථික වශයෙන් බැරෑරුම් ලෙස කඩා වැටුණු, දේශපාලනිකවත් විශාල අභියෝග රාශියකට මුහුණ දෙන අවධියකයි. දේශපාලනික වශයෙන් ගත්තත්, රටේ ජනතාව සියලු දේශපාලනඥයන් පිළිබඳව, විශේෂයෙන්ම මේ රට පාලනය කරපු දේශපාලනඥයන් පිළිබඳව දැඩි පිළිකුලකින්, කලකිරීමකින් බලන මොහොතක, විශේෂ අකමැත්තක් සහිතව වාසය කරන මොහොතක තමයි -එවැනි තත්ත්වයක් තුළ තමයි- අප මේ අය වැය ගැන කථා කරන්නේ. අය වැයක් තුළින් රජයේ ප්‍රතිපත්තිය ප්‍රකාශ වන නිසා මෙය දේශීය වශයෙනුත්, ජාත්‍යන්තර වශයෙනුත් සුවිශේෂී අවස්ථාවක්, සුවිශේෂී මොහොතක්. මේ තිබෙන සුවිශේෂී තත්ත්වය මොකක්ද, මේ රටේ පාලකයන් ඒක තේරුම් ගෙන තිබෙන්නේ කොහොමද, ඒක විග්‍රහ කරලා තිබෙන්නේ කොහොමද, මොන වාගේ විසඳුම් ද ලබා දෙන්නේ කියන කාරණා දිහා ජනතාව ඉතාම ඕනෑකමින් බලා සිටියා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. නමුත් ඉතාම පැහැදිලියි, ප්‍රශ්නය තේරුම් අරගෙන නැහැ වාගේම දේශපාලන තත්ත්වය හරියට තේරුම් අරගෙනත් නැහැ කියන එක. ජනතාව මොන තැනද ඉන්නේ, ජනතාව ආණ්ඩුවෙන් ඉල්ලන්නේ මොනවාද, මේ රටේ පාලකයන්ගෙන් ඉල්ලන්නේ මොනවාද කියන එක ගැනවත් කිසිම සංවේදීභාවයක් පෙන්නුම් කරන්නේ නැහැ. ජනතාව මේ මොහොතේ දේශපාලනයෙනුත්, දේශපාලනඥයන්ගෙනුත් මෙච්චර දුරස් වෙලා ඉන්නේ කොහොමද, රටේ ඉදිරිය වෙනුවෙන් ඒක බලපාන්නේ කොහොමද කියන එක ගැනත් කිසිම තැකීමක්, හැඟීමක් නැතිව ඉදිරිපත් වෙච්ච අය වැය ලේඛනයක් තමයි, මෙය. ඇත්තටම අපි ඒ ගැන ගොඩක් පුදුම වන්න ඕනෑත් නැහැ. මොකද, මේ අය වැය ඉදිරිපත් වන්නේ ජනතාවගෙන් ප්‍රතික්ෂේප වුණු පුද්ගලයෙකු වෙතින්.

තම දේශපාලන ඉතිහාසය පුරාම ජනතාවගෙන් දුරස්ථ වීම දේශපාලන චරිත ලක්ෂණයක් හැටියට පෙන්නුම් කරපු කෙනෙකු තමයි, මේ අය වැය ඉදිරිපත් කරලා තිබෙන්නේ. නමුත්, මේ අය වැය වෙනුවෙන් කථා කරන, මේ අය වැය සාධාරණීකරණය කරන අය හිතනවා නම් හොඳයි, අප මේ නිශ්චිත මොහොතේ මුහුණ දෙන දේශපාලන අර්බුදය, ජනතාවගේ අසතුට වාගේම දේශපාලනය, ආර්ථිකය සහ රට පාලනය කරපු අය පිළිබඳව ජනතාව තුළින් එන පිළිකුල මේ අර්බුදයේම කොටස් බව. ඒ සඳහා යම්කිසි ප්‍රතිචාරයක් දැක්වීම අවශ්‍යයි කියන තැන ඉඳන් ඔවුන් මේ අය වැය ගැන කථා කරනවා නම් ඉතාම වැදගත් වෙනවා කියා මා විශ්වාස කරනවා.

මේ සුවිශේෂ තත්ත්වය තුළ 'අපට වැරදුණේ කොතැනද, වැරදුණු තැන් මොනවාද, ඒවා නිවැරදි කරගන්නේ කොහොමද' කියන කාරණා පිළිබඳව ඉතා හොඳ විග්‍රහයක් පාලකයන්ට තිබීම මේ වෙලාවේ අත්‍යවශ්‍යයි. මේ අය වැය ලේඛනය දිහා බලන කොට පෙනෙනවා, ඔවුන් තමාට වැරදුණු බව පිළිගෙන තිබෙන බවකුත්. ඒ අය යම්කිසි පාපෝච්චාරණයක් වාගේ එකකුත් කරනවා අපි දැක්කා. නමුත්, වැරදුණු හේතුව මොකක්ද කියන එක දිහා බලන කොටත්, ඒ වැරදිවලට වගකිව යුත්තේ කවුද කියන එක ගැන කථා කරන කොටත් ඒ අය වෙතින් විශාල අඩුවක් දකින්නට පුළුවන්. ඇත්තටම කාටද වැරදුණේ?

අප අද මුහුණ දෙන ආර්ථික අර්බුදය දිහා බලන කොට පෙනෙනවා, අද විවේචනය තිබෙන්නේ ආර්ථිකය පිළිබඳව තීරණ ගත්තු අය, ආර්ථික ප්‍රතිපත්ති හදලා ක්‍රියාත්මක කරපු නායකයන්, ඒවා ක්‍රියාත්මක කරපු ආණ්ඩු පිළිබඳව නොවන බව. අද ඇති වී තිබෙන මේ තත්ත්වය පිළිබඳ වැරැද්ද පටවා තිබෙන්නේ කාටද? මේ අය වැය ප්‍රකාශය තුළම ආ වචනවලින් නම් කම්මැළි, සහන මත යැපෙන ජනතාව මත තමයි ඒ වැරැද්ද පටවා තිබෙන්නේ. කාටද මේ විධියට කියන්නේ? දරුවන්ට හරියට ආහාර වේලක් දීගන්න බැරුව ඉතා අමාරු තත්ත්වයක වැටිලා ඉන්න

[ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය මෙනෙවිය]

දෙමාපියන්ටයි; ලැබෙන ආදායමෙන් ජීවිතය හරියට කළමනාකරණය කරගන්න බැරිකමින් රැකියා දෙකතුනක් කරන මේ රටේ පුරවැසියන්ටයි; පවුල නඩත්තු කරන්න අසීමිත අවදානම්වලට මුහුණ දෙමින් පිට රටවලට යන්න සිදු වෙලා තිබෙන අපේ රටේ සොහොයුරියන්ටයි. මම ඊයේ මාධ්‍යවලින් දැක්කා, ඕමාන්වලදී අපේ කාන්තාවන් කොච්චර හැල්ලුවට ලක් වනවා ද කියලා. ඒ ස්ත්‍රීන්ට තමයි 'කම්මැළි, සහන මත යැපෙන ජනතාව' කියලා කියන්නේ. කඩා වැටුණු අධ්‍යාපනය නිසා තමන්ගේ අනාගත බලාපොරොත්තු සුන් වෙච්ච තරුණ තරුණියන්ට තමයි කියන්නේ, 'ඔබේ වැරැද්ද නිසා තමයි ඔබ අද මේ තත්ත්වයට වැටිලා ඉන්නේ' කියලා. ජීවිත කාලය තිස්සේම රැකියාවක් කරලා, මහන්සි වෙලා වැඩ කරලා තමන් වැඩිහිටි වයසට පත් වුණාම අඩුම තරමින් තමන්ගේ බෙහෙත් ටික හරියට ලබාගන්න බැරි වෙච්ච ජනතාවටයි මේ වරද පටවා තිබෙන්නේ. ඒ ජනතාවට කවුද එහෙම කියන්නේ? මුළු ජීවිත කාලය තුළම අතිශයින් ඉහළ වරප්‍රසාද සහිත ජීවිතයක් ගත කරපු අය තමයි එහෙම කියන්නේ. මේ අර්බුදයට මුහුණ දීලා තමන්ගේ එදිනෙදා ජීවිතය ගැට ගහගෙන යන්න අසීමිත ලෙස වෙහෙස දරන ජනතාවට තමයි ඒ අය කියන්නේ, 'ඔබේ වැරැද්ද නිසා තමයි මේ රටේ මේ ආර්ථික අර්බුදය, මේ තත්ත්වය, මේ කඩා වැටීම ඇති වෙලා තිබෙන්නේ' කියලා. මේ කථාව අනුමත කරන්නේත්, මේ විධියට විග්‍රහ කරන එක අනුමත කරන්නේත්, සාධාරණීකරණය කරන්නේත්, අසීමිත වරප්‍රසාද ලබන, මේ ක්‍රමය තුළින් තමන්ගේ ජීවිත ඉතා සුඛෝපභෝගී විධියට ගත කරන්න හැකියාවක් තිබෙන අයයි. ඒ අය තමයි මේ විවේචනය, මේ විග්‍රහය කරන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ ප්‍රශ්නය මේ විධියට දකින්න කොච්චර නපුරු වෙන්න ඕනෑද, කොච්චර අසංවේදී වෙන්න ඕනෑද? ඇත්තටම මේ අයට හදවතක් තිබෙනවාද කියන ප්‍රශ්නය අපට අහන්න වෙනවා. මොකද, මේ රටේ ජනතාව මුහුණ දෙන ප්‍රශ්න පිළිබඳව අපට මේ වෙලාවේ තේරුම් ගන්න පුළුවන් වෙන්න ඕනෑ. ඒ ප්‍රශ්නවලට විග්‍රහයක් ගේනකොට, ජනතාව මත මේ විධියට වැරැද්ද පටවනවා නම් ඒ අය කොච්චර අසංවේදී වෙන්න ඕනෑද කියලා පොඩ්ඩක් කල්පනා කරන්න කියලා මම ඔබ සියලුදෙනාටම කියනවා.

ඇත්තටම මේ ජනතාවගේ වරදක්ද? මේ ආර්ථික අර්බුදය ඇති වුණේ කාගේ වරදින් ද කියන එක ගැන අපි යම් කිසි විග්‍රහයක යෙදෙමු. අපි ඒක 1978 සිට පටන් ගනිමු. 1978 සිට ඉදිරිපත් වුණු අය වැය කථා බැලුවාම, එම අය වැය කථාවල පොදු ගුණාංග කිහිපයක් තිබෙනවා. සියලු අය වැය තුළ මතු කරන පොදු ප්‍රශ්න කිහිපයක් තිබෙනවා. ඒවා මොනවාද? එන්න එන්න වැඩි වන ණය බර, ඉහළ යන විරැකියාව, පාලනය කර ගන්න බැරි වුණු උද්ධමනය, අය වැය පරතරය සහ සහනාධාර ක්‍රමයත්, ආර්ථික වර්ධනයත් අතර යම් කිසි විධියක සමබරතාවක් - balance එකක් - තබා ගැනීමට නොහැකි වීම යන කරුණු හැම අය වැය ප්‍රකාශයක් තුළම මතු කරන ප්‍රශ්න වෙනවා. විවිධ අවස්ථාවල, විවිධ මුදල් ඇමතිවරු ඒවාට හේතු මතු කරනවා. කළමනාකරණය පිළිබඳ ප්‍රශ්න, දූෂණය, නාස්තිය, වැරදි දේශපාලන තීරණ ගැන කියනවා. විශේෂයෙන් ආණ්ඩු වෙනස් වන අවස්ථාවල හැම මුදල් ඇමති කෙනෙක්ම දීර්ඝ විග්‍රහයක යෙදෙනවා, පෙර තිබුණු ආණ්ඩුවේ දූෂණයත්, වැරදි දේශපාලන තීරණත් නිසා තමයි මේ තත්ත්වය මතු වුණේ කියන එක විස්තර කරන්න.

විසඳුම් බැලුවත්, ඉතා සමානකම් තිබෙන විසඳුම් රාශියක් තමයි මේ හැම කථාවකින්ම වාගේ ඉදිරිපත් වෙන්නේ. 1978 සිට බැලුවොත්, බදු ප්‍රතිසංස්කරණ, සහනාධාර සමාජ ආරක්ෂණ ක්‍රමය ප්‍රතිසංස්කරණය කිරීම, රාජ්‍ය සේවය ප්‍රතිව්‍යුහගත කිරීම, රාජ්‍ය ව්‍යාවසාය ප්‍රතිව්‍යුහගත කිරීම, එහෙම නැත්නම් පෞද්ගලිකරණය කිරීම, මානව සම්පත් දියුණු කිරීම වැනි පොදු ලක්ෂණ හැම අය වැය ප්‍රකාශයක් තුළම අපට දකින්න පුළුවන්. හැබැයි, කවදාවත් මතු කරන්නේ නැති, කථා කරන්නේ නැති, ආමන්ත්‍රණය කරන්නේ නැති ප්‍රශ්නයකුත් තිබෙනවා. දූෂණ, වැරදි කළමනාකරණය, නාස්තිය, වැරදි ප්‍රතිපත්තිවලට වගකිව යුතු දේශපාලන සංස්කෘතිය කොහොමද වෙනස් කරන්නේ කියන එක කිසි විටෙක ආමන්ත්‍රණය කරන්නේ නැති ප්‍රශ්නයක්. හැම අය වැයක් තුළම, විශේෂයෙන් ම ආණ්ඩු වෙනස් වුණු අවස්ථාවල, - උදාහරණයක් විධියට ගත්තාම 1978, 1994, 2015 වාගේ- විශාල පරිවර්තනයක් ගැන පොරොන්දු දෙනවා. අලුත් ආරම්භයක් කියලා පෙර ආණ්ඩුවල වැරදි ඔක්කොම මතක් කරලා, ඒ වැරදි නොකරන විධිය ගැන, ඒ වැරදි නිවැරදි කරන අලුත් පාලන ක්‍රමයක් ගැන විශාල පොරොන්දු රාශියක් ඉදිරිපත් කරලා තිබෙනවා. හැබැයි, යථාර්ථය මොකක්ද, ගරු නියෝජ්‍ය කථානායකතුමනි? යථාර්ථය තමයි, වෙනසක් වෙලා නැහැ කියන එක. මේ මූලික ප්‍රශ්න එහෙමම තිබෙනවා. මේ මූලික ප්‍රශ්න එහෙමම තිබෙනවා, කිසිම වෙනසක් වෙලා නැහැ. ඇත්ත වශයෙන්ම අපි මේ කඩදාසි ඇතුළු සම්පත් නාස්ති කරන්නේ නැතිව එක අය වැය ලේඛනයක් අරගෙන නම් ටිකයි, දින ටිකයි පොඩ්ඩක් එහෙන්, මෙහෙන් වෙනස් කරලා ඉදිරිපත් කළා නම් ලොකු ප්‍රශ්නයක් එන්නේ නැහැ. මොකද, එකම කථාව තමයි අවුරුදු ගණනාවක් තිස්සේ කියලා තිබෙන්නේ. අපි නැවත වතාවක් මේ අය වැය ලේඛනය දිහා බැලුවොත්, ඔය කථාවම තමයි කියලා තිබෙන්නේ. විශාල පරිවර්තනයක් ගැන කථා කරලා තිබෙනවා. වෙනසක් අවශ්‍යයි කියලා කථා කරලා තිබෙනවා. විවෘත ආර්ථිකයේ අඩු පාඩු ගැනත් කථා කරලා තිබෙනවා. සංවෘත ආර්ථිකයේත් අඩු පාඩු තිබෙනවා කියලා වෙනසක් ගැන කථා කරලා, තිබෙන පැරණි අදහස් ටිකම නැවත වතාවක් ඉදිරිපත් කරලා තිබෙන බව තමයි පෙනෙන්න තිබෙන්නේ. හැබැයි, ඇත්තටම අද ජනතාව මුහුණ දෙන ප්‍රශ්න මොනවාද, මේ අය වැය තුළින් ඒ ප්‍රශ්නවලට ලැබිලා තිබෙන්නේ මොන වාගේ විසඳුම්ද කියලා අපි පොඩ්ඩක් කල්පනා කරමු.

අපි අධ්‍යාපනය පිළිබඳව කල්පනා කරනවා නම්, අධ්‍යාපන ක්ෂේත්‍රයට වෙන් කරලා තිබෙන මුදලුත්, ඉදිරිපත් කර තිබෙන යෝජනාත්, අද ජනතාව මුහුණ දෙන ප්‍රශ්නත් අතර තිබෙන සම්බන්ධය මොකක්ද? අපි දන්නවා, පසුගිය අවුරුදු දෙකහමාරත්, තුනත් ඇතුළත අධ්‍යාපනයේ විශාල කඩා වැටීමක් සිදු වෙලා තිබෙන බව. කොවිඩ් වසංගතය නිසාත්, ආර්ථික අර්බුදය නිසාත් දරුවන්ගේ අධ්‍යාපනය අහිමිවීම විශාල ප්‍රශ්නයක්. නමුත්, ඒ ප්‍රශ්නයට අපට විසඳුමක් අවශ්‍ය වෙනවා. සාම්ප්‍රදායිකව අධ්‍යාපනය වෙනුවෙන් කරන දේවල්වලට අමතරව, ඒ සුවිශේෂී තත්ත්වය පිළිබඳව මේ අය වැය තුළ අපි ආමන්ත්‍රණය කර තිබෙන්නේ කොහොමද? අවුරුදු දෙකහමාරක් අධ්‍යාපනය අහිමි වුණු ඒ දරුවන් මුහුණ දෙන අර්බුදයට මේ අය වැය තුළින් ලැබී තිබෙන්නේ මොන වාගේ විසඳුම්ද? විසඳුම් ලැබී නැහැ. දැන් යෝජනා කරලා තිබෙනවා, අලුත් වෛද්‍ය පීඨයක් හදන්න. ඒක ඉතාම හොඳයි. වෛද්‍ය අධ්‍යාපනය පුළුල් කිරීම හොඳ දෙයක්. ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයට අලුතින් වෛද්‍ය පීඨයක් එකතු කරලා තිබෙනවා. දැනට තිබෙන වෛද්‍ය පීඨවල තිබෙන ප්‍රශ්න ගැන පොඩ්ඩක් හොයලා බලලා තිබෙනවාද? අලුතින් ආරම්භ වුණු සබරගමුව විශ්වවිද්‍යාලයේ ක්‍රියාත්මක වෙන්න තිබෙන වෛද්‍ය පීඨයේ ප්‍රශ්න පිළිබඳව අරගෙන තිබෙන තීරණ මොනවාද?

සෞඛ්‍ය ක්ෂේත්‍රය ගත්තත්, වෛද්‍යවරුන්, හෙදියන් රට හැර දමා යන මෙවන් යුගයක, ඒ වෙනුවෙන් ගෙනැවිත් තිබෙන යෝජනා මොනවාද? ගෙවන වාට්ටු රජයේ රෝහල්වලට හඳුන්වා දීමට යෝජනා කර තිබෙනවා. ඒකද විසඳුම? ආහාර සුරක්ෂිතතාව

පිළිබඳව බරපතළ ප්‍රශ්නයක් තිබෙනවා. ළමුන්ට මන්දපෝෂණය පිළිබඳව බරපතළ ප්‍රශ්න තිබෙනවා. ඒ සඳහා මුදල් වෙන් කරලා තිබෙනවා. නමුත් ඒ මුදල ප්‍රමාණවත්ද? අද දවසේ මොන දරුවාටද මේක අවශ්‍ය, මොන දරුවාටද අවශ්‍ය නැත්තේ කියලා අපි තෝරා ගන්නේ කොහොමද? ඒ නිර්ණායක අලුතින් ඉදිරිපත් කරන්න තිබෙන මැදිහත්වීම මොකක්ද? ඒ සඳහා ඉදිරිපත් කරන යෝජනා මොනවාද? පවතින මේ ආර්ථික අර්බුදය තුළ විශාලම බරක් අදින්නේ මේ රටේ ස්ත්‍රීන්. මෙපමණ කාලයක් යම්කිසි විධියකට මේ රටේ ණය බර ගෙවන්න මුදල් සොයාගෙන තිබෙන්නේ මේ රටේ ස්ත්‍රීන්. ඒ බර අඩු කිරීම අරගෙන තිබෙන තීරණ මොනවාද? ඒ, ස්ත්‍රීන් වෙනුවෙන් යෝජනා වන අලුත් මැදිහත්වීම් මොනවාද? මේ අර්බුදය තුළ අපි ස්ත්‍රීන්ට දෙන විසඳුම තරුණියන්, ව්‍යවසායකයන් බවට පත් කිරීමද? වැඩිහිටියන්ට තිබෙන සමාජ ආරක්ෂණ ගැටලුවලට මේ ආණ්ඩුව යෝජනා කරන විසඳුම, අපි ඔවුන්වත් ව්‍යවසායකයන් කරන එකද? මේ රටේ ජනතාව එදිනෙදා මුහුණ දෙන ප්‍රශ්නවලට මේ අය වැයෙන් කර තිබෙන්නේ මොන විධියේ මැදිහත්වීමක්ද කියන එකත් විශාල ප්‍රශ්නයක්. ඇත්ත වශයෙන්ම මේ අය වැය ප්‍රකාශනය තුළින් අපට මතක් කරලා දෙන්නේ, මේ අය වැය කියන දේවල් කොච්චර අවැදගත්ද කියන එකයි. මොකද, මේ රටේ තීරණ ගන්නේ මේ අය වැය අනුව නොවන බව අපි සියලු දෙනාම දන්නවා. ප්‍රතිපත්ති හැදෙන්නේ මේ අය වැය ගැන මෙතැන කථා කරන දේවල් අනුව නොවෙයි. මෙතැනින් එහා, මෙතැනින් පිට ඉඳලා තමයි තීරණ ගන්නේ. සම්ප්‍රදායානුකූලව මෙතැනදී මේ දේවල් සිද්ධ වෙනවා. නමුත්, තීරණ ගැනෙන්නේ වෙන තැනකින්. ජනාධිපතිතුමා මොනවා කිව්වත්, මේ අය වැය IMF එක සතුටු කරන්න ඉදිරිපත් කරලා තිබෙන අය වැයක්. නමුත් ඇත්තටම ක්‍රියාත්මක වන දේවල් තීරණය වෙන්නේත්, ක්‍රියාත්මක වෙන්නේත් මෙතැනින් බැහැරව කියන එක ඉතාම පැහැදිලියි.

මේක ඇත්තටම නාට්‍යයක්; අපි අවුරුදු ගණනක් තිස්සේ ඉදිරිපත් කරන නාට්‍යයක්. අවාසනාවකට අපි සියලු දෙනාත් මේ නාට්‍යයේ නළු නිළියන් බවට පත් වෙලා තිබෙන එක තමයි සිද්ධ වෙලා තිබෙන්නේ. මේ නාට්‍යය තුළින් රටේ ප්‍රශ්න විසඳෙන්නේ නැහැ කියන එක ඉතාම පැහැදිලියි. රටේ ප්‍රශ්න විසඳන්න නම් මේ තිබෙන දේශපාලන සංස්කෘතිය වෙනස් වෙන්න ඕනෑ. මෙපමණ කාලයක් මේ රට පාලනය කළ අයගේ තිබෙන උද්ධච්චකමත්, අසංවේදී බවත් වෙනස් නොවන තාක් කල් අපි මේ නාට්‍ය හැම වසරකම ප්‍රදර්ශනය කරමින්, රටේ ජනතාව තව තවත් දුකට ඇද දමමින් ඉන්න එක තමයි සිද්ධ වෙන්නේ.

බොහොම ස්තුතියි.

**ගරු හෙක්ටර් අප්පුහාමි මහතා**
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු අධිකරණ ඇමතිතුමාත් මේ වෙලාවේ සභාවේ සිටින නිසා මම එතුමාගෙන් කාරණයක් දැන ගන්න කැමැතියි. ඒ සඳහා මට විනාඩි දෙකතුනක් දෙන්න. ගරු ඇමතිතුමනි, ඊයේ ඉඳලා බොහොම තදබල විධියට මාධ්‍යවල පළ වෙනවා, සංචාරක වීසාවලින් ඕමානයට අරගෙන ගිහින් තිබෙන ගැහැනු ළමයි පිරිසකට වෙච්ච දෙයක් නැහැ කියලා. මේක විශාල ප්‍රශ්නයක්. අපට දිගින් දිගටම අහන්න ලැබෙනවා, ඩුබායිවලටත්, තවත් රටවල් කිහිපයකටත් සංචාරක වීසා හරහා මේ විධියට ගැහැනු ළමයි ගෙනියනවා කියලා. එහෙම එක එක තැන්වලට ගෙනියලා අපේ ගැහැනු ළමයි විකුණන ව්‍යාපාරයක් මේ අය කරනවා කියලා තමයි දැන ගන්න ලැබෙන්නේ. මේක විශාල ප්‍රශ්නයක්.

ගරු අධිකරණ ඇමතිතුමනි, දැන් හදිසියේ මේ ගැන කිව්වාම, ඔබතුමාට මේ ප්‍රශ්නයට උත්තරයක් දෙන්න බැහැ කියන එක අපි දන්නවා. නමුත්, මම මෙය අවස්ථාවක් කරගෙන ඒ ගැන කිව්වේ වෙන කාරණාවක් නිසා නොවෙයි, මේ තත්ත්වය දිගින් දිගටම තිබුණොත්, තවත් දින කිහිපයක් ගත වෙනකොට මොන වාගේ තත්ත්වයක් ඇති වෙයිද දන්නේ නැති නිසායි. ඒ නිසා තමයි ඉක්මනින්ම මේ ගැන හොයා බලන්න කියා විශේෂයෙන්ම මම ඉල්ලන්නේ. මොකද, මේක භයානක තත්ත්වයක්.

**ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) கவிந்த ஹேஷான் ஜயவர்தன)
(The Hon. (Dr.) Kavinda Heshan Jayawardhana)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි,-

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාත් ඒ කාරණය ගැනද කියන්නේ?

**ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) கவிந்த ஹேஷான் ஜயவர்தன)
(The Hon. (Dr.) Kavinda Heshan Jayawardhana)

ඒ කාරණාව ගැනම තමයි මමත් කියන්නේ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. අබුඩාබිවලට අපේ කාන්තාවන් දොළොස් දෙනෙකු අරගෙන ගිහින් තිබෙනවා. ඊට පසුව ඔවුන් ඕමානයට ගෙනියලා ඕමානයේ පැවැති කිසියම් උත්සවයකදී ප්‍රසිද්ධියේම මේ අය auction කර තිබෙනවා. ඊට පසුව මේ අයව ගණිකා වෘත්තියට, sex traffickingවලට අරගෙන ගියා කියලා තමයි සිරස මාධ්‍ය ජාලය වාර්තා කර තිබුණේ. ඒ, අපේ රටේ සිටි අම්මා කෙනකු වෙන්න පුළුවන්, එහෙම නැත්නම් කාගේ හෝ නැගණියක් වෙන්න පුළුවන්. කරුණාකර මේ සම්බන්ධයෙන් රජයේ අවධානය යොමු කර ඉක්මන් පියවරක් ගන්න කියා අපි ඉල්ලීමක් කරනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

**ගරු ජනාධිපති නීතිඥ (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා (අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා)**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ - நீதி, சிறைச்சாலைகள் அலுவல்கள் மற்றும் அரசியலமைப்பு மறுசீரமைப்பு அமைச்சர்)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe, PC - Minister of Justice, Prison Affairs and Constitutional Reforms)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ වාගේ තොරතුරු රාශියක් මමත් මාධ්‍ය තුළින් දැක්කා. අපිත් නිරන්තරයෙන්ම විදේශ රැකියා අමාත්‍යාංශයේ අවධානය මේ සම්බන්ධව යොමු කර තිබෙනවා. සමහර රැකියා ඒජන්තවරු කිසිදු ප්‍රමිතියකින් තොරව, නීතිගරුකභාවයකින් තොරව මේ වාගේ කූට, ව්‍යාජ කටයුතුවල යෙදෙන බවට තොරතුරු රාශියක් දීර්ඝ කාලයක් තිස්සේ වරින්වර ලැබී තිබෙනවා. මම ඒ පිළිබඳව අවධානය යොමු කරන්නම්. ඒ වාගේම විෂය භාර ගරු ඇමතිතුමාට සහ අමාත්‍ය මණ්ඩලයට ඒ පිළිබඳව දැනුම් දී යම් තීරණයක් අරගෙන ඔබතුමන්ලාට දැනුම් දෙන්නම්.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ගරු කනක හේරත් රාජ්‍ය ඇමතිතුමා. ඔබතුමාට මිනිත්තු 14ක කාලයක් තිබෙනවා.

[අ.භා. 12.52]

**ගරු කනක හේරත් මහතා (තාක්ෂණ රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு கனக ஹேரத் - தொழில்நுட்ப இராஜாங்க அமைச்சர்)
(The Hon. Kanaka Herath - State Minister of Technology)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට මේ අවස්ථාව ලබා දීම පිළිබඳව ප්‍රථමයෙන් ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. 2023 - විසර්ජන පනත් කෙටුම්පත දෙවැනිවර කියවීමේ විවාදයට සම්බන්ධ වෙමින් ආණ්ඩු පක්ෂයේ සහ විපක්ෂයේ මන්ත්‍රීවරුන් පසුගිය දවස්වලදී විවිධ කාරණා ප්‍රකාශ කළා. ඒ කථා කළ මන්ත්‍රීතුමන්ලාගෙන් බහුතරයක් සඳහන් කළේ නිදහසින් පසු ගෙවුණු අවුරුදු 74ක කාලය තුළදී අපේ රට තුළ හරියාකාර ආර්ථික ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක නොකිරීම ගැනයි. එහෙම නැත්නම්, ඒ ක්‍රියාත්මක කළ හැම ආර්ථික ප්‍රතිපත්තියක්ම ෆේල් කියන එකයි. නමුත්, මම මේ අවස්ථාවේදී සඳහන් කළ යුතු කාරණාවක් තිබෙනවා. ඒ සමහර තීරණ වරදින්න ඇති. නමුත්, නිදහස් අධ්‍යාපනය සහ නිදහස් සෞඛ්‍ය සේවය ගැන බැලුවොත්, ඒ අතින් අපි ලෝකයේ අනෙක් රටවල් සමඟ කරට-කර ඉන්නවා කියන එකත් මේ අවස්ථාවේ අපි මතක තබා ගන්න ඕනෑ. ඇත්තටම රට තුළ හරියාකාරව එක ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක නොවීම මේකට හේතුව වෙන්න පුළුවන්. සමහර වෙලාවට රජයෙන් රජයට ප්‍රතිපත්ති වෙනස් වෙනවා. ආර්ථික ප්‍රතිපත්ති පමණක් නොවෙයි, විදේශ ප්‍රතිපත්ති වෙන්න පුළුවන්, අධ්‍යාපන ප්‍රතිපත්ති වෙන්න පුළුවන්, ඒ හැම ප්‍රතිපත්තියක්ම වෙනස් වෙනවා. නමුත්, මෙවැනි අභියෝගාත්මක අවස්ථාවකදී පාර්ලිමේන්තු නියෝජිතයන් හැටියට අප සියලුදෙනා එකතු වුණොත්, ඉදිරි අනාගතය වෙනුවෙන් හැම අංශයකින්ම ස්ථිර ප්‍රතිපත්තියක් ඉදිරිපත් කිරීමට හැකියාව ලැබෙයි කියා අපට බලාපොරොත්තුවක් තිබෙනවා.

පසුගිය කාලයේ අපි IMF එකට ගියේ නැහැ කියා විරුද්ධ පක්ෂය විසින් බොහෝ වෙලාවට චෝදනා කළා. නමුත් අද එතුමන්ලා කියනවා, මේක IMF අය වැයක් කියලා. IMF එකෙන් අපට ඉදිරිපත් කර තිබෙන ප්‍රධාන කරුණු ගැන කිව්වොත්, දේශපාලන ස්ථාවරත්වය, ණය ප්‍රතිව්‍යුහගත කිරීම, ඒ වාගේම පාඩු ලබන ආයතන ප්‍රතිව්‍යුහගත කිරීම, බදු වැඩි කර රජයට ආදායම වැඩි කර ගැනීම කියන කාරණා සඳහන් කරන්න පුළුවන්. මම හිතන විධියට එවැනි වැඩ පිළිවෙළක් සාර්ථකව ක්‍රියාත්මක කිරීම රජයේ ස්ථිර ප්‍රතිපත්තියක් හැටියට පෙන්වා දෙන්න පුළුවන්. ඒකට කවුරුවත් විරුද්ධ වීමේ අවශ්‍යතාවක් නැහැ. මේක IMF අය වැයක්ද, එහෙම නැත්නම් වෙන කාගේ හෝ අය වැයක්ද කියන එක නොවෙයි වැදගත් වෙන්නේ. අද රටේ තිබෙන තත්ත්වයට අපි මුහුණ දෙන්නේ කොහොමද කියා තීරණය කර, අපේ ජනතාව මුහුණ දීලා තිබෙන මේ තත්ත්වයෙන් ඔවුන් මුදා ගන්නේ කොහොමද කියා තීරණය කර එම තීරණය ක්‍රියාවට නැංවීමයි අද කළ යුතුව තිබෙන්නේ. එහෙම නැතිව, පසුගිය අවුරුදු 74ට බැණ බැණ ඉන්න එක නොවෙයි කළ යුත්තේ.

ඊයේ දිනයේදී G20 සමුළුව අවසන් වෙලා තිබුණා. එහිදී ඉදිරිපත් කළ G20 Bali Leaders' Declaration එක මට ලැබුණා අපේ රටටත් ඒ පිළිබඳව වැදගත් වන කාරණාවක් තිබෙන නිසා, අපිත් ඉල්ලීම් කර තිබෙන නිසා ඒක ඉංග්‍රීසි භාෂාවෙන් කියවන්න මම බලාපොරොත්තු වෙනවා. Paragraph 33 of the G20 Bali Leaders' Declaration states, I quote:

> "We are committed to support all vulnerable countries to recover together, recover stronger. We welcome pledges amounting to USD 81.6 billion through the voluntary channelling of Special Drawing Rights (SDRs) or equivalent contributions, and call for further pledges from all willing and able countries to meet the total global ambition of USD 100 billion of voluntary contributions for countries most in need. We welcome the operationalization of the Resilience and Sustainability Trust (RST) to help eligible low-income countries, small states and vulnerable middle-income countries address longer-term structural challenges that post macroeconomic risks, including those stemming from pandemics and climate change."

It further states, I quote:

> "We are concerned about the deteriorating debt situation in some vulnerable middle-income countries. This could be addressed by multilateral coordination that involves all official and private bilateral creditors to take swift action to respond to their requests for debt treatments. We stress the importance for private creditors and other official bilateral creditors to commit to providing debt treatments on terms at least as favourable to ensure fair burden sharing in line with the comparability of treatment principle."

G20 සමුළුවේදීත් අපේ රට කර තිබෙන ඉල්ලීමට සහයෝගය ලබා දීම සඳහා ඒ ගොල්ලන් සැදීපැහැදී ඉන්නවා. අපේ රටේ තිබෙන මේ තත්ත්වය තුළ ඔවුන්ගේ සහයෝගය ලබා ගැනීම අවශ්‍යයි. අපි ඒ සහයෝගය ලබා ගන්නේ මොන ආයතනයකින්ද, කුමන කණ්ඩායමකින්ද කියන එක නොවෙයි වැදගත් වන්නේ.

මේ අය වැය ගැන බොහෝ දෙනෙක් කථා කළා. මේක කෙටි කාලීන වාසි ලබා ගන්න පුළුවන් අය වැයක් හැටියට මම දකින්නේත් නැහැ. මේක මැතිවරණයකට අය වැයක් නොවෙන්න පුළුවන්. ජනප්‍රිය අය වැයක් නොවෙන්න පුළුවන්. හැබැයි, මේක දේශපාලනමය වශයෙන් මැතිවරණයක් ජයග්‍රහණය කිරීමේ බලාපොරොත්තුවෙන් ඉදිරිපත් කරන ලද අය වැයක් නොවෙයි. අද මේ රටේ බහුතරයක් ජනතාවගේ -පවුල් තිස්අට ලක්ෂයක- අවශ්‍යතාව වෙලා තිබෙන්නේ, තමන්ට ජීවත්වීම සඳහා අවශ්‍ය ආහාර ටික ලබා ගැනීමයි. ඔවුන් තමන්ට සහන ලබා ගැනීම සඳහා ඉල්ලීම් කර තිබෙනවා. ඒ නිසා මේ වර්ෂය තුළදීත්, ලබන වර්ෂය තුළදීත් අපේ බලාපොරොත්තුව සහ එකම ප්‍රාර්ථනාව විය යුත්තේ, මේ රටේ ඉන්න බහුතරයක් වූ -සියයට 60ක් පමණ වූ- ජනතාවගේ ජීවිත යථා තත්ත්වයට පත් කිරීමට අවශ්‍ය කටයුතු කිරීමයි. ඒක තමයි වැදගත් වන්නේ. මේ අය වැය තුළින් අපි බලාපොරොත්තු වන්නේත් ඒකයි. ඒ සහනාධාර ලබා දීම සඳහා මෙවර අය වැයෙනුත් විශාල වශයෙන් මුදල් වෙන් කර තිබෙනවා. පසුගිය වර්ෂ කිහිපය තුළ වෙන් කර තිබුණාටත් වඩා මුදලක් ඒ සඳහා වෙන් කර තිබෙනවා. එක පැත්තකින්, අපි සියයට 20ක් පමණ බදු ගහනවා. අනෙක් පැත්තෙන්, මේ රටේ ජීවත් වන මධ්‍යම පාන්තික ජනතාවගෙන් සියයට 75කට, 80කට පමණ ලබා දෙන සහන තුළින් ඔවුන්ට ජීවත් වෙන්න හැකියාව ලැබෙයි කියන බලාපොරොත්තුව ඇතිව සහනාධාර සඳහා මුදල් වෙන් කරනවා.

ඇත්තටම මේ බදු ප්‍රතිපත්තිය වෙනස් කිරීම ඉතා වැදගත් කටයුත්තක් හැටියටයි අපි දකින්නේ. මෙම අය වැය ලේඛනයේ ප්‍රධාන කාරණා තුළ, ඩිජිටල්කරණය පිළිබඳව සඳහන් කර තිබෙනවා. මේ අවස්ථාවේදී විශේෂයෙන්ම අපි ඒ වැඩසටහන ක්‍රියාත්මක කරන්න බලාපොරොත්තු වෙනවා. සෑම වර්ෂයකම අපි රටේ අධ්‍යාපනයට මුදල් වෙන් කර තිබෙනවා. පසුගිය අවුරුදු 74 තුළදීම අපි නිදහස් අධ්‍යාපනය ලබා දෙන්න කටයුතු කර තිබෙනවා. අඩු වැඩි වශයෙන් එය ලබා දීම තුළින් අධ්‍යාපනය අතින් අපේ රට යම්කිසි තත්ත්වයකට පැමිණ තිබෙනවා. අද ආසියානු කලාපය තුළ සාක්ෂරතාව අතින් අපි ඉතා ඉහළ මට්ටමක ඉන්නවා. තරුණ කාන්තා සාක්ෂරතාව සියයට 99ට වඩා වැඩියි. අපේ අධ්‍යාපනයට, සෞඛ්‍යයට මුදල් වෙන් කර තිබෙනවා වාගේම තාක්ෂණය සඳහාත් අපි මුදල් වෙන් කළ යුතුයි. අපි research and development සඳහා මුදල් වෙන් කළ යුතුයි. එය වැදගත් කාරණාවක් හැටියට සලකා ඉදිරියේදී අපි කටයුතු කරන්න ඕනෑය කියන එකත් මේ අවස්ථාවේදී මා මතක් කරනවා.

මගේ අමාත්‍යාංශය යටතේ විශාල වැඩ කොටසක් කිරීමට මම බලාපොරොත්තු වෙනවා. දැනටමත් Personal Data Protection Act එක අනුමත වෙලා තිබෙනවා. අපි බලාපොරොත්තු වෙනවා, ලබන වසරේ සැප්තැම්බර් මාසය වනකොට ඒ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන්න. 2024 වර්ෂය වනකොට සෑම රජයේ ආයතනයකම electronic payments අනිවාර්ය කිරීම ඉතාම වැදගත් වෙනවා. පසුගිය කාලයේදී පාර්ලිමේන්තුවේ අපි සියලුදෙනාම අනුමත කළා, electronic signature එක. නමුත්, අද වනකල් හරියාකාරයෙන් ඒක පාවිච්චි කරන්නේ නැහැ.

එහි අවශ්‍යතාව තිබෙනවා. මොකද, ඒ වෙනුවෙන් අපේ රටට එන්න තිබෙන මුදල් මේ රටින් යන තත්ත්වයක් තිබෙන්නේ. එවැනි වැඩ පිළිවෙළ රාශියක් ඩිජිටල් තාක්ෂණය තුළින් ඉදිරියේදී ක්‍රියාත්මක කරන්න අප බලාපොරොත්තු වෙනවා. ඉන්ධනවලට QR code ක්‍රමය හඳුන්වා දුන්නා වාගේම ප්‍රවාහනය සඳහාත් වෙනම QR code ක්‍රමයක් හඳුන්වා දෙන්න අපි කටයුතු කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ අය වැයේ ප්‍රධාන වශයෙන්ම සඳහන් කරන කාරණාවක් තමයි ආයතන විකිණීම, නැත්නම් රාජ්‍ය ආයතන ප්‍රතිව්‍යුහගත කිරීම. අපිත් පෞද්ගලිකව සමහර අවස්ථාවලදී ඒවාට විරුද්ධ වෙනවා. මේ අවස්ථාවේ හැටියට ශ්‍රීලන්කන් ගුවන් සමාගමට තව මාස තුන හතරක්වත් operations ගෙනියන්න පුළුවන් වෙයිද කියන එක ලොකු ප්‍රශ්නයක්. ඒ නිසා දැන්ම මෙහෙම කළේ නැත්නම් තව ටික කාලයකින් ඒ සඳහා කිසිම ආයෝජකයෙක් එන එකක් නැහැ. නමුත් අපි විශේෂ ඉල්ලීමක් කරනවා, මේ ආයතනය කෑලි කඩලා විකුණන්නේ නැතිව රටට ගැළපෙන ආකාරයේ ආයෝජනයක් කළ යුතුයි කියලා. ඊළඟ, ප්‍රධාන කාරණාව තමයි ටෙලිකොම් ආයතනය විකිණීම. ඇත්තටම මේ ආයතනය විකුණනවා කියන මතයට තවම සියයට සියයක්ම ඇවිල්ලා නැහැ. හැබැයි, මේ ආයතනය ප්‍රතිව්‍යුහගත කිරීමේ අවශ්‍යතාව තිබෙනවා.

අද බොහෝ දෙනෙක් කථා කරනවා, පසුගිය වර්ෂයේ ටෙලිකොම් ආයතනය ලබා ගත්ත ලාභය පිළිබඳව. ඔව්, මේ ආයතනය ලාභයක් ලබා ගත්තා තමයි. නමුත් අපි කරුණු කිහිපයක් සැලකිල්ලට ගන්න ඕනෑ. මේ ආයතනයේ ඉතිහාසය දිහා බැලුවාම, SLT ආයතනය තිබිලා 2000 වර්ෂයේ විතර NTT Communications කියන සමාගමට ලබා දීලා තිබෙනවා. එම ජපන් ආයතනයට ලබා දුන්නාට පස්සේ තමයි අපේ රටේ දුරකථන ටික නොමිලයේ ලබා ගන්න පුළුවන් වුණේ. ඒ වාගේම PEO TV ලබා ගන්න පුළුවන් වුණේ. ඒ කාලය තුළදී හොඳ ආයෝජනයක් කළා. එහෙම ආයෝජන කරලා එම ආයතනය ජාත්‍යන්තර තත්ත්වයට පත් කළා. ටෙලිකොම් ආයතනය, අද පෞද්ගලික ආයතන තිබෙන තත්ත්වයට පත් කළා. 2008දී ඒ NTT Communications කියන සමාගමට සහ රජයට එක කණ්ඩායමක් හැටියට තමයි එහි කොටස් තිබුණේ. මේ ආයතනයේ කොටස් අයිතියෙන් සියයට 45ක් Maxis Communications කියන මැලේසියානු සමාගමටත්, සියයට 49ක් රජයටත් ලබා ගත්තා. අනික් කොටස් open market එකේ තිබෙන්නේ. ඒවා ලබා දීලා පරිපාලනය රජය තියා ගත්තා. එහෙම තියාගත්ත එක සමහර වෙලාවට අපේ වරදක් වෙන්න ඇති. මේ ආයතනය පසු ගිය අවුරුද්දේ ලබාගත් ලාභය ගැන සමහර අය කියනවා. නමුත් ලෝකයේ මේ තාක්ෂණය තිබෙන අනික් රටවල් එක්ක අපි සංසන්දනය කරන්න ඕනෑ. මොකද, තාක්ෂණය කියන එක අවුරුද්දෙන් දෙකෙන් වෙනස් වෙනවා. අපි අවුරුදු පහකට අවශ්‍ය කරන තාක්ෂණය සඳහා ආයෝජනය කරන්නේ නැත්නම් ඒක අලාභ වෙන්න පුළුවන්. අපේ ටෙලිකොම් එක, එහෙම නැත්නම් මොබිටෙල් ආයතනය වාගේ දෙගුණයක් customersලා ඉන්න ඒ ගොල්ලන්ගේ පෞද්ගලික ආයතනයක් අලාභ ලබන්නයි අපේ ආයතනය ලාභ ලබන්නයි හේතුවක් තිබෙනවා. මේ වාගේ කාරණා කිහිපයක් තිබෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු රාජ්‍ය ඇමතිතුමා, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

**ගරු කනක හේරත් මහතා**
(மாண்புமிகு கனக ஹேரத்)
(The Hon. Kanaka Herath)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, තව විනාඩි 3කින් මම අවසන් කරනවා.

අපි බලන්න ඕනෑ පසුගිය වර්ෂය දිහා නොවෙයි. මේ වර්ෂය, ලබන වර්ෂය, ඉදිරි වර්ෂ තුන, එහෙම නැත්නම් වර්ෂ 5ක් වෙනතුරු අපි හරි financial සැලැස්මක් තියා ගන්න ඕනෑ. ඒ සැලැස්ම තුළින් තමයි අපට කියන්න පුළුවන් වෙන්නේ මේකේ ඉදිරියේදී බලාපොරොත්තු වෙන්නේ මොකක්ද කියන එක. අද වෙනකොට SLT ආයතනයේ ණය ප්‍රමාණය බිලියන 36ක් පමණ වෙනවා. ජාත්‍යන්තර වෙනත් ණය නැතිව බිලියන 35ක පමණ ණය තිබෙනවා. ඉතින් මේ ආයතන අපි ඉදිරියට ගෙන යන්නේ කොහොමද? ඉදිරියේදී ආයෝජන අවශ්‍යතාව තිබෙනවා. මොබිටෙල්, එහෙම නැත්නම් telecommunication, නැත්නම් IT ආයතන අපි පවත්වාගෙන යනවා නම්, ඒ සඳහා ලොකු ආයෝජන අවශ්‍යයි. ඒ ආයෝජනය කරන්න අපට හැකියාව තිබෙනවාද කියන එක පිළිබඳව හොයලා බලන්න ඕනෑ. මෙහිදී උපරිම විධියට , එනම් මේ ආයතනයේ සියයට 49ක කොටස් අයිතිය පෞද්ගලිකරණය කරන්න ගියොත් එතැන වැරැද්දක් වෙනවා. විශේෂයෙන් විපක්ෂයේ මන්ත්‍රීවරු බහුතරයක් සඳහන් කළා, ටෙලිකොම් ආයතනය විකුණද්දී එය ආරක්ෂාව අතින් අපේ රටට, රජයට විශාල අභියෝගයක් වෙයි කියලා. මම නැවත වතාවක් සඳහන් කරන්න ඕනෑ, මේ ආයතනය විකිණීම, එහෙම නැත්නම් ප්‍රතිව්‍යුහගත කිරීම පිළිබඳව සියයට සියයක සැලස්මක් දැනට ක්‍රියාත්මක කර නැති බව. ඒ කෙසේ වෙතත්, අපි මේ ආයතනයේ කොටස් විකුණනවා නම්, අපේ ජාතික ආරක්ෂාවට වැදගත් වන අංශ, රජයට වැදගත් වන අංශ, නියාමනය කරන අංශ, නියාමනය - regulate - කරන bodies තියා ගන්න අපට හැකියාව තිබෙනවා. ඊයේ අපේ මන්ත්‍රීවරයෙක් marine fiber cables ටිකත් ලබා දෙන්න වෙනවාය කියලා සඳහන් කළා. එය නම් ජාතික ආරක්ෂාවට ඇත්තටම වැදගත්.

මේ සමාගම යටතේ සමාගම් රාශියක් තිබෙනවා. මේ තුළින් රටට ගැළපෙන, රටට ලාභයක් ගෙන එන ආකාරයෙන් ඉදිරියේදී ලෝකයේ අනික් රටවල ටෙලිකොම් ආයතනත් සමඟ තරගකාරිත්වයක් ඇති කරන්න පුළුවන් ආයෝජනයක් ගෙන ඒම තමයි අපි බලාපොරොත්තු වෙන්නේ. පසුගිය කාලයේ අපේ රටේ අර්බුදකාරී තත්ත්වයක් තිබුණා. අපේ රටේ ආයෝජන

තිබුණේ නැහැයි කියලා තිබෙනවා. ආයෝජකයන් අපේ රටට එන්න බලාගෙන ඉන්නවා නම්, ඒ සඳහා අවස්ථාව ලබා දීමත් වැදගත්. මේ අවස්ථාවේදී, G20 Bali Leaders' Declaration එක මා **සභාගත*** කරනවා.

මට කාලය ලබා දීම පිළිබඳව ඔබතුමාටත් ස්තුතිවන්ත වෙමින් මගේ කථාව අවසන් කරනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

---

* *පුස්තකාලයේ තබා ඇත.*
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
මීළඟට, ගරු මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමා. ඔබතුමාට මිනිත්තු 13ක කාලයක් තිබෙනවා.

Order, please! මෙම අවස්ථාවේදී, කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයෙක් ගරු ආචාර්ය හරිනි අමරසූරිය මෙනෙවියගේ නම මූලාසනය සඳහා යෝජනා කරන්න.

**ගරු එස්. වියාලේන්ද්‍රන් මහතා (වෙළඳ රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு ச. வியாழேந்திரன் - வர்த்தக இராஜாங்க அமைச்சர்)
(The Hon. S. Viyalanderan - State Minister of Trade)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "ගරු හරිනි අමරසූරිය මන්ත්‍රීතුමිය දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

**ගරු ගාමිණී ලොකුගේ මහතා**
(மாண்புமிகு காமினி லொக்குகே)
(The Hon. Gamini Lokuge)

***විසින් ස්ථිර කරන ලදී.***
*ஆமோதித்தார்.*
*Seconded.*

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය මෙනෙවිය මූලාසනාරූඪ විය.***
*அதன்பிறகு, மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு (கலாநிதி) (செல்வி) ஹரினி அமரசூரிய அவர்கள் தலைமை வகித்தார்கள்.*
*Whereupon* THE HON. DEPUTY SPEAKER *left the Chair, and* THE HON. (DR.) (MS.) HARINI AMARASURIYA *took the Chair.*

[අ.භා. 1.07]

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, 2023 අය වැය ලේඛනය පිළිබඳව සාකච්ඡා කරන මේ අවස්ථාවේදී විශේෂයෙන්ම මම මේ කාරණය කියන්න ඕනෑ, ජනාධිපතිතුමා මුදල් ඇමතිවරයා හැටියට අය වැය කථාව කියවනකොට, -හිතා මතාද කියා මම දන්නේ නැහැ- අසත්‍ය කාරණා කිහිපයක්ම කියැවුණා. මට පෙර කථා කළ ගම්පහ දිස්ත්‍රික්කය නියෝජනය කරන, අපිත් එක්ක පළාත් සභාවේ හිටපු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ මන්ත්‍රීතුමා, මේ මහ පොළොවේ තිබෙන යථාර්ථය ගැන ආණ්ඩුව පැත්තෙන් කථා කළා. එතුමා ලොකු අදෝනාවක් කළේ. එතුමා තමන්ගේ හිතේ තිබෙන වේදනාව ගැන කිව්වා. එතුමා ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරයෙක් වුණත්, මේ ආණ්ඩුව පත් කිරීමේදී එතුමන්ලා ජනතාවට දුන්නු බලාපොරොත්තු ඉෂ්ට කර ගන්න බැරුව, එතුමන්ලාගේ පැත්තෙන් අද ජනතාවට කිසිම දෙයක් කර ගන්න බැරුව ඉතාම අසරණභාවයට පත්වෙලා ඉන්නවාය කියන එක එතුමාගේ හෘදය සාක්ෂියට එකඟව ප්‍රකාශ කළ බව අපට පෙනෙනවා. ඇත්තටම එතුමා ආණ්ඩු පක්ෂයේ සිටියත්, මහ පොළොවේ තිබෙන යථාර්ථය දැනගෙන කථා කිරීම ගැන අපි එතුමාට ස්තුතිවන්ත වෙන්න ඕනෑ. මොකද, එතුමා තේරුම් ගෙන තිබෙනවා, මේ රටේ ජනතාවගේ හද ගැස්ම.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ගරු රනිල් වික්‍රමසිංහ ජනාධිපතිතුමා සිය අය වැය කථාව ආරම්භ කරමින් එම පොතේ පළමුවන පිටුවේදීම මෙහෙම කියනවා:

> "පසුගිය කාලය තුළ අප අනුගමනය කළ ක්‍රියාමාර්ග නිසා උද්ධමනය යම් ප්‍රමාණයකින් පාලනය කර ගන්න පුළුවන් වුණා. ඒ වගේම රුපියල ශක්තිමත් වෙමින් පවතිනවා."

එතුමා මෙහෙම කියන්නේ අය වැය කථාව සඳහන් වන පොතේ පළමුවන පිටුවේ 3වන ඡේදයේයි. දැන් මට තිබෙන ප්‍රශ්නය මෙයයි. ඩොලරයේ වටිනාකම මාස ගණනාවක් රුපියල් 369ට තිබුණා. අද වනකොට ඩොලරයේ වටිනාකම රුපියල් 371ක් බවට පත්වෙලා තිබෙනවා. ජනාධිපතිතුමා අය වැය කථාවෙන් කියනවා, රුපියල ශක්තිමත් වෙමින් පවතිනවාය කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, එය ඉතාම අසත්‍ය ප්‍රකාශයක්. මොකද, රුපියල ශක්තිමත් වෙලා නැහැ. ලෝකයේ එන්න-එන්න රුපියල බාල්දු වෙමින් යන තත්ත්වයක් අපට දකින්න තිබෙනවා. විශේෂයෙන්ම පසුගිය මාස 6 තුළ ඇමෙරිකාවේ තිබෙන Federal Reserve එක, එහෙම නැත්නම් ඇමෙරිකානු මධ්‍යම බැංකුව විශාල ලෙස පොලී අනුපාතය වැඩි කළා. ඒ පොලී අනුපාතය වැඩි කිරීම තුළින් ඩොලර් විශාල වශයෙන් ඇමෙරිකාවට ගලාගෙන ගියා. එසේ ගලා යෑමත් එක්ක ලෝකයේ තිබෙන ඉතාමත් ශක්තිමත් මුදල් ඒකක කඩා වැටෙන්න පටන් ගත්තා. යූරෝ එක කඩා වැටුණා, පවුම කඩා වැටුණා, ඉන්දියානු රුපියල කඩා වැටුණා. එහෙම කඩා වැටී තිබියදී, ඒ ශක්තිමත් ආර්ථිකයන් තිබෙන රටවල මුදල් ඒකක පවා ක්ෂය වීමට ලක් වුණා. මා දන්නේ නැහැ, රුපියල ශක්තිමත් වුණාය කියලා ජනාධිපතිතුමා කොහොමද කියන්නේ කියලා. රුපියල ශක්තිමත් වෙලා නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි. අද සිද්ධ වෙලා තිබෙන්නේත්, එදා ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපතිව අජිත් නිවාඩ් කබ්රාල් මහත්මයා රුපියල බලහත්කාරයෙන් රඳවාගෙන සිටියා වාගේ රුපියල තවම රඳවාගෙන තබාගෙන ඉන්න එකයි. එසේ රඳවා තබාගෙන ඉන්න නිසා තමයි, ඩොලරයේ වටිනාකම රුපියල් 371ට තිබෙන්නේ. රුපියල පාවෙන්න හැරියා නම් ඩොලරයේ වටිනාකම රුපියල් 450 දක්වා ඉහළට යනවා. එහෙම පාවෙන්න අරින්න ආණ්ඩුවට විධියක් නැහැ.

එදා අජිත් නිවාඩ් කබ්රාල්ලා ඒ ගෙන ගිය ප්‍රතිපත්තිය නැවත ක්‍රියාත්මක කරගෙන ඉන්නවා. ඇයි ඒ? ඩොලර් නැති නිසා. ඒක තමයි ඇත්ත කථාව. අපේ සංචිතයේ ඩොලර් නැති හින්දා, අපේ රටට ඩොලර් එන්නේ නැති හින්දා, ආණ්ඩුව බලාපොරොත්තු වන ප්‍රමාණයට ඩොලර් ලැබෙන්නේ නැති හින්දා බලහත්කාරයෙන් රුපියල රඳවාගෙන ඉන්නවා. ඒක තමයි ඇත්ත කථාව, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි. එහෙම නැතිව, කිසිම විටෙකත් රුපියල් ශක්තිමත් වෙලා නැහැ. රුපියලේ අගය එන්න එන්න, තවත් ක්ෂය වීගෙන යන තත්ත්වයක් තමයි අපට දකින්න ලැබෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, දැන් අපේ රටට ඩොලර් ඕනෑ කියන එක ගැන අපි දන්නවා. දැන් රටට ඩොලර් එන්න ඕනෑ. ජනාධිපතිතුමාගෙනුත්, ආණ්ඩුවෙනුත් අපි අහනවා, රටේ ජනතාව මේ විධියට අන්දවන්නේ ඇයි කියලා. ඔය ඇන්දවිල්ල තමයි අජිත් නිවාඩ් කබ්රාල් පවා ඇන්දුවේ. අන්දගෙන ගිහිල්ලා අන්තිමට වැඩේ වැරදිලාම ගියා. ඒ නිසා අපි ජනාධිපතිතුමාට කියනවා, ඇත්ත කියන්න, මේ රටට සත්‍යය කියන්න කියලා. මේ දේවල් ජනතාවට වසන් කරන්න එපා.

දැන් අපි IMF එකත් එක්ක සාකච්ඡා පවත්වමින් සිටිනවා. ජනාධිපතිතුමා බලයට ආපු දවසේ ඉඳන් කිව්වේ මොකක්ද? IMF එක සම්බන්ධ කාරණය අගෝස්තු මාසය වෙනකොට හරියනවා

කිව්වා; සැප්තැම්බර් මාසය වෙනකොට හරියනවා කිව්වා. ඊළඟට, කිව්වා දෙසැම්බර් මාසය වෙනකොට හරියනවා කියලා. ඒ වාගේම, Staff-level Agreement එක පිළිබඳ එකඟත්වයකට ආවා කිව්වා. නමුත්, ආණ්ඩුව රටේ ජනතාවට සමහර කරුණු වසන් කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි. ඒ වසන් කරන්නේ මොකක් හින්දා ද? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, IMF එක බලාපොරොත්තු වෙනවා, ණය හිමිකරුවන් එක්ක කථා කරලා සියයට 20ක, සියයට 40ක ණය අඩුවීමක් ලබා ගන්න. IMF එක කියනවා මේ දේ අපට කර ගන්න කියලා. එතකොට චීනය මොකක්ද කියන්නේ? චීනය දැනටමත් කියා තිබෙනවා, "අපි කිසිම ණය අඩු කිරීමක් කරන්නේ නැහැ" කියලා. චීනය කියනවා, "අපි ණය අඩු කරන්නේ නැහැ, ඕනෑ නම් පොලිය අඩු කර දෙන්නම්. එහෙම නැත්නම් ණය ගෙවන්න ඔය ගොල්ලන්ට අපි නැවත ණය දෙන්නම්" කියලා. චීනය ණය අඩු කර ගන්න එකඟ නැත්නම්, චීනය haircut එකකට එකඟ නැත්නම්, ඉන්දියාවයි, ජපානයයි එකඟ වෙන්නේත් නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි. අපි ඒ රටවල් තුනම එක්ක එකඟත්වයකට ආවොත් තමයි ජාත්‍යන්තර මූල්‍ය අරමුදල අපට උදව් කරන්න ලැහැස්ති වෙලා ඉන්නේ. නමුත්, දැන් මේක ආණ්ඩුව කියන්නේ නැහැ. ආණ්ඩුව මේක වහනවා. ණය අඩු කරන්න චීනය කැමැති නැහැයි කියන එක කියන්නේ නැතිව ආණ්ඩුව ඒක හංගනවා. අපි ආණ්ඩුවට, ජනාධිපතිතුමාට කියන්නේ රටේ මහජනතාවට ඇත්ත කියන්න කියලා; ඇත්ත කියලා මේ යථාර්ථය වටහලා දෙන්න කියලා.

අපි ආර්ථික අර්බුදයේ පතුලේම ඉන්න රටක්. එහෙම නම් කවුද අපට උදව් කරන්නේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි? මේ ආණ්ඩුවට IMF එක උදව් කරන්නේ නැත්නම්, යුරෝපය ඇවිල්ලා අපට උදව් කරයි ද, එහෙම නැත්නම් අනෙක් රටවල් උදව් කරයි ද? කවුරුවත් උදව් කරන්නේ නැහැ. ඒ ඇයි? මුළු ලෝකයම දන්නවා, මේ ආණ්ඩුව හින්දා තමයි අපේ රට මේ තරම් ප්‍රපාතයට පත් වුණේ කියලා. මේ රට ප්‍රපාතයට ඇද දාපු, මේ රට විනාශ කරපු, වැරදි ආර්ථික තීන්දු ගත්ත උදවියගේ ආණ්ඩුවට කවුද සල්ලි දෙන්නේ? කවුද උදව් කරන්නේ?

එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සලය කියනවා, ලංකාව ආර්ථික අපරාධ කරපු රටක් කියලා. අපේ රට ආර්ථික අපරාධ කරපු පාලකයෝ ඉන්න රටක් කියලා ඒ ගොල්ලන්ගේ වාර්තාවේ සඳහන් වෙනවා. එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සලය එහෙම ප්‍රකාශයට පත් කරනවා නම්, අනෙකුත් රටවල් ඇවිල්ලා අපට ඩොලර් දේවි ද? එහෙම දෙන්නේ නැහැ. රටේ වංචා, දූෂණ ඉහ වහා ගිහිල්ලා තිබෙනවා. තවම හොරකම් සිදු වෙනවා. මේ අයට හොරකම නවත්වා ගන්න බැහැ. ඒක අපි දන්නවා. ලෝක බැංකුව කිව්වා, "අපි පොහොර ගන්න ඩොලර් මිලියන 10ක් දෙන්නම්" කියලා. හැබැයි, ඔවුන් කිව්වා "අපි නුඹලාගේ අතට සල්ලි දෙන්නේ නැහැ. අපේ අධීක්ෂණය යටතේ, අපේ නිරීක්ෂණ යටතේ, අපි කියන බැංකුවේ LC open කරලා තමයි අපි නුඹලාට සල්ලි දෙන්නේ. ආණ්ඩුවට සල්ලි දෙන්න බැහැ" කියලා. එවැනි තත්ත්වයකට පත් වුණු ආණ්ඩුවක්, මේ. අපේ රට සම්බන්ධයෙන් එවැනි තත්ත්වයක් ලෝකයේ තිබෙන්නේ. එවැනි තත්ත්වයක් තිබියදී ජනාධිපතිතුමා ඇවිල්ලා නැවත අපිව අන්දන්න, රටේ ජනතාව අන්දන්න, එහෙම නැත්නම්, පොහොට්ටුවේ ඉන්න මන්ත්‍රීවරු ටික වුන් කරන්න "ඩොලර් එක ශක්තිමත් වෙලා තිබෙනවා" කියනවා. ඊළඟට එතුමා කියනවා, අපේ රටේ ආර්ථික වර්ධනය ලබන වසර තුළ සියයට 7කට, 8කට ගෙන එන්න බලාපොරොත්තු වෙනවා කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ලෝක බැංකු වාර්තාවට අනුව අපි ඉන්නේ සියයට සෘණ 9ක ආර්ථිකයකයි. ලබන වසර තුළ සියයට 7ක, 8ක ආර්ථික වර්ධනයකට කොහොම යන්න ද? හිතන්නවත් පුළුවන් ද? චීනයේ ආර්ථික වර්ධනයත් දැන් සියයට 4යි. මම දන්නා තරමින් ඉන්දියාවේ විතරයි සියයට 7ක ආර්ථික වර්ධන වේගයක් තිබෙන්නේ. චීනයේ තිබෙන්නේත් සියයට 4ක ආර්ථික වර්ධන වේගයක්. සියයට 7ක, 8ක ආර්ථික වර්ධනයක් ගැන අපට හිතන්නවත් පුළුවන්ද? මෙහෙම බොරු සංඛ්‍යාලේඛන ඉදිරිපත් කරලා මේ රට රාජපක්ෂලා ඇන්දුවා වාගේ නැවත අන්දවන්නයි මේ හදන්නේ. ඒ නිසා අපි ජනාධිපතිතුමාට කියනවා, බොරු කියන්න එපා, සත්‍යය ප්‍රකාශ කරන්න කියලා. මේ රටේ ජනතාවට ඇත්ත කියලා කටයුතු කරගෙන යන්න. එහෙම නැත්නම් මේ ගමන යන්න බැහැ.

ඊළඟට අය වැය කථාවේදී ජනාධිපතිතුමා කියනවා, කැප කිරීම් කරන්න කියලා. අය වැය කථාවේ 5වැනි පිටුවේ 3.10 ඡේදය යටතේ එතුමා කියා තිබෙනවා, කැප කිරීම් කරන්න සියලු දෙනාම සූදානම් වෙන්න ඕනෑ, අපි කැප කිරීම් කරනවා කියලා. ජනාධිපතිතුමා කරපු කැප කිරීම මොකක්ද? ජනාධිපතිතුමා කරපු කැප කිරීමක් නැහැ. ජනාධිපතිතුමා හිතුමතේට උපදේශකයෝ පත් කරනවා; ලේකම්වරු පත් කරනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මාලදිවයිනේ කථානායකතුමා වන මොහොමඩ් නෂීඩ් මැතිතුමා තනතුරු දෙකකට පත් කළා.

එතුමා කාලගුණය සහ පරිසරය පිළිබඳ උපදේශකවරයා හැටියට එක තනතුරකට පත් කළා. මොහොමඩ් නෂීඩ් කථානායකවරයා පසුගිය දිනවල ජනාධිපතිතුමා එක්ක ඊජිප්තුවට ගියා. කවුද, ඒ සඳහා මුදල් ගෙව්වේ? ජනාධිපතිතුමා ඊජිප්තුවට යන අතරේ, තෙල් නැවක් ඇවිල්ලා ඩොලර් ගෙවා ගන්න බැරිව වරායේ නැංගුරම් දාගෙන ඉන්නවා, මාසයකට වැඩියි. කෝටි 200කට වැඩිය ගෙවන්න ඕනෑ ඒකට ප්‍රමාද ගාස්තු. ජනාධිපතිතුමා නෂීඩ් මහත්මයාව අරගෙන ඊජිප්තුවට ගියා. ඒ, කාගේ සල්ලිවලින්ද? මාලදිවයිනේ පාර්ලිමේන්තුවේ සන්නිවේදන මාධ්‍ය අධ්‍යක්ෂ හසන් සියා කියනවා, "නෂීඩ් මහත්මයාට ඊජිප්තුවට යන්න අපි නම් මුදල් වියදම් කළේ නැහැ" කියලා. එහෙම නම් කවුද මුදල් වියදම් කළේ? අපි ඩොලර් නැතිව ඉන්න මේ වෙලාවේ, තෙල් නැව් ගෙනැල්ලා වරායේ නවත්වා ගෙන ඉන්න වෙලාවේ ජනාධිපතිතුමා අපට කැප කිරීම් කරන්න කියලා, නෂීඩ් මහත්තයාත් එක්ක ඊජිප්තුවට යනවා. අපට කියනවා කැපකිරීම් කරන්න කියලා. මිනිසුන්ට කන්න නැහැ. තමන්ගේ ළමයාට පෝෂ්‍යදායී ආහාර වේලක් දෙන්න විධියක් නැහැ. ළමයා ඉස්කෝලේ ගිහිල්ලා දවල්ට ගෙදර ආවාම බිත්තරයක් හදලා දෙන්න බැහැ, අද වෙනකොට බිත්තරයක මිල රුපියල් 54යි. එහෙම රටක අපි අද ජීවත් වෙන්නේ.

අද මිනිස්සු දරිද්‍රතාවෙන් පෙළෙනවා. අද රටේ දරුවන්ගේ මන්දපෝෂණය එන්න එන්න වැඩි වෙනවා, දරිද්‍රතාව වැඩි වෙනවා. අපේ ක්‍රය ශක්තිය අඩු වෙනවා. පෝෂ්‍යදායී ආහාර වේලක් ජනතාවට ලබා දෙන්න බැරිව මිනිස්සු අතරමං වෙලා ඉන්න තත්ත්වයක් රටේ පවතිද්දී ආණ්ඩුව අපට කියනවා "කැප කිරීම් කරන්න" කියලා. ජනාධිපතිතුමා අද වෙනකොට කැබිනට් ඇමතිවරු 20දෙනකු -ජනාධිපතිතුමාගේ ඇමති ධුරයත් සමඟ- පත් කර තිබෙනවා. රාජ්‍ය ඇමතිවරු 38දෙනකු පත් කර තිබෙනවා. හෙට අනිද්දා අය වැයට පක්ෂව ඡන්දය දෙන අය වෙනුවෙන් තව ඇමති ධුර 10ක් දෙන්න යනවාය කියනවා. ආණ්ඩුව කිසිදු ආකාරයේ කැප කිරීමක් කරන්නේ නැතිව අපට කියනවා "කැප කිරීම් කරන්න" කියලා. අපි මොනවා කැප කරන්නද? මේ රටේ ජනතාවගේ වැරැද්දෙන්ද මේ විනාශය සිදු වුණේ? මේ රටේ ජනතාවද මේකට වන්දිය ගෙවන්න ඕනෑ? ඒ වෙනුවෙන් වන්දි ගෙවන්න ඕනෑ මේ රටේ ජනතාව නොවෙයි. හොර තක්කඩි පාලකයන් විසින් ගත්ත වැරදි තීන්දු නිසා තමයි මේ රට ප්‍රපාතයට වැටුණේ. හරි නම් ජනාධිපතිතුමා කොමිසමක් පත් කරලා මේ ආර්ථික ව්‍යසනය ඇති කරපු අයට විරුද්ධව ක්‍රියා කරන්න ඕනෑ. හොරකම් කරපු මුදල් ටික අය කර ගන්න එතුමා වැඩ කරන්න ඕනෑ.

[ගරු මුජිබුර් රහුමාන් මහතා]

අපි දන්නවා, නැනෝ පොහොර ගෙන්වද්දී ඒකෙන් ගැහුවා; චීනයෙන් ආපු අනෙකුත් පොහොරවලින්; ඩොලර් මිලියන 6.6ක පොහොර තොගයෙන් ගැහුවා. ඊළඟට, Pandora Papers පිළිබඳ කාරණය හෙළිදරව් වුණා. මේ රටේ කරපු හැම වංචාවක්ම එළියට ආවා. ඒ එළියට ආවේ මේ රටේ ජනතාවගේ මුදල් හොරකම් කරපු ඒවා පිළිබඳ විස්තර. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ජනාධිපතිතුමා හරි විධියට නම් කරන්න ඕනෑ, ඒ හොරකම් කරපු මුදල් ටික නැවත අය කර ගන්න වැඩ පිළිවෙළක් මේ අය වැය හරහා ඉදිරිපත් කරන එකයි. නමුත්, එවැනි යෝජනා ඉදිරිපත් කර නැහැ. ඒවා ඉදිරිපත් කරන්නේ නැතිව එතුමා ගාමිණී වියන්ගොඩ මහත්මයා කියා තිබෙන කාරණයක් ගැන කියනවා.

**ගරු (වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ரமேஷ் பதிரண)
(The Hon. (Dr.) Ramesh Pathirana)
Hon. Presiding Member, I rise to a point of Order.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
කියන්න, ගරු අමාත්‍යතුමා.

**ගරු (වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ரமேஷ் பதிரண)
(The Hon. (Dr.) Ramesh Pathirana)
ගරු මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමනි, මාලදිවයිනේ කථානායකතුමාගේ සංචාරයට රජයේ මුදල් වියදම් කරලා නැති බව මුදල් අමාත්‍යාංශය දැනුම් දෙනවා. ඔබතුමාට ඒ ගැන දැනුවත් කරන්නයි මෙය කියන්නේ.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
ඔබතුමා එහෙම කිව්වාට, මාලදිවයිනේ පාර්ලිමේන්තුවෙනුත් කියා තිබෙනවා, "අපේ සල්ලිවලින් නම් ගියේ නැහැ" කියලා. එහෙම නම් ඒ කාගේ සල්ලිද? ඔබතුමා කියන්න, කාගේ සල්ලිද කියලා.

**ගරු (වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ரமேஷ் பதிரண)
(The Hon. (Dr.) Ramesh Pathirana)
එතුමාගේ පෞද්ගලික මුදල්වලින්.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
කාගෙද, නෂීඩ් මහත්මයාගේද?

**ගරු (වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ரமேஷ் பதிரண)
(The Hon. (Dr.) Ramesh Pathirana)
ඔව්.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
නෂීඩ් මහත්මයාට මාර කැක්කුමක් නේ තිබෙන්නේ අපේ රටේ පරිසරය ගැන. ඒ කියන්නේ, එතුමා පෞද්ගලිකව ඩොලර් වියදම් කරගෙන ගිහිල්ලා, අපේ රටේ පරිසරය ගැන- *[බාධා කිරීමක්]* එහේ නඩු දාලා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තවත් විනාඩි දෙකක කාලයක් පමණයි තිබෙන්නේ.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මන්ත්‍රීතුමනි, මට තව පොඩි වේලාවක් වැඩි කර දෙන්න පුළුවන්ද?

**ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)
තව විනාඩි කිහිපයක් දෙන්නම්.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
හොඳයි.

මාලදිවයිනේ රජය මොහොමඩ් නෂීඩ් මහත්මයාට විරුද්ධව නඩු දාලා තිබෙනවා. එතුමා ගියේ කොහොමද කියලා විමර්ශනය කරනවා. මොකද, එතුමාගේ තනතුරේ හැටියට එතුමාට තවත් රටක තනතුරක් දරන්න බැහැ කියන කාරණය එරට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේම සඳහන් වෙලා තිබෙනවා. එය අද ලොකු විවාදයකට පත් වෙලා තිබෙනවා. අපි දන්නේ නැහැ, මොහොමඩ් නෂීඩ් මහත්මයා තමන්ගේ ඩොලර් වියදම් කරගෙන අපේ රට වෙනුවෙන් මේ තරම් කැක්කුමකින් ගියේ ඇයි කියලා. ගරු ඇමතිතුමනි, අපි නම් ඒ ගැන දන්නේ නැහැ. ඔබතුමා ඒ ගැන ටිකක් හොයා බලා පුළුවන් නම් අපටත් කියන්න.

**ගරු (වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ரமேஷ் பதிரண)
(The Hon. (Dr.) Ramesh Pathirana)
ලංකාවට ආදරෙයි. ඒකයි.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
ලංකාවට ආදරෙයි නම් බොහොම හොඳයි. ලංකාවට ආදරෙයි නම්, පුළුවන් නම්-*[බාධා කිරීමක්]*

**ගරු (වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ரமேஷ் பதிரண)
(The Hon. (Dr.) Ramesh Pathirana)
එතුමා ලංකාවට ගොඩාක් ආදරෙයි.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
බොහොම හොඳයි. බොහොම හොඳයි. එහෙම ආදරය කරන අය ඔක්කෝම ළං කර ගන්න. එහෙම ආදරය කරන අය බලයට ගෙනැල්ලා තමයි මේ දේත් සිද්ධ වුණේ. ඒකත් අපි මතක තියා ගන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඊළඟට මම විශේෂයෙන් "නීතිය" ගැන කියන්න ඕනෑ. අපි නීතිය ගැන කථා කරනවා. අපි මේ රටේ ආයෝජකයෝ ගෙන්වන්න ඕනෑ නම් මේ රටේ නීතියේ ආධිපත්‍යය තිබෙන්න ඕනෑ. එහෙම වුණොත් තමයි අපිට ආයෝජකයෝ එන්නේ. අද වනවිට නීතියේ ආධිපත්‍යය බිඳ වැටී තිබෙන බව පෙනෙනවා.

පොලීසිය දේශපාලනීකරණය කරලා තිබෙනවා. ආණ්ඩුවට අවශ්‍ය විධියට වැඩ කරන පොලීසියක් අද තිබෙන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, නීතිපති දෙපාර්තමේන්තුව තිබෙන නමුත් නීතියේ ආධිපත්‍යය නැත්නම් මේ රටට ආයෝජකයන් එන්නේ කොහොමද? මොකක්ද මේ රට ගැන තිබෙන විශ්වාසය? අපට පෙනෙනවා අද නීතියේ ආධිපත්‍යය කඩා වැටී තිබෙන බව. එයට හොඳම උදාහරණය මා කියන්නම්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි.

මේ පාර්ලිමේන්තුවේ මන්ත්‍රීතුමියකට විරුද්ධව 2020.11.02 දින ඕෂල ලක්මාල් හේරත් මහත්මයා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත පැමිණිල්ලක් කරනවා, එතුමිය විදේශීය පුරවැසියෙක් කියලා. ඒ පැමිණිල්ලට අදාළව පරීක්ෂණ ආරම්භ කරනවා, අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව. ඊට පසුව එතුමන්ලා අලුත්කඩේ උසාවියේ පැමිණිල්ලක් ගොනු කරනවා. 2021 මාර්තු 9වන දා කරුණු වාර්තා කරනවා. ඒ කරුණු අනුව කියනවා, එම මන්ත්‍රීතුමිය මේ රටේ පුරවැසියෙකු නොව, විදේශීය පුරවැසියෙකු බව. ඊළඟට තව කාරණාවක් කියනවා, එතුමිය විදේශීය පුරවැසියෙකු හැටියට ඉඳගෙන ලංකාවේ පාස්පෝර්ට් එක ගන්න අයදුම් කර තිබෙනවා කියලා. ව්‍යාජ ලිපි ලේඛන හැදුවා කියන චෝදනාවත් එතුමියට එල්ල වෙලා තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, එතුමිය අරගෙන තිබෙන visa එක සම්බන්ධයෙන් ආගමන හා විගමන දෙපාර්තමේන්තුව ලියවිල්ලක් ඉදිරිපත් කර තිබෙනවා, අපරාධ විමර්ශන කොට්ඨාසයට. ඒ ලියවිල්ල තුළ කියනවා, 2014.07.16 වැනි දා ලංකාවට ඇවිල්ලා තිබෙන බව සහ එසේ ඇවිල්ලා Residence Visa අරගෙන තිබෙන බව. ඒ Residence Visa එක අවසන් වන්නේ 2015.07.16වන දා. මෙන්න මේක තමයි එම වාර්තාව. මේ වාර්තාව මම **සභාගත*** කරනවා.

ආණ්ඩුව මේ වාර්තාව පැහැදිලිව යටපත් කර තිබෙනවා. විමර්ශන කටයුතු කරපු නිලධාරින් දෙදෙනා - එක්කෙනෙක්, අධ්‍යක්ෂ නිශාන් සොයිසා මහත්මයා. ඊළඟ කෙනා, සී.අයි. සුගත් අමරසිංහ මහත්මයා - transfer කර තිබෙනවා. ඇයි ඒ? මේ නඩුව විමර්ශනය කළා කියලා. කවුද transfer කරන්නේ? මහින්ද රාජපක්ෂ මැතිතුමා අගමැති වෙලා ඉන්නකොට, 2020 දී. ඒ දෙදෙනාව දැන් වෙනත් තැන්වලට දාලා තිබෙනවා. ඇයි ඒ? එම මන්ත්‍රීතුමියගේ පුරවැසිභාවය පිළිබඳ පැමිණිල්ල පිළිබඳව පරීක්ෂණ කරලා උසාවියට කරුණු වාර්තා කළා කියලා ඒ ගොල්ලන් transfer කර තිබෙනවා. මෙහෙමයි නීතිය ක්‍රියාත්මක වෙන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මේකට නීතිපති දෙපාර්තමේන්තුවේ උපදෙස් ඕනෑ නැහැ. සාමාන්‍ය පුද්ගලයෙකු වුණා නම් මේ චෝදනාව යටතේ අද ඔහුව අත් අඩංගුවට අරගෙන. මොකද, ව්‍යාජ ලිපි ලේඛන ඉදිරිපත් කරලා ගුවන් ගමන් බලපත්‍රයක් අරගෙන තිබෙනවා. ඊළඟට, විදේශිකයෙකු හැටියට ඉඳගෙන ලංකාවේ පාර්ලිමේන්තුව නියෝජනය කරන්න ඇවිල්ලා තිබෙනවා. වෙනත් පුද්ගලයෙකු -සාමාන්‍ය පුද්ගලයෙකු- මෙය කළා නම් අද වන කොට ඔහුව අත් අඩංගුවට අරගෙන ඉවරයි. නමුත්, එතුමිය දේශපාලනය කරන හින්දා, ආණ්ඩුවට සහයෝගය ලබා දෙන හින්දා, ආණ්ඩුව අද අපරාධ විමර්ශන කොට්ඨාසයට බලපෑම් කරලා, නීතිපති දෙපාර්තමේන්තුවට බලපෑම් කරලා මේ නඩුව විභාගයට ගන්න දෙන්නේ නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි. ඉතින්, එහෙම රටකට ආයෝජකයන් එයි ද? ඒකයි අපට තිබෙන ගැටලුව. ජනාධිපතිතුමා මෙතැනට ඇවිල්ලා සුරංගනා කථා කියනවා.

---

** පුස්තකාලයේ තබා ඇත.*

* நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.

* *Placed in the Library.*

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, හරි නම් මොකක්ද වෙන්න ඕනෑ. වෙන්න ඕනෑ එක දෙයයි. ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ detention centre එකක් තිබෙනවා, මිරිහානේ. ඒ මන්ත්‍රීතුමියව ඒකට යවලා, මේ රටින් පිටමං කරන්න ඕනෑ. මොකද එතුමිය විදේශිකයෙක්. එතුමියව මේ රටේ තබාගන්න බැහැ. ඒකයි වෙන්න ඕනෑ දේ. ඒ වෙන්න ඕනෑ දේ වෙන්න දෙන්නේ නැතුව දේශපාලන බලය උඩ අද මේ කාරණය යටපත් කරලා තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි. ඒ හින්දා අපි ආණ්ඩුවට කියනවා, ආර්ථික ස්ථාවරභාවය හදන්න නම් දේශපාලන ස්ථාවරභාවය හදලා ඉන්න කියලා. මොකද, දේශපාලන ස්ථාවරභාවය හදන්න බැරුව ආර්ථික ස්ථාවරභාවය හදන්න බැහැ. අද දේශපාලන ස්ථාවරභාවයක් නැහැ. ආණ්ඩුවේ මන්ත්‍රීවරු 43දෙනෙක් විපක්ෂයේ වාඩි වෙලා ඉන්නවා. අද ආණ්ඩුව කැලිවලට කැඩිලා තිබෙනවා. පක්ෂයකට ලැබුණු එකම ආසනයෙන් පාර්ලිමේන්තුවට ආපු මන්ත්‍රීවරයෙක් අද රටේ ජනාධිපති වෙලා ඉන්නවා. ඒ හින්දා දේශපාලන ස්ථාවරත්වයක් නැහැ. එහෙම නම් අපි ජනාධිපතිතුමාට යෝජනා කරනවා, ආණ්ඩුවට යෝජනා කරනවා, සිහින ලෝක හදන්නේ නැතුව මේ මහ පොළොවේ යථාර්ථය තේරුම් අරගෙන පෙබරවාරි මාසය අවසාන වනකොට පාර්ලිමේන්තුව විසුරුවා ඡන්දයකට යා යුතුයි කියලා. එම යෝජනාව කරමින්, මගේ කථාව අවසන් කරනවා.

ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු ගාමිණී ලොකුගේ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 14ක් තිබෙනවා.

[අ.භා. 1.25]

**ගරු ගාමිණී ලොකුගේ මහතා**
(மாண்புமிகு காமினி லொக்குகே)
(The Hon. Gamini Lokuge)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අපේ මිත්‍ර ගරු මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමාගේ කථාවෙන් පසුව මට කථා කරන්න ලැබීම ගැන මම සතුටු වෙනවා. මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමා තවම රටේ යථාර්ථය අවබෝධ කර නොගෙනයි කථා කරන්නේ.

අද මේ රටේ තිබෙන ප්‍රශ්නය එතුමා කියපු කාරණය නොවෙයි. අද මේ රටේ විශාල අර්බුද කීපයක් තිබෙනවා. අද මේ රටේ ආර්ථිකය පිළිබඳව අර්බුදයක් තිබෙනවා; විදේශ විනිමය පිළිබඳව අර්බුදයක් තිබෙනවා. තවත් විවිධ අර්බුද තිබෙනවා. අද මේ පාර්ලිමේන්තුව තුළ අප කථා කරන්නේ අපේ පක්ෂ දේශපාලනය ගැනවත්, අපේ පක්ෂයේ ප්‍රතිපත්තිය ගැනවත් නොවෙයි. අප පත් කරලා එවපු ජනතාව මේ ආර්ථික අර්බුදයෙන් ගොඩ අරගෙන මේ රට යථා තත්ත්වයට ගෙන යන්නේ කොහොමද කියන එක ගැනයි අප කථා කරන්නේ. ඒක තමයි අපට තිබෙන පළමුවැනි පරමාර්ථය. චෝදනා කරනවා නම් ඕනෑතරම් චෝදනා කරන්න අපටත් පුළුවන්.

ගෝඨාභය රාජපක්ෂ හිටපු ජනාධිපතිතුමා විපක්ෂ නායකතුමාට අඬ ගැහුවා, අග්‍රාමාත්‍යකම භාරගන්න කියලා. එතුමා ඒක භාර ගත්තේ නැහැ. එහෙම වුණා නම්, සමහර විට එතුමා ජනාධිපති වෙන්න තිබුණා. ඊට පස්සේ එතුමා ලියනවා, "මම කැමැතියි අගමැතිකම භාරගන්න" කියලා. එතකොට අගමැතිවරයෙකු පත් කරලා. ආසයි, බයයි දෙකම තියාගෙන වැඩ කරන්න පුළුවන්කමක් නැහැ. තමුන්නාන්සේලා කියන දේ කරන්න තිබුණා එදා සජිත් ප්‍රේමදාස මැතිතුමා අගමැතිකම භාරගත්තා නම්. එහෙම නම් සමහර විට එතුමා මේ රටේ

[ගරු ගාමිණී ලොකුගේ මහතා]

ජනාධිපති වෙන්නත් ඉඩ තිබුණා. නමුත්, අද අපට කරන්න තිබෙන්නේ මේවා ගැන තර්ක කරන එක නොවෙයි. අද මේ රට විශාල ආර්ථික අර්බුදයකට පත් වෙලා තිබෙනවා. ලංකා ඉතිහාසයේ තිබෙන ප්‍රධානම අර්බුදයටයි අප අද මුහුණ දී තිබෙන්නේ.

මම මේ පාර්ලිමේන්තුවට ආවේ 1983 දී. එදා ඉඳලා ඉදිරිපත් කරපු හැම අය වැය ලේඛනයකටම අදාළ විවාදවලට මම සහභාගි වෙලා තිබෙනවා. නමුත් මීට පෙර මේ වාගේ අර්බුදකාරී තත්ත්වයකට අපේ රට පත් වෙලා නැහැ. එහෙම නම් අපට යුතුකමක් තිබෙනවා, අප පත් කරලා එවපු ජනතාවගේ ප්‍රශ්නවලට විසඳුමක් දෙන වැඩ පිළිවෙළක් සකස් කරන්න. ඒ නිසා තමයි හිටපු අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මැතිතුමා මේ රටේ ජනාධිපතිවරයා වුණාට පසුව මුදල් අමාත්‍යවරයා හැටියට මේ අය වැය ලේඛනය ඉදිරිපත් කළේ.

මේ අය වැය ලේඛනය සහන අය වැය ලේඛනයක් නොවෙයි. අපි මීට ප්‍රථමයෙන් ඉදිරිපත් කළ හැම අය වැය ලේඛනයක් මඟින්ම විවිධ සහනාධාර දුන්නා. මේ අය වැයෙනුත් සහන ටිකක් දීලා තිබෙනවා. නමුත් අද රාජ්‍ය සේවයේ, අර්ධ රාජ්‍ය සේවයේ වැඩ කරන පන්තිය ඉතා අසීරු තත්ත්වයකට පත් වෙලා ඉන්නවා. අපි රජයට යෝජනා කළා, මේ ආර්ථික අමාරුකම් නිසා පුළුවන් නම් ඒ ගොල්ලන්ට යම්කිසි දීමනාවක් දෙන්න කියලා. නමුත්, මේ තිබෙන ආර්ථික පරිහානියත් එක්ක ඒක කරන්න බැරි තත්ත්වයකුයි ඇති වෙලා තිබෙන්නේ. ඒ හින්දා තමයි අප උත්සාහ කරන්නේ, මේ ආර්ථිකය යම්කිසි මට්ටමකට ශක්තිමත් කරලා මේ රටේ සියලු ජනතාවට යම්කිසි සහනයක් ලබා දෙන්න. අද මේ රට ඉතා අමාරු තත්ත්වයක තිබෙන්නේ. මේ රට දියුණු කරන්න නම්, මේ ආර්ථික අර්බුදයෙන් ගැලවෙන්න නම් විදේශ විනිමය ලැබෙන යම්කිසි වැඩ පිළිවෙළකට යන්න අපි කල්පනා කරන්න ඕනෑ.

අපි හැම විටම හැම වැඩකටම පාහේ විරුද්ධ වුණා. ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාට අපි දොස් කියන්නේ නැහැ. එතුමා ගත්තු ණය නොවෙයි අපි මේ ගෙවන්නේ. එතුමාගේ ආණ්ඩුවට ප්‍රථමයෙන් පැවැති ආණ්ඩු ගත්තු ණය තමයි මේ ගෙවන්නේ. එතුමාට සිද්ධ වුණා, ඒ ණය අර්බුදයට මුහුණ දෙන්න. එතුමා ගත් යම් යම් තීන්දු නිසාද යම් යම් අපහසුකම් ඇති වුණා. එදා මේ රටට විවිධ ව්‍යාපෘති සඳහා ආයෝජකයන් එන්න සූදානම් වුණා. නමුත්, ආයෝජකයන් එන්නත් ප්‍රථමයෙන් විරුද්ධ වුණා. ලක්දනවි බලාගාරයට අදාළව සියයට 45ක කොටස් අරගෙන ඇමෙරිකානු සමාගමක් එන්න හැදුවා. ඒකට අපේ ආණ්ඩුවේ කැබිනට් මණ්ඩලයේ හිටපු අයත් විරුද්ධ වුණා; රට විරුද්ධ වුණා. උසාවියටත් ගියා. ඒ නිසා ඒක ක්‍රියාත්මක කරන්න බැරි වුණා. එය ක්‍රියාත්මක කළා නම් අද liquefied natural gas කොළඹට ගෙනැල්ලා විදුලිය නිපදවා පිරිවැය සියයට 75කින්, 80කින් අඩු කරගන්න තිබුණා. නමුත් ඒ කටයුතු අසාර්ථක වුණා.

ඊළඟට, අපි solar power projects ගෙනෙන්න unsolicited proposals කැඳෙව්වා. ඒ අනුව unsolicited proposals 300ක්, 400ක් පමණ ආවා. නමුත්, තවම ඒ එක්කෙනෙකුට හෝ එය පටන්ගන්න ඉඩ දෙන්න පුළුවන්කමක් ලැබුණේ නැහැ. විවිධ ආයතනවල bottlenecks හේතුවෙන් ඒ අය ඇවිල්ලා රස්තියාදු වෙවී ඉන්නවා. ඒ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ අවස්ථාව දෙන්න තවම පුළුවන්කමක් ලැබුණේ නැහැ. අද අපේ රට මේ අර්බුදවලින් ගොඩ ගන්න නම්, අප සියලුදෙනා එකතු වෙලා මේ රටේ ආර්ථිකය ශක්තිමත් කරන්න පුළුවන් වැඩ පිළිවෙළකට යන්න ඕනෑ. ඒකට පාර්ලිමේන්තුව පමණක් නොවෙයි, මේ රටේ රාජ්‍ය ආයතන, රාජ්‍ය නිලධාරින් ඇතුළු සියලුදෙනා එක පෙළකට සිටගන්න ඕනෑ.

සංචාරක ව්‍යාපාරය වැඩි දියුණු කරනවා නම්, ඒක ඉතා හොඳ කටයුත්තක් වෙනවා. එය ලංකාවට හොඳ ආදායමක් ලැබිච්ච ව්‍යාපාරයක්. මෙවර අය වැය තුළින් සමුද්‍රීය කලාපවල සංවර්ධන කටයුතුවලටත් මුදල් වෙන් කර තිබෙනවා. සංචාරකයකු මාලදිවයිනට ගිහිල්ලා මාලදිවයිනේ හෝටලයක කාමරයක් ගත්තොත්, මුහුදේ snorkeling, flyboarding, whale watching වැනි විවිධ ක්‍රීඩාවලට සහභාගි වෙන්න ඒ කාමරයට ගෙවනවාට වඩා වැඩි මුදලක් ඔහු වියදම් කරනවා. ලංකාවේ whale watchingවලටත් සංචාරකයෝ එනවා. අපි එය වැඩි දියුණු කරන්න ඕනෑ.

ළඟට ගිහිල්ලා blue whalesලා බලන්න පුළුවන් රටකට ආසියාවේ තිබෙන්නේ ලංකාව තමයි. නමුත් තවම ඒවාට ඕනෑ කරන පහසුකම් සකස් වෙලා නැහැ, දියුණු වෙලා නැහැ. ඒවා දියුණු වෙනවා නම්, සංචාරක ව්‍යාපාරයෙන් අපි බලාපොරොත්තු වනවාට වඩා වැඩි ආදායමක් ලබා ගන්න අපට පුළුවන්. හැබැයි ඉතින් රටේ පරිසරයත් ඒකට ගැළපෙන්න හැදෙන්න ඕනෑ. හැමදාම සත්‍යග්‍රහ, වැඩ වර්ජන, විරෝධතා පැවැත්වෙනවා නම්, මේ රටට සංචාරකයන් එන්නේ නැහැ. නමුත් අපි සන්තෝෂ වෙන්න ඕනෑ, දැන් සෝවියට් දේශයෙන් සතියකට සමාගම් දෙකකින් ගුවන් යානා දෙකක් අපේ රටට එනවා. තවත් සමාගම් ගණනාවක ගුවන් යානා එනවා. එම ගුවන් යානාවලින් එන සංචාරකයන්ට කරදරයක් නැතුව මේ රටේ සංචාරය කරලා යන්න පුළුවන්කම ලැබෙනවා නම්, සංචාරක කර්මාන්තයෙන් අපට හොඳ ආදායමක් ලබා ගන්න පුළුවන්. එදා අපේ මුහුද බලන්න පමණයි සංචාරකයන් ආවේ. අද මුහුද බලන්න පමණක් නොවෙයි, සංස්කෘතික ත්‍රිකෝණය බලන්න, විවිධ ස්ථාන බලන්න සංචාරකයන් එනවා. මොකද, ලංකාවට සංචාරකයෙක් ආවාම දවස් හතකදී ඕනෑ නම් wildlife බලන්න ගිහිල්ලා එන්න පුළුවන්; කඳුකරයට ගිහිල්ලා එන්න පුළුවන්; සංස්කෘතික ත්‍රිකෝණය බලන්න ගිහිල්ලා එන්න පුළුවන්. ඒ සියල්ලම දවස් හතකින් බලන්න පුළුවන්. ඉන්දියාවට ගියොත් එහෙම දවස් දාහතරකින්-පහළොවකින්වත් ඒ ටික කරන්න පුළුවන්කමක් ලැබෙන්නේ නැහැ. ඒ නිසා, ශ්‍රී ලංකාව සංචාරකයන්ට හොඳ ගමනාන්තයක් බවට පත් වෙලා තිබෙනවා. ඒ තත්ත්වය තුළ අපට ඉහළ පෙළේ සංචාරකයන් ගෙන්වා ගන්න පුළුවන්කම තිබෙනවා. අපේ ප්‍රධාන හෝටල්වල standard එක ලෝකයේ හෝටල්වලට සමාන මට්ටමක තිබෙනවා. ඒ පහසුකම් තිබෙනවා. එක සංචාරක සමාගමක කෙනෙක් මට කිව්වා, "ලංකාව තමයි සංචාරකයන්ට තිබෙන හොඳම රට" කියලා. ඉන්දියාවට සංචාරකයෙක් ගියාම සේවකයෙක් හිනා වෙන්නේත් ඩොලර් එකක් දුන්නාම කියලා කිව්වා. ලංකාවේ එහෙම නොවෙයි කිව්වා. පැමිණෙන හැම කෙනෙකුම හිනාවෙන් පිළිගන්නා රටක් තිබෙනවා නම්, ඒ ලංකාව කිව්වා. ඒ නිසා ලංකාව සංචාරකයන්ට හොඳ ගමනාන්තයක්.

සංචාරක ව්‍යාපාරය ගැන වාගේම, ආයෝජන ගැනත් මම කියන්න ඕනෑ. අදානි සමාගම එනවාය කිව්වාම අපේ සමහර අය විරුද්ධත්වය ප්‍රකාශ කළා. අදානි සමාගමත් ආයෝජකයෙක්. මන්නාරමේ මෙගාවොට් පන්සියයක බලාගාරයක් ඉදිකරන්න එනවාය කිව්වාම, ඒ සමාගම එන්න ඉස්සර වෙලා විරුද්ධ වුණා. අදානි තියා, දෙවියන් වහන්සේ ආවත් මේ රටේ Central Environmental Authority එකේ අවසරය අරගෙන, අනෙකුත් අවසරයන් අරගෙන තමයි ඒ කටයුතු කරන්න ඕනෑ. මෙගාවොට් දාහක-දෙදාහක-තුන්දාහක විතර ඒ ආයෝජනය ලැබුණා නම්, තෙල් ටික පාවිච්චි නොකර විදුලිය නිෂ්පාදනය කර ගන්න අපට පුළුවන්කම ලැබෙනවා. ඒකට තමයි සැලසුම් කළේ. අපේ තිබෙන දේශගුණයත්, අපේ තිබෙන පරිසරයත් එක්ක අපි දේශපාලන භේදයකින් තොරව රට නගා සිටුවීමට උදව් කරන්න ඕනෑ. රට නගා සිටුවීමට උදව් නොකළොත්, ඉස්සරහටත් මේ තත්ත්වයට

තමයි අප සියලුදෙනාටම මුහුණ දෙන්න සිදු වන්නේ. ඒ නිසා අපි හැමෝම පාඩමක් ඉගෙන ගන්න ඕනෑ. පසුගිය කාලයේ තෙල් ටික ගෙනෙන්න අපේ ළඟ සල්ලි තිබුණේ නැහැ. ගෑස් ටික ගෙනෙන්න සල්ලි තිබුණේ නැහැ. National Fuel Pass App එක හැදුවාට පසුව මේ තත්ත්වය යන්තම් පාලනය කරලා, පෝලිමක් නැතුව තෙල් ටික දෙන්න පුළුවන්කම ලැබී තිබෙනවා. තවමත් අපට හරියාකාරව තෙල් ගෙනෙන්න බැහැ. නමුත් රටේ මහජනයාට අවහිරයක් නැතුව දැන් තෙල් සපයන්න පුළුවන් වෙලා තිබෙනවා. පෝලිමක් නැතුව ගෑස් ටික දෙන්න පුළුවන්කම ලැබී තිබෙනවා.

කෘෂිකර්මය ගැන කථා කරනවා නම්, අද බොහොම අමාරුවෙන් යූරියා ටික, පොහොර ටික ගෙන්වනවා. මේ මහ කන්නයේ දැන් සෑහෙන ප්‍රමාණයක් වපුරලා තිබෙනවා. ඒ එක්කම ගොවියාට පොඩි වාසියකුත් ඇති වෙලා තිබෙනවා. එදා රුපියල් හතළිහට-පනහට තිබුණු වී කිලෝ එක අද රුපියල් එකසිය විස්සට විකුණන්න පුළුවන් වෙලා තිබෙනවා. අද අපේ රටේ හැම අපනයන භෝගයකම වාගේ මිල වැඩි වෙලා තිබෙනවා. රුපියල් හාරසිය පනහට-පන්සියයට තිබුණු රබර් මිල රුපියල් හයසියයට-හත්සියයට ගිහිල්ලා තිබෙනවා. රුපියල් අසූපහට-අනූවට තිබුණු තේ කිලෝව දැන් රුපියල් දෙසිය හැත්තෑපහට-දෙසිය අසූවට ගිහිල්ලා තිබෙනවා. අස්වැන්න අඩු වුණත් ආදායම වැඩි වෙලා තිබෙනවා. ගම්මිරිස්, කුරුඳු මිල වැඩි වෙලා තිබෙනවා; වවන ප්‍රමාණය වැඩි වෙලා තිබෙනවා. එදා කහ ආනයනය නවත්වපු නිසා අද ලංකාව කහවලින් ස්වයංපෝෂිත වෙලා තිබෙනවා. ඒ වාගේ හුඟක් ද්‍රව්‍යවලින් අද රට ස්වයංපෝෂිත වෙලා තිබෙනවා. මේ තිබෙන වැඩ පිළිවෙළත් එක්ක අත් වැල් බැඳගෙන ගියොත්, මේ අවස්ථාව තමයි අපේ රට ස්වයංපෝෂිත කර ගන්න, අපේ රටේ ආර්ථිකය ශක්තිමත් කර ගන්න පුළුවන් අවස්ථාව. රටේ මහ ජනයාට අමාරුකම් නැහැ කියලා අපි කියන්නේ නැහැ. අමාරුකම් තිබෙනවා. සමහර පවුල්වලට මේ දවස්වල තුන්වේල කාලා ඉන්න අමාරු තත්ත්වයක් තිබෙනවා.

ඒ අයට සහන දෙන්න අපි තීරණය කර තිබෙනවා. සමෘද්ධිලාභීන්ට විවිධ සහනාධාර දෙන්න අපි මුදල් වෙන් කරලා තිබෙනවා. හැබැයි, ඒක මදි. ආර්ථිකය ශක්තිමත් කර, ඒ මුදල වැඩි කරන්නයි අපි බලන්නේ. මේ රටේ හැම කෙනෙකුටම තුන් වේල කාලා යහපත් ජීවිතයක් ගත කරන්න පුළුවන් රටක් හදන වැඩ පිළිවෙළකටයි අපි මේ යන්නේ. අපි ජනතා විමුක්ති පෙරමුණ වාගේ ඡන්දයක් ඉල්ලන්නේ නැහැ. ජනතා විමුක්ති පෙරමුණත් එක්ක ඡන්ද කරලා අපට හොඳට හුරුයි. 1989 මැතිවරණයේදී පළමුවෙන්ම ඡන්දය දීපු මිනිහාව ඝාතනය කරනවා කිව්වා, ඒ වාගේම ඝාතනය කළා. ඡන්දය දමන්න යන්න එපා කිව්වා. මේ රටේ පළාත් සභා මන්ත්‍රීවරු 30ක්, 40ක් ඝාතනය කළා. වැල්ලෙතොට හාමුදුරුවෝ, කොළොන්නාවේ හාමුදුරුවෝ වැනි හාමුදුරුවරු ඝාතනය කළා. ඊට අමතරව ලංකාවේ තේ කම්හල් සිය ගණනකට ගිනි තිබ්බා. බස් ගිනි තිබ්බා. ඒවා ගේන්නත් මේ රටේ මුදල් තමයි වැය වුණේ. අද ජනතා විමුක්ති පෙරමුණේ මන්ත්‍රීවරුන් කථා කරන්නේ හරියට බෝධිසත්වයින් වාගෙයි. ඡන්දයක් තියන්න කියනවා. ඕනෑම අවස්ථාවක කියන්නේ, "මහජන මුදල් තමයි ඔය වියදම් වෙන්නේ" කියලායි. මහජන මුදල් තමයි හැම දෙයකටම වියදම් වෙන්නේ. ඒ කාලයේ ජනතා විමුක්ති පෙරමුණේ හිටපු සමහර මන්ත්‍රීවරුන්ගේ අතේ ඇඟිලි නැහැ. හැබැයි, ඒ රෙදි කපන්න ගිහිල්ලා නොවෙයි. මහජනයා ඝාතනය කරන්න බෝම්බ ගහන්න ගිහිල්ලා. එහෙම අය දැන් මැතිවරණයක් ඉල්ලනවා. මැතිවරණයක් පැවැත්වීම ගැන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ තිබෙනවා. ජනතා විමුක්ති පෙරමුණට පුළුවන් පාර්ලිමේන්තුවට යෝජනාවක් ඉදිරිපත් කරලා එය සම්මත කරගෙන මැතිවරණයකට යන්න. අවුරුදු දෙකහමාරකට පසුව ජනාධිපතිතුමාට කැමැති නම් මැතිවරණයකට යන්න පුළුවන්. එහෙම නැත්නම් තව දිගටම ඉන්නත් පුළුවන්. නමුත්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ තිබෙනවා, අවුරුදු 5ක කාල සීමාවක්. මහජනයා මේ පාර්ලිමේන්තුව පත් කළේ අවුරුදු පහකට. ඒ අවුරුදු පහ අවසන් වෙනතුරු මේ පාර්ලිමේන්තුව පැවත්වේවි. නියම කාලයට මැතිවරණයක් පවත්වාවි. මැතිවරණයක් පැවැත්වූවාම ඡන්ද දායකයෝ තීන්දු කරාවි කවුද පත් කරන්නේ කියලා. ඒක ගැන කිසිම ප්‍රශ්නයක් නැහැ. නමුත් අද අපට තිබෙන ප්‍රශ්නය වන්නේ, ඒ කාලය තුළ මේ රට පාලනය කරනකොට ජනතාවගේ ප්‍රශ්නවලට විසඳුම් සෙවීමයි. ඒකට තමයි රනිල් වික්‍රමසිංහ ජනාධිපතිතුමා මේ අය වැය ඉදිරිපත් කළේ. අපි එතුමාව පත් කළේ ඒ බලාපොරොත්තුවෙන්. ඒ නිසා, එතුමා ඉදිරිපත් කරපු මේ අය වැය ලේඛනය තුළින් රටේ අනාගතය ශක්තිමත් කරන්න අපි කටයුතු කරනවා කියමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු උදය ගම්මන්පිල මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් තිබෙනවා.

[අ.භා. 1.38]

**ගරු උදය ගම්මන්පිල මහතා**
(மாண்புமிகு உதய கம்மன்பில)
(The Hon. Udaya Gammanpila)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ජනාධිපතිතුමා කෙතරම් බුදු බණ අසා තිබුණත්, එතුමාගේ කථාව පුරාවට දහම් කරුණු සඳහන් වුවත්, එතුමා ඇසිය යුතුම බණ පදය මෙතෙක් අසා නැහැ කියන එක තමයි මේ අය වැය දෙස බලද්දී පෙනී යන්නේ. බුද්දක නිකායේ ඉතිවුත්තක පාලියේ ලෝකාවබෝධ සූත්‍රයේ බුදුරජාණන් වහන්සේගේ විශේෂ ලක්ෂණයක් සඳහන් වෙනවා. ඒ තමයි "යථාවාදී තථාකාරී - යථාකාරී තථාවාදී" ගුණය; කියන දේ කරන, කරන දේ කියන ගුණය. අවාසනාවට, අපේ මහ බැංකු අධිපතිතුමාටත්, ජනාධිපතිතුමාටත්, මෙන්න මේ "කියන දේ කරන, කරන දේ කියන" ගුණය නැහැ කියන එකයි අපි පසු ගිය කාලයේ නිරීක්ෂණය කළේ.

මුලින්ම අපි මහ බැංකු අධිපතිතුමා ගැන කථා කරමු. මහ බැංකු අධිපති නන්දලාල් වීරසිංහ මහත්මයා එම තනතුර භාර ගනිමින් කිව්වේ, තමන්ගේ පූර්වගාමීන් දැවැන්ත ලෙස මුදල් අච්චු ගැසීම නිසා රටේ උද්ධමනය ඇති වෙලා, ආර්ථික අර්බුදය තීව්‍ර වෙලා තිබෙනවා කියලායි. එහෙම කියපු එතුමා තමයි මේ වන විට ඉතිහාසයේ වැඩිම මුදල් ප්‍රමාණයක් අච්චු ගහපු මහ බැංකු අධිපතිවරයා බවට පත් වෙලා තිබෙන්නේ. මේ කථාවේ ඇත්ත නැත්ත අපි ඉලක්කම් එක්ක අවබෝධ කර ගනිමු. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මහාචාර්ය ඩබ්ලිව්.ඩී. ලක්ෂ්මන් මහත්මයා මහ බැංකු අධිපති ධුරයේ සිටියදී 2020 මාර්තු 13 සිට 2021 සැප්තැම්බර් 14 දක්වා තිබෙන දින 551 තුළ රුපියල් බිලියන 1,260ක භාණ්ඩාගාර බිල්පත් නිකුත් කර තිබෙනවා. ජනතාවට තේරෙන භාෂාවෙන් කිව්වොත්, දවසකට රුපියල් බිලියන 2.18 බැගින් මුදල් අච්චු ගහලා තිබෙනවා. ඊළඟට, මහ බැංකු අධිපතිතුමා වශයෙන් පත් වුණා, අජිත් නිවාඩ් කබ්රාල් මැතිතුමා. එතුමා 2021 සැප්තැම්බර් 15 වැනිදා සිට 2022 අප්‍රේල් 5 වැනිදා දක්වා දින 203ක කාලය තුළ රුපියල් බිලියන 446ක නව භාණ්ඩාගාර බිල්පත් නිකුත් කර තිබෙනවා. ඒ කියන්නේ, එතුමාත් දිනකට රුපියල් බිලියන 2.2 ගණනින් මුදල් අච්චු ගහලා තිබෙනවා. ඔන්න, ලක්ෂ්මන් මහත්මයාගේ වාර්තාව කබ්රාල් මහත්මයා දශම ගණනක් වැඩියෙන් කරලා බිඳ හෙළනවා.

[ගරු උදය ගම්මන්පිල මහතා]

ඊට පස්සේ මහ බැංකුවට පත් වෙනවා, මුදල් අච්චු ගැහීමේ ආදීනව ගැන මාධ්‍ය පුරා අපට වැදි බණ දෙසූ නන්දලාල් වීරසිංහ මහත්මයා. 2022 අප්‍රේල් 06වෙනි දා සිට සැප්තැම්බර් 30වෙනි දා දක්වා වූ දින 175ක කාලය තුළ එතුමා රුපියල් බිලියන 590ක නව භාණ්ඩාගාර බිල්පත් නිකුත් කර තිබෙනවා. ඒ කියන්නේ, එතුමාගේ කාලය තුළ දිනකට රුපියල් බිලියන 3.37ක මුදල් අච්චු ගහලා තිබෙනවා. කබ්රාල් යුගයේ වාර්තාව නන්දලාල් වීරසිංහ මහ බැංකු අධිපති බිඳ හෙළන්නේ කබ්රාල් යුගයට වඩා දෛනික මුදල් අච්චු ගැසීම සියයට 55කින් ඉහළ දැමීමෙන්. එය එසේ මෙසේ ප්‍රතිශතයක් නොවෙයි. කබ්රාල්, ලක්ෂ්මන් යුගවලදී නම් අපි ඩොලර් බිලියන ගණනින් ණය ගෙව්වා. ණය ගෙවන්න ඩොලර් මිලදී ගන්න ආණ්ඩුවට රුපියල් අවශ්‍ය නිසා රුපියල් අච්චු ගහන්න සිදු වුණා. ණය ගෙවීමත් නතර වෙලා තිබෙන මේ යුගයේ මොකටද මේ රුපියල් අච්චු ගැහුවේ කියන එක හැමෝටම ප්‍රශ්නයක්. ආණ්ඩුවේ ආදායම ඇදගෙන වැටුණත් වැටුප් ගෙවන්න ඕනෑ, විශ්‍රාම වැටුප් ගෙවන්න ඕනෑ, සමෘද්ධිය වැනි සහනාධාර කොහොමත් ගෙවන්න ඕනෑ. ආණ්ඩුවට සල්ලි නැත්නම් මුදල් අච්චු ගහලා හරි මේ වියදම් දරන්න සිද්ධ වෙනවා. ඒක තිත්ත ඇත්තක්. හැබැයි, මේ අය වැය දිහා බැලුවාම පේන්නේ ආණ්ඩුව හැසිරෙන්නේ භාරලක්ෂය ඇදිච්ච මුදලාලි වාගේ කියලායි. මොකද, ලෝස් නැතිව වියදම් කරන අය වැයක් තමයි මේ හදලා තිබෙන්නේ.

ලංකාවේ තිබෙන ආර්ථික අර්බුදයට එක් ප්‍රධානතම හේතුවක් තමයි, දැවැන්ත රාජ්‍ය අංශයක් නඩත්තු කිරීම. මේ ගැන ජනාධිපතිතුමා එතුමාගේ කථාවලදී මේ පාර්ලිමේන්තුවට වරින් වර කිව්වා. එහෙම කිව්ව ජනාධිපතිතුමා මේ අය වැය තුළින් නව ආයතන 11ක් හඳුන්වා දී තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මම මේ ආයතන 11 ගැන ගණන් හැදුවේ ජනාධිපති කොමිෂන් සභා, ජනාධිපති පත් කරන කමිටු, ජනාධිපති කාර්ය සාධක බලකා, තිබෙන ආයතන ඒකාබද්ධ කරලා අලුතෙන් හදන ආයතන කියන සියල්ල බැහැර කරලා. එහෙම කළත් නව ආයතන 11ක් හැදෙනවා. මම ඒ ටික නම් කරන්නම්.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙන්නේ.

**ගරු උදය ගම්මන්පිල මහතා**
(மாண்புமிகு உதய கம்மன்பில)
(The Hon. Udaya Gammanpila)
එහෙම නම් මම මේ ආයතන ටිකේ නම් නොකියා ඉන්නම්. අය වැය කථාවෙන් ඒ ටික බලාගන්න කියලා මම ඉදිරියට යනවා. මොකද, මට තව කාරණා ගණනාවක් කියන්න තිබෙනවා.

අලුත් ආයතන 11ක් එනවා කියන්නේ අධ්‍යක්ෂවරු, වාහන සහ කාර්ය මණ්ඩලවලට අලුතෙන් වියදම් කරන්න වෙනවා කියන එක නේ. මේ අය වැයේ කියනවා, විශ්වවිද්‍යාල උපාධි සඳහා තත්ත්ව සහතික හා ප්‍රතීතන මණ්ඩලය කියලා අලුත් ආයතනයක් ඇති කරනවා කියලා. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙන් ඕක කර ගන්න බැරිද? ඒ වාගේම ක්ෂුද්‍ර මූල්‍ය හා ණය නියාමන අධිකාරියේ රාජකාරිය මහ බැංකුවෙන් කර ගන්න බැරිද? ඇයි, මේ අලුත් ආයතන හදන්නේ?

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මට මේ කාරණයත් කියන්න පොඩි වෙලාවක් දෙන්න. අය වැය හිඟය රුපියල් බිලියන 2,400යි කිව්වාම හැමෝම හිතන්නේ රුපියල් බිලියන 2,400ක් තමයි ණය ගන්නේ කියලා. ඒක එහෙම නොවෙයි. ඔතැන ණය ආපසු ගෙවීම් නැහැ. අය වැය පොතේ දෙවෙනි ඇමුණුමේ දක්වා තිබෙනවා, ණය ආපසු ගෙවීම් එකතු කළාම අපේ ණය ගැනීමේ අවශ්‍යතාව රුපියල් බිලියන 4,979ක් කියලා; රුපියල් ට්‍රිලියන 5ක්. සමස්ත ණය රුපියල් ට්‍රිලියන 25යි. 2023 වර්ෂයට විතරක් ණය ගන්නවා, රුපියල් ට්‍රිලියන 5ක්. ඒ කියන්නේ, සමස්ත ණය ට්‍රිලියන 5කින් ඉහළ යනවා. මේ ණය දෙන්න කවුරුවත් ඉදිරිපත් වෙන්නේ නැහැ. ඇයි? රට බංකොලොත්. බංකොලොත් රටකට කවුරුවත් ණය දෙන්නේ නැහැ. මේ ට්‍රිලියන 5ක බර දරන්න වෙන්නේත් මහ බැංකුවට. තවත් ට්‍රිලියන 5ක් මුදල් අච්චු ගහලා කබ්රාල් මහත්තයාගේ වාර්තාව නන්දලාල් මහත්මයා කඩනවා, මේ වසරේදී. ඒ අනුව 2023දී රුපියල් ට්‍රිලියන 5ක් අච්චු ගහලා නන්දලාල් මහත්මයාගේ වාර්තාව බිඳින්නයි මේ අය උත්සාහ කරන්නේ.

මම ඉතා වේගයෙන් කියන්නම්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි වෙලාව නැති නිසා. මත් කුඩුවලට ඇබ්බැහි වුණු කෙනකු ඒකේ වේදනාව කෙතරම් දැනගෙන හිටියත්, ආදීනව දැනගෙන හිටියත්, ඒ කෙනාට මතු කුඩු භාවිතය අත්හරින්න බැහැ. ඒකට අපි කියනවා, ඇබ්බැහිවීම - addiction - කියලා. ඒ විධියටම දැන් අපේ මහ බැංකු අධිපතිතුමා මුදල් අච්චු ගහන්න ඇබ්බැහි වෙලා ඉවරයි. ආදීනව ගැන කෙතරම් කථා කළත්, කෙතරම් දැනගෙන හිටියත්, එතුමාට ඒක නවත්වන්න බැහැ. අපේ ආණ්ඩුව ණය ගන්න එකට ඇබ්බැහි වෙලා ඉවරයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඒ නිසා මහ බැංකු අධිපතිතුමාත්, මේ ආණ්ඩුවත් කන්දකාඩු පුනරුත්ථාපන මධ්‍යස්ථානයට යවලා මේ ඇබ්බැහිවීම්වලින් පුනරුත්ථාපනය කළ යුතුයි කියලා යෝජනා කරමින්, මම නිහඬ වෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු චමල් රාජපක්ෂ මැතිතුමා. ඔබතුමාට විනාඩි 11ක කාලයක් තිබෙනවා.

[අ.භා. 1.45]

**ගරු චමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சமல் ராஜபக்ஷ)
(The Hon. Chamal Rajapaksa)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ලංකාවේ පමණක් නොවෙයි, ඇමෙරිකාව වාගේ රටවල ආර්ථිකයත් අද විශාල අර්බුදයකට මුහුණ දී සිටින බව අපි දන්නවා. එම නිසා අද වනකොට බොහෝ දෙනෙකුගේ රැකියා පවා අහිමිවන තත්ත්වයක් ඇති වෙලා තිබෙනවා. කොරෝනා වසංගතයත්, රටවල් අතර තිබෙන යුද්ධයත් ලෝකයේ තිබෙන හැම රටකම ආර්ථිකයට බලපා තිබෙනවා. අපේ රටත් ඒවාට මුහුණ පා තිබෙනවා. මා හිතන්නේ ලෝකයේ රටවල් අතුරින් ශ්‍රී ලංකාවට තමයි ඉස්සෙල්ලාම ඒ අර්බුදවලට මුහුණ පාන්න සිදු වුණේ. ඒ නිසා අපි මේ අර්බුදවලින් දැන් ගොඩ එන්න ඕනෑ. අපි මේ අර්බුදවලින් ගොඩ එන්න නම්, අපේ නිෂ්පාදනය වැඩි කර ගන්න වෙනවා. විශේෂ අවධානයක් යොමු කරලා, අපනයනයත් වැඩි කර ගන්න ඕනෑ. ඒ සඳහා ස්ථිර වැඩ පිළිවෙළක් ඇති කරන්න ඕනෑ.

මුදල් ඇමතිතුමා ඉදිරිපත් කරපු අය වැය කථාවේ කෘෂි කර්මාන්තය ගැන හුඟක් කරුණු සඳහන් කරලා තිබෙනවා. කෘෂිකර්ම විෂයය සම්බන්ධයෙන් ඇමතිවරයෙක්, කැබිනට් නොවන ඇමතිවරයෙක් හා නියෝජ්‍ය ඇමතිවරයෙක් හැටියටත් මා හිටපු නිසා කෘෂි කර්මාන්තය පිළිබඳව පමණක් මගේ

අවධානය යොමු කරනවා. අය වැය කථාවේ සඳහන් වනවා, තාරුණ්‍යය කෘෂිකර්මයෙන් ඈත් වන බව. ඒක සත්‍යයක්. ඒ නිසා අපි ඒ තරුණයන් කෘෂිකර්මයට ආකර්ෂණය කර ගන්න, ඔවුන් දිරිමත් කරන්න අවශ්‍ය වැඩ කටයුතු සම්පාදනය කරන්න ඕනෑ. නමුත් ඒ වැඩ කටයුතු සම්පාදනය කළත්, ඒවා දීර්ඝ කාලීනව පවත්වා ගෙන යන්න කිසි කෙනෙක් කටයුතු කරන්නේ නැහැ. ඇමතිවරු මාරු වුණාමත් ඒ කටයුතු නිසි ලෙස කෙරෙන්නේ නැහැ. ඒ වාගේම ආණ්ඩු මාරු වුණාමත් ඒ කටයුතු කෙරෙන්නේ නැහැ.

2006දී මා කෘෂිකර්ම සංවර්ධන කැබිනට් නොවන අමාත්‍යවරයා හැටියට හිටපු කාලයේ මේ කාරණය අවබෝධ කරගෙන බටඅත ගොවිපොළ ආරම්භ කළා. ඒ ගොවිපොළ තිබෙන්නේ හම්බන්තොට දිස්ත්‍රික්කයේ. 1989 වර්ෂයේ මා පාර්ලිමේන්තුවට එනකොට එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව ගොවිපොළවල් රාශියක් විකුණන්න දාලා තිබුණා. ඒ වෙලාවේ කෘෂිකර්ම ඇමතිවරයා හැටියට හිටියේ ධර්මදාස බණ්ඩා මැතිතුමා. එතුමා එක්ක මා මේ කාරණය සම්බන්ධයෙන් කථා කරලා, ඒ යෝජනාව ඉවත් කර ගත්තා. අපි බලයට ආවාට පස්සේ තරුණයන් කෘෂි කර්මාන්තයෙන් ඈත් නොකර තබා ගැනීමට පුළුවන් වන විධියට බටඅත ගොවිපොළ ප්‍රතිසංවිධානය කළා. ඒ ගොවිපොළ කෘෂි තාක්ෂණ හා සංචාරක උද්‍යානයක් බවට පත් කළා. පාසල් දරුවන්ට වාගේම ජාත්‍යන්තර පාසල්වලට යන දරුවන්ට නිවාඩු කාලවලදී මේ ගොවිපොළට -මේ උද්‍යානයට- ඇවිල්ලා, කෘෂි කර්මාන්තය පිළිබඳව හදාරලා, ඒ අය කෘෂි කර්මාන්තයට යොදා ගන්න අවශ්‍ය වැඩ පිළිවෙළ හැදුවා. දැන් ඒ කටයුතු සාර්ථකව පවත්වා ගෙන යනවා. අද කෘෂිකර්ම දෙපාර්තමේන්තුව හැම තැනම හදා ගෙන යන හෙළ බොජුන්හල් ආරම්භ කළේ බටඅත ගොවිපොළෙන්. අද ඒ බොජුන්හල් ජනප්‍රිය වෙලා තිබෙනවා. දැන් හැම තැනකම ඒ බොජුන්හල් හැදෙනවා.

තාක්ෂණය යොදා ගැනීම ගැනත් මා කියන්න කැමැතියි. තරුණයන් කෘෂි කර්මාන්තයට නැඹුරු කර ගන්න ඕනෑ නම් ඔවුන්ට තාක්ෂණය ලබා දිය යුතුයි. ඒ වාගේම ඔවුන්ට කෘෂි කර්මාන්තය කෙරෙහි අභිමානයක් ඇති කරන්න ඕනෑ. ඒ වාගේම සංචාරක ක්ෂේත්‍රයත්, කෘෂිකර්මයට බද්ධ කර ගත්තොත් අපට වැඩි ආදායමක් සොයන්න පුළුවන්. පර්යේෂණ කරන අයට මේ ස්ථානයේම නැවතිලා පර්යේෂණ කටයුතුවල යෙදෙන්නත් අවස්ථාව සලසන්න අප කටයුතු කළා. මහාචාර්ය ඩබ්ලිව්.ඩී. ලක්ෂ්මන් මැතිතුමා තමයි එදා කොළඹ විශ්වවිද්‍යාලයේ උපකුලපතිතුමා හැටියට හිටියේ. ඒ කාලයේ කොළඹ විශ්වවිද්‍යාලයත් සම්බන්ධ කර ගෙන හම්බන්තොට දිස්ත්‍රික්කයේ වැලිගත්ත කියන ප්‍රදේශයේ විශාල භූමි ප්‍රමාණයක ලුණුගම්වෙහෙර ව්‍යාපාරය යටතේ විශාල නගරයක් හදන්න වෙන් කර තිබුණු ගොඩනැඟිලි ආදිය ජල හිඟය නිසා ප්‍රයෝජනයට අරගෙන තිබුණේ නැහැ. එදා වාරිමාර්ග ඇමතිතුමා හැටියට හිටපු අනුරුද්ධ රත්වත්තේ මැතිතුමා එක්කත් කථා කරලා මේ ස්ථානය කොළඹ විශ්වවිද්‍යාලයට දුන්නා. අද මේ ස්ථානය කෘෂි තාක්ෂණික හා ග්‍රාමීය විද්‍යායතනය නමින් කොළඹ විශ්වවිද්‍යාලයෙන් පාලනය වෙනවා. කොළඹ විශ්වවිද්‍යාලයෙන් එහි ඉගෙනුම ලබන ශිෂ්‍යයන්ට උපාධියක් ලබා දෙනවා. ඒ උපාධිය තුළින් තරුණයන්ට අභිමානයක් ඇති වෙනවා. ඒ වාගේම නව තාක්ෂණයට අනුව තරුණයා කෘෂි කර්මාන්තයේ යෙදෙනවා. ඒ අනුව, තරුණයන් කෘෂි කර්මාන්තයට එකතු කර ගෙන අපට ඒ ප්‍රශ්න විසඳා ගන්න පුළුවන්. ඒ වාගේම රටට අවශ්‍ය ආහාර භෝග ටික වගා කර ගැනීමේ හැකියාවත් ලැබෙනවා. නමුත්, මේ සඳහා වැඩි අවධානයක් යොමු වුණේ නැහැ. එහෙත් මෙවර අය වැයෙන් මේ කාරණා පිළිබඳව අවධානය යොමු කර තිබීම ගැන අපි සතුටු වෙනවා.

වැලිගත්ත ග්‍රාමීය විද්‍යායතනයේ පුහුණු වන ගොවීන් කොළඹ විශ්වවිද්‍යාලයේ උපාධිය ලබා ගත්තා. මම එක් වතාවක් යාපනයට ගිය අවස්ථාවේ එම විද්‍යායතනයට ඇවිල්ලා අදාළ පාඨමාලා හදාරලා උපාධිය ලබා ගත් ගොවි මහත්වරු තුන් හතරදෙනෙක් එක්ක කථා කළා. එවැනි අය අපේ දිස්ත්‍රික්කයේත් ඉන්නවා; විවිධ තැන්වලත් ඉන්නවා. සාමාන්‍යයෙන් අවුරුද්දකට 200දෙනෙක්, 250දෙනෙක් විතර ඇවිල්ලා ඒ පහසුකම ලබා ගන්නවා. ඒ තත්ත්වය අපි දියුණු කරන්නට ඕනෑ.

මෙවර අය වැයේ 12 වැනි ඡේදයේ කෘෂි අපනයනය සඳහා ඉඩම් දීම පිළිබඳව සඳහන් වෙනවා. අද බොහෝ අය ඇවිල්ලා වගා කරන්න ඉඩම් ඉල්ලනවා. එහෙම නැත්නම්, විවිධ කර්මාන්ත සඳහා ඉඩම් ඉල්ලනවා. මම මහවැලි ඇමතිවරයා හැටියට හිටපු කාලයේ මහවැලිය යටතේ කන්දකාඩුව, රඹකැන්ඔය, මාදුරුඔය වාගේ ප්‍රදේශවල ඉඩම් මහා පරිමාණයෙන් ආයෝජනය කළ හැකි අයට ලබා දුන්නා. රටට අවශ්‍ය ආහාර ටික නිෂ්පාදනයට, ආහාර බෝග වගාව, ඒ වාගේම බඩ ඉරිඟු වාගේ දේවල් මහා පරිමාණයෙන් වගා කිරීම සඳහා ඉඩම් ලබා දුන්නා. ඒ වාගේම ඒ අයට අපනයනය සඳහා පහසුකම් ලබා දෙන්නත් කටයුතු කළා. තාක්ෂණය ගෙනැල්ලා ඒ අය ඒවා වැඩිදියුණු කරන්න කටයුතු කළත්, ඒ ප්‍රදේශවල සිටින යම් යම් දේශපාලනඥයන්, ඒ වාගේම ඒ ප්‍රදේශවල හිටපු සමහර භික්ෂූන් වහන්සේලා ජනතාව උසිගන්වලා, ආයෝජනය කරන්න ආපු අයට ඒවා කරන්න ඉඩ දුන්නේ නැහැ. එහෙම නම් අපි ආයෝජනය කරන අයට ඒ සඳහා අවස්ථාව සලසා දෙන්න ඕනෑ, ඒ අයගේ ආරක්ෂාව සලසන්න ඕනෑ, නීති රීති හැදෙන්න ඕනෑ.

අපි 1935 ඉඳලා රජයේ ඉඩම් බෙදාගෙන, බෙදාගෙන ගිහිල්ලා තිබෙනවා. නමුත්, දැන් ඒ ඉඩම් කුඩා කැබලිවලට කැඩිලා තිබෙනවා. අක්කරයක් දුන්නා නම්, ඒ අක්කරය හත් අට දෙනෙකුට බෙදිලා. දැන් එම ඉඩම්වලින් නිෂ්පාදනයක් කෙරෙන්නේ නැහැ. එම නිසා මිරිස්, කංකුං වාගේ දේවල් පවා අද පිට රටින් ගේනවා. එහෙම නම් අපි මහා පරිමාණයෙන් වගා නොකළොත් මේ ප්‍රශ්නය විසඳන්න බැරි වෙනවා වාගේම, ආහාර සුරක්ෂිතතාවක් ඇති කර ගන්නත් අපට බැරි වෙනවා. එම නිසා විශේෂයෙන්ම අපි මාදුරුඔය තරුණයන්ට ඊශ්‍රායලයේ තිබෙන kibbutz ක්‍රමය අනුව වගා කිරීමේ අයිතිය ලබා දීලා, ඒ අයට අවශ්‍ය යටිතල පහසුකම් සපයලා, මහවැලි අධිකාරිය යටතේ රටට අවශ්‍ය වගාවන් කරන්න සැලසුම් කරලා තිබුණා. දැන් ඒක ක්‍රියාත්මක වෙන්නේ නැහැ. කටුපොල් වගාව මැලේසියාවේත් ක්‍රියාත්මක වුණා. තරුණයන්ට වගා අයිතිය දීලා කටයුතු කිරීමෙන් ඒක සාර්ථක වුණා.

ඉඩම් ප්‍රතිපත්තිය යටතේ අපට සිදු වුණු අඩු පාඩුකම් ගැනත් සොයා බලන්නට ඕනෑ. රජයේ ඉඩම් බෙහැර කිරීමේදී සිදු වුණු අපහසුතා, දූෂණය, වාගේම අක්‍රමිකතා ගැනත් සොයන්න ඕනෑ. විශේෂයෙන්ම මහවැලිය යටතේ තිබෙන ඉඩම්, LRC එක යටතේ තිබෙන ඉඩම් සමහර වෙලාවට විශේෂ නිර්දේශයන් යටතේ ඇමතිවරුන්ගේ හිතවතුන්ට, ඥාතීන්ට ලබා දී තිබෙනවා. මේ සියලුම ඉඩම් එක තැනකින් පාලනය වෙනවා නම්, එක ක්‍රමයකට යනවා නම්, දූෂණ සහ අක්‍රමිකතා නතර කර ගන්න පුළුවන්. මම ඒ යෝජනාව සමඟ එකඟ වෙනවා. මොකද, මම මහවැලිය භාරව සිටියා, ඉඩම් ඇමතිවරයා හැටියට 2006 දී LRC එක භාරවත් සිටියා. හිතවතුන්ට ඉඩම් දීලා තිබෙන බව මම ඒ වෙලාවේ දැක්කා. LRC එකෙන් දුන්න ඉඩම් අක්කරයක් සඳහා හැම අවුරුද්දකම අඩු ගණනේ රුපියල් 5,000ක, 10,000ක බද්දක් ගත්තොත්, ඒවා එකතු වුණාම අය වැය හිඟය පියවන්න පුළුවන්. අපි මේවා ගැන හිතන්න ඕනෑ.

පොල් වගාව, සුළු අපනයන බෝග වගාව ගැනත් මම කියන්න ඕනෑ. ලුණුවිල විතරයි පොල් පර්යේෂණායතනයක් තිබුණේ.

[ගරු විමල් රාජපක්ෂ මහතා]

හම්බන්තොට, මිද්දෙනිය ප්‍රදේශයේ මිනි පොල් ත්‍රිකෝණයක් තිබෙනවා. 2004 දී මම වැවිලි අංශය භාර නියෝජ්‍ය අමාත්‍යවරයා හැටියට ඉන්නකොට මිද්දෙනියේ පොල් පර්යේෂණායතන උප පොළක් ඇති කළා. දැන් එහි වැඩ සාර්ථකව කරගෙන යනවා. ඒ වාගේම ඒ ප්‍රදේශවලට සුදුසු පොල් වර්ග අපි හඳුන්වා දුන්නා. මොකද, අපේ ප්‍රදේශවල ඉස්සෙල්ලා තිබුණේ පැඟිරි වගාව, ඊළඟට පොල් වගාව. දැන් ඒ ප්‍රදේශවල කුරුඳු වගාව කරනවා.

ගම්මිරිස් භෝග වගාව කෙරෙනවා. සුළු අපනයන භෝග වගාව කෙරෙනවා. අපි ඒවාට පහසුකම් දෙන්න ඕනෑ. මිද්දෙනියේ සුළු අපනයන භෝග සඳහා අක්කර 25ක් දීලා, ඒක සාර්ථකව කෙරෙනවා. රබර් වගාවත් කෙරෙනවා. අද ඒ ප්‍රදේශවල රබර් වගාවත් පටන් ගෙන තිබෙනවා. අනුරාධපුරයේ විතරයි පසු අස්වනු තාක්ෂණ මධ්‍යස්ථානය තිබුණේ. අපි හම්බන්තොටත් එකක් පටන් ගත්තා. ඒකට මහියංගනයත් සුදුසුයි. මේවා ගමට ගියාම අපට ඒ පහසුකම් ලබා ගන්න පුළුවන්.

ආදර්ශයක් විධියට ඒකාබද්ධ සූක්ෂ්ම වාණිජ අපනයන ගොවි පොළවල් 5,000ක් අපි ආරම්භ කළා. එහෙම 2000 වර්ෂයේ ආරම්භ කරපු ඒවා 2001 වර්ෂයේ ආණ්ඩු මාරු වෙන කොට නැති වුණා. අපට ඒවා තුළින් එළුවන්, කිකිළියන් ඇති කරන්නත්, කිරි, බිත්තර නිෂ්පාදනය කරගන්නත් පුළුවන්. ඒ මඟින් ආහාර සුරක්ෂිතතාව ඇති කරගන්න පුළුවන්. මම මීට වඩා කාලය ගන්නේ නැහැ. ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු චන්දිම වීරක්කොඩි මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි නවයක කාලයක් තිබෙනවා.

[අ.භා. 1.57]

**ගරු නීතිඥ චන්දිම වීරක්කොඩි මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சந்திம வீரக்கொடி)
(The Hon. Chandima Weerakkody, Attorney-at-Law)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අපේ රට විශාල අභියෝගයකට මුහුණ දී තිබෙන මේ වෙලාවේ රට ඉදිරියට ගැනීමේ අරමුණෙන් තමයි අය වැය ලේඛනයක් ඉදිරිපත් කළ යුත්තේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඔබතුමිය අහලා ඇති; ජෝන් එෆ්. කෙනඩි මැතිතුමා ප්‍රසිද්ධ ප්‍රකාශයක් කරලා තිබෙනවා, "අර්බුදයකින් අවස්ථාව උදා වෙනවා" කියලා. නමුත්, මේ අර්බුදයෙන් අපි අවස්ථාව උදා කර ගන්න උත්සාහ ගන්නවා ද කියන එක විශාල ප්‍රශ්නාර්ථයක්

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

Order, please! Will an Hon. Member propose the Hon. Weerasumana Weerasinghe to the Chair?

**ගරු (වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ரமேஷ் பதிரண)
(The Hon. (Dr.) Ramesh Pathirana)

Hon. Presiding Member, I propose that the Hon. Weerasumana Weerasinghe do now take the Chair.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය මෙනෙවිය මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු වීරසුමන වීරසිංහ මහතා මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு (கலாநிதி) (செல்வி) ஹரினி அமரசூரிய அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு வீரசுமன வீரசிங்ஹ அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon* THE HON. (DR.) (MS.) HARINI AMARASURIYA *left the Chair, and* THE HON. WEERASUMANA WEERASINGHE *took the Chair.*

**ගරු නීතිඥ චන්දිම වීරක්කොඩි මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சந்திம வீரக்கொடி)
(The Hon. Chandima Weerakkody, Attorney-at-Law)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපට අවශ්‍ය කරන්නේ මුදල් වාගේම විදේශ විනිමය. ඒ සඳහා පැහැදිලි වැඩ පිළිවෙළක් තිබෙනවා ද? රජය අද කරලා තිබෙන්නේ මොකක් ද? බදු වැඩි කරලා, බදු බර පටවලා මේ රටේ අහිංසක මනුෂ්‍යයාගේ ඉඳලා, ඉහළම ව්‍යාපාරිකයා, ව්‍යවසායකයා, කර්මාන්තකරුවා දක්වාම දැඩි පීඩනයකට පත් කරලා තිබෙනවා. රජයට ආදායම් ගන්න පුළුවන් මාර්ග තිබෙනවා. අපි විපක්ෂයේ ඉඳගෙන කථා කරන කොට ඔබතුමන්ලා හිතනවා, විවේචන විතරයි කරන්නේ කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද බීඩිවලට බද්දක් පනවලා තිබෙනවා. ගංජාවලට අලුත් නමක් ගෙනැල්ලා ජනාධිපතිතුමා ඒ සඳහා අවසර දෙන්න උත්සාහ ගන්නවා. හැබැයි, සිගරැට්වලට කිසිදු බද්දක් පනවා නැහැ. විශේෂ කණ්ඩායම්, ආයතන, රජය මේ පිළිබඳව අධ්‍යයන කරලා තිබෙනවා. සිගරැට් මිල වැඩි කළ යුතු සූත්‍රයක් ඉදිරිපත් කරලා තිබෙනවා. ඒ සූත්‍රය ගැන කිසිම කථාවක් නැහැ. බීඩිවලට බද්දක් දැම්මාම ජනතාව සිගරැට්වලට තවත් ඇබ්බැහි වෙනවා. අද වනවිට සිගරැට් කොම්පැනිවලින් වෙළඳ පොළට රුපියල් 10ට, 20ට සිගරැට් ඉදිරිපත් කරලා තිබෙනවා. සිගරැට් කොම්පැනි වෙනුවෙන් පෙනී සිටින නළුවෙකු කරන ප්‍රකාශයක් වාගේ ජනාධිපතිතුමා අය වැය ඉදිරිපත් කළා ද කියලා ප්‍රශ්නයක් ඇති වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ රටේ PAYE Tax එක තුළින් රුපියල් බිලියන 100ක් අය කර ගන්න බලාපොරොත්තු වෙනවා. 2019දී රුපියල් බිලියන 50ක් අය කරගෙන තිබෙනවා. වර්තමාන ආදායම 2019 වර්ෂයට සාපේක්ෂව තිබුණා නම්, රුපියල් බිලියන 60ක් විතර හම්බ වෙනවා. රුපියල් බිලියන 30ක්, 40ක් වැඩි කරගන්න විශාල බද්දක් පනවලා තිබෙනවා. මම අභියෝග කරලා කියනවා, වර්තමානයේ පවතින සිගරැට් මිල, අධ්‍යයනයන්ට අනුව ඉදිරිපත් කරලා තිබෙන සූත්‍රයකට අනුකූලව වැඩි කළා නම්, මේ වර්ෂයේ රුපියල් බිලියන 45ත්, 50ත් අතර ප්‍රමාණයක් රජයට බදු හැටියට අය කර ගන්න හැකියාව තිබුණා කියලා. ඒක කරලා නැහැ. ඇයි, ඒ?

මේ මොහොතේ, සෞඛ්‍ය ක්ෂේත්‍රයට අදාළව බෙහෙත් නැහැ. රෝහල්වල ප්‍රශ්න තිබෙනවා. එහෙම වුණත් තවදුරටත් සිගරැට්වලට ඇබ්බැහි කරන කර්තව්‍යයට උර දීලා තිබෙනවා. ඒ කටයුත්ත නැවැත්වුවා නම්, රුපියල් බිලියන 50ක් හොයා ගන්න තිබුණා. ඒ විතරක් නොවෙයි. අපේ රටේ සංඛ්‍යාත - frequencies - තිබෙනවා. ඉතිහාසයේ ඉඳලාම ඒ සංඛ්‍යාත තමන්ගේ දේශපාලන හිතවතුන්ටයි දුන්නේ. එහෙම දුන්නා කියලා ඒ සංඛ්‍යාත ගත්තු හිතවත්තු ඒවා දීපු නායකයෝ එක්ක හිටියේ නැහැ. ගරු ටිරාන් අලස් ඇමතිතුමනි, ඔබතුමා දන්නවා, "දෙරණ" සහ "හිරු" මාධ්‍ය ආයතන ආරම්භ කරන්න අවස්ථාව දුන්නේ, චන්ද්‍රිකා බණ්ඩාරනායක මැතිනිය බව.

අද "දෙරණ" සහ "හිරු" මාධ්‍ය ආයතන ඉන්නේ චන්ද්‍රිකා බණ්ඩාරනායක මැතිනියගේ පැත්තේ ද? ඩයලොග් සමාගමට සංඛ්‍යාත දුන්නේ මහින්ද රාජපක්ෂ මහත්මයා. අද "සිරස" ඉන්නේ

එතුමාගේ පැත්තේද? "සියත"ට සංඛ්‍යාත දුන්නේ මහින්ද රාජපක්ෂ මහත්මයා. අද "සියත" එතුමාට පාක්ෂිකවද ඉන්නේ? මේ වාගේ එකින් එකට analyse කළොත්, මේ සංඛ්‍යාත දේශපාලන පදනම මත දුන්නාය කියලා දේශපාලන වාසියක් වෙලාත් නැහැ; රටට වාසියක් වෙලාත් නැහැ. හැබැයි, මේ සංඛ්‍යාත 5G කරලා, අපේ රට 5G තාක්ෂණය හඳුන්වලා දෙන මට්ටමට ගෙනැල්ලා මේ සංඛ්‍යාත වෙන්දේසි - auction - කළා නම්, විශාල මුදලක් ලබා ගන්න තිබුණා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඉන්දියාව මේ කටයුත්ත කරලා එක්සත් ජනපද ඩොලර් බිලියන 19ක් හෙව්වා. ඩොලර් බිලියන 18ක් පැත්තකින් තියලා ලංකාවේ සංඛ්‍යාත ටික වෙන්දේසි කරලා ඩොලර් බිලියනයක් හෙව්වා නම් කොච්චර හොඳද? ඩොලර් බිලියනයක් කියන්නේ රුපියල් බිලියන 350ටත් වැඩියි. අපි මේ විධියට සල්ලි හොයන්න උත්සාහයක් පිළිබඳ හිතලාවත් නැහැ. මේ අපේ සම්පත්. මේ ජනතාවගේ සම්පත්. මේ අපේ ජනතාවට අයිති දේවල්. අපි මේ පිළිබඳ අවධානය යොමු කරලා නැහැ. ඇයි අවධානය යොමු කරලා නැත්තේ?

හිටපු මුදල් ඇමති බැසිල් රාජපක්ෂ මැතිතුමාගේ අය වැය කථාවේදී කිව්වා, "බැඳුම්කරයෙන් එන්න තිබෙන මුළු මුදල නොවෙයි. රුපියල් බිලියන 8.5ක් අය කර ගැනීමට කටයුතු කරනවා" කියලා. එතුමාගේ අය වැය කථාවේ එහෙම කිව්වා. මේ අය වැය කථාවේ බැඳුම්කරය ගැන සඳහනකුත් නැහැ. ඒ රුපියල් බිලියන 8.5ට මොකක්ද වුණේ කියලා සඳහනකුත් නැහැ. අපේ රටේ ජනතාවට හිමි දේවල් ජනතාව පීඩනයට පත් කරන්නේ නැතිව රටේ උන්නතිය වෙනුවෙන්, ජනතාව වෙනුවෙන් එකතු කරන්නට කිසිදු උත්සාහයක් අරගෙන නැහැ කියන එක අපට මේ මොහොතේ කියන්න සිද්ධ වෙලා තිබෙනවා.

ආරක්ෂක වියදම තමයි අපේ රටේ විශාලම වියදම. ඒ පිළිබඳ කරුණු දෙකයි ජනාධිපතිතුමාගේ කථාවේ සඳහන් කළේ. එකක් තමයි හමුදා විරුවන්ට සේවා කාලය අවුරුදු 18න් පසුව විශ්‍රාම යන්න අවස්ථාව දෙනවා කියන එක.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

**ගරු නීතිඥ චන්දිම වීරක්කොඩි මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சந்திம வீரக்கொடி)
(The Hon. Chandima Weerakkody, Attorney-at-Law)
මට තව විනාඩි තුනක් තිබෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
නැහැ, තව විනාඩි දෙකක කාලයක් තිබෙන්නේ.

**ගරු නීතිඥ චන්දිම වීරක්කොඩි මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சந்திம வீரக்கொடி)
(The Hon. Chandima Weerakkody, Attorney-at-Law)
අනෙක් කරුණ අකුරේගොඩ හදන විශාල ගොඩනැඟිල්ලට තව මුදල් වෙන් කළා කියන එක. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සොල්දාදුවන්ට අවුරුදු 18ක සේවා කාලයෙන් පසුව එළියට යන්න අවස්ථාව දෙනවා නම්, ඒ අයට යම් පුහුණුවක් ලබා දීලා එළියට යන්න අවස්ථාව දෙන්න කියලායි මම ඉල්ලා සිටින්නේ. නිකම්ම එළියට දමලා ඒ අයගේ ජීවිත අනාථ කරන්න එපා. අවුරුදු 18දී, අවුරුදු 20දී සේවයට බැඳෙන හමුදා සෙබලා අවුරුදු 36දී එළියට යනකොට පුහුණුවක් අවශ්‍යයි. ඒ පුහුණුව ලබා දීම සඳහා මුදල් වෙන් කරලා තිබෙනවාද? නාස්ති කරන මුදල්, අනවශ්‍ය වියදම්වලට යොදවන මුදල් පිළිබඳව කිසිදු audit එකක් නැහැ. මට කියන්න සිද්ධ වෙලා තිබෙනවා, ආරක්ෂක ලේකම්වරයාගේ වියදම අඩු කරලා, වෙනත් අමාත්‍යාංශ ලේකම්වරයෙකුගේ වියදමට සමාන මුදලක් ඔහුටත් වෙන් කළොත් විශාල මුදලක් මේ රටේ සංවර්ධනයට වෙන් කර ගන්න, මිනිසුන්ගේ අවශ්‍යතාවලට වෙන් කර ගන්න පුළුවන්.

ඒ වාගේම අපි තේ, රබර්, පොල් ගැන කථා කරනවා. එදා අපේ ප්‍රදේශයේ තේ දලු කිලෝග්‍රෑම් 500ක් නෙළපු තැන අද නෙළන්න පුළුවන් වෙලා තිබෙන්නේ තේ දලු කිලෝග්‍රෑම් 200යි. එදා රුපියල් 90ට තිබුණු තේ දලු කිලෝවට අද රුපියල් 220ක් ලැබෙනවා. හැබැයි, අතට එන මුදල ගත්තාම එදා රුපියල් 45,000ක් ලැබුණු කෙනාට අද ලැබෙන්නේ ඊට වඩා අඩුවෙන්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එදා පොහොර ටික ගත්තේ කීයටද? රුපියල් 1,500ට ගත්ත පොහොර මිටියක අද අවම මිල රුපියල්18,000යි. රුපියල් 18,000ටත් ගන්න නැහැ. පොහොර මිල දස ගුණයකින් වැඩි වෙලා. එදා යම් දෙයක් රුපියලකට ගත්තා නම්, අද ඒක රුපියල් තුනයි. රුපියල් 1,000කට ගත්තා නම්, අද රුපියල් 3,000යි. එතකොට මොකක්ද මේ ක්ෂේත්‍රයට වෙලා තිබෙන්නේ? දැන් රබර් කිරි ඇති වෙන්න ගේන්න ඉඩ දීලා තිබෙනවා.

අපි පිළිගන්නවා, කර්මාන්තවලට රබර් කිරි අවශ්‍ය බව. යම් සාධාරණ මුදලකට කිරි ගත්තේ නැත්නම් කර්මාන්ත කරන්න බැහැ. හැබැයි, ඒ අවශ්‍ය ප්‍රමාණය තීන්දු කරලා නොවෙයි, රබර් කිරි ගෙන්වන්න ඉඩ දීලා තියෙන්නේ. හුරතලුන්ට, හිතවතුන්ට ඇති වෙන්න ගේන්න ඉඩ ඇරලා තියෙනවා. අද ඒ හේතුව මත රබර් මිල අඩු වෙලා තියෙනවා. හාල්වලටත් වෙලා තියෙන්නේ මේ දේමයි. අවශ්‍ය ප්‍රමාණය නොවෙයි, ඇති වෙන්න ගේන්න ඉඩ ඇරලා තියෙනවා. අද ඒවාත් කලවම් කරලා විකුණන්නේ. ඒකම තමයි කක්කුස්සි කටටත් වෙලා තියෙන්නේ. කක්කුස්සි කටත් ගෙන්වන්න තහනම් කරන්න කලින් ඇති වෙන්න ගෙනැල්ලා තියෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට ලබා දුන් කාලය අවසානයි.

**ගරු නීතිඥ චන්දිම වීරක්කොඩි මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சந்திம வீரக்கொடி)
(The Hon. Chandima Weerakkody, Attorney-at-Law)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, තව විනාඩියක් දෙන්න.

තමන්ගේ යම් පිරිසක් පෝෂණය කිරීම සඳහා පමණක් හිතලා, රට ගැන, රටේ අනාගතය ගැන, ජාතිය ගැන හිතලා මේ තිබෙන ප්‍රශ්නවලින් එළියට එන්න කල්පනා කරන්නේ නැතුව අද කටයුතු කරනවා. හොඳට දුවන ටෙලිකොම් එක, බිලියන 20ක් බදු ගෙවපු ටෙලිකොම් එක, බිලියන 3.5ක් ලාභාංශ ගෙවපු ටෙලිකොම් එක විකුණන්න දාලා තියෙනවා. මේවා සාධාරණීකරණය කරන්නේ කෙසේද කියන එක පිළිබඳව ප්‍රශ්නයක් තියෙන බව ප්‍රකාශ කරමින් මම නිහඬ වෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මොහාන් ප්‍රියදර්ශන ද සිල්වා රාජ්‍ය අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 13ක කාලයක් සහ අතිරේක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.08]

**ගරු නීතිඥ මොහාන් ප්‍රියදර්ශන ද සිල්වා මහතා (කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு சட்டத்தரணி மொஹான் பிரியதர்ஷன த சில்வா - கமத்தொழில் இராஜாங்க அமைச்சர்)
(The Hon. Mohan Priyadarshana De Silva, Attorney-at-Law - State Minister of Agriculture)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, වෙලාව ලබාදීම පිළිබඳ ඔබතුමාට බොහොම ස්තුතිවන්ත වෙනවා.

මුදල් අමාත්‍යවරයා හැටියට ගරු ජනාධිපතිතුමා 2023 වසර සඳහා අය වැය ඉදිරිපත් කළා. මේ අය වැය මේ රටේ ඉදිරිපත් කරපු 77 වන අය වැය. මේ අය වැය ඉදිරිපත් කරනකොට වෙන කිසි කාලයක නොතිබිච්ච අභියෝගයකට අපි මුහුණ දෙමින් සිටිනවා. අපි රටක් හැටියට විශේෂයෙන්ම ආර්ථික, දේශපාලන, සමාජයීය වශයෙන් ලොකු අභියෝගයකට වගේම පරිහානියකට පත් වෙච්ච කාලයක් මේක. දැන් මේ සභාව ඇතුළේත්, පිටතත් අපට පෙනෙනවා, මේ ආර්ථික අභියෝගය සම්බන්ධයෙන් විවිධ අර්ථකථන ලබා දෙන බව. සමහර අය කියන කාරණයක් තමයි මේ ආර්ථික අර්බුදය හැදුණේ අපේ හිටපු ජනාධිපතිතුමා ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාත්, ඒ වාගේම එතුමාගේ ආණ්ඩුවත් නිසා කියලා. හැබැයි, ඒක වැරදියි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි මේ සභාවේ ඉන්නකොට සමහර වෙලාවට අපට පුදුම හිතෙනවා. මොකද, මේ සභාවේ ඉන්නවා, හැම ආණ්ඩුවේම හිටපු මන්ත්‍රීවරු, ඇමතිවරු. ඒ අය ඒ ආණ්ඩුවල හිටපු කාලයේ, ඒ රජයන් නියෝජනය කරපු කාලයේ කරන්න තිබිච්ච වැඩ දැන් අපට කරන්න කියලා කියනවා. ඇත්තටම ඒක හොඳින් තේරුම් අරගෙන කියන්න ඕනෑ කාරණයක්. මොකද, ඒ අය ඒ හැම ආණ්ඩුවෙන්ම, හැම රජයෙන්ම ප්‍රතිලාභ අරගෙන තිබෙනවා. ඇමතිකම්, නියෝජ්‍ය ඇමතිකම් නැත්නම් අඩුම ගාණේ ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවක හරි මේ අය ඉඳලා තියෙනවා. මම ඒ කාරණය අවධාරණය කරලා කියනවා. එහෙම තිබියදී මේ ආණ්ඩුවට ඇඟිල්ල දිගු කරන එක කොච්චර සදාචාර සම්පන්නද කියන කාරණය මම පෙරළා අහන්න කැමැතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එදා ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා මේ රටේ ජනාධිපතිවරයා වෙනකොට පාස්කු ප්‍රහාරයෙන් මේ රටේ ආර්ථිකය සම්පූර්ණයෙන් බිඳ වැටිලා තිබුණේ. සංචාරක ව්‍යාපාරය බහුලව තියෙන ප්‍රදේශයක් නියෝජනය කරන ජනතා නියෝජිතයෙක් නිසා මා දන්නවා, පාස්කු ප්‍රහාරයත් එක්ක අපේ රටේ සංචාරක ව්‍යාපාරය බිංදුවට කඩා ගෙන වැටුණු බව. ගහෙන් වැටිච්ච මිනිහාට ගොනා ඇන්නා වාගේ පාස්කුවෙන් පස්සේ කොවිඩ් වසංගතය ආවා. කොවිඩ් වසංගතයෙන් පස්සේ සංචාරක ව්‍යාපාරය සම්පූර්ණයෙන් කඩා ගෙන වැටුණා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. 2018දී අපට සංචාරක ව්‍යාපාරයෙන් ලැබිලා තියෙනවා, ඇමෙරිකන් ඩොලර් මිලියන 4380.9ක්. හැබැයි, ඒක 2021 වෙනකොට ඇමෙරිකානු ඩොලර් මිලියන 506.9 දක්වා අඩු වෙලා තියෙනවා. එතකොට අපට පෙනෙනවා, කොච්චර විශාල ආදායමක් ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාගේ කාලයේදී අපේ රටට අහිමි වෙලා තියෙනවාද කියලා. ඒක එක කාරණයක් විතරයි.

ඒ වාගේම අපි කවුරුත් දන්නා කාරණයක් තමයි ගෝලීය වසංගත තත්ත්වය යටතේ අපට විදේශ ශ්‍රමිකයන්ගෙන් ලැබිච්ච ප්‍රේෂණ ප්‍රමාණය අතිවිශාල වශයෙන් අඩු වුණාය කියන කාරණය. ඒ වාගේ අපේ ඇඟලුම් කර්මාන්තය ප්‍රමුඛ කර්මාන්තවල ලොකු කඩා වැටීමක් වුණා. නමුත් ඒ සියලු තත්ත්ව යටතේ එතුමාට පුළුවන්කම ලැබුණා, කොවිඩ් වසංගතය ඉතාම මැනවින් පාලනය කරන්නට. ඒ කාලයේ මිනිස්සු රස්සාවල් ඉල්ලුවේ නැහැ. මිනිස්සු කන්න බඩට දේවල් ඉල්ලුවේ නැහැ. ඒ කාලයේ මිනිස්සු අභයදානය ලබා දෙන්න කියලා විතරයි කිව්වේ. මේ රටින් කොවිඩ් වසංගතය තුරන් කරලා නිදහසේ ජීවත් වීමේ අයිතිය ලබා දෙන්න කියන එක විතරයි ගෝඨාභය රාජපක්ෂ මහත්තයාගෙන් මිනිස්සු ඉල්ලුවේ. එතුමා ඒක ඕනෑවටත් වැඩිය කළා.

හැබැයි, අපේ මේ සමාජය ඉතාම අකෘතඥ සමාජයක්. කළගුණ දන්නේ නැති, ඉතාම පහත් ගණයේ මිනිස්සු ඉන්න සමාජයක්. අද ඒ සියල්ල අමතක කරලා දාලා සියලු පව් ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා පිට පටවලා තිබෙනවා. ඒක ඉතා නිහීන, තුච්ඡ ක්‍රියාවක් කියලා මම කියන්නට ඕනෑ. අපි බොහොම පිළිකුලින් යුක්තව ඒ තත්ත්වය හෙළා දකිනවාය කියන කාරණය මම බොහොම පැහැදිලිව කියන්න ඕනෑ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ඒ වාගේම මේ අර්බුදය එක දවසකින්, දෙකකින් හැදුණු එකක් නොවෙයි. අපේ රට නිදහස ලබනකොට අපේ ඒක පුද්ගල ආදායම කීයද, අපේ ණය ප්‍රමාණය කීයද කියලා අපි කවුරුත් දන්නවා. නමුත් මේ සියල්ල කාලයත් එක්ක වෙනස් වුණා. අපේ රට ආදායමට වඩා වියදම් කළා. ඒ සියල්ලටම පැවති ආණ්ඩු වාගේම හිටපු පාලකයෝ සියලුදෙනාම වග කියන්න ඕනෑ. ඒ ආණ්ඩුවල හිටපු මැති ඇමතිවරු හැටියට අපිත් ඒවාට වග කියන්න ඕනෑ. 2010 වර්ෂයේ ඉඳලා මම මේ පාර්ලිමේන්තුවේ හිටියා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාත් මාත් කාලයක් එකට දකුණු පළාත් සභාව නියෝජනය කළා. එතකොට අපි සියලුදෙනාම ඒවාට වග කියන්න ඕනෑ. ඒ නිසා මේ සියල්ල 2019 අවුරුද්ද අවසානයේ බලයට පත් වුණු ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාගේ පිට පටවන එක ඉතාම අසාධාරණ ක්‍රියාවක් කියන කාරණය අපි කියන්නට ඕනෑ,

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අනික් කාරණය තමයි, මේ රට පාලනය කරපු අය වාගේම තවත් අය මේ තත්ත්වයට වග කියන්න ඕනෑ. සමහර වෙලාවට අපට පෙනෙනවා ජනතා විමුක්ති පෙරමුණේ මන්ත්‍රීවරු නිකම් නින්දෙන් නැඟිටලා වාගේ කථා කරනවා. ඒ අය තමයි සුදනෝ. ඒ අය මේ රටේ ආර්ථිකයට කිසි දෙයක් කරලා නැහැ. දැන් ගරු ගාමිණී ලොකුගේ ඇමතිතුමා ඉතාම හොඳ දේශපාලන විග්‍රහයක් කළා. එතුමා කිව්වා, ජනතා විමුක්ති පෙරමුණ මේ රටේ ආර්ථිකයට මොකක්ද කළේ කියලා. ජනතා විමුක්ති පෙරමුණ වාගේම තමයි එල්ටීටීඊ සංවිධානයත්. අපි දන්නවා, ඔවුන් මේ රටේ ආර්ථිකයට, මේ රටේ මිනිස්සුන්ට කොච්චර සාහසික අපරාධ කළාද කියලා. අද කවුරුත් ඒ ගැන කථා කරන්නේ නැහැ. හැමෝම ආණ්ඩු කරපු දේශපාලන පක්ෂවලට විතරක් ඇඟිල්ල දිගු කරනවා. නමුත් ආණ්ඩු කළ අය වාගේම ආණ්ඩු නොකරපු ජනතා විමුක්ති පෙරමුණත්, එල්ටීටීඊ සංවිධානයත් මේ රටේ ආර්ථික පරිහානියට ලොකු දායකත්වයක් ලබා දීලා තිබෙනවාය කියන කාරණය මම පැහැදිලිවම කියන්න ඕනෑ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මේ අර්බුදයත් එක්කම අපි දැක්කා මේ රටේ අරගළය කියලා එකක් ඇති වුණා. ඒ අරගළයට අපේ නායකයොත් ගිහිල්ලා කථා කළා. ඒ අරගළය නිසාම ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාට ධුරයෙන් ඉවත් වෙන්න සිදු වුණා. එතුමා ප්‍රජාතන්ත්‍රවාදී නායකයකු හැටියට ඒකට මුහුණ දුන්නා. ඕනෑ නම් එතුමාට පුළුවන්කම තිබුණා යුද හමුදාව දාලා ඒ තරුණයන් ඝාතන කරන්න. ඊට පසුව නේ මොන දේ වුණත් සිද්ධ වෙන්නේ. නමුත් එතුමා එහෙම තීන්දුවකට යන්නේ නැතිව, බොහොම නිහතමානීව මහත්මයෙක් විදියට, ජනතා වරමින් ලැබුණු ඒ තනතුරෙන් ඉවත් වෙලා, බැහැලා ගියා. එයින් පස්සේ තමයි රනිල් වික්‍රමසිංහ මැතිතුමා මේ රටේ ජනාධිපතිවරයා බවට පත් වුණේ. අද අපි එතුමා පිළිගන්නට ඕනෑ. එතුමාගේ දේශපාලන මති මතාන්තර එක්ක තවමත් මම එකඟ නැහැ. මම ඒක පැහැදිලිව කියන්නට

ඕනෑ. එතුමාගේ දේශපාලන න්‍යාය පත්‍රය එක්ක මගේ පෞද්ගලික එකඟතාවක් නැති වුණත්, එතුමා අද මේ රට වෙනුවෙන් යම් කාර්යභාරයක් කරලා තිබෙන බව කියන්න ඕනෑ. අපි ඒකට එතුමාට ස්තුතිවන්ත වෙනවා. අද වෙනකොට එදා තිබුණු තෙල් පෝලිම්, ගෑස් පෝලිම් නැහැ මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මිනිස්සු යම් සන්සුන් බවකින් ඉන්නවා. ඒ අතරත් යම් යම් කල්ලි, කණ්ඩායම් තවමත් අරගළ කරන්න මිනිස්සුන්ට කථා කරන හැටි අපට පෙනෙනවා. විවිධ හේතු කියමින් මේ රටේ ජනතාව උසිගන්වන්න කටයුතු කරනවා. ඒ මොනවා වුණත්, රනිල් වික්‍රමසිංහ මැතිතුමා අද මේ රටේ ජනාධිපතිවරයා හැටියට මේ ආර්ථික අර්බුද මැද්දේ, සමාජ අසහනය මැද්දේ, විවිධ කෙනෙහිලිකම් මැද්දේ, විවිධ කකුලෙන් ඇදීම් මැද්දේ මේ කරගෙන යන වැඩ පිළිවෙළ පිළිබඳව, පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු හැටියට නොවෙයි, මේ රටේ සාමාන්‍ය පුරවැසියකු හැටියට එතුමාට මගේ කෘතඥතාව පිරිනමන්න කැමැතියි.

එතුමා ඉදිරිපත් කරපු අය වැය ගැනයි අද අපි කථා කරන්නේ. මොකක්ද මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අය වැයක් කියන්නේ? සමහර උදවිය හිතාගෙන ඉන්නවා, අය වැයක් කියන්නේ අපේ කන් පිනවන හොඳ යෝජනා තිබෙන්න ඕනෑ ලියවිල්ලක් කියලා. එහෙම නැත්නම් ආදායම්, වියදම් පිළිබඳව සකස් කරපු ලියවිල්ලක් කියලා. නමුත් ඇත්තටම මම දකින විධියට නම්, අය වැයක් කියන්නේ පවතින ආණ්ඩුව මේ රටේ ආර්ථිකය හසුරුවන්නේ කොහොමද කියන ආකාරය පෙන්නුම් කරන ලියවිල්ලක්. එදා ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමා ඉදිරිපත් කරපු ඒ අය වැය පිළිබඳව සාකච්ඡා වන මේ වෙලාවේ විශේෂයෙන්ම මම ඔබතුමාට කියන්න ඕනෑ, නිදහස ලබනකොට අපේ රටේ තිබුණේ විවෘත ආර්ථිකයක් බව. ඒ විවෘත ආර්ථිකය 1956 සිට1977 දක්වා නැවත සංවෘත ආර්ථිකයක් බවට පත්වුණා.

ජනාධිපතිතුමා අය වැය කථාවේදී බණ්ඩාරනායක යුගය ගැන දැක්වූ යම් යම් කාරණා සමඟ මම එකඟ වෙන්නේ නැහැ. මොකද, මට ඒ ගැන තිබෙන්නේ වෙනත් මතයක් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. බණ්ඩාරනායක අගමැතිතුමාට ලොකු කාලයක් මේ රට පාලනය කරන්න ලැබුණේ නැහැ. 1956දී එතුමා අගමැති වුණා. 1959දී එතුමාව ඝාතනය කළා. නමුත් සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය මේ රට වෙනුවෙන් විශාල වැඩ කොටසක් කළා. එතුමිය ඒ කාලයේ යම් යම් ආයතන ජනසතු කරලා එයින් පසුව විවිධ කර්මාන්ත මේ රටේ ඇති කරන්න ලොකු මහන්සියක් ගත්තා. ඒ කාලයේ අපේ රටේ කර්මාන්තවල විශාල වර්ධනයක් ඇති වුණා, විශාල පුනරුදයක් ඇති වුණා. නමුත් ඒ අවස්ථාවේ අපේ මිනිස්සුන්ට යම් යම් දේවල් දරාගන්න බැරි වුණා. එදා වගා සංග්‍රාමයක් ගැන කථා කළා. සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය ඒ කටයුත්ත කරගෙන යන කොට, ඒකට රුකුලක් ලබා දුන්නේ නැහැ. විවිධ හේතු නිසා එදා සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනියගේ ආණ්ඩුව පරාජයට පත් කරලා, 1977දී ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා හයෙන් පහක බහුතර බලයක් ලබා ගනිමින් මේ රටේ නායකයා බවට පත් වුණා. එයින් පසුව එතුමා එතෙක් පැවැති සංවෘත ආර්ථිකය සම්පූර්ණයෙන්ම කණපිට හරවලා නැවත විවෘත ආර්ථිකයට ගියා.

ඒ විවෘත ආර්ථික ක්‍රමය වැරදියි කියලා මම කියන්නේ නැහැ. ඒ තුළත් යම් යම් සාධනීය ලක්ෂණ තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ නිසාම තමයි එයින් පසුව බලයට පත් වුණු හැම ආණ්ඩුවක්ම ඒ විවෘත ආර්ථික ක්‍රමය ඉස්සරහට අරගෙන ආවේ. හැබැයි, එදා ගරු ජනාධිපතිතුමා මේ පාර්ලිමේන්තුවේ ප්‍රකාශ කළා වාගේම 1956-77 දක්වා පැවති සංවෘත ආර්ථික ක්‍රමයේ වාගේම, 1977න් පසුව තිබුණු විවෘත ආර්ථික ක්‍රමයේත් යම් යම් වෙනස්කම් කරන්න ඕනෑය කියන කාරණය අපිත් පිළිගන්න ඕනෑ. මොකද, ඒ කිසිම ආර්ථික ක්‍රමයකින් මේ රටේ ජනතාවට යහපතක් වෙලා නැහැ කියන කාරණය අපි පැහැදිලිව කියන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එදා ජනාධිපතිතුමා අදහස් ප්‍රකාශ කරන කොට කිව්වා, නව ආර්ථික ක්‍රමයක් මේ රටට හඳුන්වා දෙන්න ඕනෑ කියලා. එතුමා ඒක හැඳින්නුවේ, "සමාජ ආරක්ෂණ විවෘත ආර්ථික ක්‍රමය" කියලා. ඒ ආර්ථික ක්‍රමය තුළ එතුමා මූලික කාරණා තුනක් මේ ගරු සභාවට ඉදිරිපත් කළා. පළමුවෙනි කාරණය තමයි, අපනයනය මූලික කරගත් තරගාකාරී ආර්ථිකයක් කියන එක. දෙවැනි එක තමයි, පරිසර හිතකාමී හරිත හා නීල ආර්ථිකයක් කියන එක. තුන්වැනි කාරණය තමයි, ඩිජිටල් ආර්ථිකයක් කියන එක. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ලෝකයේ පවතින්නේ තරගකාරී වෙළෙඳ පොළක් කියන එක අපි පිළිගන්නට ඕනෑ. එතකොට ඒ තරගයට අපිත් අනුගත වෙන්න ඕනෑ. අපිත් ඒකට අනුගත නොවුණොත්, පැහැදිලිවම අපි පරාජයට පත් වෙනවා. ඒක තමයි චාල්ස් ඩාවින්ගේ පරිණාමවාදය තුළත් දක්වා තිබෙන්නේ. අපි පරිසරයත් එක්ක අනුගත වෙන්න ඕනෑ, එහෙම නැත්නම් අපි වඳ වෙන්න පුළුවන්.

මේ රටේ තවම තිබෙන්නේ සේවා ආර්ථිකයක්. මේ සේවා ආර්ථිකය අපි තවදුරටත් තහවුරු කරන ගමන්, අපේ නිෂ්පාදන ආර්ථිකය ශක්තිමත් කරන්න ඕනෑය කියන ප්‍රායෝගික අත්දැකීම අපට තිබෙනවා. මොකද, අපි දැක්කා, කොවිඩ් වසංගතය එන කොට, අපට නිෂ්පාදන ආර්ථිකයක් තිබුණේ නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අපට තිබුණේ සේවා ආර්ථිකයක්. කොවිඩ් වසංගතයත් එක්ක, පාස්කු ප්‍රහාරයත් එක්ක අපේ රටේ සංචාරක ව්‍යාපාරය කඩාගෙන වැටෙන කොට, අපට වෙන කිසිම විකල්ප වැඩ පිළිවෙළක් තිබුණේ නැහැ. ඒ නිසා ජනාධිපතිවරයා කියනවා වාගේම, අපි නිෂ්පාදන ආර්ථික ක්‍රමයක් පටන් අරගෙන ඒ නිෂ්පාදන ආර්ථිකය හරහා අපේ නිෂ්පාදන අපනයනය කරන්න පුළුවන් උසස් මට්ටමට ගෙනෙන්න ඕනෑ. එදා ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාගේ කාලයේ ගරු බැසිල් රාජපක්ෂ මැතිතුමා මුදල් අමාත්‍යවරයා හැටියට මේ ක්‍රමය ඉදිරිපත් කළා. නමුත් ඒ ගැන කවුරුත් කථා කරන්නේ නැහැ. එදා එතුමා මුදල් ඇමතිවරයා හැටියට ගම්වල ඉන්නා ජනතාවගේ නිෂ්පාදන ආර්ථිකය ශක්තිමත් කරන්න විශාල වැඩ පිළිවෙළක් ආරම්භ කළා. පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් හරහා ගම්වලට විශාල මුදල් ප්‍රමාණයක් ලබා දුන්නා. "සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන" වාගේ වැඩසටහන් ඇති කරලා, ගම්වල ජනතාවගේ නිෂ්පාදන හැකියාව, ඒ අයගේ ශක්තිය වැඩි කර ගන්න අවස්ථාව ලබා දුන්නා. ඒ නිසා අද එතුමා පිළිබඳව මොන විධියේ විවේචන තිබුණත්, එතුමා එදා ඒ කළ වැඩ කොටස මම මේ අවස්ථාවේ ඉතාම ගෞරවයෙන් සිහිපත් කරනවාය කියන කාරණය කියන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සමහර රටවල් ඉතිහාසයේ යම් යම් කාලවල ඉතාම දුෂ්කර ආර්ථික අර්බුදවලට මුහුණ දීලා තිබෙනවා, අද අපි මුහුණ දෙනවා වාගේ. ඒ සඳහා මම ඔබතුමාට උදාහරණ කීපයක් දක්වන්නම්. දෙවැනි ලෝක යුද්ධයෙන් පසුව ජර්මනිය, හිරෝෂිමා-නාගසාකි බෝම්බ පිපිරීමෙන් පසුව ජපානය, 1950-53 කාලයේ සිවිල් අරගළයක් පැවති දකුණු කොරියාව වැනි රටවල් අරගෙන බැලුවාම, ඒ රටවල ලොකු ආර්ථික අර්බුද නිර්මාණය වුණා.

හැබැයි, මොකක්ද ඒ රටවල් ඒ ආර්ථික අර්බුදවලින් මිදෙන්න කළේ? ඒ අය ඒ ආර්ථික අර්බුදය පැවති අවදියේ තමන්ගේ සම්පත්, තමන්ගේ ශ්‍රමය යෙදවූයේ දේශීය පරිභෝජනය සඳහායි. ඒ කියන්නේ, තමන්ට පරිභෝජනය සඳහා අවශ්‍ය තමන්ගේ එදිනෙදා අවශ්‍යතා පිරිමසාගන්න පුළුවන් කෘෂි කාර්මික නිෂ්පාදන

[ගරු නිතිඥ මොහාන් ප්‍රියදර්ශන ද සිල්වා මහතා]

හා කාර්මික නිෂ්පාදන ඇති කරන්න විතරයි. හැබැයි, ඒ අය ඒ ආර්ථික අර්බුදයේදී සාම්ප්‍රදායික කර්මාන්තත් එක්ක නවීන තාක්ෂණයත් යොදා ගත්තා. සාම්ප්‍රදායික කෘෂිකර්ම රටාවත් එක්ක නවීන තාක්ෂණය බද්ධ කරගත්තා. ඒ තාක්ෂණය බද්ධ කරගෙන ඒ නිෂ්පාදන අපනයනය කළා. ඒ අනුව තමයි, ඒ රටවල් ආර්ථික ශක්තිය වැඩි දියුණු කරගත්තේ. අපි රටක් හැටියට අපේ නිෂ්පාදන ආර්ථිකය ශක්තිමත් කරගෙන, ඒ නිෂ්පාදන අපනයන මට්ටමට ගෙනාවොත්, අපට අද පවතින ආර්ථික අර්බුදයෙන් මිදීමට හැකි බව මම කියන්න ඕනෑ.

ගරු ජනාධිපතිතුමා මේ අය වැය ප්‍රකාශයේ ඒ සම්බන්ධයෙන් කරුණු කාරණා ගණනාවක් දක්වා තිබෙනවා. විශේෂයෙන්ම නවීන තාක්ෂණය අපේ රටේ තරුණ පරම්පරාවට හුරු කරන්න ඕනෑය කියන කාරණය එතුමා පැහැදිලිව කියන කාරණයක්. ඒ සඳහා අවශ්‍ය අධ්‍යාපන පසුබිම සකස් කරන්න කටයුතු කරන්න ඕනෑ. ඒ වාගේම, මේ නව ආර්ථිකය නිර්මාණය කරන්නේ මේ රටේ ජාතික සම්පත වන තරුණ-තරුණියන් වෙනුවෙන්, ඔවුන්ගේ හෙට දවස වෙනුවෙන් කියන කාරණය ගරු ජනාධිපතිතුමාගේ අය වැය කථාවේදී කිව්වා. උදාහරණයක් හැටියට කිව්වොත්, දුෂ්කර ප්‍රදේශවල තිබෙන පාසල්වලට නවීන තාක්ෂණය මුසු වෙච්ච අන්තර්ජාල පහසුකම් ලබා දෙන්න මේ අය වැයෙන් යෝජනා කරලා තිබෙනවා. ඒක කාලෝචිත, ඉතාම හොඳ යෝජනාවක් කියන කාරණය මම කියන්න ඕනෑ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, නගරබද දරුවන්ට අන්තර්ජාල පහසුකම්වලට පහසුවෙන් ළඟා වෙන්න පුළුවන් බව ඔබතුමාත්, අපිත් දන්නවා. නමුත්, ගම්බද දුෂ්කර දරුවන්ට ඒ අවස්ථාව නැහැ. මේ කාරණය ජනාධිපතිතුමා කියන ආකාරයට කරගන්න අපට පුළුවන් වුණොත්, ඒ තුළින් අපේ තරුණ පරම්පරාවට ලොකු වැඩ කොටසක් කරරන්න අපට පුළුවන් කියන කාරණය කියන්න ඕනෑ.

රාජ්‍ය විශ්වවිද්‍යාලවලට දරුවන් බඳවා ගැනීමේ ප්‍රතිශතය වැඩි කරන්නත්, ඒ බඳවා ගන්නා දරුවන්ට ලබා දෙන උපාධියේ ප්‍රමිතිය වැඩි කරන්නත් එතුමා යෝජනා කරලා තිබෙනවා. අද අපි පිළිගන්න ඕනෑ කාරණාවක් තිබෙනවා. අද අපේ රටේ විශ්වවිද්‍යාල තිබෙනවා. ඒ විශ්වවිද්‍යාල තිබුණාට ඒ දරුවන්ට ඉංග්‍රීසි දැනුම නැහැ, පරිගණක පහසුකම් නැහැ, පරිගණක පාවිච්චි කිරීමේ හැකියාව නැහැ. ඒ නිසා මේ උදවිය යම් යම් දේශපාලන පක්ෂවල අතකොළු බවට පත් වෙනවා. තමන්ගේ මූලික යුතුකම්වත් ඉෂ්ට කරගන්න මේ අයට හැකියාවක් නැහැ. තමන්ගේ අම්මා, තාත්තාට සලකන එක පැත්තකින් තියලා අරගළ කරන්න, අරවා කරන්න, මේවා කරන්න ගිහිල්ලා අන්තිමට ජීවිත විනාශ කරගන්න තැනට පත් වෙලා තිබෙනවා. ඒ නිසා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේක ඉතාම හොඳ යෝජනාවක්. මේ සම්බන්ධයෙන් අපේ වැඩි අවධානය යොමු කරන්න ඕනෑ. අපේ තරුණ පරම්පරාවේ හැකියාව, දක්ෂතා ඔප් නංවාගෙන මේ රටට, සමාජයට යම් වැඩ කොටසක් කරන්න අපි ඉඩකඩ ලබා දිය යුතුයි.

අපේ අපනයන වෙළෙඳ පොළ ගැන කථා කරනවා නම්, ගරු ජනාධිපතිතුමා ආයෝජකයන් මේ රටට ආකර්ෂණය කර ගැනීම සඳහා යම් යම් යෝජනා ගණනාවක් ඉදිරිපත් කරලා තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ රටේ ව්‍යාපාර කරන එක පහසු කාරණයක් නොවෙයි කියන එක ඔබතුමා දන්නවා. අපි විදේශිකයන්ට මේ රටේ ව්‍යාපාර කරන්න අවස්ථාව ලබා දෙන්න කලින්, ස්වදේශිකයන්ට ව්‍යාපාර කරන්න අවශ්‍ය පහසුකම් ලබා දෙන්න අපට පුළුවන් නම් ඒක හොඳයි. අපේ රටේ ව්‍යාපාර කරන්න ගියාම විශාල අපහසුතාවකට ලක් වනවා. යම් කාරණයක් ඉෂ්ට කරගන්න ආයතන ගණනාවකට යන්න ඕනෑ. විශාල කාලයක් ඒ සඳහා ගතවෙනවා. පහසුවෙන් ව්‍යාපාර කරගෙන යෑමේ දර්ශකයක් දැන් ලෝකයේ රටවල තිබෙනවා. ඒ කියන රටවල් 190න් අපි ඉන්නේ පහළ ස්ථානයක. ඒක අපට හොඳ ලකුණක් නොවෙයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ නිසා, ආයෝජනවලට හිතකර පරිසරයක් අපේ රටේ නිර්මාණය කරන්න අපි උත්සාහ කරන්න ඕනෑ කියලා මම හිතනවා. ඒක අත්‍යවශ්‍ය කාරණයක් බවට පත් වෙලා තිබෙනවා. ඒ සඳහා අවශ්‍ය ප්‍රතිසංස්කරණ කරන්න මුදල් අමාත්‍යවරයා හැටියට ගරු ජනාධිපතිතුමා මේ අය වැයෙන් මුදල් වෙන් කරලා තිබෙනවා. ඒක හොඳ කාරණයක්.

ජනාධිපතිතුමා තවත් යෝජනාවක් කරනවා. මේ රටේ යල් පැන ගිය කම්කරු අණපනත් තිබෙනවා. ඒ කම්කරු අණ පනත් වර්තමානයට ගැළපෙන්නේ නැහැ. ඒ අණ පනත් වර්තමානයට ගැළපෙන ආකාරයට යථාවත් කරලා සේවා සේවක අයිතිවාසිකම් ආරක්ෂා වන ආකාරයට නව නීති හඳුන්වා දෙන්න කියලා ගරු ජනාධිපතිතුමා මේ අය වැයෙන් යෝජනාවක් ඉදිරිපත් කරලා තිබෙනවා. ඒක ඉතා හොඳ කාලෝචිත යෝජනාවක් කියන එක මම කියන්න ඕනෑ.

අපේ විදේශගත ශ්‍රී ලාංකිකයන් මේ රටේ යම් යම් ආයෝජන කරන්න පෙළඹෙනවා. එසේ පෙළඹෙනකොට සමහර වෙලාවට මේ අය විවිධ විධියේ වංචාවලට හසු වෙනවා. මේ අය මුදල් යොදවලා අපේ රටින් ඉඩමක් ගන්න ගියාම, වංචාවලට හසුවන අවස්ථා තිබෙනවා. ඉඩමක් මිල දී ගැනීමේ දී ඔප්පුවේ පිරිසිදුභාවය බලන්න ඕනෑ. සමහර වෙලාවට ඉඩමක් සල්ලි දීලා ගත්තාට පස්සේ, වෙන කෙනෙක් තමයි එහි අයිතිකාරයා වෙන්නේ. අපි දන්නවා, ඉඩම් කන්තෝරුවල විශාල වංචා වන බව. එහෙම වෙනකොට ආයෝජකයන්ගේ විශ්වාසනීයත්වය නැති වෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මේ අවස්ථාවේ හිටපු අධිකරණ ඇමති ගරු අලි සබ්රි මැතිතුමා සභාවේ ඉන්නවා. මම එතුමාට ස්තුතිවන්ත වෙන්න ඕනෑ. මොකද, එතුමාගේ කාලයේ තමයි කල් පැනගිය නීති අණ පනත් යථාවත් කරන්න කටයුතු කළේ. දැනට සති දෙක තුනකට කලින් ගරු අධිකරණ ඇමතිතුමා වංචා වැළැක්වීමේ ආඥා පනත ඇතුළුව ඉතා වැදගත් අණ පනත් රාශියක් සංශෝධනයට ලක් කරමින් මේ තිබෙන තත්ත්වය වෙනස් කරන්න කටයුතු කළා. ඒක ආයෝජනයට හිතකර තත්ත්වයක් කියන කාරණය අපි කියන්න ඕනෑ.

බස්නාහිර, වයඹ, හම්බන්තොට, ත්‍රිකුණාමලය පළාත් ආශ්‍රිතව විදේශ ආයෝජන ආකර්ෂණය කරන්න නව ආර්ථික කලාප ඇති කරන්න ගරු ජනාධිපතිතුමා මේ අය වැයෙන් යෝජනා කරලා තිබෙනවා. ඒක හොඳ යෝජනාවක්. දැනටමත් කටුනායක, බියගම, කොග්ගල වාගේ ප්‍රදේශවල නිදහස් ආර්ථික කලාප තිබෙන බව අපි දන්නවා. මේ ආර්ථික කලාපවලින් අපේ ආර්ථිකයට ලොකු පිටුවහලක් ලැබෙනවා. පිහිටුවීමට යෝජිත නව ආර්ථික කලාපවලිනුත් අපේ ආර්ථිකයට ලොකු ශක්තියක් ලැබේවි කියන සුබදායක සිතිවිල්ල අප තුළ තිබෙනවා. විපක්ෂයේ ගරු මන්ත්‍රීතුමන්ලාගෙන් මම බොහොම ගෞරවයෙන් ඉල්ලීමක් කරනවා, හැම දෙයක් ගැනම අසුබවාදී විධියට බලන්න එපා කියලා. කොරහේත් කිඹුල්ලු දකින, සමහර මන්ත්‍රීතුමන්ලාත් ඉන්නවා. එහෙම කරන්න එපා කියලා අපි ඒ අයට කියනවා.

ගරු ජනාධිපතිතුමා ආයෝජකයන් රටට අද්දවා ගන්න තවත් යෝජනා ගණනාවක් ඉදිරිපත් කරලා තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපට තිබෙන බරපතළ ප්‍රශ්නය තමයි විදේශ විනිමය. අපේ රටට හැකිතාක් විදේශ විනිමය ගෙන්වා ගැනීමේ වැඩ පිළිවෙළක් අපි ක්‍රියාත්මක කරන්න ඕනෑ. ඉන්දියාව, චීනය, තායිලන්තය, සිංගප්පූරුව වාගේ රටවල් සමඟ නව වෙළෙඳ ගිවිසුම් ඇති කර ගන්නත්, ඒ වාගේම දැනට තිබෙන ගිවිසුම් -

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, කථාව අවසන් කරන්න.

**ගරු නීතිඥ මොහාන් ප්‍රියදර්ශන ද සිල්වා මහතා**
(மாண்புமிகு சட்டத்தரணி மொஹான் பிரியதர்ஷன த சில்வா)
(The Hon. Mohan Priyadarshana De Silva, Attorney-at-Law)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට ගරු මිලාන් ජයතිලක මන්ත්‍රීතුමාගේ කාලයත් ලැබුණා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මිලාන් ජයතිලක මන්ත්‍රීතුමාට නියමිත කාලය විනාඩි 13යි, ඔබතුමාට නියමිත කාලය විනාඩි 13යි.

**ගරු නීතිඥ මොහාන් ප්‍රියදර්ශන ද සිල්වා මහතා**
(மாண்புமிகு சட்டத்தரணி மொஹான் பிரியதர்ஷன த சில்வா)
(The Hon. Mohan Priyadarshana De Silva, Attorney-at-Law)
ගරු මිලාන් ජයතිලක මන්ත්‍රීතුමා කථා කරන්නේ නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
එතුමාගේ විනාඩි 13ත් එක්ක ඔබතුමාට විනාඩි 26ක කාලයක් තිබෙනවා. ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් කථා කරන්න පුළුවන්.

**ගරු නීතිඥ මොහාන් ප්‍රියදර්ශන ද සිල්වා මහතා**
(மாண்புமிகு சட்டத்தரணி மொஹான் பிரியதர்ஷன த சில்வா)
(The Hon. Mohan Priyadarshana De Silva, Attorney-at-Law)
හොඳයි. එහෙම නම් මගේ කථාව මම කෙටි කරන්නම්.

ආයෝජන මණ්ඩලය ඇතුළුව තවත් ආයතන ගණනාවක් එකට එකතු කරලා තනි ආයතනයක් හදන්න එතුමා යෝජනා කළා. එතකොට ඒ කටයුතු කර ගැනීමේදී විශාල කාලයක් ඉතිරි වෙනවා.

මම අනෙක් කාරණා දෙක ගැන -ඩිජිටල්කරණයත්, හරිත ආර්ථිකයත් පිළිබඳ- කරුණු දක්වන්න යන්නේ නැහැ. නමුත්, ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාගේ ප්‍රතිපත්ති ප්‍රකාශය අරගෙන බැලුවොත් පෙනෙනවා, මේ රට සම්පූර්ණයෙන් ම ඩිජිටල් කරණය කිරීම ගැනත්, නීල හරිත ආර්ථිකයක් ගැනත් එතුමා පැහැදිලිව සඳහන් කරලා තිබුණ බව. හරිත ආර්ථිකය සහ නීල ආර්ථිකය ගැන ඉස්සෙල්ලාම කථා කළේ, ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා. අවාසනාවකට වාගේ එතුමාට ඒ කාර්යයන් කර ගන්න ලැබුණේ නැහැ. මොකද, රටේ ආර්ථික තත්ත්වය යහපත් නොවුණු නිසාත්, අකාලයේ එතුමාට ජනාධිපති ධුරයෙන් නික්ම යෑමට සිදු වූ නිසාත්. නමුත්, වර්තමාන ජනාධිපතිතුමා ඒ වැඩ පිළිවෙළ ඉදිරියට ගෙන යන්න කටයුතු කිරීම ගැන එතුමාට ස්තුතිවන්ත වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අනෙක් කාරණය මෙයයි. මේ සියලු දේවල් කරන ගමන් ගරු ජනාධිපතිතුමා සමාජ සුබසාධනය ගැනත් කථා කරනවා. එක මන්ත්‍රීතුමියක් මේ සභාවේ කථා කරද්දී කිව්වා, ළමා මන්ද පෝෂණය ගැන එක වචනයක්වත් මේ අය වැයේ නැහැ කියලා. නමුත් මේ රටේ ළමයින්ගේ පෝෂණය වෙනුවෙන් රුපියල් මිලියන 500ක් ජනාධිපතිතුමා මෙම අය වැයෙන් වෙන් කරලා තිබෙනවාය කියන කාරණය අපි පැහැදිලිව කියන්න ඕනෑ.

ඒ වාගේම සමාජ සුබසාධන පනතට අනුව ප්‍රතිලාභීන් තෝරා ගැනීමේ වැඩ කටයුත්ත ආරම්භ කරලා තිබෙනවා. මේ සභාවේ දී කළ චෝදනාවක් තමයි, සමෘද්ධිය ලබා දෙන්නේ දේශපාලන හිතවත්කම්වලට කියලා. නැහැ, ඒක වැරදියි. අපි කවදාවත් සමෘද්ධි ප්‍රතිලාභීන් තෝරා ගැනීමේ කටයුත්තක නිරත වෙලා නැහැ කියන එක අපි පැහැදිලිව කියන්න ඕනෑ. ග්‍රාමීය කමිටු තිබෙනවා. ඒ ග්‍රාමීය කමිටු හරහා තමයි ඒ ප්‍රතිලාභීන් තෝරන්නේ. ඒක සිදු වුණේ පසුගිය යහ පාලන ආණ්ඩුවෙන්. ඒක තමයි ඇත්ත කාරණය.

උදාහරණයක් හැටියට කිව්වොත්, ඒ ගැන අපි සොයා බලනකොට අපේ ගම්වල වැන් තිබුණු මිනිසුන්ටත් වැලිවිටිය-දිවිතුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් සමෘද්ධි සහනාධාර ලබා දීලා තිබුණු බව දැන ගන්න පුළුවන් වුණා. ඒක තමයි ඇත්ත. රජයක් හැටියට අපි ඒ විධියට කටයුතු කරන්නේ නැහැයි කියන කාරණය පැහැදිලිව කියන්න ඕනෑ. ඒ නිසා ඒ චෝදනාව අපි ප්‍රතික්ෂේප කරනවා.

ගරු ජනාධිපතිතුමාගේ අය වැය කථාවේදී, වැන්දඹුවන් සහ පහළ ආර්ථිකයක් තිබෙන උදවිය මේ රටේ ව්‍යවසායකයන් බවට පත් කිරීම ගැන කථා කළා. අපි දන්නවා, බංග්ලාදේශයේ ග්‍රාමීන් බැංකු ව්‍යාපාරය ගැන. ඒ ග්‍රාමීන් බැංකු ව්‍යාපාරය මහාචාර්ය යූනුස් ආරම්භ කරද්දී එතුමාට බරපතළ අර්බුදවලට, බරපතළ ප්‍රශ්නවලට මුහුණ පාන්න සිද්ධ වුණා. නමුත් එතුමා ඒ ප්‍රශ්න එකින් එක විසඳාගෙන ඒ කටයුතු ක්‍රියාත්මක කරගෙන ගියා. අපේ රටේ නායකයන් මහාචාර්ය යූනුස් අනුගමනය කළොත්, මා හිතන හැටියට මේ වැඩ පිළිවෙළ ශක්තිමත්ව කරගෙන යන්න පුළුවන් වෙයි.

දීර්ඝ වශයෙන් කථා කරන්න තිබුණත් ඒකට කාලය නැහැ. මට තව එක විනාඩියක් දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ජනාධිපතිතුමාගේ අය වැය කථාවේ බදු ගැන සඳහන් කර තිබෙනවා. එතුමා මීට පෙර අතුරු අය වැය ලේඛනයක් ඉදිරිපත් කරලා බදු වැඩි කළා. ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාගේ කාලයේ බදු අඩු කළා. ඒ බදු අඩු කළේ, කොවිඩ් - 19 වසංගතය නිසා ඇති වුණු තත්ත්වය තුළ මේ රටේ ව්‍යාපාරිකයන්ට ව්‍යාපාර කිරීම පහසු කරන්නයි. එතකොට මේ රටේ විපක්ෂය බදු අඩු කළාම ඒකට බැන්නා. දැන් රනිල් වික්‍රමසිංහ මැතිතුමා බදු වැඩි කළා. එතකොට මොකක්ද මේ ආර්ථික න්‍යායාචාර්යවරු කියන්නේ? බදු අඩු කරපු එකටත් බණිනවා, බදු වැඩි කරපු එකටත් බණිනවා. මේ උදවිය මේ රටේ ජාතික ආර්ථිකය ශක්තිමත් කරන්න ලබාදෙන ආර්ථික වැඩ පිළිවෙළ මොකක්ද? නිකම් කටින් බතල ඉන්දන එක තමයි මේ උදවිය කරන්නේ.

දීර්ඝ වශයෙන් කථා කරන්න කාරණා තිබුණත්, කල්වේලා නැති නිසා මා දීර්ඝ වශයෙන් කථා කරන්නේ නැහැ. මට මේ අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් ස්තුතිවන්ත වෙනවා. අවසාන වශයෙන්, පක්ෂ, විපක්ෂ සියලු මන්ත්‍රීවරුන්ගෙන් මා ඉල්ලීමක් කරනවා. අද අපි රටක් හැටියට ඉන්නේ හොඳ තැනක නොවෙයි. දේශපාලනය කරන්නත් අපට රටක් තිබෙන්න ඕනෑ; අපට මිනිස්සු ඉන්න ඕනෑ. ඒ නිසා අපි 225දෙනාම එකතුවෙලා ශක්තිමත් වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කළොත් විතරයි මේ රටට සහනයක් ලැබෙන්නේ. ඒ නිසා අපි එකතුමුතුව වැඩ කරමු. ගරු ජනාධිපතිතුමා ගෙන යන වැඩ මේ පිළිවෙළට අපේ සහාය ලබා දෙමුයි කියන ඉල්ලීම කරමින් මගේ කථාව අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මයන්ත දිසානායක මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.34]

**ගරු මයන්ත දිසානායක මහතා**
(மாண்புமிகு மயந்த திசாநாயக்க)
(The Hon. Mayantha Dissanayake)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු ජනාධිපති රනිල් වික්‍රමසිංහ මැතිතුමා අය වැය ලේඛනය ඉදිරිපත් කරන අවස්ථාවේ අපි කල්පනා කළේ, අපට හිතුණේ, ඒක රාජාසන කථාවක්ද, එහෙම නැත්නම් මුදල් ඇමතිවරයා හැටියට කරන කථාවක්ද කියන කාරණය. ඒ අය වැය කථාව අහගෙන ඉන්නකොට අපට හිතුණා, එතුමාගේ ඒ ප්‍රතිපත්ති ප්‍රකාශනයත් එක්ක, එහෙම නැත්නම් රාජාසන කථාවත් එක්ක සියයට 98ක් විතර අපට එකඟ වෙන්න පුළුවන් කියලා. මේ වැටී තිබෙන ආර්ථික ප්‍රපාතයෙන් මේ රට ගොඩ ගන්නේ කොහොමද කියලා ජනාධිපතිවරයා හැටියටත්, මුදල් ඇමතිවරයා හැටියටත් එතුමා මේ අය වැය ලේඛනය තුළින් ඉතා පැහැදිලිව ප්‍රකාශ කළේ නැහැයි කියන කාරණය කනගාටුවෙන් හෝ මේ අවස්ථාවේ ප්‍රකාශ කරන්න ඕනෑ.

සමහරු කල්පනා කරනවා, දෙසැම්බර් මාසයේ IMF එකෙන් සල්ලි ටික ලැබුණාම, ලබන අවුරුද්දේ ජනවාරි මාසය හා පෙබරවාරි මාසය වනකොට මේ රටේ තිබෙන සියලු ප්‍රශ්න අපට විසඳන්න පුළුවන් කියලා. අපි බලන්න ඕනෑ, මේ වාගේ ආර්ථික ප්‍රශ්නවලට මුහුණ දීලා තිබෙන ලෝකයේ අනිකුත් රටවල් පිළිබඳව. විශේෂයෙන්ම ආර්ජන්ටිනාව හා ග්‍රීසිය දිහා බැලුවාම පෙනෙනවා, අඩුම තරමින් අවුරුදු 10ක්වත් යනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙවැනි ගැටලුවකින් රටක් ගොඩ එන්න. එන අවුරුද්දේ මැද භාගය වනකොට අපි මේ ප්‍රශ්නයෙන් ගොඩ එන්නේ නැහැ. IMF එකේ සල්ලි එක වරටම ගලාගෙන එන්නේ නැහැ. පක්ෂ දේශපාලන මතය මොනවා වුණත්, මේ පාර්ලිමේන්තුවේ ඉන්න මන්ත්‍රීවරුන් හැටියට, මේ රටේ ඉන්න නායකයන් හැටියට අපි ජනතාවත් එක්ක සුහදව සාකච්ඡා කරලා, ගම් මට්ටමින්, ආසන මට්ටමින්, දිස්ත්‍රික් මට්ටමින් ජනතාව දැනුවත් කරන්න ඕනෑ, මේ ගැටලුවට මුහුණ දෙන්න රටක් හැටියට සියලු දේශපාලන පක්ෂ එකතුවෙලා වැඩ කරන්න ඕනෑය කියලා. මා ඒ ඉල්ලීම මේ අවස්ථාවේ කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ අය වැය ලේඛනය දිහා බලනකොට ඇත්තෙන්ම අපට කනගාටුයි. අපි හිතනවා, රනිල් වික්‍රමසිංහ මැතිතුමා මුදල් ඇමතිතුමා හැටියට ප්‍රතිපත්තිමය ප්‍රකාශයක් කරන්නේ නැතුව, ඇත්තෙන්ම මේ රටේ ආණ්ඩුවේ තිබෙන වියදම් පිළිබඳව යම්කිසි වැඩසටහනක් ආරම්භ කළා නම් හොඳයි කියලා.

අපි වියදම් පාලනය කරන්න අවශ්‍යයි. වියදම් පාලනය කරන්නේ නැතිව අපි මොන දේ කළත් වැඩක් වෙන්නේ නැහැ. විශේෂයෙන්ම ආණ්ඩුවේ වියදම් පාලනය කරන්නේ නැතිව අපට මේ රට ගොඩ දාන්න බැහැ. අපි ඒ අදහසේ ඉන්නවා: there has to be a mechanism to bring down Government expenditure. එහෙම කරන්නේ නැතිව අපට මේ රට ගොඩ ගන්න බැහැ. ඒ වාගේම තමයි, ආණ්ඩුව කොහොමද revenue සඳහා බදු එකතු කරන්න යන්නේ? ඒ බදු දැල තවදුරටත් පුළුල් කරන්න යන්නේ කොහොමද කියන වැඩසටහනක් ගරු ජනාධිපතිතුමා, මුදල් ඇමතිතුමා හැටියට ඉදිරිපත් කළේ නැහැ. දැන් උත්තේජන පැකේජයක් අනිවාර්යයෙන්ම අපේ ජනතාවට දෙන්න අවශ්‍යයි. මේ වන විට අපේ රටේ ජනතාව දරන පීඩනය පිළිබඳව අපි මේ පාර්ලිමේන්තුවේ සාකච්ඡා කරලා තිබෙනවා. අපේ රටේ දුප්පත් ජනතාවට යම්කිසි පැකේජයක් දෙන්නේ නැතිව ඉදිරියට යන්න අපට බැහැ. විශේෂයෙන්ම මේ රටේ පීඩිත පන්තියේ ඉන්න දුප්පත් ජනතාවට අනිවාර්යයෙන්ම සහනයක් ලැබෙන ක්‍රමයක් සකස් කළ යුතුයි කියලා අපි මේ අවස්ථාවේදී යෝජනා කරනවා.

විශේෂයෙන්ම අපේ රටේ උද්ධමනය - inflation - පාලනය කරන ක්‍රමයක් ඇති කරන්න ඕනෑ. විශේෂයෙන්ම රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේදී කථා කරනකොට අපට නිලධාරින් පවසන්නේ, එන අවුරුද්දේ දෙසැම්බර් මාසය වන විට උද්ධමනයේ යම්කිසි පාලනයක් කර ගන්න පුළුවන් වෙයි කියලායි. හැබැයි, ඒ පිළිබඳවත් හරි වැඩසටහනක්, හරි ක්‍රමයක් මේ අය වැය ලේඛනයේ සඳහන් කරලා නැහැ කියන එක අපි සඳහන් කරන්න ඕනෑ.

Sir, this Budget has brought about projections and predictions which are unrealistic and cannot be materialized. So, in a situation of that nature, how are we going to get out of this mess? There is no mention of an anti-corruption law. We have spoken about it; we have even spoken about it with the Hon. Minister of Justice, Prison Affairs and Constitutional Reforms and he said that the Government policy will be to bring about an anti-corruption law. However, there is no mention of an anti-corruption law, which is a must, at all in the Budget Proposals of the Hon. President as Minister of Finance.

Private universities - you all were listening to the President's Budget Speech - we welcome, as a policy, but we must know, Hon. Chair, what the plan is. How are you going to introduce private universities into this country?

අපි MCC ගිවිසුම ගේන අවස්ථාවේදී තමුන්නාන්සේලා විපක්ෂයේ ඉඳගෙන ඒ ගිවිසුම ඉරලා, ඒක කවදාවත් ක්‍රියාත්මක කරන්නේ නැහැ කියලා කිව්වා. අපරාදේ! ඒකෙන් ඒ නිසා ඩොලර් මිලියන 500ක් විතර මේ රටට අහිමි වුණා. මම මේ අවස්ථාවේදී ඒකත් මතක් කරලා දෙන්න ඕනෑ. මේ පාර්ලිමේන්තුවෙන්ම තමයි ඒ දේ කළේ.

දේශීය ණය පිළිබඳවත් අපි කථා කරන්න ඕනෑ. අපි දේශීය ණය ගෙවන්න යන්නේ කොහොමද? අද බැංකු හිරවෙලා. අද අපට දේශීය ණය ගෙවන්න ප්‍රතිපත්තියක් තිබෙනවා ද, එහෙම නැත්නම් අපි තවදුරටත් සල්ලි අච්චු ගහලා මේ ප්‍රශ්නයෙන් ගැළවෙන්න උත්සාහ කරනවා ද කියලා කල්පනා කරන්න ඕනෑ. Are we going to print money and pay back, which we cannot afford to do? Today, there is a serious liquidity problem with the banks. So, unless we address these things and at least introduce a moratorium package for people who have taken loans, again there will be a huge cash flow problem by mid next year. ඒ වාගේම මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, the tax bracket is not being expanded and there is also no plan to get more taxpayers in.

ඒ වාගේම, පාර්ලිමේන්තුවේ estate workersලා පිළිබඳව කථා කළා. අපේ වතුකර ජනතාවට මේ අය වැයෙන් ලබාදීලා තිබෙන්නේ මොනවාද? මම කියන්නේ නැහැ හැම අය වැයකින්ම "දියව්, දියව්" කියන ප්‍රතිපත්තියට යන්න ඕනෑ කියලා. හැබැයි, මේ

රට වැටිලා තිබෙන තැනින් ගොඩ ගන්න නම්, අපි විශේෂයෙන්ම වතුකරයේ ජනතාවට අනිවාර්යයෙන්ම Budget එකෙන් යම්කිසි සහනයක් ලබා දිය යුතුයි. මම අද උදේ අහගෙන හිටියා, ගරු රමේෂ් පතිරණ ඇමතිතුමාගේ කථාව. ඒක ඉතා හොඳ කථාවක්. මම ඒකට එතුමාට ස්තුතිවන්ත වෙනවා. හැබැයි, අනිවාර්යයෙන්ම වතුකර ජනතාව වෙනුවෙන් අපි යම්කිසි දෙයක් කරන්න ඕනෑ. තේ කර්මාන්තය වෙනුවෙන් අපි අනිවාර්යයෙන්ම කටයුතු කරන්න ඕනෑය කියන එකත් මේ අවස්ථාවේදී සඳහන් කරන්න ඕනෑ.

විශේෂයෙන්ම ආරක්ෂක අමාත්‍යාංශයේ වැය ශීර්ෂය, Defence Ministry Vote එක, පිළිබඳව අද මේ රටේ මිනිස්සු කථා කරනවා. අද ඒ මිනිස්සු අහන ප්‍රශ්නයක් තමයි, අධ්‍යාපනය වෙනුවෙන් වැඩිය මුදල් වෙන් කරන්නේ නැතුව ආරක්ෂක අමාත්‍යාංශයට මෙච්චර මුදලක් වෙන් කර තිබෙන්නේ ඇයි කියලා. රටේ මිනිස්සු ඒ ගැන කතා කරනවා.

කාන්තාවන්ට අද මේ රටේ සිදු වන හිංසන බලන්න. කාන්තාවකට පාරේ බැහැලා යන්න පුළුවන් තත්ත්වයක් ඇති කරන්න, ඒවාට මුහුණ දෙන්න අපි අනිවාර්යයෙන්ම ප්‍රතිපත්තිමය වශයෙන් නීතිරීති ගෙනෙන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම අවසාන වශයෙන් මහවැලිය පිළිබඳව කතා කරන්න ඕනෑ. අපි හිතුවා 1994 චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනිය බලයට ආවාම, මගේ පියාගේ, ගාමිණී දිසානායක මැතිතුමාගේ ශ්‍රේෂ්ඨ නම මහවැලියෙන් මකා දමන්න උත්සාහ කරයි කියලා. හැබැයි එහෙම වුණේ නැහැ. මට මතකයි මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා මහවැලි විෂය භාර ඇමතිවරයා හැටියට සිටියදී ඇත්තෙන්ම කොත්මලේ ඇතුළු මහවැලි ප්‍රදේශවල මහවැලි ඉඩම් ආරක්ෂා කරලා දුන්නා. ඒ ගැන අද මම එතුමාට ස්තුතිවන්ත වෙන්න ඕනෑ. ඒ වාගේම මහින්ද රාජපක්ෂ මැතිතුමා බලයට ආවාම අපි නැවතත් කල්පනා කළා, ගාමිණී දිසානායක මැතිතුමාගේ නම මහවැලියෙන් මකන්න, අමතක කරවන්න උත්සාහ කරයි කියලා. හැබැයි, මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ පාලන කාලයේත් එහෙම දෙයක් වුණේ නැහැ කියලා මම සඳහන් කරන්න ඕනෑ. හැබැයි, මෙවර අය වැය ලේඛනයට ඇතුළත් කර තිබෙන ප්‍රතිපත්ති මාලාව හරහා ඒ සඳහා උත්සාහයක් තිබෙන බව මම ඉතා වේදනාවෙන් සඳහන් කරන්න ඕනෑ.

ගාමිණී දිසානායක මැතිතුමා 1978-1979 කාලයේ මහවැලි අධිකාරිය පනත ගෙනෙන කොට, දිස්ත්‍රික්කයක් තුළ, මහවැලි කලාප තුළ මහවැලි අධිකාරියට අවශ්‍ය ඉඩම් බලතල ලබා දුන්නා. හැබැයි, මේ ප්‍රතිපත්ති මාලාව හරහා අද ඒක මකන්න උත්සාහයක් කරන බව මා ඉතා කනගාටුවෙන් සඳහන් කරන්න ඕනෑ. විශේෂයෙන්ම මේ ගැන අපේ වන්න ජයසුමන මන්ත්‍රීතුමාත් කතා කළා. මේ ප්‍රතිපත්තිය අනිවාර්යයෙන්ම වෙනස් කරන්න ඕනෑ කියලා, මම මුදල් ඇමතිවරයා වශයෙන් ඉන්න ජනාධිපතිතුමාගෙනුත්, ආණ්ඩුවේ ඉන්න ඇමතිවරු සියලු දෙනාගෙනුත් ඉල්ලා සිටිනවා. මොකද, මහවැලියට මේ විධියට හානියක් කරන්න ඉඩ දෙන්න බැහැ. විශේෂයෙන්ම විදුලිය සහ කෘෂිකර්මය පැත්තෙන් මේ රටේ ආර්ථිකයට තවමත් විශාල ශක්තියක් දෙන ව්‍යාපෘතියක් තමයි කඩිනම් මහවැලි ව්‍යාපාරය. ඒ නිසා ජනාධිපතිතුමා ඇතුළු ආණ්ඩුවේ මැති ඇමතිවරු සියලුදෙනාගෙන් මා ඉල්ලා සිටින්නේ මහවැලිය ආරක්ෂා කරන්න, මහවැලිය කේන්ද්‍ර කර ගත් තව යෝජනා ක්‍රියාත්මක කරන්න, මහවැලි ප්‍රදේශවල ජීවත් වන -විශේෂයෙන්ම "සී" කලාපය, "බී" කලාපය වැනි කලාපවල - ගොවි මහතුන් ආරක්ෂා කරගෙන වැඩකටයුතු කරන්න කියලායි. මේ ඉඩම් ප්‍රතිපත්තිය අනිවාර්යයෙන්ම වෙනස් කරලා නැවත වරක් මහවැලි අධිකාරියට ඒ බලය ලබා දෙන්න කියලා ඉල්ලා සිටිනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ කාලය ලබා දීම පිළිබඳව විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමාටත්, ඒ වාගේම ඔබතුමාටත් මගේ ස්තුතිය පිරිනමනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු රාජිකා වික්‍රමසිංහ මන්ත්‍රීතුමිය. ඔබතුමියට විනාඩි 15ක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.45]

**ගරු රාජිකා වික්‍රමසිංහ මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ராஜிகா விக்கிரமசிங்ஹ)
(The Hon. (Mrs.) Rajika Wickramasinghe)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 77 වන අය වැය ලේඛනය සම්බන්ධ විවාදය පැවැත්වෙන මේ මොහොතේ, ඒ ගැන අදහස් දක්වන්නට පෙර, මා විශේෂයෙන්ම මතක් කළ යුතු කාරණයක් තිබෙනවා.

අද මාධ්‍යවලින් -මොන මාධ්‍ය ක්ෂේත්‍රය ගත්තත්- අපේ දූවා දරුවන්, කාන්තාවන් සහ ඒ අය ලක් වන පීඩාව, හිංසාව ගැන කතා වෙනවා. විශේෂයෙන්ම රජයට සහ රටේ සමස්ත පුරවැසියන් විධියට අපේ අනාගත පරපුර රැක ගැනීමට අපට වගකීමක් තිබෙනවා. අපේ ආර්ථිකය කොතරම් සංවර්ධනය වුණත් වැඩක් නැහැ, අපේ අනාගත පරපුර පීඩාවට පත් වනවා නම්, විනාශ වනවා නම්. අපි මේ කාලවකවානුවේ රටේ ආර්ථිකය ගොඩනහන්න කටයුතු කරනවා වාගේම, අපේ දූවා දරුවන්ගේ ආරක්ෂාව සහ සෞඛ්‍ය වෙනුවෙන් අවධානය යොමු කළ යුතුයි. විශේෂයෙන්ම ආරක්ෂාව වෙනුවෙන් වැඩි අවධානය යොමු කරන්න කියන ඉල්ලීම මේ සභාවට මම ඉදිරිපත් කරනවා. මොකද, අපි උදේ පාන්දර සාලේ පුටුවක් උඩ ඉඳ ගත්තොත් අහන්න වෙන්නේ ඉතාම ඛේදනීය දේවල්; දුක්ඛදායක දේවල්. ඒ නිසා තමයි මේ අවස්ථාවේ ඒ ගැන විශේෂ අවධානයක් යොමු කරලා, අදාළ නීතිය ක්‍රියාත්මක කරමින් දරුවන් ආරක්ෂා කර ගන්න කටයුතු කරන්න කියන ඉල්ලීම කරන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ඉතා අමාරු කාලවකවානුවක් බව අපි දන්නවා. රටේ ආර්ථිකය සහ සංවර්ධනය කඩා වැටුණු යුගයක තමයි අද අපි ඉන්නේ. ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ මේ අය වැය තුළින් අපි කරන්නේ ලෝකයට ණය වෙමින් මහුල් කන තාලයේ වැඩක් නොවෙයි. අපි බලාපොරොත්තු වන්නේ මේ ආර්ථික ක්‍රමය තුළින් අපේ ශක්තියෙන් ගොඩ නහන්න පුළුවන් රටකට ප්‍රවේශ වන එකයි. ඒක තමයි එතුමාගේ අරමුණ, තේමාව සහ අධිෂ්ඨානය වන්නේ.

1970 හිටපු මුදල් ඇමති ආචාර්ය එන්.එම්. පෙරේරා මහතා මේ ආකාරයෙන්ම ප්‍රතිපත්ති ක්‍රියාවට නංවන්න පුළුවන් අය වැයක් ඉදිරිපත් කළා. හැබැයි එතුමාට ඒක ක්‍රියාත්මක කරන්න පුළුවන්කමක් තිබුණේ නැහැ. ඒ වැරැද්ද මෙවරත් කරන්නේ නැතුව, රජය ශක්තිමත් සැලැස්මක් ක්‍රියාත්මක කරලා, ඒක ක්‍රියාත්මක කරන්න පුළුවන් යාන්ත්‍රණයක් හදලා මේ රටේ ජනතාව බලාපොරොත්තු වන ආර්ථික සංවර්ධනයක් ඇති රටක් ගොඩනහන්න ඕනෑ. ධනාත්මකව හිතලා මේ ප්‍රතිපත්ති ප්‍රායෝගිකව ක්‍රියාත්මක කරන්න පුළුවන් ආකාරයට කටයුතු කරන්න කියන ඉල්ලීම අපි කරන්න ඕනෑ. අය වැයක් තුළින් අපි හැම දාම යෝජනා, ප්‍රතිපත්ති ඉදිරිපත් කරනවා. හැබැයි ඒවා ක්‍රියාත්මක කිරීමේදී කොතරම් දුරට සාර්ථකද කියන එක අපි අද දකිමින් ඉන්නවා. ඒ නිසා අය වැය යෝජනා ක්‍රියාත්මක කරන්න අධීක්ෂණ කාර්ය සාධක බලකායක් පත් කරන්න කටයුතු කරන

[ගරු රාජිකා වික්‍රමසිංහ මහත්මිය]

එක ගැන අපි සතුටු වෙනවා. මේ සියලු යෝජනා, යෝජනා පමණක් බවට පත් නොවී අධීක්ෂණය කරමින් ක්‍රියාත්මක කරන්න පුළුවන් නම් ඒක තමයි විය යුතු වන්නේ.

අපේ රටේ ආර්ථිකයට දේශීය කර්මාන්ත දායක කර ගන්නවා වාගේම, අපේ රට ආර්ථික වශයෙන් ශක්තිමත් කිරීමට තරුණ කාන්තාවන් දායක කර ගනිමින් ඒ ගොල්ලන් නියැළෙන ක්ෂේත්‍ර, ව්‍යාපාර, ස්වයං රැකියා සඳහා දායකත්වය ලබා දෙන්න රජයක් විධියට අප කටයුතු කර තිබෙනවා. ඒ කරුණු අය වැය මේ ප්‍රතිපත්ති මාලාවට ඇතුළත් කරලා තිබෙනවා. ඒ තරුණ ව්‍යවසායකයන් සහ කාන්තාවන් තෝරා ගැනීමේදී ක්‍රමානුකූලව, වෘත්තීය දක්ෂතාව, හැකියාව අනුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් හෝ නිවැරදි ආකාරයෙන් ඒ තෝරා ගැනීම කළ යුතුයි. අද ගම්වල විශාල වශයෙන් කාන්තාවන් සහ උගත් බුද්ධිමත් තරුණ පිරිසක් ඉන්නවා. තමන්ගේ හැකියාව, දක්ෂතාව තුළින් ආර්ථිකය ශක්තිමත් කරන වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්න පුළුවන් පිරිසක් ඉන්නවා. කෘෂි කර්මාන්තය පැත්තෙන් හෝ වෘත්තීය හැකියාව පැත්තෙන් ගන්න පුළුවන් පිරිස නිවැරදිව තෝරා ගෙන, කුටුම්භය සවිබල ගැන්වීම යන තේමාවත් එක්ක මේ කටයුතු ක්‍රියාත්මක කළ යුතුයි. ඒ ගොල්ලන්ට පුහුණුව දීමෙන්, රජයෙන් දෙන්න පුළුවන් උපරිම සහයෝගය ලබා දීමෙන් අපේ රටේ ආර්ථිකයට ඒ තරුණ තරුණියන් ඇතුළු සියලුදෙනා දායක කරගන්න පුළුවන්. ඒ තුළින් රටේ ආර්ථිකයට ලොකු ශක්තියක් ලබාගන්න පුළුවන් හැකියාව තිබෙනවා.

කෘෂි කර්මාන්තය පැත්තෙන් බොහෝ දේවල් ක්‍රියාත්මක කරන්න රජයක් විධියට දැඩි අවධානය යොමු කර තිබෙන කාල වකවානුවක් මේ. මා නියෝජනය කරන දිස්ත්‍රික්කය ගත්තොත්, වැවිලි ක්ෂේත්‍රය, කිතුල් ව්‍යාපාරය, තේ කර්මාන්තය, මැටි කර්මාන්තය වැනි ක්ෂේත්‍රවල විශාල පිරිසක් නියැළිලා ඉන්නවා. මේ දේවල් ක්‍රමානුකූලව ක්‍රියාත්මක කරන්න පුළුවන් නම්, ඒ තුළින් රටේ ආර්ථිකය වාගේම, ඒ අයගේ ගෙදර ආර්ථිකයත් ගොඩනඟා ගන්න පුළුවන් වටපිටාවක් හදලා දෙන්න පුළුවන්. නමුත් ඒ කටයුතු අධීක්ෂණය කරමින් ක්‍රියාත්මක කළොත් තමයි සාර්ථක වන්නේ. ඒ ශ්‍රම බලකායට කාන්තාවන්ගේ දායකත්වය ලබා ගන්න ඕනෑ. අපට මේ කඩා වැටුණු ආර්ථිකය ශක්තිමත්ව ගොඩනඟන්න පුළුවන් ඉහළ දායකත්වයක් ඒ අයගෙන් ලබා ගන්න පුළුවන් වෙනවා. අද බුද්ධිමත් කාන්තා නියෝජනයක් ශ්‍රම බලකාය තුළ ඉන්නවා. ඒ වාගේම බුද්ධිමත් කාන්තාවෝ අද උසස් තනතුරු දරනවා. ඒ නිසා ශ්‍රම බලකායට කාන්තාවන්ගේ දායකත්වය ලබා ගැනීම සම්බන්ධයෙන් රජයේ දැඩි අවධානය යොමු කරන්න කියන ඉල්ලීම නිරන්තරයෙන්ම මම කරනවා. හැකියාව, දක්ෂතාව ඇති, වෘත්තීය හැකියාව අනුව ඉදිරියට යන්න පුළුවන් කාන්තාවන් ගම්වල සිටිනවා.

සංචාරක ක්ෂේත්‍රය තුළින් අද රටේ ආර්ථිකය ගොඩනඟන වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන්න ජනාධිපතිතුමා යෝජනා කර තිබෙනවා. අපේ දිස්ත්‍රික්කය නියෝජනය කරන කිතුල්ගල ආශ්‍රිතව whitewater rafting ක්‍රීඩාව දියුණු කරන්න මෙතෙක් කාලයක් අපි යෝජනා ඉදිරිපත් කළත්, ඒ පිළිබඳව කථාබහට යොමු කළත්, ඒ ක්‍රීඩාව වැඩි දියුණු කරන්න අය වැය තුළින් යම් අවස්ථාවක් තිබුණේ නැහැ.

හැබැයි, මෙවර අය වැය තුළින් එම යෝජනාව ක්‍රියාත්මක කරන්න කටයුතු කරලා තිබෙනවා. පුහුණු වැඩසටහන් ලබා දීලා ඒ ක්ෂේත්‍රයේ නියැළෙන පිරිස වෙනුවෙන් රක්ෂණ ක්‍රමයක් ක්‍රියාත්මක කරන්නත් යෝජනා කරලා තිබෙනවා. රටේ ආර්ථිකය ගොඩ නඟන වැඩ පිළිවෙළ තුළ මෙතෙක් කථා බහ නොවුණු ඒ ක්ෂේත්‍රය වෙනුවෙන් වැඩි අවධානයක් යොමු වීම ගැන මට සතුටක් තිබෙනවා.

රටේ ආර්ථිකය කොතරම් අමාරු වුණත්, මාර්ග ප්‍රශ්නය නිසා අද අපේ ගම්වල ජනතාව දැඩි දුෂ්කරතාවට පත් වෙලා තිබෙනවා. මං මාවත් රටක ආර්ථිකයට විශාල වශයෙන් බලපානවා. අද අපේ ආර්ථික ප්‍රශ්නත් එක්ක රටේ සංවර්ධනය, ගමේ සංවර්ධනය නැවතිලා තිබෙනවා. හැබැයි, මං මාවත් රටේ ආර්ථිකය, ජනතාවගේ ආර්ථිකය ගොඩ නගන්න විශාල දායකත්වයක් ලබා දෙනවා. පාර හොඳට තිබුණේ නැත්නම්, ගමනාගමන අපහසුතා මතු වෙනවා. යටියන්තොට, රුවන්වැල්ල, දැරණියගල කියන්නේ කෑගල්ල දිස්ත්‍රික්කයේ තිබෙන අති දුෂ්කර ගම්මාන. ඒ ගම්මානවල පාරවල් සම්බන්ධයෙන් ජනතාව අනන්ත අප්‍රමාණ ප්‍රශ්න ඉදිරිපත් කරනවා. රටේ ආර්ථිකය තුළ ඒ දේවල් ගොඩ නගන්න බැරි බවත් ජනතාව තේරුම් අරගෙන තිබෙනවා. හැබැයි, අපි ඒ පිළිබඳව දැඩි අවධානය යොමු කරන්න ඕනෑ. ඒ සඳහා යම් මුදල් ප්‍රමාණයක් වෙන් කරලා තිබෙනවා. මාර්ග පද්ධතිය නිසි ආකාරයෙන් ගොඩ නැඟීම තුළින් ගම්වල ජනතාවගෙන් රටේ ආර්ථිකයට විශාල දායකත්වයක් ලබා ගන්න පුළුවන් බව මම මතක් කරන්න ඕනෑ. ඒ නිසා ඒ ගැන අවධානය යොමු කරන්න ඕනෑ.

අපේ රටේ ආර්ථිකය ගොඩ නගන ක්‍රියාවලිය තුළ කුරුඳු වගාව සඳහා විශේෂ අවස්ථාවක් උදා කරලා දීලා තිබෙනවා. අපේ ප්‍රදේශවල රජයට අයත්, ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අයත් ඉඩම් තිබෙනවා. කෘෂිකර්මාන්තය පැත්තෙන් ඉදිරියට එන පිරිස වෙනුවෙන් ඒ ඉඩම් නිදහස් කිරීමේ ගැටලු තිබෙනවා. අද තරුණ පිරිස වාගේම කාන්තාවන් කෘෂිකර්මාන්තයේ නියැළෙන්න බලාපොරොත්තුවෙන් ඉන්නවා. හැබැයි, ඒ අයගේ ව්‍යාපෘති ක්‍රියාත්මක කරන්න යෑමේදී ඉඩම් නිදහස් කර ගැනීමට අදාළව අද ඒ පිරිස බොහෝ ගැටලුවලට මුහුණ දීලා තිබෙනවා. අවශ්‍ය ඉඩම් නොලැබීම නිසා කෘෂි ක්ෂේත්‍රය අමතක කරලා වෙනත් දේවල්වලට යොමු වන අවස්ථාවක් උදා වෙලා තිබෙනවා. ඒ ගැනත් අපි දැඩි අවධානය යොමු කරන්න ඕනෑ.

ඒ වාගේම මෙවර අය වැය යෝජනාවලින් ගරු ජනාධිපතිතුමා රජය සතු ඉඩම් නිදහස් කිරීමේ බලය ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට ලබා දීමට යෝජනා කර තිබෙනවා. ඒ කටයුත්ත ක්‍රමානුකූලව ක්‍රියාත්මක වෙයිද කියන ප්‍රශ්නය අප තුළ තිබෙනවා. ඒ නිසා ඒ බලය ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට ලබා දීම සුදුසුද කියලා නැවත වරක් හිතා බලන්න කියලා විශේෂයෙන්ම මම මේ මොහොතේ ඉල්ලා සිටිනවා. මොකද, ප්‍රාදේශීය ලේකම් කාර්යාල හරහා රජයේ ඉඩම් බලපත්‍ර ලබා දීමේදී ගැටලු ඇති වෙන්න පුළුවන්. අපේ ජනතාව බොහෝ වේලාවට බලන්නේ, සින්නක්කර ඔප්පුවක් මඟින් ප්‍රාදේශීය ලේකම් කාර්යාල හරහා ඉඩමක් දුන්නොත්, ඒක විකුණලා මොකක් හරි ගෙදර දොරේ වැඩක්, තමන්ගේ වැඩක් බලා කියා ගන්නයි. යම් ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීමේ ඕනෑකමක් ජනතාව තුළ ඇති වන්නේ නැහැ. ඒ නිසා තමයි ඒ යෝජනාව පිළිබඳව විශේෂ අවධානය යොමු කරන්නේ.

කිතුල් ආශ්‍රිත නිෂ්පාදන වැඩි දියුණු කරන්න පුළුවන්, මැටි කර්මාන්තය, තේ කර්මාන්තය දියුණු කරන්න පුළුවන් දිස්ත්‍රික්කයක් වන අපේ දිස්ත්‍රික්කයට වැඩි සහනයක් ලබා දෙන්න පුළුවන් නම් හොඳයි. එහෙම කළොත් ඒ ආශ්‍රිත නිෂ්පාදන තව තවත් වැඩි දියුණු කර ගන්න අපේ ජනතාව බොහොම ඕනෑකමින් බලාගෙන ඉන්නවා. අද කාලයේ හැමෝටම රජයේ රැකියා දෙන්න බැහැ. ඒ නිසා ජනතාව නියැළෙන ක්ෂේත්‍ර වැඩි දියුණු කර ගන්න තමයි අපි වැඩි අවධානය යොමු කරලා කටයුතු කරන්න ඕනෑ.

ඒ සියලු දේ එක්ක මේ 77 වන අය වැය යෝජනාවලිය තුළ, උසස් අධ්‍යාපනය ලබන, විශ්වවිද්‍යාල වරම් ලබන දරුවන්ගේ ප්‍රතිශතය වැඩි කරලා තිබෙනවා. ඒ ගැන අපි සතුටු වෙනවා. උගත් බුද්ධිමත් පිරිසක් මේ රටට දායාද වීම වාගේම, අපේ රටේ ඉදිරි අනාගතය සඳහා, ආර්ථික වශයෙන් රට සංවර්ධනය කිරීම සඳහා උගත් බුද්ධිමත් පිරිසගේ දායකත්වය ලබා ගැනීම හොඳ දෙයක්. හැබැයි, විශ්වවිද්‍යාල වරම් ලබා ගෙන උපාධිය ලබා ගත්තාට පසුව ඒ තරුණ පිරිස හිතන්නේ අපි උපාධියක් ගත්තා, අපට අනිවාර්යයෙන්ම රජයෙන් රැකියාවක් ලබා දිය යුතුයි කියලායි. ඒ මානසිකත්වය අපි වෙනස් කරන්න ඕනෑ. උගත් බුද්ධිමත් පිරිස රජයේ රැකියාවක් බලාපොරොත්තු වන මානසිකත්වයෙන් ඉවත් කරලා, තමන්ගේ හැකියාව, දක්ෂතාව අනුව යම් ව්‍යාපෘතියක නියැළෙන්න පුළුවන් කියන මානසිකත්වය ඔවුන් තුළ ඇති කළ යුතුයි.

විශ්වවිද්‍යාලයෙන් නික්මෙනකොට ඒ මානසිකත්වය හදන්න අපට පුළුවන් නම්, හොඳ, නිර්මාණශීලි අදහස් ඇති තරුණ පිරිසක් ඉදිරියේදී බිහිවේවි කියලා මම හිතනවා. ඒක තමයි කාලෝචිත වෙන්නේ. ඒ වාගේම අධ්‍යාපන අමාත්‍යවරයා විධියට ආණ්ඩුවෙන් ආණ්ඩුවට ප්‍රතිපත්ති වෙනස් නොකර, අධ්‍යාපන ක්‍රමය වෙනස් නොකර, මෙවැනි ක්‍රියාමාර්ග සහ නව තීන්දු හරහා දීර්ඝ කාලීන ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කරන්න පුළුවන් නම්, අධ්‍යාපන ක්ෂේත්‍රය සුබදායී ආකාරයෙන් ඉදිරියට පවත්වාගෙන යන්න පුළුවන්කම ලැබෙනවා. ඒ ගැනත් අවධානය යොමු කරලා අනාගත පරපුර වෙනුවෙන් යම් ක්‍රමයක් සකසන වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කළ යුතු යැයි මතක් කර සිටිනවා.

අපි සියලු දෙනාම නිල් පාට, කොළ පාට, රතු පාට දේශපාලනයෙන් මිදී කටයුතු කළ යුතුයි. ආර්ථිකය කඩා වැටිච්ච, රට අමාරුම තැනකට පත් වෙච්ච මොහොතක අපි මේ ඉන්නේ. විපක්ෂය මේ අය වැය ගැන විවේචන ඉදිරිපත් කරනවාට වඩා මෙය ජාතික වගකීමක් ලෙස සැලකිය යුතුයි. මෙය අපි සියලුදෙනාගේම රට, අපේ දරුවන් සියලුදෙනාගේම රට යැයි සිතමින් අපි සියලු දෙනාම එකට එකතු වෙලා මේ අය වැය ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය වැඩ පිළිවෙළට සහාය දිය යුතුයි. ඔබ සැබෑ ලෙසම ජනතා නියෝජිතයෙක් නම්, ඔබ සැබෑ ලෙසම මේ රටේ ජනතාවට ආදරය කරනවා නම්, ඔබ සියලුදෙනාගේම වගකීම හා යුතුකම වන්නේ, ඒ කාර්යභාරය නිවැරැදිව හඳුනා ගෙන මේ රට ආර්ථික වශයෙන් ගොඩ නඟන වැඩ පිළිවෙළට සහාය දැක්වීමයි.

මේ රටේ ආර්ථිකය සංවර්ධනයට, මේ රටේ සංවර්ධනයට සහ අනාගත පරපුර රැක ගන්න කටයුතු කිරීමේදී කාන්තාවක් බුද්ධිමත්ව, නිවැරැදිව කටයුතු කරන්න ඕනෑ. කාන්තාවක් වුණාට, කාන්තාවන්ගේ අයිතීන් දිනා ගන්න, දරුවන්ගේ අයිතීන් දිනා ගන්න හන්දියක් හන්දියක් ගානේ කෑ ගැහුවාට වැඩක් නැහැ; ඒ අයිතීන් ලැබෙන්නේ නැහැ. කාන්තාව සමාජයට, දරුවන්ට ආදර්ශවත්ව කටයුතු කළ යුතුයි. ඒ බවත් මතක් කරමින් මේ රටේ ආර්ථිකය ගොඩ නැඟීමට යන වැඩ පිළිවෙළට දායකත්වය දෙන්න සියලුමදෙනාට සිත් පහළ වේවායි කියලා සැබෑ ලෙසම මේ රටට ආදරය කරන, මේ රටේ අනාගත පරපුරට ආදරය කරන ජනතා නියෝජිතවරියක විධියට මම ප්‍රාර්ථනා කරනවා. ඒ වාගේම වචන ස්වල්පයක් කථා කිරීමට මට අවස්ථාව ලබා දීම ගැන මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමාට ස්තුතිවන්ත වෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු සාරතී දුෂ්මන්ත මැතිතුමා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් තිබෙනවා.

Order, please! මේ අවස්ථාවේ ගරු සමන්ප්‍රිය හේරත් මහතාගේ නම මූලාසනයට යෝජනා කරන්න.

**ගරු ටිරාන් අලස් මහතා (මහජන ආරක්ෂක අමාත්‍යතුමා)**
(மாண்புமிகு டிரான் அலஸ் - பொதுமக்கள் பாதுகாப்பு அமைச்சர்)
(The Hon. Tiran Alles - Minister of Public Security)
"ගරු සමන්ප්‍රිය හේරත් මහතා දැන් මූලාසනය ගත යුතුය"යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු වීරසුමන වීරසිංහ මහතා මූලාසනයෙන් ඉවත් වුයෙන්, ගරු සමන්ප්‍රිය හේරත් මහතා මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு வீரசுமன வீரசிங்ஹ அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு சமன்பிரிய ஹேரத் அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon* THE HON. WEERASUMANA WEERASINGHE *left the Chair, and* THE HON. SAMANPRIYA HERATH *took the Chair.*

[අ.භා. 2.59]

**ගරු සාරතී දුෂ්මන්ත මහතා**
(மாண்புமிகு சாரதீ துஷ்மந்த)
(The Hon. Sarathi Dushmantha)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මුදල් අමාත්‍යවරයා වන වර්තමාන ජනාධිපතිතුමා බණ්ඩාරනායක පවුල ගැන සඳහන් කරමින් තමයි 2023 අය වැය කථාව පටන් ගත්තේ. ඒක මුලින්ම මතක් කරන්නට ඕනෑ. බණ්ඩාරනායකවරු ජනප්‍රිය තීන්දුවලට ගිහිල්ලා මේ රටේ ආර්ථිකය කාබාසිනියා කළා කියලා තමයි රනිල් වික්‍රමසිංහ මහත්තයා මේ අය වැය කථාවේදී ව්‍යංගාර්ථයෙන් ප්‍රකාශ කළේ. අපි දන්න විධියට නම් 1970, 77 කාලයේ තුනී ලෑලි සංස්ථාව, වානේ සංස්ථාව, ටයර් සංස්ථාව ආදි දැවැන්ත නිෂ්පාදන ආර්ථිකයක් රටට උරුම කරපු පවුලක් තමයි බණ්ඩාරනායක පවුල කියන්නේ. ඒ වාගේම රනිල් වික්‍රමසිංහ මහත්තයා මේ අය වැය කථාවේදී 1977 ප්‍රවේශය ගැන සඳහන් කරමින් කියනවා, කාලයට අනුකූලව අවශ්‍ය වෙනස්කම් සහ ප්‍රතිසංස්කරණ සිදු කෙරුණේ නැහැ කියලා. එතුමා ම පිළිගන්නවා එතුමන්ලාගේ කාලයේ තමයි මේක fail වෙලා තිබෙන්නේ කියලා. නිෂ්පාදන ආර්ථිකයෙන් බැහැර වෙලා සේවා ආර්ථිකයකට සෙමින් සෙමින් ගමන් කිරීමේ දී කාලයක් තිස්සේ සිද්ධ වුණු වෙනස්කම් නිසා තමයි අද අපට මේ දැවැන්ත ආර්ථික අර්බුදයකට මුහුණ දෙන්න සිද්ධ වෙලා තිබෙන්නේ කියන කාරණය මුලින්ම මතක් කරන්නට ඕනෑ.

මේ අය වැයේ යම් යම් හොඳ ලක්ෂණත් තිබෙනවා. විශේෂයෙන්ම ගරු ජනාධිපතිතුමාට මම ස්තුතිවන්ත වෙනවා, විදේශ වෙළඳාම හා ආයෝජනය සම්බන්ධ නියෝජිත ආයතනයක් වාගේම ජාතික ඵලදායිතා කොමිෂන් සභාවක් පිහිටුවීමට යෝජනා කිරීම සම්බන්ධයෙන්. මානව සම්පත ගත්තාම අපේ රටේ විශාල ප්‍රශ්නයක් තිබෙනවා. අපේ රටේ ගොඩනැඟිල්ලක වැඩ නිම කරන්න ගියාම සමහර වෙලාවට පෙදරේරුවෝ නැහැ. කාර්මිකයෝ නැහැ. ඒ වාගේ ලොකු ප්‍රශ්න තිබෙනවා.

ඒ වාගේම, ජාතික සංවර්ධන කමිටුවකුත් එතුමා යෝජනා කරලා තිබෙනවා. මට මතකයි, එවකට සිටි ජනාධිපතිවරයාගේ වැඩ පිළිවෙළ එක්ක ඉස්සරහට යන්න බැරි නිසා අපි පාර්ලිමේන්තුව ඇතුළේ ස්වාධීන වුණාම, අපේ හැම රැස්වීමකටම

[ගරු සාරතී දුෂ්මන්ත මහතා]

රනිල් වික්‍රමසිංහ ජනාධිපතිතුමා සම්බන්ධ වුණා. බහුතරයක් වුණු අපි -ස්වාධීන මන්ත්‍රීවරු- යම් එකඟතාවකට ආවා. ඒ එකඟතාවලින් කීපයක් එතුමා මේ අය වැයට ඇතුළත් කරලා තිබෙනවා. ඒ පිළිබඳව එතුමාට ස්තුතිවන්ත වෙනවා. මොකද, මේ විධියේ සංවර්ධන කමිටුවක් දැම්මේ නැත්නම් දේශපාලනඥයන්ට හිතෙන හිතෙන සංවර්ධන ව්‍යාපෘති ගේනවා, රටට කිසිම ආර්ථික ප්‍රතිලාභයක් ලැබෙන්නේ නැති. මම කනගාටුවෙන් කියනවා, අපේ කෑගල්ල දිස්ත්‍රික්කයේ තමයි තිබෙන්නේ ලංකාවේ එකම "A" ශ්‍රේණියේ කාපට් නොවුණු පාර තිබෙන්නේ. හැබැයි සමහර දිස්ත්‍රික්කවල තිබෙන පාරවල්වල, lanes හතරයි, පහයි. දැන් ඒවායේ හරක් තමයි ලගින්නේ. ඒ වාගේම සම්මන්ත්‍රණශාලා, ගුවන් තොටුපොළවල්, වරායවල් වාගේ මහා දැවැන්ත ව්‍යාපෘතිවලට මුදල් වෙන් කළා, වෙන් කළා, වෙන් කළා. අන්තිමට අපේ රටට ඒවායෙන් කිසිම ප්‍රතිලාභයක් ලැබුණේ නැහැ. ඒ නිසා ජාතික සංවර්ධන කමිටුවක් ආරම්භ කිරීම බොහොම හොඳ දෙයක් හැටියට තමයි මම දකින්නේ.

මේක අභියෝගාත්මක කාලයක්. ඒ ගැන කිසි සැකයක් නැහැ. සමහරු මේ අභියෝගාත්මක කාලයේ ඇති වුණු මේ ආර්ථික ප්‍රශ්නය සියලු ආණ්ඩුවලට බැර කරලා ඇඟ බේරා ගන්න හදනවා. හැබැයි, මම බොහොම පැහැදිලිව කියන්න ඕනෑ වර්තමාන මහ බැංකු අධිපතිවරයා පාර්ලිමේන්තුවට ඇවිල්ලා කියපු කාරණය. එතුමා කිව්වා රුපියල පා කරන්න තිබුණු වෙලාවේ රුපියල පා කළේ නැහැ කියලා. ඒ වාගේ ආර්ථිකමය වශයෙන් අනුවණ තීන්දු රාශියක් ගත්ත නිසා තමයි අද අපට මේ තත්ත්වයට මුහුණ දෙන්න සිද්ධ වෙලා තිබෙන්නේ. අපි ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මන්ත්‍රීවරු හැටියට මීට අවුරුදු එකහමාරකට විතර ඉස්සෙල්ලා එවකට සිටි ජනාධිපතිතුමා මුණ ගැහිලා මේ වාගේ ආර්ථික ප්‍රශ්නයක් එනවාය කියන කාරණය දැනුම් දුන්නා. අද මේ සභාවේ ආණ්ඩු පක්ෂයේ වාඩි වෙලා ඉන්න ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සමහර මන්ත්‍රීවරුත්, අද ඇමතිවරු වෙලා ඉන්න උදවියත් අපිත් එක්ක ඒ රැස්වීම්වලට සම්බන්ධ වෙලා මේ ප්‍රශ්නය පිළිබඳව එතුමාට කිව්වා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම විශේෂයෙන්ම පොහොර ප්‍රශ්නය පිළිබඳව කියන්න ඕනෑ. මම නොවෙයි, වැවිලි කර්මාන්ත ඇමතිතුමා ම පිළිගත්ත කාරණයක් තමයි පොහොර ප්‍රශ්නයේදී ගත්ත තීන්දුව වැරදියි කියන එක. අද අපි නියෝජනය කරන කෑගල්ල ප්‍රදේශයේ කුඩා තේ වතු හිමියන් නැත්තටම නැති වෙලා. තේ කිලෝ එකට රුපියල් 220ක් හම්බ වෙනවා කියලා අපට උඩ පනින්න පුළුවන්කමක් නැහැ. මොකද, එදා රුපියල් 2,800ට, -3,000යි කියලා කියමුකෝ- තිබුණු පොහොර බෑග් එක අද රුපියල් 27,000යි! අවුරුද්දක්, එකහමාරක් පොහොර ටික නියම වෙලාවට දුන්නේ නැති එකෙන් තේ වතු ටික කැලෑ වෙලා ගියා. දැන් ඒවායේ තිබෙන කැලෑ ටික අයින් කරන්න වෙනම මිනිස් ශ්‍රමයක් අවශ්‍ය වෙනවා. අද ලේසි නැහැ ඒ වැඩ කටයුතු කරන්න. ඒ නිසා අද වෙනකොට කුඩා තේ වතු හිමියා කබලෙන් ළිපට වැටිලා ඉන්නේ. ඒ නිසා අපි විශ්වාස කළා මේ අය වැයේදී කුඩා තේ වතු හිමියන්ගේ අස්වැන්න එක පාර ලබා ගැනීම සඳහාවත් යම් මුදලක් ලබා දෙයි කියලා. නමුත්, ඒක ලබා දුන්නෙත් නැහැ. අද රබර් කිරි ටික විකුණා ගන්න විධියක් නැහැ. අද සමහර පාර්ලිමේන්තු මන්ත්‍රීවරු මේ ව්‍යාපාරවල නිරත වෙලා ඉන්නවා; ඒ අය ඕනෑ තරම් රබර් කිරි පිටරටින් ගේනවා. ඒ නිසා අද අපේ රබර් ගොවියාගේ කිරි ටික විසි කරන්නයි වෙලා තිබෙන්නේ. මොකද, අවශ්‍ය ප්‍රමාණයට වඩා රබර් කිරි පිටරටින් ගේනවා. ඒවා අනුපාතයක් හැටියට බලලා ගේන්නේ නැහැ. ඒ නිසා අපට මේ වෙනකොට මේ වාගේ ලොකු ප්‍රශ්න ටිකකට මුහුණ දෙන්න සිද්ධ වෙලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙතැන තිබෙන බරපතළ ප්‍රශ්නය මේකයි. රනිල් වික්‍රමසිංහ මැතිතුමා කාලයක් තිස්සේ කරගෙන ආපු වැඩ පිළිවෙළක් තිබෙනවා. එතුමන්ලා නියෝජනය කළ ආණ්ඩුවලින් බොහෝ දේවල් විකිණුවා. සමහර ආයතන, ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව වාගේ ආයතන නඩු දාලා තමයි ආපහු ගත්තේ. මම දන්නේ නැහැ දැන් මොන හේතුවක් නිසා Sri Lanka Telecom එක විකුණන්න හදනවාද කියලා. ඒ වාගේම ලාභ ලබන තව රජයේ ආයතන ගණනාවක් විකුණන්න හදනවා. කොහොමද දෙවියනේ මේවාට පක්ෂව අත උස්සන්නේ? අද බොහෝදෙනෙක් කියනවා, SriLankan Airlines එක විකුණන එක හොඳයි, කොහොමත් පාඩු ලබනවා කියලා. හැබැයි, SriLankan Airlines එක බංකොලොත් කළේ කවුද? ඒ කළමනාකාරිත්වය වෙනස් කරලා බංකොලොත් කළේ කවුද? ඒක බංකොලොත් කළෙත් මේ රටේ දේශපාලනඥයෝම තමයි. ඒ කණ්ඩායම ම ආපහු වතාවක් එකට එකතු වෙලා මේ තීන්දු-තීරණ ගන්නවා. නමුත් මම හිතන්නේ නැහැ මේ මොන තීන්දු - තීරණ ගත්තත් අද රට ඇතුළෙන්වත්, ජාත්‍යන්තරයෙන්වත් සල්ලි ටිකක් ඉල්ලා ගන්න අවශ්‍ය ප්‍රතිරූපය, වට පිටාව අපට තිබෙනවා කියලා. මේ වෙනකොට ලොකු කාලයක් ගත වෙලා තිබෙනවා. නමුත් අපට තවම කවුරුත් සත පහකින්වත් ආධාර කරලා නැහැනේ; කිසිම රටක් උදවු කරලා නැහැනේ. තවමත් අපි IMF එකේ කොන්දේසි එක්ක ගැටී ගැටී ඩොලර් බිලියන 2.9ක් එයි කියලා බලාගෙන ඉන්නවා. ඒක එන්නේ කොහොමද කියන කාරණය කථා බහ කරමින් ඉන්න එක තමයි දැන් කරන්න වෙලා තිබෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, තව බරපතළ ප්‍රශ්නයක් තිබෙනවා. මහවැලිය කියන්නේ අපේ රටේ ජීවනාලිය. කලින් ආණ්ඩුවත් ඉඩම් පනතක් ගෙනැල්ලා, මහවැලියේ තිබෙන ඉඩම් ටික එළියට දෙන්න අවශ්‍ය පිඹුරු පත් සැකසුවා. මේ කටයුත්ත කොහොම සිදුවෙනවද කියන කාරණය අපි බලන්න ඕනෑ. දරිද්‍රතාවෙන් අඩු පිරිසක් ඒ කලාපවල ජීවත් වනවා. බැහැර කිරීමේදී මේ ඉඩම් බහුජාතික කොම්පැනිවලට දෙනවාද, එහෙම නැත්නම් මේවා නිකුත් කරන්නේ මොන ක්ෂේත්‍රවලටද, මහවැලිය අහෝසි කරනවාද වාගේ ප්‍රශ්න රාශියක් අපට තිබෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට ලැබී ඇති කාලය අවසානයි, ගරු මන්ත්‍රීතුමා.

**ගරු සාරතී දුෂ්මන්ත මහතා**
(மாண்புமிகு சாரதீ துஷ்மந்த)
(The Hon. Sarathi Dushmantha)
මට ලැබී ඇති කාලය අවසාන නිසා මා මේ කාරණයට මීට වඩා අවධානය යොමු කරන්නේ නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. දැන් සෙස් බද්දත් ගහලා තිබෙන නිසා භාණ්ඩ හයසිය ගණනක මිල වැඩි වනවා. මට ඒ සෙස් බද්ද අය කරන භාණ්ඩ ගණන හරියට මතක නැහැ. අපේ රටේ ආදායම බිලියන 3,415යි. වියදම බිලියන 5,819යි. එයින් බිලියන 3,130ක්ම බදුවලින් ලැබෙන්නේ. ඒ අස්සේ දැන් ණය ගෙවීමත් පැහැර හැරලා - default කර - තිබෙනවා. මා ඒ ගැන මීට වඩා අදහස් දක්වන්නේ නැහැ. මේ අය වැයේ තිබෙන අපි කියපු සුබවාදී කාරණා පිළිබඳ අපට ප්‍රශ්නයක් නැහැ. නමුත්, මේ අය වැයේ ඊට වඩා බොහොම දරුණු ප්‍රශ්න කීපයක් තිබෙනවාය කියන එක සඳහන් කරන්න ඕනෑ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ගීතා සමන්මලී කුමාරසිංහ රාජ්‍ය අමාත්‍යතුමිය. ඔබතුමියට විනාඩි පහළොවක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.08]

**ගරු ගීතා සමන්මලී කුමාරසිංහ මහත්මිය (කාන්තා හා ළමා කටයුතු රාජ්‍ය අමාත්‍යතුමිය)**
(மாண்புமிகு (திருமதி) கீதா சமன்மலீ குமாரசிங்ஹ - மகளிர் மற்றும் சிறுவர் அலுவல்கள் இராஜாங்க அமைச்சர்)
(The Hon. (Mrs.) Geetha Samanmale Kumarasinghe - State Minister of Women and Child Affairs)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අතිශයින් වැදගත් අවස්ථාවක අය වැය පිළිබඳව කථා කරන්න අවශ්‍ය බව හැඟුණ මුත්, එය පසුවට කල් දමා, සියයට 52කට, සියයට 53කට ළංවී සිටින කාන්තා ප්‍රතිශතය පිළිබඳව කථා කරන්න මා බලාපොරොත්තු වනවා.

2019 සිට කරන ලද පරීක්ෂණවලින් එළි වී තිබෙනවා, මේ රටේ සෑම කාන්තාවන් පස්දෙනෙකුගෙන් අඩුම තරමින් දෙදෙනකුවත් ජීවිතයේ කවදා හෝ දවසක මානසිකව, ආර්ථිකව, ශාරීරිකව ලිංගික හිංසනයට ගොදුරු වී ඇති බව. අද මේ ගරු සභාවේ ගැලරිය පුරා බාලිකාවන් රැසක් සිටින මොහොතක, දරුවනේ, කාන්තාවන් ගැන කථා කරන්න ලැබීම මට ඉමහත් ආඩම්බරයක්. අපේ රටේ කාන්තාව රැක ගන්න, කාන්තාවට ගරු කරන්න අවශ්‍ය ඒ system එක වෙනස් වෙන්න ඕනෑය කියන ප්‍රතිපත්තියේ අප සියලුදෙනාම පිහිටිය යුතුයි.

මා විශ්වාස කරනවා, දරුවා නීරෝගී දරුවෙක් වෙන්නේ ගර්භිණී මව ආරක්ෂා කර ගත්තොත් පමණයි කියලා. ඒ නිසාම අපේ රටේ සියලු ගර්භිණී මව්වරුන්ට දරුවා ලැබීමට සිටින මාස පහක කාලය තුළදීත්, දරු ප්‍රසූතියෙන් පසු තවත් මාස හතරක් සඳහාත් මසකට රුපියල් 2,000 බැගින් රුපියල් 20,000ක මුදලක් ලබා දෙනවා, පෝෂ්‍යදාය ආහාර වේලක් ලබා ගැනීමට. ඒකට තව රුපියල් 2,500ක මුදලක් පසුගිය අතුරු අය වැයෙන් එකතු කළා. ඒ මුදලත් වෙන් කළේ ගර්භිණී කාන්තාවන්ගේ පෝෂණය සඳහායි. අඩු බර දරු උපත් නිසා දරුවන් මන්ද පෝෂණය කරා යෑම අපි කාටවත් නතර කරන්න බැහැ. පළමුවන පියවර තමයි පෝෂණයෙන් යුක්ත නීරෝගී දරුවෙක් මේ රටට බිහි කිරීම. දරුවා බිහි වීමෙන් පසු සෑම මවකගේම වගකීම තමයි දරුවා මව් කිරෙන් පෝෂණය කිරීම. දරුවා මව් කිරෙන් පෝෂණය වනවිට මන්ද පෝෂණය කරා යන ගමන ගොඩක් අඩු වනවා.

ඉන් පසුව දරුවන් පෙර පාසල් යන මූලික අවස්ථාවට මුහුණ දෙනවා. මේ රටේ පෙර පාසල් දරුවන් පන්ලක්ෂ අසූදාහක් ඉන්නවා. පෝෂණය අතින් ඉතා අඩු මට්ටමක දරුවන් සිටින පළාත් හා දිස්ත්‍රික්ක කීපයක් අපි මේ වනකොට හඳුනා ගෙන තිබෙනවා. විශේෂයෙන්ම මඩකලපුව, අම්පාර, රත්නපුරය වැනි පළාත්වල දරුවන් සිටිනවා, පෝෂ්‍යදායී ආහාර වේලක් ඉක්මනින්ම ලැබිය යුතුයි කියලා මා සිතන. ඒ නිසාම තමයි අපි ඒ දරුවන්ට උදෑසන ආහාර වේල ලබා දෙන්න අවශ්‍ය සියලු කටයුතු සූදානම් කර තිබෙන්නේ. ඒ සඳහා දැනට එක දරුවෙකු වෙනුවෙන් රුපියල් 60ක මුදලක් වෙන් කර තිබෙනවා. ඒකත් ඉතා අමාරුවෙන් තමයි අපට කර ගන්න වෙන්නේ. කථාවක් තිබෙනවා නේ, "something is better than nothing" කියලා; වෙන මොකක්වත් නැති අවස්ථාවක මේ රුපියල් 60ක මුදලක් වෙන් කිරීමත් ඉතා වටිනවා. අපි කොහොම හරි මේ ආහාර වේල ඉක්මනින් සූදානම් කරලා දරුවන්ට ලබා දෙන්න උපරිම උත්සාහයක් ගන්නවා.

අපේ කාන්තාව හිංසනයට පත්වීම ගැන අපි දිගින් දිගටම පාර්ලිමේන්තුවේදී කථා කරනවා. කාන්තාවකට පුළුවන්ද පොලීසියකට ගිහිල්ලා තමන්ට වෙච්ච අකරතැබ්බය, තමන්ට වෙච්ච ප්‍රශ්නය ගැන නිදහසේ පැමිණිල්ලක් කරන්න? මුළු පොලීසියේම කට්ටිය වටවෙලා ඒක අහගෙන ඉන්නවා. අපි දැන් ඒ අය වෙනුවෙන් සෑම පොලිස් ස්ථානයකම සූදානම් කරනවා, විශේෂ කාමරයක්. ඒ සඳහා පොලිස් කොස්තාපල්වරියන් 4දෙනෙකු අවශ්‍ය වෙනවා. කාන්තාව ගොස් ඇගේ පැමිණිල්ල කරද්දී එය රහසිගත භාවයෙන් යුක්ත විය යුතුයි. ඒක මුළු ගමටම දැනුම් දෙන ප්‍රශ්නයක් වෙන්න බැහැ. ඇයට ආත්ම ගරුත්වයක් තිබෙනවා. ඇය බියෙන් ඉන්නේ. ඒ ලජ්ජාව සහ බිය නිසාම තමයි අපේ රටේ බොහෝ කාන්තාවන් තමන්ට කොච්චර අකරතැබ්බ වුණත්, කොච්චර ප්‍රශ්න ඇති වුණත් ඒ බොහෝ දේවල් යටපත් කරගෙන නිහඬව ඉන්නේ. නමුත් කිසිම කෙනෙක් නිහඬ විය යුතු නැහැ. ආත්ම ගරුත්වය වෙනුවෙන් නැඟී සිටින්නට අපි මේ රටේ සියලු කාන්තාවන් පෙළ ගැස්විය යුතුයි. අපේ ශක්තිය, අපේ බලය මේ රටේ සියලුදෙනාටම පෙන්වීමට මේක හොඳම අවස්ථාවක්.

මම දරුවන් පිළිබඳව කථා කරන්නේ ඉතාම කනගාටුවෙන්. එදා රුපියල් 3,000ක් වාගේ මුදලකට දරුවෙකුගේ පාසල් උපකරණ ගන්න පුළුවන් වුණත්, එන ජනවාරි මාසයේ එක දරුවෙකුට වුණත් අවශ්‍ය පාසල් උපකරණ මිල දී ගන්නේ කොහොමද? ගණන් හදලා බැලුවොත් සාමාන්‍යයෙන් ඒකට රුපියල් 15,000ක් විතර ඕනෑ. දරුවෝ දෙදෙනෙක්, තුන්දෙනෙක් සිටින පවුලකට මේ තත්ත්වය දරා ගන්න අපහසු වෙනවා. රටක් හැටියට අපි ආර්ථික ප්‍රශ්නවලින් හෙම්බත්වෙලා, මේ සියල්ල ඉතාම අමාරුවෙන් කරගෙන යන අවස්ථාවක් බව අපි දන්නවා. එවන් අවස්ථාවක් තිබුණත්, අපේ අනාගතය කියන්නේ අපේ දරුවෝ. දරුවන් වෙනුවෙන් දෙන්න පුළුවන් ඉහළම දේ තමයි අධ්‍යාපනය සහ හොඳ සෞඛ්‍ය. එහෙම නම්, මම අධ්‍යාපන ඇමතිතුමාට යෝජනා කරනවා, ජනවාරි මාසයේ පාසල් පටන් ගනිද්දී මේ දරුවන්ට පාසල් පොත් ඇතුළු පාසල් උපකරණ ලබා ගැනීමට යම් කිසි ක්‍රමයක් හදලා, පුළුවන් තරම් ඉක්මනින් හැකි උපරිම උදව්ව කරන්න කියලා.

මෙවර අය වැයෙන් අපේ කුරුඳු වගාව ගැන කථා කළා. මම නියෝජනය කරන්නේ ගාල්ල දිස්ත්‍රික්කය. ගාල්ල දිස්ත්‍රික්කයේ බොහෝ තැන්වල වගා කරන්නේ කුරුඳු. කරන්දෙණියේ පමණක් නොවෙයි, ඒ හතර වටේ සෑම තැනම තිබෙන්නේ කුරුඳු. කුරුඳු වගාවට යොමු වී සිටින ගොවියා ආරක්ෂා කර ගන්න, ඔහු ශක්තිමත් කරන්න අප කටයුතු කළ යුතුයි. මෙය ඉතාම වැදගත් කාර්යයක් කියලා මම හිතනවා. කලක් අපේ කෘෂි කර්මාන්තය අඩාල වෙලා, මේ රට ඉතාම අමාරු තත්ත්වයකට වැටිලා තිබුණා. දැන් අපේ දිස්ත්‍රික්කයේ තිබෙන කුරුඳු වගාව ශක්තිමත් කරන්නට අපි ඉදිරියේ දී කටයුතු කළ යුතුයි.

අද කියනවා, දරුවෙක් සමඟ මවකට හිභාකන්න එපාලු. මවත්, දරුවාත් කුදලාගෙන ගිහිල්ලා දමනවා රිමාන්ඩ් එකට. ඒක නොවෙයි වෙන්න ඕනෑ. ඒ මව්වරුන්ගෙන් මේ ගැන ඇහුවාම ඒ ගොල්ලෝ අහනවා, අපි දරුවා තියලා යන්නේ කොහේද කියලා. ඒ නිසා අපි ඒ මව සවිබල ගැන්විය යුතුයි. ඒ මවට ශක්තියක් ලබා දෙන්න ඕනෑ. කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය හැටියට ඉදිරි වසරේදී අපි ඒ පිළිබඳ විශේෂයෙන් කටයුතු කරනවා. දරුවන් සමඟ මව්වරුන් රිමාන්ඩ් බන්ධනාගාරයට ගෙන ගොස් මහා අපරාධකාරයන් ඉදිරියේ ඒ පුංචි දරුවන්ගේ ජීවිතයට කරන තර්ජනය ඉතා බියකරුයි, ඉතා අසාධාරණයි. මම අධිකරණ ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා, ඒ අයගෙන් දරුවන් වෙන්කරන්න කියලා. ඒ කියන්නේ මවගෙන් නොවෙයි, ඒ අපරාධකරුවන්ගෙන් වෙන් කරලා ඒ මවත් දරුවාත් වෙනම ස්ථානයක තබමින් ඔවුන්ට සාධාරණය ඉෂ්ට කරන්න. එහෙම කළොත්, ඒ දරුවන්ගේ ජීවිතය, ඒ දරුවන්ගේ අනාගතය මානසික පීඩනයෙන් ගලවා ගන්න ඔබට පුළුවන්. ඒ දරුවා කිසිදු වැරැද්දක් කරලා නැහැ. අම්මා කරන ලද වැරැද්දකට දරුවා වන්දි ගෙවන්නේ කුමන හේතුවක් නිසාද? ඇයි දරුවන් සහ මවුවරුන් කියන දෙගොල්ලන් එකම තැනකට දාලා, මහා අපරාධකරුවන් සමඟ රිමාන්ඩ් බන්ධනාගාර ගත කරන්නේ? ඒ තත්ත්වය වහාම වෙනස් කර දෙන මෙන් ඔබතුමන්ලාගෙන් ඉල්ලා සිටිනවා.

**ගරු ගාමිණී වලේබොඩ මහතා**
(மாண்புமிகு காமினி வலேபொட)
(The Hon. Gamini Waleboda)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු ඇමතිතුමියගේ අවසරය මත මට කාරණයක් පැහැදිලි කර ගන්න තිබෙනවා.

ගරු රාජ්‍ය ඇමතිතුමියනි, මේ වනතෙක් රැකියා සඳහා විදේශගත වන කාන්තාවන් සම්බන්ධයෙන් රටේ පැවතුණු නීතිය තමයි, අවුරුදු පහට වඩා අඩු දරුවන් ඉන්න මවුවරුන් විදේශ ගත කරන්න බැහැ කියන කාරණය. නමුත් දැන් Cabinet Paper එකක් දාලා තිබෙනවා කියලා දැන ගන්න ලැබුණා, ඒ දරුවන්ගේ වයස් සීමාව අවුරුදු දෙකට අඩු කරලා කියලා. ඒ පිළිබඳව ඔබතුමියගේ අවධානය යොමු කරලා, නැවත වරක් ඒ වයස් සීමාව අවුරුදු පහක් කරන්න කියලා මම ඉල්ලා සිටිනවා.

**ගරු ගීතා සමන්මලී කුමාරසිංහ මහත්මිය**
(மாண்புமிகு (திருமதி) கீதா சமன்மலீ குமாரசிங்ஹ)
(The Hon.(Mrs.) Geetha Samanmale Kumarasinghe)
ගරු මන්ත්‍රීතුමනි, ඒ ගැන මතක් කර දීම ගැන ඔබතුමාට බොහොම ස්තුතියි.

මගේ ඊළඟ මාතෘකාව වෙලා තිබුණේ ඒක. කලින් තිබුණේ වයස අවුරුදු පහකට වඩා අඩු දරුවන් සිටින මවකට විදේශ ගත වන්නට බැහැ කියලා. දැන් ඒ වයස් සීමාව අවුරුදු දෙක දක්වා පහළ දමා තිබෙනවා. අවුරුදු දෙකක දරුවෙකු කියන්නේ කථා කර ගන්න බැරි දරුවෙක්. තමන්ට වෙන අතවරය ගැන කියා ගන්න බැරි දරුවෙක්. එවැනි දරුවෙකුට මවගේ උණුසුම අත්‍යවශ්‍ය මොහොතක,ඒ දරුවා දාලා අම්මා රට යනවා. එහෙම අවස්ථාවල කියනවා, "අපි යැව්වේ නැතත් ඒ ගොල්ලන් යනවා" කියලා. ඒ සම්බන්ධයෙන් යම් ක්‍රමයක් සකස් කරන්නට ඕනෑ. සෑම ගමකම ඉන්නවා, පවුල් සෞඛ්‍ය සේවිකාවක්. ඇයට පුළුවන්, මේ ගැන දැනුවත් කරන්න. ප්‍රාදේශීය ලේකම්තුමාට පුළුවන්, මේ ගැන දැනුවත් කරන්න. අඩුම තරමින් දරුවාට වයස අවුරුදු පහක් වෙන තුරු කිසිම මවක් මේ රටින් පිට ගෘහ සේවය සඳහා යා යුතු නැති බව මම තරයේ විශ්වාස කරනවා. මම ඒ පිළිබඳව දිගින් දිගටම කරුණු පැහැදිලි කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ළමා ගායිකාවක් වෙන එක වැරැද්දක් ලු. නමුත් දක්ෂයාට තැනක් දෙන්න ඕනෑ. මේ ලෝකයේ බිහි වුණු සියලු කලාකරුවන්ගේ ජීවිතය පටන් අරගෙන තිබෙන්නේ ඉතාම අඩු වයසකදී. පසුගිය කාලයේ ඉතාම දක්ෂ සංගීත ශිල්පීන් කිහිප දෙනෙකුට විරුද්ධව කටයුතු කරලා තිබුණා. පළාත් කොමසාරිස්තුමාගේ මාර්ගයෙන් තමයි ඒ පිළිබඳ කටයුතු කරලා තිබුණේ. අපි ඒ සියල්ල මැඩ පැවැත්වීමට කටයුතු කළා. ඒ සඳහා මට ඉතා හොඳ ශක්තියක් ලබා දෙමින් කාන්තා සහ ළමා කාර්යාංශය කටයුතු කිරීම පිළිබඳව මට ඉමහත් සතුටක් දැනෙනවා. දරුවෝ කිව්වා ම male, female කියන දෙගොල්ලන්ම අයිති වෙනවා; පිරිමි ළමයි සහ ගැහැණු ළමයි. ළමයි එක ජාතියකට අයිති වෙන්නේ නැහැ. වයස අවුරුදු 18ක් වෙන තෙක් දරුවකු කියන්නේ පිරිමි ළමයෙක් හෝ ගැහැණු ළමයෙක්.

මම සංචාරක පුරවරයක ජීවත් වෙන කෙනෙක්. අපි බෙන්තර, හික්කඩුව, ගාල්ලට යන කල් මුහුදු තීරයේ සංචාරක ව්‍යාපාරයත් එක්ක ඔට්ටු වෙන මිනිස්සු. අපි දන්නවා, අපේ රටේ ගැහැණු ළමයින්ටත් වඩා පිරිමි ළමයින් ඉතා අවාසනාවන්ත ලෙස හිංසනයට ලක් වෙන බව. විශේෂයෙන් ලිංගික හිංසනයට. එය නතර කිරීම සඳහා පුළුල් පරීක්ෂණ පවත්වමින් පොලීසිය මැදිහත් විය යුතුයි. කාන්තාවකට ප්‍රශ්නයක් වුණාම අවුරුදු ගණනක් ඒ නඩුව අහනවා. ඒ නඩුව මුලින්ම යනවා, කාන්තා හා ළමා කාර්යාංශයට. එතැනින් යනවා, පොලීසියට. පොලීසියෙන් යනවා, නීතිපති ළඟට. නීතිපතිටත් වඩා උස කන්දක් වාගේ ෆයිල් ගොඩක් එතැන තිබෙනවා. ඒ ෆයිල් ටික අරගෙන පහළ උසාවියට යනවා. එතැනදීත් තවත් ෆයිල් කන්දක් ගොඩ ගැහෙනවා. ඊළඟට, ඉහළ උසාවියට යනවා. එක්තරා දියණියක් මා හම්බවෙන්න ආවා. ඇය මට කිව්වා, "මම අවුරුදු 15දී තමයි අතවරයකට ලක් වුණේ. දැන් මට අවුරුදු 23ක්. මම විවාහ වෙන්න ලෑස්තියි. ඔබතුමියට පුළුවන් නම් මේ නඩුව අයින් කරලා දෙන්න" කියලා. බලන්න, මෙක ශෝචනීය අවස්ථාවක් නොවෙයිද කියලා? මේ වාගේ පැමිණිල්ලක් ආවාම ඒ ගැන ඉක්මන් ක්‍රියා මාර්ගයක් තිබෙන්නට ඕනෑ. පොලිසියේ ආධාර නැතුව අපට ඒක තනියම කරන්නත් අමාරුයි. ඒ සියලු අවස්ථාවලදී පොලීසිය අපට සම්පූර්ණ සහයෝගය ලබා දෙන්නට ඕනෑ. කාන්තාවන්ට, පිරිමි ළමුන්ට හෝ ගැහැණු ළමුන්ට වෙන අතවර පිළිබඳව පොලීසිය ඉදිරියෙන්ම කටයුතු කළ යුතුයි කියලා මා විශ්වාස කරනවා.

ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු කිංස් නෙල්සන් මහතා. ඔබතුමාට විනාඩි අටක කාලයක් ලැබෙනවා.

[අ.භා. 3.21]

**ගරු කිංස් නෙල්සන් මහතා**
(மாண்புமிகு கிங்ஸ் நெல்சன்)
(The Hon. Kins Nelson)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, වත්මන් ජනාධිපතිතුමා මුදල් ඇමතිතුමා විධියට මේ රටේ 77වැනි අය වැය ලේඛනය ඉදිරිපත් කළ අවස්ථාවේ ඒ පිළිබඳ අදහස් ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දීම ගැන මා සතුටු වෙනවා.

ගරු ජනාධිපතිතුමාගේ අය වැය කථාව කළ අවස්ථාවේ මට දැනුණේ එතුමා රාජාසන කථාවක් කරනවාද කියලායි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද මේ රටේ දුප්පත්කම වැඩි වෙලා, ඒ වාගේම ව්‍යාපාර ක්ෂේත්‍රය සම්පූර්ණයෙන්ම කඩා වැටිලා. ඒ නිසා 2023 නව වසරේ රට යම් මට්ටමකට යථා තත්ත්වයට ගේන්න පුළුවන් අය වැයක් ඉදිරිපත් කරයිද කියලා තමයි ජනතාව බලාගෙන හිටියේ; කඩිනම් විසඳුම් ලැබෙයි කියලා තමයි ජනතාව බලාගෙන හිටියේ. එතුමා දැන් 2025 අවුරුද්ද ගැන කථා කරනවා. දීර්ඝ කාලීන වැඩ පිළිවෙළක් හොඳයි. හැබැයි මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද අපට අවශ්‍ය දීර්ඝ කාලීන වැඩ පිළිවෙළක්ද කියලා අපි කල්පනා කරලා බලන්න ඕනෑ. අද මේ රට වැටිලා තිබෙන තත්ත්වයෙන් කඩිනමින් ගොඩ ගන්නේ කොහොමද කියන එක ගැන තමයි අපි මේ අවස්ථාවේ කථා කරන්න ඕනෑ.

අද උද්ධමනය සියයට 60කින් වැඩි වෙලා. ආහාර උද්ධමනය සියයට 80කින් වැඩි වෙලා. එතුමා කියනවා එන අවුරුද්දේ රාජ්‍ය ආදායම සියයට 66කින් ඉහළට ගේනවා කියලා. 1950දී මේ රටේ මහ බැංකුව ස්ථාපිත කරලා රට හොඳටම තිබුණු කාලයේත් රජයේ ආදායම සියයට 23ක් වාගේ ඉලක්කමකට තමයි ගේන්න පුළුවන් වුණේ. ඉතින්, අද මේවා ගැන පැහැදිලි කිරීමක් නැහැ.

දේශීය ණය ප්‍රතිව්‍යුහගත කරනවාද කියන එක ගැන මේ අය වැයේ කිසිම තැනක සටහන් වෙන්නේ නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. එහෙම නොවුණොත් අපට නැවතත් රුපියල් අච්චු ගහන්න සිදු වෙනවා. ඒ වාගේම දේශීය ව්‍යාපාරිකයා, රජයේ සේවකයා, ගොවියා යන අයගේ ණය ප්‍රතිව්‍යුහගත කරනවාද කියලා, ඒ අයට දෙන සහන මොනවාද කියලා මේ අය වැයේ

කිසිම තැනක සටහන් වෙලා නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

අධ්‍යාපනය සඳහා රුපියල් බිලියන 232ක් වෙන් කරලා තිබෙනවා. අධ්‍යාපනය සඳහා රුපියල් බිලියන 232ක් වෙන් වෙනකොට, අධ්‍යාපන ඇමතිවරයා මේ පාර්ලිමේන්තුවේ කියනවා, 2023 වසරේදී අධ්‍යාපන ප්‍රතිසංස්කරණයක් වෙනවා කියලා. හැබැයි, ප්‍රමාණවත් මුදල් ඒවාට වෙන් වෙලා නැහැ කියන එක මම වගකීමෙන් කියනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ඒ වාගේම ගුරු පුහුණුව සඳහාත් ප්‍රමාණවත් මුදලක් වෙන් කරලා නැහැ. ගුරු සේවයට සියයට 70ක් ගුරුවරුන් බිහි කරන්නේ ජාතික අධ්‍යාපන විද්‍යා පීඨවලින්. ලංකාවේ ඒ වාගේ ආයතන 19ක් තිබෙනවා. ගුරු සිසුන් 6,000ක් පමණ ඉන්නවා. ඇමතිවරයා සහ රජය කියනවා මේ ආයතන විශ්වවිද්‍යාල මට්ටමට ගේනවා කියලා. ඉතින්, අධ්‍යාපනයට වෙන් කරලා තිබෙන මුදලත් එක්ක ඒවා විශ්වවිද්‍යාල මට්ටමට ගේන්නේ කොහොමද කියලා අපට ප්‍රශ්නයක් තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ලංකාවේ ගුරු පුහුණු විද්‍යාල 8ක් තිබෙනවා; මධ්‍යස්ථාන 115ක් තිබෙනවා. ඒවායේ වැඩි දියුණුව සඳහා ප්‍රමාණවත් මුදලක් වෙන් වෙලා නැහැ. මේ ආයතනවල සේවය කරන්නේ කථිකාචාර්යවරුන්. වර්තමාන ආධුනික ගුරුවරයෙකුගේ වැටුපටත් වඩා අඩු වැටුපක් තමයි මේ කථිකාචාර්යවරුන්ට දෙන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැනට 6,000ක් පමණ විද්‍යා පීඨවල ගුරු සිසුන් ඉගෙනුම ලබනවා. ඒ අයට මාසයකට දීමනාවක් වශයෙන් රුපියල් 5,000ක් වාගේ ඉතා සොච්චම් මුදලක් ලබා දෙනවා. ඒක දිනකට රුපියල් 115ක් වාගේ මුදලක්. මම අහන්න කැමතියි, රුපියල් 115කින් තුන්වේලක් කන්න පුළුවන්ද කියලා. මේ ගුරු සිසුන් ඉන්න මධ්‍යස්ථානවල, විද්‍යා පීඨවල වැඩි ප්‍රමාණයක් කාන්තාවන් තමයි ඉගෙනුම ලබන්නේ.

අපි දැන් මන්ද පෝෂණය ගැන කථා කරනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පොළොන්නරුව දිස්ත්‍රික්කයේ ඉන්න දූ දරුවන්ට මන්ද පෝෂණ තත්ත්වයක් තිබුණාය කියලා අපි ජීවිතේට අහලා නැහැ. අද මන්ද පෝෂණය ගැන කථා කරනවා. ඒ නිසා මේ දීමනා වැඩි වෙන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, වත්මන් ජනාධිපතිතුමා අගෝස්තු මාසයේ ගෙනා අතුරු අය වැයෙන් පාසල් දරුවන්ගේ දිවා ආහාරය වෙනුවෙන් රුපියල් මිලියන 4,000 වෙන් කළා. ඒ කියන්නේ එක ළමයෙකුට දිනකට ලැබෙන්නේ රුපියල් 60යි. අද මේ ගැලරියේත් ඉන්නවා පාසල් දරුවෝ.

මේ දරුවෙකුට දවසකට පෝෂණීය ආහාර වේලකට ලැබෙන්නේ රුපියල් 60යි. අද රුපියල් 60කින් දරුවෙකුට පෝෂණීය ආහාර වේලක් ගන්න පුළුවන්ද? අද බිත්තරයක් රුපියල් 60ක් වෙනවා. ඉතින් කොහොමද පෝෂණ ආහාර වේලක් දෙන්නේ? නමුත් අතුරු ඒ අය වැයෙන් කිව්වා, පාසල් පෝෂණ ආහාර වැඩසටහනට රුපියල් මිලියන 4,000ක් වෙන් කරනවා කියලා. හැබැයි, මේ අය වැයේ කිසිම තැනක මේ පෝෂණ ආහාර වැඩසටහනට මෙච්චර මුදලක් වෙන් කළා, මේ රුපියල් 60ක මුදල වැඩි කළා කියලා නැහැ. අඩුම ගණනේ ඒක රුපියල් 100ක් වත් කරන්න ඕනෑ. ඒ නිසා මේ ගැන විශේෂ අවධානයක් යොමු කරන්න කියලා මම මේ ගරු සභාවෙන් මේ අවස්ථාවේ ඉල්ලා සිටිනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පොළොන්නරුව දිස්ත්‍රික්කය ගත්තාම, අද වී ගොවියාට වී ටික විකුණා ගන්න විධියක් නැහැ. යල කන්නයේ වී ටික තවම ගෙවල්වල. පසුගිය කාලයේ, හිටපු ජනාධිපතිතුමා ගෝඨාභය රාජපක්ෂ මහත්තයා රසායනික පොහොර කප්පාදු කරපු අවස්ථාවේ එවකට හිටපු කෘෂිකර්ම ඇමතිතුමා කිව්වා, බය වෙන්න එපා, ගොවිතැනට කාබනික පොහොර පාවිච්චි කරන්න, ඒවා පාවිච්චි කරලා වගා හානි වුණොත් අපි වන්දි ලබා දෙනවා කියලා. ඒ සඳහා මුදලකුත් වෙන් කර ගත්තා. හැබැයි, තවමත් ඒ ගොවීන්ට වන්දි ලබා දීලා නැහැ. ඒ වාගේම යල කන්නයේ ගොවියාගේ වී ටික විකුණා ගන්න තවම විධියක් නැහැ. රජය කිව්වා, රුපියල් 120ට වී මිලදී ගන්නවා කියලා. ඒ නිසා තමයි වී මෝල් මුදලාලිලා ගොවියාගේ වී ගත්තේ නැත්තේ. අද ගොවියාට තවමත් යල කන්නයේ වී ටික විකුණා ගන්න බැරි වෙලා තියෙනවා. මුදල් ඇමතිතුමා වන වත්මන් ජනාධිපතිතුමාගෙන් මම මේ අවස්ථාවේ ගෞරවනීය ඉල්ලීමක් කරනවා, යල කන්නයේ වී ටික අවම වශයෙන් රුපියල් 140කටවත් ලබා ගන්න මේ අය වැයෙන් දායකත්වය ලබා දෙන්න කියලා

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි විදේශ විනිමය ගැන කථා කරනවා. සංචාරකයෝ ගැන කථා කරනවා. ඊයේ ආණ්ඩුව පැත්තෙන් කථා කරපු සමහර මන්ත්‍රීවරු ඇමතිවරු කිව්වා, කොවිඩ් වසංගතය නිසා රටේ මේ තත්ත්වය ඇති වුණා කියලා. බංග්ලාදේශය, මාලදිවයින සහ අනෙක් රටවලත් මේ වසංගතය ඇති වුණා. හැබැයි, අද ඒ රටවල් අපි අබිබවා ඉස්සරහට ගිහිල්ලා තිබෙනවා. මම එදා මේ පාර්ලිමේන්තුවේදී කිව්වා, පසුගිය කාලයේ ගෙන්වූ Pfizer vaccines මිලියන 8ක් ඔක්තෝබර් මාසයේ expire වෙනවා කියලා. එක්තරා පුවත් පතක තිබුණා, රුපියල් 250 vaccine එක රුපියල් 40,000ක් දීලා අරගෙන කියලා. ඒ කියන්නේ ලක්ෂ තුනෙන් කරන වැඩේට කෝටි 7ක් වියදම් කරලා. කවුද මේවාට වග කියන්න ඕනෑ?

පසුගිය කාලයේ රසායනික පොහොර නැවැත්තුවා. සුදු ලූනු වංචාව, සීනි වංචාව, පොල්තෙල් වංචාව, Pandora Papers ගනුදෙනු වාගේ දේවල් සිදු වුණා. අපි විපක්ෂය විධියට ඒවා පෙන්වා දෙනකොට වත්මන් ජනාධිපතිතුමා කියනවා, ප්‍රශ්නයේ වල්ගයෙන් අල්ලාගෙන ඉන්නවා වාගේ කියලා. වංචා දූෂණය නවත්වනවා, ඒවා කරපු අය හිරේ විලංගුවේ දානවා යැයි කීම ප්‍රවාදයක් කියලායි අය වැය කථාවේදී එතුමා කියන්නේ. එතුමාගේ අය වැය කථාවේදී කියනවා, විපක්ෂයේ මන්ත්‍රීවරු ප්‍රශ්නයේ වලිගයෙන් අල්ලා ගෙන ඉන්නවා කියලා. ඇත්තටම අපි ප්‍රශ්නයේ වලිගයෙන් නොවෙයි අල්ලාගෙන ඉන්නේ. අපි ප්‍රශ්නය බෙල්ලෙන් අල්ලා පෙන්වා දීලා තිබෙනවා. ඒවා නිවැරදි කරන්නේ නැතුව, ඉස්සරහට යන්න බැහැ. රටේ ජනතාව මේවා දිහා බලාගෙන ඉන්නවා. විදේශ රටවල් වෙන්න පුළුවන්, IMF එක වෙන්න පුළුවන්, අපේ රටට ආධාර කරන්න ඉන්න විදේශ රටවල් වෙන්න පුළුවන් මේවා කළේ කවුද කියලා බලාගෙන ඉන්නවා. මේ රටේ ගොවියා මේවාට වග කියන්න ඕනෑ නැහැ. මේ රටේ පාරිභෝගිකයා මේවාට වග කියන්න ඕනෑ නැහැ.

මේ ආණ්ඩුව තුළ හොඳ දක්ෂ ඇමතිවරු ඉන්නවා. විශේෂයෙන්ම කංචන විජේසේකර ඇමතිතුමා, පරිසර ඇමතිතුමා, මහින්ද අමරවීර ඇමතිතුමා වාගේ අය. මහින්ද අමරවීර ඇමතිතුමා පොළොන්නරු දිස්ත්‍රික්කයට ඇවිල්ලා, මේ ප්‍රශ්න විසඳන්න අප සාකච්ඡාවට කැඳෙව්වා. අන්න එහෙම තමයි වැඩ කරන්න ඕනෑ. අපි බොහොම සහයෝගයෙන් ඒ අයත් එක්ක වැඩ කරනවා. ඒ වාගේ අයත් එක්ක වැඩ කරන්න පුළුවන්. හැබැයි, පමණක් අය අද එන්න, හෙට එන්න කියලා බොරුවට අපි රස්තියාදු කළොත් අපට ඒ අය එක්ක එකතු වෙලා වැඩ කරන්න බැරි වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට මේ අවස්ථාව ලබාදීම ගැන ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
කේ. කාදර් මස්තාන් අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 13ක කාලයක් ලැබෙනවා.

[பி.ப. 3.31]

**ගරු කේ. කාදර් මස්තාන් මහතා (ග්‍රාමීය ආර්ථික රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு கா.காதர் மஸ்தான் - கிராமியப் பொருளாதார இராஜாங்க அமைச்சர்)
(The Hon. K. Kader Masthan - State Minister of Rural Economy)
*பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.*

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இலங்கைப் பாராளுமன்றத்தில் சமர்ப்பிக்கப்பட்டிருக்கின்ற 77ஆவது வரவு செலவுத்திட்ட உரை தொடர்பாக இந்த உயரிய சபையில் ஒருசில வார்த்தைகளைக் கூறச் சந்தர்ப்பம் கிடைத்த தையிட்டு மகிழ்ச்சியடைகின்றேன். மாண்புமிகு ஜனாதிபதி ரணில் விக்கிரமசிங்ஹ அவர்களின் 2023ஆம் நிதி ஆண்டுக் கான வரவு செலவுத்திட்டம், பல சவால்களுக்கு மத்தியிலும் எமது தேசத்தைச் சரியான திசையில் வழிநடத்தும் வகையில் முன்வைக்கப்பட்டிருப்பதாகத் தெரிகிறது. வெற்றுப் பேச்சு களுக்கும் ஜனரஞ்சகமான வாசகங்களுக்கும் அப்பால், மக்களின் தேவைகளை முதன்மைப்படுத்தும் விதமாக, நாடு எதிர்கொண்டுள்ள பொருளாதார நெருக்கடியிலிருந்து மீண்டு வருவதே இந்த வரவு செலவுத்திட்டத்தின் நோக்கமாகும். இறக்குமதிமீது தங்கியிருக்கும் பொருளாதாரத்திற்குப் பதிலாக, உள்நாட்டு விவசாய உற்பத்தி, பண்ணை உற்பத்தி மற்றும் விவசாயக் கைத்தொழில் முயற்சிகள்மூலம் தேசிய உற்பத்திப் பொருளாதாரத்தை மேம்படுத்துவதை இந்த வரவு செலவுத் திட்டம் இலக்காகக் கொண்டுள்ளது.

இளைஞர், யுவதிகளின் சிறந்த எதிர்காலத்தை இலக்காகக் கொண்டு இந்த வரவு செலவுத்திட்டம் 3 பிரதான விடயங்கள் மீது கவனத்தைச் செலுத்துகின்றது: (1) ஏற்றுமதியை அடிப்படையாகக் கொண்ட போட்டிக்குரிய பொருளாதாரம்; (2) சூழல் நட்பான பசுமை மற்றும் நீலப் பொருளாதாரம்; (3) டிஜிட்டல் பொருளாதாரம். இதன்மூலம் 7-8 சதவீத தேசிய பொருளாதார வளர்ச்சி எதிர்பார்க்கப்படுகின்றது.

மிக அதிகமான வியாபார நட்புச் சூழல் ஒன்றினை உருவாக்குவதற்கு இலகுபடுத்தப்பட்ட மற்றும் தற்பொழுது காணப்படுகின்ற ஏற்பாடுகளை வினைத்திறன் மிக்கதாக மாற்றுவதற்கான அவசியம் ஏற்பட்டுள்ளது. இதற்கமைய ஆரோக்கியமான வியாபாரச் சூழலொன்றை உருவாக்குவதற்கு இயலுமான வகையில் தேவையான மறுசீரமைப்புகளை அறிமுகம் செய்வதற்கு முதலீட்டு ஊக்குவிப்பு அமைச்சுக்கு ரூபாய் 200 மில்லியன் ஒதுக்கீடு செய்யப்பட்டுள்ளது.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, மக்களின் காணிப் பிரச்சினைகளை விரைவாகத் தீர்ப்பதற்குப் பல செயற்றிட்டங்கள் இங்கே கூறப்பட்டுள்ளன. உண்மை யிலே, எமது பகுதிகளில் காணப்படும் காணிப் பிரச்சினை களுக்கு விரைவான முடிவுகள் எட்டப்படும்பொழுது, அங்கு வந்து உணவுப் பாதுகாப்பு அம்சத்தை நிறைவுசெய்யும் விதமாகப் பல உற்பத்திச் செயற்பாடுகளில் முதலீடு செய்வதற் குப் பல முதலீட்டாளர்கள் காத்துக்கொண்டிருக்கின்றார்கள். ஆனால், அதற்குரிய காணியை அவர்களுக்குக் கொடுப்பதில் பாரிய பிரச்சினையுள்ளது. எமது பகுதிகளில் மரவள்ளிக் கிழங்கு அதேபோல, சோளம், உழுந்து போன்ற தானியங்களை எமது நாட்டுக்குத் தேவையானவற்றைவிட ஏற்றுமதி செய்யக் கூடியளவுக்கு உற்பத்தி செய்யக்கூடிய வளம் இருக்கின்றது. இவையெல்லாம் ஏற்றுமதி செய்வதற்குரியவை. எனவே, இந்தக் காணிப் பிரச்சினைக்கு விரைவான முடிவுகளை எடுப்பதற்கு எமது ஜனாதிபதி அவர்களுடைய இந்த வரவு செலவுத்திட்டத்தினூடான செயற்றிட்டங்கள் உறுதுணையாக அமையுமென நான் எதிர்பார்க்கின்றேன்.

அதேபோல, கல்வி தொடர்பில் நாங்கள் எடுத்துக் கொண்டால், இந்த வரவு செலவுத்திட்டத்துக்கூடாகப் பாடசாலைகளுக்கு இலவச இணைய வசதிகளை வழங்குதல், கிராமியப் பாடசாலைகளின் வசதிகளை மேம்படுத்துதல், மாணவர்களுக்கான புலமைப்பரிசில் திட்டம் என்பவற்றுடன் இன்னும் பல ஊக்குவிப்புச் செயற்றிட்டங்களையும் வழங்கும் ஏற்பாடுகள் காணப்படுவதை அவதானிக்க முடிகின்றது. குறிப்பாக, universitiesஇற்குரிய ஒதுக்கீடுகள் பலவும் செய்யப் பட்டுள்ளன. எமது பகுதியில் அண்மையில்தான் வவுனியா பல்கலைக்கழகம் உருவாக்கப்பட்டது. எனவே, இந்த Budget இல் அதற்குரிய நிதி ஒதுக்கீடு இடம்பெறுமென்று நாங்கள் எதிர்பார்த்திருந்தோம்; அது நடைபெறவில்லை. அதுதான் எங்களுக்கு இதிலுள்ள ஒரு குறைபாடாக நான் உணர்கிறேன். இருந்தாலும், எதிர்காலங்களிலோ அல்லது ஏனைய சில உதவித்திட்டங்கள்மூலமோ எமது வவுனியா பல்கலைக் கழகத்துக்குரிய தேவைப்பாடுகள் நிறைவுசெய்து தரப்படும் என்று எதிர்பார்க்கின்றோம்.

அதேபோல, இந்த வரவு செலவுத்திட்டத்துக்கூடாக 100 மில்லியன் ரூபாய் சர்வதேச சூழற் பாதுகாப்புப் பல்கலைக் கழகத்தை உருவாக்குவதற்காக ஒதுக்கீடு செய்யப்பட்டிருக் கின்றது. இது ஓர் ஆரம்பகட்ட ஒதுக்கீடாக இருக்குமென்று நான் நினைக்கின்றேன். இந்தப் பல்கலைக்கழகத்தை அமைப் பதற்குரிய பொருத்தமான மாவட்டங்களாக மன்னார் அல்லது முல்லைத்தீவு காணப்படும் என்ற அடிப்படையில், இந்தச் செயற்றிட்டத்தை நாங்கள் இந்த இரண்டு மாவட்டங்களில் ஏதாவது ஒன்றுக்கு எதிர்பார்த்திருக்கின்றோம்.

குறிப்பாகக் கூறுவதென்றால், இன்று இங்கு எவ்வாறான ஒரு சூழ்நிலை நிலவுகின்றதென்பது உங்களுக்குத் தெரியும். இப்படியான ஒரு காலகட்டத்தில் எங்களுக்கு எவற்றுக் கெல்லாம் முக்கியமாக நிதி தேவையோ அவையனைத்துக்கும் உரிய ஒதுக்கீடுகள் செய்யப்பட்டிருக்கின்றன. அந்த வகையில், மாண்புமிகு ஜனாதிபதி அவர்கள் - எங்களுடைய நிதியமைச்சர் அவர்கள் எப்படியான Budgetஇனைச் சமர்ப்பிக்கப் போகின்றார் என்று பலரும் எதிர்பார்த்திருந்த சமயம் நல்ல தொரு Budget சமர்ப்பிக்கப்பட்டிருக்கின்றது.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, குறிப்பாக நாங்கள் சொல்வதென்றால், ஊவா வெல்லஸ்ஸ பல்கலைக்கழகத்தில் புதிய மருத்துவப்பீடம் அமைப்பதற்கு 200 மில்லியனும் கிராமியப் பாடசாலைகளில் குறைபாடாகக் காணப்படுகின்ற மலசலகூட வசதிகளை மேம்படுத்த 200 மில்லியனும் வைத்தியர்களின் பட்டப்பின் படிப்புக்கு 60 மில்லியனும் பல்கலைக்கழகப் பட்டத்தின் தரத்தை உறுதி செய்வதற்காக 100 மில்லியனும் எமது சமூகப் பாதுகாப்பு வலை நிகழ்ச்சித்திட்டத்துக்கு 43 பில்லியனும் ஒதுக்கப் பட்டிருக்கின்றது.

முதியோர்கள், விசேட தேவையுடையோர், விதவைகள் என்ற வகையில் குறைந்த வருமானத்தைப் பெறுவோரை வலுவூட்டும் விதமாக, குடும்பத் தொழில்முயற்சியாளர்களாக

அவர்களை மாற்றும் வகையில் ரூபாய் 250 மில்லியனும் 10 விவசாயத் தொழில்முயற்சியாண்மைக் கிராமங்களை நிறுவுவதற்கு ரூபாய் 250 மில்லியனும் அறுவடைக்குப் பிந்திய இழப்புக்களைக் குறைப்பதற்கும் களஞ்சியப்படுத்தலை மேற்கொள்வதற்குமாக ரூபாய் 150 மில்லியனும் விவசாயத் தொழில் துறையில் இளையோரைத் தக்கவைத்துக் கொள்வதற்காக ரூபாய் 120 மில்லியனும் இளம் பெண் தொழில்முயற்சியாளர்களை ஊக்குவிப்பதற்கான கடன் திட்டத்திற்காக ரூபாய் 250 மில்லியனும் எனப் பல செயற்றிட்டங்களுக்காக, எமது மக்களினுடைய வாழ்க்கைத் தரத்தை உயர்த்துவதற்காகவும் அவர்கள் சந்திக்கின்ற பிரச்சினைகளுக்குத் தீர்வுகாணும் விதமாகவும் நிதி ஒதுக்கீடுகளைச்செய்து ஓர் அருமையான வரவு செலவுத்திட்டத்தை நிதி அமைச்சர் என்ற முறையில் மாண்புமிகு சனாதிபதி அவர்கள் சமர்ப்பித்திருக்கின்றார். அந்த வகையில், கமத்தொழில் அமைச்சுக்கு ரூபாய் 115 பில்லியனும் irrigation அமைச்சுக்கு ரூபாய் 84 பில்லியனும் கல்வி அமைச்சுக்கு ரூபாய் 232 பில்லியனும் சுகாதார அமைச்சுக்கு ரூபாய் 322 பில்லியனும் எனப் பாரிய நிதி ஒதுக்கீடுகள் செய்யப்பட்டிருக்கின்றன. தற்போதைய இந்தக் காலகட்டத்தில் இவ்வாறான நிதி ஒதுக்கீடுகள் வரவேற்கத்தக்கதாகும். அதனடிப்படையில் இந்த வரவு செலவுத்திட்டத்தில் எந்தவிதமான குறைபாடுகளையும் காணக்கூடியதாக இல்லை என்பதனை நான் இந்த இடத்தில் கூறிக்கொள்கின்றேன்.

மேலும், சர்வதேச வர்த்தகம் மற்றும் முதலீட்டுக்காக ரூபாய் 100 மில்லியனும் புதிய பொருளாதார வலயங்களை உருவாக்குவதற்காக ரூபாய் 300 மில்லியனும் தேசிய உற்பத்தித்திறன் ஆணைக்குழுவினைத் தாபிப்பதற்காக ரூபாய் 100 மில்லியனும் நிதி ஒதுக்கீடு செய்யப்பட்டுள்ளது.

ஒரு காலகட்டம் இருந்தது, கண்டி போன்ற பகுதிகளில்தான் கறுவாப்பட்டை உற்பத்திக்குரிய கறுவாப் பயிர்ச்செய்கையை மேற்கொள்ளலாமென்று. ஆனால், இன்று எமது பகுதிகளிலும் வவுனியா மாவட்டத்திலும் கறுவாப் பயிர்ச்செய்கையினைச் செய்வதற்குரிய பரீட்சார்த்தமான நடவடிக்கை வெற்றியடைந்துள்ளமையினால், அங்கும் பாரியளவில் கறுவா உற்பத்தியை மேற்கொள்ளக்கூடிய நிலைமை காணப்படுகின்றது. கறுவா உற்பத்தியினை ஊக்குவிப்பதற்கான திணைக்களம் ஒன்றைத் தாபிப்பதற்காக ரூபாய் 200 மில்லியன் நிதி ஒதுக்கீடு செய்யப்பட்டுள்ளது. அந்த வகையில், இந்த வரவு செலவுத் திட்டத்தில் குறிப்பாக விவசாயிகளை முன்னுரிமைப்படுத்தி அவர்களை ஊக்குவிப்பதற்கான பல திட்டங்கள் குறிப்பிடப்பட்டுள்ளன.

எமது பகுதிகளில் இருக்கின்ற மீனவர்களுக்கு நிறையப் பிரச்சினைகள் இருக்கின்றன. அந்த வகையில், மீனவர்களுடைய பிரச்சினைகள் தொடர்பாகவும் இந்த வரவு செலவுத் திட்டத்திலே குறிப்பிடப்பட்டுள்ளதோடு, இதிலே கடற்றொழில் அமைச்சுக்குப் பாரியளவு நிதி ஒதுக்கீடும் செய்யப்பட்டிருக்கின்றது. சிறிய தோணிகளில் சென்று மீன்பிடியில் ஈடுபடுகின்றவர்களுக்கும் மலையக மக்களுக்கும் மண்ணெண்ணெய்க்கான மானியம் வழங்கப்படுமென்று கடந்த காலங்களில் கூறப்பட்டிருந்தது. அந்த வகையில், எமது மீனவ மக்கள் மண்ணெண்ணெய்க்கு மானியம் கிடைக்குமென்ற பாரிய எதிர்பார்ப்பில் இருந்தார்கள். அதுவும் இந்த வரவு செலவுத்திட்டத்தில் இடம்பெறுமென்று நினைத்தேன். ஆனால், அதற்குரிய ஒதுக்கீடுகள் எதுவும் இங்கு குறிப்பிடப்படவில்லை. அதனையும் இந்த வரவு செலவுத்திட்டத்திற்குள் உள்வாங்குவதற்குரிய நடவடிக்கை எடுக்கப்படவேண்டும்.

நாம் கடந்த காலங்களில் கூறியதுபோல், இன்றும் அவர்களுக்கு வழங்கப்படுகின்ற மண்ணெண்ணெயின் அளவு போதாது. மீன்பிடிப் படகு வைத்திருப்பவர்கள் பொதுவாக ஒரு கிழமையில் கிட்டத்தட்ட நான்கு தடவையாவது கடலுக்குச் செல்வார்கள். ஆனால், ஒரு கிழமைக்கு ஒரு படகுக்கு கிட்டத்தட்ட 30 லீற்றர் மண்ணெண்ணெய்தான் கிடைக்கின்றது. இதனால், அவர்கள் ஒரு முறைதான் மீன் பிடிக்கப் போகக் கூடியதாக இருக்கின்றது. இதிலொரு மாற்றத்தை ஏற்படுத்தும் விதமாக அவர்களுக்கு மானியம் வழங்குவதோடு, அவர்களுக்குத் தேவையான மண்ணெண்ணெயை வழங்குவதற்குரிய ஏற்பாடுகளையும் கௌரவ அமைச்சர் அவர்கள் செய்துதர வேண்டுமென்று கேட்டவனாக, எனது உரையை நிறைவு செய்கின்றேன். நன்றி.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු ලලිත් එල්ලාවල මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි හතක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.44]

**ගරු ලලිත් එල්ලාවල මහතා**
(மாண்புமிகு லலித் எல்லாவல)
(The Hon. Lalith Ellawala)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට පොඩි වෙලාවක් තිබෙන නිසා ඉතා ඉක්මනින් මගේ කථාව කරන්නම්. සම්ප්‍රදායානුකූල අය වැයක් වාගේ නිලධාරීන් පමණක් සහභාගි වෙලා හදපු අය වැයක් විධියට තමයි මේ අය වැය මම දකින්නේ. මොකද, මේ අය වැය හදලා තිබෙන්නේ අද රටේ පවතින අර්බුදයට පිළියමක් හැටියට නොවෙයි. රටේ ජාතික දේපළ විකුණාගෙන කන අය වැයක් හැටියට තමයි මම මේ අය වැය දකින්නේ. මේ අය වැය තුළින් පාඩු ලබන ආයතන ලාභ ලබන ආයතන බවට පරිවර්තනය කරන වැඩ පිළිවෙළකට යන්නේ නැතිව, හොඳට ලාභ ගන්නා ආයතන තමයි මේ අය වැය හරහා විකුණන්න හදන්නේ. ශ්‍රී ලංකා ටෙලිකොම්, කොළඹ හිල්ටන් හෝටලය, වෝටර්ස් එජ් හෝටලය, ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව වාගේ රටේ ලාභ ගන්න ආයතන ටික තමයි මේ අය වැය හරහා විකුණන්න හදන්නේ.

රනිල් වික්‍රමසිංහ අපේ ජනාධිපතිතුමා ඒ කාලයේත් කළේ විකුණාගෙන කන එක තමයි. එවැනි ආර්ථිකයක් තමයි ඒ කාලයේත් තිබුණේ. එතුමා දැනුත් හැදිලා නැහැ. ඒ විකුණාගෙන කන වැඩ පිළිවෙළ ම තමයි දැනුත් මේ රටේ ක්‍රියාත්මක කරන්න හදන්නේ. රට විකුණනවා වාගේම, තව තවත් රට ණය කරන වැඩ පිළිවෙළකට තමයි මේ අය වැයෙන් යන්නේ. මේ අය වැය ඇස්තමේන්තු අනුව රුපියල් බිලියන 4,979ක් ණය වශයෙන් ගන්න බලාපොරොත්තු වෙනවා. එයින් ආපසු ගෙවන්න බලාපොරොත්තු වන්නේ රුපියල් බිලියන 2,025යි. ඒ කියන්නේ තවත් ණය බරක් ඉතිරි කරලා තමයි මෙතුමා යන්න හදන්නේ. මේවා නවතින්න ඕනෑ. ණය ගන්න එක නොවෙයි කරන්න ඕනෑ වැඩේ. රටේ ආර්ථිකය ගොඩනගන්න මීට වඩා හොඳ වැඩ පිළිවෙළවල් තිබෙනවා.

1977න් පස්සේ අපේ රට පාලනය කළ නායකයෝ සියලුදෙනාම අද තිබෙන අර්බුදයට වග කියන්න ඕනෑ. 1977න් පස්සේ මේ රටේ අය වැය ඉදිරිපත් කළ නායකයන් අපේ රටේ ජනතාවට ඉතිරි කළේ එකම දෙයයි. ඒ තමයි, අද වෙනකොට මේ රටේ එක් පුද්ගලයෙක් රුපියල් 1,395,000ක ණයකාරයෙක් කරලා තිබෙන එක. ජනතාවට තවත් ණය බර වැඩි කරන්න තමයි අදත් හදන්නේ. ඒ වාගේම මේ රටේ නායකයෝ කරලා තිබෙන එකම දේ තමයි, මේ රටේ මතු උපදින්න ඉන්න දරුවාටත් ණය මල්ලක් මීට මොළවාගෙන බිහිවෙන්න ඉඩ සැලසීම. ඉතින් මේක නවතින්න ඕනෑ. මේක නවතියි කියලා තමයි අපි බලාපොරොත්තු වුණේ.

[ගරු ලලිත් එල්ලාවල මහතා]

1977දී සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය මේ රට භාරදෙනකොට ඩොලර් බිලියන 1.4ක්ව තිබුණු ණය ප්‍රමාණය තමයි මේ වෙනකොට ඩොලර් බිලියන 51ක් දක්වා වැඩිවෙලා තිබෙන්නේ. මේ ණය ගැනීම් තුළින් කළ හොඳ දේවලුත් තිබුණා, නරක දේවලුත් තිබුණා. ණය ගත යුතු දේවලුත් තිබුණා, ණය නොගත යුතු දේවලුත් තිබුණා. මේ රටට ගැලපෙන්නේ නැති විධියට ණය අරගෙන තිබෙනවා. විශේෂයෙන්ම අපේ අලුත් මන්ත්‍රීවරු මේක තේරුම් ගන්න ඕනෑ. අපි මේ පාර්ලිමේන්තුවට ඇවිල්ලා අවුරුදු දෙකක්, දෙකහමාරක් ගතවෙලා තිබෙන්නේ. මේ පාර්ලිමේන්තුව තුළ අපි දැකපු හැටියට, ඇමතිකම්වලට, වරප්‍රසාදවලට යටවෙලා තමයි සමහර මැති ඇමතිවරු මේ සියලු දේට පක්ෂව අත උස්සලා තිබෙන්නේ. සමහර මැති ඇමතිවරු කථා කරනකොට කිව්වා, මේ වාගේ තත්ත්වයකට රට පත්වෙනකොට සමහර රටවල ජනතාව කන, කර තිබෙන දේවල් පවා ගලවලා දෙනවා කියලා. නමුත් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ රටේ එහෙම ගලවලා දෙයිද? අපේ රටේ සිදු වුණු දූෂණ, වංචා එක්ක ජනතාව එහෙම කරයිද? ඒ නිසා තවදුරටත් එවැනි තැනකට මේ රට ගෙනයන්න නරකයි.

එවැනි තත්ත්වයකට රට පත් කරන්නේ නැතුව, මේ රට ණය බරින් මිරිකන්නේ නැතුව, මේ රටේ ජාතික සම්පත් විකුණන්නේ නැතුව කටයුතු කරන එක තමයි හොඳ. ඒක තමයි මගේ විශ්වාසය. අපි නිවැරදිව මේ තැන්වලදී ඡන්දය පාවිච්චි කළේ නැත්නම් පරණ මන්ත්‍රීවරුන්ට -අවුරුදු විසිනවය, තිහ හිටපු මන්ත්‍රීවරුන්ට- කියන කථා ටිකම තමයි ජනතාව කවදා හෝ අපටත් කියන්නේ කියන කාරණය විශේෂයෙන්ම අලුත් මන්ත්‍රීවරුන් තේරුම් ගත යුතුව තිබෙනවා.

මෙවර අය වැයෙන් අධ්‍යාපන අමාත්‍යාංශයට වෙන් කර තිබෙන්නේ රුපියල් බිලියන 232යි. රුපියල් මිලියන 232,000යි. ආරක්ෂක අමාත්‍යාංශයට රුපියල් මිලියන 410,000ක් වෙන් කරලා තිබෙනවා. අපි දන්නවා, පසුගිය කාලයේ සිදු වූ සියලු දේත් එක්ක දරුවන්ගේ අධ්‍යාපනය තමයි කඩා වැටුණේ. ඒ නිසා මේ අය වැයේ දරුවන්ගේ අධ්‍යාපනයට වැඩි ඉඩක් තිබෙන්න ඕනෑ. හැබැයි, ආරක්ෂක අංශවලට තමයි වැඩිපුර මුදල් වෙන් කරලා තිබෙන්නේ. ඒ මොකටද? දැන් මේ රටේ යුද්ධයක් තිබෙනවාද? මේ රටේ යුද්ධයක් නැතුව ඇයි එහෙම කරන්නේ? මේ කරන්න හදන්නේ මොකක්ද? මේ රටේ ආරක්ෂක අංශය තවතවත් තර කරන්නයි මේ හදන්නේ. "එතුමාටත් මේ ආර්ථිකය හදන්න බැහැ, මේ රජයටත් මේ ආර්ථිකය හදන්න බැහැ, ඒ නිසා ජනතාව එළියට බහින කොට, ආරක්ෂාව තිබෙන්න ඕනෑ" කියලා ජනාධිපතිතුමා තේරුම් ගෙන ඉන්නවාද අපි දන්නේ නැහැ. එහෙම හිතලාද දන්නේ නැහැ, අධ්‍යාපනයට අඩු මුදලක් වෙන් කරලා, ආරක්ෂක අංශ සඳහා මේ වාගේ විශාල මුදලක් වෙන් කරලා තිබෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපිත් දන්නවා, පත්තරවලත් පළ වෙනවා, සමහර පාසල්වල දරුවෝ වැස්සට කුඩ ඉහළා ගෙනයි විභාගයට උත්තර ලියන්නේ. අද පාසල් පද්ධතිය ඒ තත්ත්වයට පත් වෙලා තිබෙනවා. කළුතර දිස්ත්‍රික්කය ගත්තාම, අපි කළුතර දිස්ත්‍රික්කයේ රජයේ නිලධාරින් සමඟ කථා කරන කොට, ඒ නිලධාරින් මොකක්ද කියන්නේ? ඒ ගොඩනැඟිලි කඩා වැටෙන්න යනවා කියනවා; ගොඩනැඟිල්ල හදන්න සල්ලි නැහැ කියනවා. අද එවැනි තත්ත්වයකට පාසල් පද්ධතිය පත් වෙලා. ඒ නිසා මම ඉල්ලා සිටින්නේ, වෙන දෙයක් නොවෙයි. මේ රජයට මේ කටයුතු කරන්න බැරි නම්, තවතවත් ජනතාවට බර පටවන්නේ නැතුව වහාම ඉල්ලා අස් වෙන්න. එහෙම ඉල්ලා අස් වෙලා, අපි එදා ප්‍රාර්ථනා කළා වාගේ මේ කැබිනට් මණ්ඩලය විස්සකින් සමන්විත කරලා, මේ රාජ්‍ය ඇමතිකම් ටික අයින් කරලා ජනතාව තුළ විශ්වාසයක් ගොඩ නගන්න පුළුවන් විධියට නව රජයක් හදන්න. එහෙම විශ්වාසයක් ගොඩ නැඟුවාට පස්සේ විදේශ රටවල්වල ඉන්න ජනතාව, ඒ රටවල සේවය කරන ජනතාව අපට සල්ලි එවයි. මේ රටේ ජනතාවට මේ පාර්ලිමේන්තුව ගැන, මේ ආණ්ඩුව ගැන විශ්වාසයක් නැහැ. ඒ විශ්වාසය ජනතාව තුළ ගොඩ නගන්න ඕනෑ. විශ්වාසය ගොඩ නැඟුවේ නැත්නම් දෙවැනි අරගළ රැල්ලත් එනවා. ඒ පළමුවෙනි රැල්ලේදී නම් අපේ ගම්වල මිනිස්සු විසින් අප බේරාගත්තා. හැබැයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ක්‍රමයට ගියොත් දෙවැනි රැල්ලේදී නම් ගමේ මිනිස්සුවත් අප බේරා ගන්න ඉදිරිපත් වෙන්නේ නැහැ.

අපි-ඔබතුමන්ලා සියලුදෙනාම අලුත් මන්ත්‍රීවරුන්. ඒ නිසා ඔබතුමන්ලා මේ අය වැයට ඡන්දය දෙන කොට, බොහොම හොඳින් හිතා මතා කටයුතු කරන්න කියමින් මම අවසාන වශයෙන් කියනවා, මෙවන් මන්ත්‍රීවරු සිටින රටක් පිනෙන් උදාරයි ! - *[බාධා කිරීමක්]*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු නිතිඥ සාගර කාරියවසම් මන්ත්‍රීතුමා. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට විනාඩි 15ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 3.52]

**ගරු නීතිඥ සාගර කාරියවසම් මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சாகர காரியவசம்)
(The Hon. Sagara Kariyawasam, Attorney-at-Law)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි අද මෙම අය වැය විවාදයට සහභාගි වෙන්නේ අපේ රට දැඩි ආර්ථික ප්‍රශ්න රැසකට මුහුණ දෙමින්, ඒ වාගේම විදේශ ණය ගෙවීම නවතා ඇති අර්බුද තත්ත්වයකට පත් වී ඇති අවස්ථාවක් තුළ. අපි ජාතියක් වශයෙන් අත්‍යවශ්‍යයෙන්ම මෙම තත්ත්වයෙන් ගොඩ යා යුතුයි. ඊට අවශ්‍ය මූලික පදනම මේ අය වැය තුළින් ඉදිරිපත් කරනවාය කියන විශ්වාසය අප තුළ තිබෙනවා.

ඊයේ පාර්ලිමේන්තුවේ පැවති අය වැය දෙවැනිවර කියවීමේ විවාදය තුළ දී මා ඉතාම ලස්සන කථාවකට සවන් දුන්නා. ඒ, පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු සංජීව එදිරිමාන්න මහතාගේ කථාව. එතුමාගේ කථාවේදී ඉතා පැහැදිලිව කිව්වා, මේ රට අද පත්ව ඇති තත්ත්වයට වග කිව යුත්තේ නිදහසින් පස්සේ මේ රටේ බිහි වුණු දේශපාලනඥයන් යැයි කියමින් ගොඩනගමින් තිබෙන සමාජ මතය ගැන. ඇත්තටම මේ පාර්ලිමේන්තුවේ බහුතර බලයක් ලබාගන්න බැරි දේශපාලන පක්ෂ සහ දේශපාලනඥයන් විසින් ගොඩනගනු ලබන ඒ සමාජ මතය සම්බන්ධයෙන් එතුමා අදහස් දැක්වූවා.

මොකද, අප රටේ ජනතාවගෙන් සැලකිය යුතු කොටසක් මේ වන විට විශ්වාස කරනවා, මේ රට අද වැටී තිබෙන තත්ත්වයට වග කියන්න ඕනෑ, නිදහසින් පසු මේ රටේ කටයුතු කළ දේශපාලනඥයන් කියන කාරණය. ඒ වාගේම ඒ ජනතාව පත් කළ දේශපාලනඥයන් නිවැරදි දේ කළා නම්, මෙවැනි තත්ත්වයක් උද්ගත නොවන බවත් ඔවුන් සිතනවා. ඊයේ සංජීව එදිරිමාන්න මැතිතුමාගේ කථාවෙන් ඉතා පැහැදිලිව මේ රටේ ජනතාවට එක කාරණයක් පෙන්වා දුන්නා. ඒ තමයි, මේ රටේ ජනතාව අද ඉන්න මේ තත්ත්වයට වග කිව යුතු වන්නේ, පාර්ලිමේන්තුව නියෝජනය කළ දේශපාලනඥයන් නොවන බව.

අපි අද කථා කරනවා, නිදහසින් පසු දියුණු වූ රටවල් ගැන. අපි ඉන්දියාව, සිංගප්පූරුව, මැලේසියාව, වියට්නාමය වැනි රටවල්

දියුණු වෙච්ච ආකාරය ගැන කථා කරනවා. හැබැයි, ඒ සම්බන්ධයෙන් හොඳට විශ්ලේෂණය කර බැලුවොත් අපට එක් කාරණයක් පෙනෙනවා. ඒ කාරණය තමයි, මේ සියලු රටවල්වල පොදු වූ කරුණක් තිබීම. ඒ තමයි, ඒ රටවල්වල ජනතා විමුක්ති පෙරමුණ වැනි පක්ෂ නොතිබීම. නිදහසින් පසු අනාගත ශ්‍රම බලකායට දායකත්වය දෙන්න ඉන්න දහස් ගණන් තරුණයන් වැරදි මගට යොමු කර, දහස් ගණන් තරුණයන් මහාමාර්ගයේ මියැදෙන්න, මරන්න කටයුතු නොකිරීම ඒ රටවල තිබෙන විශේෂ ලක්ෂණයක්. ඒ වාගේම, බලය ලබා ගැනීම ගැන විතරක් සිතන, රටට ආදරය නොකරන, විප්ලවවාදී නායකයන් යැයි කියා ගන්නා පිරිස් එම රටවල නොසිටීම ඒ රටවල වාසනාවක් කියා මම හිතනවා.

නමුත් අපේ රටේ සිදු වුණේ මොකක්ද? මේ රටේ ජනතාවගේ යහපත සඳහා, පාවිච්චිය සඳහා තිබුණු පොදු ප්‍රවාහන බස් රථ දහස් ගණන් මහ මග පුච්චලා විනාශ කළා. ඒ වාගේම තැපැල් කාර්යාල, රාජ්‍ය ආයතන ගිනිබත් කළා; ට්‍රාන්ස්ෆෝමර් පුපුරුවා හැරියා; දුම්රිය ගිනිබත් කළා. මේ වාගේ විනාශ ක්‍රියා විටින් විට කළාම, රටේ ආදායම නැවත යොදවන්න වෙන්නේ ඒ ගිනි තබා විනාශ කළ දේවල් නැවත ගොඩ නැඟීමටයි. මෙවැනි දේශපාලන සංවිධාන සිදු කළ ක්‍රියා නිසා අපේ රට මේ වාගේ තත්ත්වයකට අද පත් වෙලා තිබෙනවාය කියන එක අපට ඉතාම පැහැදිලි කරුණක්. ඒ විධියට රට ගිනි තබා විනාශ කරලා, රටේ දේපළ විනාශ කළ හැම අවස්ථාවකම අපි රටක්, ජාතියක් වශයෙන් වසර ගණනාවක් පිටුපස්සට ගියා. අද අපි රටක්, ජාතියක් වශයෙන් අත් විඳින්නේ මේ රට විනාශ කරලා, මේ රටේ පොදු දේපළ ගිනි තියලා, ට්‍රාන්ස්ෆෝමර් පුපුරුවලා මේ රටට කළ විනාශයේ ප්‍රතිඵල කියන එක ඉතාම පැහැදිලි කරුණක්. අදත් මම හිතනවා, ජනතා විමුක්ති පෙරමුණ සහ පෙරටුගාමී සමාජවාදී පක්ෂය කියන පක්ෂ දෙක නැවත වතාවක් අරගළයක් තුළින් උත්සාහ කරන්නේ, වසර ගණනාවක් තිස්සේ මේ රටට කළා වාගේ විශාල හානියක් ඇති කරලා, මේ රට නැවතත් ඒ තත්ත්වයට ගෙනියන්න ද කියලා. ඒ කාරණය සම්බන්ධයෙන් මේ රටේ ඉන්න බුද්ධිමත් ජනතාව හෘදය සාක්ෂියෙන් අහලා තීරණයක් ගන්න ඕනෑ කාලයක් ඇවිල්ලා තිබෙනවා.

ඒ වාගේම අපි තේරුම් ගතයුතු එක් යථාර්ථයක්, එක් සත්‍යයක් තිබෙනවා. ඒ තමයි, මෑත ඉතිහාසයේ ලෝකයේ කිසිදු රටක් අරගළ තුළින් දියුණුවක් ලබාගෙන නැහැ කියන එක. අරගළ තුළින් සිදු වන්නේ රටකට එන ආයෝජකයන්, සංචාරකයන් වළක්වන එකයි. විතරක් නොවෙයි, රටේ ඉන්න ආයෝජකයන් පවා ඒ රටින් එළියට ගිහිල්ලා වෙනත් රටවල ඒ අයගේ ආයෝජන කටයුතු කරන්න උත්සුක වන එක.

ඔබතුමන්ලා මේ රටට අවංකව ආදරය කරනවා නම්, මේ රට දියුණු වෙනවා දකින්න අවංකව කැමැති නම් කළ යුත්තේ මේ රට ප්‍රජාතන්ත්‍රවාදයේ මාවත ඔස්සේ, නීතියේ ආධිපත්‍ය ඔස්සේ මේ රට ඉදිරියට ගෙන යෑම මිස, අරගළ කිරීම නොවෙයි. අරගළ තුළින් ලබා ගත හැකි ජයග්‍රහණයක් නොමැති බව ප්‍රකාශ කරන්න කැමැතියි. ඒ වාගේම මේ රටේ නැවත අරගළයක් ඇති වෙනකල් තලු මර මර බලාගෙන ඉන්න, ඒ ගැන කථා කරන දේශපාලනඥයන්ට මම කියන්න කැමැතියි, ඔබ මේ රටට කළ විනාශය ඇති, තවදුරටත් මේ රට විනාශ කරන්න ඒ කටයුතු කරන්න එපා කියලා.

2009 දී ලැබූ යුද ජයග්‍රහණයෙන් පස්සේ එවැනි කිසිදු අරගළයක් නැති වසර කීපයක් මේ රටේ තිබුණා. ඒ තමයි නිදහසින් පස්සේ මේ රටේ වඩාත්ම දියුණු වෙච්ච කාල පරිච්ඡේදය. එදා අපගේ දළ ජාතික නිෂ්පාදිතය හතර ගුණයකින් වැඩි වුණා. ලොව ශීඝ්‍රයෙන්ම දියුණු වෙන රටවල් කීපය අතරට අපි පත් වුණා. ලෝකයේ වේගයෙන්ම දියුණු වෙන නගරය බවට කොළඹ නගරය පත් වුණා. අපේ යටිතල පහසුකම් නිර්මාණය වුණා. ඈත ගම් නියම්ගම්වල අහිංසක ජනතාවගේ ජීවිකාව කරගෙන යන්න ඕනෑ කරන මාර්ග පහසුකම්, යටිතල පහසුකම් ලබා දුන්නා. ජනතාවගෙන් සියයට 96කට විදුලිබලය ලබා දුන්නා. ඉතින් මෙවැනි තත්ත්වයක් තිබුණු රටක් තමයි අපි මේ වෙනස් කරගෙන තිබෙන්නේ. ඒක කරගෙන තිබෙන්නේ වෙන කවුරුවත් නොවෙයි, අපේම ක්‍රියාකාරකම් තුළින් අපිමයි ඒ දේ කරගෙන තිබෙන්නේ. අපේම වැරදි තීරණ නිසා ඒ දේ කරගෙන තිබෙනවාය කියන එක පැහැදිලියි. මේ රටේ තරුණයන්ගේ සිත් තුළ වෛරය වැපිරීම වෙනුවට, ඔවුන්ගේ සිත් තුළ ශක්තිය සහ අධිෂ්ඨානය ස්ථාපිත කරන්න කියලා මේ අරගළය ගැන කථා කරන දේශපාලනඥයන්ගෙන් මම ඉල්ලා සිටින්න කැමතියි.

මේ රට සංවර්ධිත රටක් බවට පත් කිරීමට අවශ්‍ය මූලික අඩිතාලම මෙවර අය වැය තුළින් හඳුන්වා දීලා තිබෙනවාය කියලා මම අවංකව විශ්වාස කරනවා. හැබැයි මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ක්‍රමයක් හඳුන්වා දීම තුළින් පමණක් රටක් සංවර්ධනය කරන්න හෝ දියුණු කරන්න බැහැ. ඒ සඳහා ජනතාවගේ බුද්ධිමත් වූ තීරණ ගැනීම හා කැපවීම අවශ්‍ය කරනවා. අද මේ රටේ ශක්තිමත්ව දේශපාලනය කරන, හොඳින් වැඩ කරන ඕනෑම නායකයකු හඳුන්වන්නේ හොරෙක් හැටියට. එක්තරා රූපවාහිනී සාකච්ඡාවකදී පාර්ලිමේන්තු මන්ත්‍රී ධම්මික පෙරේරා මැතිතුමා ප්‍රකාශයක් කරනවා මම දැක්කා. "අපේ මිනිස්සු හොරා කියන වචනයට කොච්චර පුරුදු වෙලා තිබෙනවාද කිව්වොත්, දිග සුදු පෙදයක් තිබෙන කුරුල්ලාට සුදු රෙදි හොරා කියන්න තරම්, කහපාට පිහාටු තිබෙන කුරුල්ලාට සිවුරු හොරා කියන්න තරම් හොරා කියන වචනයට පුරුදු වෙලා ඉන්නවා කියලා." මේ රටට වැඩ කරන, මේ රට වෙනුවෙන් කැප වුණු, මේ රට බේරා ගත් නායකයන්ට අපහාස කිරීම, වැරදි චෝදනා නැඟීම, පදනම් විරහිත චෝදනා නැඟීම නතර කර ගත්තේ නැත්නම්, ඒ මානසිකත්වයෙන් මිදෙන්න ජනතාවක් හැටියට අපට හැකි වුණේ නැත්නම්, මොන ක්‍රම හඳුන්වා දුන්නත් අපට රටක් හැටියට ඉදිරියට යන්න පුළුවන් වෙයි කියලා මම හිතන්නේ නැහැ.

***[මෙම අවස්ථාවේදී ගරු ජනාධිපති රනිල් වික්‍රමසිංහ මැතිතුමා සභා ගර්භයට පැමිණියේය.]***

*[இச்சந்தர்ப்பத்தில் மாண்புமிகு சனாதிபதி ரணில் விக்கிரமசிங்ஹ அவர்கள் சபாமண்டபத்துட் பிரவேசித்தார்.]*

*[At this stage, the Hon. President Ranil Wickremesinghe entered the Chamber.]*

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ලංකාව කියන්නේ ප්‍රජාතන්ත්‍රවාදී රටක්. අපේ රට පාලනය වෙන්නේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුළින්. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා නීතියට අමතරව අපේ බොහෝ නීති තිබෙනවා. යම් කිසි පුද්ගලයෙක් සොරකමක්, වංචාවක්, දූෂණයක් කරනවා නම් ඒ පුද්ගලයාට එරෙහිව ගත යුතු ක්‍රියාමාර්ග මොනවාද කියලා අපේ රටේ නීතියේ ඉතා පැහැදිලිව සඳහන් කරලා තිබෙනවා. ඒ වාගේම, අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13.(5) ව්‍යවස්ථාවේ ඉතා පැහැදිලිව සඳහන් කරලා තිබෙනවා, "නිර්දෝෂභාවය පූර්ව නිගමනය" කියන කාරණය.

අපේ රටේ ජනතාවට, විශේෂයෙන් අපේ රටේ තරුණ පරපුරට මම මේ කාරණය කියන්න කැමැතියි. මේ රටේ යම් කිසි දේශපාලනඥයකුට, තමන්ට විරුද්ධ මත දරන දේශපාලනඥයකුට ඔබගේ නායකයින් ඇඟිල්ල දික් කරලා "හොරා" කියලා කියනකොට, ඔබට පුළුවන්කම තිබෙනවා නම්, ඔබට කශේරුකාවක් තිබෙනවා නම් තමන්ගේ නායකයාගෙන් අහන්න, "ඔබ ඔහුට හොරා කියනවා නම්, ඔබ ඔහුට විරුද්ධව නීතිමය වශයෙන් පියවර ගන්නේ නැත්තේ ඇයි? මේ ෆයිල් ගොඩගහගෙන ගෙදර තබා ගෙන ඉන්නේ ඇයි?" කියලා. අපේ

[ගරු නීතිඥ සාගර කාරියවසම් මහතා]

රටේ තරුණ පරපුරට ඒ ශක්තිය ලැබුණු දවසට අපේ ජනාධිපතිතුමා ඉදිරිපත් කළ ආර්ථික ප්‍රතිසංස්කරණවල සාර්ථකභාවය ලබා ගන්න පුළුවන් වෙයි කියලා මා හිතනවා.

ඒ විතරක් නොවෙයි. මෙවැනි දේවල්වලට නීති නැහැයි කියන බොළඳ තර්කයකුත් ගෙනෙන්න උත්සාහ දරනවා. නීති නැත්නම් ඔබතුමන්ලා නීති ගෙනෙන්න කියලා ජනතා විමුක්ති පෙරමුණේ නායකයින්ගෙන් මා ඉල්ලා සිටිනවා. නීති නැත්නම් කරුණාකරලා නීති ගෙනෙන්න. අපි එක අතක් නොවෙයි, අත් දෙකම උස්සා එවැනි නීති සම්මත කරන්න උදවු කරන්නම්. මා හිතන හැටියට මේ රටේ බොරු චෝදනා නැඟීම අවසන් විය යුතුයි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් ඉතිරි වී තිබෙනවා.

**ගරු නීතිඥ සාගර කාරියවසම් මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சாகர காரியவசம்)
(The Hon. Sagara Kariyawasam, Attorney-at-Law)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු ඩී.වී. චානක රාජ්‍ය ඇමතිතුමාගේ කාලයෙනුත් මට විනාඩි කිහිපයක් දෙන්න.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඒ කාලය දුන්නා, ගරු කාදර් මස්තාන් රාජ්‍ය අමාත්‍යතුමාට.

**ගරු නීතිඥ සාගර කාරියවසම් මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சாகர காரியவசம்)
(The Hon. Sagara Kariyawasam, Attorney-at-Law)
නැහැ. ගරු ඩී.වී. චානක රාජ්‍ය ඇමතිතුමාගේ කාලයෙන් මා ඉල්ලා සිටින්නේ, ගරු මිලාන් ජයතිලක මන්ත්‍රීතුමාගේ කාලයෙන් නොවෙයි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඩී.වී. චානක රාජ්‍ය ඇමතිතුමාගේ කාලය තමයි ගරු කාදර් මස්තාන් රාජ්‍ය ඇමතිතුමාට ලබා දුන්නේ.

**ගරු නීතිඥ සාගර කාරියවසම් මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சாகர காரியவசம்)
(The Hon. Sagara Kariyawasam, Attorney-at-Law)
එතුමා මට දැනුම් දුන්නා, එතුමාගේ කාලය ලබා ගත හැකි බවට.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු කාදර් මස්තාන් රාජ්‍ය ඇමතිතුමා ඒ කාලය ගත්තා.

**ගරු නීතිඥ සාගර කාරියවසම් මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சாகர காரியவசம்)
(The Hon. Sagara Kariyawasam, Attorney-at-Law)
කමක් නැහැ.

ඒ නිසා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ බොරු කීම නවත්වන්න ඕනෑ. අද ගරු මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමා ප්‍රකාශයක් කරනවා මං දැක්කා, ගරු ජනාධිපතිතුමා විසින් ශ්‍රී ලංකාවේ මුදල් ගෙවලා මාලදිවයිනේ කථානායකවරයා විදේශයකට ගෙන යෑමක් සම්බන්ධයෙන්. ඒ කාරණය දැන ගත්ත මොහොතේම ඒ ගැන මා සොයා බැලුවා. මෙය කිසිම පදනමක් නැති අමූලික බොරුවක්. මා හිතන හැටියට දේශපාලනඥයන් වශයෙන් අපි මෙවැනි බොරු චෝදනා නැඟීම දැන්වත් නතර කළේ නැත්නම්, ජනතාව දේශපාලනඥයා කියන චරිතය විශ්වාස කිරීම තවදුරටත් කරන එකක් නැහැ. ඒ නිසා මෙවැනි බොරු චෝදනා කරන්න එපා. මට දැන ගන්න ලැබුණු හැටියට නම්, ඒ මාලදිවයිනේ කථානායකවරයා විදේශගත වෙන්න නියමිතව තිබුණේ, ගරු මුජිබුර් රහුමන් මන්ත්‍රීතුමාගෙන් මුදල් වගයක් ඉල්ලාගෙන. නමුත් සජිත් ප්‍රේමදාස මැතිතුමාට "හූ" කියන්න ජනතාව ගෙනෙන්න සියලු මුදල් ටික වියදම් කළාට පස්සේ මුදල් ඉතිරි වුණේ නැහැ, මාලදිවයිනේ කථානායකවරයාට දෙන්න. මට දැන ගන්න ලැබී තිබුණු හැටියට ඒක තමයි වෙලා තිබෙන්නේ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

**ගරු නීතිඥ සාගර කාරියවසම් මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சாகர காரியவசம்)
(The Hon. Sagara Kariyawasam, Attorney-at-Law)
මා ප්‍රකාශ කරනවා, මේ අය වැය ලේඛනය මේ රටේ ව්‍යවසාය නැංවීම සඳහා ඉදිරිපත් කර තිබෙන අය වැයක් කියලා. මේ ව්‍යවසායයන් නැංවීමටමේ ක්‍රමය විතරක් ප්‍රමාණවත් වන්නේ නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මේ රටේ ජනතාවගේ සිතුම් පැතුම් වෙනස් කරලා, ජනතාව මේ රට වෙනුවෙන් වැඩ කිරීමට අනුගතවෙලා, විවේචනය කරමින් සිටීම නවතා මේ රට ඉදිරියට ගෙන යන්න ඕනෑය කියන සිතුවිල්ලෙන් යුතුව කටයුතු කළොත්, අපට ඒ දේ කරන්න පුළුවන්. එහෙම නැතුව මේ මොන සංශෝධන ගෙනාවත්, රටක් හැටියට අපට ඉදිරියට යන්න පුළුවන් වෙයි කියලා මා හිතන්නේ නැහැ.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු චාල්ස් නිර්මලනාදන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 17ක කාලයක් තිබෙනවා.

[பி.ப. 4.08]

**ගරු චාල්ස් නිර්මලනාදන් මහතා**
(மாண்புமிகு சாள்ஸ் நிர்மலநாதன்)
(The Hon. Charles Nirmalanathan)
நன்றி, கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே!

ගරු ජනාධිපතිතුමා මෙතැන ඉන්න එක ගැන මට සන්තෝෂයි. මම කථා කරන වෙලාවේ කැබිනට් ඇමතිවරු කවුරුවත් නැතිවෙයි කියලා මම හිතුවේ. ඒ නිසා ජනාධිපතිතුමා මෙතැනට ආපු එක ගැන මම සන්තෝෂයි. මම කියන කාරණා ටික එතුමාට අහගන්න පුළුවන්.

மாண்புமிகு சனாதிபதி அவர்களே, பொருளாதார நெருக்கடிமிக்க சூழலில்தான் நீங்கள் நிதி அமைச்சராக இருந்து இந்த வரவு செலவுத்திட்டத்தை முன்மொழிந் திருக்கிறீர்கள். ஏன் இந்த நாட்டில் இவ்வாறானதொரு பொருளாதார நெருக்கடி ஏற்பட்டது? என்பதைப் பற்றி நாங்கள் சிந்திக்க வேண்டும். இலங்கை சுதந்திரம்

அடைந்ததற்குப் பிற்பாடு, இனவாதத்தை முதலீடாக வைத்துத் தேர்தலுக்குச் செல்கின்றவர்களுக்கு ஆதரவாகத்தான் பெரும்பான்மையான சிங்கள மக்கள் வாக்களித்திருக்கிறார்கள். அதன் தொடர்ச்சியாக, 1956ஆம் ஆண்டு தனிச் சிங்களச் சட்டம் கொண்டுவரப்பட்டபோது, அதை எந்தவொரு சிங்களப் பொதுமகனும் எதிர்க்கவில்லை. மாறாக, ஆதரித்தார்கள். அதன் விளைவாக, தமிழர்கள்மீது வன்முறைகள் கட்டவிழ்த்துவிடப்பட்டன.

கடந்த காலங்களில் இனவாதத்தை முதலீடாகப் பயன்படுத்தி தேர்தலில் போட்டியிட்டவர்களைச் சிங்கள மக்கள் ஆதரித்திருக்கிறார்கள். ஆனால், இன்று அந்த நிலைமை மாறியிருப்பதாகவே நான் நினைக்கிறேன். எதிர்காலத்தில் யாராவது இனவாதத்தை முதலீடாகப் பயன்படுத்தி தேர்தலுக்குச் செல்வாரேயானால், அவரைச் சிங்கள மக்கள் நிராகரிப்பார்கள் என்றே நான் எண்ணுகிறேன். அது எதிர்காலத்தில் இலங்கையை வளர்ச்சிப் பாதையில் கொண்டுசெல்வதற்குச் சாதகமாக அமையுமென்று நான் நினைக்கிறேன். மாண்புமிகு சனாதிபதி அவர்களே, யுத்தம் முடிவடைந்ததன் பின்னர், வடக்கு, கிழக்குப் பிரதேசங்களில் நாங்கள் நிறையச் சவால்களைச் சந்தித்து வருகிறோம். அவற்றில் மிகப் பிரதானமானது, காணி அபகரிப்பாகும். அது, இராணுவ முகாம்களை விஸ்தரிப்பதற்காக எடுக்கப்படுகின்ற தனியார் காணிகளாக இருக்கலாம், அரசாங்கத்தால் வழங்கப்பட்ட காணிகளாக இருக்கலாம்! இச்செயற்பாடு வடக்கு, கிழக்கில் தொடர்ச்சியாக நடைபெற்று வருகிறது. முல்லைத்தீவு மாவட்டத்திலுள்ள Gotabaya Navy Base தொடர்பில் நான் ஏற்கெனவே உங்களுடன் கதைத்திருக்கிறேன். அது 671 ஏக்கர் பரப்பளவைக் கொண்டது.

அங்கு கடற்படை முகாம் இருக்கக்கூடாது என்பது என்னுடைய கருத்தல்ல. ஒரு கடற்படை முகாமுக்கு, Townஇற்கு அண்மித்த பிரதேசத்தில் 671 ஏக்கர் நிலம் எதற்காக? என்பதுதான் என்னுடைய கேள்வியாகும். இன்றுகூட, அந்தக் காணியைக் கொழும்பிலிருந்து சென்ற நிலஅளவைத் திணைக்களத்தினர் GPSமூலம் முறையற்ற விதத்தில் நிலஅளவை செய்திருக்கிறார்கள். ஒருசிலர் தங்களது நிலங்களைக் கடற்படைக்குக் கொடுப்பதற்குச் சம்மதித்திருப்பதாக கடற்படை கூறுகிறது. மாண்புமிகு சனாதிபதி அவர்களே, நான் உங்களிடம் கேட்க விரும்புவது என்னவெனில், அந்த 671 ஏக்கர் நிலத்தில், நீங்கள் விருப்பமானவர்களுடைய காணியை எடுக்க முயற்சிப்பதுபோல, விருப்பமில்லாதவர்களுடைய காணியை அவர்களிடம் ஒப்படைக்க வேண்டும் என்பதுதான். இந்த இரண்டு விடயங்களும் ஒரே நேரத்தில் நடந்தால்தான் நியாயமாக இருக்கும் என்பது என்னுடைய கருத்தாகும்.

கௌரவ சனாதிபதி அவர்களே, உங்களிடம் இனவாதச் சிந்தனை குறைவு என்றே நான் நினைக்கிறேன். கடந்த காலங்களில் தொல்பொருள் திணைக்களமானது, தமிழர்களுடைய வணக்கஸ்தலங்களை அபகரித்து, அங்குள்ள கலாசார அடையாளங்களை அழித்து, பௌத்தமயமாக்குகின்ற செயற்பாடுகளை முன்னெடுத்தது. குறிப்பாக, முல்லைத்தீவிலுள்ள நீராவியடிப் பிள்ளையார் ஆலயம் அப்படியானதொரு பிரச்சினையைச் சில மாதங்களுக்கு முன்னர் சந்தித்தது. அதுபோன்றதொரு பிரச்சினையை வவுனியா மாவட்டத்தில் நெடுங்கேணிப் பிரதேசத்திலுள்ள வெடுக்குநாறிமலை ஆதிலிங்கேஸ்வரர் ஆலயமும் சந்தித்தது. தற்பொழுது, முல்லைத்தீவு மாவட்டத்தில் குருந்தூர் மலையிலுள்ள சிவன் ஆலயமும் அதுபோன்றதொரு பிரச்சினையைச் சந்தித்திருக்கிறது. நாங்கள் பௌத்த மதத்திற்கு எதிரானவர்கள் அல்லர் என்பதை மாண்புமிகு சனாதிபதி அவர்கள் உட்பட சகல பாராளுமன்ற உறுப்பினர்களும் விளங்கிக்கொள்ள வேண்டும். ஆனால், ஓர் இடத்தில் இருக்கும் இந்து ஆலயத்தை அழித்துவிட்டு, அவ்விடத்தில் பௌத்த விகாரையை நிறுவ முயற்சிப்பதைத்தான் நாங்கள் எதிர்க்கிறோம். அவ்வாறான செயற்பாடுகள் எங்களுடைய மக்கள் மத்தியில் விரக்தியை ஏற்படுத்தியிருக்கின்றன. இது தொடர்பில் மாண்புமிகு சனாதிபதியவர்கள் உரிய நடவடிக்கை எடுப்பாரென நான் நம்புகிறேன்.

2009ஆம் ஆண்டு யுத்தம் முடிவுக்கு வந்தது. ஆனால், இன்றும் வடக்கில் அதிகளவு இராணுவத்தினரும் கடற்படையினரும் இருக்கிறார்கள். கடற்படையினரும் இராணுவத்தினரும் எங்களுடைய பகுதிகளில் இருக்கக்கூடாது என்று நாங்கள் கூறவில்லை. அனர்த்தங்கள் ஏற்படுகின்றபோது, இராணுவத்தினர் உதவி செய்கிறார்கள். சில இடங்களில் கடற்படையினரால் மக்களுக்குக் குடிநீர் வழங்கப்படுகிறது. நான் அந்த விடயங்களை வரவேற்கிறேன். வடக்கு மாகாணத்தில் அதிகளவான இராணுவத்தினரும் அதிகளவான புலனாய்வுத்துறையினரும் அதிகளவான கடற்படையினரும் இருக்கையில், அங்கு போதைவஸ்து வியாபாரமும் பாவனையும் இடம்பெறுகின்றன என்றால், அதனை நாங்கள் சந்தேகக் கண்கொண்டுதான் பார்க்கவேண்டியிருக்கிறது. அதற்கு கடற்படை உடந்தையாக இருக்கிறதா? இராணுவம் உடந்தையாக இருக்கிறதா? என்ற சந்தேகம் தோன்றுகிறது. படையினரின் முழுமையான கட்டுப்பாட்டின்கீழ் இருக்கின்ற ஒரு பிரதேசத்தில் எவ்வாறு போதைவஸ்து வியாபாரம் நடைபெறும்? என்பது என்னுடைய கேள்வியாகும். மாண்புமிகு சனாதிபதி அவர்களே, நீங்கள் பிரதமராக இருந்த காலத்தில் வெளிநாட்டலுவல்கள் அமைச்சராக இருந்த அமரர் மங்கள சமரவீர அவர்கள் ஐ.நா. மனித உரிமைகள் பேரவையில் பயங்கரவாதத் தடைச் சட்டத்தை நீக்குவதாகக் கூறியிருந்தார். எனினும், அது இன்றுவரை நீக்கப்படவில்லை. அதனை நீக்குவதாகத் தொடர்ச்சியாக அரச தரப்பினர் கூறிக்கொண்டு வந்தாலும், தற்போதுவரை அதுதொடர்பில் எந்தவிதமான நடவடிக்கையும் எடுக்கப்படவில்லை. இதனால் நாங்கள் தொடர்ச்சியாகப் பிரச்சினைகளை எதிர்நோக்கி வருகிறோம்.

கௌரவ சனாதிபதி அவர்களே, விவசாய அமைச்சின்கீழ் இயங்குகின்ற PMBஆனது, கடந்த காலங்களில் விவசாயிகளிடமிருந்து நெல்லைக் கொள்வனவு செய்திருந்தது. அச்சபை நெல்லைக் கொள்வனவு செய்த விலையின் அடிப்படையில், இம்முறையும் தங்களுடைய நெல்லை விற்பனை செய்யமுடியும் என்ற நம்பிக்கையில், எங்களுடைய விவசாயிகள் முருங்கனிலுள்ள Government Storeஇல் நெல்லைச் சேமித்து வைத்திருக்கிறார்கள். முன்னாள் நிதி அமைச்சர் ரவி கருணாநாயக்க அவர்கள் அங்கு வந்து, அக்களஞ்சியசாலையைத் திறந்து வைத்தார். அப்போது, நானும் அந்த இடத்திற்குச் சென்றிருந்தேன். தற்பொழுது, அந்த Storeஇல் கிட்டத்தட்ட 7,000 நெல் மூடைகள் இருக்கின்றன. அவற்றைக் கொள்வனவு செய்வதற்கு PMB எந்தவித நடவடிக்கையையும் எடுக்கவில்லை. இந்த நெல் கொள்வனவு விடயமானது, விவசாயிகளுக்கு மிகவும் முக்கியமானது. ஆகையால், எதிர்காலத்தில் அவர்களுடைய நெல்லைக் கொள்வனவு செய்யக்கூடிய திட்டங்களை விவசாய அமைச்சினூடாக நடைமுறைப்படுத்த வேண்டுமென்று கேட்டுக்கொள்கிறேன்.

கௌரவ அமைச்சர் மஹிந்த அமரவீர அவர்கள் சிறிது நேரத்துக்கு முன்னர் இச்சபையில் இருந்தார். தற்போது, அவர் இச்சபையில் இல்லாவிட்டாலும், நான் அவரிடம் ஒரு

[ගරු චාල්ස් නිර්මලනාදන් මහතා]

கோரிக்கையை முன்வைக்க விரும்புகிறேன். ஒன்றரை மாதங்களுக்கு முன்னர், 32,000 ரூபாவுக்கு விற்பனை செய்யப்பட்ட ஒரு லீற்றர் 'லொயன்ட்' என்ற களைநாசினி தற்பொழுது 42,000 ரூபாவுக்கு விற்பனை செய்யப்படுகிறது. நெல் விதைக்கும்போது புற்களை வளரவிடாமல் தடுப்பதற்காக அந்த களைநாசினி பயன்படுத்தப்படுகின்றது. அது ஒரு மாத காலத்திற்குள் ஒரு லீற்றர் 16,000 ரூபாயால் அதிகரித்திருக்கின்றது. இப்படியான ஒரு சூழ்நிலையில், இந்த விவசாயிகள் எவ்வாறு தங்களுடைய வாழ்க்கையைக் கொண்டுசெல்ல முடியுமென்று நான் கேட்க விரும்புகின்றேன்.

நாட்டினுடைய ஜனாதிபதி அவர்கள் தற்பொழுது பாதுகாப்பு அமைச்சராகவும் இருக்கின்றார். 2009ஆம் ஆண்டு யுத்தத்திற்குப் பிற்பாடு, 2010ஆம் ஆண்டு முதல் 2022ஆம் ஆண்டு வரை பாதுகாப்பு அமைச்சுக்கு வரவு செலவுத் திட்டத்தினூடாக 3,790.8 பில்லியன் ரூபாய் ஒதுக்கப் பட்டிருக்கிறது. கடந்த வருடம் அதற்கு 373.05 பில்லியன் ரூபாய் ஒதுக்கப்பட்டிருந்தது. தற்பொழுது 410 பில்லியன் ரூபாய் ஒதுக்கப்பட்டிருக்கின்றது. இது கடந்த வருடத்தைவிட 36.95 பில்லியன் ரூபாயால் அதிகரிக்கப்பட்டிருக்கிறது. எனக்கு முன்னர் பேசிய பாராளுமன்ற உறுப்பினர் ஒருவரும் பாதுகாப்பு அமைச்சுக்கான ஒதுக்கீடு பற்றிக் குறிப் பிட்டிருந்தார். கடந்த வருடத்தைவிட 36.95 பில்லியன் ரூபாயை பாதுகாப்பு அமைச்சுக்கு மேலதிகமாக ஒதுக் கவேண்டிய தேவை என்ன? கடந்த வருடம் ஒதுக்கிய நிதியே மிகக் கூடுதலாக இருந்தது. 2010ஆம் ஆண்டு அதற்கு ஒதுக்கிய நிதி 202.22 பில்லியன் ரூபாய்; தற்பொழுது 410 பில்லியன் ரூபாய்! பாதுகாப்பு அமைச்சுக்கு 2010ஆம் ஆண்டுக்கென ஒதுக்கிய நிதியைவிடவும் பாரிய தொகை தற்பொழுது ஒதுக்கப்பட்டுள்ளது. இது 100 சதவீத அதிகரிப்பாகும்.

கௌரவ அமைச்சர் அவர்களே, யுத்தம் முடிந்ததற்குப் பிற்பாடு, பாதுகாப்பு அமைச்சுக்கு 4,200.8 பில்லியன் ரூபாய் ஒதுக்கப்பட்டிருக்கிறது. இவ்வாறு பாதுகாப்பு அமைச்சுக்குக் கூடுதலான நிதியை ஒதுக்கினால், நாட்டின் பொருளாதார நெருக்கடி எவ்வாறு தீரும்? சர்வதேச நாணய நிதியத் திடமிருந்து - IMF - 4,000 மில்லியன் டொலரை நான்கு வருடங்களில் பெறுவதற்கு இலங்கை அரசாங்கம் முழுமுயற்சி எடுத்துவருகிறது. IMF சொல்கின்றவாறு, வரிகள் அதிகரிக்கப் படுகின்றன. அதுமாத்திரமன்றி, நட்டத்தில் இயங்குகின்ற அரச நிறுவனங்களைத் தனியாருக்கு விற்பதாகச் சொல்லிக் கொண்டு, இலாபத்தில் இயங்குகின்ற அரச நிறுவனங்களையும் தனியாருக்கு விற்பதற்கு நடவடிக்கை எடுக்கப்படுகிறது.

2009ஆம் ஆண்டு யுத்தம் முடிந்ததற்குப் பிற்பாடு, திறைசேரியூடாக பாதுகாப்பு அமைச்சுக்கு 4,200.8 பில்லியன் ரூபாய் வழங்கப்பட்டிருக்கிறது. இதனால், இலங்கையின் பொருளாதாரம் எவ்வளவு தூரம் நெருக்கடிக்கு ஆளாகியிருக்கும்? என்பதைச் சிந்தித்துப் பாருங்கள்! மாறி மாறி ஆட்சிக்கு வருகின்ற அரசாங்கங்கள் பாதுகாப்பு அமைச்சுக்கு அதிகமான நிதியை ஒதுக்கீடு செய்வதற்குக் காரணம், இராணுவத்தைப் பகைத்துக்கொண்டு அல்லது அதன் உதவியோ, அனுசரணையோ இல்லாமல் எவராலும் ஆட்சிசெய்ய முடியாது என்ற எழுதப்படாத சட்டமொன்று இலங்கையில் இருப்பதனாலேயாகும்.

அப்படியான எழுதப்படாத சட்டத்தின் அடிப்படையில், இராணுவத்தைத் திருப்திப்படுத்துவதற்காக எத்தனையாயிரம் பில்லியன்களை அச்சிட்டேனும் பாதுகாப்பு அமைச்சுக்குக் கூடுதலான நிதியை ஒதுக்கவேண்டுமென்ற எண்ணத்தில் தற்போதைய நிதியமைச்சர் அவர்கள் - மாண்புமிகு ஜனாதிபதி - அந்த நிதியை ஒதுக்கீடு செய்திருக்கின்றார். ஒரு நாளைக்குச் சராசரியாக 3 பில்லியன்களுக்கு மேல் பணம் அச்சிடப்படுகின்ற ஓர் அச்சுக் கூட்டுத்தாபனமாக இன்றைக்கு இலங்கை மத்திய வங்கி செயற்பட்டுக்கொண்டிருக்கின்றது. ஆனால், மாதாமாதம் 5,000 ரூபாய் கொடுப்பனவு வழங்கப்படுகின்ற அங்கவீனர்களுக்கு அதில் 2,500 ரூபாயைக் குறைத்து 2,500 ரூபாய் வழங்குவதாகத் தற்பொழுது தீர்மானிக்கப்பட்டிருக்கின்றது. என்னிடம் ஓர் அங்கவீனர் தொலைபேசிமூலம், "ஏற்கனவே மிகவும் சிரப்பட்டுக் கொண்டிருக்கின்ற எங்களுடைய 5,000 ரூபாய் கொடுப் பனவை 2,500 ரூபாயாகக் குறைப்பதற்கு அரசாங்கம் நடவடிக்கை எடுத்திருக்கின்றது. அந்த 5,000 ரூபாய் கொடுப்பவானது பலருக்குக் கிடைப்பதுமில்லை. எனவே, இதைப் பாராளுமன்றத்தினுடைய கவனத்துக்குக் கொண் டுவாருங்கள்" என்று கோரிக்கை விடுத்திருந்தார்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, தற்போது சமர்ப்பிக்கப்பட்டிருக்கும் வரவு செலவுத்திட்டம் தொடர்பில் இலங்கையில் எந்தவிதமான ஒரு பரபரப்பும் இல்லை. பாராளுமன்ற உறுப்பினர்கள் மற்றும் அமைச்சர் களிடம் அது தொடர்பில் எந்தவொரு எதிர்பார்ப்பும் இல்லை. அப்படியான எதிர்பார்ப்பு மக்களிடமும் இல்லை. ஏனென்றால், அந்த எதிர்ப்பார்ப்பை உண்டுபண்ணக்கூடிய வகையில் இந்த வரவு செலவுத்திட்டத்தில் எந்தவிதமான ஒரு திட்டமும் இல்லை. சில அமைச்சுக்களுக்கு நிதிகள் ஒதுக்கப்பட்டிருக்கின்றன. இலங்கையினுடைய வருமானம் என்ன? அந்த வருமானத்தைப் பெறும் துறைகளை ஊக்குவிப் பதற்கு இந்த வரவு செலவுத்திட்டத்தில் செய்யப்பட்டுள்ள முன்மொழிவுகள் என்ன? என்றுகேட்டால், ஒன்றுமே இல்லை.

நான் ஒரு விடயத்தைக் கூறவேண்டும். தற்பொழுது நடைபெற்ற நீர்ப்பாசன அலுவல்கள் பற்றிய அமைச்சுசார் ஆலோசனைக்குழுக் கூட்டத்திலும் அது பற்றிக் குறிப்பிட்டுவிட்டுத்தான் வந்திருக்கிறேன். அதாவது, உலக வங்கியினுடைய நிதியுதவியுடன் WaSSIP திட்டத்தினூடாக இலங்கையில் 7 மாவட்டங்களில் குடிநீர் வழங்கும் திட்டத்திற் கமைய முல்லைத்தீவு மாவட்டத்தினுடைய பாண்டியன்குளம் கரும்புள்ளியான் குடிநீர் வழங்கும் திட்டத்தினை நடைமுறைப்படுத்துவதற்கு முன்மொழியப்பட்டிருந்தது. அது தொடர்பில் 2022ஆம் ஆண்டு தை மாதம் 12ஆம் திகதி பத்திரிகையில் ஒப்பந்தகாரர்களுக்குரிய கேள்விப்பத்திரம் கோரப்பட்டிருந்தது. ஆனால், இன்னும் அதன் வேலைகள் ஆரம்பிக்கப்படவில்லை. நேற்றைய தினம் நான் இந்தச் சபையில் அது தொடர்பில் ஓர் ஒத்திவைப்பு வேளைப் பிரேரணையைக் கொண்டுவந்தபோது, அந்தப் பணத்தில் 15 மில்லியன் ரூபாயைத் திறைசேரி எடுத்துவிட்டதாகவும் அதை முடிப்பதற்குக் காலம் போதாது என்பதால் அத்திட்டம் நிறுத்தப்பட்டிருப்பதாக இராஜாங்க அமைச்சர் அவர்கள் கூறினார். வெட்கமாக இல்லையா? உலக வங்கியினுடைய நிதியுதவியுடன் WaSSIP திட்டத்தினூடாக இலங்கையில் 7 மாவட்டங்களுக்கெனக் கொடுக்கப்பட்ட திட்டங்கள் 6 மாவட்டங்களில் நடைமுறைப்படுத்தப்பட்டுக் கொண்டிருக் கின்றன. அவற்றில் கம்பஹா, நுவரெலியா, குருநாகல், மொனராகலை போன்ற மாவட்டங்களுக்குரிய திட்டங் களுக்கென இன்றும்கூட கேள்விப்பத்திரங்கள் கோரப் பட்டிருக்கின்றன. ஆங்கிலப் பத்திரிகையொன்றில் பிரசுரிக்கப் பட்டிருந்த கேள்விப்பத்திரம் தற்போது என்னிடம் இருக்கின்றது.

ஆனால், முல்லைத்தீவு மாவட்டத்தில் மட்டும் அதை நடைமுறைப்படுத்தாமைக்கு கொவிட்-19இனைக் காரணம் காட்டுகிறார்கள். கொவிட்-19 காரணமாக அந்தக் காலத்தில் ஒப்பந்தம் செய்துகொள்ள முடியாமற்போய்விட்டதாக இன்று பி.ப. 2.30 மணிக்கு நடைபெற்ற நீர்ப்பாசன அலுவல்கள் பற்றிய அமைச்சுசார் ஆலோசனைக்குழுக் கூட்டத்தில் அவ்வமைச்சினுடைய செயலாளர் அவ்வாறு கூறியிருந்தார். வெட்கமாக இல்லையா? மிகுதி 6 திட்டங்களும் நடைமுறைப் படுத்தப்பட்டுக் கொண்டிருக்கின்றன. "உங்களுடைய தொகுதியில் 1,200 மில்லியன் ரூபாய் பெறுமதியான உலக வங்கியினுடைய திட்டத்தை நிறுத்தியிருந்தால், நீங்கள் சும்மா இருப்பீர்களா?" என்று அக்கூட்டத்தின்போது நான் கேட்டேன். அந்தக் கூட்டத்தில், அரச சார்புப் பாராளுமன்ற உறுப்பினர்களும் இருந்தார்கள். அப்படியிருந்தும் அதற்கு யாரும் பதில் கூறவில்லை. அமைச்சருக்கு அது பற்றித் தெரியுமோ என்பது எனக்குத் தெரியாது. அவர் மௌனமாக இருந்தார். அமைச்சின் செயலாளரோ சிரித்துக் கொண்டிருந் தார். முல்லைத்தீவு மாவட்டத்திற்கென ஒதுக்கப்படுகின்ற பணத்தை அல்லது அபிவிருத்தித் திட்டங்களை நிறுத்தினால் கேட்பதற்கு யாரும் இருக்க மாட்டார்களென்ற மனோபாவம்தான் இந்த அரசாங்கத்திடமும் அமைச்சிடமும் இருக்கின்றது. ஆகவே, இப்படியான செயற்பாடுகளை நீங்கள் எதிர்வரும் காலத்தில் நிறுத்தவேண்டும் என்பதனை நான் இந்தநேரத்தில் கண்டிப்பாகவும் விநயமாகவும் கேட்டுக் கொள்கின்றேன்.

**ගරු මුලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු එස්. වියාලේන්ද්‍රන් රාජ්‍ය ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 11ක කාලයක් තිබෙනවා.

[பி.ப. 4.25]

**ගරු එස්. වියාලේන්ද්‍රන් මහතා (වෙළඳ රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு ச. வியாழேந்திரன் - வர்த்தக இராஜாங்க அமைச்சர்)
(The Hon. S. Viyalanderan - State Minister of Trade)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, 2023ஆம் ஆண்டுக்கான வரவு செலவுத்திட்டத்தின் இரண்டாம் மதிப்பீடுமீதான இன்றைய விவாதத்திலே பேசுவதற்கு வாய்ப்பு வழங்கியமைக்கு நன்றி தெரிவித்துக்கொள்கிறேன்.

ஒரு நாட்டுக்குத் தேவையான வருமானத்தை வரி அறவிடுதல், வெளிநாட்டு முதலீடுகளைக் கொண்டுவருதல், வெளிநாடுகளிடமிருந்து கடன் பெறுதல், உள்நாட்டில் உற்பத் திகளை மேற்கொண்டு, ஏற்றுமதியை அதிகரித்தல் என்பவற் றின்மூலம் ஈட்டிக்கொள்ள முடியும். வரி அறவிடுதலானது, நாட்டு மக்களுக்குச் சுமையாகத்தான் இருக்கும். அனைவராலும் வரி செலுத்த முடியாது. ஏனென்றால், நமது நாடு அபிவிருத்தி அடைந்துவருகின்ற ஒரு நாடு; வறுமைக் கோட்டுக்குக்கீழ் வாழ்கின்ற மக்களை அதிகமாகக்கொண்ட ஒரு நாடு! ஆகையால், அனைவரிடமிருந்தும் வரியை அறவிடுவது என்பது மிகவும் கஷ்டமான ஒரு விடயமாகும். அண்மையில் ஓர் ஊடகவியலாளர் என்னிடம், "மாதாந்தம் ஓரிலட்சம் ரூபாயைச் சம்பளமாகப் பெறுகின்ற ஓர் அரச ஊழியரால் வரி செலுத்த முடியுமா?" என்று கேட்டிருந்தார். ஓர் அரச ஊழியரை எடுத்துக்கொண்டால், அவர் பல்வேறு விதமான கடன்களைப் பெற்றிருப்பார். அதனால், அவருக்குச் சம்பளம் குறைவாகத்தான் கிடைக்கும். அப்படிப்பட்ட ஒருவரால் வரி செலுத்துவது என்பது கஷ்டமான ஒரு செயற்பாடுதான். வரி அறவிடுவதன்மூலம் அரசாங்கம் பெருமளவு வருமானத்தை ஈட்டிக்கொள்வதை, வெளிநாடுகளிடமிருந்து மென்மேலும் கடன்களைப் பெற்று நாட்டை அதலபாதாளத்திற்குள் இட்டுச்செல்வதை நான் பொருத்தமற்ற விடயங்களாகவே பார்க்கிறேன்.

இங்கு நாங்கள் முக்கியமாக இரண்டு விடயங்களில் கவனம் செலுத்தவேண்டும். ஒன்று, எமது உற்பத்திப் பொருளாதாரத்தை அதிகரிப்பதற்கான நடவடிக்கைகளை மேற்கொள்ளவேண்டும். இரண்டாவது, வெளிநாட்டு முதலீடுகளை எமது நாட்டிற்குக் கொண்டுவருவதற்கான கதவுகளை நாம் திறந்துவிட வேண்டும். இந்த நாட்டினுடைய சாபக்கேடு என்னவென்றால், மாறி மாறி அரசாங்கங்கள் ஆட்சிக்கு வருகின்றபோது நாட்டுக்கு வருகின்ற வெளிநாட்டு முதலீடுகளை அவ்வப்போது எதிர்க்கட்சியினர் தான்தோன் றித்தனமாக எதிர்ப்பதுதான். இந்த நாடு காலனித் துவத்திலிருந்து சுதந்திரம் பெற்ற நாளிலிருந்து இந்த நிலைமை இருந்து வருகிறது. இந்த நிலைமை மாற்றமடைய வேண்டும்.

இலங்கையில் முதலாவது மிகப் பெரிய ஆடைக் கைத்தொழில் பூங்காவை - textile zone - மட்டக்களப்பு மாவட்டத்தில் புன்னக்குடா பகுதியில் நிறுவுவதற்காக நாங்கள் கடின முயற்சிகளை மேற்கொண்டு வருகிறோம். அதற்காக நாங்கள் பல தடவை இந்தியா சென்று, அங்குள்ள textile சார்ந்த முதலீட்டாளர்களுடன் பேசினோம். அதை எதிர்க் கட்சியினர் எதிர்க்கிறார்கள். இந்தியாவுக்கு அந்த ஆடைக் கைத்தொழில் பூங்காவைத் தாரைவார்த்துவிட்டதாகக் கூறுகி றார்கள். அப்படியென்றால், எவ்வாறு நாங்கள் இந்த நாட்டை அபிவிருத்தி செய்வது? எவ்வாறு எமது நாட்டுக்கு வெளிநாட்டு முதலீடுகளைக் கொண்டுவருவது? அந்த ஆடைக் கைத் தொழில் பூங்கா திறக்கப்பட்டால், அம்மாவட்டத்திலுள்ள சுமார் 10,000 இளைஞர், யுவதிகளுக்கு வேலைவாய்ப்பு கிடைக்கும்; நாட்டுக்கு அந்நியச் செலாவணி கிடைக்கும். இன்று எதிர்க்கட்சியினராக இருப்பவர்கள், தாங்கள் ஆட்சிபீடம் ஏறவேண்டும் என்பதற்காக இதனை எதிர்க் கிறார்கள். அதேபோல, இன்று ஆளும்கட்சியினராக இருப் பவர்கள் நாளை எதிர்க்கட்சிக்குச் சென்றால், இதேபோன்றுதான் செயற்படுவார்கள். அவர்கள் இவ்வாறான கீழ்த்தரமான, கேவலமான வேலையைச் செய்வதுதான் இந்த நாட்டுக்குச் சாபக்கேடாகும். இவ்வாறான வேலைகளைச் செய்வதை விடுத்து, நாங்கள் வெளிநாட்டு முதலீடுகளைக் கொண்டுவர முயற்சிக்க வேண்டும். எந்தவிதமான இயற்கை வளமுமில்லாத - without any natural resource - துபாய் 30 வருடங்களுக்குள் அபிவிருத்தியடைந்திருக்கிறது. அதற்குக் காரணம், அங்கு வெளிநாட்டு முதலீடுகள் தங்குதடையின்றி வருவதேயாகும். அன்று தெற்காசிய நாடுகளுக்கிடையில் பொருளாதார வளர்ச்சியில் இந்தியாவிற்கு அடுத்ததாக இருந்த எமது நாடு, இன்று ஆப்கானிஸ்தானுக்கு அடுத்ததாக தர வரிசையில் 8ஆம் இடத்திற்கு பின்னோக்கிச் சென்றுவிட்டது. உண்மையிலே, இந்த நாட்டை நாசமாக்கிக்கொண்டு இருப்பவர்களில் ஒரு பிரிவினர் மதத் தலைவர்கள்! அவர்கள் மதத்திற்கு மாத்திரம் தலைவராக இருக்காமல், அரசியலிலும் நேரடியாகத் தலையிடுகிறார்கள். அடுத்தது, மந்திரவாதிகள்! அதுபற்றி நேற்று நண்பர் இஷாக் ரஹுமான் அவர்களும் சொன்னார். ஞானக்கா போன்ற சூனியக்காரிகளும் மந்திரவாதிகளும் இந்த நாட்டை நாசமாக்கியிருக்கிறார்கள். முன்னாள் சனாதிபதி கோட்டாபய ராஜபக்ஷ அவர்கள் நல்ல பல திட்டங்களைக் கொண்டுவந்தார்.

ஆனால், அந்தத் திட்டங்களை நடைமுறைப்படுத்திய விதம் பிழையாக இருந்தது. குறிப்பாக, படித்த முட்டாள்கள் சிலரைக்கொண்ட 'வியத்கம' என்ற அமைப்பின்

[ගරු එස්. වියාලේන්ද්‍රන් මහතා]

செயற்பாடுகளும் இந்த நாட்டினுடைய பொருளாதார வீழ்ச்சிக்குக் காரணமாக அமைந்தன. இந்து மதத் தலைவர்களாக இருக்கலாம், கிறிஸ்தவ மதத் தலைவர்களாக இருக்கலாம், பௌத்த மதத் தலைவர்களாக இருக்கலாம், இஸ்லாம் மதத் தலைவர்களாக இருக்கலாம், எந்த மதத் தலைவர்களாக இருந்தாலும் அவர்கள் மதம் சார்ந்த பணிகளைச் செய்து, நாட்டு மக்களை நல்வழிப்படுத்த வேண்டுமே ஒழிய, நேரடியாக அரசியலில் தலையிடக்கூடாது. அவர்கள் நேரடியாக அரசியலில் தலையிட்டு, "அவர் சரியில்லை; இவர் சரியில்லை" என்று சொல்கிறார்கள். அப்படியென்றால், அவர்களைத் தங்களுடைய வழிபாட்டுத் தலங்களினூடாக ஒரு சிறந்த பிரஜையாக உருவாக்கவேண்டிய தார்மீகப் பொறுப்பு அந்த மதத்தலைவர்களுக்கு இருக்கிறது.

இந்த நாடு அழகான ஒரு நாடு; எல்லா வளங்களும் நிறைந்த ஒரு நாடு!

"என்ன வளம் இல்லை இந்த திருநாட்டில்!
ஏன் கையை ஏந்த வேண்டும் வெளிநாட்டில்!"

என்ற பாடல் வரியையும் என் மண்ணின் கவிஞன் நீலாவணனின்,

"தேன்கடலாய் ஓடுமெங்கள்
திருநாட்டில் பிறந்தபயன்
தெரிகின்றாயோ?
வான்தந்த வளமிலையோ
வயல்தந்த நிதியிலையோ
வாடாதே நீ"

என்ற பாடல் வரியையும் நான் இங்கு ஞாபகப் படுத்துகிறேன். அந்த அடிப்படையில், இந்த நாட்டில் நீர் வளம், நில வளம் என சகல வளங்களும் இருக்கின்றன. அப்படிப்பட்ட இந்த நாடு, இனவாதிகள், மதவாதிகள், பிரதேசவாதிகள், மந்திரவாதிகள், சூனியக்காரர்கள் போன்றவர்களால் நாசமடைந்திருக்கிறது. இதுதான் உண்மை! இந்த நிலைமை மாறவேண்டும்.

நல்லிணக்கம் - reconciliation - என்பது, வெறுமனே பேச்சளவில் மாத்திரம் இருக்காது, நடைமுறையில் வரவேண்டும். அன்று கோட்டாபய ராஜபக்ஷ அவர்கள் சனாதிபதியாக இருந்தபோது, பிரதமர் பதவியையேற்று, ஆட்சியைப் பொறுப்பேற்குமாறு எதிர்க்கட்சித் தலைவர் சஜித் பிரேமதாஸ அவர்களுக்கும் அநுர திஸாநாயக்க அவர்களுக்கும் அழைப்பு விடுத்தார். ஆனால், அவர்கள் இருவருமே அதனை ஏற்க முன்வரவில்லை. மாறாக, காதல் கடிதம் எழுதுவதுபோல, சனாதிபதிக்கு கடிதம் எழுதிக்கொண்டிருந்தார்கள். அந்த வேளையில், தற்போது சனாதிபதியாக இருக்கின்ற மாண்புமிகு ரணில் விக்கிரமசிங்ஹ அவர்கள் துணிச்சலாக முன்வந்து, அதனைப் பொறுப்பேற்றார். இப்பொழுது, சஜித் பிரேமதாஸ அவர்களுடைய அணியில் அல்லது எதிர்க்கட்சியில் இருக்கின்ற ஏனைய கட்சிகளைச் சேர்ந்தவர்கள், தற்போதைய சனாதிபதி மாண்புமிகு ரணில் விக்கிரமசிங்ஹ அவர்கள் 'நல்லாட்சி' அரசாங்க காலத்தில் பிரதமராக இருந்தபொழுது, அவரைப் பார்த்து, "Hello, Sir", "Good morning, Sir!", "How are you, Sir?", "I love you, Sir.", "I like you, Sir" என்று சொன்னார்கள். இன்று அவர்களேதான் அவரை வீட்டுக்குப் போகுமாறு கூறுகிறார்கள். சில மாதங்களுக்கு முன்னர், மக்கள் பெற்றோலுக்காக lineஇலே நின்றார்கள்; டீசலுக்காக lineஇலே நின்றார்கள். மண்ணெண்ணெய்க்காக lineஇலே நின்றார்கள்; Gasஇற்காக lineஇலே நின்றார்கள்; அத்தியாவசியப் பொருட்களுக்காக lineஇலே நின்றார்கள்.

இந்த நாட்டில் உருவாகியிருக்கின்ற வரிசைக் கலாசாரம் ஒழிவதாக இருந்தால், 20 வருடங்கள் செல்லுமென அப்போது சிலர் சொன்னார்கள். எனினும், தற்போதைய சனாதிபதி அவர்களும் அரசாங்கமும் எடுத்த சில அர்ப்பணிப்பான முன்னெடுப்புக்களால் இன்று அந்த வரிசை கலாசாரம் முடிவுக்குக் கொண்டுவரப்பட்டிருக்கிறது. அதற்காக நான் இந்த இடத்தில் மாண்புமிகு சனாதிபதி அவர்களைப் பாராட்டுகிறேன். ஒருவரைப் பாராட்டவேண்டிய இடத்தில் பாராட்ட வேண்டும். தற்பொழுது, பொருட்களின் விலைகள் ஓரளவுக்குக் குறைவடைந்திருக்கிறது. அது இன்னும் குறைக்கப்பட வேண்டும். இன்று மக்களின் வாழ்க்கைச் சுமை அதிகரித்திருப்பது எங்களுக்குத் தெரியும்! அன்றாடம் கூலித்தொழில் செய்து வாழ்க்கை நடாத்துகின்றவர்களால் தங்களுடைய நாளாந்த வருமானத்தைக்கொண்டு வாழ்க்கையைக் கொண்டுநடத்த முடியாத நிலைமை இருப்பதை நாங்கள் அறிவோம். அந்த நிலைமையை மாற்றியமைக்க வேண்டுமானால், உற்பத்திப் பொருளாதாரத்தை அதிகரிக்க வேண்டும்.

இலங்கையில் அதிக நிலப்பரப்பைக்கொண்ட மாகாணமான வட மத்திய மாகாணம் 10,724 சதுர கிலோமீற்றர் பரப்பளவைக் கொண்டது. இரண்டாவது அதிக நிலப்பரப்பைக்கொண்ட மாகாணமான கிழக்கு மாகாணம் 9,951 சதுர கிலோமீற்றர் பரப்பளவைக் கொண்டது. மூன்றாவது அதிக நிலப்பரப்பைக்கொண்ட மாகாணமான வட மாகாணம் 8,882 சதுர கிலோமீற்றர் பரப்பளவைக் கொண்டது. இலங்கையின் மொத்த நிலப்பரப்பில் 3/6 பங்கை இந்த மூன்று மாகாணங்களும் கொண்டிருக்கின்றன. நண்பர் சாள்ஸ் நிர்மலநாதன் அவர்கள் கூறியதுபோல, அந்தப் பகுதிகளுக்கு வருகின்ற திட்டங்கள் சில அதிகாரிகளுடைய அசமந்தப்போக்கினாலும் பக்கச்சார்பான செயற்பாடுகளினாலும் திருப்பி அனுப்பப்படுகின்றன.

இன்று நாங்கள் சில திணைக்களத் தலைவர்களை - head of the department - அணுகி, ஒரு வேலையை இலகுவாக நிறைவேற்றிக்கொள்ள முடியாத நிலைமை காணப்படுகிறது. காரணம், இலஞ்சம்! இந்த நிலைமை மாற்றியமைக்கப்பட வேண்டும். இன்று இந்த நாட்டில் 15 பேருக்கு ஒருவர் என்ற அடிப்படையில், 1,450,000இற்கும் மேற்பட்ட அரச ஊழியர்கள் இருக்கிறார்கள். ஒரு கிராம சேவகர் பிரிவில் மக்களுக்குச் சேவை செய்யவென 5 அரச உத்தியோகத்தர்கள் இருக்கிறார்கள். நாட்டில் என்ன நடக்கிறது? இந்த நிலைமை மாற்றியமைக்கப்பட வேண்டும். இன்று 52 அரச நிறுவனங்கள் எந்தவித வருமானமும் இல்லாமல் இருக்கிறது. அவற்றுக்கென வருடந்தோறும் 86 பில்லியன் ரூபாய் செலவழிக்கப்படுகிறது.

மக்கள் தலைவர்களாக இருக்கலாம், அரசியல்வாதிகளாக இருக்கலாம், மதத் தலைவர்களாக இருக்கலாம், அரச அதிகாரிகளாக இருக்கலாம், ஆளுங்கட்சியினராக இருக்கலாம், எதிர்க்கட்சியினராக இருக்கலாம், யாராக இருந்தாலும் மக்கள் நலனைக் கருத்திற்கொண்டு, பொருளாதார ரீதியாக வீழ்ச்சி யடைந்திருக்கின்ற இந்த நாட்டைக் கட்டியெழுப்புவதற்காக இன, மத, சாதி, நிற, வர்க்க, பால் வேறுபாடு இல்லாமல், "இலங்கை மாதாவின் பிள்ளைகள்" என்ற அடிப்படையில் கரம்கோர்த்துப் பயணிக்க வேண்டும். அந்த நிலைமை ஏற்பட்டால்தான், எங்களால் இந்த நாட்டை பொருளாதார ரீதியாக வளர்ச்சியடையச் செய்ய முடியும்; நாட்டில் முன்னேற்றத்தைக் காணலாம். எங்களுடைய

நாட்டைப்போல வரவேண்டுமென்று கனவு கண்ட லீ குவான் யூவின் சிங்கப்பூர் இன்று எங்கேயோ போய்விட்டது. எங்களுடைய நாடு சிங்கப்பூராக அல்ல, சிங்காரபுரியாக வரவேண்டிய நாடு! இன்று எங்களுடைய நாடு இவ்வளவு மோசமான நிலைக்கு வருவதற்குக் காரணம், குறுகிய அரசியல் இலாப நோக்கும் குறுகிய வட்டத்திற்குள் சிந்திக்கின்ற பிற்போக்கான சிந்தனைப் போக்குமே ஆகும். இவை மாற்றியமைக்கப்பட்டு, நல்லதோர் அரசியல் கலாசாரத்தைக் கட்டியெழுப்புவதனூடாகவும் உற்பத்திப் பொருளாதாரத்தை மேம்படுத்துவதனூடாகவும் வெளிநாட்டு முதலீடுகளைக் கொண்டுவருவதனூடாகவும் இந்த நாட்டை எங்களால் மேல் நிலைக்குக் கொண்டுவர முடியும் என்று கூறி, வாய்ப்புக்கு நன்றி தெரிவித்து நிறைவு செய்கிறேன்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඉෂාක් රහුමාන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 09ක කාලයක් තිබෙනවා.

Order, please! ඊට පෙර කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයෙක් මූලාසනය සඳහා ගරු ප්‍රේම්නාත් සී. දොලවත්ත මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

**ගරු ප්‍රසන්න රණතුංග මහතා (නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)**
(மாண்புமிகு பிரசன்ன ரணதுங்க - நகர அபிவிருத்தி மற்றும் வீடமைப்பு அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற் கோலாசானும்)
(The Hon. Prasanna Ranatunga - Minister of Urban Development and Housing and Chief Government Whip)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "ගරු ප්‍රේම්නාත් සී. දොලවත්ත මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය"යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු සමන්ප්‍රිය හේරත් මහතා මූලාසනයෙන් ඉවත් වුයෙන්, ගරු ප්‍රේම්නාත් සී. දොලවත්ත මහතා මූලාසනාරූඪ විය.***
*அதன்பிறகு, மாண்புமிகு சமன்பிரிய ஹேரத் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு பிரேம்நாத் சி. தொலவத்த அவர்கள் தலைமை வகித்தார்கள்.*
*Whereupon* THE HON. SAMANPRIYA HERATH *left the Chair, and* THE HON. PREMNATH C. DOLAWATTE *took the Chair.*

[අ.භා.4.37 ]

**ගරු ඉෂාක් රහුමාන් මහතා**
(மாண்புமிகு இஷாக் ரஹுமான்)
(The Hon. Ishak Rahuman)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ රටේ 77වැනි Budget එක ඉදිරිපත් කර තිබෙන වෙලාවේ ඒ ගැන කථා කරන්න අවස්ථාව ලැබීම ගැන ඉතාම සතුටු වෙනවා.

1948 නිදහස ලබා ගැනීමට පෙර අපේ රටේ හිටපු සුදු මහත්වරු අපේ රටේ සම්පත් පාවිච්චි කළා. කෘෂිකර්මාන්තය පැත්තෙන් ගත්තොත්, අපේ රටේ පොල් වෙන්න පුළුවන්, රබර් වෙන්න පුළුවන්, කොකෝවා වෙන්න පුළුවන් මේ හැම එකක්ම පාවිච්චි කරලා ඒ අය විශාල ආදායමක් ගත්තා. හැබැයි, අපි කනගාටු වෙන්න ඕනෑ. අපේ රටට නිදහස ලැබුණාට පස්සේ බලයට ආපු අපේ නායකයෝ කිව්වා, මේ රට කෘෂිකාර්මික රටක් කියලා. අපේ ජනතාව ඉදිරියට ඇවිල්ලා එවැනි දේවල් කියලා තමයි ඡන්දය ලබාගෙන ජය ගත්තේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ පාර්ලිමේන්තුවේ ඉන්න මන්ත්‍රීවරු 225දෙනාම ලජ්ජා වෙන්න ඕනෑ. මොකද අපේ ගොවියා බොහොම අමාරුවෙන් වගා කරලා ගත්ත වී ටිකවත් මිලදී ගන්න තවම ආණ්ඩුවට බැරි වෙලා තිබෙනවා. ඒ නිසා ආණ්ඩුව අද ගොවි මහත්වරු විශාල ප්‍රශ්නයකට ඇද දමලා තිබෙනවා. ඇයි ඒ? ගොවි මහත්වරු විශාල මහන්සියක් වුණා. නමුත්, රජය වෙලාවට පොහොර දුන්නේ නැහැ. ගොවි මහත්වරු විශාල පීඩනයකට ලක් වෙච්ච වෙලාවක, වී ටික විකුණා ගන්න බැරි ප්‍රශ්නයටත් මුහුණ දීලා තිබෙනවා. දැන් වගා කටයුතු ආරම්භ කරලා තිබෙනවා. නමුත්, තවම වෙලාවට යූරියා දීලා නැහැ, මඩ පොහොර ටික දීලා නැහැ, TDM දීලා නැහැ. අපි පොහොර ගෙනැල්ලා තිබෙනවා කියලා ඇමතිතුමා ඊයේත් කියනවා මම අහගෙන හිටියා. ගරු ඇමතිතුමනි, ඔබතුමා ගබඩාවල stock කරලා පොහොර ටික තිබ්බාට වැඩක් නැහැ. ඒ store එක බලන්න කිව්වාට වැඩක් නැහැ, ඇමතිතුමනි. හරි වෙලාවට ගොවි මහත්වරුන්ට ඒ පොහොර ටික ලබා දෙන්න. එතකොට තමයි ගොවි මහත්වරුන්ගේ ප්‍රශ්නයට නියම විසඳුමක් ගන්න පුළුවන්.

අපි ඉතාම කනගාටු වෙන්න ඕනෑ තවත් කාරණයක් තිබෙනවා, ගරු ඇමතිතුමනි. ඒ මොකද, මේ රට කෘෂිකාර්මික රටක් කිව්වාට, අද ගොවි මහත්වරුන්ට පැළ කරන්න BG වර්ගයේ වී ටිකත් නැතිව ඉන්නවා. එදා 1958දී, පැළ කරන වී නිෂ්පාදනය කරන්න බතලගොඩ වී පර්යේෂණ ආයතනය ආරම්භ කෙරුවා. ඒ වාගේම, 1973දී මහඉලුප්පල්ලම ක්ෂේත්‍ර බෝග පර්යේෂණ ආයතනයෙන් MI මිරිස් ප්‍රභේද සොයා ගත්තා. නමුත්, අද අපේ ගොවියාට බීජ වී ටික ලැබෙන්නේ නැහැ.

අපේ ජනාධිපතිතුමා රට වටේම ගිහිල්ලා කියනවා, අපි කෘෂිකර්මාන්තයේ දියුණුවක් ඇති කරනවා කියලා. ගරු ජනාධිපතිතුමනි, මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා. ඔබතුමාට අපේ කෘෂිකර්මාන්තය දියුණු කරන්න අවශ්‍යයි නම්, 1958 ආරම්භ කරපු බතලගොඩ වී පර්යේෂණ හා සංවර්ධන ආයතනයයි, 1973දී අලුත් මිරිස් ප්‍රභේද සොයා ගත්ත මහඉලුප්පල්ලම පර්යේෂණ හා සංවර්ධන ආයතනයයි වැඩිදියුණු කරන්න කියලා. මොකද, ඒ ආයතන තවමත් එදා පැවැති තත්ත්වයේමයි තිබෙන්නේ. අදටත් ඒ ආයතනවල කිසිම දියුණුවක් වෙලා නැහැ. වගා කටයුතු ආරම්භ කරන කාලවලදී අපේ ගොවි මහත්වරුන්ට බීජ වී නැතිව ඉතාම බරපතළ ප්‍රශ්නවලට මුහුණ දෙන්න වෙලා තිබෙනවා. ඒ නිසා මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා ජනාධිපතිතුමනි, රට වටේම ගිහින් ඒවා කාරණා කියලා වැඩක් නැහැ, මේ තිබෙන පැරණි කෘෂිකාර්මික ආයතන දියුණු කරන්න. මේ ආයතන දියුණු කරන්නේ නැතිව අපි නමට විතරක් කෘෂිකාර්මික රටක් කියන එකේ තේරුමක් නැහැ.

ඒ වාගේම බලන්න, අද බඩඉරිඟුවලට විශාල ප්‍රශ්නයක් ඇති වෙලා තිබෙනවා. ඒ වගා කටයුතු සියයට 50කින් අඩුවෙලා තිබෙනවා. ඊකට ප්‍රධාන හේතුව තමයි, බඩ ඉරිඟු බීජ මිල. එදා බඩ ඉරිඟු බීජ කිලෝ 5ක් ගන්න ගියේ රුපියල් 1,500යි. දැන් ඒක රුපියල් 7,500ට වැඩි වෙලා තිබෙනවා. මේ වාගේ විශාල ප්‍රශ්නවලට ගොවි මහත්වරුන්ට දැන් මුහුණ දෙන්න වෙලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ ලංකාව කෘෂිකාර්මික රටක් කිව්වාට, අද බලන්න වෙලා තිබෙන දේ. අනුරාධපුර දිස්ත්‍රික්කයේ තිබෙන අවුරුදු 70ක් තිස්සේ වගා කරපු අක්කර

[ගරු ඉෂාක් රහුමාන් මහතා]

120ක වගා කටයුතු නිලධාරීන් විසින් නවත්වලා තිබෙනවා. ඒවායේ වගා කරන්න දෙන්නේ නැහැ. අනුරාධපුර දිස්ත්‍රික්කයේ හොරොව්පතාන ආසනයේ වීරචෝල, තාම්මල, හල්මිල්ලෑව කියන ගම්මානවල ගොවි මහත්වරු තමයි අවුරුදු 70ක් තිස්සේ ඒ අක්කර 120 වගා කළේ. දැන් ඒ ඉඩම්වල වගා කටයුතු නිලධාරීන් නවත්වා තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මේ වාගේ බරපතළ හානියක් ගොවි මහත්වරුන්ට කරන කොට, කොහොමද ගොවිතැන්වලින් දියුණුවක් අපි ඇති කරන්නේ? එහෙම නම් අපි වචනවලට සීමා වෙලා හරියන්නේ නැහැ. "අපි ගොවි මහත්වරුන්ට සහනයක් දෙනවා" කිව්වාට වැඩක් නැහැ. ඒකට අවශ්‍ය දේවල් කරලා දෙන්න ඕනෑ.

අධ්‍යාපනය ගැනත් කියන්න ඕනෑ. දැන් පාසල් ගොඩනැඟිලි හදන්න බැහැ. රටේ තිබෙන ආර්ථික ප්‍රශ්නය ගැන අපි හැම එක්කෙනාම දන්නවා. අපේ මන්ත්‍රීවරුත් පාර්ලිමේන්තුවේ කතා කරන කොට කිව්වා, දරුවෝ ආහාර වේල ගන්න විධියක් නැතුව ක්ලාන්ත වෙලා වැටෙනවා කියලා. හැබැයි, අපේ සමහර අය හිනා වුණා; එහෙම වෙන්නේ නැහැ කිව්වා. මීට විනාඩි කීපයකට පෙර අපේ හාමුදුරුවෝ නමක් මට කතා කළා. අද ගම්වල විශාල ප්‍රශ්නයක් තිබෙනවා. ආහාර ගන්න විධියක් නැතුව දරුවන්ට පාසලට යන්න බැරි ප්‍රශ්නයක් තිබෙනවා. අධ්‍යාපන ඇමතිතුමනි, ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා. එදා ප්‍රේමදාස ජනාධිපතිතුමා පාසල් දරුවන්ට දිවා ආහාරය දුන්නේ, සල්ලි වැඩිවෙලා නොවෙයි; රටේ නිෂ්පාදන වැඩි වෙලා නොවෙයි. අධ්‍යාපනයට මුල් තැන දෙන්න ඕනෑ, අධ්‍යාපනය දියුණු කරන්න ඕනෑ කියලා එදා හරි විධියට තේරුම් අරගෙන තමයි එතුමා පාසල් දරුවන්ට ආහාර වේලක් දුන්නේ. දරුවන්ට පාසල් ඇඳුම් කට්ටලයක් ගන්න බැරි අවස්ථාවක් මේ වෙලාවේ තිබෙනවා. ඒ නිසා ඒකත් ලබා දෙන්න ඕනෑ කියලා ඉල්ලීමක් කරනවා.

අද ව්‍යාපාරිකයන්ට විශාල ප්‍රශ්නයක් තිබෙනවා. දැන් බැංකුවල පොලිය කීය ද? සියයට 30යි, 36යි. ඉතින්, කොහොමද ව්‍යාපාර කරන්නේ? දැන් අපි හැමඑක්කෙනාම කතා කරනවා, රජයේ සේවකයෝ ලක්ෂ 14ක් ඉන්නවා කියලා. හැබැයි මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා දන්නවා ව්‍යාපාරික ක්ෂේත්‍රයේ ලක්ෂ 50කට වැඩි පිරිසක් ව්‍යාපාර විනාශ වෙච්ච නිසා අසරණ වෙලා ඉන්න බව. පොලී වැඩි කරලා මේ රටේ තිබෙන ප්‍රශ්නවලට විසඳුමක් ගන්න බැහැ. ව්‍යාපාර නැති වුණොත් ඒ යටතේ ඉන්න කුලීකරුවෝ, කර්මාන්තකරුවෝ ලක්ෂ 50කට වැඩි පිරිසක් අසරණ වෙනවා.

පිට රටවල ඉන්න අපේ ශ්‍රමිකයන්ටත් විශාල ප්‍රශ්නයක් තිබෙනවා කියලා ඔබතුමන්ලා දන්නවා. අපි තානාපතිවරු පත් කරලා යවනවා. ඒ අය රජ සැප විඳිනවා. හැබැයි, ඒ ශ්‍රමිකයන්ට තිබෙන ප්‍රශ්න ගැන ඒ කවුරුවත් කතා කරන්නේ නැහැ. ඒ ශ්‍රමිකයන් තමයි අද අපේ රටේ ආර්ථිකයට විශාල ශක්තියක් ලබා දෙන කණ්ඩායම. ඒ ශ්‍රමිකයන්ගෙන් මම ඉල්ලීමක් කරනවා. මගේ ආදරණීය ශ්‍රමිකයනි, මේ රට අද වැටිලා තිබෙන තත්ත්වයෙන් ගොඩ ගන්න නම් ඔබ ගන්නා ඩොලර් එකක්වත් විනාශ කරන්නේ නැතුව අපේ මාතෘ භූමිය බේරාගන්න බැංකු හරහා එවන්න. අපේ මාතෘ භූමියට අද විශාල ප්‍රශ්නයකට මුහුණ දෙන්න වෙලා තිබෙනවා. ඒකෙන් අපේ මාතෘ භූමිය බේරාගන්න නම්, ශ්‍රමිකයනි, අපේ ලංකාවේ බැංකු විශ්වාස කරලා, ඔබ ගන්නා පඩිය ඒ බැංකු හරහා එවන්න.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි "ලී ක්වාන් යූ" ගැන කතා කරනවා. ඒ වාගේම "මහතීර් මොහොමඩ්" ගැන කතා කරනවා. ඇත්තටම අපි හදවත්වලට එකඟවද ඒ කතා කරන්නේ? නැහැ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, කතාව අවසන් කරන්න.

**ගරු ඉෂාක් රහුමාන් මහතා**
(மாண்புமிகு இஷாக் ரஹுமான்)
(The Hon. Ishak Rahuman)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට තව විනාඩියක් දෙන්න.

බලය ගන්න හිතලා රට දියුණු කරපු ලී ක්වාන් යූ ගැනත් මහතීර් මොහොමඩ් ගැනත් අපි අද කතා කරනවා. හැබැයි, ඒවා වචනවලට පමණයි අපි සීමා කෙරුවේ; වැඩවලින් කවදාවත් පෙන්නලා නැහැ. ලී ක්වාන් යූ කියන්නේ කවුද? මනුස්සයෙක්. මහතීර් මොහොමඩ් කියන්නේ කවුද? මනුස්සයෙක්. සිංගප්පූරුව කියන රට වටේම මුහුද විතරයි තිබෙන්නේ. හැබැයි, හැම සම්පතක්ම තිබිලාත් අපට ලංකාව දියුණු කරගන්න බැහැ. අපේ පාලකයෝ තමන්ගේ න්‍යාය පත්‍ර ඉදිරියට අරගෙන යන්න ඕනෑ කියලා කරන වැඩ පිළිවෙළ නිසා තමයි මේ රට විනාශ වෙලා තිබෙන්නේ. තවත් උදාහරණයක් කියන්නම්. අපට ආසන්න රටක් තමයි මාලදිවයින. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මාලදිවයිනේ මොනවා ද තිබෙන සම්පත්? තනිකර මුහුද. මම ඊයේ පෙරේදා මක්කම ගිහිල්ලා ආවා.

Plane එකේ සියයට 25ක් විතර තමයි ඉතුරු වුණේ; අනෙක් සියයට 75ම මාලදිවයිනට තමයි ගියේ. ආයෙත් එනකොට plane එකේ මා වාගේ කළු ජාතිකයන් තමයි ආවේ. සුද්දෝ සියයට 90ක්ම මාලදිවයිනෙන් බැස්සා. සියයට 10ක් තමයි ලංකාවට ආවේ. ඇයි ඒ? අපේ රට විනාශ කරලා ඉවරයි. කවුද විනාශ කළේ? මා වාගේ, ඔබ වාගේ පාලකයෝ. ඒ නිසා මම ඔබතුමන්ලාගෙන් ඉල්ලා සිටිනවා, මෙතැනින් එහාටවත් රට ගැන හිතලා එකට එකතු වෙලා අපි කටයුතු කරමු කියලා. මට මේ වෙලාව ලබා දීපු ඔබතුමාටත් ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු සිසිර ජයකොඩි රාජ්‍ය අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 12ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.46]

**ගරු නීතිඥ සිසිර ජයකොඩි මහතා (දේශීය වෛද්‍ය රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு சட்டத்தரணி சிசிர ஜயகொடி - சுதேச வைத்திய இராஜாங்க அமைச்சர்)
(The Hon. Sisira Jayakody, Attorney-at-Law - State Minister of Indigenous Medicine)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අතිශය වැදගත් විවාදයකට එක් වන්නට ලැබීම මට සතුටක්. මට පෙර කථා කරපු අපේ ගරු සහෝදර මන්ත්‍රීතුමා සඳහන් කළ පරිදි රට ගැන හිතලා කටයුතු කළ යුතු බව මාත් කියනවා. අපේ රටේ 2019 වර්ෂයේ සිදු වූ පාස්කු ඉරු දින ප්‍රහාරයත් ඉන්පසුව ඇති වූ කොවිඩ් වසංගත උවදුරත් නිසා සංචාරක ව්‍යාපාරය විශාල පසු බෑස්මකට ලක් වුණා. ඉන්පසු සංචාරක ව්‍යාපාරය නැවත ගොඩ නැඟෙමින් තිබුණු අවස්ථාවක අපේ රට තුළ ඇති වෙච්ච මහා ගැටුම් ස්වභාවය සංචාරක ක්ෂේත්‍රය නැවත කඩා වැටීමට හේතු වුණු බව අපි දන්නවා. ඒ නිසා 2019 වර්ෂයට පෙර අපේ රටට ඩොලර් බිලියන 4කට වඩා විදේශ විනිමයක් උපයපු මාර්ගය අපට අහිමි වුණා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, නිදහසින් පසුව දීර්ඝ කාල පරිච්ඡේදයක් තුළ අපි විවිධ අභියෝගවලට මුහුණ දුන්නා. 1971

කැරැල්ල, 1988-89 කැරැල්ල, තිස් අවුරුදු යුද්ධය, කොවිඩ් උවදුර වැනි විවිධ අර්බුදත් එක්ක අපි අපේ සමාජ සුබසාධන වැඩ පිළිවෙළ ඉදිරියට ගෙනිච්චා. මුදල් අමාත්‍යතුමා වශයෙන් ජනාධිපතිතුමා මෙම අය වැය ලේඛනය මඟිනුත් ඒ සුබසාධන කාර්ය භාරය නොපිරිහෙළා ඉෂ්ට කරන බව අපි මතක් කරන්න ඕනෑ. පසුගිය කාලයේ අපි අපේ අධ්‍යාපන සහ සෞඛ්‍ය ක්ෂේත්‍ර දකුණු ආසියාවේ මෙන්ම ලෝකයේ දියුණු යැයි සම්මත රටවල් හා සම මට්ටමට ගෙනැල්ලා තිබුණා. විශේෂයෙන්ම සාක්ෂරතාවෙන් ඉහළ ජනතාවක්, සෞඛ්‍ය සම්පන්න බවින් ඉහළ ජනතාවක් බිහි කිරීමේ අරමුණින් අපි තවමත් නිදහස් අධ්‍යාපනයත්, නිදහස් සෞඛ්‍ය සේවයත් ලබා දෙනවා. ඒ නිසා මේ සමාජ සුබසාධන කටයුත්ත ඉවත් නොකර ඉදිරියට පවත්වාගෙන යෑම පිළිබඳව අපි අපේ ප්‍රශංසාව පළ කරනවා.

අපි අද විශාල විදේශ විනිමය අර්බුදයක සිටින්නේ. අපට අධ්‍යාපන ක්ෂේත්‍රයේ අතිප්‍රබල, දැවැන්ත ජයග්‍රහණ ලබාගත හැකිව තිබියදී අපේ අධ්‍යාපන ක්ෂේත්‍රය අද කොතැනටද ගිහින් තිබෙන්නේ? අධ්‍යාපන ක්ෂේත්‍රයේ අපට වඩා පහළ මට්ටමේ සිටින සමහර තැනැත්තන් විදේශ විනිමය උපයන මාර්ගයක් ලෙස අධ්‍යාපන ක්‍රමය සකස් කරගෙන තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද ඕස්ට්‍රේලියාව, නවසීලන්තය වාගේ රටවල විදේශ විනිමය ඉපයීමේ ප්‍රධාන මාර්ගය අධ්‍යාපනය බව ඔබතුමා ඉතා පැහැදිලිව දන්නවා. විදේශ රැකියාවල නිරත විශාල පිරිසක් ඔවුන්ගේ දරුවන් අධ්‍යාපනය සඳහා රටවල්වලට යවනවා. ඒ නිසා මෙරටට විදේශ විනිමය ඒම නවතිනවා. අනෙක් අතට, විදේශවල අධ්‍යාපනය ලබන දරුවන් වෙනුවෙන්, නීත්‍යානුකූල සහ නීත්‍යානුකූල නොවන ක්‍රම ඔස්සේ විශාල විදේශ විනිමය ප්‍රමාණයක් වැය කරන්නත් අපට සිද්ධ වෙලා තිබෙනවා. ඒ නිසා ඩොලර් බිලියන 3කට වඩා හැංගුණු විදේශ විනිමය ප්‍රමාණයක් අද අපට අහිමි වෙලා තිබෙනවා.

පේරාදෙණිය විශ්වවිද්‍යාලය ආරම්භ කරද්දී එහි ප්‍රථම උපකුලපතිවරයා වූ සර් අයිවෝ ජෙනිංස් මහත්මයා කිව්වා, මේ පේරාදෙණිය විශ්වවිද්‍යාලය වාගේ තව විශ්වවිද්‍යාල සිය ගණනක් මේ රටේ බිහි වේවි කියලා. නමුත්, ඒ දැනුම පුළුල් කරමින් පෞද්ගලික අංශයේ සහභාගිත්වය සහිත අධ්‍යාපන ක්‍රමයක් සකස් කරන්න, විදේශගත තැනැත්තන්ට අපේ රට තුළ අධ්‍යාපනය ලබන්න අවශ්‍ය පහසුකම් සපයන්න අපට තවම හැකියාවක් ඇත්තේ නැහැ. දැනුම ආයෝජනයක් ලෙස සලකා විදේශ විනිමය උත්පාදනය කිරීමේ මාර්ගය සකසා ගනිමින්, දකුණු ආසියාවේ සුවිශේෂී කේන්ද්‍රීය අධ්‍යාපන ක්‍රමය හිමි රට බවට අපේ රට පත් කරන්න අද වනතෙක් අපට පුළුවන්කමක් ලැබිලා නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ සමහර ශිෂ්‍යයන් බංග්ලාදේශය, නේපාලය, ඉන්දියාව ආදි රටවල පවා අධ්‍යාපනය ලබන්නේ ඉතා කටුක අන්දමින්. මේ තරම් උසස් අධ්‍යාපන මට්ටමක් තිබුණු අපේ රටට ඒ ජයග්‍රහණ ලබාගන්න බැරි වුණේ ඇයි? ඒකට චෝදනා කළ හැක්කේ කාටද? ඒ පිළිබඳව විවෘත සංවාදයක් අවශ්‍ය වෙනවා.

ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමා ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය පනත ගෙන ආවා. ඒ අනුව විශ්වවිද්‍යාල පද්ධතියේ නව්‍යකරණයක්, අධ්‍යාපන ක්ෂේත්‍රයේ පරිවර්තනයක් කරන්න හැදුවා. එය තමයි ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා පලවා හැරීම සඳහා වූ අරගළයේ පළමුවැනි පියවර. ගුරු සටන ආරම්භ වුණේ එයින්. එයට ජනතාව එකතු වුණේ නැහැ; වෘත්තීය සමිති එකතු වුණේ නැහැ. ඉන් පසුව වැටුප් වැඩි කිරීමේ සටන ඒකට ඒකාබද්ධ කළා.

අපේ රටේ විශ්වවිද්‍යාල පද්ධතිය ඒකාබද්ධ කරගෙන, නව්‍යකරණය කරගෙන, විදේශගත පුද්ගලයන්ට අපේ රටේ අධ්‍යාපන නිකේතන ගොඩ නැඟීම ඉඩ දීමෙන් තමයි අපේ සංවර්ධන උපාය මාර්ගය සකස් කළ යුත්තේ. 1988-1989 කාල පරිච්ඡේදයේ වෘත්තීය සමිති ව්‍යාපාරයේ හිටපු විශ්වවිද්‍යාල ශිෂ්‍යයෙකු විධියට මං අද ආපස්සට හැරිලා කල්පනා කරනවා, රාගම පෞද්ගලික වෛද්‍ය විද්‍යාලය ආරම්භ කිරීමේදී අපි ඉදිරිපත් කළ ප්‍රතිවිරෝධතා පිළිබඳව. ඒ පිළිබඳව වැඩිහිටියකු ලෙස අද මා නැවත වතාවක් ප්‍රශ්න කරනවා. අද අපේ රටේ වෛද්‍ය වෘත්තිකයන් දිහා බලන්න. වෛද්‍යවරයෙකුගේ වැටුප රුපියල් හාරලක්ෂ පනස්දහසකට වඩා වැඩියි. ඔවුන්ට වැටුප් ගෙවන්න රුපියල් බිලියන හැත්තෑවකට වඩා වැය කරනවා. ඔවුන්ට අතිකාල දීමනා ගෙවන්න රුපියල් බිලියන හැටපහකට වඩා වියදම් දරනවා. ඔවුන්ගේ දරුවන් අද කොහේද අධ්‍යාපනය ලබන්නේ? ඒ අය පිට රට විශ්වවිද්‍යාලවල අධ්‍යාපනය ලබනවා. නමුත් ජාතික වශයෙන් විශ්වවිද්‍යාල පද්ධතිය පුළුල් කරන වැඩ පිළිවෙළට, පෞද්ගලික අංශය සමඟ ඒකාබද්ධව අධ්‍යාපන ක්ෂේත්‍රයට ජයග්‍රහණ අත්කර දීමේ වැඩ පිළිවෙළට අපි එකතු වෙලා නැහැ. අපි අද ඉතාම පටු සීමා තුළ සිටිමින් තමයි තර්ක කරන්න පටන් අරගෙන තිබෙන්නේ.

ආයුර්වේද ක්ෂේත්‍රය භාර රාජ්‍ය අමාත්‍යවරයා විධියට මා දන්නවා, අද අපේ ආයුර්වේද රෝහල්වලට හෙදියන් නැහැ. මොකද, තෙල් බෙහෙත් ගාන්න හෙදියන් එන්නේ නැහැ. හැබැයි, හෙද ක්ෂේත්‍රයේ පුරප්පාඩු විශාල සංඛ්‍යාවක් තිබෙනවා. නමුත් ආයුර්වේද ක්ෂේත්‍රයට අදාළව හෙද අධ්‍යාපනය ලබන්න ඉඩක් ලබා දෙන්නේ නැහැ. ඒ සඳහා නිශ්චිත ආයතනයක් පිහිටුවන්න අවසර දෙන්නේ නැහැ, උද්සෝෂණ කරනවා, වැඩ වර්ජන කරනවා. කලා සහ වාණිජ අංශයෙන් උසස් පෙළ අධ්‍යාපනය ලැබූ දරුවන්ට හෙද සේවයට එන්න ඉඩ ප්‍රස්තාව දෙන්නේ නැහැ. ඒක විද්‍යා අංශයට පමණක් සීමා කරගෙන තිබෙනවා. වෘත්තිය සමිති මාෆියාවක් විසින් අද අපේ රට මෙහෙයවනවා. හැම දේටම කරන්නේ, දෙසිය විසිපහට බණින එක. හැම දේටම කරන්නේ පාලකයන්ට බණින එක. ඒ නිසරු ප්‍රතිපත්තිය වෙනස් කිරීමේ වගකීම අද අපට පැවරිලා තිබෙනවා. අද මහාචාර්යවරු, ආචාර්යවරු රජයට විරුද්ධව, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට විරුද්ධව දේශන පවත්වනවා. අපි දන්නවා, මහාචාර්යවරයෙකුගේ වැටුප රුපියල් ලක්ෂ පහකට වඩා වැඩියි. ඔවුන් පාවිච්චි කරන වාහන බලන්න. ඔවුන් ලක්ෂ දෙසියය-තුන්සියය වටිනා වාහන පාවිච්චි කරන්නේ; ජපන් වාහන පාවිච්චි කරන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පසුගිය සති කිහිපය තුළ මා ඉන්දියාවේ පෞද්ගලික සංචාරයක නිරත වුණා. බිහාර් සහ උත්තර් ප්‍රදේශවලට මම ගියා. ඒ ප්‍රදේශවල ලක්ෂ ගණනක් මිනිස්සු ජීවත් වෙනවා; ලක්ෂ ගණනක් වාහන තිබෙනවා. හැබැයි, විදේශයක නිෂ්පාදනය කළ එක වාහනයක් නැහැ. හැම තැනැත්තාම පාවිච්චි කරන්නේ ඉන්දියානු වාහන. ඉන්දියාවේ නිෂ්පාදිත වාහනයක් ඔවුන් පාවිච්චි කරන්නේ. අපේ රටේ පාරකට බැහැලා බැලුවාම ලක්ෂ ගණනක් වාහන තිබෙනවා. ඒක රටකට දරන්න පුළුවන්ද? හැබැයි, රුපියල් ලක්ෂ තුන්හාරසියයක් වටිනා වාහනවල යන විශ්වවිද්‍යාල මහාචාර්යවරු සහ විද්වත් වෘත්තිකයන් ඒවා දැක දැක, මේ රටේ ආර්ථිකය හදන ආකාරය ගැන විශාල වශයෙන් දේශන පවත්වනවා. ඔවුන්ට වාහන පර්මිට් එක දුන්නේ නැති වුණාම රණ්ඩු වෙනවා. වෛද්‍යවරුන්ට වාහන පර්මිට් එක දුන්නේ නැති වුණාම උද්සෝෂණ කරනවා. ඔවුන්ගේ දරුවන්ට විදේශ රටවල විශ්වවිද්‍යාලවල අධ්‍යාපනය ලබා දෙනවා. හැබැයි, මේ මන්ත්‍රීවරුන්ට චෝදනා කරනවා. ඒක තමයි මේ රටේ තත්ත්වය. ඒ නිසා ඒ ක්‍රමය වෙනස් කිරීමට අප කටයුතු කළ යුතු වෙනවා.

අද අපේ ජීවන ක්‍රමය පිළිබඳව බරපතළ ප්‍රශ්නයක් තිබෙනවා. ඉන්දියාවේ මිලියන අටසියයක ජනතාවක් අපට වඩා පහළ

[ගරු නිතිඥ සිසිර ජයකොඩි මහතා]

ආර්ථික තත්ත්වයක ඉන්නේ. ඔවුන්ගේ එක ආහාර වේලකට වැය වන්නේ ඉන්දියානු රුපියල් විස්සයි. හැබැයි, අපේ ආහාර වේලක තත්ත්වය කුමක්ද? අපි දන්නවා, ආර්ථික අපහසුතා තිබෙන අය ඉන්නවා. ඒ මොන ආර්ථික අපහසුතා තිබුණත්, සමහර දවස්වලට අපි ආහාර සඳහා වියදම් කරන මුදල බලන්න. අපි හදන නිවසක ස්වභාවය බලන්න. අපේ සමීප රටවල මිනිස්සු හදන ගෙවල් දිහා බලමු. ඔවුන්ගේ ජීවන ක්‍රමය ඉතා සරලයි. ඒ ජීවන ක්‍රමය ඔවුන්ගේ ආර්ථිකයට ගැළපෙනවා. ඒ නිසා අපේ මිනිසුන්ගේ චින්තනමය වෙනසක්, පරිවර්තනයක් අවශ්‍ය වෙනවා. ඒ රටවල මිනිස්සු තමන්ගේ නිවසේම එළු පැටියෙක් හදාගෙන, එළදෙනක් හදාගෙන, කිරි කිරි ටික ලබාගෙන ඉතාම සරල ජීවිතයක් ගත කරනවා. අපි අතේ සල්ලි නැති වුණත් මනසින් සුඛෝපභෝගී ජීවිතයකට ගමන් කරමින් ඉන්නවා.

වෘත්තීය සමිති ව්‍යාපාර වෛරය වපුරමින්, මේ රට තුළ කරන කිසිම ප්‍රතිසංස්කරණයකට ඉඩ දෙන්නේ නැහැ. එය බරපතළ ප්‍රශ්නයක්. හැමෝම උත්සාහ කරන්නේ සිහින ලෝකවල තනි වෙන්නයි. හැබැයි, මේ මහ පොළොවේ තිබෙන ආර්ථික යථාර්ථය අපි තේරුම් ගත යුතුයි. මේ සම්බන්ධයෙන් කාටවත් දොස් කියන්න බැහැ. අපේ ජීවන රටාව, සිතන පතන ක්‍රමය අපි වෙනස් කරන්න ඕනෑ. එහෙම වෙනස් කිරීමෙන් පමණයි මේ අය වැය ලේඛනයේ තිබෙන කාරණා යථාර්ථවාදී කර ගන්න පුළුවන් වෙන්නේ. ඕනෑම කෙනෙකුට චෝදනා කරන්න පුළුවන්, බණින්න පුළුවන්, එහෙම නැත්නම් වෙනත් ආකාරයේ උද්ඝෝෂණ කරන්න පුළුවන්. හැබැයි, අපි සියලුදෙනා එක තැනකට එකතු වෙන්න ඕනෑ. අපේ ජීවන ක්‍රමය සරල කර ගැනීමට, විදේශ විනිමය ආරක්ෂා කර ගැනීම සඳහා විදේශවලින් කරන ආනයන සීමා කිරීමට, අපට අලෙවි කළ හැකි යම් දෙයක් තිබෙනවා නම් එය අලෙවි කිරීමට අප කළ යුතුයි.

ගුරුවරයකු විධියට මම නම් විශ්වාස කරන්නේ, අපට අලෙවි කරන්න පුළුවන් හොඳම දේ අපේ අධ්‍යාපනය කියලායි. අධ්‍යාපන ක්ෂේත්‍රයේ ජයග්‍රහණ ලෝකයටම බෙදන්න පුළුවන්. බුදුරජාණන් වහන්සේ දේශනා කළේ, ලෝක සත්වයා වෙත ධර්මය ගෙන යන්න කියලායි. ඒ නිසා ඒ ධර්මය ලෝකය පුරා ගෙන යන්න අපට පුළුවන්; අපේ සෞන්දර්යය අපට විකුණන්න පුළුවන්; අපේ හෙළ වෙදකම අපට විකුණන්න කරන්න පුළුවන්. විශිෂ්ට දැනුම් පද්ධතියක්, හර පද්ධතියක් අපට තිබෙනවා. ඒ තුළින් අපේ රටට අනන්‍ය වූ ආර්ථික ප්‍රතිපත්තියක් ගොඩ නඟා ගන්නා තෙක් අපට කරන්න පුළුවන් වෙන්නේ රණ්ඩු වෙවී ඉන්න එක විතරයි. ඒ නිසා මේ යථාර්ථයට එකඟ වෙන්න කියන කාරණය මතක් කරමින්, මට කථා කරන්නට අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු වේලු කුමාර් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 12ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.57]

**ගරු වේලු කුමාර් මහතා**
(மாண்புமிகு வேலு குமார்)
(The Hon. Velu Kumar)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ රටේ ඉදිරිපත් කළ 77වෙනි අය වැය සම්බන්ධයෙන් අදහස් ප්‍රකාශ කිරීමට මට අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

77 වෙනි අය වැයෙන්, 2023 අවුරුද්දේ මේ රටේ ගමන් මග කුමක්ද කියන කාරණය ඉදිරිපත් කරලා තිබෙනවා. අපි 2023දී ගොඩ යනවාද, එහෙම නැත්නම් අපි මෙතැනින් පහළට යනවාද කියන එක තමයි මේ ලියවිල්ල හරහා තීරණය වෙන්නේ. මේ අය වැය ඉතාම දුෂ්කර වූ අභියෝගාත්මක අවස්ථාවක ඉදිරිපත් කරපු අය වැයක්. මෙහි තිබෙන ඉලක්කම් පිළිබඳව විවාද කිරීමෙන් ඵලක් තිබෙනවා කියලා මම හිතන්නේ නැහැ. මෙවැනි අය වැයක් ඉදිරිපත් කිරීම ගැන වර්තමාන ජනාධිපතිවරයාට -මුදල් අමාත්‍යවරයාට- දොස් කියන එකේ තේරුමක් නැහැ කියන ස්ථාවරයේ මම ඉන්නේ. අපි බලන්න ඕනෑ, මේ අය වැය තුළ වර්තමානයේ රටේ පවතින දැවෙන ප්‍රශ්නවලට උත්තර තිබෙනවාද, ඒවාට යම්කිසි විසඳුමක් සොයා ගැනීමේ අවස්ථාව 2023දී තිබෙනවාද කියලා.

අද රට තුළ තිබෙන ප්‍රධානම ප්‍රශ්නය තමයි දරිද්‍රතාව - poverty. අද දුප්පත්කම දවසින් දවස ඉහළ යනවා. දැන් ඒක තුන් ගුණයකට පත් වෙලා තිබෙනවා. සාමාන්‍යයෙන් සියයට 8ට පැවැති poverty rate එක අද වෙනකොට සියයට 23කට, සියයට 24කට පමණ ඉහළ ගිහිල්ලා තිබෙන්නේ. අද වතුකරයේ - estate sector එකේ - දරිද්‍රතා අනුපාතය - poverty rate එක - සියයට 53කට අධික ප්‍රමාණයක් බව ලෝක බැංකුව මඟින් වාර්තා කර තිබෙනවා. ඒ නිසා, ලබන අවුරුද්ද වෙනකොට දරිද්‍රතාව අඩු කර ගන්න, දුප්පත්කම අඩු කර ගන්න මේ අය වැයෙන් යම් විසඳුමක් තිබෙනවාද කියලා බලන්නට ඕනෑ. එහෙම විසඳුමක් ලැබෙනවා නම් අපි මේ රට තුළ නිෂ්පාදනය ඉහළ දාගන්න ඕනෑ. නිෂ්පාදනය ඉහළ දැම්මාම තමයි අපේ රුපියල ශක්තිමත් කරන්න පුළුවන් වෙන්නේ. අද වෙනකොට ආහාර උද්ධමනය සියයට 85.6ක තත්ත්වයට ගිහින් තිබෙනවා. රටේ උද්ධමනය - inflation - සියයට 66කට පමණ ඉහළ ගිහිල්ලා තිබෙන්නේ එතකොට අපේ මුදල ශක්තිමත් කර ගන්න, උද්ධමනය අඩු කර ගන්න, නිෂ්පාදනය ඉහළ දමා ගන්න මේ අය වැය හරහා යෝජනා තිබෙනවාද කියන එක තමයි අපි බලන්නට ඕනෑ.

මේ අය වැය කථාව ඉදිරිපත් කරනකොට මුදල් අමාත්‍යවරයා විධියට ජනාධිපතිතුමා අපේ ආදායම් මාර්ග පිළිබඳව කිව්වා. එතුමා එහිදී අපි ඩොලර් ටික උපයා ගන්නා ප්‍රධානම මාර්ගය විධියට සඳහන් කළේ වැවිලි කර්මාන්තය, එහෙම නැත්නම් තේ කර්මාන්තය. මේ අය වැය තුළින් කථා කරනවා, පොල් වගාව වැඩිදියුණු කිරීම පිළිබඳව. ඒ වාගේම cinnamon වගාව වැඩිදියුණු කිරීම පිළිබඳව කථා කරනවා. එපමණක් නොවෙයි, කංසා වගා කිරීම පිළිබඳවත් කථා කරනවා. නමුත්, අපේ රටට ස්ථාවර ඩොලර් ප්‍රමාණයක් ගෙනැත් දෙන පාරම්පරික තේ කර්මාන්තය ගැන මේ අය වැයේ මොනවාද තිබෙන්නේ? අවාසනාවකට ඒ ගැන මොනවත් සඳහන් කරලා නැහැ.

අපනයන කෘෂිකර්මය සඳහා ඉඩම් ලබා දෙන බව නම් මේ අය වැයේ සඳහන් වනවා. අපනයන කෘෂි කර්මාන්තය සඳහා කොහෙන්ද ඉඩම් ලබා දෙන්නේ? මේ සඳහා ලබා දෙන්නේ ජනතා වතු සංවර්ධන මණ්ඩලයේ, SLSPC සහ LRC එකේ ඉඩම් කියන එක පැහැදිලිවම මේ අය වැයේ කියනවා. අමාත්‍යවරු ඇතුළු මේ ගරු සභාවෙන් මම අහන්න ඕනෑ, තේවලට සාපේක්ෂව අපනයන ආදායමක් ලබා ගන්න පුළුවන් අපනයන කෘෂිකර්ම භෝගය මොකක්ද කියලා. පසුගිය අවුරුදු 150ක කාලය තුළ, එහෙම නැත්නම් අපි නිදහස ලබපු කාලයේ ඉඳලා අද වෙනතුරු, කිසිම අවස්ථාවක තේවලට ලෝකයේ තිබෙන demand එක නැති වෙලා නැහැ. තේ දලු ටික, අපි නිෂ්පාදනය කරන තේ ටික කිසිම කාලයකදී අපතේ ගිහිල්ලා නැහැ. ඒකට market එකක් නැති වෙලා නැහැ. ඒකත් ඛනිජ තෙල්වලට තිබෙන market එකට සමානයි කියලා කියන්න පුළුවන්. ඛනිජ තෙල් ගැනීම තමයි අද ඩොලර්වලින් සිදු වෙන්නේ. ඛනිජ තෙල් හා සමාන වටිනාකමක්

තිබෙන දෙයක් තමයි තේ කියන්නේ. නමුත්, මේ අය වැයෙන් මොකක්ද කියන්නේ? අපනයන කෘෂිකර්මය දිරිමත් කරන්න කියලා මේ තේ වගා කරන ඉඩම් වෙනත් කර්මාන්තවලට ලබා දෙනවා! රටට විශාල ආදායමක් ගන්න පුළුවන් තේ වගාව වැඩිදියුණු කිරීමට යෝජනා ඉදිරිපත් කරනවා වෙනුවට, තේ වගා කරන ඉඩම් ටික වෙනත් අපනයන කෘෂි භෝගවලට යොදවන්න යෝජනා කරනවා. ලෝකයේ ඔය තරම් demand එකක් තිබෙන වෙනත් කෘෂි අපනයන භෝග මොනවාද අපට තිබෙන? ඒ මොනවාද? ඒ සඳහා තිබෙන සැලසුම මොකක්ද?

ඒ නිසා මෙතැන තිබෙන්නේ දේශපාලන agenda එකක්. මේ ඉඩකඩම් ටික බෙදා දීම දේශපාලන agenda එකක්. මේක තමයි දිගින් දිගටම කරගෙන ආවේ. වත්තේ ජීවත් වෙන, වැවිලි කර්මාන්තය නියෝජනය කරන අපි හැමවිටම තේ ගහ රැක ගන්න සටන් කළා. අපේ ජනතාව තේ ගහ රැක ගන්න සටන් කළා. ඒ වුණත් ප්‍රදේශයේ දේශපාලනඥයෝ වෙන්න පුළුවන්, මේ ප්‍රතිපත්ති හදන අය වෙන්න පුළුවන්, මේ රට තුළ ඉන්න නිලධාරින් වෙන්න පුළුවන්, හැම වෙලාවේම වැවිලි කර්මාන්තයට තිබෙන ඉඩම් කෑල්ල මොනවා හරි දේකට ගන්න හදනවා. එක්කෝ ground එකක් හදන්න ඕනෑ කියනවා, එහෙම නැත්නම් එතැන club එකක් හදන්න ඕනෑ කියනවා, එහෙම නැත්නම් restaurant එකක් හදන්න ඕනෑ කියනවා, එහෙම නැත්නම් පන්සලක් හදන්න ඕනෑ කියනවා, එහෙම නැත්නම් පුනරුත්ථාපන කඳවුරක් හදන්න ඕනෑ කියනවා. කොහොම හරි මේ ඉඩම් උදුරා ගන්න හදනවා. මට නම් යෝජනා කරන්න තිබෙන්නේ, සම්පූර්ණයෙන් තේ ගස් ටික අයින් කරලා දාන්න කියලායි. එතකොට අපේ ජනතාව වෙනත් ක්‍රමයකින් ජීවනෝපාය ගෙනියාවි. තේ වගාව සම්පූර්ණයෙන් ඉවත් කරලා දාලා, ඔය කියන අලුත් කෘෂිකර්ම අපනයන භෝග වගා කරන්න. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ රටේ ප්‍රතිපත්ති සකස් කරන කණ්ඩායම් මේ පිළිබඳව වගකීමෙන් බලන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විදේශ ප්‍රේෂණ - foreign remittances - කියන්නේ අපට ඉක්මනටම ඩොලර් ටිකක් ලබා ගන්න තිබෙන ක්‍රමයක්. ඒ විදේශ ප්‍රේෂණ ලබා ගන්න නම් අපි විදේශීය jobs ටිකක් ලබා ගන්න ඕනෑ. ඒ සඳහා අපේ labour force එකේ skills වැඩි කර ගන්න ඕනෑ. ඒ සඳහා දායක වෙන Technical Colleges ගැන, ඒ technical side එක ගැන මේ අය වැයෙන් කිසිම සෘජු අදහසක් ඉදිරිපත් කරලා නැහැ.

ඊට පස්සේ අපට තිබෙන්නේ tourism industry එක. ඒ tourism industry එක සම්බන්ධවත් මේ අය වැයේ හරි පදනමක් ඉදිරිපත් කරලා තිබෙනවාද? මේ හැමෝම වැඩිපුරම කථා කරන්නේ මේ අය වැයේ තිබෙන වැය පිළිබඳව. මේකට වැඩියි, මේකට අඩුයි කියලා වියදම පිළිබඳව හැමෝම කථා කරනවා. මා නම් කියන්නේ අපේ ආදායම වැඩි කර ගැනීම පිළිබඳව අපි වැඩි-වැඩියෙන් කථා කරන්න ඕනෑ කියායි. මා මේ කාරණය ඇමතිතුමන්ලාගෙන් අහනවා. සෑම අමාත්‍යාංශයකම ඇමතිවරයා අය වැය ලේඛනය ගත්ත ගමන් බලන්නේ තමන්ගේ අමාත්‍යාංශයට වැය කරන්න කොච්චර මුදලක් තිබෙනවාද කියලා. සමහර අමාත්‍යාංශ තිබෙනවා, මුදල් වැය කරලා සේවා ලබා දෙන. ඒ වාගේම වෙළෙඳාම හා සම්බන්ධ වූ අමාත්‍යාංශත් තිබෙනවා. ඒ කියන්නේ, profit එකක් හොයන්න පුළුවන් අමාත්‍යාංශත් තිබෙනවා. ඒ අමාත්‍යාංශ නියෝජනය කරන ඇමතිවරුත් බලන්නේ තමන්ගේ අමාත්‍යාංශයට අය වැයෙන් වෙන් කර තිබෙන්නේ කොච්චර මුදලක්ද කියලා. මා මේ ගරු සභාවේ ඉන්න අමාත්‍යවරුන්ගෙන් අහනවා, ඔබතුමන්ලාට ලබන අවුරුද්ද වෙනුවෙන් වැඩසටහනක් තිබෙනවාද කියලා. ඔබතුමන්ලාට කොන්ද කෙළින් තියාගෙන මේ ගරු සභාවට ඇවිල්ලා කියන්න පුළුවන්ද, මගේ අමාත්‍යාංශය තුළින් ලබන අවුරුද්ද වනකොට මෙච්චර මිලියන ගණනක ලාභයක් හොයා දෙනවා, එහෙම නැත්නම් මේ අමාත්‍ය ධුරය දාලා ගෙදර යනවා කියලා? එහෙම කොන්ද කෙළින් තියාගෙන කියන්න පුළුවන් අමාත්‍යවරු කී දෙනෙක්ද ඉන්නේ. කිසිම අමාත්‍යවරයෙකු ළඟ ආදායම වැඩි කර ගැනීමට කිසිම වැඩ පිළිවෙළක් නැති බව අපි පැහැදිලිවම දන්නවා.

අමාත්‍යාංශයක් ගත්තාම අමාත්‍යවරයා, ලේකම්වරයා, අමාත්‍යාංශයේ වැඩ කරන නිලධාරින්, ඇමතිවරයාගේ පෞද්ගලික කාර්ය මණ්ඩලය ඇතුළු සියලුදෙනා වාහන 20ක්, 25ක් පාවිච්චි කරනවා. කමක් නැහැ, තව වාහන දෙක තුනක් හෝ ගන්න. ඒ වුණාට ඔබතුමන්ලාගේ වැඩ පිළිවෙළ මොකක්ද? ඔබතුමන්ලා අසාර්ථක නම් දාලා යන්න ඕනෑ. අසාර්ථක වනවා, ඒත් ඇදගෙන යනවා; අසාර්ථක වනවා, ඒත් ඇදගෙන යනවා. අසාර්ථක නම්, අමාත්‍ය ධුරය දාලා යන්න ඕනෑ. ඒ ලජ්ජාව කියන එක මේ රට තුළ ඉන්න දේශපාලනඥයන්ට නැති වෙලා තිබෙන්නේ. හැකියාවක් නැත්නම් හැකියාව තිබෙන අනික් පාර්ශ්වයට මේ තනතුරු ලබා දෙන්න ඕනෑ. අද අපි ආදායම වැඩි කර ගැනීම පිළිබඳව වැඩි-වැඩියෙන් සාකච්ඡා කරන්න ඕනෑ. මේ අභියෝගය භාර ගන්න. ඕනෑ නම් තව අමාත්‍යාංශ භාර දෙන්න. ඒ වුණාට ඒ අමාත්‍යවරු රටට මුදලක් හම්බ කරලා දෙන්න ඕනෑ; ඩොලර් ටික ගේන්න ඕනෑ; ප්‍රතිඵලයක් ලබා දෙන්න ඕනෑ. ඒ පිළිබඳව අපි වැඩිපුර සාකච්ඡා කරන්න ඕනෑ කියලා මා කියනවා.

இந்த வரவு செலவுத்திட்டத்தில் எங்களுடைய மலையகச் சமூகத்துடன் தொடர்புடைய ஒரேயொரு விடயம்தான் முன்வைக்கப்பட்டிருக்கிறது. அதாவது, "பாரியளவிலான உபயோகப்படுத்தப்படாத/ உற்பத்தித் திறனின்றிப் பயன்படுத் தப்படுகின்ற காணிகள் ஏற்றுமதிப் பயிர்களைப் பயிரிடுவ தற்காக நீண்டகால அடிப்படையில் குத்தகைக்கு விடப்படும்" என்பதாகும். இங்கிருக்கின்ற தலைவர்கள் தேயிலைப் பயிர்தான் இந்த நாட்டுக்குப் பிரச்சினை என்று கருதினால், அதனை முற்றாக அழித்துவிடுங்கள்! அப்போதாவது, எங்களு டைய மக்கள் வேறு துறைகளில் சென்று, நிம்மதியாகத் தங்களை வளர்த்துக்கொள்வார்கள்.

இன்று மலையகப் பெருந்தோட்டங்களில் இருக்கின்றவர் களில் அரைவாசிப் பேர் வறுமை நிலைக்குத் தள்ளப்பட்டு, ஒருவேளை உணவைக்கூட பெறமுடியாமல் இருப்பதாக உலக வங்கி, UNICEF நிறுவனம் போன்ற பல்வேறு அமைப்புக்கள் சொல்கின்றன. எனினும், அவர்களுக்கு இந்த வரவு செலவுத்திட்டத்தில் எந்தவித நிவாரணமும் வழங்கப்பட வில்லை. வெற்றாக இருக்கக்கூடிய நீங்கள், பட்டினியிலிருந்து செத்து மடியுங்களென்றவாறான உங்களுடைய மன நிலையைத்தான் இது எடுத்துக் காட்டுகிறது என்பதை நான் இங்கு கவலையோடு கூறவேண்டியிருக்கிறது. ஆகையால், இச்சமூகத்தின் நிலை தொடர்பில் இந்த அரசாங்கம் இதைவிடக் கூடுதல் அக்கறை செலுத்த வேண்டுமெனக் கேட்டுக்கொள்கிறேன். இந்த வரவு செலவுத்திட்டத்தின் மூலமாவது, இந்த நாட்டில் புத்துணர்ச்சியை ஏற்படுத்துவதற்கு இங்கே இருக்கக்கூடியவர்கள் உண்மையாக, இதயசுத்தியோடு பங்காற்ற வேண்டுமென்று கேட்டு, விடைபெறுகின்றேன். நன்றி.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු තාරක බාලසූරිය රාජ්‍ය අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 12ක කාලයක් තිබෙනවා.

[අ.භා. 5.09]

**ගරු තාරක බාලසූරිය මහතා (විදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு தாரக்க பாலசூரிய - வெளிநாட்டலுவல்கள் இராஜாங்க அமைச்சர்)
(The Hon. Tharaka Balasuriya - State Minister of Foreign Affairs)

අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් ඔබතුමාට ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මේ රටේ ඉදිරිපත් කළ 77වන අය වැය කථාව ගැන මගේ අදහස් ඉදිරිපත් කරන්න පෙර, අපේ වේලු කුමාර් මන්ත්‍රීතුමා ඉදිරිපත් කළ චෝදනා කීපයකට පිළිතුරු දීලා හිටියා නම් හොඳයි කියලා මා විශ්වාස කරනවා. එතුමා මේ ගරු සභාවේදී යම්කිසි වැරැදි අර්ථ කථනයක් ඉදිරිපත් කරන්න හැදුවා, දේශපාලන වුවමනාවලට තේ වතු එක එක්කෙනාට භාර දෙන්න යනවා කියලා. ගරු ජනාධිපතිතුමා අය වැය කථාවේදී වැඩිපුර අදහස් ඉදිරිපත් කරලා තිබෙන්නේ කුඩා තේ වතු හිමියන් සම්බන්ධව. අපි දන්නවා, තේ වතු දිහා බැලුවාම වැඩියෙන්ම productivity එකක් තිබෙන්නේ කුඩා තේ වතු හිමියන්ට බව. ඒ වාගේම රාජ්‍ය තේ වතුවලිනුත් හරියට ඵලදාවක් නොලැබෙන -underutilized - වතු තිබෙනවා. මේ තේ වතු තමයි lease එකකට හෝ දීලා ඊට වඩා හොඳ production එකක් ලබා ගන්න අදහස් කරලා තිබෙන්නේ.

වේලු කුමාර් මන්ත්‍රීතුමා පැවසූ අන්දමටම මේ වෙලාව අය වැයක් ඉදිරිපත් කරන්න සුදුසු වෙලාවක් නොවෙයි. කෙසේ වෙතත්, ගරු ජනාධිපතිතුමාට මේ අවස්ථාවේදී මගේ ශුභාශිංසන පුද කරන්න කැමැතියි. ඉතා අමාරු කාලයක් තමයි අපි මේ ගත කරන්නේ. ගරු ජනාධිපතිතුමා යම්කිසි පණිවුඩයක් දුන්නා නම්, ඒ දීපු මූලික පණිවුඩය තමයි, අපි යම්කිසි මට්ටමකට වෙනස් වෙන්න ඕනෑය කියන එක. අපි නිදහස ලැබුණු දවසේ ඉඳලා මොනවාද කළේ? සුබසාධන ආර්ථිකයකට තමයි අපේ ජනතාවත්, දේශපාලනඥයනුත් පුරුදු වෙලා හිටියේ. සමහර විට 1948ට ඉස්සෙල්ලා අපට යම්කිසි වාමාංශික ආභාසයක් තිබෙන්න ඇති. වාමාංශික ආභාසයක් තිබුණත් අපි මොකක්ද කළේ? අපට අමාත්‍යාංශයක් තිබෙනවා නම්, අපේ ආසනයේ, දිස්ත්‍රික්කයේ අයට අපි රැකියා ටිකක් දුන්නා. ඒ වාගේම, කෙනෙකුට විදුලිබලය ලබා දුන්නා නම්, ඒ විදුලිය නිෂ්පාදනය කරන්න ගිය සම්පූර්ණ ගණනට නොවෙයි අපි විදුලිය දුන්නේ. ඊට වඩා අඩු ගණනකට දුන්නේ. වතුර ටිකත් එහෙමයි. අපි වතුර ටික දුන්නේත් නිෂ්පාදනය කරන්න ගිය මිලට වඩා අඩු මිලකට.

ඒ වාගේම අපි තැපැල දිහා බැලුවත්, කෝච්චිය දිහා බැලුවත්, ඒ ප්‍රතිපත්තියමයි අවුරුදු හැත්තෑ ගණන තුළ අපි අනුගමනය කළේ. යම් කිසි දෙයක් නිෂ්පාදනය කරන්න වියදම් වන මුදලට වඩා අඩු ගණනකට තමයි අපේ රටේ ජනතාවට දුන්නේ. සුබසාධන ආර්ථිකය විධියට මම ඒක තමයි මෙතැනදී අදහස් කළේ. අපි යම් කිසි විධියකට මෙතැනින් වෙනස් වෙන්නට ඕනෑ. ඒ වාගේම මේ සුබසාධන ආර්ථිකයෙන් දේශීය ආර්ථිකය ආරක්ෂා කරන්න ඕනෑ කියලා අපි යම් යම් සීමා දැම්මා. යම් යම් දේවල් සඳහා අපි සමහර කට්ටියට ලයිසන් දුන්නා, සමහර කට්ටියට quotas දුන්නා, සමහර කට්ටියට permits දුන්නා. හැබැයි, වෙළෙඳ පොළ සඳහා නිෂ්පාදනයක් කරන්න අපි උත්සාහ දැරුවේ නැහැ.

මම මෑතකදී කියවපු පොතක, ලෝකයේ හිටපු ලොකුම ධනපතියන් දෙදෙනෙක් සංසන්දනය කරලා තිබෙනවා. එක්කෙනෙක් ඇමෙරිකාවේ සිටින බිල් ගේට්ස් කියන ධනපතියා. අනෙක් එක්කෙනා තමයි මෙක්සිකෝවේ සිටින කාලෝස් ස්ලිම් හේලු කියන ධනපතියා. මේ දෙන්නාම යම් කිසි කාලයක ලෝකයේ පොහොසත්ම පුද්ගලයන් හැටියට හිටියා. නමුත්, මේ දෙදෙනා සංසන්දනය කරලා බැලුවොත්, අපට ලොකු වෙනසක් පෙනෙනවා. බිල් ගේට්ස් කියන පුද්ගලයා යම් කිසි දෙයක් නිර්මාණය කරලා, ලෝකයට අලුත් දෙයක් දුන්නා. මෙක්සිකෝවේ කාලෝස් ස්ලිම් හේලු කියන කෝටිපතියා, ඒ රටේ සිටින දේශපාලනඥයන්ට යම් කිසි විධියකට මුදල් දීලා, ඒ රටේ තිබුණු රාජ්‍ය ආයතන ටික අඩු මුදලට අරගෙන, ඊට පස්සේ ඒවා වැඩි ගණනකට විකුණලා පොහොසත් පුද්ගලයෙක් වුණා. එතකොට, පසුගිය අවුරුදු 73 දිහා බැලුවොත්, ආණ්ඩුවක් හැටියට අපි කොයි වාගේ පුද්ගලයන්ද නිර්මාණය කළේ? අපි ඒ ගැන පොඩ්ඩක් කල්පනා කරන්න වුවමනාවක් තිබෙනවා. අපි ව්‍යාපාරිකයෝ නිර්මාණය කළා නම්, ඒ බහුතරයක් නිර්මාණය කළේ අර කාලෝස් ස්ලිම් වාගේ ව්‍යාපාරිකයන්.

අපි මෙතැනදී අපට අමතක කරන්න බැරි කාරණාවක් තිබෙනවා. හුඟක් කට්ටිය හිතනවා, අද පෝලිම් අඩු නිසා, ඉන්ධන තිබෙන නිසා පෙර තිබුණු ආර්ථික තත්ත්වයෙන් අපි දැනටමත් ඔළුව උස්සලා ඉවරයි කියලා. නමුත්, අපි පැහැදිලිව කියන්න කැමැතියි, ඒ ආර්ථික තත්ත්වයෙන් අපි තවම ඔළුව උස්සලා නැහැ කියලා. ඒ වාගේම මේ තත්ත්වය තව උග්‍ර වෙන්නත් බොහෝ ඉඩ කඩ තිබෙනවා, අපි දේශපාලන සහ ආර්ථික ප්‍රතිසංස්කරණ හරි වෙලාවට කළේ නැත්නම්. ඉංග්‍රීසියෙන් කියනවා නම්, අපේ ආයතන - institutions - අනිවාර්යයෙන්ම වෙනස් කරන්න වුවමනාව තිබෙනවා. ඒ වාගේම අපේ structure එක වෙනස් කරන්නත් වුවමනාවක් තිබෙනවා.

අපි බදු ප්‍රතිපත්තිය ගැන විතරක් කල්පනා කරලා බලමු. 1979 -1980 විතර වෙනකොට අපේ දළ ජාතික නිෂ්පාදනයට සියයට 28ක වාගේ බදු ප්‍රතිශතයක් තිබුණා. දැන් එය සියයට 8කට වාගේ අඩුවෙලා තිබෙනවා. ප්‍රතිශතයක් හැටියට බැලුවොත්, ලෝකයේ තිබෙන අඩුම බදු ප්‍රතිශතයක් සහිත රටවල් 10න් එකක් හැටියට දැන් ලංකාව පත්වෙලා තිබෙනවා. එම නිසා අපට අනිවාර්යයෙන්ම බදු වැඩි කරන්න වෙනවාය කියන එක මේ සියලුදෙනාම තේරුම්ගත යුතු වෙනවා. හැබැයි, නිකම් ම බදු වැඩි කළොත් මොකක්ද වෙන්නේ? අපි ගිහිල්ලා ජනතාවට කිව්වොත්, අපි බදු වැඩි කරනවා කියලා, එතකොට ඔවුන් මොකක්ද කියන්නේ? "බදු වැඩි කළාට වැඩක් නැහැ, අපි ගෙවන බදුවලින් ප්‍රයෝජනයක් ලැබෙන්නේ නැහැ" කියලා තමයි ජනතාව කියන්නේ. ඒ නිසා තමයි මෙතැනදී අපට දේශපාලන ප්‍රතිසංස්කරණත්, ඒ වාගේම ආර්ථික ප්‍රතිසංස්කරණත් දෙකම එකට අරගෙන යන්න වෙන්නේ. මාත් විශ්වාස කරන දෙයක් තමයි, බදු වැඩි කරනවා නම්, දූෂණ අවම කරන්න තිබෙන මේ රටේ නීති රාමුව යම් කිසි විධියකට ශක්තිමත් කළ යුතුව තිබෙන බව.

දැන් විපක්ෂයේ ඉන්න මන්ත්‍රීවරු ගිය ආණ්ඩුවේ sugar scam එක ගැන කථා කළා. ඒ වාගේම, ඊට ඉස්සෙල්ලා තිබුණු ආණ්ඩුව කාලයේ bond scam එක ගැන කථා කළා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ මොන scam එක වුණත් මොකක්ද ඇත්තටම වෙලා තිබෙන්නේ? වෙලා තිබෙන්නේ අනෙක් අයට තොරතුරු එන්න ඉස්සෙල්ලා යම් කිසි වරප්‍රසාද තිබෙන කණ්ඩායමකට ඒ තොරතුරු එන එක. ඒ තොරතුරුවලින් ඒ අය අසාධාරණ ප්‍රයෝජනයක් ගන්නවා. මේ තත්ත්වය වෙනස් කරන්න නම්, අපි මෙන්න මේ system එක අනිවාර්යයෙන්ම වෙනස් කරන්න වුවමනාවක් තිබෙනවා.

ඒ වාගේම, ජනාධිපතිතුමාගේ කථාවේදී එතුමා පැහැදිලිව කිව්වා, social market economy එකකට තමයි අපි යන්නේ, සමාජ වෙළෙඳ පොළ ක්‍රියාදාමයකට තමයි යන්නේ කියලා. සමාජ වෙළෙඳ පොළ ක්‍රමය රටවල් කීපයක් පාවිච්චි කරලා තිබෙනවා.

1949 Christian Democratic Union of Germany කියන පක්ෂයෙන් තමයි ඒක ඉස්සෙල්ලාම පටන් ගත්තේ. අපේ අය වැය ලේඛනය ඉදිරිපත් කළාට පස්සේ පැවැති තේ පැන් සංග්‍රහයේදී ආසියාවේ සමාජවාදී රටක තානාපති කෙනෙකු මාත් එක්ක කථා කරද්දී කිව්වා, "දැන් ජනාධිපතිතුමා පැවසුවා සමාජයීය වෙළඳ පොළ ආර්ථිකයට තමයි යන්නේ. අපේ රටේ තිබෙන්නේත් සමාජයීය ආර්ථික වෙළඳ පොළක්" කියලා. එහෙම නම් මේ ක්‍රමය ධනවාදී රටවල තිබෙන්න පුළුවන්, සමාජවාදී රටවලත් තිබෙන්න පුළුවන්. මේකේ ලොකු spectrum එකක් තිබෙනවා. ඒ ප්‍රතිපත්තියේදී අපි තේරුම් ගන්න වුවමනායි, වෙළඳ පොළවලින් තමයි හොඳ ම විධියට resource allocation එකක් වෙන්නේ කියලා. ඒ නිසා අපිට වෙළඳ පොළ වර්ධනය කරන්න වුවමනාවක් තිබෙනවා. ඒ වෙළඳ පොළට නීති-රීති ගෙනෙන්න වුවමනාවකුත් තිබෙනවා. ඒ නීති-රීතිවලින් සමාජයේ අඩු ආදායම් ලබන පිරිස ආරක්ෂා කර ගන්න වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්න වුවමනාවක් තිබෙනවා. ඒ වාගේම, අපේ යම්කිසි විවෘතභාවයකුත් තිබෙන්න ඕනෑ.

මේ අය වැය ගෙනාවාට ම මේවා වෙනස් වෙන්නේ නැහැ. ඒ සඳහා අපේ කම්කරු නීති වෙනස් කරන්න වුවමනාවක් තිබෙනවා. ඒ වාගේම අපේ රාජ්‍ය ව්‍යාපාර ප්‍රතිව්‍යුහගත කරන්න වුවමනාවක් තිබෙනවා. මම ඉස්සෙල්ලා පැවසූ අන්දමට අපි මොකක් හරි දෙයක් විකුණනවා නම්, cost-plus pricing එකක්, එහෙම නැත්නම් කොච්චර වියදමක් යනවා ද කියලා ගණන් හදලා ඒ මිල දෙන්න වුවමනාවක් තිබෙනවා. ඒ වාගේම red tape, එහෙම නැත්නම් ආයතනයකට ගියාම permits ගන්නට ගත වෙන කාලය, අපි පුළුවන් තරම් අඩු කරන්න වුවමනාවක් තිබෙනවා. ඒ වාගේම digitalization, තොරතුරු තාක්ෂණ පැත්තට ගිහිල්ලා අපේ efficiency එක වැඩි කරන්නත් වුවමනායි. අපි අනිවාර්යයෙන්ම මේ පසුබිම ඇති කර ගන්න වුවමනාවක් තිබෙනවා. ඒවා කළොත් විතරයි, අපට අපේ ආර්ථිකය වර්ධනය කර ගන්න පුළුවන් වන්නේ.

ඊයේ ද, පෙරේදා ද අපේ මහාචාර්ය චරිත හේරත් මන්ත්‍රීතුමා ප්‍රකාශයක් කළා, රාජ්‍ය ආයතන විකුණන්න හදනවා කියලා. රාජ්‍ය ආයතන විකුණන්න හදන කථාවක් නොවෙයි මේ තිබෙන්නේ. සමහර රාජ්‍ය ආයතන අනිවාර්යයෙන්ම විකුණන්න වුවමනාවක් තිබෙනවා. එතුමා කිව්වා, "ඔව්, මට තේරෙනවා SriLankan Airlines එක විකුණන එක. නමුත් ඇයි මේ ලාභ ලබන Sri Lanka Insurance Corporation වැනි ආයතන විකුණන්නේ" කියලා. මට හොඳ අත්දැකීමක් තිබෙනවා. මම දේශපාලනයට එන්න ඉස්සෙල්ලා Sri Lanka Insurance Corporation එකේ අවුරුදු නවයක්, දහයක් වාගේ කාලයක් වැඩ කළා. මම පළමුවැනි අවුරුදු පහ වැඩ කළේ, ඒ ආයතනය පෞද්ගලික අංශය යටතේ තිබුණු කාලයේ, හැරී ජයවර්ධන මහත්තයා යටතේ. ඉන් පසුව නඩු තීන්දුවකින් ඒ ආයතනය ආණ්ඩුවට ගත්තා. ඒ ආයතනය රජය යටතට ගත්තාට පස්සේත් මම අවුරුදු පහක් ඒ ආයතනයේ වැඩ කළා. මට ඒ ආයතනය ගැන අත්දැකීමක් තිබෙනවා, ආණ්ඩුව යටතේ තිබුණු කාලයේ කොහොමද ඒ ආයතනය පවත්වා ගෙන ගියේ වාගේම, පෞද්ගලික අංශය යටතේ තිබුණු කාලයේ කොහොමද ඒ ආයතනය පවත්වාගෙන ගියේ කියලා. මගේ අත්දැකීම අනුව, ආණ්ඩුව යටතට ඒ ආයතනය ගත්තාට පස්සේ ඒ ආයතනයේ තිබුණු efficiency එක පොඩ්ඩ, පොඩ්ඩ අඩු වෙන්න පටන් ගත්තා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කොමර්ෂල් බැංකුව වාගේ පෞද්ගලික බැංකු අනෙක් රටවල බැංකු ශාඛා පටන් අරගෙන තිබෙනවා. බංග්ලාදේශයේ branches 24ක් වාගේ ප්‍රමාණයක් තිබෙනවා. LOLC ආයතනය අනෙක් රටවල branches open කරලා තිබෙනවා. නමුත් අපේ Sri Lanka Insurance Corporation එක, National Savings Bank එක, Bank of Ceylon එක අනෙක් රටවල branches කීයක් විවෘත කරලා තිබෙනවා ද? අපේ චරිත හේරත් මහාචාර්යතුමාට මම කියන්න කැමැතියි, restructure කරනවා කියන්නේ සම්පූර්ණයෙන්ම විකුණනවා කියන එක නොවෙයි කියලා. ඒ ආයතනයෙන් සියයට 30ක්, 40ක් වාගේ කොටස් රජයට තියා ගන්න පුළුවන්. ටෙලිකොම් ආයතනයේ යම්කිසි කොටස් ප්‍රමාණයක් රජයට අයිතිව තිබෙනවා. සමහර අය කියනවා, සියයට 50ක වාගේ කොටස් තියා ගන්න ඕනෑ කියලා. මම නම් කියන්නේ සියයට 50ට වඩා අඩුවෙන් කොටස් තියා ගත්තොත් හොඳයි කියලා. සියයට 50කට වඩා කොටස් තියා ගත්තොත් SriLankan Airlines එකට වුණු දේ වෙන්න පුළුවන්. නමුත් මේ කරන්න යන වෙනස්කම්වලට අපට එකඟ වෙන්න වෙනවා. අපි මේ වෙනස්කම් කළේ නැත්නම් අපට පරණ පාරේම තමයි ආපසු යන්න වෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි දහසය වතාවක් IMF එකට ගියා. ඒත් අපි පාඩම් ඉගෙන ගත්තේ නැහැ. ඒ නිසා අපි සියලුදෙනා එකතු වෙලා මේ සැරේවත් අවශ්‍ය දේශපාලන සහ ආර්ථික ප්‍රතිසංස්කරණ කරමු. එහෙම කළොත්, අපට මේ රට හරි මාර්ගයට දමන්න පුළුවන් වෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු වසන්ත යාපාබණ්ඩාර මන්ත්‍රීතුමා.

[අ.භා. 5.22]

**ගරු නීතිඥ වසන්ත යාපාබණ්ඩාර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி வசந்த யாப்பாபண்டார)
(The Hon. Wasantha Yapabandara, Attorney-at-Law)
ඔබතුමාට සුබ උපන් දිනයක් වේවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි! ඔබතුමා මූලාසනයේ සිටින මේ අවස්ථාවේ මට කථා කිරීමට අවස්ථාව ලැබීම ගැන මම සතුටු වෙනවා.

වසර 30ක් වාගේ කාලයක් අපොස (උසස් පෙළ) දරුවන්ට ආර්ථික විද්‍යාව උගන්වපු ගුරුවරයකු හැටියට මට නම් ජනාධිපතිතුමා ඉදිරිපත් කළ මේ අය වැය ලේඛනයත්, එතුමා මීට කලින් ඉදිරිපත් කරපු සංකල්ප පත්‍රිකාවත් -ජනාධිපතිතුමාගේ රාජාසන කථාවත්- අතර වෙනසක් පේන්නේ නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මේ අය වැය ලේඛනයේ සඳහන් වන කාරණා පිළිබඳව අවසාන වශයෙන් අපේ තාරක බාලසූරිය රාජ්‍ය අමාත්‍යතුමා සඳහන් කළා. ටෙලිකොම් ආයතනය, හිල්ටන් ආයතනය, වෝටර්ස් එජ් හෝටලය, ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව වාගේ ආයතන පෞද්ගලිකරණය කිරීම, වෙනත් විධියකට කියනවා නම් ප්‍රතිව්‍යුහගත කිරීම සම්බන්ධයෙන් චරිත හේරත් මැතිතුමා නඟපු ප්‍රශ්නයට එතුමා යම් පිළිතුරක් දුන්නා. ගරු තාරක බාලසූරිය මැතිතුමා උගත් මන්ත්‍රීවරයකු, රාජ්‍ය අමාත්‍යවරයකු විධියට ඒ පිළිතුර ලබා දීම ගැන මම කනගාටු වෙනවා. මේ රටේ පෞද්ගලිකරණය කළ යුතු, පෞද්ගලික අංශයට බරව ප්‍රතිසංවිධානය කළ යුතු ආයතන තිබෙනවා. නමුත්, මේ වාගේ ලාභ ලබන ආයතන කුණුකොල්ලයට අළෙවි කිරීමේ යම් යටි අරමුණක් ඇතිවයි මේ ක්‍රියාදාමයට මුල පුරන්නේ කියලා අපි මේ වෙලාවේ නඟපු ප්‍රශ්නය තාර්කිකව ඔප්පු කරන්න ඕනෑ කියලා මා විශ්වාස කරනවා. මේ කාර්යයද පළමුවෙන්ම කරන්න තිබෙන්නේ? පාඩු ලබන, අතිශයින්ම ප්‍රතිසංස්කරණය කළ යුතු ඒවා නේද පෞද්ගලිකරණය කරන්න ඕනෑ? ඒකයි අපි යෝජනා කරන්නේ.

[ගරු නීතිඥ වසන්ත යාපාබණ්ඩාර මහතා]

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ අය වැය ලේඛනයේ සඳහන් වෙන්න ඕනෑ කාරණාවක් හිතාමතාම පැහැර හැර තිබෙනවා කියලා මම මේ වෙලාවේ කියන්න ඕනෑ. මේ රට අද මූල්‍ය අර්බුදයක් එක්කයි තිබෙන්නේ. මේ මූල්‍ය අර්බුදය විසඳීම සඳහා කෙටි කාලීන විසඳුම් වාගේම, මැදි කාලීන විසඳුම් අපි බලාපොරොත්තු වෙනවා. නමුත්, මේ අය වැයේදී මූල්‍ය අර්බුදයට විසඳුම් ඇතුළත් කිරීමෙන් වැළකී සිටින්න පරෙස්සම් වෙලා තිබෙන බව මම කියනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ අය වැය කථාව රාජාසන කථාවකට සමානයි කියන්නේ අදට අවශ්‍ය විසඳුම් පිළිබඳව ඡායා මාත්‍රයක්වත් මෙහි සඳහන් නොවීම නිසායි. මේ මූල්‍ය අර්බුදයට -කෙටියෙන් කියනවා නම් ඩොලර් අර්බුදයට- විසඳුම ඩොලර් සොයා ගැනීමයි. ඩොලර් සොයා ගන්න තිබෙන ප්‍රධානම බලවේගය තමයි මේ රටේ සිටින සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන්.

ලෝකයේ දියුණු වෙච්ච රටවල් පිළිබඳ න්‍යායක් තිබෙනවා. ලෝකයේ දියුණු වෙච්ච රටවල දියුණුව පිළිබඳ Solow න්‍යායෙන්, Harrod-Domar විග්‍රහයෙන්, Endogenous විග්‍රහයෙන්, Amartya Sen ගේ විග්‍රහයෙන් කථා කරනවා. රටක් සංවර්ධනය කිරීම පිළිබඳව විවිධ විග්‍රහ තිබෙනවා. මේ සංවර්ධන මූලාකෘතිවල තිබෙනවා, රටක් පූර්ණ ප්‍රශස්ත සම්පත් උපයෝජනයකට ලක් කරන්න ඕනෑ කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ශ්‍රී ලංකාවේ අය වැය ලේඛනවලදී හැම දාම ජප කරන, "නිෂ්පාදන ආර්ථිකයකට යනවා" කියන කථාව මේ පොළොවේ පැළ කරන්න නම්, නිෂ්පාදනයට අවශ්‍ය ප්‍රධාන සාධක හතර පූර්ණ උපයෝජනයට ලක් කරන්න ඕනෑ.

මේ නිෂ්පාදන සාධක හතරෙන් පළමුවැනි එක ස්වාභාවික සම්පත වන භූමියයි. දෙවැනි එක තමයි මානව සම්පත - ශ්‍රමය. ඊළඟට, ව්‍යාපාර සහ ප්‍රාග්ධනය. මේ තමයි ඒ සාධක හතර. මේ නිෂ්පාදන සාධක හතරෙන් අපි භූමිය පමණක් -ස්වාභාවික සම්පත පමණක්- ගනිමු. මේ අය වැය යෝජනාවලින් භූමිය පූර්ණ උපයෝජනයට ලක් කිරීමට පුළුවන්ද කියලායි මම අහන්නේ. ඔබතුමා දන්නවා, මේ වනවිට වැට් එක සියයට 8 සිට සියයට 15 දක්වා ගෙනියලා, ආදායම් බද්ද සියයට 30ට, 36ට ගෙනියලා, පොලී අනුපාතය සියයට 33ට ගෙනියලා කියලා. මේ තරම් දැවැන්ත මර්දනයකට ලක් කරලා තිබෙනවා ආර්ථිකය කියන සාධකය.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සියයට 33ක පොලියක් ගෙවන්න තරම් ලාභ ලබන ව්‍යාපාරය මොකක්ද කියලා මම ඔබතුමාගෙන් අහනවා. සමහරවිට ඩයනා ගමගේ මන්ත්‍රීතුමිය හිටියා නම් කියයි, "ගංජා වැවීම" කියලා. මේ රටේ ගංජා ආර්ථිකයක් හදන්න යන්නේ සියලු සංකල්ප, ආර්ථික මූලධර්මවලට පටහැනිවයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අද මේ ආර්ථිකය ගොඩ ගන්න තැත් කරන සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරිකයන් තමන්ගේ දේපළ විකුණලා fixed deposit එකක් දමන තැනට ගෙනැල්ලා තිබෙනවා. අපේ රාජ්‍ය ඇමතිතුමා කියනවා, මේ වෙලාවේවත් IMF එක සාධාරණව තේරුම් අරගෙන එක්ව රට ගොඩ ගමු කියලා. IMF එක ඉදිරිපත් කරලා තිබෙන මේ කොන්දේසි පහෙන් දූෂණය පිළිබඳ කාරණය හැර අනෙක් ඔක්කොම හරියටම, අකුරටම ඉටු කරන්න ආණ්ඩුව පෙළ ගැහිලා ඉන්නවා. ඒ එක්කම, මූල්‍ය ප්‍රතිසංස්කරණ ගෙනෙන්න කියලා තිබෙනවා. සියයට 6 තිබුණු පොලී අනුපාතය සියයට 33ට ඉහළ දමලා තිබෙනවා.

කොහොමද සියයට 33ක් පොලී ගෙවලා සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවා ජීවත් වෙන්නේ? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ තරම් බදු ගැහුවාම ඒ මිනිස්සු - විශේෂයෙන් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරිකයා - ජීවත් වෙන්නේ දැවැන්ත පීඩනයකින්. මම ඔබතුමාට කියන්න අවශ්‍යයි, එක පැත්තකින් රාජ්‍ය සේවකයාගේ වැටුප ඒ විධියටම තියලා, ඔහුගේ ආදායම් මාර්ග සියල්ල අහුරා දමා තිබෙනවා. රටේ ආහාර උද්ධමනය සියයට 91ට වැඩි වෙලා තිබෙනවා. රටේ මූර්ත ආදායම්වල දැවැන්ත කඩා වැටීමක් තියෙන්නේ. මේ ප්‍රශ්නවලට විසඳුම විධියට අපි කරන්න ඕනෑ, මේ වාගේ ගෙල මිරිකා බදු ගන්න එකද? පාත්තයාගෙන් පිහාටු ගලවා ගන්නා සේ බදු අය කළ යුතුය කියලායි බදු මූලධර්මවල සඳහන් වෙන්නේ. අර්බුදයක් තියෙන වෙලාවක ඒ අර්බුදය ලිහන්න තවදුරටත් සාමාන්‍ය දුප්පත් මිනිහා, රජයේ සේවකයා පීඩාවට පත් කරන්න එපා කියලායි අපි කියන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ රටේ ලක්ෂ 16ක් වන රාජ්‍ය සේවක ප්‍රමාණයක් නිර්මාණය කිරීමේ වරද රාජ්‍ය සේවකයාගේ නොවෙයි. ඒ නිසා රාජ්‍ය සේවකයා හංවඩු ගහන්න එපා. ඒ පවුකාරකමට කර ගහන්න, වින්දිතයෙක් වෙලා ඉන්න රාජ්‍ය සේවකයාට සාධාරණ හේතුවක් නැහැ. ප්‍රතිසංස්කරණය කරන්න ලෝකයේ භාවිත කරපු ක්‍රම තිබෙනවා. ඔබතුමා දන්නවා, ලෝකයේ රටවල් අතරින් රුවන්ඩාව කියන්නේ අපේ රට වාගේ රටක්. වර්ග කිලෝමීටර 26,000ක විතර භූමි ප්‍රමාණයක් තියෙන රටක්. ඒ රට අද අප්‍රිකානු කලාපයේ අග්‍රගණ්‍ය -දියුණු- තැනකට ඇවිල්ලා තියෙනවා. ඔබතුමා දන්නවා, ඊශ්‍රායලය ගැන. ඊශ්‍රායලයේ වර්ග කිලෝමීටර ප්‍රමාණය ගත්තොත්, ශ්‍රී ලංකාව තරම් වන රටක් නොවෙයි. මේ වාගේ රටවල් දියුණුවට ගිහිල්ලා තියෙන්නේ විවිධ න්‍යායික උපක්‍රම භාවිත කරලායි මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. දකුණු කොරියාව ගත්තොත්, වර්ග කිලෝමීටර ලක්ෂයක් වාගේ ප්‍රමාණයක් තියෙන්නේ. මම කලින් සඳහන් කරපු ඊශ්‍රායලයේ වර්ග කිලෝමීටර 22,145ක් පමණ තියෙන්නේ. රුවන්ඩාවේ වර්ග කිලෝමීටර 26,000ක් තියෙන්නේ. වර්ග කිලෝමීටර 65,610ක භූමි ප්‍රමාණයක් තියෙන අපේ රටේ සම්පත් පූර්ණ උපයෝජනයට ලක් කරන්න අවශ්‍යයි. අපේ සම්පත් පූර්ණ උපයෝජනයට ලක් කරන්න අය වැයේ තියෙන උපක්‍රම මොනවාද?

බීජ පනත කියලා පනතක් තියෙනවා. නමුත්, මිල නියාමනයක් නැහැ. අපි අහපුවාම, තක්කාලි බීජ කිලෝව මේ රටේ අලෙවි කරන්නේ රුපියල් 120,000ට කියනවා. නමුත්, දඹුල්ලෙන් අහලා බලනකොට බීජ කිලෝවක් රුපියල් 680,000යි. මේ මිල ගණන්වලට බීජ ලබා ගෙන ගොවියාට පුළුවන්ද පූර්ණ සේවා නියුක්තියකට යන්න? කුඹුරු වගාව සහ වෙනත් වගා කරන ගොවියාට ඇයි මේ විධියට පහර ගහන්නේ? එළවා දමන්නේ? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රජයක් විධියට අය වැයෙන් යෝජනා කරන්න ඕනෑ, භාවිත උපයෝජනය වැඩි වෙන ක්‍රම නේද?

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මහනුවර දිස්ත්‍රික්කය නියෝජනය කරන මන්ත්‍රීවරයකු විධියට මම කියන්න ඕනෑ කාරණා කීපයක් තිබෙනවා. ජයිකා ආධාර යටතේ මහනුවර නගරයේ අපජල ව්‍යාපෘතියක් ආරම්භ කළා. ඒ අපජල ව්‍යාපෘතිය භාරව කටයුතු කළ ජයිකා ආයතනය මේ දෙසැම්බර් මාසයේ ලංකාවෙන් ඉවත් වෙන්න යනවා. මහනුවර නගරයේ වසන මිනිස්සු දහස් ගණනක් මේ අපරාධයේ වින්දිතයෝ කරන්නයි ඒ හදන්නේ. ජල සම්පාදන අමාත්‍යවරයා ඉන්නේ නුවර. ගරු කෙහෙළිය රඹුක්වැල්ල ඇමතිතුමනි, කරුණාකරලා මේ ගැන අවධානය යොමු කරන්න. භාගෙට කැඩුණු පාරවල්, භාගෙට හදපු බැමි එක්ක මේ කටයුතු මහනුවර මහ නගර සභාවට භාර දෙන්නයි යන්නේ. මහනුවර මහ නගර සභාවට මේක දරා ගන්න බැහැ. ඒ නිසා අදත් මහ ඇළ ගොඩගලනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, නුවර නගරයට මධ්‍යම අධිවේගී මාර්ගය එනවා කියනවා. එහෙම නම් කටුගස්තොට නගරය දියුණු වෙනවා. කටුගස්තොට නගරය තමයි වෙළඳ නගරය බවට පත්වෙන්නේ. එතකොට වෙනත් පැත්තකට උමං මාර්ගයක් මොකටද කියලා මම අහනවා. ඒ උමං මාර්ග හදන්න ගත්ත වාර්තා පිළිබඳවත් අපට ප්‍රශ්නයක් තියෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, උමං මාර්ග හදන එක කොයි හැටියට වෙයිද කියලා හිතා ගන්න පුළුවන්. ජයිකා ආයතනය එක්ක එකතු වෙලා, අඩි දෙකක් යටට බටයක් දාන්න බැරි නම්, මොන උමං මාර්ග ද? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මහනුවරින් බිහි වෙච්ච මන්ත්‍රීවරු 8දෙනෙකු ඉන්නවා. දෙදෙනකු විපක්ෂය පැත්තේ ඉන්නවා. හය දෙනෙක් ඇමතිවරුත් එක්ක එහා පැත්තේ ඉන්නවා. ගරු මන්ත්‍රීවරුනි, කරුණාකරලා ආණ්ඩුවට කියන්න, මේ පාරවල් වාරිමාර්ග වෙලායි තියෙන්නේ කියලා. අලදෙණියේ ඉඳලා පොල්ගහමුලට එන මාර්ගය, දෙල්තොට මාර්ගය -ජනාධිපතිතුමා මුල්ගල තිබ්බේ- අද අවභාවිතයට ලක් වෙලා. ඒ සඳහා ගෙනාපු බඩු අපතේ. ඒ ද්‍රව්‍ය ඒ තැන්වල එහෙමම ගොඩ ගහලා තියෙනවා. මේකෙන් වෙන්නේ පසුගිය දිනවල කුරුණෑගලදී ළමයකු අනතුරට පත් වුණු විධියට අපේ තවත් සාමාන්‍ය මනුෂ්‍යයකුට අනර්ථයක්, මරණයක් සිද්ධ වෙන එකයි. ඒ නිසා භාගෙට හදලා තියෙන මාර්ග, භාගෙට ඉදි කරලා තියෙන වැඩ ටික අවසාන කරන්න කරුණාකර ප්‍රතිපාදන වෙන් කරන්න කියලායි අපි කියන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ වෙලාවේ මේ අයගේ උපක්‍රමය වෙලා තිබෙන්නේ මර්දනය බව අපි දන්නවා. රටේ මිනිසුන් පීඩාවට පත් වෙලා සිටින මේ වෙලාවේ දින 90ක් රඳවා තබාගෙන ඉන්න වසන්ත මුදලිගේ සහ සිරිධම්ම හිමි ඇතුළු පිරිස තවත් දින 90ක් රඳවා තබාගන්නයි යන්නේ. වසන්ත, සිරිධම්ම හිමි ඇතුළු පිරිසගේ දේශපාලනය අපේ දේශපාලනය නොවෙයි. දේශපාලන මතිමතාන්තර මොනවා වුණත්, අනර්ථකාරී විධියට ඒ අය තවදුරටත් රඳවා තබාගන්න එපා. ඔවුන්ට එරෙහිව යම් චෝදනාවක් තිබෙනවා නම් ඒ පිළිබඳව කරුණු ඉදිරිපත් කරන්න කියලායි අපි කියන්නේ.

මට මේ කාලය ලබා දුන්නාට ඔබතුමාට ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

***එකල්හි වේලාව අ.භා. 5.30 වූයෙන්, කටයුතු අත්හිටුවා විවාදය කල් තබන ලදී.***

***එතැන් සිට විවාදය 2022 නොවැම්බර් 18වන සිකුරාදා පවත්වනු ලැබේ.***

*அப்பொழுது, பி.ப. 5.30 மணியாகிவிடவே அலுவல்கள் இடைநிறுத்தப்பட்டு விவாதம் ஒத்திவைக்கப்பட்டது.*

*விவாதம், 2022 நவம்பர் 18, வெள்ளிக்கிழமை மீளத் தொடங்கும்.*

*It being 5.30 p.m., Business was interrupted, and the Debate stood adjourned.*

*Debate to be resumed on Friday, 18th November, 2022.*

## කල්තැබීම
## ஒத்திவைப்பு
## ADJOURNMENT

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය" යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව, ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ මන්ත්‍රීතුමා.

Order, please! ඊට පෙර කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයෙක් මූලාසනය සඳහා ගරු සමන්ප්‍රිය හේරත් මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "ගරු සමන්ප්‍රිය හේරත් මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු ප්‍රේම්නාත් සී. දොලවත්ත මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු සමන්ප්‍රිය හේරත් මහතා මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு பிரேம்நாத் சி. தொலவத்த அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு சமன்பிரிய ஹேரத் அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon* THE HON. PREMNATH C. DOLAWATTE *left the Chair, and* THE HON. SAMANPRIYA HERATH *took the Chair.*

## සමාජ සුබසාධන ආධාර ප්‍රතිලාභීන්ගේ නිවසටම ලබා දීමේ වැඩ පිළිවෙළක්
## சமூக நல உதவித்தொகையினைப் பயனாளிகளின் வீடுகளுக்குச் சென்று வழங்குவதற்கான செயற்றிட்டம்
## PROGRAMME TO DISTRIBUTE SOCIAL WELFARE ALLOWANCES TO BENEFICIARY HOUSEHOLDS

[අ.භා. 5.32]

**ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ මහතා**
(மாண்புமிகு உபுல் மஹேந்திர ராஜபக்ஷ)
(The Hon. Upul Mahendra Rajapaksha)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද සභාව කල් තබන අවස්ථාවේ මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

> "රජය විසින් ලබාදෙන වැඩිහිටි ආධාර, ආබාධිත ආධාර, වකුගඩු රෝගී ආධාර හා පින්පඩි ආධාර මුදල් මේ වන විට ප්‍රාදේශීය ලේකම් කාර්යාල, සමෘද්ධි කාර්යාල, තැපැල් කාර්යාල මඟින් ලබා ගැනීම සිදුවන අතර, එම ආධාර මුදල් ලබා ගැනීම සඳහා ප්‍රතිලාභීන්හට ප්‍රවාහන වියදමක් දැරීමට සිදු වී ඇත. මෙම ආධාර මුදල් ලබන පුද්ගලයින් සමාජයේ සානුකම්පිත අවධානය ලැබිය යුතු අයවලුන් වන බැවින්, මේ පිළිබඳ අපගේ විශේෂ අවධානය යොමු කළ යුතු බැව් මාගේ අදහසකි.
>
> එබැවින් මේ සම්බන්ධව මෙම ගරු සභාවේ අවධානය යොමු කර ඉහත ආධාර මුදල් ප්‍රතිලාභීන්ගේ නිවෙස් වෙත ම ලබා දීම සඳහා සුදුසු වැඩ පිළිවෙළක් සකස් කළ යුතු යැයි මෙම ගරු සභාවට යෝජනා කර සිටිමි."

අද සමාජයේ විශාල කතිකාවක් බවට පත් වූ, ගරු මන්ත්‍රීතුමන්ලා හැම කෙනෙකුම වාගේ කථා කරන කාරණයක් තමයි වැඩිහිටි ආධාර, ආබාධිත අය වෙනුවෙන් වන දීමනාව, වකුගඩු රෝගීන් වෙනුවෙන් වන දීමනාව ආදිය ලබා දීමේදී ඇති වෙලා තිබෙන ගැටලුව. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඊයේ මම

[ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ මහතා]

අපේ බෙම්මුල්ල කියන ප්‍රදේශයේ දුම්රිය ස්ථානය අසලට ගියා, යම් පිරිසක් හමුවෙන්න. ඒ වෙලාවේත් අහිංසක ආච්චි කෙනෙක් ඇවිල්ලා මගෙන් ඇහුවා, "මහත්තයෝ, අපේ වැඩිහිටි දීමනාව ලැබෙන්නේ නැද්ද?" කියලා. ඇය ඉතාම වයෝවෘද්ධ කෙනෙක්; පාරේ සිටිය යුතු කෙනෙක් නොවෙයි. නමුත් ඇයගේ වැඩිහිටි දීමනාව ගැන සොයන්න දුර බැහැර ගෙවාගෙන සමෘද්ධි බැංකුවට යනවා. අද මා යෝජනා කරනවා, වැඩිහිටි ආධාර, ආබාධිත අය සඳහා වන ආධාර, වකුගඩු රෝගී ආධාර, මහජන ආධාර සහ වෙනත් රෝග සඳහා වන ආධාර ලබා දීමේදී අප ඒ කෙරෙහි වඩාත් විමසිලිමත්ව බැලිය යුතු බව.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද තිබෙන්නේ, අපේ රටේ මහ ජනතාව මහත් සේ අපහසුතාවට පත්වූ යුගයක්. අපි ඒක පිළිගන්නට ඕනෑ. ඒකට විවිධ අර්ථකථන දෙන්න පුළුවන්. ඒකට වසර 74ක සාපය කියනවා වෙන්න පුළුවන්. සමහරු මේ සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවට දොස් කියනවා වෙන්නත් පුළුවන්. කෙසේ හෝ මෑත කාලීනව විශාල ප්‍රශ්නයකට මුහුණ දෙන්න මේ රටේ ජීවත් වන අපට සිද්ධ වුණා. ඒ ප්‍රශ්නය තමයි, අපි ආර්ථික වශයෙන් යම් ප්‍රපාතයකට වැටීම. එසේ ප්‍රපාතයට වැටුණු නිසා ඈත දුෂ්කර ගම්බද ප්‍රදේශවල ජීවත් වන අහිංසක අම්මලා, තාත්තලා ඇතුළු සමස්ත රටම පීඩාවට පත් වුණා. අපේ වැඩිහිටි අම්මලා, තාත්තලාත් ඒ තත්ත්වයට පත් වුණා. රෝගී අයත් ඒ තත්ත්වයට පත් වුණා. භූමිතෙල් ටික නැතිව, ඉන්ධන ටික නැතිව, ගෑස් ටික නැතිව, ජීවත් වීමට තිබෙන ආර්ථික අපහසුතා මැද, සමහර විට පොහොර හිඟය නිසා කුඹුර වගා කරන්නට බැරිව අපහසුතාවට පත් වෙලා ඉන්න වැඩිහිටි අයට මේ වැඩිහිටි දීමනාව ඉතා වැදගත් දීමනාවක් වුණා.

මේ කාරණය දෙස දුරින් ඉඳලා බලන අපට ගැටලුවක් පෙනෙන්නේ නැහැ. මොකද, අපි කවුරුවත් ආබාධිතයෝ නොවෙයි. අපට හොඳට ඇස් දෙක පෙනෙනවා, හොඳට කන් ඇහෙනවා. අපට හොඳට ඇවිදලා යන්න පුළුවන්. ඒ නිසා අපට මේ ප්‍රශ්නය දැනෙන්නේ නැහැ. හැබැයි, වයෝවෘද්ධ කෙනෙකුට මේ ප්‍රශ්නය දැනෙනවා. රටේ තිබෙන ඉන්ධන ප්‍රශ්නය නිසා අද කෙටි දුරක් යන්නත් ත්‍රිරෝද රථවලින් ලොකු මුදලක් අය කරනවා. ඒ වාගේම ඒ අය විවිධ තැන්වලට ගිහින් රස්තියාදු වෙන්න ඕනෑ. සමාජයේ ඒ සෑම පුද්ගලයෙකුටම ගෞරවය අවශ්‍ය වෙනවා. ආදරය අවශ්‍ය වෙනවා, කරුණාව අවශ්‍ය වෙනවා, ඒ අයගේ අවශ්‍යතාව ඉටු කරගන්න ගියාම ඒ අයට ඇහුම් කන් දීමත් අවශ්‍ය වෙනවා.

ඉහත කරුණු කාරණා දිහා බලා, වැඩිහිටියන්, ආබාධ සහිත වූවන්, වකුගඩු රෝගීන් ඇතුළුව ආධාර ලබන තත්ත්වයේ පසුවන අයට ඒ ආධාර මුදල වඩාත් හොඳින් ලබා දීම සඳහා වන යෝජනාවක් කරන්න මා කැමැතියි. ගමක් තුළ රාජකාරි කරන ප්‍රධාන නිලධාරින් පස් දෙනෙක් ඉන්නවා.

මේ ආධාර මුදල් ලබා දීමේ දී බැංකුවක් එක්ක සම්බන්ධ වෙන්න ඕනෑ කියලා හිතෙන්න පුළුවන්. අතීතයේ ඉතිරි කිරීමේ බැංකුව හා තැපැල් කාර්යාලය හරහා ඒ කටයුතු කළා. අද සමෘද්ධි බැංකු තිබෙනවා. කෙසේ වෙතත්, වඩා ගෞරවනීය සේවයක් ලබා දීමට නම් වැඩිහිටි දීමනා ඇතුළු ඒ සියලු දීමනා ඒ ප්‍රතිලාභීන්ගේ තත්ත්වය විමසා -වඩා හොඳ තත්තවයෙන් ඉන්න අයට අවශ්‍ය නැහැ- ඔවුන්ගේ නිවෙස්වලටම ගිහින් ලබා දෙන්න පුළුවන් නම් හොඳයි. අපහසුතා තිබෙන අයගේ නිවෙස්වලටම ගිහින් එම ආධාර මුදල් ලබා දීමට කටයුතු කරන ලෙසත්, එය පුණ්‍ය කර්මයක් හැටියට සලකන ලෙසත් ඉල්ලා සිටිමින් මෙම යෝජනාව ස්ථිර කිරීම සඳහා අපේ ගරු කුමාරසිරි රත්නායක මන්ත්‍රීතුමාට අවස්ථාව ලබා දෙමින් මා නිහඬ වෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු කුමාරසිරි රත්නායක මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි තුනක කාලයක් තිබෙනවා.

[අ.භා. 5.37]

**ගරු කුමාරසිරි රත්නායක මහතා**
(மாண்புமிகு குமாரசிறி ரத்னாயக்க)
(The Hon. Kumarasiri Rathnayaka)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට මේ අවස්ථාව ලබා දුන්නාට ස්තුතියි.

අද සභාව කල්තබන අවස්ථාවේ ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ මන්ත්‍රීතුමා ඉතාම වැදගත් යෝජනාවක් ඉදිරිපත් කළා. එතුමා ජීවත් වන, නියෝජනය කරන ගම්පහ දිස්ත්‍රික්කයේ පමණක් නොවෙයි, මා නියෝජනය මොණරාගල දිස්ත්‍රික්කය ඇතුළු අනෙක් දිස්ත්‍රික්ක සියල්ලේත් කාලයක සිට මේ ගැටලුව තිබෙන බව අපේ ගරු මන්ත්‍රීවරුන් සමඟ කථා කරද්දී අපට දැනගන්නට ලැබුණා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මීට පෙර මෙම දීමනා මුදල් ලබා දෙන කොට, ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් හෝ ප්‍රතිලාභියාට ආසන්න තැපැල් කාර්යාලයෙන් ලබාගන්න පුළුවන්කම තිබුණා. එහෙමත් නැත්නම් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට ඔවුන් ලබා දී තිබුණු බැංකු ගිණුමකට ඒ මුදල් බැර කරන්න ප්‍රාදේශීය ලේකම්වරුන් පසුගිය කාලය තුළ කටයුතු කළා. නමුත් සමෘද්ධි බැංකු මඟින් ඒ දීමනා ලබා දෙන්න තීරණය කළාට පසුව, ඒ ප්‍රතිලාභීන් දැඩි අපහසුතාවට පත් වෙලා ඉන්නවා. අපේ ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේම, වයෝවෘද්ධ වැඩිහිටියන්ට ඒ දීමනාව ලබාගැනීමට බස් රථයකින් එන්න පුළුවන්කමක් නැහැ; යතුරු පැදියකින් එන්න පුළුවන්කමක් නැහැ. ඒ නිසා ඒ අයට ත්‍රිරෝද රථයක් වෙනුවෙන්, එහෙම නැත්නම් වෙනත් වාහනයක් වෙනුවෙන් යම් මුදලක් දරන්න සිදු වෙලා තිබෙනවා. මේ ලැබෙන සුළු දීමනාව එවැනි දේ සඳහා වියදම් කිරීම නිසා ඔවුන්ගේ එදිනෙදා අවශ්‍යතා ඉටු කරගැනීමට, අවශ්‍ය ඖෂධ ටික ලබාගැනීම ආදියට ප්‍රමාණවත් වන්නේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද වනකොට රුපියල අවප්‍රමාණ වීම හේතුවෙන්, ආබාධිත පවුල් සඳහා ලබා දෙන්නා වූ මුදල, ඒ වාගේම වකුගඩු රෝගීන් වෙනුවෙන් ලබා දෙන්නා වූ මුදල ආදි වශයෙන් ලබා දෙන දීමනා මුදල ප්‍රමාණවත් නොවන බව අපි හැමෝම පිළිගන්නවා. කොහොම වුණත්, අද මේ දීමනා සමෘද්ධි බැංකු මඟින් ලබා දීම නිසා ඒ ප්‍රතිලාභීන් දැඩි අපහසුතාවට පත් වෙලා ඉන්නවා. ඒ නිසා ගරු මන්ත්‍රීතුමා සඳහන් කළ විධියට ඒ මුදල් ලබා දීම අදාළ කොට්ඨාසය නියෝජනය කරන ක්ෂේත්‍ර නිලධාරින් මඟින් හෝ එහෙම නැත්නම් වෙනත් ක්‍රමයක් මඟින් හෝ ලබා දෙන්න කටයුතු කරන්න කියන ඉල්ලීම කරමින්, මෙම යෝජනාව ස්ථිර කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ජේ.සී. අලවතුවල මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි හතරක කාලයක් ලැබෙනවා.

[අ.භා. 5.40]

**ගරු ජේ.සී. අලවතුවල මහතා**
(மாண்புமிகு ஜே.சீ. அலவத்துவல)
(The Hon. J.C. Alawathuwala)

මූලසුන හොබවන ගරු මන්ත්‍රීතුමනි, ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ මන්ත්‍රීතුමා අද සභාව කල්තබන අවස්ථාවේ ඉදිරිපත් කළ යෝජනාව ඉතාම වැදගත් යෝජනාවක්. මේ යෝජනාවේ සඳහන් වන ආබාධිත අය, වකුගඩු රෝගීන්, වැඩිහිටියන් ආදි ප්‍රතිලාභීන් වෙනුවෙන් ඉතාම සුළු මුදලක් ලැබෙන්නේ. ඉතින් ඒ අයට බස් එකක හෝ වෙනත් වාහනයක ගිහින් ඒ මුදල ලබාගන්න සිදු වනවා නම් ඒ මුදලින් ප්‍රයෝජනයක් ලැබෙන්නේ නැහැ.

අද වනවිට ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල නිලධාරීන් විශාල සංඛ්‍යාවක් ඉන්නවා. ඒ නිසා මෙම ආධාර ලබාගන්නා අය සමඟ සාකච්ඡා කරලා ඒ අයට පහසුම බැංකුවක බැංකු ගිණුමක් විවෘත කරලා මේ මුදල් තැන්පත් කරනවා නම් ඒ අයට ඕනෑම වෙලාවක ඒ මුදල ගෙදර සිටින කෙනෙකු යවා හෝ ඒ මුදල් ගන්න පුළුවන්. දැන් බැංකු කාඩ්පත් - ATM card - ක්‍රමය තිබෙනවා. ඒ නිසා ඕනෑම අවස්ථාවක ඒ මුදල් ගැනීමේ හැකියාව තිබෙනවා. අපි මේ ක්‍රමය තමයි මෙහිදීත් ඇති කළ යුත්තේ. ලබා දෙන සියලු ආධාර මුදල් ඒ අය නමින් ගිණුම්ගත කරනවා නම්, ඕනෑම අවස්ථාවක ඒ මුදල් බැංකු කාඩ්පත් හරහා ලබාගැනීමේ හැකියාව තිබෙනවා. මෙන්න මේ වාගේ පහසු ක්‍රමයක් සකස් කර දෙන එක ඉතාම වැදගත්. මොකද, ආබාධිත තත්ත්වයේ සිටින සමහර අයට ගමන් බිමන් යෑම අපහසුයි.

ඒ වාගේම, මේ ලබා දෙන දීමනාව වැඩි කරනවා නම් හොඳයි. මොකද, අද ඇති වෙලා තිබෙන මේ බංකොලොත්භාවය තුළ රුපියලේ අගය අඩුවීම නිසා මේ ලැබෙන ආධාර මුදල්වලින් ගත හැකි භාණ්ඩ ප්‍රමාණයත් අවම වෙලා තිබෙනවා. ඒ නිසා අපි මේ පවතින තත්ත්වය ගැනත් කල්පනා කරන්න ඕනෑ.

ඒ වාගේම අද ගමනාගමන වියදම් අධික වෙලා තිබෙනවා. බස් ගාස්තු, ත්‍රිරෝද රථ ගාස්තු ආදි හැම වියදමක්ම වැඩි වෙලා තිබෙනවා. ඒ නිසා මෙම දීමනාව මා මුලින් සඳහන් කළ ආකාරයට බැංකු ගිණුමක තැන්පත් කරලා ATM කාඩ්පතකින් පහසුවෙන් ලබාගැනීමට පුළුවන් විධියේ ක්‍රමයක් ක්‍රියාත්මක කරනවා නම් ඒ අයට ඇත්තටම පහසුවක් වෙයි.

ඒ වාගේම අද විශ්‍රාමිකයන්ටත් අපහසුතා ගණනාවක් තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. වැඩිහිටියන් කිව්වාම, විශ්‍රාමිකයෝත් වැඩිහිටියන් හැටියට මුහුණ දෙන අපහසුතා ගණනාවක් තිබෙනවා. ඒ අයට ලැබෙන විශ්‍රාම වැටුපෙන් සති දෙකක්වත් ජීවත් වෙන්න බැරි තැනට ඔවුන් අද පත් වෙලා තිබෙනවා. ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල රජයේ නිලධාරීන් විශාල ප්‍රමාණයක් ඉන්න නිසා, මේ අයටත් පහසු ක්‍රමයකට විශ්‍රාම වැටුප ලබා ගන්න පුළුවන් ආකාරයේ වැඩ පිළිවෙළක් සකස් කරනවා නම් ඉතාම වැදගත් කියන එක මේ වෙලාවේ මතක් කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ප්‍රේම්නාත් සී. දොලවත්ත මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි දෙකක කාලයක් ලැබෙනවා.

[අ.භා. 5.43]

**ගරු නීතිඥ ප්‍රේම්නාත් සී. දොලවත්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி பிரேம்நாத் சி. தொலவத்த)
(The Hon. Premnath C. Dolawatte, Attorney-at-Law)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ මැතිතුමා විසින් සභාව කල් තබන අවස්ථාවේ ඉදිරිපත් කරන ලද මේ යෝජනාව ඉතාම කාලෝචිත යෝජනාවක්. අර්බුදයක් පවතින මෙවැනි කාලයක දී විශාල වශයෙන් දිළිඳු බවට පත් වුණු, පීඩාවට පත් වුණු කණ්ඩායමක් ගැන තමයි අද කථා කරන්නේ. මේ අයට ඒ සහනදායී ක්‍රියාවලියට එක්වන්නත් දිගු පෝලිමක ඉන්න සිද්ධවෙලා තිබෙනවා. එක පැත්තකින්, රටේ පවතින තත්ත්වය මත මේ ලැබෙන මුදල කොහෙත්ම ප්‍රමාණවත් වෙන්නේ නැහැ. ඒ එක්කම දැනට සිටින ප්‍රමාණයට අලුතින් එකතු වන ප්‍රමාණය අද වනකොට වැඩි වෙලා තිබෙනවා. දිළිඳු බව වැඩි වෙලා තිබෙනවාය කියන එක අපි කවුරුත් පිළිගන්නවා. අංගවිකල, ආබාධ සහිත පුද්ගලයන්ගේ සංඛ්‍යාව වැඩි වෙලා තිබෙනවා. ඒ අයටත් ආධාර ගන්න පෝලිමේ ඉන්න වෙලා තිබෙනවා. ඔවුන් තවදුරටත් පෝලිම්වල නොතබා, සහනාධාර ලබා දෙන පුද්ගලයන් ප්‍රමාණය වැඩි කරලා, ඒ සියලුදෙනාට සහනාධාර ලබාදීම කළ යුතුයි. ඒ එක්කම සහනාධාර වශයෙන් ලබා දෙන මුදලත් ප්‍රමාණාත්මකව වැඩි කළ යුතුයි.

දැන් අලුත්ම තත්ත්වය මේකයි. වයසක උදවිය පුරුදු වෙලා හිටියා, තැපැල් කන්තෝරුවට ගිහිල්ලා මුදල් අරගන්න. අපේ කුමාරසිරි රත්නායක මන්ත්‍රීතුමා කිව්වා වාගේ සමෘද්ධි බැංකු මඟින් මේ මුදල් ලබා දීම තුළ ඒ අය විශාල ප්‍රශ්නයකට මුහුණ පා තිබෙනවා. මගේ ප්‍රදේශයේ ජනතාවත් කීප වතාවක් ඇවිල්ලා මට කිව්වා, මේ සිද්ධ වෙලා තිබෙන දේ නිසා ඒ අයට යම් අපහසුතාවක් ඇති වෙලා තිබෙනවා කියලා. අපි පැහැදිලිව දන්නවා, යම් කාලයක් තුළ නිවැරදිව මේ මුදල් ගෙවා ගැනීමේ හැකියාවක් තිබුණේ නැහැ කියලා. ඒ නිසා රාජ්‍ය සේවයේ අතිරික්තව ඉන්න සේවකයන් ලවා මේ මුදල නිවසට ම ගිහිල්ලා ලබා දෙන්න පුළුවන් නම්, ඒක විය යුත්තක් කියා මා විශ්වාස කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු වසන්ත යාපාබණ්ඩාර මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි හතරක කාලයක් ලැබෙනවා.

[අ.භා. 5.45]

**ගරු නීතිඥ වසන්ත යාපාබණ්ඩාර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி வசந்த யாப்பாபண்டார)
(The Hon. Wasantha Yapabandara, Attorney-at-Law)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඇත්ත වශයෙන්ම උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ මැතිතුමා විසින් සභාව කල් තබන අවස්ථාවේ ඉදිරිපත් කරන ලද යෝජනාව අතිශයින්ම කාලෝචිත යෝජනාවක්. මේ යෝජනාව තුළ කේන්ද්‍රගත වෙලා තිබෙන්නේ, සමාජය තුළ සදාකාලික දරිද්‍රතාවට පත් වෙච්ච කණ්ඩායමක් පිළිබඳවයි. ඇත්තටම සමාජය තුළ සදාකාලික දරිද්‍රතාවට ලක් වෙච්ච ආබාධිත පුද්ගලයන්, වකුගඩු රෝගීන්, පිළිකා රෝගීන් ඇතුළු වයෝවෘද්ධ කණ්ඩායමකට තමයි මහජන ආධාර ලබා දීමක් කරන්නේ. ගරු රාජ්‍ය අමාත්‍යතුමාත් සභාවේ සිටින මේ වෙලාවේ මම යම් කාරණාවක් පෙන්වා දෙන්න කැමැතියි. වකුගඩු රෝගීන් වීමට, පිළිකා රෝගීන් වීමට මේ අය සාධාරණ වරදක් කර තිබෙනවා කියලා ඔබතුමන්ලා විශ්වාස කරනවාද? රජය වන

[ගරු නිශ්ශංක වසන්ත යාපාබණ්ඩාර මහතා]

අපෙන් වෙච්ච වරදක් නිසා තමයි පිළිකා රෝගියා, වකුගඩු රෝගියා මේ රෝගාබාධවලින් පෙළෙන්නේ කියා මම විශ්වාස කරනවා. රජයන් ගත්ත විවිධ ප්‍රතිපත්තිමය තීන්දුත් එක්ක, - සමහර විට අපේ රට නොවෙයි, ලෝකයේ වෙනත් රටවල් ගත්ත ප්‍රතිපත්තිමය තීන්දුත් එක්ක - පරිසර දූෂණ තත්ත්වය සහ වෙනත් දේවල් මත ගමේ ඉන්න අහිංසක මිනිස්සු මේ රෝගවල වින්දිතයන් බවට පත්වෙලා තිබෙනවා; සාමාන්‍ය අහිංසක, දුප්පත් මිනිස්සු රෝගීන් බවට පත් වෙලා තිබෙනවා. එවැනි රෝගියෙකුට සාමාන්‍යයෙන් අද ගෙවන්නේ රුපියල් 350ක්, 500ක් වාගේ බොහොම සොච්චම් මුදලක්. ඔබතුමන්ලා දන්නවා, සමහර වෙලාවට ත්‍රි රෝද රථයක අවම ගාස්තුව වන්නේත් ඔය ගාස්තුව. එවැනි ගාස්තුවක් ගෙවලා ගමන ගිහිල්ලා එනකොට, සමහර වෙලාවට ත්‍රි රෝද මල්ලිලාට අතිනුත් පාඩු සිද්ධ වන අවස්ථා තිබෙනවා. ගරු රාජ්‍ය අමාත්‍යතුමනි, ඒ නිසා මේ පිළිකා රෝගීන්ගේ, වකුගඩු රෝගීන්ගේ, ආබාධිත තත්ත්වයේ පසුවන අයගේ දීමනාව වැඩි කරන්න කියා ඔබතුමා දැඩි බලපෑමක් කරන්න.

ඇත්ත වශයෙන්ම අපේ මහනුවර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම්තුමන්ලා ඇතුළු නිලධාරින් ඉතාම දක්ෂයි. ඒ නිසා කලට වේලාවට රජයෙන් ලබා දෙන මුදල් බෙදා දීමේ කටයුත්ත හොඳින් කරනවා කියලා මට සෑහීමකට පත් වෙන්න පුළුවන්. ගරු රාජ්‍ය අමාත්‍යතුමනි, නමුත් මේ අයගේ මූර්ත ආදායම ඉතාම අඩුයි. මේකේ මූල්‍යමය අගයක් තිබෙනවා වෙන්න පුළුවන්. අද අපට ලෝකයේ ආධාර ලැබී තිබෙනවා. ඒ කියන්නේ, මේ වාගේ අයට, who are suffering from poverty, පමණක්ම ගෙවන්න කියලා ලෝක බැංකුව වැනි ආයතනවලින් අපට ආධාර ලැබී තිබෙනවා. කරුණාකර ලෝක බැංකුව වැනි ආයතනවලින් ලැබී තිබෙන ආධාරත් භාවිත කරලා, මේ අයට යම් රක්ෂණාවරණයක් ලබාදීම හරහා යම්කිසි විධියකින් ඔවුන්ට සමාජ සුරක්ෂිතතාවක් ඇති කිරීම වෙනුවෙන් ක්‍රමයක් හදන්න. මෙවැනි ආකාරයට සමාජ රක්ෂණයක් දෙන ආයතන ලෝකයේ තිබෙනවා. අද අපි සංවර්ධිත මට්ටමේ රටක්වත්, සංවර්ධනය වෙමින් පවතින රටක්වත් නොවෙයි. අද අපි බංකොලොත් තත්ත්වයට පත් වෙලා තිබෙන රටක්.

සදාකාලික දරිද්‍රතාවට පත් වෙච්ච වයෝවෘද්ධ මට්ටමේ ඉන්න මේ අය රක්ෂණයට ලක් කරන්න ක්‍රමයක් යෝජනා කරන්න කියලායි මම ඔබතුමාට කියන්නේ. ඒ සඳහා ගරු අමාත්‍යතුමා හොඳ ආරම්භයක් ගන්න. අද ඔවුන්ට බෙහෙත් ටික ගන්න බැරි වෙලා තිබෙනවා. පසු ගිය දවස්වල ඔබතුමන්ලා ගිය මළ ගෙවල් පිළිබඳව කල්පනා කර බලන්න. වෙන අවුරුදුවලට වඩා මේ වෙනකොට අපි මළ ගෙවල්වලට යනවා වැඩියි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා -සමන්ප්‍රිය හේරත් මැතිතුමා-කුරුණෑගල දිස්ත්‍රික්කයේ ඉන්න දක්ෂ මන්ත්‍රීවරයෙක්; ගමේ ගොඩේ ඇවිදින පුද්ගලයෙක්. ඔබතුමාත් දන්නවා ඇති මේ වෙනකොට වයෝවෘද්ධ අයගේ මරණ ප්‍රමාණය වැඩි වෙලා තිබෙන බව. ඇයි ඒ මරණ ප්‍රමාණය මේ තරම් වැඩි වෙලා තිබෙන්නේ? ඒ අසනීපයක් වුණාම බෙහෙත් ගන්න සල්ලි මදි නිසායි ගරු අමාත්‍යතුමනි. ඒ නිසා මේ වයෝවෘද්ධ අයට අවශ්‍ය බෙහෙත්වල මිල යම් කිසි පාලනයක් කළ යුතුයි කියලා අපි කියනවා. විශේෂයෙන්ම වයෝවෘද්ධභාවය නිසාම පැන නඟින රෝගාබාධ තිබෙනවා. එක්කෝ, ඒ අයට අවශ්‍ය බෙහෙත් ටික ලබා ගැනීමට වෙනම දීමනාවක් ලබා දීමට කටයුතු කරන්න කියලා මම ඉල්ලීමක් කරනවා. වයෝවෘද්ධ අයට ලැබෙන මේ දීමනාව පිළිබඳව කෙසේවත්ම සෑහීමකට පත් වෙන්න බැහැ. ඒ වාගේම මේ අයට මේ දීමනාව ලබා දීමේ දී රස්තියාදු කරවන්න එපා කියලාත් මම කියනවා. ඒ හැමෝටම ආත්ම ගරුත්වයක් තිබෙනවා. ඒ ආත්ම ගරුත්වය රැකෙන විධියට අපි මේ කටයුතු කරන්න ඕනෑ. ගමේ ක්ෂේත්‍ර නිලධාරින් මේ කටයුතුවලදී අකාර්යක්ෂමතාවක් දක්වනවා කියලා මම විශ්වාස කරන්නේ නැහැ. ඔවුන් මේ පිළිබඳ කාර්යක්ෂමතාවක් දක්වනවා. සමහර තැන්වල ඒ වාගේ තත්ත්වයක් තිබෙන්න පුළුවන්. ඒ කෙසේ වෙතත්, මේ අයගේ දීමනා වැඩි කරන්න කියලා මම ඉල්ලීමක් කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු කේ.පී.එස්.කුමාරසිරි මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 3ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 5.49]

**ගරු කේ.පී.එස්. කුමාරසිරි මහතා**
(மாண்புமிகு கே.பி.எஸ். குமாரசிறி)
(The Hon. K.P.S. Kumarasiri)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ මන්ත්‍රීතුමා විසින් අද සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව විධියට ඉතාම ප්‍රායෝගික යෝජනාවක් ගෙනැල්ලා තිබෙනවා. ගරු ඇමතිතුමනි, මේ වනකොට මාස තුනකට අධික කාලයක් මේ වකුගඩු දීමනා, ආබාධිත දීමනා, වැඩිහිටි දීමනා ලැබිලා නැහැ. ඒ නිසා මම ප්‍රථමයෙන්ම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා, පුළුවන් තරම් ඉක්මනින් මේ දීමනා ටික ලබා දෙන්න කියලා.

ගරු ඇමතිතුමනි, මෙය ඉතා වැදගත් යෝජනාවක් කියලා මම කිව්වේ වෙන හේතුවක් නිසා නොවෙයි. වකුගඩු රෝගියකු වෙනුවෙන් යම් මුදලක් ලබා දෙනවා නම්, ඒ මුදල ලබා දෙන්නේ ඔහුගේ රුධිර කාන්දු පෙරීම කරන්න පටන් ගත්තාට පස්සේ; ලේ අලුත් කරන්න පටන් ගත්තාට පස්සේ. ගරු ඇමතිතුමනි, වැඩිහිටි දීමනාව ලබා දෙන්නේ අවුරුදු 70 පැන්නාට පස්සේ. ආබාධිත දීමනාව ලබා දෙන්නේ, කකුලක් නැති හෝ වෙනත් ආබාධිත තත්ත්වයක ඉන්න අයට. මම ඔබතුමාට එක දෙයක් මතක් කරන්න ඕනෑ, ගරු ඇමතිතුමනි. මා නියෝජනය කරන අනුරාධපුර දිස්ත්‍රික්කයේ නොච්චියාගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කුකුල්කටුව, හුණුවිලගම, කටුපැත්තෑව, මහරණවරාව යන ගම්මානවල ඉඳලා නොච්චියාගම නගරයට එන්න කිලෝමීටර් 25ක්, 30ක් තිබෙනවා. හැබැයි, මේ වැඩිහිටි දීමනාව, වකුගඩු දීමනාව ලෙස ලැබෙන්නේ රුපියල් 5,000ක් වාගේ සුළු මුදලක්. මේ මුදල ගන්න ආබාධිතයෙක් එනවා නම් බස් එකේ එන්න බැහැ. ඔහු එන්න ඕනෑ ත්‍රිවිල් එකක. ත්‍රිවිල් එකක එන්න අඩුතරමින් රුපියල් 2,500ක්, රුපියල් 3,000ක්වත් ගන්නවා. එතකොට ඒ දීමනාව අරගෙන වැඩක් නැහැ. ඒ නිසා ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ මන්ත්‍රීතුමා ඉදිරිපත් කළේ ඉතා වැදගත් යෝජනාවක්. ඒ නිසා අපි ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා, කරුණාකරලා මේ දීමනාව ඔවුන්ගේ අතට ලැබෙන වැඩ පිළිවෙළක් සකසන්න කියලා. ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල ක්ෂේත්‍ර නිලධාරින් ඉන්නවා. ඒ ක්ෂේත්‍ර නිලධාරින් හරහා මේ දීමනාව ඔවුන්ගේ නිවසට ගිහිල්ලා දෙන්න පුළුවන් නම් ඒක ඉතාම වැදගත් වෙනවා. පසුගිය කාලයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල හරහා මේ කටයුත්ත කරනකොට, ග්‍රාම නිලධාරින් ඒ දීමනාව ගෙදරට ගිහිල්ලා දුන්නා, අපි දැක්කා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද වෙලා තිබෙන්නේ මෙකයි. මම කියපු ඒ දුරක ඉඳලා ඒ දීමනාව ගන්න එන අම්මා හෝ තාත්තාට - ආබාධිත පුද්ගලයාට- අද සමෘද්ධි බැංකුවේ රුපියල් 500ක් දාලා ගිණුමක් අරඹන්න වෙලා තිබෙනවා. ඒ ගිණුම අරඹලා, ඒ ගිණුමට ලැබෙන මුදල තමයි ගන්න වෙලා තිබෙන්නේ. ඒ නිසා අපි ඔබතුමාගෙන් කාරුණික ඉල්ලීමක්

කරනවා, මේ කටයුත්ත පිළිබඳව ගරු ජනාධිපතිතුමා එක්ක කථා කරලා, මේ දීමනාව ඒ අයගේ නිවසට ගිහිල්ලා දෙන්න පුළුවන් විධියට ක්‍රමයක් හදලා දෙන්න කියලා.

මට කථා කරන්න අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට ගෞරවනීය ස්තුතිය පුද කරමින් මා නිහඬ වනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු වීරසුමන වීරසිංහ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 4ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 5.52]

**ගරු වීරසුමන වීරසිංහ මහතා**
(மாண்புமிகு வீரசுமன வீரசிங்ஹ)
(The Hon. Weerasumana Weerasinghe)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පසුගිය මාස තුනක්, හතරක් තිස්සේ අපි ඉතා පීඩාවට පත් වෙච්ච ප්‍රශ්නයක් පිළිබඳව තමයි අද මේ යෝජනාව ඉදිරිපත් කර තිබෙන්නේ. ඒ පිළිබඳව දිගින් දිගටම අපි අදාළ නිලධාරින් සමඟ පසුගිය කාලයේ දී කථා කළා. ඒ වාගේම, මීට දින කීපයකට කලින් පැවැති අමාත්‍යාංශ උපදේශක කාරක සභාවේ දීත් ගරු රාජ්‍ය අමාත්‍යතුමා සමඟ සාකච්ඡා කරලා යම් එකඟවීමකට එන්න උත්සාහ කරපු කාරණාවක් තමයි අද ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ මැතිතුමා සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව විධියට මේ ගරු සභාවට ඉදිරිපත් කරලා තිබෙන්නේ.

ලැබී තිබෙන කාලය අනුව මා මේ කාරණාව ගැන දීර්ඝ වශයෙන් අදහස් දක්වන්න බලාපොරොත්තු වන්නේ නැහැ. පසුගිය අතීතයේ සිටම අභිංසක මිනිසුන් වෙනුවෙන් යම් සුබසාධන කටයුත්තක් කිරීම අපේ රටේ සිද්ධ කළා. එය රාජ්‍යයක වග කීමක්. රාජ්‍යයට ඒකෙන් බැහැරව යන්න බැහැ. රාජ්‍යයක වග කීමක් ඉෂ්ට කිරීම සඳහා ඉතා පහළ මට්ටමේ ඉන්න පිරිසක් වෙනුවෙන් තමයි මේ සුභසාධන දීමනාව දෙන්නේ. මේ කල් තැබීමේ යෝජනාවේ සඳහන් වුණු ආකාරයට වකුගඩු රෝගියකු වෙන්න පුළුවන්, පිළිකා රෝගියකු වෙන්න පුළුවන්, වැඩිහිටියකු වෙන්න පුළුවන්, ඔවුන් මේ සමාජ ක්‍රමය තුළ, මේ සෞඛ්‍ය ක්‍රමය තුළ, මේ ආහාර සංස්කෘතිය තුළ පීඩාවට පත්වන කොටසක්. නමුත්, වයස්ගත වුණු හැම කෙනාටම වැඩිහිටි ආධාරය ලැබෙන්නේත් නැහැ. සීමිත පිරිසකට විතරයි ලැබෙන්නේ. පීඩාවට පත් වුණු පිරිසට විතරයි මේ ආධාරය ලැබෙන්නේ. ආබාධිත අයට දෙන ආධාරයත් එහෙමයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පසුගිය කාලයේ මේ ආධාරය නතර කරන්න, අනිකුත් සුබසාධන කටයුතු කප්පාදු කරන්න, සමෘද්ධි දීමනා කප්පාදු කරන්න, රාජ්‍ය සේවය කප්පාදු කරන්න යම් පිරිසකට ඕනෑකම තිබුණා. ඒ කටයුත්ත චක්‍රාකාරයකින් සිදුවන ක්‍රියාවලියක ආරම්භයක් වශයෙන් තමයි, මෙතෙක් කලක් තිබුණු මේ ක්‍රියාවලිය වෙනස් කරලා සංකීර්ණ ක්‍රියාවලියක් බවට පත් කරලා, මේ අභිංසක මිනිසුන් තවත් පීඩාවෙන් පීඩාවට පත් කරලා, මේ දීමනාව ඔවුන්ට එපා කරවන මට්ටමකට ගෙනාවේ. මේ තීන්දුව තකතීරු තීන්දුවක්, තක්කඩි තීන්දුවක් කියලා පැහැදිලිව මම කියන්න ඕනෑ.

ලෝක බැංකුව ආධාර දෙන තැන්වලට මහ පෙන්වා තිබෙනවා, මෙවැනි ගෙවීම් බැංකුවක් හරහා කරන්න කියලා. සමෘද්ධි බැංකුව හරහා මේ කටයුත්ත කරන එක ගැන ප්‍රශ්නයක් නැහැ. සමෘද්ධි බැංකුව හරහා ඒ මුදල් ලබා දෙනවා නම්, ඒ මුදල මිනිසුන් අතට ලබා දෙන ක්‍රමයක් නිර්මාණය කරන්න. එය සමෘද්ධි සංවර්ධන නිලධාරින්ගේ රාජකාරියක් බවට පත් කරන්න. දැනට තිබෙන තොරතුරු අනුව සමෘද්ධි සංවර්ධන නිලධාරින්ගේ සංගමය ඒකට යම් එකඟතාවක් පළ කරලා නැහැ. ඒ නිසා වෙනත් ක්ෂේත්‍ර නිලධාරියකු හරහා හෝ මේ දේ කරන්න.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා නියෝජනය කරන මාතර දිස්ත්‍රික්කයේ ග්‍රාම නිලධාරි වසම් 650ක් තිබෙනවා. මේ ග්‍රාම නිලධාරි වසම් 650ටම තිබෙන්නේ සමෘද්ධි බැංකු 50ක් විතරයි. මෙතෙක් කාලයක් උපතැපැල් කාර්යාල 194කින් හා තැපැල් කාර්යාල 31කින් සේවා ලබා ගත්ත ඒ මිනිසුන්ට දැන් සමෘද්ධි බැංකු 50කට යන්න සිද්ධ වෙලා තිබෙනවා. ඒ නිසා මේ තීන්දුව වහාම වෙනස් කරන්න කටයුතු කරන්න කියන ඉල්ලීම මම කරනවා. බැංකු හරහා මේ කටයුත්ත කිරීම ඉතා වැදගත් දෙයක්. හැබැයි, එහිදී පීඩාවට පත්වන්නේ අභිංසක මිනිසුන්. වැඩිහිටි දීමනාව විධියට ලැබෙන රුපියල් 2,000නුත් රුපියල් 100ක් කපාගෙන රුපියල් 1,900යි ඔවුන්ට ලැබෙන්නේ. ඒ රුපියල් 1,900 ගන්න විඳින්න සිදුවන වේදනා අනන්තයි; අප්‍රමාණයි. ඒ නිසා ඒ ක්‍රමය වෙනස් කරන්න කියලා මේ මොහොතේ මා ඉල්ලා සිටිනවා. මේ කටයුත්ත ක්ෂේත්‍ර නිලධාරින් මඟින් සිදු කරන්න කියන එක තමයි මේ යෝජනාවේ ප්‍රධාන ඉල්ලීම. මෙය ඉතාම හොඳ යෝජනාවක්. ක්ෂේත්‍ර නිලධාරින්ගෙන් මේ කටයුතු කරන කල් මෙතෙක් කාලයක් ක්‍රියාත්මක කළ ක්‍රමය හරහා ඒ මිනිසුන්ට ඒ මුදල් ලබා ගන්න ඉඩකඩ, පහසුකම් ලබා දෙන්න කියා ගරු රාජ්‍ය අමාත්‍යතුමාගෙන් ගෞරවයෙන් ඉල්ලා සිටිමින්, මේ වැදගත් යෝජනාව ඉදිරිපත් කළ ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ මන්ත්‍රීතුමාට මගේ ගෞරවයත්, ස්තුතියත් පුද කරමින් මා නිහඬ වෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු අනුප පස්කුවල් රාජ්‍ය අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 6ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 5.56]

**ගරු අනුප පස්කුවල් මහතා (සමාජ සවිබලගැන්වීම් රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு அனுப பஸ்குவல் - சமூக வலுவூட்டுகை இராஜாங்க அமைச்சர்)
(The Hon. Anupa Pasqual - State Minister of Social Empowerment)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ යෝජනාව ඉතා වැදගත් යෝජනාවක්. ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කළ මේ යෝජනාවෙන් මනාව පිළිබිඹු වෙනවා, අපේ මන්ත්‍රීවරුන් මේ පිළිබඳව කොයි තරම් අවධානයකින් හා උනන්දුවකින් ඉන්නවාද කියන එක. අනිකුත් මන්ත්‍රීවරුන්ගේ ප්‍රකාශත් ඉතාම වැදගත්.

මුලින්ම මේ ගෙවීම් කළේ තැපැල් කන්තෝරු සහ උප තැපැල් කන්තෝරු හරහා. ලෝක බැංකුවෙනුත්, ආසියානු සංවර්ධන බැංකුවෙනුත් කරන ලද ඉල්ලීමක් අනුව, ඊට පස්සේ මේ දීමනා ලබන අයට අපේ අමාත්‍යාංශයෙන් අමතර ගෙවීමක් වශයෙන් රුපියල් 5,000ක දීමනාවක් ලබා දෙන්න කටයුතු කළා. මේ අයට කලින් ගෙව්වේ රුපියල් 2,000ක් වැනි මුදලක්. සමහර මන්ත්‍රීවරු කිව්වා, රුපියල් 350ක් වැනි මුදලක් තමයි දෙන්නේ කියලා. ඒක පින් පඩියක් විධියට තිබුණු එකක්. ඒක ගෙවන්නේ පළාත් සභාවලින්. ඒ දීමනාව නොවෙයි, මේ දීමනාව. මෙහිදී අපි රුපියල් 5,000ක දීමනාවක් ගෙවනවා. ඊට අමතරව තවත් රුපියල් දෙදහස් ගණනක එකතු කිරීමකුත් තිබෙනවා. මේ සියලු

[ගරු අනුප පස්කුවල් මහතා]

සහනාධාර දීමේදී ලෝක බැංකුවෙන් සහ ආසියානු සංවර්ධන බැංකුවෙන් යෝජනා වුණේ, මේ සියලු ගෙවීම් බැංකු පද්ධතියක් හරහා ගිණුම්ගත කළ යුතු බවයි. මා මේ අමාත්‍යාංශය භාර ගැනීමට මාසයකට පමණ පෙරයි මෙය සිද්ධ වුණේ. ඊට පෙර ගිණුම්ගත කිරීමක් නොවෙයි තිබුණේ. තැපැල් කාර්යාල හරහා තමයි ඒ මුදල් ලබා දුන්නේ. අදාළ පුද්ගලයා National Identity Card එක අරගෙන තැපැල් කාර්යාලයට ගියාම ඔහුට ඒ මුදල ලබා දුන්නා. ගිණුමක් විවෘත කරලා, ඒ ගිණුමට මුදල් තැන්පත් කරනවාය කියන පදනම මත අපේ අමාත්‍යාංශය යටතේ තිබෙන ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය, ආබාධිත තැනැත්තන් සඳහා වූ මහලේකම් කාර්යාලය, සමාජ සේවා දෙපාර්තමේන්තුව, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව යන සියලු ආයතනවල රාජකාරියක් විධියට මේ කටයුත්ත ක්‍රියාත්මක වන නිසා අපි තීරණය කළා, සමෘද්ධි බැංකු 1,100ක් පමණ තිබෙන අපේ බැංකු පද්ධතිය හරහා මේ මුදල ගෙවන්න. ඒ අනුව අපි සියලු වැඩිහිටියන්ට දැනුම් දුන්නා, මේ සඳහා ගිණුමක් විවෘත කරන්න කියලා. ගිණුම් විවෘත කළ සියලුදෙනාට සමෘද්ධි බැංකුව හරහා ඒ මුදල් ගෙවනවා. අපි ඒ සම්බන්ධයෙන් චක්‍රලේඛ නිකුත් කරලා තිබෙන්නේ.

සමෘද්ධි සංවර්ධන නිලධාරියෙකුටම ග්‍රාම නිලධාරි වසම තුළ කාර්යාලයක් තිබෙනවා. මේ ගිණුම විවෘත කළාට පස්සේ අන්න ඒ කාර්යාලයෙන් දීමනාලාභීන්ට මේ මුදල ලබා ගන්න පුළුවන්. නමුත්, ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ මන්ත්‍රීතුමා යෝජනා කළේ දුෂ්කරතා තිබෙන අයට මේ මුදල ගෙදරටම ගිහිල්ලා දෙන්න කියලායි. යම් කෙනෙකුට මේ මුදල ගන්න පැමිණීමට ලොකු වියදමක් යනවා නම්, එන්න අපහසුයි නම්, තමන්ගේම වසමේ කාර්යාලයට ගිහිල්ලා ඒ මුදල ගන්න බැරි කෙනෙක් ඉන්නවා නම්, එවැනි අයට මේ මුදල ගෙදරටම ගිහිල්ලා දෙන්න කියලා චක්‍රලේඛයක් මඟින් මේ වන විටත් අපි දැනුම් දීලා තිබෙනවා.

මේ දීමනා ලබන සියලුදෙනාට ගෙවල්වලට ගිහිල්ලා එම මුදල දෙන්න අවශ්‍ය නැහැ. සමහර අය පොළට එන ගමන් බැංකුවට ගිහිල්ලා ඒ මුදල ලබා ගන්නවා. සමහර අය සමෘද්ධි සංවර්ධන නිලධාරි කාර්යාලයට ගිහිල්ලා ගන්නවා. එම නිසා තවම ඉතාම හොඳින් මේ කටයුත්ත ක්‍රියාත්මක වෙනවා. අවශ්‍ය නම් කලින් තිබුණු විධියට නැවතත් තැපැල් කන්තෝරුවෙන් මේ මුදල ලබා ගන්න ඉඩ සැලැස්විය හැකියි. එහෙම කරන්න කියලා වැඩි පිරිසක් කියනවා නම්, එය කළ හැකියි. නමුත්, වඩාත් සුදුසු කලින් කිව්වා වාගේ මේ යෝජනාවේ තිබෙන විධියටම ඇවිදගන්න බැරිවීම වැනි අපහසුතා තිබෙන අයට ගෙදරටම ගිහිල්ලා ඒ මුදල දෙන්නත්, අනෙක් අයට තමන්ගේ වසමේ සමෘද්ධි සංවර්ධන නිලධාරි කාර්යාලයෙන් ඒ මුදල ලබා ගන්නත්, අනෙකුත් අයට බැංකුවලට ගිහිල්ලා ඒ මුදල ලබා ගත හැකි විධියටත් ක්‍රමයක් සකස් කිරීමයි. මේ යෝජනාව ඉදිරිපත් කිරීම පිළිබඳව විශේෂයෙන්ම ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ මන්ත්‍රීතුමාට මම නැවතත් ස්තුතිවන්ත වෙනවා.

මේ ක්‍රියාදාමය සිදු වන්නේ මේ දෙසැම්බර් මාසය වෙනකම් විතරයි. ලෝක බැංකුවේ සහ ආසියානු සංවර්ධන බැංකුවේ මුදල් අපට ලැබෙන්නේ දෙසැම්බර් මාසය වෙනකම් පමණයි. ඊට පස්සේ අපේ මුදල්වලින්මයි මේ වැඩසටහන ක්‍රියාත්මක කරන්නේ. ඊට පස්සේ අවශ්‍යතාව අනුව අපේ සැලැස්ම ක්‍රියාත්මක කරලා වඩාත් යහපත් ආකාරයට මේ කටයුතු කළ හැකියි. පහසු අයට බැංකුවෙනුත්, අනෙක් අයට සමෘද්ධි සංවර්ධන නිලධාරි කාර්යාලයෙනුත්, ඒ කිසිදෙයක් කර ගන්න බැරි අයට ගෙදරටම ගිහින් ඒ මුදල ලබා දෙන ක්‍රමයකුත් සකස් කරන බව මේ ගරු සභාවට ප්‍රකාශ කර සිටිනවා.

ස්තුතියි.

***එකල්හි වේලාව අ. භා. 6.00 වූයෙන් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා විසින් ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තබන ලදී.***

***පාර්ලිමේන්තුව ඊට අනුකූලව, 2022 නොවැම්බර් 10 වන දින සභා සම්මතිය අනුව, 2022 නොවැම්බර් 18වන සිකුරාදා පූ. භා. 9.30 වන තෙක් කල් ගියේ ය.***

*அப்பொழுது, பி.ப. 6.00 மணியாகிவிடவே மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள் வினா விடுக்காமலேயே பாராளுமன்றத்தை ஒத்திவைத்தார்.*

*அதன்படி பாராளுமன்றம், அதனது 2022 நவம்பர் 10ஆம் திகதிய தீர்மானத்திற்கிணங்க, 2022 நவம்பர் 18, வெள்ளிக்கிழமை மு.ப. 9.30 மணிவரை ஒத்திவைக்கப்பட்டது.*

*It being 6.00 p.m..,* THE HON. PRESIDING *MEMBER adjourned Parliament without Question put.*

*Parliament adjourned accordingly until 9.30 a.m. on Friday, 18th November, 2022, pursuant to the Resolution of Parliament of 10th November, 2022..*

**සැ.යු.**

මෙම වාර්තාවේ අවසාන මුද්‍රණය සඳහා ස්වකීය නිවැරදි කළ යුතු තැන් දක්වනු රිසි මන්ත්‍රීන් මින් පිටපතක් ගෙන නිවැරදි කළ යුතු ආකාරය එහි පැහැදිලිව ලකුණු කොට, පිටපත ලැබී දෙසතියක් නොඉක්මවා **හැන්සාඩ්** සංස්කාරක වෙත ලැබෙන සේ එවිය යුතුය.

**குறிப்பு**

உறுப்பினர் இறுதிப் பதிப்பிற் செய்யவிரும்பும் பிழை திருத்தங்களைத் தமது பிரதியில் தெளிவாகக் குறித்து அதனைப் பிழை திருத்தப்படாத பிரதி கிடைத்த இரு வாரங்களுள் **ஹன்சாட்** பதிப்பாசிரியருக்கு அனுப்புதல் வேண்டும்.

**NOTE**

Corrections which Members suggest for the Final Print should be clearly marked in their copy and sent to the Editor of HANSARD within two weeks of receipt of the uncorrected copy.

---

**Contents of Proceedings :**

**Final set of manuscripts Received from Parliament :**

**Printed copies dispatched :**

**හැන්සාඩ් වාර්තා**
**කොළඹ 5, පොල්හේන්ගොඩ, කිරුළපන පාර, අංක 163 දරන ස්ථානයෙහි පිහිටි රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ගත හැක.**

**මෙම හැන්සාඩ් වාර්තාව www.parliament.lk වෙබ් අඩවියෙන් බාගත හැක.**

ஹன்சாட் அறிக்கையின் பிரதிகளை
இல. 163, கிருலப்பனை வீதி, பொல்ஹேன்கொட, கொழும்பு 5இல் அமைந்துள்ள அரசாங்க தகவல் திணைக்களத்தின் அரசாங்க வெளியீடுகள் அலுவலகத்தில் பணம் செலுத்திப் பெற்றுக்கொள்ளலாம்.

இந்த ஹன்சாட் அறிக்கையை www.parliament.lk எனும் இணையத்தளத்திலிருந்து பதிவிறக்கம் செய்ய முடியும்.

Hansard Reports can be purchased from the Government Publications Bureau
at the Department of Government Information,
No. 163, Kirulapone Avenue, Polhengoda, Colombo 5.

This Hansard Report can be downloaded from
www.parliament.lk

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.